## කර්තෘ ගැන

කැළණිය විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යාව පිළිබඳ ගෞරව උපාධිධරයෙකු වන අයි.රණසිංහ පෙරේරා සමාජ විද්‍යා ක්ෂේත්‍රයේ වෘත්තීයමය පර්යේෂකයෙකු හා පුහුණුකරුවෙකු වශයෙන් 1980 දී ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය සමග සම්බන්ධ විය. 1985 - 87 කාලය තුළ දී ඇමරිකාවේ මිනසෝටා විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම අධ්‍යාපනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලැබූ ඔහු 1990 - 93 කාලයේ දී ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ පුහුණු අංශයේ ප්‍රධානියා වශයෙන් කටයුතු කළේය. 1992 වර්ෂයේ දී පෙරේරා විසින් රචිත "පුහුණු ක්‍රම වේදය" ග්‍රන්ථය අදත් ශ්‍රී ලංකාවේ පුහුණු ක්‍රම වේදය පිළිබඳ ව සිංහලෙන් ලියැවුණු එකම අත්පොත බවට පත් වී තිබේ. 1993 - 96 කාලය තුළ දී පුහුණු කිරීම හා සංවර්ධනය පිළිබඳ පශ්චාද් අධ්‍යයන කටයුතු සඳහා දිවයිනෙන් බැහැර ව සිටි ඔහු 2001 වර්ෂයේ සිට හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ මානව සම්පත් සංවර්ධන අංශයේ ප්‍රධානියා වශයෙන් ද, සමාජ විද්‍යා ක්ෂේත්‍රයේ අධි පර්යේෂක වරයකු වශයෙන් ද කටයුතු කරයි.

## සමාජ සජීවීකරණය

සමාජ සජීවීකරණයට ඇත්තේ දිගාරු තේරුමකි. ඇතැයමකුට සමාජ සජීවීකරණය යනු ගැමියන් සංවිධානය කිරීම ය. තවෙකකුට සමාජ යහපැවැත්ම තහවුරු කිරීම ය. තවත් අය කියන්නේ දිළිඳුකම පිටුදැකීම සමාජ සජීවීකරණය බව ය. බලගැන්වීම, පෙළඹුම් ක්‍රියාවලිය, විපර්යකාරකත්වය, මතවාද ව්‍යාප්තිය ආදිය සමාජ සජීවීකරණය යයි තවත් අය කියති. එහෙත් මේ ග්‍රන්ථයේ සාකච්ඡා වන සමාජ සජීවීකරණයෙන් අදහස් වන්නේ මෙකී ආංශික අර්ථකතනයන්ගෙන් එළිදැක්වෙන තත්වයන් ඉක්මවා ගිය පුළුල් අර්ථකතනයකි. සමාජය සජීවීකරණය කිරීමට නම් සජීවීකරණයේ බාධක හඳුනා ගත යුතු බවත්, හඳුනා ගත් බාධක ජය ගත යුතු බවත් මේ ග්‍රන්ථය කියයි.

ග්‍රන්ථය තුළ ඉදිරිපත් වන සාකච්ඡා, සංවාද හා තර්ක විතර්ක ආදිය මගින් කතුවරයා ශ්‍රී ලාංකිකයන් තුළ තිබෙන ප්‍රතිගාමී චර්යාවන් පිළිබඳ ව සාකච්ඡා කරයි. පරාධීනත්වයේ, බයාදුකමේ, මන්දෝත්සාහීකමේ අහිතු ප්‍රතිවිපාක පිළිබඳ ව සාකච්ඡා කරයි. දේශපාලනකරණයේ, නිලධාරිවාදයේ හා බලලෝභීත්වයේ ආදීනව පිළිබඳ ව සාකච්ඡා කරයි. අවස්ථාවාදයේ, කුහකත්වයේ හා ආත්ම වංචාවේ භයානකකම පිළිබඳ ව සාකච්ඡා කරයි. කෙටියෙන් කිව හොත් ශ්‍රී ලාංකිකයන්ගේ ඉදිරි ගමන වැළැක්වීම සඳහා ඔවුන් විසින් ම පනවා ගෙන ඇති බාධක ජය ගන්නේ කෙසේද යන්න පිළිබඳ ව සාකච්ඡා කරයි. කතුවරයාගේ විග්‍රහයට අනු ව සමාජ සජීවීකරණයක් අවශ්‍ය වන්නේ මිනිසුන්ගේ විභව ශක්තීන් මතුකිරීමට ය. දිළිඳු බව තුරන් කිරීමට ය. සමාජ සාධාරණය ඉස්මතු කිරීමට ය. සමානාත්මතාව තහවුරු කිරීමට ය. අපරාධ අඩු කිරීමට ය. ඉච්ඡාභංගත්වය, අසහනය, පසුබෑම ජය ගැනීමට ය. අලසකම මන්දෝත්සාහීකම තුරන් කිරීමට ය. පුහු ආටෝපය වෙනුවට සැබෑ ගෞරවාන්විත බව ඇති කිරීමට ය. පුරාජේරුව, පම්පෝරිය, කයිවාරුව වෙනුවට ක්‍රියාව ඉස්මතු කිරීමට ය. ඉතා කෙටියෙන් කිව හොත් ශ්‍රී ලාංකික ජන සමාජය ප්‍රතිගාමී කරන බලවේග යටපත් කොට ප්‍රගතිශීලී බලවේග ඉස්මතු කිරීමට ය

'සමාජ සජීවීකරණය' ග්‍රන්ථය ශ්‍රී ලාංකික ජන චර්යාව පිළිබඳ පර්යේෂණ ග්‍රන්ථයකි. සාම්ප්‍රදායික පර්යේෂණයක් පරිද්දෙන් උපන්‍යාස පරීක්ෂාවක් හෝ ප්‍රශ්න පත්‍රයකට පිළිතුරු සැපයීමක් නො කරන නමුදු ග්‍රන්ථයේ තොරතුරු පදනම මුළුමනින් ම ගවේෂණාත්මක ය. පුළුල් පාඨක පිරිසක් උදෙසා ඉලක්ක කර ඇති මේ ග්‍රන්ථය ඕනෑම සංකීර්ණ දෙයක් ඉතා සරළ ව කිව හැකි ය යන රීතිය මත පදනම් ව සකස් කරන ලද්දකි. එබැවින් මේ ග්‍රන්ථයේ ඉදිරිපත් කරන කරුණු තේරුම් ගැනීම සඳහා කිසිදු විශේෂිත විෂය ඥානයක් අවශ්‍ය නැත. හුදෙක් සාමාන්‍යයෙකු ව සිටීම හොඳට ම ප්‍රමාණවත් ය.

පිටකවරය : කරුණාසිරි විජේසිංහ

ISBN : 955 - 612 - 050 - 5

සමාජ සජීවීකරණය අයි. රණසිංහ පෙරේරා

22265

301 (SL) පෙරේ



# සමාජ සජීවීකරණය

( පළමු වැනි වෙළුම )

අයි. රණසිංහ පෙරේරා



හෙක්ටර් කොබ්බෑකඩුව
ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ ප්‍රකාශනයකි.

2009/06

2010/04 06

# සමාජ සජීවීකරණය

පළමු වැනි වෙළුම

MFN 6304

අයි. රණසිංහ පෙරේරා

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා
පුහුණුකිරීමේ ආයතනයේ ප්‍රකාශනයකි.

පුස්තකාලය
LIBRARY
HARTI

22265

22265

පළමු වන මුද්‍රණය 2001

ISBN : 955 - 612 - 050 - 5

මේ ග්‍රන්ථයේ ප්‍රකාශන අයිතිය හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය සතු ය. මෙහි ඇතුළත් ඕනෑම කරුණක්, ප්‍රකාශයක්, ඡේදයක් හෝ කොටසක් කතුවරයාගේ හා ආයතනයේ නම සඳහන් කොට උපුටා ගැනීමට අවසර තිබේ.

මුද්‍රණය : සීමා සහිත ලේක්හවුස් මුද්‍රණ ශිල්පියෝ සහ ප්‍රකාශකයෝ.

## පිදුම

සත්‍ය ගරු කරන්නා වූ ද
අසත්‍ය පිළිකෙව් කරන්නා වූ ද
අතලොස්සක් වන මිනිසුන් සඳහා ය.

අධ්‍යක්ෂ වරයාගෙන්.....

ශීඝ්‍ර සංවර්ධනයක් සඳහා සමාජ සජීවීකරණයක් කළ යුතු යයි බොහෝ අය කියති. එහෙත් සමාජ සජීවීකරණයක් කළ යුතු යයි යෝජනා කරන්නවුන් තුළ පවා සමාජ සජීවීකරණය යනු කුමක්ද යන්න පිළිබඳ ව මූලික එකඟතාවක් තිබෙන බවක් නො පෙනේ. ඇතැමුනට සමාජ සජීවීකරණය යනු දිළිඳුකම පිටු දැකීමේ ක්‍රියාවලියකි. තවත් අයෙකුට එය විපර්යකාරකත්වය හෙවත් ජනතාව පෙළඹවීමේ ක්‍රියාවලියකි. ගැමියන් සංවිධාන ගත කිරීම සමාජ සජීවීකරණය බව කෙනෙකු කියන අතර තවෙකෙකු කියන්නේ සමාජ ආර්ථික කාර්යක්ෂමතාව ඉහළ දැමීම සමාජ සජීවීකරණයේ කාර්ය භාරය බව යි. සමාජ සජීවීකරණය යනු මෙකී කවර ක්‍රියාවලියක් වුවත් එය මෙතෙක් පැහැදිලි ව නිර්වචනය නො වූ දියාරු (vague) සංකල්පයක් බව නම් ඉතා පැහැදිලි ය. සමාජ සජීවීකරණය පිළිබඳ ව ලිය වී ඇති සීමිත සාහිත්‍ය පරිශීලනය කිරීමෙන් වුව ද තේරුම් ගත හැක්කේ මේ සත්‍යය ය.

සංවර්ධනය වූ කිසිදු බටහිර රටක් සමාජ සජීවීකරණයක් පිළිබඳ ව කවර අවස්ථාවක දී වත් සාකච්ඡා කර ඇති බවක් අප අසා නැත. එමෙන් ම සංවර්ධනය ලඟා කර ගැනීමේ දී ඔව්හු සමාජ සජීවීකරණ අවධියක් පසු කළ බවට හෝ සඳහනක් නැත. මේ නිසා සමාජ සජීවීකරණය තුන් වැනි ලෝකයේ සංවර්ධනය ගැන සාකච්ඡා කිරීමට ඉවහල් වන ප්‍රස්තුතයක් වනවා විනා බටහිරින් පැමිණි සංවර්ධන න්‍යායන්ට ඇතුලත් ප්‍රස්තුතයක් නො වන බව පැහැදිලි ය. එබැවින් සමාජ සජීවීකරණය අර්ථ දැක්විය යුතු ව තිබෙන්නේ සංවර්ධනය සඳහා සමාජ සජීවීකරණය උවමනා යයි යෝජනා කරන්නා වූ තුන් වැනි ලෝකය විසින් ම බව පෙනේ. තුන් වැනි ලෝකය සඳහා ම යෝජනා වී තිබෙන, තුන් වැනි ලෝකය විසින් ම අර්ථ දක්වා ගත යුතු සමාජ සජීවීකරණය කුමන ස්වරූපයක් හා ආරක් ගත යුතු විෂයක් ද යන්න පැහැදිලි කිරීම මේ ග්‍රන්ථයේ අරමුණ වී තිබේ.

මේ ග්‍රන්ථය ශාස්ත්‍රීය පර්යේෂණ ග්‍රන්ථයක් සේ හැඳින්විය හැකි නමුදු කිසිදු නිශ්චිත විෂයයකට අයත් පර්යේෂණ ග්‍රන්ථයක් සේ හැඳින්වීම

අපහසු ය. සමස්තයක් ලෙස ගත් විට මේ ග්‍රන්ථයෙන් කෙරෙන්නේ ශ්‍රී ලාංකිකයන්ගේ සමාජ චර්යාව විශ්ලේෂණය කොට එමගින් ශ්‍රී ලාංකිකයන්ට ගැලපෙන සමාජ සජීවීකරණය කුමක් දැයි පැහැදිලි කිරීම ය.

ග්‍රන්ථයේ ප්‍රකට ව පෙනෙන විෂය පදනම සමාජ විද්‍යාව යි. එහෙත් මානව විද්‍යාව, මනෝ විද්‍යාව, ජාන විද්‍යාව, ආචාර ධර්ම විද්‍යාව, දේශපාලන විද්‍යාව, අධ්‍යාපන විද්‍යාව, ආර්ථික විද්‍යාව, ගණිතය, තර්ක ශාස්ත්‍රය, ඉතිහාසය ආදී වූ බොහෝ විෂයයන් තුලින් උකහා ගත් න්‍යායන් හා තර්කනයන් තොරතුරු පෙළ ගැස්වීම සඳහා උපයෝගී කර ගෙන ඇති බව පෙනේ. ශ්‍රී ලාංකිකයන්ගේ ජන චර්යාව විශ්ලේෂණය කිරීම සඳහා කිසිදු විෂයයකට අයත් යයි නම් කළ නො හැකි ස්වාධීන වාර්තාවන් වන පෘතුගිසි ජාතික රිබෙයිරෝ, ඉංග්‍රිසි ජාතික නොක්ස් සහ ජර්මන් ජාතික හයිඩ් ගේ වාර්තා ද, එඩ්වඩ් සුලිවාන්, බුෂී, කැම්ප්බෙල් ආදීන්ගේ සටහන් ද කතුවරයා ප්‍රයෝජනයට ගෙන ඇත.

ග්‍රන්ථය වෙළුම් දෙකකින් එළි දැක්වීම කතුවරයාගේ අදහස වී තිබේ. පළමු වෙළුම වන මේ කොටසින් සාකච්ඡා වන්නේ සමාජ සජීවීකරණයේ පසුබිම හා සමාජ සජීවීකරණය සඳහා ගත යුතු මඟ පිළිබඳ ව පමණි. සමාජ සජීවීකරණයේ උපාය මාර්ග පිළිබඳ ව විශේෂ වශයෙන් සාකච්ඡා කිරීමට නියමිත ව ඇත්තේ දෙවැනි වෙළුම තුල ය. එහෙත් පළමු වෙළුම, දෙවැනි වෙළුමෙන් ස්වාධීන කොට කිය විය හැකි පරිදි තර්කානුකූල අනුපිළිවෙලක් මත තොරතුරු පෙළ ගස්වා තිබෙනු දැකිය හැකි ය.

මේ ග්‍රන්ථයෙන් ඉදිරිපත් වන්නේ සමාජ සජීවීකරණය පිළිබඳ කතුවරයාගේ අදහස් මිස හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ අදහස් නො වේ. කතුවරයාගේ අදහස් ගොනු කර ඇත්තේ ඔහු පරිශීලනය කළ පුළුල් පරාසයකින් යුතු විෂය සාහිත්‍ය මත සහ ඔහු ලැබූ අත්දැකීම් මත බව පැහැදිලි ය. පොත පතින් උකහා ගත් දැ බොහෝ විට අත්දැකීම් සමඟ ගැලපීම නිගමනයන්ට එළඹීමේ මාර්ගය වී ඇති බව පෙනේ.

මනුෂ්‍යයන්ගේ චර්යාව විශ්ලේෂණය කිරීම සඳහා බ්‍රෝඩ්හර්ස්ට් ගේ පාලිත පර්යේෂණ මගින් කතුවරයා ආභාෂයක් ලබා තිබෙන බව පැහැදිලි ය. එමෙන් ම කොලර්, රයිට්ස්මන් ආදීන් ගේ චර්යා විශ්ලේෂණ ප්‍රවේශයන් ද ශ්‍රී ලාංකික ජන චර්යාව විශ්ලේෂණය කිරීම සඳහා කතුවරයා පාදක කර ගෙන තිබේ. මනුෂ්‍යයන්ගේ චර්යාව විශ්ලේෂණය කිරීම සඳහා යොදා ගැනෙන නොමොතෙටික් ප්‍රවේශය හා ඉඩිඔග්‍රැපික් ප්‍රවේශය යන ප්‍රධාන ප්‍රවේශ දෙක අතුරින් ඉඩිඔග්‍රැපික් ප්‍රවේශය මේ ග්‍රන්ථයේ තොරතුරු විශ්ලේෂණ උපක්‍රමය ලෙස ප්‍රයෝජනයට ගෙන ඇත. ඉඩිඔග්‍රැපික් ප්‍රවේශය යනු යම් ජන කොට්ඨාශයක චර්යාවට හේතු වන්නා වූ විශේෂිත කරුණු සොයා බැලීමේ උපක්‍රමය යි.

මේ ග්‍රන්ථය චර්යා විද්‍යා ක්ෂේත්‍රය තුල නව දැනුම් සම්භාරයක් නිර්මාණය කළ එකකැ යි කීමට කරුණු කිහිපයක් තිබේ. ඉන් දෙකක් ප්‍රධාන ය. පළමුවැන්න නම් මනුෂ්‍ය චර්යාව විශ්ලේෂණය කිරීම සඳහා කතුවරයා හඳුන්වා දෙනු ලබන ගණිතමය සමීකරණය යි. මා දන්නා පරිදි මනුෂ්‍ය චර්යාව විශ්ලේෂණය කිරීම සඳහා සංගෘහිත ගණිත සමීකරණයක් ප්‍රථම වරට ප්‍රයෝජනයට ගනු ලැබුවේ මේ ග්‍රන්ථය තුල ය. දෙවැන්න, ශ්‍රී ලාංකිකයන්ගේ ඉතිහාසය හා වර්තමානය පිළිබඳ ව විවිධ පොත් පත් ඇසුරින් කතුවරයා ඉදිරිපත් කරන මත වාදය යි. කතුවරයාගේ පැහැදිලි කිරීමට අනුව ශ්‍රී ලාංකිකයන් මුළුමනින් ම පරිහාණියට පත් ජන කොටස කි. බැබිලෝනියානුවන්, පේරු වැසියන්, මැක්සිකානුවන් මෙන් ම ශ්‍රී ලාංකිකයන් ද යම් ඓතිහාසික අවස්ථාවක දී තාක්ෂණය, ආර්ථිකය, කලාව සහ මිනිස් සාරධර්ම අතින් ඉතා ඉහළ අවධියක සිටි නමුත් ඉහත කී ජාතීන් මෙන් ම ශ්‍රී ලාංකිකයෝ ද අග මුල සැසඳිය නො හැකි මට්ටමේ මහා පරිහාණියකට පත් ව තිබෙන බව කතුවරයා පෙන්වා දෙයි. කතුවරයා ඔප්පු කර සිටින්නේ බැබිලෝනියානුවන්ට, පේරු වැසියන්ට, මැක්සිකෝවරුන්ට ඔවුන් සිටි ශ්‍රේෂ්ඨ ඉතිහාසය නැවත ගොඩ නැගිය නො හැකිවාක් මෙන් ශ්‍රී ලාංකිකයන්ට ද ඔවුන්ගේ ඉතිහාසය නැවත ගොඩ නැගිය නො හැකි බව ය. මේ නිසා ශ්‍රී ලාංකිකයන්ගේ ඉදිරි මග වැටී ඇත්තේ ගෝලීයකරණයේ අත්‍යන්ත ලක්ෂණ වන ප්‍රජාතන්ත්‍රවාදය, මානව නිදහස, තාක්ෂණය

ඇතුලත් නූතන වාදය (modernism) හරහා බව කතුවරයාගේ නිගමනය යි. කතුවරයා සමාජ සජීවිකරණය යයි කියන්නේ ද මේ තත්ත්වයට ම බව පැහැදිලි ය.

මේ ග්‍රන්ථයේ කතුවරයා වන අයි. රණසිංහ පෙරේරා අප ආයතනයේ අධි පර්යේෂක වරයෙකු මෙන් ම පුහුණු අංශයේ ප්‍රධානියා ද වේ. රණසිංහ පෙරේරා සමාජ සජීවිකරණය පිළිබඳ ග්‍රන්ථයක් සම්පාදනය කිරීමට ඉදිරිපත් වූයේ ස්වේච්ඡාවෙනි. 1992 දී ද ඔහු ස්වේච්ඡා අභ්‍යාසයක් මගින් පුහුණු ක්‍රමවේදය නම් වූ වැඩිහිටි පුහුණුකිරීම් පිළිබඳ පළමු සිංහල ග්‍රන්ථය සම්පාදනය කළේ ය. එමෙන් ම සමාජ සජීවිකරණය පිළිබඳ පළමු සිංහල ග්‍රන්ථය වන්නේ ද මේ ග්‍රන්ථය යි. පුරා වසරකට ආසන්න කාලයක් ආයතන පුස්තකාලයෙහි ජවත් වෙමින් ග්‍රන්ථය එළිදැක්වීම සඳහා ඔහු දැරූ වෙහෙස හා නො පසුබට උත්සාහය මම විශේෂයෙන් අගය කරමි.

ආචාර්ය ඇස්.ජී.සමරසිංහ.
අධ්‍යක්ෂ.
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය.
2001 පෙබරවාරි 25 දින.

# ස්තුතිය

සමාජ සජීවීකරණ පිළිබඳ ග්‍රන්ථයක් සම්පාදනය කිරීමට පාදක වූ හේතුන් කීපය කි. විවිධ සමාජ සජීවීකරණ අභ්‍යාසයන්ගෙන් කතුවරයා ලැබූ අත්දැකීම් සටහන් කර තැබීම ඉන් පළමු වැන්න ය. දෙවැන්න, ශ්‍රී ලාංකික ජන සමාජයට විශේෂිත වූ කරුණු සලකා බලා සජීවීකරණයට පාදක වන ගැටලු සහ අවස්ථා හඳුනා ගැනීම ය. තුන් වැන්න, සමාජ සජීවීකරණය පිළිබඳ ව සුවිශේෂ වශයෙන් පර්යේෂණ කර බැලීමට කතුවරයා තුළ තුබූ දැඩි උවමනාව ය. සිව් වැන්න සමාජ සජීවීකරණය පිළිබඳ ව පැවැත්වූ විවිධ පුහුණු පාඨමාලාවලදී කියවීම් ග්‍රන්ථයක් සම්පාදනය කිරීම සඳහා බොහෝ දෙනෙකු කළ ඉල්ලීමට ප්‍රතිචාර දැක්වීම ය.

වෙළුම් දෙකකින් යුතු මේ ග්‍රන්ථය සඳහා උවමනා තොරතුරු සම්පාදනයට ගත වූ කාලය වසර දහයකට ආසන්න බව මගේ කල්පනාව යි. එකල සිට ම මට බොහෝ අය ආධාර උපකාර කළාහු ය. දිරි ගැන්වීම් ද කළාහු ය. තොරතුරු සම්පාදනයේ දී නන් අයුරින් මට උදව් උපකාර කළ සියල්ලන්ට මගේ ස්තුතිය පිරි නැමීමට මා මෙය අවස්ථාවක් කර ගන්නෙමි.

ග්‍රන්ථය ලියා නිම කිරීමට ගත වූයේ මාස නමයක් පමණ වූ කාලයක් පමණි. මාස නමයක් වැනි කාලයක් තුළ දී ග්‍රන්ථයක් ලියා නිම කිරීමට හැකි වීම පිටු පස තිබෙන එක් වැදගත් සාධකයක් නම් කතුවරයාට ලැබුණු ප්‍රමාණවත් මානසික නිදහස යි. පසුගිය මාස නමයක කාලය පුරාම කාර්යාල කාලය තුළ මා ජීවත් වූයේ ආයතනයේ පුස්තකාලය තුළ ය. මගේ අධ්‍යක්ෂවරයා රාජකාරි සාකච්ඡාවක් සඳහා වුව ද මා කැඳවූයේ අත්‍යාවශ්‍ය අවස්ථාවක පමණි. ග්‍රන්ථය සම්පාදනය කිරීමේ දී අධ්‍යක්ෂවරයාගෙන් ලැබුනේ අසීමිත අනුග්‍රහයකි. පර්යේෂණයක් කිරීමට නිදහස උවමනා ය. සැහැල්ලුව උවමනා ය. මේ සියල්ල මට නො අඩු ව මගේ අධ්‍යක්ෂවරයාගෙන් ලැබුනි. එබැවින් මගේ අධ්‍යක්ෂවරයා වූ ආචාර්ය ඇස්.ජේ. සමරසිංහ මහතාට මා අතිශයින් කෘතඥ වෙමි. ස්තුති පූර්වක වෙමි.

මගේ කාර්යාල දිවිය පුස්තකාලයට ම කොටු වෙද්දී පුස්තකාල කාර්ය මණ්ඩලයෙන් මට ලැබුණු සහාය බොහෝ ය. පුස්තකාලයාධිපති ජ්. එච්. කරුණාරත්න මහතාගෙන් මෙන් ම අනෙකුත් සියලු සේවක මහත්ම මහත්මීහු ඔවුනට හැකි අයුරින් මට ආධාර උපකාර කළාහු ය. කරුණාරත්න මහතා මගේ අධ්‍යයනය සඳහා ම උවමනා වූ පොත් පත් ගණනාවක් මිළට ගත්තෙහි ය. පුස්තකාල කාර්ය මණ්ඩලය උවමනා පොත පත සොයා දීමෙන් අනුග්‍රහය දැක්වීය. මම ඔවුන් සියළු දෙනාට මගේ කෘතඥතාපූර්වක ස්තූතිය පුද කර සිටිමි.

ග්‍රන්ථයේ පළමු වෙළුමේ අත් පිටපත කියවා බැලූ මිතුරන් කීප දෙනෙකි. කොළඹ විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කුමුදු කුසුම් කුමාර මහතා ද, මගේ ආයතනයේ අධි පර්යේෂක ආචාර්ය ඩී.ගමගේ මහතා ද, සහාය අධි පර්යේෂකවරුන් වන ජේ. කේ. එම්.ඩී. චන්ද්‍රසිරි මහතා සහ බණ්ඩාර රත්නායක මහතා ද ජ්‍යෙෂ්ඨ පර්යේෂක පී. පියරත්න මහතා ද ඉන් ප්‍රධාන ය. අත් පිටපත් කියවා විවිධ යෝජනා හා අදහස් ඉදිරිපත් කළ ඒ සියළු දෙනාට මගේ හෘදයාංගම ස්තූතිය පුද කරමි.

වරින් වර සංශෝධනය කරන ලද මේ ග්‍රන්ථය නැවත නැවතත් පරිගණක ගත කළේ පුහුණු අංශයේ රහස්‍ය ලේකම් ඉන්ද්‍රා දේවේන්ද්‍ර මහත්මිය යි. පුහුණු අංශයේ යතුරු ලේඛිකා කුමාරි මෙනෙවිය ද ඇයට උදව් උපකාර කළා ය. පරිගණක කටයුතුවලදී ප්‍රකාශන අංශයේ ලඝු/යතුරුලේඛක පාලිත ගුණරත්න මහතාගෙන් ලැබුණු සහාය ද මා බෙහෙවින් අගය කරමි. මම ඔවුනට ද ස්තූති කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

මේ ග්‍රන්ථයේ භාෂාමය නිදොස් කිරීම් කරනු ලැබුයේ මහාචාර්ය සුචරිත ගම්ලත් විසිනි. අධික වැඩකටයුතු මධ්‍යයේ වුව ද මගේ ඉල්ලීම පිළිගනිමින් ඔහු ලබා දුන් අනුග්‍රහය මා විශේෂයෙන් සිහි කළ යුතු ය. ග්‍රන්ථ අන්තර්ගතයට අදාල කරුණු නියෝජනය වන පරිදි සිත්ගන්නා සුළු පිට කවරයක් නිර්මාණය කළේ කරුණාසිරි විජේසිංහ මහතා ය. ඔහු ද මා විශේෂයෙන් සිහිපත් කළ යුතු ය.

මේ ග්‍රන්ථය ලිවීමට ගත කල මාස නවයක කාළ වකවානුව තුල දී මගේ බිරියට හා දරුවන්ට මගෙන් ඉටු විය යුතු ඇතැම් යුතුකම් පැහැර හැරෙන්නට ඇති බව මම හොඳින් දනිමි. පුස්තකාලයෙන් මිදී නිවසට ගිය පසු රාත්‍රී කාළයේදීත්, බොහෝ නිවාඩු දිනවලත් මම ග්‍රන්ථය ලිවීමේ කාර්යයෙහි ම නියුක්ත උනෙමි. ඔවුන් සමඟ ගත කළයුතු කාළය වෙනත් කටයුත්තකට යෙදවීම ඉවසා සිටීම වෙනුවෙන් බිරිඳ හේමාට ද, ප්‍රසාද් සහ දේශප්‍රිය පුතුන් දෙදෙනාට ද මම බෙහෙවින් ණය ගැති වෙමි. අවසන් වශයෙන් මේ ග්‍රන්ථය එළිදැක්වීමේ අවස්ථාව වන තුරු මට නන් අයුරින් අත හිත දුන් සියළු දෙනාට ස්තුති කිරීමට මම මෙය අවස්ථාවක් කර ගන්නෙමි.


අයි. රණසිංහ පෙරේරා
187/2
හරිත පෙදෙස
කැස්බෑව
පිළියන්දල.


2001 අගෝස්තු 15

## පෙරවදන

මෙම ග්‍රන්ථයෙහි අඩංගු කරුණු ගැන යමක් කීමට පෙරාතු ව ග්‍රන්ථයේ ඉලක්ක කණ්ඩායම ගැන යම් පැහැදිලි කිරීමක් කළ යුතුය. මේ ග්‍රන්ථය ලියා ඇත්තේ පුළුල් පැතුරුමකින් යුතු ඉලක්ක කණ්ඩායමක් සඳහා ය. ශ්‍රී ලාංකික ජනතාව අද සිටින මට්ටමට වඩා සමාජ ආර්ථික අතින් හෝ සමාජ යහපැවැත්ම අතින් ඉදිරියට ගෙන යාම සඳහා කිසියම් වූ මෙහෙවරක යෙදෙන කෙනෙකු සිටී ද, යටත් පිරිසෙයින් එවැනි ඉදිරියට යාමක් පිළිබඳ ව බලාපොරොත්තු තබන්නකු හෝ සිටී ද, ඔව්හු සියල්ලෝ ම මේ ග්‍රන්ථයේ ඉලක්ක කණ්ඩායමට ඇතුලත් ය. ඉතා කෙටියෙන් කිවහොත් මේ ග්‍රන්ථය ලියා ඇත්තේ තරාතිරම, උගත් නූගත් බව ආදී වූ මිණුම්දඬු මත කොටු කර ගත් ඉලක්ක කණ්ඩායමකට නො ව පොදුවේ සංවර්ධනය අපේක්ෂා කරන්නා වූ සියල්ලන් සඳහා ය. එබැවින් ග්‍රන්ථයේ ඉලක්ක කණ්ඩායමට බුද්ධිමතුන්, විද්වතුන් ඇතුලත් ය. කුමන දේශපාලන මතයක් දැරුවත් පාලකයන් හෝ බලධාරීන් ද ඇතුලත් ය. පාලනය ක්‍රියාවට නගන්නා වූ රාජ්‍ය නිලධාරීන් ඇතුලත් ය. පාලිතයන්, සේවකයන්, ස්වාමියන් ඇතුලත් ය. ආගම කුමක් වුවත් පූජකයන් ද, චින්තනය ජාතික වුවත් විජාතික වුවත්, සියළු ආකාරයේ මත දරන්නා වූ චින්තකයන් ද මෙහි ඉලක්ක කණ්ඩායමට ඇතුලත් ය. ඉතා කෙටියෙන් කිවහොත් මේ ග්‍රන්ථය ලියා ඇත්තේ ඉදිරියට යාමේ උවමනාවක් තිබෙන්නා වූ සියළු පාර්ශවයන්ට අයත් ජන කොටස් සඳහා ය.

ඉලක්කය යන වචනයේ තේරුම "පුළුල් පැතුරුමක් නැත" යන අරුත යි. වෙනත් වචනවලින් කිව හොත් පුළුල් ලෙස පැතුරුණු තත්ත්වයක් තුල කිසිදු ඉලක්කයක් නැත. තවත් අයුරකින් කියනවා නම් පැතුරුම පුළුල් වන තරමට ඉලක්කය වැරදීමට තිබෙන ඉඩ කඩ වැඩි ය. මේ නිසා මේ ග්‍රන්ථයේ ඉලක්කය තුල කිසිදු ඉලක්කයක් නැතැ යි යමෙකුට තර්ක කළ හැකි ය. මක්නිසා ද? උගත් - නූගත්, පාලක - පාලිත, සේවක - ස්වාමි ආදී වූ සියළු කුලකයන්ට අයත් මනුෂ්‍යයන් එක වර ඉලක්ක කිරීමක දී කිසිවෙකුත් එලදායී ලෙස ඉලක්ක කිරීමට නො හැකි යයි සාධාරණ ලෙස තර්ක කළ හැකි බැවිනි.

පුළුල් පැතුරුමක් සහිත ජන කණ්ඩායමක් මෙම ග්‍රන්ථයේ ඉලක්කය ලෙස යොදා ගෙන තිබෙන්නේ ප්‍රබල හේතු වාදී පදනමක් මත ය. නැතහොත් ප්‍රබල තර්කයක් මත ය. ග්‍රන්ථය කියවන තුරු මේ තර්කය කුමක් දැයි තේරුම් ගැනීම පාඨකයාට අපහසු ය. එහෙත් පාඨකයා පෙරවදන කියවන්නේ ග්‍රන්ථය කුමක් දැයි තේරුම් ගැනීම සඳහා අදහසක් ලබා ගැනීමට බැවින් 'පෙර වදන' පෙර වදනක් වන්නේ පුළුල් පැතුරුමකින් යුතු ඉලක්ක කණ්ඩායමක් තෝරා ගනු ලැබුවේ ඇයි දැයි යන්තමින් හෝ පැහැදිලි කිරීමෙනි.

ශ්‍රී ලාංකිකයන් අද මුහුණ දෙමින් සිටින්නා වූ දිළිඳුකම ඇතුළත් සමාජ ආර්ථික ගැටලුවලට හෝ මිනිස් වටිනාකම් හා සාරධර්ම පිරිහීම පිළිබඳ ගැටලුවලට හඳුනා ගත හැකි වග කිව යුත්තෙකු නැත. පොදු ජනතාවගේ අදහසට අනු ව මේ ගැටලුවලට පාලකයන් වග කිව යුතු ය. පාලකයන්ගේ අදහසට අනු ව පාලිතයන් හෝ පාලනය ක්‍රියාවට නගන්නා වූ නිලධාරීන් වගකිව යුතු ය. ශ්‍රී ලාංකිකයන් මුහුණ දෙන ගැටලු ආර්ථික විශේෂඥයන්ට පෙනෙන්නේ සම්පත් හිඟකම හා සම්පත් කළමනාකරණය පිළිබඳ ගැටලුවක් ලෙස ය. පූජකයන්ට, චින්තකයන්ට, සමාජ ශෝධකයන්ට පෙනෙන්නේ සමාජ සාරධර්ම හා වටිනාකම් පිරිහීම පිළිබඳ ගැටලුවක් ලෙස ය. අධ්‍යාපනඥයන්ට අධ්‍යාපන රටාවේ නො ගැලපීමක් සේ පෙනෙන මේ ගැටලු නීති වේදීන්ට පෙනෙන්නේ නීතිය නිසි ලෙස ක්‍රියාවේ නො යෙදීමක් ලෙස ය. කෙසේ වෙතත්, මේ ග්‍රන්ථය මගින් කතුවරයා ඔප්පු කර සිටින්නේ ශ්‍රී ලාංකිකයන් මුහුණදෙන ගැටලු ඉහත කී කිසිදු හඳුනාගත් පුද්ගල කණ්ඩායමක් නිසා හෝ විශේෂිත විෂයය හේතුවක් නිසා නිර්මාණය වූවක් නො ව ශ්‍රී ලාංකිකයන්ගේ චර්යාවන්ගේ ස්වභාවය නිසා නිර්මාණය වී ඇති බව ය. ශ්‍රී ලාංකිකයන් මුහුණ දෙන කිසිදු ගැටලුවක් හුදකලා කොට යම් හඳුනාගත් පුද්ගල කණ්ඩායමක් මත බර තබා විස්තර කළ නො හැකි බවත්,පාර්ශව කරුවන් ගණනාවකගේ හවුල් දායකත්වයක් මත ගැටලු නිර්මාණය වන බවත් මේ ග්‍රන්ථය පැහැදිලි කර යි. එ පමණක් නො වේ. එක් එක් පාර්ශව කරුවන් ගෙන් ප්‍රමාණවත් පරිදි ලැබෙන සම්මාදම නිසා ගැටලු නො කඩවා පවත්වා ගෙන යාම සිදු වන බව ද, ගැටලු නිර්මාණයේ දායකත්වය නතර කිරීමෙන් හා ගැටලු පවත්වා ගෙන යාමේ සම්මාදම

අත් හිටු වීමෙන් ඒවා විසඳිය හැකි බව ද මේ ග්‍රන්ථය පැහැදිලි කර යි. මේ නිසා ගැටලු නිර්මාණය කිරීමට දායක වන්නා වූ ද, ගැටලු පවත්වා ගෙන යාමට සම්මාදම් වන්නා වූද සියල්ලෝ ම මේ ග්‍රන්ථයේ ඉලක්ක කණ්ඩායමට ඇතුලත් ය. ගැටලු නිර්මාණය හා පවත්වා ගෙන යාම සඳහා එකිනෙකාගෙන් ලැබෙන සම්මාදම කොතෙක් දැයි වටහා ගැනීම සඳහා අවශ්‍යයෙන් ම ග්‍රන්ථය කියවා බැලිය යුතු ය.

ඉලක්ක කණ්ඩායම පුළුල් පරාසයක් වන නිසා මේ ග්‍රන්ථයේ භාෂාව ද බොහෝ ප්‍රවේශමෙන් පරිහරණය කරනු ලැබින. මක් නිසාද? ඉලක්ක කණ්ඩායම පුළුල් වන විට උගත්, නූගත් භේදයකින් තොර ව, විෂය විශේෂඥතා භේදයකින් තොර ව කාටත් තේරුම් ගත හැකි භාෂාවකින් කරුණු ඉදිරිපත් කළ යුතු බැවිනි. මේ ග්‍රන්ථයේ බොහෝ තැන න්‍යායාත්මක විශ්ලේෂණ තිබේ. ගණිතමය ඉදිරිපත් කිරීම් ද තිබේ. එහෙත් මේ කිසිවක් වටහා ගැනීම සඳහා කිසිදු විෂය විශේෂඥතාවක් අවශ්‍ය නැත. පාඨකයා ආර්ථික විද්‍යාව දැන සිටිය යුතු නැත. සමාජ විද්‍යාව දැන සිටිය යුතු නැත. අධ්‍යාපන විද්‍යාව, මානව විද්‍යාව, මනෝ විද්‍යාව, දේශපාලන විද්‍යාව, ගණිතය, ආගම හෝ අනෙකුත් කුමන විෂයක් හෝ දැන සිටිය යුතු නැත. හුදෙක් සාමාන්‍යයෙකු වී සිටීම හොඳටම ප්‍රමාණවත් ය. කුමන සංකීර්ණ දෙයක් වුව ද ඕනෑ ම සාමාන්‍ය පුද්ගලයෙකුට තේරුම් ගත හැකි පරිදි අතිශයින් සරළ ව කිව හැකි ය යන යන රීතිය මෙම ග්‍රන්ථය පුරා ම ප්‍රයෝජනයට ගෙන ඇත. මේ නිසා පුළුල් පැතුරුමක් ඇති ඉලක්ක කණ්ඩායමේ සියළු පාර්ශවයන්ට අයත් පුද්ගලයන්ට ජීර්ණ කර ගත හැකි භාෂාවකින් කරුණු ඉදිරිපත් කිරීම කතුවරයාගේ උත්සාහය විය. එබැවින් මේ ග්‍රන්ථයේ ඉදිරිපත් කිරීම උපමා උපමේයන් මගින් ද, ප්‍රබන්ධ කථා ආදියෙන් ද අති සරළ කොට ඉදිරිපත් කර ඇති අයුරු පාඨකයාට දැක ගත හැකි ය.

මේ ග්‍රන්ථය එක් අතකින් ශාස්ත්‍රීය ග්‍රන්ථයකි. තවත් අතකින් ශාස්ත්‍රීය නො වන ග්‍රන්ථයකි. මෙය පර්යේෂණ ග්‍රන්ථයක් ලෙස ද පර්යේෂණ නො වන ග්‍රන්ථයක් ලෙස ද වර්ග කිරීමට පදනමක් තිබේ. ශාස්ත්‍රීය ග්‍රන්ථයක් සේ සැලකිය හැක්කේ විවිධ ශාස්ත්‍රීය විෂයයන් තුල වග විභාග වන කරුණු මේ ග්‍රන්ථය තුල ද වග විභාග වන නිසා ය.

ශාස්ත්‍රීය නො වන ග්‍රන්ථයක් සේ සැලකිය හැක්කේ කිසිදු විෂය විශේෂඥතා දැනුමකින් තොර ව මෙහි පෙළ ගැසෙන කරුණු ඕනෑ ම සාමාන්‍ය පුද්ගලයෙකුට තේරුම් ගත හැකි නිසා ය. මෙය පර්යේෂණ ග්‍රන්ථයක් සේ සැලකිය හැක්කේ ගවේෂණාත්මක තොරතුරු පදනමක් මත ග්‍රන්ථයේ පෙළ ගැස්ම සිදු වන නිසා සහ නව දැනුමක් හා නව මත වාදයක් ගොඩ නැගීමට ග්‍රන්ථය මග පාදන නිසා ය. පර්යේෂණ ග්‍රන්ථයක් නො වන්නේ සාම්ප්‍රදායික පර්යේෂණයක පරිද්දෙන් උපන්‍යාස පරීක්ෂාවක් හෝ පර්යේෂණ ප්‍රශ්න පත්‍රයකට පිළිතුරු සැපයීමත් මෙ මගින් සිදු නො වන නිසා ය. කරුණු කුමක් වුව ද, මේ ග්‍රන්ථය පර්යේෂණ ග්‍රන්ථයක් සේ හඳුන්වා දීමට කතුවරයා මනාප ය. මක් නිසා ද? මුලින් කී සියළු හේතූන් යටපත් කොට පර්යේෂණ ග්‍රන්ථයක් වශයෙන් හඳුන්වා දීමට ප්‍රමාණවත් හේතූන් මේ ග්‍රන්ථය තුළ බහුල ව ඇති බැවිනි.

මේ ග්‍රන්ථයේ තොරතුරු පදනම මුළුමනින් ම ගවේෂණාත්මක උත්සාහයක ප්‍රතිඵලය කි. ග්‍රන්ථය සම්පාදනය කිරීම උදෙසා කතුවරයා ශ්‍රී ලාංකික ජන චර්යාව හෙළිදරව් කරන බොහෝ පොත පත කියවා වසර කීපයක් පුරා සටහන් තබා ගත්තෙහි ය. අනතුරු ව පොත පතින් උකහා ගත් තොරතුරුවල වලංගු භාවය පරීක්ෂා කිරීම සඳහා ශ්‍රී ලාංකික ජන චර්යාව පිළිබඳ ව සංවිධිත නිරීක්ෂණ කළෙහි ය. එමතු ද නො ව ග්‍රන්ථය සම්පාදනය කිරීමේ කිසිදු අදහසක් නො පැවති අවධියේ වසර විසි ගණනක් පුරා කතුවරයා ලැබූ අත්දැකීම් සංවිධිත නිරීක්ෂණ සමඟ සසැඳුවෙහි ය. එපමණක් ද නො වේ. කතුවරයා ගෙන් පිටස්තර වූ විවිධ පුද්ගලයන්ගෙන් ද ලබා ගත් අදහස්, උදහස් මති මතාන්තර ගොනු කොට ඒවා පොත පතෙහි හෙළිදරව් කර ඇති කරුණු සමඟ ද, කතුවරයාගේ නිරීක්ෂණ සමඟ ද ගලපා අවසන් විනිශ්චයන්ට පැමිණියෙහි ය. මේ නයින් බැලූ කල මෙම ග්‍රන්ථය උපන්‍යාස පරීක්ෂාවක් නො මැති නමුත් පර්යේෂණ ග්‍රන්ථයක් සේ සැලකීමට බොහෝ සාධක තිබේ.

කතුවරයාගේ සැලසුමට අනුව ග්‍රන්ථය වෙළුම් දෙකකින් හා පරිච්ඡේද අටකින් යුතු ය. පළමු වෙළුම තුළ පෙළ ගැසෙන්නේ පළමු වැනි පරිච්ඡේදයේ සිට සිව් වැනි පරිච්ඡේදය දක්වා වූ තොරතුරු පමණ ය.

දෙවැනි වෙළුම තුළ පස් වැනි පරිච්ඡේදයේ සිට අට වැනි පරිච්ඡේදය දක්වා වූ තොරතුරු පෙළ ගැසේ.

ග්‍රන්ථයේ එක් පරිච්ඡේදයකින් ගොනු කරන තොරතුරු අනතුරු ව එන පරිච්ඡේදය සමඟ තාර්කික සම්බන්ධතාවක් පවත්වයි. මේ නිසා මුල් පරිච්ඡේද නො කියවා අනතුරු ව එන පරිච්ඡේද කියවීම එතරම් සුදුසු වන්නේ නැත. මක් නිසාද? මුල් පරිච්ඡේද තුළ ඉදිරිපත් කරන තොරතුරු පදනම පසු පරිච්ඡේදවල ආරම්භක පසුබිම වන නිසා පසු පරිච්ඡේද තේරුම් ගැනීමට මුල් පරිච්ඡේද කියවා තිබීම පූර්ව සුදුසුකමක් වන බැවිනි. ග්‍රන්ථයේ පළමු වෙළුමේ පළමු පරිච්ඡේදය සමාජ සජීවීකරණයට හැඳින්වීමක් සැපයීම සඳහා වෙන් කර ඇත. සමාජ සජීවීකරණය යන්නට වර්තමානයේ ලැබී තිබෙන අර්ථකථනය වෙනුවට නව අර්ථකථනයක් සැපයීම පළමු පරිච්ඡේදය තුළ සිදු වේ.

දෙවැනි පරිච්ඡේදයේ සාකච්ඡා වන්නේ සමාජ සජීවීකරණයක අවශ්‍යතාවක් මතු ව තිබෙන්නේ ඇයි ද යන්න යි. බටහිර රටවලට උවමනා නො වූ සමාජ සජීවීකරණයක් නැගෙනහිර රටවලට උවමනා වී ඇත්තේ ඇයි ද යන්න මේ පරිච්ඡේදය තුළ සියුම් පරීක්ෂාවකට භාජනය කරනු ලබයි. මීට අමතර ව සමාජ සජීවීකරණයේ අවශ්‍යතාවක් පැන නැඟී තිබෙන්නේ ගැටලු විසඳා ගැනීමට හා අවස්ථාවලින් නිසි පරිදි ප්‍රයෝජන ගැනීමට බව ඔප්පු කර සිටීම මේ පරිච්ඡේදයේ අරමුණ වේ.

තුන් වැනි පරිච්ඡේදය බැලූ බැල්මට ගණිතමය පදනමක් මත විස්තර වන න්‍යායාත්මක විශ්ලේෂණයක් සේ පාඨකයාට පෙනී යා හැකි ය. ග්‍රන්ථය කියවීමට සූදානම් ව සිටින පාඨකයා වෙනුවෙන් කතුවරයා මෙහිදී යමක් අවධාරණය කර කිව යුතු ය. එනම්, මතුපිටින් පෙනෙන ස්වභාවය දෙස බලා තුන් වැනි පරිච්ඡේදය පිළිබඳ ව පාඨකයා කලබලයට පත් විය යුතු නැති බව යි. මේ පරිච්ඡේදයේ සාකච්ඡා වන කරුණු තේරුම් ගැනීම සඳහා පාඨකයා ගණිතය දැන සිටිය යුතු නො වේ. කිසියම් විෂය විශේෂඥයකු විය යුතු ද නො වේ. තුන් වැනි පරිච්ඡේදයේ ඉදිරිපත් වන කරුණු බොහෝ විට ශාස්ත්‍රීය නැඹුරුවක් ඇති කරුණු බව සැබෑ ය. එහෙත් ඒවා අති සරළ කොට උපමා

උපමේය සමඟ ද, පාඨකයාගේ දෛනික අත්දැකීම සමඟ ද මිශ්‍ර කොට ඉදිරිපත් කර ඇති බැවින් එහි කිසිදු ශාස්ත්‍රීය බවක් පාඨකයාට නො දැනෙනු ඇත. තුන් වැනි පරිච්ඡේදය තුළ දී මනුෂ්‍ය චර්යාව විග්‍රහ කරන්නා වූ ගණිතමය ආකෘතියක් ගොඩ නැගෙන නමුදු එය මුළුමනින් ම ශ්‍රී ලාංකික ජන සමාජය සම්බන්ධ තොරතුරු හා අත්දැකීම් මත ගොඩ නැගෙන නිසා ගණිතමය තර්කයක් ඒ තුළ ඇතැයි පාඨකයාට මුළුමනින් ම නො දැනී යනු ඇත.

මේ ග්‍රන්ථයේ පළමු වෙළුමේ අවසන් පරිච්ඡේදය වන සිව් වැනි පරිච්ඡේදයෙන් විමසා බලන්නේ සමාජ සජීවීකරණය සඳහා ශ්‍රී ලාංකිකයන් ගත යුතු මග කුමක් ද යන්න යි. මේ පරිච්ඡේදය තුළ දී ප්‍රධාන මත වාද දෙකක් පරීක්ෂාවට ලක් කරන අතර ඉන් සාධනය කළ හැකි මතය හා සාධනය කළ නො හැකි මතය කුමක් දැයි තේරුම් ගැනීම සඳහා කතුවරයා ප්‍රමාණවත් තොරතුරු සම්භාරයක් ඉදිරිපත් කරන්නේ ය. මේ මත වාද මොනවා දැයි පැහැදිලි කිරීම සඳහා පෙර වදන ප්‍රමාණවත් නො වන බැවින් ග්‍රන්ථය කියවා බැලීම සඳහා කතුවරයා පාඨකයාට ආරාධනය කරන්නෙ හි ය.

හතර වැනි පරිච්ඡේදයෙන් සමාජ සජීවීකරණය පිළිබඳ ග්‍රන්ථයේ පළමු වෙළුම අවසන් ය. පළමු වෙලුම අවසන් වන විට සමාජ සජීවීකරණය යනු කුමක්ද? යන්නත්, එහි අවශ්‍යතාව කුමක්ද? යන්නත්, සමාජ සජීවීකරණය සඳහා ගත යුතු මග කුමක්ද යන්නත් පැහැදිලි කර අවසන් ය. මේ නිසා දෙවැනි වෙලුම මුළුමනින් ම වෙන් වන්නේ සමාජ සජීවීකරණය සඳහා අනුගමනය කළ යුතු ප්‍රතිපත්ති හා ක්‍රියා මාර්ග සාකච්ඡා කිරීමට ය. දෙවැනි වෙලුළු පළමු වෙලුමෙන් මුළුමනින් ස්වාධීන නැතත් එක් එක් වෙළුම වෙන් වෙන් වශයෙන් කියවීමට බාධා ඇති නො වන පරිදි මේ ග්‍රන්ථය සකස් කර තිබේ. දෙවැනි වෙළුම මේ වන විටත් සැකසෙමින් පවතින නිසා දෙවැනි වෙළුමේ අන්තර්ගතය ගැන පැහැදිලි කිරීමක් දෙවන වෙලුම සම්පාදනය අවසානයේ දී සිදු වනු ඇත.

## පටුන


| | පිටුව |
|---|---|
| පිදුම | iii |
| අධ්‍යක්ෂ වරයාගෙන් | iv |
| ස්තුතිය | viii |
| පෙරවදන | xi |

### 1 පරිච්ඡේදය

| | |
|---|---|
| හැඳින්වීම | 01 |
| සමාජ සජීවිකරණයේ දියාරු බව | 07 |
| සමාජ සජීවිකරණය යනු කුමක්ද? | 12 |
| සමාජයෙන් කොටසක් නො ව සමස්ත සමාජය | 22 |
| කාල නිශ්චයක් සහිත ව්‍යාපෘතියක් නො ව නො කඩවා දිවෙන ක්‍රියාදාමයක් | 24 |
| දේශපාලන පැලැස්තරයක් නො ව සමාජ සංවර්ධන උපාය මාර්ගයක් | 25 |
| පටරනු ලැබූ කොන්ත්‍රාත්තුවක් නො ව සියල්ලන්ගේ ම සම්මාදමක් | 26 |
| නාම මාත්‍රික සජීවිකාරකයෙක් නො ව සැබෑ සජීවිකාරකයෙක් | 27 |
| බල කිරීමක් නො ව පෙළඹවීමක් | 29 |
| අතිශයෝක්තියක් නො ව සමාජ යථාර්ථයක් | 31 |

### 2 පරිච්ඡේදය

| | |
|---|---|
| සමාජ සජීවිකරණයක අවශ්‍යතාව | 36 |
| ගැටලු | 40 |
| සමාජ සජීවිකරණයක් සඳහා පාදක වන ගැටලු | 46 |
| අවස්ථා | 54 |

## 3 පරිච්ඡේදය


| | |
|---|---|
| ශ්‍රී ලාංකිකයන්ගේ සමාජ චර්යාව | 71 |
| චර්යා ශ්‍රිතය | 75 |
| මනුෂ්‍ය චර්යාව සම්බන්ධ දෙන ලද තත්ත්වයන් හෙවත් නියත සාධක | 81 |
| භෞතික පරිසර නියතය | 81 |
| සමාජ පසුබිම් නියතය | 82 |
| සමාජ පසුබිම හා ජන චර්යාව, ඉතිහාසය හා වර්තමානය | 90 |
| පරිහාණියට පත් වූ ශ්‍රී ලාංකිකයෝ | 91 |
| මෑත ඉතිහාසයට තොරතුරු පදනමක් | 99 |
| සමාජ පසුබිම නියතය හා බැඳුණු සජීවීකරණයේ බාධක චර්යා | 101 |
| අධිපති වාදය | 102 |
| පරායත්ත මානසිකය | 121 |
| උච්චායම | 136 |
| සම්පත් නියතය | 144 |
| සම්භව නියතය | 149 |
| අලසකම හා අකාර්යක්ෂමතාව | 153 |
| වහා අමතක වන බව හා වැනෙන බව | 160 |
| බොරුව හා රැවටීම | 162 |


## 4 පරිච්ඡේදය


| | |
|---|---|
| සමාජ සජීවීකරණය සඳහා ගත යුතු මග | 186 |
| චර්යා වෙනස පිළිබඳ මත වාද | 187 |
| පැරණි සමාජ වටිනාකම්, විශ්වාස හා සිතුම් පැතුම් | 190 |
| සමාජය භීෂණයට ලක් කළ දඬුවම් | 194 |
| නාමික බෞද්ධයන් වූ සැබෑ බෞද්ධයන් නො වූ ශ්‍රී ලාංකිකයෝ | 195 |
| බටහිර බලපෑම හා සමාජ චර්යාව | 199 |
| ශ්‍රී ලාංකිකයන්ගේ නාමික ප්‍රජාතන්ත්‍රවාදය | 201 |
| ශ්‍රී ලාංකික ප්‍රජාතන්ත්‍රවාදයේ සමාජ නිර්මාණය | 205 |

පැරණි සමාජ මෙවලම් හුවා දක්වන අතුරු තර්ක 209
සුද්දන්ගේ අසද්භාවය හා වෙස් වලාගත් ආශිර්වාදය 215
සජීවීකරණය පිළිබඳ විද්වතුන්ගේ අදහස් 217
ආශ්‍රිත ග්‍රන්ථ 223

# 1 පරිච්ඡේදය

## හැඳින්වීම

සමාජ සජ්වීකරණය පිළිබඳ ව ලියා ඇති මේ ග්‍රන්ථය කියවීම සඳහා ඔබ පළමු පරිච්ඡේදයට පිවිස සිටිත්. එහෙත් පළමු පරිච්ඡේදය කියවීමට පෙර ග්‍රන්ථයේ පෙරවදන කියවීම සුදුසු යයි මම යෝජනා කරමි. මක් නිසාද? පෙරවදන, ග්‍රන්ථය කියවීම සඳහා ඔබ සූදානම් කර තබන බැවිනි. එබැවින් ඔබ මෙතෙක් පෙරවදන නො කියවා සිටියේ නම් එය කියවා පළමු පරිච්ඡේදයට පිවිසෙන්න.

'සමාජ සජ්වීකරණය' ශ්‍රී ලංකාවේ වර්තමාන සංවර්ධනය ගැන කතා කරන බොහෝ දෙනෙකුගේ පොදු මාතෘකාවක් වී තිබේ. සමාජ විද්‍යාඥයෝ ද, ආර්ථික විද්‍යාඥයෝ ද, කෘෂිකර්ම, කර්මාන්ත ආදී ක්ෂේත්‍රයන් සඳහා ජනතාව පොළඹවන විපර්යකාරකයෝ ද, දේශපාලකයෝ ද, ප්‍රතිපත්ති සම්පාදකයෝ ද, ස්වේච්ඡා සංවිධාන කටයුතුවල යෙදෙන්නෝ ද, සංවර්ධන ව්‍යාපෘති සඳහා ආධාර අනුබල ලබා දෙන්නෝ ද, රාජ්‍ය නිලධාරීහු ද, විවිධ ගණයේ විද්වත්හු ද පර්යේෂකයන් හා විශේෂඥයෝ ද තම තමන්ට හැඟෙන පරිදි, තම තමන් අත්දැක ඇති පරිදි, තම තමන්ගේ විෂය ඥානයට වැටහෙන පරිදි සමාජ සජ්වීකරණය විස්තර කරති. සමාජ සජ්වීකරණය මෙකී සියලු කුලකවලට අයත් ක්‍රියාකාරීන්ගේ අවධානයට යොමු වූ පොදු මාතෘකාවක් වී ඇත්තේ එයට ඔවුන් තුළ ඇති විශේෂ කැමැත්තක් නිසා නො ව ඔවුන්ගේ කටයුතු ඵලදායී ව කර ගෙන යාමට අනුබල නො දෙන්නා වූ බාධාකාරී සමාජ පසුබිමක් ශ්‍රී ලාංකික ජන සමාජය තුළ මුල් බැස ගෙන ඇති බැවිනුත්, මෙකී බාධාකාරී සමාජ පසුබිම ජය ගැනීමේ උපාය මාර්ගයක් වශයෙන් එය සාකච්ඡාවට භාජනය වී ඇති බැවිනුත් ය.

ශ්‍රී ලාංකික ජන සමාජය සමාජ - ආර්ථික වශයෙන් ඉදිරියට ගෙන යාම සඳහා සැලසුම් සහගත ජනතා පෙළඹවීමක් අවශ්‍ය බවත්, ජනතාව තුළ යම් ආකාරයක ආකල්පමය පරිවර්තනයක් සිදු විය යුතු බවත් ඉහත කී ක්‍රියාකාරීන්ගේ පොදු අත්දැකීම මෙන් ම පිළිගැනීම ද වී තිබේ. සමාජ සජ්වීකරණ ක්‍රියාවලිය මෙකී පෙළඹවීම හා

ආකල්පමය පරිවර්තනය සඳහා යෝග්‍ය ප්‍රතිකර්මයක් වන බව බොහෝ අය විශ්වාස කරති. කෙසේ වුවත්, සමාජ සජීවීකරණය නමින් නිශ්චිත වූ විෂය මාතෘකාවක් සමාජ විද්‍යාවේ, මානව විද්‍යාවේ, සමාජ - මානව විද්‍යාවේ, ආර්ථික විද්‍යාවේ, දේශපාලන විද්‍යාවේ, දේශපාලන - ආර්ථික විද්‍යාවේ හෝ වෙනත් කිසිදු සම්බන්ධිත විෂයක සාකච්ඡා නො වේ. මේ නිසා එක් අතකින් සමාජ සජීවීකරණය ඉහත කී සියලු දෙනාගේම මාතෘකාවක් යයි කිව හැකි ය. නවත් අතකින් එය කවරෙකුගේවත් මාතෘකාවක් නො වන්නේ යැයි ද කිව හැකි ය.

> සමාජ සජීවීකරණය කවරෙකුගේවත් මාතෘකාවක් නො වේ යයි යමෙකුට කිව හැකි ය. එහෙත් තවෙකෙකුට කිව හැක්කේ එය සියලු දෙනාගේ ම මාතෘකාවක් බව යි. අපේ ජන සමාජය සමාජ ආර්ථික අතින් හා යහපැවැත්ම අතින් ඉදිරියට ගෙන යාමේ උවමනාවක් ඇති සියලු දෙනා සමාජ සජීවීකරණය පිළිබඳ ව අවධානය යොමු කිරීම අවශ්‍ය බව පෙනේ.

ග්‍රන්ථයේ හැඳින්වීම වන මේ පරිච්ඡේදය තුළ මා අදහස් කරන්නේ සමාජ සජීවීකරණය පිළිබඳ ව ඉතා කෙටි හැඳින්වීමක් සපයා ග්‍රන්ථයට ප්‍රවිෂ්ඨයක් ලබා දීමට යි. කෙසේ වෙතත්, සමාජ සජීවීකරණය පිළිබඳ ව ලියා ඇති මෙම ග්‍රන්ථය කියවීමට සූදානම් වන පාඨකයෙකු වන ඔබ ඉහත ජේදය කියවීමෙන් පසු එක්තරා විමතියකටත්, කුතුහලයකටත්, කුකුසකටත් පත්වන්නට ඇතැයි මට සිතේ. මන්ද? සමාජ සජීවීකරණය කවරෙකුගේවත් මාතෘකාවක් නො විය හැකි යයි ද, ඇතැම් විට එය සැම දෙනාගේ ම මාතෘකාවක් විය හැකි යයි ද, එමෙන් ම කිසිදු විෂයයක නිශ්චිත මාතෘකාවක් ලෙස සජීවීකරණය සාකච්ඡා නො වන්නේ යයි ද පවසමින් මා සජීවීකරණය පිළිබඳ ව දීර්ඝ වශයෙන් සාකච්ඡා කරන්නට යන්නේ කුමන ස්ථාවරයක පිහිටා දැ යි ඔබට නො කී බැවිනි. අනෙක් අතට ඉහත කී කුලකයන්ට අයත් වියතුන් තම තමන්ට හැඟෙන පරිදි සජීවීකරණය විස්තර කරන්නේ නම් මා අයත් වන කුලකය කුමක්ද යන්න දැන ගැනීමටත්, සජීවීකරණය ගැන දීර්ඝ වශයෙන් සාකච්ඡා කිරීමට මා වෙත ඇති සුදුසුකම කුමක් ද යන්න දැන ගැනීමටත්, පාඨකයා වශයෙන් ඔබ තුළ කුතුහලයක් ඇති විය හැකි ය. මේ නිසා මෙම ග්‍රන්ථයට හැඳින්වීමක් ලබා දීමට පෙර මෙකී ප්‍රශ්නවලට සරළ පිළිතුරු

ලබා දීමෙන් ඔබ නිරවුල් ව තබා ගැනීමට මම ප්‍රථමයෙන් උත්සාහ ගනිමි.

## සමාජ සජ්වීකරණය සියලු දෙනාගේ ම මාතෘකාවක් වන්නේ යයි කීවේ ඇයි?

හැදින්වීමේ පළමු ඡේදයේ දී කීවාක් මෙන් සමාජ සජ්වීකරණය සියලු දෙනාගේ ම පොදු මාතෘකාවක් වී තිබේ. එසේ වීමෙහි කිසිදු වරදක් ද නැත. සිදු විය යුතු ව ඇත්තේ ද එය ය. පළමු ඡේදයේ මා සඳහන් කළ බොහෝ කුලකවලට අයත් ක්‍රියාකාරීන්ට තම තමන්ගේ කාර්ය ඉටු කර ගෙන යාමේ දී මෙරට ජන සමාජය තුළ පවතින පසුගාමී ස්වභාවය හෝ මන්දගාමී ස්වභාවය පුන පුනා අත්දකින්නට සිදු වූ බාධාකාරී සමාජ සංසිද්ධියක් බව අලුතින් කිව යුතු නො වේ. මෙම ප්‍රතිගාමී සමාජ පරිසරය ජය ගැනීම සඳහා සංවර්ධනයේ නියමුවන්, දායකකාරකාදීන් ඔවුනොවුන් ප්‍රගුණ කළ විෂය සීමාවෙන් ඔබ්බට ගොස් යම් සමාජමය පෙළඹවීම් කාර්යභාරයක ද නියුක්ත විය යුතු ව තිබේ. මෙකී කාර්යභාරය සමාජ සජ්වීකරණය වශයෙන් මෙම ග්‍රන්ථය මඟින් පසු ව විස්තර කෙරෙන අතර එය සංවර්ධනයේ ප්‍රධාන පෙළේ නියමුවන් හා දායකයන් වන සියලු දෙනාගේ ම සම්මාදමින් විය යුත්තක් බවට ද කරුණු ඉදිරිපත් කෙරේ. මේ නිසා සමාජ සජ්වීකරණය සියලු දෙනාගේ ම මාතෘකාවක් වන්නේ යයි මම කීමි.

## සමාජ සජ්වීකරණය කවරෙකුගේවත් මාතෘකාවක් නො වන්නේ යයි කීවේ ඇයි?

සමාජ සජ්වීකරණය කවරෙකුගේවත් මාතෘකාවක් නො වන්නේ යයි කීවේ සංවර්ධනයට දායක වන කිසිදු විෂය පථයක් තුළ සමාජ සජ්වීකරණය නම් වූ මාතෘකාවක් සාකච්ඡා නො වන බැවිනි. උදාහරණ වශයෙන් සමාජ විද්‍යාව, මානව විද්‍යාව, දේශපාලන විද්‍යාව, සමාජ - මානව විද්‍යාව, ආර්ථික විද්‍යාව යනාදී වූ කිසිදු මූලික සමාජ විද්‍යා විෂයක් තුළ හෝ සංවර්ධනය, සැලසුම්කරණය, පරිපාලනය, කළමනාකරණය, ව්‍යාප්තිකරණය යනාදී වූ විශේෂීකරණයට ලක් වූ විෂයයන් තුළ හෝ සමාජ සජ්වීකරණයක් පිළිබඳ ව සාකච්ඡා නො වේ. මේ නිසා තමා හැදෑරූ, ප්‍රගුණ කළ,

කිසිදු විෂයයක අන්තර්ගතයක් වශයෙන් හෝ අන්තර්ගතයක කොටසක් වශයෙන් හෝ කිසි විටෙකත් සාකච්ඡා නො කළ මාතෘකාවක් කවරෙකුගේවත් මාතෘකාවක් වන්නේ කෙසේද? සංවර්ධන මැදිහත් කරුවන් අපේක්ෂා කරන පරිදි සැලසුම් කරනු ලැබූ සංවර්ධන කාර්යය ඉටු නො වන්නේ නම් සහ එසේ නො වන්නේ සමාජය තුළ පවතින යම් ප්‍රතිගාමී ස්වභාවයක් නිසා නම් එම ප්‍රතිගාමී ස්වභාවය ජය ගන්නා ආකාරය ඔවුනට හෙළිදරව් කළෝ කවරහු ද? කවර විෂයයක් ද? මේ නිසා සංවර්ධනය මෙහෙයවනු ලබන විෂය විශේෂඥයෝ ඔවුන් අපේක්ෂා කළ අරමුණු ඉටු නො වීම පිළිබඳ වගකීමෙන් නිදහස් ය. මන්ද? එවැනි පසුගාමීත්වයක් ජයගන්නා අයුරු ඔවුන් උගත් විෂය අන්තර්ගතවල ඇතුළත් නො වූ බැවිනි. ඔව්හු නිලධාරීහු, පරිපාලකයෝ, ආර්ථික විද්‍යාඥයෝ, සමාජ විද්‍යාඥයෝ, කෘෂි විද්‍යාඥයෝ, සැලසුම් සම්පාදකයෝ, පර්යේෂකයෝ, කළමනාකරුවෝ හෝ අනෙකුත් විෂය විශේෂඥයන් වශයෙන් පුහුණුව හා ප්‍රවීණතාවක් ලබා ඇති නමුත් සමාජ පසුගාමීත්වයට පිළිතුරු සොයන්නන් වශයෙන් විෂයානුබද්ධ පුහුණුවක් හෝ ප්‍රවීණතාවක් ලබා නැති බැවිනි. එබැවින් සමාජ සජීවීකරණය කවරෙකුගේ වත් මාතෘකාවක් නො වන්නේ යයි මම කීමි.

## සජීවීකරණය කිසිදු විෂයයක නිශ්චිත මාතෘකාවක් නො වේ යයි කීවේ ඇයි?

මෙම ප්‍රශ්නයට මා දැනටමත් පිළිතුරු දී හමාර ය. පෙර මතු කළ ප්‍රශ්නවලට ලබා දුන් පිළිතුරු මෙමප්‍රශ්නයට ද එක සේ ගැළපේ. එබැවින් එකී පිළිතුරු නැවතත් කීම පුන පුනා කීමක් වන බැවින් මම මේ ප්‍රශ්නයට පිළිතුරු දීමෙන් වැළකී සිටිමි. ඉතා කෙටියෙන් කිව හොත් සමාජ සජීවීකරණය කිසිදු විෂයක නිශ්චිත මාතෘකාවක් නො වේ යයි ප්‍රකාශ කරනු ලැබුවේ එය කිසිදු විෂයයක නිශ්චිත මාතෘකාවක් වශයෙන් සාකච්ඡාවට නො ගැනෙන බැවිනි. කෙසේ වෙතත් මා මේ ග්‍රන්ථය ලියන්නාක් මෙන් විවිධ ග්‍රන්ථවල හා ලියකියවිලි වල සමාජ සජීවීකරණය යන යෙදුම හා එකී ක්‍රියාවලිය විවිධාකාරයෙන් සාකච්ඡාවට භාජන වී ඇත. උදාහරණයක් ලෙස ෂෙඕන් සහ යුනිසෙෆ් වාර්තාවලට අනුව සජීවීකරණයේ නිර්වචන

බොහෝ විට පුද්ගල නි:ශ්‍රිත බවක් පෙන්වයි (Schoen, 1996), (Unicef, 1986). එබැවින් සමාජ සජීවීකරණය සඳහා මෙම ග්‍රන්ථය තුළ පැනෙන නිර්වචනයන් ද ලේඛකයාගේ අත්දැකීමෙන් ස්වාධීන වූවක් සේ නො සැලකුව මනා ය.

## කතුවරයා අයත් වන්නේ කුමන කුලකයකට ද? සමාජ සජීවීකරණය ගැන කතා කිරීම සඳහා කතුවරයා ලත් සුදුසුකම කුමක්ද?

මෙම උපමා‍තෘකාව මගින් මම එකිනෙකට සම්බන්ධ වූ යුගල ප්‍රශ්නයක් මතු කළෙමි. සමාජ සජීවීකරණය ගැන දීර්ඝ වශයෙන් කරුණු සෙවීමට යන පාඨකයාට මෙම ප්‍රශ්නයේ දෙකොටස ම එක සේ වැදගත් විය හැකි ය. ප්‍රශ්නයේ එක් එක් කොටස ඉතා සංක්ෂිප්ත ව, එහෙත් වෙන් වෙන්ව සාකච්ඡා කිරීමට උත්සාහ ගනිමි.

සමාජ සජීවීකරණය ගැන අදහස් ඉදිරිපත් කිරීම, විස්තර කිරීම හා මත වාදයන් ගොඩනැගීම ඒ ඒ විෂය කුලකවලට අයත් තැනැත්තන් ප්‍රගුණ කළ විෂය, ඔවුනොවුන් ලැබූ අත්දැකීම් මත සිදු වන්නක් බව, හැඳින්වීමේ පළමු ඡේදයේදී ම සඳහන් කළා ඔබට මතක ඇතැයි සිතමි. මේ නිසා කතුවරයා අයත් වන්නේ කුමන කුලකයකට දැයි දැනගැනීමට ඔබට දැඩි කුතුහලයක් තිබිය හැකි ය.

සමාජ සජීවීකරණය ගැන ග්‍රන්ථයක් ලිවීමට මා අදහස් කළත්, මම ද අනෙකුත් අය මෙන් ම සජීවීකරණය හැදෑරුවෙක් නො වෙමි. යමෙකුට හැදෑරීමට එවැනි විෂයයක් හෝ මාතෘකාවක් නොමැති බව මා මීට පෙර ද සඳහන් කළා ඔබට මතක ඇත. කාර්ය මූලික පදනමක් මත මා හඳුනා ගැනීමට ඔබ කැමති නම් මම සමාජවිද්‍යා ක්ෂේත්‍රයේ නියුතු වෘත්තීයමය පර්යේෂකයෙක් ද පුහුණුකරුවෙක් ද වෙමි. විෂය මූලික පදනමක් මත මා හඳුනාගැනීමට ඔබ කැමති නම් මම මූලික වශයෙන් අර්ථශාස්ත්‍රඥයෙක්මි. ද්විතීයික වශයෙන් ව්‍යාපෘතිකරණය හැදෑරුවෙක් වෙමි. තෘතීයික වශයෙන් සංවර්ධනයත්, මනුෂ්‍යයා ලබන පුහුණුවත් අතර සබඳතා හදාරමින් සිටින්නෙක්මි. මීට අමතර ව සමාජ විද්‍යාව, සමාජ - මානව විද්‍යාව, වැඩිහිටි මනෝවිද්‍යාව,

වැඩිහිටි පුහුණුව, කළමනාකරණය යනාදී වැඩිහිටි මනුෂ්‍ය චර්යාවන් කේන්ද්‍රගත වූ විෂයයන් කිහිපයක් ශාස්ත්‍රීය වශයෙන් හදාරනු ලැබ ඒවායේ වලංගුභාවය පරීක්ෂා කරමින් සිටිමි.

සමාජ සජීවිකරණය පිළිබඳ මා සාකච්ඡා කරන්නට යන දැ කුමන ශාස්ත්‍රීය පසුබිමක සිට සාකච්ඡා කරනු ඇද්ද යන්න පිළිබඳ ව ඔබට දැන් පැහැදිලි අදහසක් ඇත. මා යම් කුලකයකට ඇතුළත් කළ යුතු යයි ඔබ සිතන්නේ නම් එසේ කිරීම ඔබට අයත් කාර්යයකි. එමෙන් ම මේ ග්‍රන්ථයේ අන්තර්ගතය තුළ සාකච්ඡා කරන දැ ප්‍රතික්ෂේප කිරීම, පිළිගැනීම, නැවත වග විභාග කර බැලීම, විකල්ප මතවාදයන් ගොඩ නැගීම හෝ අලුත් අදහස් එකතු කිරීම ද ඔබගේ කාර්යයක් වේ.

ම විසින් මතු කරනු ලැබූ ප්‍රශ්නයේ දෙවැනි කොටස නම් සමාජ සජීවිකරණය පිළිබඳ ව දීර්ඝ වශයෙන් සාකච්ඡා කරන්නට කතුවරයා ලැබූ සුදුසුකම හෝ අත්දැකීම කුමක් ද යන්න යි. කතුවරයා හැරුණු විට දහස් ගණනින් වූ වෙනත් තැනැත්තන් ද ඉහත කී විෂයයන් ශාස්ත්‍රීය වශයෙන් හදාරා තිබිය හැකි අතර භාවිතය තුළ ක්‍රියාත්මක කර ද තිබිය හැකි ය. එබැවින් මෙම ක්ෂේත්‍රයන්හි නියුතු දහස් ගණනින් වන ක්‍රියාකාරීන් අතර මා එක් අයෙකු පමණි. කෙසේ වෙතත්, වසර විසි පහක් පමණ කාලයක් තුළ ප්‍රජා සංවිධාන කටයුතු හා විපර්යකාරක කටයුතුවල නිරතවීමෙන් ද, ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශ, විවිධ ජන කණ්ඩායම් හා විවිධ සමාජ ස්ථරවලට අදාළ ව ක්‍රියාත්මක කරන ලද සමාජ සජීවිකරණය සම්බන්ධ වූ පර්යේෂණ අත්හදා බැලීම්වලට සම්බන්ධ වීම නිසා ද, සමාජ සජීවිකරණ ක්ෂේත්‍රයේ පුහුණුකරුවෙකු ලෙස දිගු කලක් කටයුතු කිරීමෙන් ද ඒකරාශි වූ අත්දැකීම් සම්භාරයක් මා සතු ව ඇති අතර ඒවා සටහන් කර තැබීම කාලීන අවශ්‍යතාවක් යයි මම විශ්වාස කරමි. මා ප්‍රථම වරට වෘත්තියකට පිවිසුණේ විපර්යකාරකයෙකු (අදට ගැළපෙන වචනය නම් සමාජ සජීවිකාරකයෙකු) වශයෙන් නිසාත්, අනතුරු ව අදාළ ක්ෂේත්‍රයෙහි ම වෘත්තියමය පුහුණුකරුවෙකු හා පර්යේෂකයෙකු වශයෙන් කටයුතු කරනු ලබන නිසාත්, මෙවැනි ග්‍රන්ථයක් සම්පාදනය කිරීම සඳහා යමෙකු කලාතුරකින් ලබන සුදුසුකමක් මා ලබා ඇතැයි ද හැගේ.

හැදින්වීම නම් වූ ප්‍රථම පරිච්ඡේදය තුළ මා මෙතෙක් උත්සාහ ගත්තේ ග්‍රන්ථයට හැදින්වීමක් සැපයීමට නො ව 'හැදින්වීම' කියවීමට පෙරාතුව ම පාඨකයා තුළ ඇති විය හැකි යයි උපකල්පනය කළ ප්‍රශ්නවලට පිළිතුරු සපයා පාඨකයා නිරවුල් ව තබා ගැනීමට යි. හුදෙක් ඒකපාර්ශවික දෘෂ්ඨිකෝණයක සිට කතුවරයා ඉදිරිපත් කරන දේ පාඨකයා වෙත පටවා යැවීම මෙම ග්‍රන්ථයේ අරමුණ නො වේ. කතුවරයා හා පාඨකයා අතර කෙරෙන සංවාදශීලී සාකච්ඡාවක් මගින් තොරතුරු විවරණය කරගැනීම මෙම ග්‍රන්ථයේ පළමු පරිච්ඡේදයේ තොරතුරු ඉදිරිපත් කිරීමේ ක්‍රම වේදය යි. අවාසනාවකට මෙන් වරෙක පාඨකයා ලෙස ප්‍රශ්න ඇසීමෙනුත්, තවත් වරෙක කතුවරයා ලෙස පිළිතුරු දීමෙනුත් සංවාදය පවත්වා ගෙන යාමට සිදු ව ඇත්තේ එක ම පුද්ගලයෙකුට වීම වැළැක්විය නො හැකි ය.

මේ පරිච්ඡේදයේ ප්‍රධාන පරමාර්ථ දෙක කි. ඉන් පළමුවැන්න නම් 'සමාජ සජීවීකරණය' නම් වූ මාතෘකාවට කෙටි හැදින්වීමක් සැපයීම මගින් ග්‍රන්ථයට ප්‍රවිෂ්ඨයක් ඇති කිරීම යි. දෙවැන්න නම් ග්‍රන්ථයේ ඉදිරි පරිච්ඡේද තුළ දී සාකච්ඡාවට භාජන වන කරුණු පහසුවෙන් ග්‍රහණය කර ගැනීම සඳහා පාඨකයාට පසුබිමක් සැපයීම යි. මේ නිසා සමාජ සජීවීකරණය පැහැදිලි ලෙස අර්ථ දක්වා ගැනීම, එම භාෂාමය යෙදුමෙහි සුදුසුකම් පිරික්සීම, සජීවීකරණයේ විකාශය යනාදිය පිළිබඳ ව සංක්ෂිප්ත ව සාකච්ඡා කිරීම මෙම පරිච්ඡේදය තුළ දී කළ යුතු වේ.

## සමාජ සජීවීකරණයේ දියාරු බව

පන්තියට පැමිණි ගුරුවරයා ජිනසේනගෙන් මෙසේ ඇසී ය. 'ජිනසේන අම්පාරේ පස් කෙබඳු ද?' ජිනසේන ගුරුවරයාට ලබා දෙන පිළිතුර දෙස පන්තියේ අනෙකුත් ළමුන් ද නෙත් අයා බලා සිටිනු ජිනසේනට පෙනිණි. ජිනසේන මඳ වේලාවක් කල්පනා කොට 'ඔව් සර්, අම්පාරේ පස් කෙබඳුයි ' යනුවෙන් පිළිතුරු දුනි. ගුරුවරයාට ජිනසේන ගැන කේන්ති ගියේ ය. ළමෝ ජිනසේනට සිනාසුන හ. ජිනසේන ලැජ්ජාවට පත් විය. ඔබටත් මටත් පැහැදිලි ව පෙනෙන්නේ ජිනසේනට ගුරුවරයා ඇසූ දේ නො වැටහුණ බව යි. එහෙත් ජිනසේන පිළිතුරු දීමෙන් වැළකී සිටියේ නැත. ඔහු අනුමානයෙන් පිළිතුරක් දුන්නේ ය. එහෙත්

ඔහු දුන් අනුමාන පිළිතුරෙහි ඇසූ ප්‍රශ්නයට පිළිතුරක් නැත. 'කෙබඳුද?' යන වචනය ජිනසේන මෙතෙක් අසා නො තිබූ වචනයක් බැවින් ඔහු ප්‍රශ්නය තේරුම් ගත්තේ ගුරුවරයා බලාපොරොත්තු වූ ආකාරයට නො වේ. ජිනසේන අනුමාන කරන්නට ඇත්තේ 'කෙබඳු' යන වචනය පස් වර්ගයක නමක් ලෙස විය හැකි ය. 'ජිනසේනට කෙබඳුද?' යන වචනය නුහුරු වූවා සේම 'සමාජ - සජීවීකරණය' නම් වූ පද යුගලය ද බොහෝ අයට නුහුරු, නුපුරුදු ය. මෙම පරිච්ඡේදයේ ආරම්භයේ දී ම සඳහන් කළාක් මෙන් අප උගත් සමාජ විද්‍යාවේවත්, ආර්ථික විද්‍යාවේවත්, දේශපාලන විද්‍යාවේවත් වෙනත් සම්බන්ධිත විෂයක දී වත් මෙවැනි පද යුගලයන් ඇසුණු බවට මට මෙන් ම ඔබට ද සිහි එළවා ගත නො හැකි ය. සැබැවින් ම ඉතා මෑතක් වනතුරු ම මෙවැනි පද යුගලයක් අපි කිසිවෙකුත් නො ඇසුවෙමු. මේ නිසා සමාජ සජීවීකරණය යනු කුමක්දැයි යමෙකුගෙන් ඇසුව හොත් ඔහු හෝ ඇයට නැගෙන පරිදි හෝ ඔහු හෝ ඇය ලැබූ අත්දැකීම් මත හෝ කිසියම් අනුමානයක් මත හෝ විස්තර කරනු විනා වෙන කළ හැකි දෙයක් නැත. කරුණු විමසා බැලීමට ඉතිහාසයක් ද, භාවිතයෙන් පෝෂණය වූ සාහිත්‍යයක් ද, සංකල්පය විස්තර කෙරෙන නිශ්චිත විෂයයක් ද නො මැතිව වහරට පැමිණි සමාජ සජීවීකරණය නුදෙක් නිශ්චිත නො වූ සංකේතියක් මත ගොඩනැගුණු භාෂාමය සංකේතයක් බව බැලූ බැල්මට පෙනේ.

> කිසිදු විෂයයක නිශ්චිත ව සාකච්ඡා නො වන 'සමාජ සජීවීකරණය' ගැන යමෙකු නො දැන සිටීම අඩුපාඩුවක් හෝ නො දැනුවත්කමක් සේ සැලකිය නො හැකි ය.

මෙම ග්‍රන්ථය සම්පාදනය කිරීමට වසරකට පමණ පෙර මා විසින් අත්දකින ලද එක් සත්‍ය සිදුවීමක් ඔබ වෙත ඉදිරිපත් කරමි. රජයේ ප්‍රමුඛ අමාත්‍යාංශයක් විසින් සමාජ සජීවීකරණය පිළිබඳ ව රට පුරා ව්‍යාප්ත කරනු ලැබූ පුහුණු වැඩසටහනක් සංවිධානය කරනු ලැබිණ. පුහුණු වැඩසටහන සැලසුම් කිරීම සඳහා රාජ්‍ය ආයතන කීපයක් කැඳවනු ලැබූ අතර පුහුණුවේ ඉලක්ක කණ්ඩායම ලෙස තෝරා ගෙන තිබුණේ 'සජීවීකාරකයන්' යයි කී පිරිසකි. මෙම වැඩසටහන සම්පාදනය කිරීම සඳහා කැඳවනු ලැබූ රැස්වීම් වාර දෙකකට මම ද සහභාගි වුණෙමි. රැස්වීමට සහභාගි වූවන්ගෙන් වැඩිදෙනෙකු සමාජ

'සජීවීකරණය' නම් වූ පද යුගලයක් පිළිබඳ ව අසා තිබුණත් එහි අරුත කුමක් දැ යි දැන නො තිබිණි. එහෙත් නො දන්නා බව පෙන්වීමට එකී රැස්වීම සුදුසු තැනක් නො වන බැවින්, ඔවුහු නිහඬ ව සිටින්නට ඇත. අප ඒ ගැන පුදුම විය යුතු ද නො වේ. මීට පෙර සඳහන් කළාක් මෙන් කිසිදු විෂයයක නිශ්චිත මාතෘකාවක් ලෙස සාකච්ඡා නො වූ, සමාජ 'සජීවීකරණයක්' ගැන යමෙක් නො දැන සිටීම අඩු පාඩුවක් ලෙස හෝ නො දැනුවත්කමක් ලෙස සලකන්නේ කෙසේ ද? කරුණු එසේ වුව ද, සමාජ සජීවීකරණය පිළිබඳ පුහුණු වැඩසටහන සැලසුම් කිරීමේ රැස්වීම ක්‍රියාත්මක වෙමින් පැවතිණ. රැස්වීමේ එක් අවස්ථාවකදී නිලධාරී මහතෙකු සමාජ සජීවීකරණයේ ඉංග්‍රීසි වචනය කුමක්දැයි විමසීය. කීප දෙනෙක් ම එක් වරම 'Social Mobilization' (සෝෂල් මොබිලයිෂේෂන්) යයි කීහ. ප්‍රශ්නය ඇසූ නිලධාරී මහතා ඉංග්‍රීසියෙන් උසස් අධ්‍යාපනය ලැබූවෙකු විය හැකි ය. ඇතැම් විට ඔහු උත්සාහ කරන්නට ඇත්තේ ඉංග්‍රීසියෙන් වචනය දැන ගත් විට එත් කරන්නට යන්නේ කුමක් දැයි තේරුම් ගැනීමට යම් සහනයක් ලැබේ ද කියා බලන්නට විය හැක. එහෙත් ඔහු උගත් කිසිදු විෂයයක 'Social Mobilization' නම් වූ යෙදුමක් ඇසූ බවක් ඔහුට මතක නැත. එහෙත් තමා මෙතෙක් නො ඇසූ දේ තමා හැදෑරූ විෂයයෙහි පවා කොපමණ තිබිය හැකි ද? එපමණක් ද? උගත් විෂය හැරුණු විට තවත් විෂයයන් කොපමණ තිබේ ද? ඇතැම් විට සමාජ සජීවීකරණය තමා හදාරනු නො ලැබූ විෂයයක සංකල්පයක් විය නො හැකි දෝ යි සිතා එම නිලධාරී මහතා ද නිහඬ විය. දැන් රැස්වීම දිවෙයි. රැස්වීමේ හඬ නගන්නේ විශේෂඥයන් කිහිප දෙනෙක් පමණි. විශේෂඥයන්ගේ සමාජ සජීවීකරණ විග්‍රහයන් එකකට එකක් වෙනස් ය. සමාජ සජීවීකරණය යනු ජනතාව සංවිධානය කිරීම යයි අයෙක් කීහ. තවෙකෙකු කීවේ සමාජය තුළ ප්‍රබෝධයක් ඇති කිරීම සමාජ සජීවීකරණය කියා ය. ඇතැමෙකු කීයේ දිළිඳු බව තුරන් කිරීම සමාජ සජීවීකරණය බව ය. තවෙකෙකු කීයේ ජනසවිය හා සමෘද්ධියට කියන අලුත් නම සමාජ සජීවීකරණය බව ය. එක් අයෙක් අලුත් ම අදහසක් ඉදිරිපත් කළේ ය. එනම් සමාජ සජීවීකරණය යනු වැඩිමනත් සිතීමට තරම් දෙයක් නො ව එය හුදෙක් සුළු ගොවීන් සංවිධානය කිරීමට යෙදෙන අලුත් යෙදුමක් බව යි. ඔහු පසු ගිය දශකය පුරා ම සමාජ සජීවීකරණයේ යෙදී සිටි බවත් පෙන්වා

දුන්නේ ය. මේ අනුව අවසානයේ සමාජ සජීවීකරණය 'සුළු ගොවීන් සංවිධානය කිරීම' යන්නට සමාන අරුත් ඇති යෙදුමක් සේ පිළිගනිමින් සුළු ගොවීන් සංවිධානය කිරීම තේමා කොට ගත් ක්ෂණික පුහුණු වැඩසටහනක් සැකසීමට තීන්දු කළෝ ය.

පුහුණු වැඩසටහන දැන් සැකසී අවසන් ය. සකස් කළ පුහුණු වැඩසටහන ක්‍රියාත්මක කිරීම දිස්ත්‍රික් මට්ටමේ රාජ්‍ය නිලධාරීන් වෙත පවරනු ලැබිණි. දිනක් කාර්යාල වේලාවේ දී මට දුරකතන ඇමතුමක් ලැබිණි. හෙතෙම මා හොඳින් දන්නා දිස්ත්‍රික් මට්ටමේ ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරියෙකි. ඉහත කී පුහුණු වැඩසටහන සැලසුම් කිරීම සඳහා මා ද සම්මාදම් කරුවෙකු බව දත් හේ මගෙන් ප්‍රශ්නයක් ඇසී ය. ප්‍රශ්නය නම් 'සමාජ සජීවීකරණය යනු කුමක් ද' යන්න යි. මට එකවර ම පිළිතුරක් දීමට නො හැකි විය. මන් ද? මා පිළිගත් සමාජ සජීවීකරණයත් පුහුණු වැඩසටහනින් අදහස් කළ සමාජ සජීවීකරණයත් අතර ප්‍රබල වෙනසක් පැවතුණ බැවිනි. කෙසේ වෙතත් වැඩසටහන සම්පාදනය කිරීමේ සාමූහික වගකීමෙන් බැඳී සිටි මම 'සජීවීකරණය' මගින් සිදු වන්නේ 'සුළු ගොවීන් සංවිධානය කිරීම' යයි කීමි. එවිට එම නිලධාරි මහතා ප්‍රශ්න කළේ 'සුළු ගොවීන් සංවිධාන කිරීම' ට සුළු ගොවීන් සංවිධාන කිරීම යයි නො කියා නො තේරෙන භාෂාවෙන් සජීවීකරණය යයි කියන්නේ අසවල් අරමුණක් ඉටු කර ගැනීමට ද කියා යි.

සමාජ සජීවීකරණය යනු කුමක් දැයි අර්ථ විග්‍රහ කිරීම පසෙක තබා අතීත කතා ගෙනහැර පාමින් පාඨකයා වල්මත් කරන්නේ යයි ඔබ කතුවරයාට අවලා ද නැඟිය හැකි ය. එහෙත් සමාජ සජීවීකරණය අර්ථ දැක්වීමට පෙර සමාජ සජීවීකරණය නම් වූ ජන්‍ත්‍රය යට ක්‍රියාත්මක වන සැබෑ භූමිකා හෙළිදරව් නො කළහොත් සජීවීකරණයේ පසුබිම් කතා ඔබෙන් වසන් කළ බවක් මට හැඟෙයි. අනෙක් අතට සමාජ සජීවීකරණය පිළිබඳ ව නිරවුල් අදහසක් ඇති කර ගැනීමටත්, එය නිරවුල් කර ගැනීමටත් පැතුරුණු තොරතුරු සම්භාරයක් ඔබ වෙත තිබිය යුතු නො වන්නේ ද?

සමාජ සජීවීකරණය අර්ථ දැක්වීම සඳහා ප්‍රමාණවත් ලිඛිත සාහිත්‍යයක් ගොඩ නැඟී නැති හෙයින් සමාජ සජීවීකරණය යන්න නිර්වචනය කිරීම වඩා ප්‍රවේශමෙන් කළ යුතු කාර්යයක් වේ. මේ සඳහා අනුගමනය කළ හැකි එක් සාධාරණ උපාය මාර්ගයක් සේ සැලකිය හැක්කේ සමාජ සජීවීකරණය නම් වූ තේමාව මූලික කොට ගෙන අතීතයේ ක්‍රියාත්මක වූ විවිධ සංවර්ධන වැඩසටහන්වල ප්‍රතිඵල දෙස එබී බැලීම යි. එහෙත් මා විස්තර කිරීමට අපේක්ෂා කරන සමාජ සජීවීකරණ සංකල්පය විස්තර කිරීම සඳහා එවැනි වැඩසටහන්වලින් ප්‍රමාණවත් අනුබලයක් නො ලැබෙන බව මගේ පිළිගැනීම යි. මන්ද? බොහෝ සමාජ සජීවීකරණ වැඩසටහන්, නමින් සජීවීකරණ වැඩසටහන් ලෙස හැඳින්වුවත් ඒවා නිසා ජනතාව තුළ සැබෑ සජීවීකරණයක් සිදු නො වූ හෙයිනි. (විශ්ලේෂණ ප්‍රකාශන 1994). පසුගිය කාල සීමාව තුළ ක්‍රියාත්මක වූ විවිධ සජීවීකරණ වැඩසටහන් නම් කිරීමට මම අකමැත්තෙමි. එහෙත් කිවයුත්ත නම් සජීවීකරණය නමින් රජය මැදිහත් වී ක්‍රියාත්මක වූ බොහෝ වැඩසටහනක් තුළ රාජ්‍ය නිලධාරීන්ගේ හෝ නියෝජිතයන්ගේ සුපුරුදු අලස බවත්, අකාර්යක්ෂම බවත්, අවුල් සහගත බවත් ප්‍රකට ව ප්‍රදර්ශනය වූ බව යි. ඇතැම් සජීවීකරණ වැඩසටහන් රාජ්‍ය නිලධාරීන්ට ඇති වූ හදිසි උවමනාවක් නිසා තල්ලු කරගෙන ගිය ඒවා විය. උදාහරණ වශයෙන් එක් සජීවීකරණ පුහුණු වැඩසටහනක උපත සිදුවූයේ කිසියම් ආයතනයක වසර අවසානයේ ඉතිරි ව තුබූ මුදල් කෙසේ හෝ ප්‍රයෝජනයට ගත යුතු ව තුබූ නිසා මිස ජනතාව සජීවීකරණය කිරීමේ අංශුමාත්‍රයක වත් ඕනෑමකක් හෝ උනන්දුවක් තුබූ නිසා නො වේ. තවත් සමහර වැඩසටහන් ඉහළ නිලධාරියෙකුගේ හෝ බලධාරියෙකුගේ නියෝග නිසා ක්‍රියාවට නැංවිණි. නියෝග දෙනු ලැබූ නිලධාරියා හෝ බලධාරියා කොපමණ අවංක වුවත්, කැප වූ තැනැත්තෙකු වුවත් වැඩසටහනේ සැබෑ ක්‍රියාකාරීත්වයට බලපෑයේ වැඩසටහන ක්‍රියාත්මක කළ තැනැත්තන් තුළ තිබූ කැපවීම හා අවංකකම ය. හතු පිපෙන්නාක් මෙන් බිහි ව ඇති සිය ගණනින් වූ රාජ්‍ය නො වන සංවිධාන මගින් ක්‍රියාවට නැංවූ සජීවීකරණ වැඩසටහන්වල ද රාජ්‍ය අංශයේ වැඩසටහන්වලට වඩා වැඩි වෙනසක් නො තිබූ බව පෙනේ. රාජ්‍ය මෙන් ම රාජ්‍ය නො වන සංවිධාන මගින් ක්‍රියාවට නැංවූ සජීවීකරණ ව්‍යාපෘතිවලින් අල්පයක් යම් යම්

ස්ථානවල සමාජ ආර්ථික පරිවර්තනයක් සිදු කිරීමට සමත් වූ නමුත් ඒවා සමස්ත වැඩසටහන්වල ප්‍රයෝජනයට ගත් න්‍යාය හෝ භාවිතය සාමාන්‍ය කරණය කිරීමට තරම් ප්‍රමාණවත් පදනමක් ලබා දෙන්නේ නැත. යම් මට්ටමකට සාර්ථක වූ සෑම සජීවීකරණය ව්‍යාපෘතියක් පිටුපස ම විශේෂිත සිදු වීමක් හෝ විශේෂිත අවස්ථාවක් පසුබිම් ව පැවති නිසාත්, විශේෂිත නිලධාරියෙකුගේ, විශේෂිත විපර්යකාරකයෙකුගේ හෝ විශේෂිත ප්‍රතිලාභියෙකුගේ සම්බන්ධතා ව ඉස්මතු ව පෙනෙන නිසාත් මෙකී සාර්ථකත්වයන් වඩා සුදුසු වන්නේ සජීවීකරණ ක්‍රියාදාමය සාමාන්‍යකරණයට පත් කිරීම සඳහා ගැළපෙන උදාහරණ වශයෙන් ඉදිරිපත් කිරීමට නො වේ. ඒවා සුදුසු වන්නේ සජීවීකරණ ක්‍රියාදාමයේ විශේෂ තත්වයන් විස්තර කිරීම සඳහා ගැළපෙන උදාහරණ වශයෙන් ඉදිරිපත් කිරීමට ය. එබැවින් පොදුවේ ගත් විට සංවර්ධනයේ නව ප්‍රවේශයක් යයි බොහෝ දෙනා සිතූ සමාජ සජීවීකරණ වැඩසටහන් අලුත් බෝතලයේ පරණ වයින් මෙන් නමින් පමණක් අලුත් වූ වැඩසටහන් වූ බව මගේ අත්දැකීම යි.

ඉහතින් දැක්වූ හේතු කාරණා අනුව සමාජ සජීවීකරණය අර්ථ දැක්වීම සඳහා අතීතයේ ක්‍රියාත්මක වූ වැඩසටහන්වල ප්‍රතිඵල පිරික්සීමෙන් සැලකිය යුතු පිළිසරණක් ලබා ගත නො හැකි බව පැහැදිලි ය. එමෙන් ම ප්‍රමාණවත් ලිඛිත සාහිත්‍යයක් ගොඩ නැගී නැති බැවින් සජීවීකරණය අර්ථ දැක්වීමට පොතපතින් ගත හැකි අනුබලයක් ද නොමැති තරම් ය. මේ නිසා සමාජ සජීවීකරණය අර්ථ දැක්වීම සඳහා යොදා ගත හැකි නව උපායමාර්ග පිළිබඳ ව සිතා බැලිය යුතු වේ.

> සමාජ සජීවීකරණය යන යෙදුම දිළිඳු බව පිටු දැකීම යන්නට සමාන තේරුමක් ඇති යෙදුමක් ලෙස භාවිතයෙන් අර්ථවත් වී ඇති බව පෙනේ.

## සමාජ සජීවීකරණය යනු කුමක්ද?

සමාජ සජීවීකරණය යනු කුමක් දැයි තේරුම් ගැනීම සඳහා මෙම පරිච්ඡේදයේ මුල් කොටසේ ඉදිරිපත් කළ අදහසක් නැවතත් අවධාරණය කිරීම සුදුසු ය. පරිච්ඡේදය ආරම්භයේ දී ම කීවේ සමාජ සජීවීකරණය සියලු දෙනාගේ ම මාතෘකාවක් බව යි. මක් නිසාද?

සංවර්ධන ක්‍රියාකාරකම් ඉටු කර ගෙන යාමේ දී මෙරට ජන සමාජය තුළ දක්නට ලැබෙන ප්‍රධාන පෙළේ බාධාකාරී සමාජ සංසිද්ධීන් වන ප්‍රතිගාමීත්වය, මන්දගාමීත්වය, අපිළිවෙළ, අක්‍රමිකතාව සියල්ලන්ගේ ම අත්දැකීමක් වන නිසා ය. එමෙන් ම මෙකී බාධා ජය ගැනීම සියල්ලන්ගේ ම වගකීමක් ද වන නිසා ය. කෙසේ වෙතත් සමාජ සජීවීකරණයේ නාමයෙන් ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක වැඩසටහන් මේ අර්ථයෙන් සමාජ සජීවීකරණ වැඩසටහන් නො වේ. එනම්, ප්‍රතිගාමීත්වය, මන්දගාමීත්වය, ආදී බාධක ජය ගැනීම හෝ අපිළිවෙල, අක්‍රමිකතාව ආදී බාධක පිටු දැකීම හෝ වර්තමාන සමාජ සජීවීකරණයේ අරමුණු නො වන බැවිනි. වර්තමාන භාවිතයට අනුව සජීවීකරණය අවශ්‍ය වන්නේ දිළින්දන් සඳහා ය. මේ නිසා සමාජ සජීවීකරණය යනු දිළිඳුකම පිටුදැකීමට පර්යාය පදයක් වශයෙන් භාවිතයෙන් අර්ථවත් වී තිබෙන බවක් පෙනේ. කතුවරයාගේ සමාජ සජීවීකරණ අර්ථකතනය දිළිඳුකම පිටුදැකීමට වඩා අත්‍යන්තයෙන් ම වෙනස් ය. එය දිළිඳුකම පිටුදැකීමට වඩා බෙහෙවින් පුළුල් ය. දිළිඳුකම පිටු දැකීම සමාජ සජීවීකරණයේ එක් ප්‍රධාන උපාංගයක් ලෙස සැලකිය හැකි නමුත් සැබෑ සමාජ සජීවීකරණ උත්සාහයක් තුළ දී එය වුව ද භාවිතයට යෙදිය යුත්තේ වර්තමානයේ භාවිතයට යෙදීමේ ස්වභාවයට වෙනස් ව ය. මේ නිසා මේ ග්‍රන්ථයේ විස්තර කිරීමට නියමිත සමාජ සජීවීකරණය බොහෝ පැතිකඩවලින් පාඨකයා මෙතෙක් අසා ඇති සමාජ සජීවීකරණයට වඩා වෙනස් බව ඉතා පැහැදිලි ව කිව යුතු ය.

> සමාජ විද්‍යාවේ එන 'Social Mobility' හෙවත් සමාජ සංචලතාව යන යෙදුම 'Social Mobilization' හෙවත් සමාජ සජීවීකරණය යන යෙදුමට සමාන තේරුමක් ඇති යෙදුමක් නො වේ.

මෙම ග්‍රන්ථයේ ඉදිරි පරිච්ඡේද සියල්ල තුළ දී ම විස්තර වන්නේ කතුවරයා විසින් සමාජ සජීවීකරණය යනුවෙන් අලුතින් අර්ථකථනය කරනු ලබන තත්වය පිළිබඳ ව ය. එහෙත් සමාජ සජීවීකරණය පිළිබඳ ග්‍රන්ථයක් ලිවීමේ දී දිළිඳුකම පිටු දැකීම මූලික කර ගත් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක සමාජ සජීවීකරණය උත්සාහයන් මෙන් ම සමාජ සජීවීකරණය නම් වූ තේමාව යටතේ සාහිත්‍යයෙහි සඳහන් යම් යම් ක්‍රියාකාරකම් පිළිබඳව ද අපට අමතක කළ නො හැකි බැවින් ඒවා



22265
LIBRARY
HARTI

මෙතෙක් ගොඩ නැගී ඇති සමාජ සජ්ජීකරණ විෂයයේ ඉතිහාසය මත සජ්ජීකරණය යනුවෙන් අර්ථ දැක්විය හැක්කේ කුමක් ද? යන්න පිළිබඳ ව ප්‍රථමයෙන් විමසා බැලිය යුතු ය. අනතුරු ව නව අර්ථකථනය ඉන් වෙනස් වන්නේ කෙසේ දැයි සලකා බැලිය හැකි ය.

සමාජ සජ්ජීකරණය අර්ථ දැක්වීම සඳහා ප්‍රයෝජනයට ගත හැකි උපාය මාර්ග කීපය කි. ඉන් පළමුවැන්න නම් 'සමාජ සජ්ජීකරණය' යන යෙදුම හෝ එට පර්යාය වන යෙදුම් විෂයානුබද්ධ සාහිත්‍යයෙහි ඇත්දැයි සොයා බලා විෂයානුබද්ධ විස්තර කිරීම්වලට අනු ව අරුත් පිහිටුවා ගැනීම යි. දෙවැන්න, සමාජ සජ්ජීකරණය යන යෙදුම භාවිතයට පැමිණි සන්දර්භය, රාමුව හෝ අවස්ථාව සලකා බලා එහි සංදර්භගත තේරුම විස්තර කර ගැනීම යි. තුන්වැන්න, මෙතෙක් පැවැති සමාජ සජ්ජීකරණ වැඩසටහන්වල ක්‍රියාකාරිත්වය හා ප්‍රතිඵල කුමක් වුවත් එම වැඩසටහන් මඟින් ඉටු කර ගැනීමට බලාපොරොත්තු වූ අරමුණු හෝ පරමාර්ථ පිළිබඳ ව විමසා බලා සජ්ජීකරණය අර්ථ දක්වා ගැනීම යි. සිව්වැන්න, භාෂාමය වශයෙන් යෙදුමේ වචනාර්ථ සලකා අරුත් පිහිටුවා ගැනීම යි.

ප්‍රථමයෙන් පළමුවැනි උපාය මාර්ගය සේ දැක් වූ විෂයානුබද්ධ විස්තර කිරීම්වලට අනුව අරුත් පිහිටුවා ගැනීමට හැකි දැයි සොයා බලමු. සමාජ සජ්ජීකරණය යන්න ඉංග්‍රීසි භාෂාවෙන් සිංහලට පරිවර්තනය කොට යොදා ගත් යෙදුමක් බව නො පෙනේ. සමාජ සජ්ජීකරණය යන සිංහල යෙදුම ඉංග්‍රීසි භාෂාව ට 'Social Mobilization' යනුවෙන් පරිවර්තනය කර ඇතත් Social Mobilization නම් වූ සංකල්පයක් සමාජ විද්‍යාවේවත්, සමාජ මානව විද්‍යාවේවත් එකී විෂයයන්ට සම්බන්ධ ඉතා ම නවීන විශ්වකෝෂවලවත් නැත. මෙම යෙදුමට තරමක් හෝ ආසන්න යෙදුමක් ලෙස සමාජවිද්‍යාවට සම්බන්ධ ජාත්‍යන්තර විශ්වකෝෂයේ දක්වා ඇත්තේ 'Social Mobility' යන සංකල්පය යි. Social Mobility යනු සමාජ විද්‍යාවේ සාකච්ඡාවට ගැනෙන විෂයානුබද්ධ සංකල්පයකි. එයින් විස්තර වන්නේ රැකියාව, ආදායම, වත්කම, බලය, නම්බුව , උගත්කම ආදී වූ සාධකයන්ගේ වෙනස් වීම් හා එකී සාධකයන්ගේ සමාජ වටිනාකම් වෙනස් වීම් කරණකොට ගෙන යම් තලයක පැවැති ජන සමාජයක්, කණ්ඩායමක් හෝ පුද්ගලයෙක් වෙනත් සමාජ තලයකට ප්‍රවිෂ්ට වීමේ

පරිවර්තන ක්‍රියාවලිය යි. එය දිළිඳුන් සම්බන්ධයෙන් හෝ හඳුනා ගත් විශේෂිත ජන කොටසක් සම්බන්ධයෙන් හෝ විස්තර සපයන සංකල්පයට වඩා ඉතා පුළුල් ලෙස සමාජ ප්‍රගමනය විස්තර කරන සමාජ විද්‍යාත්මක විශ්ලේෂණයකි. මේ නිසා social Mobilization යනුවෙන් වර්තමානයේ හඳුන්වනු ලබන සංකල්පයට පර්යාය යෙදුමක් ලෙස සමාජ විද්‍යාවේ විස්තර වන 'Social Mobility' නම් සංකල්පය සැලකිය නො හැකි ය. කෙසේ වෙතත් පිලිපීනයේ ක්වෙසෝන් නගරයේ පිහිටි පිලිපීන් විශ්ව විද්‍යාලයේ Development Consultants Asia Africa Pacific (DCAAP) නම් ආයතනය විසින් 1990 දශකයේ අග භාගයේ දී සංනිවේදනය හා සමාජ සජීවීකරණය නම් වූ පුහුණු වැඩසටහනක් පැවැත්වූ බවට ලිඛිත තොරතුරු සොයා ගත හැකි විය. මෙම පුහුණු වැඩසටහනේ අන්තර්ගතය පිළිබඳ ව මම සැලකිල්ලෙන් පරීක්ෂා කර බැලීමි. සමාජ සජීවීකරණය යටතේ මෙම පුහුණු වැඩසටහනේ විෂය ක්ෂේත්‍රයට ඇතුළත් කර තිබුණේ සමාජ සංවිධාන (Community Organizations), මතවාද ව්‍යාප්තිය සඳහා ජනතාව පොළඹවා ගැනීම (Lobbying), සංවර්ධන අරමුණ ඉටු කර ගැනීම සඳහා විවිධ ආයතන හා සංවිධාන සමග සම්බන්ධතා පවත්වා ගැනීම (Net working), සංවර්ධන මතවාදයන් ජයග්‍රහණය කරවීම සඳහා ආධාරක හා උපකාරක සේවා සැපයීම (Advocacy) යනාදිය යි. අළුත් විෂය සංදර්භයක් මෙම වැඩසටහනට ඇතුළත් ව නො තිබූ අතර සංවර්ධන සාහිත්‍යයෙහි නිතර සාකච්ඡාවට භාජන වී ඇති ප්‍රජා සංවිධාන, විපර්යකාරකත්වය, ආදී මාතෘකා වෙනත් නම්වලින් සාකච්ඡාවට භාජන වීමත්, සමාජ මානව විද්‍යාවේ හා ව්‍යාප්තිකරණයේ ශිල්පක්‍රමවලින් ඇතැම් ශිල්ප ක්‍රම පාඨමාලාවේ විෂය අන්තර්ගතයට ඇතුළත් කර තිබීමත් දැකිය හැකි විය.

'Social Mobilization' නම් වූ යෙදුම සමාජ විද්‍යාව, මානව විද්‍යාව ආදී විෂයයන් හි සාකච්ඡාවට ගැනෙන ප්‍රධාන මාතෘකාවක් සේ හෝ අනු මාතෘකාවක් සේ හෝ නො සැලකුව ද මෑත දී කාලීන සංවර්ධන සාහිත්‍යයට ප්‍රවිෂ්ට වෙමින් තිබෙන නව යෙදුමකි. විශේෂයෙන් ව්‍යාපෘති මට්ටමෙන් බිහි වන විවිධ වාර්තා හා ලිපි ලේඛන මඟින් භාවිතයට පැමිණ ඇති මේ යෙදුම යටතේ ඉදිරිපත් වන තොරතුරු පුස්තකාලයවල ගොනු කර තැබීම සඳහා යම් ක්‍රම වේදයක්

අනුගමනය කළ යුතු බැවින් 1998 දී මුද්‍රණය කරන ලද සාර්ව පර්යාය කෝෂයේ (Macrothesaurus) පස් වැනි සංස්කරණයේ දී සමාජ සජීවීකරණය යම් අර්ථ දැක්වීමකට භාජන කර ඇත. සාර්ව පර්යාය කෝෂය සමාජ සජීවීකරණය අර්ථ දක්වා ඇත්තේ මෙසේ ය. 'Gathering the energies of society to work towards a specific goal' යනුවෙනි. මින් අදහස් වන්නේ කිසියම් විශේෂිත අරමුණක් ඉටු කර ගැනීම සඳහා සමාජයේ ශක්තිය ඒකරාශි කිරීමේ කාර්යය සමාජ සජීවීකරණය බව යි. යෙදුමට සම්බන්ධ වන හෝ ආශ්‍රිත යෙදුම් ලෙස පර්යාය කෝෂය දක්වා ඇත්තේ සහයෝගී සේවා (advocacy) සමාජය තුළ යම් මත වාදයක් ව්‍යාප්ත කරවීමේ පෙළඹුම් ක්‍රියාවලිය (Social marketing) සහ සමාජ සහභාගිත්වය (Social participation) යන යෙදුම් ය. මීට අමතර ව (Schoen, 1996), (Unicef ,1986) ආදී ලේඛන වලින් තහවුරු වන්නේ ද සාර්ව පර්යාය කෝෂයේ සඳහන් අර්ථදැක්වීම්වලට සමාන අදහස් ය.

> සමාජ සජීවීකරණයට ඇත්තේ දියාරු තේරුමකි. ඇතැමෙකුට සමාජ සජීවීකරණය යනු ගැමියන් සංවිධානය කිරීම ය. තවෙකෙකුට සමාජ යහපැවැත්ම තහවුරු කිරීම ය. තවත් අය කියන්නේ දිළිඳුකම පිටු දැකීම සමාජ සජීවීකරණය බව ය. බලය ගැන්වීම, පෙළඹුම් ක්‍රියාවලිය, විපර්යකාරකත්වය, මත වාද ව්‍යාප්තිය, ආධාරක, උපකාරක සේවා සැපයුම ආදිය සමාජ සජීවීකරණය යයි තවත් අය කියති.

ෂෙඕන් නම් ලේඛකයා ඔහුගේ අර්ථකථනයට අනුව සමාජ සජීවීකරණය හා ප්‍රජා සජීවීකරණය (Community mobilization) එකිනෙකට වෙනස් සංකල්ප ලෙස හඳුන්වා දෙයි. ෂෙඕන් කියන්නේ සමාජ සජීවීකරණය ඉහළ සිට පහළට ක්‍රියාවේ නැංවෙන කාර්යදාමයක් බවත් ප්‍රජා සජීවීකරණය පහළ සිට ඉහළට ක්‍රියාවේ නැංවෙන කාර්යදාමයක් බවත් ය (Schoen, 1996).

'සමාජ සජීවීකරණය' යන්න අර්ථ දක්වා ගැනීමේ දෙවැනි උපායමාර්ගය ලෙස යෝජනා කරනු ලැබුයේ යෙදුම භාවිතයට ගත් සංදර්භය හෝ රාමුව පැහැදිලි කිරීම මගින් යෙදුමෙහි අන්තර්ගත අරුත ඉස්මතු කර ගැනීම යි. සමාජ සජීවීකරණය නම් වූ යෙදුම ප්‍රයෝජනයට ගනිමින් යෙදුණු ක්‍රියාකාරකම් සම්බන්ධ ඇතැම් ලිඛිත සාක්ෂි ද, එකී වැඩසටහන්වලට සහභාගිවීමෙන් හා

නිරීක්ෂණයෙන් ලද අත්දැකීම් ද සමාජ සජීවිකරණයේ සංදර්භගත අරුත් හෙළි කර ගැනීමට ප්‍රයෝජනවත් වේ. 1992 සාර්ක් සංවිධානයේ ස්වාධීන කොමිසමක් විසින් සමාජ සජීවිකරණය යන යෙදුම ප්‍රයෝජනයට ගෙන ඇති අතර ඒ කොමිසමේ වාර්තාව සමාජ සජීවීකරණය යන්නට අර්ථ දක්වා ඇත්තේ දිළින්දන් නගා සිටුවීම යන අර්ථය දෙමිනි. ආචාර්ය පොන්න විග්නරාජා, සුසිල් සිරිවර්ධන ආදී ලේඛකයන්ගේ ලේඛන වල ද දිළිඳුකම පිටුදැකීමේ ක්‍රියා මාර්ගය සමාජ සජීවීකරණය ලෙස සැලකූ බවක් පෙනේ (Wignaraja and Sirivardana 1998). 1990 ගණන් වන තුරු සමාජ සජීවිකරණය නම් වූ යෙදුමක් ශ්‍රී ලංකාවේ සංවර්ධන සාහිත්‍යයට ඇතුළත් ව නො තිබිණි. කෙසේ වෙතත් විශ්ව සංවර්ධන සාහිත්‍යයේ මේ වන විටත් සමාජ සජීවීකරණයට පර්යාය යැයි සිතිය හැකි 'Community Empowerment' 'Community Mobilization' 'Social Animation' වැනි ඉංග්‍රීසි යෙදුම් භාවිතයේ පැවති බව අමතක කළ යුතු නැත.

> මුහුදින් ගොඩ බිමට වන හානිය කියා පෑමට සිංහල වහරේදී 'මුහුදු කෑම' යන අර්ථවත් යෙදුම භාවිතයට පැමිණියා සේ ම වගාවට නො යෙදීමෙන් පුරන් වූ කුඹුරු වගාවට යොදා ගැනීම හැඳින්වීමට 'අස්වැද්දීම' යන ප්‍රාණවත් යෙදුම භාවිතයට ගත්තා සේ ම, විවිධ සමාජ - ආර්ථික බාධකයන් නිසා කායික හා මානසික වශයෙන් නිදාවටත්, අලස භාවයටත් පත් ව සිටින ජන සමාජයක් යළි පණ ගැන්වීමේ ක්‍රියාවලිය සමාජ-සජීවිකරණය යනුවෙන් හඳුන්වාදීම අර්ථ සහිත වූත්, යෝග්‍යවූත්, භාෂාමය වශයෙන් සශ්‍රීක වූත් යෙදුමකි.

සමාජ සජීවීකරණය යන යෙදුම භාවිතයට ඒමට පෙර එම යෙදුමෙන් විස්තර කෙරෙන කාර්ය කටයුතු හඳුන්වා දීමට ප්‍රයෝජනයට ගත් සිංහල යෙදුම වූයේ ජන ශක්තිකරණය නම් වූ යෙදුම යි. ඒ ද ඉතා මෑත කාලයේ දී ය. විශේෂයෙන් 1980 ගණන්වල අග භාගයෙන් පසු ව ය. ජන ශක්තිකරණය නම් වූ යෙදුමේ මූලාරම්භය වූයේ ජන සවිය නම් වූ දිළින්දන් නඟා සිටුවීමේ රජයේ සංවර්ධන වැඩසටහන යි. සවිය යන වචනය ශක්තිය යන වචනයට පර්යාය වූ බැවින් ජන සවිය නම් වූ යෙදුම ජන ශක්තිය වශයෙන් ද එකී කාර්යභාරයේ නියුක්ත වීම ජන ශක්තිකරණයේ නියුක්ත වීමක් ලෙස ද භාවිතයට පැමිණි බව පැහැදිලි ය. 1990 ගණන්වල මැද භාගය වන විට ජන

ශක්තිකරණය නම් වූ යෙදුම භාවිතයෙන් ගිලිහුණු අතර ඒ වෙනුවට සමාජ සජීවීකරණය නම් වූ යෙදුම භාවිතයට පැමිණිණි. වර්තමානයේ ක්‍රියාත්මක සමාජ සජීවීකරණ වැඩසටහන්වල අරමුණුවලින් හා එම වැඩසටහන්වල ක්‍රියාකාරකම්වලින් හෙළිදරව් වන පරිදි සමාජ සජීවීකරණයේ සංදර්භගත අරුත වන්නේ දිළින්දන් සමාජ - ආර්ථික වශයෙන් ඉදිරියට ගෙන ඒම සඳහා බල ගැන්වීමේ, පෙළඹවීමේ, දිරිගැන්වීමේ පුළුල් ක්‍රියාවලිය යි. එය එක් අතකින් භෞතිකමය සම්පත් මුල් කොට ගත් ආර්ථික ක්‍රියාවලියක් වශයෙන් ද, තවත් අතකින් ජනතාව මූලික කොට ගත් සමාජමය ක්‍රියාවලියක් වශයෙන් ද, ඇතැම් විට අධ්‍යාපන ක්‍රියාවලියක් වශයෙන් ද ක්‍රියාත්මක වේ.

සමාජ සජීවීකරණය අර්ථ විග්‍රහ කිරීමේ තුන් වැනි උපායමාර්ගය ලෙස යෝජනා කරනු ලැබූයේ මෙතෙක් ක්‍රියාත්මක වූ සමාජ සජීවීකරණ වැඩසටහන්වල අරමුණු විශ්ලේෂණය කිරීම මඟින් යෙදුම අර්ථ දක්වා ගැනීම යි. සමාජ සජීවීකරණය නම් වූ යෙදුමේ නිෂ්පත්තිය ලෙස සැලකිය හැකි ජනසවිය වැඩසටහනේ ප්‍රාරම්භක ලිපි ලේඛනවලට අනුව එම සංවර්ධන වැඩසටහනේ මූලික අරමුණ වී ඇත්තේ පොදු ජනතාව මත පදනම් වූ තිරසාර සංවර්ධනයක් ඇති කිරීමත්, එකී සංවර්ධනය සඳහා ජනතාවට පහසුකම් සැපයීමත්, ඔවුන් බලගැන්වීමත් ය (ජනසවිය කොමසාරිස් කාර්යාලය, 1990) (ජනසවිය කොමසාරිස් දෙපාර්තමේන්තුව, 1991) (සුමනසිරි ලියනගේ සහ අනෙකුත් අය, 1995) (විශ්ලේෂණ ප්‍රකාශන, 1994). මේ සඳහා විශේෂයෙන් දිළිඳු ජනතාව තුළ මුල් බැස ගෙන ඇති උදාසීනත්වය, බියාදුකම, නියාලුකම, අසරණකම, අවිශ්වාසය, හීනමානය යනාදිය ඉවත් කළ යුතු බවත්, එවැනි ඉවත් කිරීමක් සඳහා ඒකාබද්ධවූත්, ඵලදායීවූත් වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු බවටත් අරමුණු කර තිබේ. සජීවීකරණ වැඩසටහන්වල ප්‍රමුඛ අරමුණු අතර ජනතා උත්ප්‍රේරණය (පෙළඹවීම), උත්ප්‍රේරකයන්ගේ මැදිහත්වීම, සමූහ වශයෙන් ජනතාව සංවිධානය කිරීම, සංවර්ධනය සඳහා යොදවා ගත හැකි භෞතික හා මානව සම්පත් හඳුනා ගැනීම, ජනතා අධ්‍යාපනය, සංවර්ධන අරමුණු ඉටු කර ගැනීම සඳහා රාජ්‍ය, පෞද්ගලික හා රාජ්‍ය නො වන ආයතන සමග පොදු ජනතාව

සම්බන්ධ කර තැබීම ආදිය කැපී පෙනෙන ඒවා වේ. මේ අනුව භාවිතයෙන් අර්ථවත් වන පරිදි සමාජ සජීවීකරණය යනු දිළිඳු ජනතාව සමාජ-ආර්ථික වශයෙන් ඉදිරියට ගෙන ඒම සඳහා ඔවුන් වෙත ම විශ්වාසය තබන, එහෙත් යම් මැදිහත් වීමක් හා මග පෙන්වීමක් සහිත සංවර්ධන ප්‍රවේශයක් බව පැහැදිලි ව පෙනේ.

සමාජ සජීවීකරණය අර්ථ දැක්වීමේ සිව් වැනි උපාය මාර්ගය ලෙස යෝජනා කරනු ලැබූයේ සමාජ සජීවීකරණය යන යෙදුමේ භාෂාමය වචනාර්ථ සලකා අරුත් පිහිටුවා ගැනීම යි. සමාජ සජීවීකරණය අර්ථ දැක්වීම සඳහා මුල් උපක්‍රමවලට වඩා භාෂාමය උපක්‍රමය වඩා ගැලපෙන බව කතුවරයා ගේ අදහස යි. සමාජ සජීවීකරණය යන යෙදුමෙන් හැඟෙන්නේ සමස්ත සමාජය පිළිබඳ ව මිස සමාජයේ එක් කොට්ඨාශයක් හෝ පන්තියක් පිළිබඳ ව නො වේ. මේ නිසා භාවිතය තුළ කුමක් සිදු වුව ද, වචනාර්ථ වශයෙන් බැලූ විට සමාජ සජීවීකරණය පුළුල් සංකල්පයකි. සමාජ සජීවීකරණය යන යෙදුමෙන් දිළින්දන් පිළිබඳ ව විශේෂ යමක් කියවෙන්නේ නැත. දිළින්දන් ද සමාජයේ පංගු කාරයන් බැවින් ඔව්හු ද සමාජ සජීවීකරණයට අවශ්‍යයෙන් ම ඇතුළත් ය. එමෙන් ම දිළින්දන් නො වන්නෝ ද ඇතුළත් ය. සමාජ සජීවීකරණය දිළිඳුකම පිටු දැකීමට පර්යාය යෙදුමක් සේ භාවිතයට පැමිණ ඇත්තේ දිළිඳුකම පිටුදැකීමේ ජනසවිය වැඩසටහන සමඟ මේ යෙදුම ද භාවිතයට පැමිණි නිසා විය හැකි ය.

සමාජ සජීවීකරණය යටතේ සිදු විය යුතු යැයි අපේක්ෂිත අරමුණු හඳුන්වා දීම සඳහා සමාජ සජීවීකරණය යන යෙදුම වඩාත් සුදුසු භාෂාමය යෙදුමක් බව පිළිගත හැකි ය. මුහුදින් ගොඩ බිමට වන හානිය කියා පෑමට සිංහල වහරේදී 'මුහුදු කෑම' යන අර්ථවත් යෙදුම භාවිතයට පැමිණියා සේ ම වගාවට නො යෙදීමෙන් පුරන් වූ කුඹුරු වගාවට යොදා ගැනීම හැඳින්වීමට 'අස්වැද්දීම' යන ප්‍රාණවත් යෙදුම භාවිතයට ගත්තා සේ ම, විවිධ සමාජ - ආර්ථික බාධකයන් නිසා කායික හා මානසික වශයෙන් නිදාවටත්, අලස භාවයටත් පත් ව සිටින ජන සමාජයක් යළි පණ ගැන්වීමේ ක්‍රියාවලිය සමාජ-සජීවීකරණය යනුවෙන් හඳුන්වාදීම අර්ථ සහිත වූත්, යෝග්‍යවූත්, භාෂාමය වශයෙන් සශ්‍රීක වූත් යෙදුමකි.

නිලධාරි වාදය , කුහක දේශපාලනය, අවස්ථාවාදය, දූෂණය, මර්දනය, අපරාධ, දුබලයා පාගා දැමීම ආදී ලක්ෂණ පෙරටු කොට ඇති, ගැටෙන සුළු අරමුණු (Conflicting aims) ඉටු කර ගැනීම සඳහා එකිනෙකා පරයා පොර බදන ජන කොටස්වලින් සංයුක්ත වූ සංකීර්ණ ශ්‍රී ලාංකික ජන සමාජය දිළිඳු ජනතාවගේ ඕනෑ එපාකම් අනුව ස්වායත්ත ව පාලනය කළ හැකි සරල තත්ත්වයක් යයි සිතීම මුළාවකි.

සමාජ සජීවීකරණය යන යෙදුම ඇසෙන විට යම් සමාජයක් සමස්තයක් වශයෙන් පුබුදුවාලීම හෝ එකී සමාජයට ප්‍රාණයක් දීම යන අදහස ඇති වේ. එබැවින් මෙතෙක් ශ්‍රී ලංකාවේ සංවර්ධන සාහිත්‍යයෙහි භාවිතයට ගත් විපර්ය කාරකත්වය, ප්‍රජා සංවිධාන, ප්‍රජා සංවර්ධනය, සමාජ සංවර්ධනය, ජනතා සහභාගිත්වය දිළිඳුකම තුරන් කිරීම වැනි ආංශික වූත්, සුවිශේෂ විෂය රාමුවලට සීමා වූත් යෙදුම්වලින් හැඟෙන අදහස් ඉක්මවා ගිය, සමස්ත සමාජය තුළ ම ජීවයක් ඇති කිරීම යන අදහස සමාජ සජීවීකරණය යන යෙදුමෙහි ගැබ් ව පවතී.

වර්තමාන සජීවීකරණ වැඩසටහන්වලින් පෙන්වා දෙන පරිදි සමාජය පසුගාමී ව පවතින්නේ උදාසීනත්වය, බයාදුකම, නියාලුකම, අසරණකම, අවිශ්වාසය, හීනමානය ආදිය මූලික ලක්ෂණ කොට ගත් දිළිඳු ජනතාව නිසා ය. එහෙත් කෛරාටිකකම, අවස්ථාවාදය, එංකකම, වංචාව, මුලා කිරීම, මර්දනය, තර්ජනය ,තලා පෙලා දැමීම, ඉදිරියට ඒමට ඉඩ නො දීම ආදිය ලක්ෂණ කොට ගත් දිළින්දන් නො වන්නවුන් වන පාලකයන්, නිලධාරීන්, බලධාරීන් නිසා සමාජය පසුගාමී ව තිබෙන බවක් මේවායින් නො කියැ වේ.

භාවිතයේ තිබෙන කිසිදු සමාජ සජීවීකරණ උත්සාහයක් මඟින් දිළිඳුකම හැරුණු විට ජනතාව පෙළෙන වෙනත් සංකීර්ණ සමාජ අක්‍රමිකතාවන් පිළිබඳ ව සලකා බැලීමට උත්සාහ ගෙන නැත. නිලධාරි වාදය , කුහක දේශපාලනය, අවස්ථාවාදය, දූෂණය, මර්දනය , අපරාධ, දුබලයා පාගා දැමීම ආදී ලක්ෂණ පෙරටු කොට ඇති , ගැටෙන සුළු අරමුණු (Conflicting aims) ඉටු කර ගැනීම සඳහා එකිනෙකා පරයා පොර බදන ජන කොටස්වලින් සංයුක්ත වූ

සංකීර්ණ ශ්‍රී ලාංකික ජන සමාජය දිළිඳු ජනතාවගේ ඕනෑ එපාකම් අනුව ස්වායත්ත ව පාලනය කළ හැකි සරල තත්ත්වයක් සේ මේ වැඩසටහන් මගින් උපකල්පනය කර ඇති බවක් පෙනේ.

උදාසීනත්වය, බයාදුකම, නියාළුකම, අසරණකම, අවිශ්වාසය, හීනමානය ආදිය මූලික ලක්ෂණ කොට ගත් දිළිඳු ජනතාව ධනයෙන් මෙන්ම චින්තනයෙන් ද දිළිඳු පිරිසක් නිසා සමාජය පසුගාමී ව පවතින්නේ ය යි මෙම වැඩසටහන් මගින් උපකල්පනය කොට ඇතත් කෛරාටිකකම, අවස්ථාවාදය, වංකකම, වංචාව, මුලා කිරීම, මර්දනය, තර්ජනය, තළා පෙළා දැමීම, ඉදිරියට ඒමට ඉඩ නො දීම ආදිය ලක්ෂණ කොට ගත් දිළින්දන් නො වන පාලකයන්, නිලධාරීන්, බලධාරීන් නිසා සමාජය ප්‍රතිගාමී ව පැවතීමට හේතු සාධක තිබෙන්නට ඇතැයි මේ වැඩසටහන් මගින් කල්පනා කළ බවක් නො පෙනේ. දිළින්දන් සේ සැලකෙන කම්කරුවාට, යැපුම් ගොවියාට, සහනාධාර ලාභියාට, සමාජය සජීවීකරණය සඳහා වගකීමක් පැවරී ඇතැයි පිළිගනු ලැබූ මේ වැඩසටහන් දේශපාලකයාට, නිලධාරියාට හෝ නාම්පුතාට සමාජ සජීවීකරණය සඳහා වගකීමක් පැවරී ඇතැ යි පිළිගෙන නො මැති බව ද පෙනේ. වෙනත් අයුරකින් කිව හොත් ජනසවිය හා සමෘද්ධි වැඩසටහන්වල දී වෙනස්කමට භාජන විය යුත්තේ පාලිතයා ය. පාලකයාගේ කාර්යභාරය දැනටමත් පිළිගත හැකි මට්ටමකින් සිදු වෙමින් පවතී. මේ නිසා පාලකයා හා ඔහුගේ පාලන තන්ත්‍රයත්, එහි අවයවයනුත් නිසි පරිදි ප්‍රයෝජනයට ගනු ලබන්නේ නම් සමාජය සජීවීකරණය වනු ඇතැයි උපකල්පනය කර තිබේ.

මෙම ග්‍රන්ථයේ සාකච්ඡා කෙරෙන සමාජ සජීවීකරණයේත්, ජනසවිය, සමෘද්ධි ආදී වැඩසටහන් යටතේ මෙතෙක් භාවිතයේ පැවති සමාජ සජීවීකරණයේත් ප්‍රධාන වෙනස්කම් ගණනාවක් තිබේ. මීට ඉහත දී ද පෙන්වා දුන් පරිදි මෙම ග්‍රන්ථය අර්ථ දක්වන සමාජ - සජීවීකරණය සාකච්ඡා කරන්නේ සමස්ත සමාජය පිළිබඳ ව මිස යම් තෝරා ගත් ජන කොටසක් පිළිබඳ ව නො වේ. දිළින්දන්, පාලිතයන් හා බලහීනයන් තුළ සමාජ සජීවීකරණයේ වගකීමක් ඇති වා මෙන් ම ධනවතුන්, පාලකයන් හා බලවතුන් තුළ ද සජීවීකරණය සම්බන්ධ වගකීමක් ඇති බවත්, දිළින්දන්, පාලිතයන්

හා බලහීනයන් තුළ සජීවීකරණය කිරීමේ බාධක ඇතිවා මෙන් ම ධනවතුන්, පාලකයන් හා බලවතුන් තුළ ද සජීවීකරණය කිරීමේ බාධක ඇති බවත් මේ ග්‍රන්ථය විසින් ඉදිරි පරිච්ඡේදවල දී විස්තර කරනු ඇත. සමාජයේ එක් ජන කොටසක ක්‍රියාකාරකම් එකී සමාජයේ තවත් ජන කොටසකට සෘජු ව හෝ වක්‍ර ව බලපාන බවත්, එවැනි බලපෑමකින් තොර ව ඒ ඒ ජන කොටස්වලට ස්වාධීන ව පැවතිය නො හැකි බවත්, මේ ග්‍රන්ථය මගින් විස්තර කරනු ඇත. සමාජය ගමන් ගන්නා දිසාව නිශ්චය කිරීමෙහි ලා දිළින්දන්ට හා බලහීනයන්ට වඩා වැඩි හැකියාවක් දිළින්දන් නො වන්නවුන්ට හා බලවතුන්ට ඇති බවත්, බොහෝ විට සංඛ්‍යාවෙන් කුඩා වුව ද ඔවුන්ගේ හැ කියාව දිළින්දන්ගේ හැකියාව ඉක්මවා යා හැකි බවත් ඉදිරි සාකච්ඡා වලදී පෙන්වා දෙනු ඇත. මේ නිසා මේ ග්‍රන්ථයේ සාකච්ඡා කෙරෙන සමාජ සජීවීකරණය හුදෙක් පහළ සිට ඉහළට ගමන් ගන්නා ක්‍රියාමාර්ගයක් මෙන් ම ඉහළ සිට පහළට ගමන් ගත යුතු ක්‍රියාමාර්ගයක් ද වන්නේ ය. පහත දැක්වෙන අනුමානාකාරයන්ගෙන් විස්තර වන්නේ මේ ග්‍රන්ථය හඳුන්වා දෙන සමාජ සජීවීකරණය, භාරතයේ පවතින සමාජ සජීවීකරණයෙන් වෙන් කර හඳුනා ගැනීමට උපකාර වන විශේෂිත ලක්ෂණ කීපයකි.

> සමාජ සජීවීකරණ වැඩසටහන්වලට පදනම් වී ඇති උපකල්පනවලට අනුව වෙනස් විය යුත්තේ පාලිතයා ය. පාලකයාගේ කාර්ය භාරය දැනටමත් පිළිගත හැකි පරිදි සිදුවෙමින් තිබේ. මේ නිසා පාලකයා හා ඔහුගේ පාලන තන්ත්‍රයත්, එහි අවයවයනුත් නිසි පරිදි ප්‍රයෝජනයට ගනු ලබන්නේ නම් සමාජය සජීවීකරණය වනු ඇතැ යි පිළිගෙන ඇති බවක් පෙනේ.

## සමාජයෙන් කොටසක් නො ව සමස්ත සමාජය

මීට පෙර ඡේදයෙහි දී පෙන්වා දුන් පරිදි මෙම ග්‍රන්ථය සාකච්ඡා කරන්නේ ශ්‍රී ලාංකික ජන සමාජය එකක් සේ ගෙන සජීවීකරණය කිරීමේ ක්‍රියාවලියක් පිළිබඳ ව මිස දිළින්දන් හෝ වෙන යම් සුවිශේෂ ජන කොටසක් විශේෂයෙන් සලකා බලා සජීවීකරණය කිරීමේ ආංශික උත්සාහයක් පිළිබඳ ව නො වේ. දිළිඳුකම මෙ රට ප්‍රබල සමාජ ආර්ථික ප්‍රශ්නයකි. එහෙත් දිළින්දන් සජීවීකරණය කිරීමේ කාර්යභාරය ඔවුන් මතින් ම කළ නො හැකි ය. එසේ කළ හැකි නම්, 1989 - 99 දශකය තුළදී රජය හා රාජ්‍ය නො වන සංවිධාන විසින් ක්‍රියාවට නැංවූ අප්‍රමාණ සජීවීකරණ වැඩසටහන් නිසා දිළිඳු

ජනතාව මේ වන විටත් කැපී පෙනෙන ප්‍රවාහයක් සේ සමාජ ආර්ථික වශයෙන් ඉදිරියට පැමිණ සිටිය යුතු ය. මන්ද? පසු ගිය දශකය තුළ දී අති විශාල ධනස්කන්ධයක්, ශ්‍රම බලකායක් හා ආයතනික රටාවක් සමාජ සජීවීකරණය සඳහා ම වෙන්ව තිබූ බැවිනි. එහෙත් සජීවීකරණ බලාපොරොත්තුව මිරිඟුවක් මෙන් තව තවත් ඈතට ගොස් ඇත.

වර්තමාන සජීවීකරණ උත්සාහයන් 'නස්රුදීන්ගේ මුද්ද සෙවීමේ උත්සාහය' ට තරමක් සමාන ය. රාත්‍රී කාලයේ ගමනක් යමින් සිටි නස්රුදීන්ගේ මුද්ද නැති විය. මුද්ද සොයමින් සිටි නස්රුදීන්ට මාර්ගයේ ගමන් ගත් මිත්‍රයෙකු හමු විය. මිත්‍රයා නස්රුදීන් අසල නැවතී 'නස්රුදීන්, ඔබ කුමක් කරන්නෙහි දැ යි' ඇසී ය. 'මම මගේ නැතිවූ මුදුව සොයමින් සිටිමි' යි නස්රුදීන් කී ය. මිත්‍රයා ද නස්රුදීන් සමග එක් ව මුදුව සෙවීමට පටන් ගත්තේ ය. දැන් දෙදෙනා ම මුදුව සොයමින් සිටිති. මාර්ගයේ ගමන් ගත් තවත් අසල්වාසී පිරිසක් ද නස්රුදීන් හා ඔහුගේ මිත්‍රයා යෙදී සිටින කාර්ය දැක නස්රුදීන්ගේ මුදුව සෙවීමට සහභාගි වූහ. කෙතෙක් උත්සාහ ගනු ලැබුවත් නස්රුදීන්ට හෝ ඔහුගේ සගයන්ට මුදුව හමු නො විණි. මුදුව සෙවීමෙන් බොහෝ වෙහෙසටත්, පීඩාවටත් පත් ව සිටි එක් අයෙක් නස්රුදීන් අමතා මෙසේ ඇසීය. 'නස්රුදීන්, මුදුව වැටුනු තැන මෙතැන ම බව ඔබට හොඳට ම විශ්වාසද?' 'නැහැ' නස්රුදීන් කී ය. 'එහෙනම් මෙතන පමණක් සොයන්නේ? මාර්ගයේ විදුලි බුබුලක් තියෙන්නේ මෙතන විතරයි, ඒ නිසා මම මුද්ද සොයන්න මෙතැන තෝරා ගත්තා' යි නස්රුදීන් කීය.

ආලෝකය තිබුණ නමුත් පහන් කණුව යටින් නස්රුදීන්ට මුද්ද සොයා ගත නො හැකිවාක් මෙන් සජීවීකරණය සඳහා පහසුවෙන් යොදවා ගත හැකි දිළින්දන් සමග කටයුතු කිරීමෙන් පමණක් සමාජ සජීවීකරණය ද ලඟා කර ගත නො හැකි ය.

රජය ද, රාජ්‍ය නොවන සංවිධාන ද, බොහෝ ආධාර දෙනු ලබන ආයතන ද අද හවුලේ සමාජ සජීවීකරණ වැඩසටහන්වල යෙදී සිටිති. එහෙත් මෙම සජීවීකරණය උත්සාහයන් නස්රුදීන්ගේ 'මුද්ද සෙවීමේ උත්සාහය' ට තරමක් සමාන ය. නස්රුදීන් රාත්‍රී කාලයේ ගමනක් යන විට ඔහුගේ මුද්ද නැති විය. මුද්ද සොයමින් සිටි නස්රුදීන්ට මාර්ගයේ ගමන් ගත් මිත්‍රයෙක් හමු විය. මිත්‍රයා නස්රුදීන් අසල නැවතී 'නස්රුදීන්, ඔබ කුමක් කරන්නෙහි දැ යි' ඇසී ය. 'මම මගේ නැති වූ මුදුව සොයමින් සිටිමි' යි නස්රුදීන් කී ය. මිත්‍රයා ද නස්රුදීන් සමග එක් ව මුදුව සෙවීමට පටන් ගත්තේ ය.

දැන් දෙදෙනා ම මුදුව සොයමින් සිටිති. මාර්ගයේ ගමන් ගත් තවත් අසල්වාසී පිරිසක් ද නස්රුදීන් හා ඔහුගේ මිත්‍රයා යෙදී සිටින කාර්ය දැක නස්රුදීන්ගේ මුදුව සෙවීමට සහභාගි වූහ. කෙතෙක් උත්සාහ ගනු ලැබුවත් නස්රුදීන්ට හෝ ඔහුගේ සගයන්ට මුදුව හමු නො විණි. මුදුව සෙවීමෙන් බොහෝ වෙහෙසටත් , පීඩාවටත් පත් ව සිටි එක් අයෙක් නස්රුදීන් අමතා මෙසේ ඇසීය. 'නස්රුදීන්, මුදුව වැටුණු තැන මෙතැන ම බව ඔබට හොඳට ම විශ්වාද?' 'නැහැ' නස්රුදීන් කී ය. 'එහෙනම් මෙතන පමණක් සොයන්නේ? මාර්ගයේ විදුලි බුබුලක් තියෙන්නේ මෙතන විතරයි, ඒ නිසා මම මුද්ද සොයන්න මෙතැන තෝරා ගත්තා' යි නස්රුදීන් කීය.

ශ්‍රී ලාංකික ජන සමාජය සජීවීකරණය කිරීමේ කාර්ය භාරයේ දී සිදු වන්නේ ද එක් අතකින් නස්රුදීන්ගේ මුද්ද සෙවීමේ උත්සාහයට සමාන උත්සාහයක් බව පෙනේ. නස්රුදීන් මුද්ද සෙවීමට විදුලි බුබුල ඇති තැන යොදා ගත්තාක් මෙන් කිසිදු ප්‍රතිරෝධයකින් තොර ව පහසුවෙන් යොදවා ගත හැකි දිළින්දන් හා දුබලයන් පමණක් සමාජ - සජීවීකරණය සඳහා ද යොදා ගෙන ඇත. සියළු ආකාරයේ වෙනස් වීමේ යෝජනා ගෙන එන්නේ දිළින්දන් සඳහා ම ය. ආකල්ප වෙනස් විය යුත්තේ දිළින්දන්ගේ ය. අකාර්යක්ෂමකම ඇත්තේ දිළින්දන් තුළ ය. මන්දොත්සාහීකම හා අලසකම ඇත්තේ ද ඔවුන් තුළ ය. පරිවර්තනයක් සිදු විය යුතු නම් එය සිදු විය යුත්තේ ද දිළින්දන් තුළ ය. ආලෝකය තිබුණ නමුත් පහන් කණුව යටින් නස්රුදීන්ට මුද්ද සොයා ගත නො හැකිවාක් මෙන් සජීවීකරණය සඳහා පහසුවෙන් යොදවා ගත හැකි දිළින්දන් සමග කටයුතු කිරීමෙන් පමණක් සමාජ සජීවීකරණය ද කළ නො හැකි බව මෙම ග්‍රන්ථය මඟින් ඉදිරි පරිච්ඡේදවල දී විස්තර කරනු ඇත.

## කාල නිශ්චයක් සහිත ව්‍යාපෘතියක් නො ව නො කඩවා දිවෙන ක්‍රියාදාමයක්

ජනසවි සමෘද්ධි යටතේ ක්‍රියාත්මක සජීවීකරණය, ව්‍යාපෘති පදනමක් මත ආරම්භ වී කිසියම් නිශ්චිත කාල සීමාවකින් අවසන් වේ. එහෙත් මේ ග්‍රන්ථයේ හඳුන්වා දෙන සජීවීකරණය එවැනි නිශ්චිත කාල සීමාවකට සීමා නො වී, නො බිඳී ගලා යන පරිවර්තන

ක්‍රියාවලියක් ලෙස විස්තර වේ. උදාහරණ වශයෙන් ගතහොත් සමෘද්ධි නියාමකයන් හෝ ගොවි නියාමකයන් සේ නම් කර ඇති රාජ්‍ය අංශයට සම්බන්ධ සජීවීකාරකයන් යම් ආණ්ඩු පෙරළියක් වුවහොත් අකර්මන්‍ය විය හැකි නමුත් මෙම ග්‍රන්ථයේ හඳුන්වා දෙන සජීවීකාරකයන් එවැනි අකර්මණ්‍ය වන පිරිසක් සේ විස්තර නො වේ.

## දේශපාලන පැලැස්තරයක් නො ව සමාජ සංවර්ධන උපාය මාර්ගයක්

සමාජ සජීවීකරණය තබා වෙන මොන යම් සංවර්ධන වැඩසටහනක් වුව ද මුළුමනින් ම දේශපාලනයෙන් ස්වාධීන කළ නො හැකි ය. මන්ද? යම් දේශපාලන දර්ශනයක් හෝ දේශපාලකයන් ඕනෑ ම සංවර්ධන වැඩසටහනක පිටු පසින් සිටිය හැකි බැවිනි. අරමුණු ඉටු වන්නේ නම්, ගමන නිවැරදි නම් වැඩ සටහන් මෙහෙයවන තැනැත්තන්ගේ දේශපාලනය කුමක්ද යන්න පොදු ජනතාවට ගැටළුවක් නො වේ. කොළඹ සිට නුවර දක්වා යන බස් රථයේ ගමන් ගන්නා මගීන්ට වැදගත් වන්නේ බස් රියදුරාගේ ජාතිය හෝ කුලය නො ව කොතරම් දුරට ආරක්ෂා සහිත ව මගීන් ප්‍රවාහනය කරන්නේද යන වගත් , සත්‍ය වශයෙන් ම මගීනට නුවරට යා හැකි ද යන වගත් ය. රියදුරා කවුරු ද යන්න පිළිබඳ ව සොයා බැලීම මගීන්ට නො වැදගත් වනවා මෙන් ම රියදුරාට තමාගේ කුලය හෝ ජාතිය මේ යැයි කීමට ද අවශ්‍ය නැත.

අද ක්‍රියාත්මක රජය සම්බන්ධ වූ සමාජ සජීවීකරණය දැඩි ලෙස දේශපාලනකරණය වූව කි. ආරම්භයේ සිට ම සජීවීකාරකයා හෙවත් රියදුරා කවුදැ යි ජනතාව දනිති. බොහෝ රියදුරන් රියදුරුකමට තබා වාහනය සෝදා ගැනීමටවත් සුදුස්සෝ නො වන බව ද දනිති. මේ නිසා දේශපාලනකරණය වූ වැඩසටහන් තුළ කලාතුරකින් හෝ දක්ෂයකු සිටියත් ඔවුනට ද පොදු ජනතාවගෙන් ලැබෙන ගරු සැලකිල්ලක් නැත. පිළිගැනීමක් ද නැත. සමාජය සැබෑ ලෙස සජීවීකරණය කිරීමට අවශ්‍ය නම් ඔද්දල් වී , ඕජස් ගලන, කුණු දේශපාලනයෙන් සජීවීකාරකයන් මෙන් ම ජනතාව ද නිදහස් විය යුතු ය. හිටපු ඇමෙරිකානු ජනාධිපති වරයෙකු වූ රේගන් මහතා

කීවාක් මෙන් හොඳ ම ආණ්ඩුව වන්නේ කුඩා ම ආණ්ඩුව ය. 'The least govenment is the best government' එබැවින් සංවර්ධනය පටු දේශපාලනකරණයෙන් ඉවත් කොට දේශපාලකයන්ගේ කෙරුවාව අවම කිරීමටත්, ජනතාවගේ කෙරුවාව උපරිම කිරීමටත් කටයුතු සලස්වා දිය යුතු ය. මෙය මේ ග්‍රන්ථයේ සාකච්ඡා කරන සමාජ සජීවීකරණයේ මූලික කොන්දේසියක් ද වේ.

සජීවීකරණය යනු ජනතාව ගොනාට ඇන්දවීමක් නො වේ. දේශපාලකයන්, නිලධාරීන් මෙන් ම පොදු ජනතාව ද ලෙයින් මසින් තැනුන, පසිඳුරන් සහිත වූවන් බැවින් සිදු වන්නේ කුමක්දැ යි ඔවුහු දනිති. ඒ අනුව හැසිරෙති . තමන් තුළ කිසිදු සජීවීකරණයක් සිදු නො වී අනුන් සජීවීකරණය කර දීමේ කොන්ත්‍රාත්තුව යමෙකු වෙත පවරා අත සෝදා ගැනීම කිසිදු ශිෂ්ඨ සම්පන්න නිලධාරියෙකුට හෝ දේශපාලකයෙකුට කළ නො හැකි ය.

## පවරනු ලැබූ කොන්ත්‍රාත්තුවක් නොව සියල්ලන්ගේ ම සම්මාදමක්

බොහෝ සමාජ සජීවීකරණ වැඩසටහන් දෙස බලන කළ පැහැදිලි ව පෙනී යන කරුණක් නම් දේශපාලකයන් ද, නිලධාරීන් ද, ප්‍රාඥයන් යයි සැලකෙන්නවුන් ද දිළිඳු ජන සමාජය සජීවීකරණය කර දීමේ වගකීම සජීවීකාරකයෙකු යයි කියනු ලැබූවකු වෙත කොන්ත්‍රාත්තුවක් මෙන් පවරා දී ඇති බව යි. සමාජ සජීවීකරණය සජීවීකාරකයා මගින් පමණක් ඉටු වන කාර්ය භාරයක් ලෙස ඔවුහු සලකති. 1981 වර්ෂයේ දී අම්පාර දිස්ත්‍රික්කයේ ගල්ඔය වාරි ජනපද යෝජනා ක්‍රමය ආශ්‍රිත ව ක්‍රියාත්මක වූ සජීවීකරණ වැඩසටහනක දී (එකලට ගැළපෙන වචනය නම් විපර්යාකාරක වැඩසටහන යන්න යි) ලැබූ අත්දැකීමක් මෙහි දී සඳහන් කරමි. මෙම වැඩසටහනේ නියුක්ත සජීවීකාරකයන් විසින් කළ යුතු කාර්ය භාරය වූයේ වාරිමාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතියක් සඳහා ගොවි ජනතාව සහභාගි කරවීමත්, ගොවි ජනතාවගේ ශ්‍රම පරිත්‍යාගයෙන් කුඩා ඇල වේලි ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ඔවුන් පෙළඹවීමත් ය. වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ එවකට සිටි ඉහල නිලධාරියෙකු සජීවීකාරකයන් අමතා කීවේ , පුනරුත්ථාපන වැඩසටහන සඳහා ගොවි ජනතාව පෙළඹවිය නො හැකි නම් හෝ ගොවීන් පුනරුත්ථාපනය සඳහා ශ්‍රමය පරිත්‍යාග නො කරන්නේ නම් එහි වගකීම මුළුමනින් ම

සජීවීකාරකයා වෙත පැවරෙන බවය. වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ වංචා , දූෂණ කුමක් වූවත් ඔවුන්ගේ අක්‍රමිකතා හා අකාර්යක්ෂමතා කුමක් වුවත් ගොවි ජනතාව රැකඩ මෙන් පවරන ලද අරමුණක් සඳහා කටයුතු කිරිමට සැදී පැහැදී සිටිනු ඇතැ යි යන්න එම නිලධාරී මහතාගේ කල්පනාව විය. එමෙන් ම සජීවීකාරකයාගේ මෙහෙයුමට ගොවීන් නතු නො වන්නේ සජීවීකාරකයාගේ දුර්වලකම නිසා බවත්, සජීවීකාරකයා දක්ෂ නම් කුමන තත්වයක් යටතේ වුවත් ජනතාව පෙළඹවිය හැකි බවත් ඔහු කල්පනා කල බව පෙනේ. සජීවීකරණය යනු ජනතාව ගොනාට ඇන්දවීමක් නො වේ. දේශපාලකයන් , නිලධාරීන් මෙන් ම පොදු ජනතාව ද ලෙයින් මසින් තැනුන, පසිදුරන් සහිත වූවන් බැවින් සිදු වන්නේ කුමක්දැ යි ඔවුහු දනිති. ඒ අනුව හැසිරෙති . තමන් තුළ කිසිදු සජීවීකරණයක් සිදු නො වී අනුන් සජීවීකරණය කර දීමේ කොන්ත්‍රාත්තුව යමෙකු වෙත පවරා අත සෝදා ගැනීම කිසිදු ශිෂ්ඨ සම්පන්න නිලධාරියෙකුට හෝ දේශපාලකයෙකුට කළ නො හැකි ය. වෙනත් වචනවලින් කිවහොත් සැබෑ සමාජ සජීවීකරණයක් අපේක්ෂා කරන දේශපාලකයාට හෝ නිලධාරියාට එකී සජීවීකරණයේ බාධක නිර්මාණය කිරීමට ද දායක විය නො හැකි ය. මේ නිසා මේ ග්‍රන්ථයේ සාකච්ඡා වන සමාජ සජීවීකරණය හුදෙක් සජීවීකාරකයෙකු වෙත පවරනු ලැබූ කොන්ත්‍රාත්තුවක් ලෙස විස්තර කිරීම වෙනුවට සියල්ලන්ගේ ම සම්මාදමින් වන සමාජ පරිවර්තනයක් ලෙස විස්තර වේ.

සජීවිකාරකයා සජීවිකාරකයෙකු වශයෙන් සුදුසුකම් ලද්දකු විය යුතු ය. සජීවිකාරකයා අලස නම්, අකාර්යක්ෂම නම්, අවුල් සහගත නම් ඔහුට හෝ ඇයට අනුන් උත්සුක කර වීමට, කාර්යක්ෂම කරවීමට, නිරවුල් කර වීමට නො හැකි ය. සජීවීකාරකයෙකු වෙත තිබිය යුතු අත්‍යවශ්‍ය සුදුසුකම් අතර වඩාත් ම ප්‍රමුඛ සුදුසුකම වන්නේ සජීවීකාරකයෙකු වශයෙන් කටයුතු කිරීමට සජීවිකාරකයා තුළ ඇති අව්‍යාජ කැමැත්ත යි. සජීවීකාරකයන් බොහෝ දෙනෙකුට නැත්තේ ද මෙම සුදුසුකම යි.

## නාම මාත්‍රික සජීවිකාරකයෙකු නො ව සැබෑ සජීවීකාරකයෙකු

සමාජ සජීවීකරණය යනු සමාජ - ආර්ථික බාධක නිසා අලස භාවයට හෝ නිද්‍රාවට පත් ව ඇති ජන සමාජය යළි පණ ගැන්වීමේ

ක්‍රියාවලිය යයි පිළිගනු ලැබුව හොත් හෝ නැත හොත් ජන සමාජය සවිබල ගැන්වීමක් යයි පිළිගනු ලැබුව හොත් එකී පණ ගැන්වීම හෝ බල ගැන්වීම සඳහා මූලික වන පෙළඹවීම් කාර්යයෙහි යෙදෙන සජීවීකාරකයා සජීවීකාරකයෙකු වශයෙන් සුදුසුකම් ලද්දකු විය යුතු ය. සජීවීකාරකයා අලස නම්, අකාර්යක්ෂම නම්, අවුල් සහගත නම් ඔහුට හෝ ඇයට අනුන් උත්සුක කර වීමට, කාර්යක්ෂම කර වීමට, නිරවුල් කර වීමට නො හැකි ය. සජීවීකාරකයෙකු වෙත තිබිය යුතු අත්‍යවශ්‍ය සුදුසුකම් අතර වඩාත් ම ප්‍රමුඛ සුදුසුකම වන්නේ සජීවීකාරකයෙකු වශයෙන් කටයුතු කිරීමට සජීවීකාරකයා තුළ ඇති අව්‍යාජ කැමැත්ත යි. මා දන්නා සජීවීකාරකයන් බොහෝ දෙනෙකුට නැත්තේ ද මෙම සුදුසුකම යි. දක්ෂකම, බුද්ධිය, උගත්කම, නායකත්වය ආදී කුමන සුදුසුකමක් ඇතත් ඕනෑකම හෙවත් කැමැත්ත නම් වූ සුදුසුකම නො මැති විට කිසි විටෙකත් සජීවීකාරකයෙකු ලෙස කටයුතු කළ නො හැකි ය. සමාජ සජීවීකාරකයන් සිය ගණනක් හමු වී ඔවුන් සමග සුහද ව සාකච්ඡා කිරීමෙන් මා ලත් අත්දැකීම අප සියලු දෙනා කම්පනයට පත් කරවන සුලු ය. ඔවුන්ගෙන් බොහෝ දෙනෙකු කීවේ සජීවීකාරකයන් වශයෙන් ඔවුන් කටයුතු කරන්නේ වෙනත් ලබා ගත හැකි විකල්ප රැකියාවක් නො මැති නිසා මිස සජීවීකරණයට ඇති කැමැත්තක් නිසා නො වන බව යි. ඇතැමෙකු සජීවීකරණ කාර්ය භාරයට පමණක් නො ව සජීවීකාරකයන් යනුවෙන් ඔවුන් හඳුන්වනවාට ද කැමැති නැත. රාජ්‍ය සේවයේ සිටින පහළ ම නිලධාරී පුරුක වන ග්‍රාම නිලධාරී වරයාටත් පහළින් සිටින නිලධාරියකු වීම සජීවීකාරකයෙකු වීමට වඩා හොඳ බව ඔවුහු සිතති. අවස්ථාවක් ලද ඕනෑම විටක සජීවීකරණ කාර්ය භාරයෙන් ඉවත් වීමට මාන බලන මොවුහු පිටතින් සජීවීකාරකයන් සේ පෙනුණත් ඇතුළතින් අජීවීකාරකයන් බව අප වටහා ගත යුතු ය. සැබෑ සමාජ සජීවීකරණයකට අත්තිවාරමක් දැමිය හැක්කේ සැබෑ ඕනෑකමක් ඇති අව්‍යාජ සජීවීකාරකයන් ගේ මැදිහත් වීමකින් පමණක් බව කිව යුතු ය. මෙම ග්‍රන්ථය සාකච්ඡා කරන්නේ එවැනි සජීවීකාරකයන් පිළිබඳ ව ය. එවැනි සජීවීකාරකයන් බිහි කරන්නේ කෙසේ ද යන්න පිළිබඳ ව ය. එමෙන් ම එවැනි සජීවීකාරකයන් සඳහා පසුබිම් සකස් කරන්නේ කෙසේ ද යන්න පිළිබඳ ව ය.

පහළ ම මට්ටමේ සිටින ජනතාවට සජීවීකාරකයා ආදර්ශවත් විය යුතු ය. සජීවීකාරකයාට ඔහු මෙහෙයවනු ලබන තැනැත්තාගේ ආදර්ශය හා පෙළඹවීම ලැබිය යුතු ය. මෙහෙයවනු ලබන තැනැත්තාට ඉන් ඉහළ මට්ටමෙන් ආදර්ශය හා පෙළඹවීම ලැබිය යුතු ය. මේ නිසා සමාජ සජීවීකරණය පුරුක් ඇමුණු දම්වැලක් මෙන් එකිනොකාගෙන් වෙන් කළ නො හැකි පෙළඹවීම් ක්‍රියාවලියක් වෙයි.

## බල කිරීමක් නො ව පෙළඹවීමක්

සමාජ සජීවීකරණය සිදු වන්නේ ජනතාව තුළ ස්වශක්තිය හා ආත්ම අධිෂ්ඨානය ඇති වීමෙනි. විශ්වාසය තහවුරු වීමෙනි. අනෙකුත් බොහෝ දේ මෙන් නො ව ස්වශක්තිය , ආත්මාධිෂ්ඨානය, විශ්වාසය ආදී ගුණාංගයන් නීති රීති මගින් හෝ දඬුවම් මගින් හෝ බල කිරීමෙන් හෝ ප්‍රයෝගකාරී රැවටිලි මගින් හෝ ඇති කළ නො හැකි ය. මෙකී ගුණාංගයන් වර්ධනය කිරීමේ එක ම මග වන්නේ ආදර්ශය හා පෙළඹවීම යි. ආදර්ශය හා පෙළඹවීම ලැබිය යුත්තේ ඉහළිනි. පහළ ම මට්ටමේ සිටින ජනතාවට සජීවීකාරකයා ආදර්ශවත් විය යුතු ය. සජීවීකාරකයාට ඔහු මෙහෙයවනු ලබන තැනැත්තාගේ ආදර්ශය හා පෙළඹවීම ලැබිය යුතු ය. මෙහෙයවනු ලබන තැනැත්තාට ඉන් ඉහළ මට්ටමෙන් ආදර්ශය හා පෙළඹවීම ලැබිය යුතු ය. මේ නිසා සමාජ සජීවීකරණය පුරුක් ඇමුණු දම්වැලක් මෙන් එකිනොකාගෙන් වෙන් කළ නො හැකි පෙළඹවීම් ක්‍රියාවලියක් වෙයි. යමෙකු පෙළඹවිය හැක්කේ පොළඹවන්නකු වශයෙන් තිබිය යුතු ලක්ෂණ හා හැකියාවන් ඇති පොළඹවන්නෙකුට පමණි. නැතහොත් සිදු වන්නේ පෙළඹවීම වෙනුවට නො දැනුවත්ව ම බල කිරීම යි. පෙළඹවීමෙන් ලැබිය හැකි ගුණය හෝ තත්වය බල කිරීමෙන් ලද නො හැකි ය. මේ නිසා සජීවීකරණ කාර්ය භාරයේ දී පෙළඹවීම යන්න ඉවත් කළ නො හැකි අනන්‍ය සාධකයක් වෙයි. පෙළඹවීමෙනුත් , බල කිරීමෙනුත් ලබන ප්‍රතිඵල ඇතැම් විට භෞතික වශයෙන් එක සමාන ඒවා විය හැකි නමුත් පෙළඹවීම හා බල කිරීම අන්ත දෙකකට අයත් වූ සංකල්ප ලෙස වැඩිහිටි මනෝවිද්‍යාවේ දී විස්තර කෙරේ. එබැවින් වැඩසටහන මෙහෙයවන්නන් විසින් ඔවුන්ගේ යටත් නිලධාරීන්ට බල කරන විට, එකී යටත් නිලධාරීන් ජනතාව වෙත හැරී ජනතාව පොළඹවනු

ඇතැයි අපේක්ෂා කිරීම පරස්පර විරෝධී ය. එමෙන් ම අතාර්කික ය. යමෙකු තමාට බල කරන විට තමා ද සෙස්සන්ට බල කරනු විනා පොළඹවනු ඇතැයි සිතීම හුදු මිථ්‍යාව කි.

සමාජ සජීවිකරණයෙහි දී පෙළඹවීමේ වැදගත්කම තහවුරු කිරීම සඳහා මා ලැබූ පෞද්ගලික අත්දැකීමක් ඉදිරිපත් කරමි. මෑත යුගයේ රජයේ ප්‍රධාන අමාත්‍යාංශයක් විසින් සැලසුම් කරන ලද සමාජ සජීවිකරණ වැඩසටහනක් මෙහෙයවීමේ වගකීම භාර දී තිබුණේ පරිපාලන සේවයේ ඉහළ මට්ටමේ නිලධාරියෙකුට ය. පෙළඹවීමේ ශිල්ප ක්‍රම පිළිබඳ ව හෝ වැඩිහිටි මනෝවිද්‍යාවේ 'අ' යන්න නො දත් ඔහු පරිපාලන දිස්ත්‍රික්කවලින් කැඳවා ගත් නිලධාරීන් සමග පැවැත් වූ වැඩසටහන හඳුන්වා දීමේ රැස්වීමක දී සජීවිකරණ නියෝග නිකුත් කරනු ලැබී ය. අසවල් දිනට පෙර සජීවිකරණය සඳහා වෙන් කළ මුදල් අවසන් වන බවත්, එකී දිනට පෙර ජනතාව පෙළට සිටුවා හිස බූ ගාන්නාක් මෙන් සජීවිකරණය කර දෙන ලෙසත් ඔහු නියෝග කළේ ය. රැස්වීමට පැමිණි දිස්ත්‍රික් නිලධාරීන් කිසිවෙකුත් මුවින් නො බැන, කිසිදු ප්‍රශ්නයක් නො නඟා නියෝගය පිළිපදින බවක් පෙන් වූ නමුත් රැස්වීම අවසන් වූ තැන් සිටම එකී නිලධාරියාගේ නො හොබිනා නියෝගය ගැනත්, මුග්ධ භාවය ගැනත් ආක්‍රෝශ පරිහව කරන්නට පටන් ගත් හ. එහෙත් මෙකී සියලු ආක්‍රෝශ පරිහවයක් ම නියෝග කාරයා නොමැති විට පමණක් කිරීමට ඔවුහු වග බලා ගත් හ. මන්ද? ඉහළින් දෙන ලද නියෝගයක් පිළිබඳ ව ප්‍රශ්න කිරීමේ අයිතියක් පරිපාලන නිලධාරී ව්‍යුහය තුළ යටත් නිලධාරීන්ට තිබේ යයි ඔවුන් විශ්වාස නො කරන බැවිනි. මා හොඳින් දන්නා හඳුනන දිස්ත්‍රික් නිලධාරීන් කිප දෙනෙකු ම කීවේ වැඩ නො කිරීම නිසා පරිපාලන නිලධාරියෙකුට ගැටලුවක් ඇති නො වන නමුත් කොතරම් වැඩ කරමින් සිටිය දී වුව ද ඉහළ නිලධාරියෙකු ප්‍රශ්න කිරීමට ලක් කළ හොත් බරපතල ගැටලු ඇති විය හැකි බව යි. කෙසේ වෙතත් නො කළ හැකි දෙයක් කළ හැකි යයි කීම රැවටීමක් හෝ මුළා කිරීමක් නො වන්නේ දැ යි මා ප්‍රශ්න කළ විට එක් නිලධාරියෙකු කීවේ මුල් පිළිතුරටත් වඩා සිත්ගන්නා සුලු පිළිතුරකි. 'ඔය නිලධාරියා අසවල් දිනට පෙර සමාජ සජීවිකරණ වැඩසටහන් අවසන් කරන්නට කියා අපට කියන නමුත් ඔහු ම දන්නවා එහෙම

කළ නො හැකි බව. එයා මෝඩයෙක් නො වෙයි. එයාටත් ඉහළින් ඉන්න කෙනෙක් එයාට නියෝගයක් දෙන්න ඇති. ඉතින් එයත් අකමැතියි නෙ ඉහළ ඉන්න නිලධාරියාගේ අදහසට විරුද්ධ වෙන්න' යන්න එම නිලධාරියාගේ පැහැදිලි කිරීම විය. මෙම පැහැදිලි කිරීමෙන් සමාජ සජීවිකරණය පිළිබඳ ව පමණක් නො ව රාජ්‍ය නිලධාරි ව්‍යුහය තුළ ඕනෑම කාරණා කටයුත්තක් සිදු වන්නේ කෙසේ ද යන්න පිළිබඳව මට හොඳ පිංතූරයක් ලැබිණි.

> බොහෝ සජීවිකරණ වැඩසටහන් තුළ හරවත් යමක් නැති නමුත් එම වැඩසටහන් මගින් පොදු ජනතාව ඉදිරියට ගෙන ඒම සඳහා මහත් වැඩ කොටසක් කරන ලදැයි වැඩසටහන් සම්පාදකයෝ ද , මෙහෙයවන්නෝ ද , සජීවිකාරකයෝ ද , ආධාර ආයතන ද, ඇගයුම් කරුවෝ ද, ඔවුනොවුන් විසින් ම තෘප්තියට පත් ව සිටිති. එබැවින් සජීවිකරණ වැඩසටහන් සමාජ යථාර්ථයන් වීම වෙනුවට අන්ධයන්ගේ සුප් හැලි බවට පත්ව තිබේ.

## අතිශයෝක්තියක් නොව සමාජ යථාර්ථයක්

සමාජ සජීවිකරණ වැඩසටහනක් පිළිබඳ ව කෙරෙන ඇගයුම් බොහෝ විට අතිශයෝක්තියකින් යුතු බව පෙනේ. බොහෝ සජීවිකරණ වැඩසටහන් තුළ හරවත් යමක් නැති නමුත් එම වැඩසටහන් මගින් පොදු ජනතාව ඉදිරියට ගෙන ඒම සඳහා මහත් වැඩ කොටසක් කරන ලදැයි වැඩසටහන් සම්පාදකයෝ ද, මෙහෙයවන්නෝ ද, සජීවිකාරකයෝ ද, ආධාර ආයතන ද, ඇගයුම් කරුවෝ ද, ඔවුනොවුන් විසින් ම තෘප්තියට පත් ව සිටිති. එබැවින් සජීවිකරණ වැඩසටහන් සමාජ යථාර්ථයන් වීම වෙනුවට අන්ධයන්ගේ සුප් හැලි බවට පත්ව තිබේ. අන්ධයන් පිරිසක් එක්ව සුප් පිසීම සඳහා පණ ඇති මාළුවකු රැගෙන ආ හ. ඔවුහු ජල බඳුන ලිප තබා මාළුවා පණ පිටින්ම බඳුනට දැමූ හ. මාළුවා බඳුනෙන් පිටතට පනින ලද නමුත් අන්ධයෝ ඒ පිළිබඳ කිසිදු හෝඩුවාවක් නොදත්හ. සුප් බඳුන පැසුණු පසු එක් අන්ධයෙක් රස බලා, 'හරිම රස සුප් එකක් ' යයි කී ය. තවෙකෙක් කීවේ තමා බිව් සුප්වලින් හොඳම සුප් බීම මාළු සුප් බවත්, තමා මාළුවා රැගෙන ආ නිසා ගෞරවය ඔහුට හිමි විය යුතු බව ය. මාළුවාට මුදල් ගෙවන ලද්දේ තමා නිසා තමාට ගෞරවය හිමි විය යුතු බව තවත් අන්ධයෙකුගේ අදහස විය. සියලු දෙනා ම බොහෝ සතුටින් පිළිසඳරෙහි යෙදෙමින් සුප් පානය කළහ. එක් වරම දඟලමින් සිටි මාළුවා අන්ධයෙකුගේ කකුලට පැන්නේ ය. 'මෙන්න

අපි ගෙනා මාළුවා තවමත් පණ පිටින්' ඔහු කෑ ගැසීය. 'එහෙනම් ඌ වතුරට දානකොට අහකට පණින්න ඇති' තවකෙක් කී ය. 'මාළුවා සුප් එක ඇතුළේ සිටියා නම් සුප් එක කොහොම රහකට තියෙයි ද? තවත් අන්ධයෙක් කී ය.

සජීවීකරණ වැඩසටහන් සම්පාදකයෝ, ඒවා මෙහෙය වන්නන් සහ සජීවීකාරකයෝ බොහෝ විට ඔවුන්ගේ වැඩසටහන්වල දුර්වල කම් නො දකිති. දුටු ව ද නො දැක්කා සේ අන්ධයන් ගේ සුප් වර්ණනාවට සමාන වර්ණනාවක් කරති. ඇතැම් විට ඇගයුම් කරුවන් මගින් සිදුවන්නේ ද මේ තත්වයට අනුබල දීම කි. වැඩසටහන් සම්පාදකයන් හා ක්‍රියාකාරීන් අමනාප කර ගත යුතු නැතැ යි, ඇගයුම්කරුවන් සිතන බැවින් ඇගයුම් වාර්තා සකස් කිරීමේ දී තම තමන්ගේ සේවාදායකයන් සතුටු කිරීමට ඔවුහු කටයුතු කරති. මේ නිසා සමාජ සජීවීකරණ වැඩසටහන් පමණක් නො ව අනෙකුත් බොහෝ ප්‍රජා සංවර්ධන වැඩසටහන් ද, ජනතා සහභාගිත්ව වැඩසටහන් ද සමාජ යථාර්ථයන් වීම වෙනුවට මනෝ ලෝක තුළ පමණක් ගොඩ නැගෙන යුටෝපියාවන් (පරමාදර්ශයන්) බවට පත්ව තිබේ. සැබෑ ලොව දී දිළින්දා එදා සිටි තැනම ය. සමාජ අසාධාරණය තිබුණාටත් වැඩි ය. ජනතා සාමූහිකත්වය, සහයෝගය එදා තිබූ තැනම ය. නැතහොත් ඊටත් පිටු පසිනි. එහෙත් සියල්ල සැලසුම් කළ පරිදි, සතුටුදායක ලෙස ඉටු වී ඇතැයි අපි සියල්ලෝ ම සතුටට පත් ව සිටිමු.

හැඳින්වීම නම් වූ මෙම පරිච්ඡේදය මගින් ඉටු කිරීමට බලාපොරොත්තු වූ ප්‍රධාන අරමුණු දෙකකි. ඉන් පළමුවැන්න වූයේ සමාජ සජීවීකරණය නම් වූ මාතෘකාවට කෙටි හැඳින්වීමක් සැපයීමෙන් ග්‍රන්ථයේ ඉදිරි පරිච්ඡේද සඳහා පාඨකයාට ප්‍රවිෂ්ඨයක් ලබා දීම යි. දෙවැන්න වූයේ සමාජ සජීවීකරණය අර්ථ දක්වා ගැනීම , එහි විෂයානු බද්ධ හා භාෂාමය අර්ථ පිරික්සීම සහ සමාජ සජීවීකරණයේ විකාශය පිළිබඳ ව පාඨකයා නිරවුල් කිරීම සඳහා සංගෘහිත සාකච්ඡාවක් පැවැත්වීම යි. මෙකී ද්විවිධ අරමුණු ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් සාකච්ඡාවක් සිදු කරන ලද බැවින් දැන් අපි ඉදිරි පරිච්ඡේද සඳහා ගමන් ඇරඹීමට සුදුස්සෝ වෙමු. කෙසේ වෙතත් හැඳින්වීම අවසන්

කිරීමට පෙරාතු ව පාඨකයාට කිව යුතු තවත් වැදගත් කරුණක් තිබේ. මෙම ග්‍රන්ථය කියවන පාඨක ඔබ ඇතැම් විට සමාජ සජීවීකරණ කාර්ය භාරයේ නියුක්ත වූ වග කිව යුතු ක්‍රියාකාරියෙකු වන්නට පුළුවන. එබැවින් ඔබ මතක තබා ගත යුත්තක් තිබේ. එනම්, මෙම ග්‍රන්ථය කථා කරන්නේ ඔබ පිළිබඳ ව නො වන බව යි. ඔබේ ආයතනය පිළිබඳව ද නො වන බව යි. ඔබේ වැඩසටහන පිළිබඳව ද නො වන බව යි. ග්‍රන්ථයේ පැනෙන දෑ, විග්‍රහ වන දෑ ඔබගේ පෞද්ගලික අත්දැකීමක් සේ පෙනී යා හැකි වුවත්, ඇතැම් විට ඔබගේ ම ව්‍යාපෘතිය හෝ ඔබ සම්බන්ධ ආයතනය ගැන හෝ ඍජුව ම ඔබ පිළිබඳ ව කෙරෙන සාකච්ඡාවක් සේ පෙනී යා හැකි වූවත් කතුවරයා කථා කරන්නේ පොදුවේ ශ්‍රී ලංකාවේ සමාජ සජීවීකරණය පිළිබඳ ව බව ඔබ සිහි කළ යුතු ය. මන්ද ? නැතහොත් ඔබ කතුවරයා සමග අමනාප විය හැකි බැවිනි. ආවේගවලට යටත් වී ග්‍රන්ථයේ සාකච්ඡා වන දෑ කිසිදු වග විභාගයකින් තොර ව ප්‍රතික්ෂේප කළ හැකි බැවිනි. ඔබට මේ ග්‍රන්ථයේ ඉදිරිපත් කර ඇති කරුණු රිසි පරිදි ප්‍රතික්ෂේප කළ හැකි ය. එහෙත් කරුණු විමසීමට පෙරාතුව ම ඔබ ප්‍රතික්ෂේප කරන්නකු බවට පත් වුව හොත් කතුවරයාගේ අරමුණ ඉටු නො වෙයි. මේ නිසා අවසන් වශයෙන් කිව යුත්තේ සමාජ සජීවීකරණය සම්බන්ධයෙන් ලියැවුණු මෙම ග්‍රන්ථය 'බාරා නසීයං' තත්වයක් බවට පත් කර ගත යුතු නැති බව යි. එක් ගමක 'බාරා' නම් වූ පුතකු සිටි ගොවි මවක් ගමේ පන්සලේ පැවැත් වූ පිරිත් පිංකමකට සහභාගි වූවා ය. පිරිතට වැඩ සිටි හාමුදුරුවන් වහන්සේලා 'බාරා නසීයං' යයි සජ්ජායනා කරනු ඇසීමෙන් කිපුණු ගොවි මව මගේ බාරාට නැසෙන්නට කියන හාමුදුරුවන්ට ගමේ සිටින අනික් ගැටවුන් නො පෙනේ දැ යි ඇසුවා ය. එහෙත් පිරිත් සජ්ජායනාවෙන් කීවේ ගමේ සිටි බාරා ගැන නො ව ඉන්දියාවේ බරණැස පිළිබඳ ව බව ඇය දැන නො සිටියා ය. පිරිත් දේශනයේ සජ්ජායනා වූ 'බාරා නසීයං' ගමේ සිටි බාරා ගැන සාකච්ඡා නො කළාක් මෙන් මෙම ග්‍රන්ථය සාකච්ඡා කරන සමාජ සජීවීකරණය ද ඔබ ගැන, ඔබේ ආයතනය ගැන හෝ ඔබේ වැඩසටහන ගැන සාකච්ඡා නො කරයි. මෙම ග්‍රන්ථය සාකච්ඡා කරන්නේ ශ්‍රී ලාංකික ජන සමාජයේ යථාර්ථයන් පිළිබඳ ව ය. අපේ වැඩිහිටියන්ගේ චර්යා රටා පිළිබඳ ව ය. අපේ බහුතර ජනතාව

උරුම කර ගෙන ඇත්තා වූ පරාධීනත්වයේ, බයාදුකමේ, මන්දෝත්සාහීකමේ අනිටු ප්‍රතිවිපාක පිළිබඳ ව ය. දේශපාලනකරණයේ, නිලධාරී වාදයේ හා බලලෝභීත්වයේ ආදීනව පිළිබඳ ව ය. අවස්ථාවාදයේ, කුහකත්වයේ හා ආත්ම වංචාවේ භයානකකම පිළිබඳ ව ය. කෙටියෙන් කිවහොත් අපේ ජන සමාජයේ ඉදිරි ගමන වැළැක්වීම සඳහා අප විසින් ම පනවා ගෙන ඇති අභ්‍යන්තර බාධකයන් ජය ගන්නේ කෙසේ ද යන්න පිළිබඳ ව ය.

> මෙම ග්‍රන්ථය සාකච්ඡා කරන්නේ ශ්‍රී ලාංකික ජන සමාජයේ යථාර්ථයන් පිළිබඳ ව ය. අපේ වැඩිහිටියන්ගේ චර්යා රටා පිළිබඳ ව ය. අපේ බහුතර ජනතාව උරුම කර ගෙන ඇත්තා වූ පරාධීනත්වයේ, බයාදුකමේ, මන්දෝත්සාහීකමේ අනිටු ප්‍රතිවිපාක පිළිබඳ ව ය. දේශපාලනකරණයේ, නිලධාරී වාදයේ හා බලලෝභීත්වයේ ආදීනව පිළිබඳ ව ය. අවස්ථාවාදයේ, කුහකත්වයේ හා ආත්ම වංචාවේ භයානකකම පිළිබඳ ව ය. කෙටියෙන් කිවහොත් අපේ ජන සමාජයේ ඉදිරි ගමන වැළැක්වීම සඳහා අප විසින් ම පනවා ගෙන ඇති අභ්‍යන්තර බාධකයන් ජය ගන්නේ කෙසේ ද යන්න පිළිබඳ ව ය.

ඉදිරි පරිච්ඡේදයට පිවිසීම සඳහා මේ පරිච්ඡේදයේ සාකච්ඡා වූ දෑ අප දැන් සාරාංශ කළ යුතු ය. සමස්තයක් වශයෙන් ගත් විට මේ පරිච්ඡේදයෙන් කියවුණේ සමාජ සජීවීකරණයේ නාමයෙන් වර්තමානයේ ක්‍රියාවට නැගෙන වැඩසටහන් සැබෑ සජීවීකරණ වැඩසටහන් නො වන බව ය. එමෙන් ම සැබෑ සමාජ සජීවීකරණයක් තුළ සමාජයේ එක් කොටසක් නො ව සමස්ත සමාජය ම ඉලක්ක විය යුතු බව ය. ඉතාමත් සංක්ෂිප්ත ව ගත් කල්හි මේ පරිච්ඡේදයේ දී හෙළිදරව් කරන ලද තොරතුරු අනුව සමාජ සජීවීකරණය වනාහි සියල්ලන්ගේ ම වගකීමකි. සියල්ලන්ගේ ම සම්මාදමකි. සියල්ලන්ට ම භුක්ති විඳිය හැකි සමාජ - ආර්ථික ප්‍රතිලාභයකි.

ග්‍රන්ථයේ ඉදිරි පරිච්ඡේද පිළිබඳව ද යමක් මෙහි දී කිව යුතු ය. මෙම ග්‍රන්ථය වෙළුම් දෙකකින් යුතු ය. එක් වෙළුමකට පරිච්ඡේද හතර බැගින් සම්පූර්ණ ග්‍රන්ථය පරිච්ඡේද අටකින් සමන්විත ය. පළමු පරිච්ඡේදය සමාජ සජීවීකරණයට හැඳින්වීමක් සැපයීම සඳහා වෙන් වන අතර දෙවන පරිච්ඡේදයෙන් සමාජ සජීවීකරණයක අවශ්‍යතාව කුමක් ද යන්න විස්තර කෙරේ. තුන් වැනි පරිච්ඡේදයෙන් සමාජ

සජීවීකරණයට පාදක වන මනුෂ්‍ය චර්යාව විශ්ලේෂණය වන න්‍යායාත්මක පසුබිමත්, සිව් වැනි පරිච්ඡේදයෙන් සමාජ සජීවීකරණය සඳහා ගත යුතු මග පිළිබඳවත්, විස්තර වේ. දෙවැනි වෙළුම ආරම්භ වන්නේ පස් වැනි පරිච්ඡේදයෙනි. පස් වැනි පරිච්ඡේදයෙන් ආර්ථික බලගැන්වීම පිළිබඳවත්, ස වැනි පරිච්ඡේදයෙන් සමාජ බල ගැන්වීම පිළිබඳවත්, සත් වැනි පරිච්ඡේදයෙන් සමාජ සජීවීකාරකයා පිළිබඳවත්, අට වැනි පරිච්ඡේදයෙන් ග්‍රන්ථයේ සාරාංශය හා නිගමනයනුත් ඉදිරිපත් කෙරේ.

# 2 පරිච්ඡේදය

## සමාජ සජීවීකරණයක අවශ්‍යතාව

පළමු පරිච්ඡේදයේ අරමුණ වූයේ සමාජ සජීවීකරණය පිළිබඳ ව පාඨකයාට හැඳින්වීමක් සැපයීම යි. සමාජ සජීවීකරණය නම් වූ විෂයයෙහි ස්වභාවය, ව්‍යාප්තිය හා සීමා පිළිබඳවත්, එහි භූමිකා රඟපාන්නන් කවුරුන් ද යන්න පිළිබඳවත් දළ හෙළිදරව් කිරීමක් පළමු පරිච්ඡේදය තුළ දී සිදු විය. මේ නිසා දෙවැනි පරිච්ඡේදයේ අරමුණ වන්නේ සමාජ සජීවීකරණයක අවශ්‍යතාව තහවුරු කිරීම උදෙසා කරුණු ඉදිරිපත් කිරීම ය. සජීවීකරණයට පාදක වන ගැටලු සහ අවස්ථා විශ්ලේෂණය කිරීමත්, එමගින් පාඨකයා තව දුරටත් නිරවුල් කොට සජීවීකරණයක අවශ්‍යතාව සහතික කිරීමත් මෙම පරිච්ඡේදයේ මූලික අරමුණු වේ .

සමාජ සජීවීකරණයක් අවශ්‍ය වන්නේ ප්‍රධාන කරුණු දෙකක් සඳහා ය. එකක් නම් සමාජ සහ ආර්ථික ගැටලු නිරාකරණය කර ගැනීම ය. අනෙක සමාජ සහ ආර්ථික සංවර්ධනය සඳහා පාදක කර ගත හැකි අවස්ථාවන් ගෙන් නිසි ලෙස ප්‍රයෝජන ගැනීම ය. සමාජ ආර්ථික ගැටලු නිරාකරණය කර ගැනීමත්, සංවර්ධනයට පාදක කර ගත හැකි අවස්ථා නිසි ලෙස ප්‍රයෝජනයට ගැනීමත් මගින් සිදු වන්නේ රටක් හෝ ජාතියක් සංවර්ධනය වීම ය. මේ නිසා ඉතා සරළ ව කිව හොත් සජීවීකරණයක් අවශ්‍ය වන්නේ සංවර්ධනය සඳහා ය.

සමාජ සජීවීකරණයක් අවශ්‍ය වන්නේ සංවර්ධනය උදෙසා යයි පිළිගනු ලැබුව හොත් ඒ පිළිගැනීම නිසා මතු වන අතුරු ප්‍රශ්නයක් තිබේ. පාඨකයා වෙනුවෙන් කතුවරයා එම ප්‍රශ්නය නැඟීමට කැමති ය. මක් නිසා ද? පාඨකයාට ප්‍රශ්නයක් නැඟීමට අවසරයක් තිබුණා නම් බුද්ධිමත් පාඨකයා මේ අවස්ථාවේ දී එම ප්‍රශ්නය නගහ බැවිනි. ප්‍රශ්නය නම් : දැනටමත් සංවර්ධිත තත්වයට පත් ව ඇතැයි සලකනු ලබන රටවල් ඔවුන් අත් පත් කර ගෙන ඇති සංවර්ධනය ලබා ගත්තේ සමාජ සජීවීකරණයක් මගින් ද යන්න යි.

මෙම ප්‍රශ්නයට දිය යුතු පිළිතුර පරස්පර විරෝධී ය. එක් පිළිතුරක් 'නැත' යන්න යි. අනෙක 'ඔව්' යන්න යි. 'නැත' යයි කියනු ලබන්නේ එක් අර්ථයකිනි. ඔව් යයි කියනු ලබන්නේ ඊට වෙනස් වූ අර්ථයකිනි. දියුණු යයි සම්මත රටවල් අප කථා කරන සමාජ සජීවීකරණය හරහා ඔවුන් ලැබූ දියුණු තත්ත්වයට ළඟා වූවා නම් අනිවාර්යයෙන් ම සජීවීකරණය නම් වූ විෂයයක් විශ්ව සංවර්ධන සාහිත්‍යයේ ප්‍රමුඛ මාතෘකාවක් වශයෙන් සඳහන් වනු ඇත. වෙනත් ආකරයකින් කියනවා නම් කෘෂිකාර්මික විප්ලවය, කාර්මික විප්ලවය වැනි සංවර්ධන අවස්ථාවලට ලැබුණු තැනට නො දෙවෙනි තැනක් සජීවීකරණයටත් ලැබෙනු ඇත. එහෙත් සජීවීකරණය බටහිර ලෝකයට නුහුරු නුපුරුදු , ආගන්තුක විෂයයක් නිසා සමාජ සජීවීකරණයක් ගැන විශ්ව සංවර්ධන සාහිත්‍යයෙහි කිසිවක් සඳහන් නැත. සැබැවින් ම සජීවීකරණය තුන් වැනි ලෝකය ආශ්‍රයෙන් බිහි වූ විෂයයකි. මේ අනු ව දියුණු යයි සම්මත රටවල් අද සිටින තත්ත්වයට ළඟා වූයේ සජීවීකරණය හරහා නො වන බව කිව යුතු ය.

> සමාජ සජීවිකරණයක් අවශ්‍ය වන්නේ ප්‍රධාන කරුණු දෙකක් සඳහා ය. එකක් නම් සමාජ සහ ආර්ථික ගැටලු නිරාකරණය කර ගැනීම ය. අනෙක සමාජ සහ ආර්ථික සංවර්ධනය සඳහා පාදක කර ගත හැකි අවස්ථාවන් ගෙන් නිසි ලෙස ප්‍රයෝජන ගැනීම ය.

'ඔව්' යන පිළිතුරට ද පදනමක් තිබේ. මක් නිසා ද? සමාජ සජීවීකරණය මඟින් ඉස්මතු කිරීමට බලාපොරොත්තු වන තත්ත්වයෙන් තොර ව සංවර්ධනය කරා ළඟා වීම උගහට බැවිනි. වෙනත් ආකාරයකින් කිව හොත් උවමනාවෙන් ම ගනු ලබන සමාජ සජීවිකරණ පියවර නො මැති වුව ද සමාජ සජීවිකරණ උපාය මාර්ග වනාහි සංවර්ධනයේ මූලික අවශ්‍යතාවන් වන බැවිනි. මේ නිසා දියුණු යයි සම්මත රටවල් ද සංවර්ධිත තත්ත්වයට ළඟා වූයේ සජීවිකරණය හරහා යයි යමෙකුට තර්ක කළ හැකි ය.

බටහිර රටවලට උවමනා නො වූ සමාජ සජීවිකරණයක් ආසියාතිකයන්ට අවශ්‍ය වන්නේ ඇයි ද? යන්න පාඨකයා තුළ පැන නැගෙන මී ළඟ ප්‍රශ්නය වෙයි. මේ පිළිබඳ ව ඉතාමත් අගනා විවරණයක් කර ඇත්තේ 1960 ගණන්වල අග භාගයේ දී දකුණු

ආසියාතික රටවල දිළිඳුකම පිළිබඳ පුළුල් විශ්ලේෂණයක් කර ඇති ගුනාර් මිර්ඩාල් ගේ ආසියානු නාටකය (Asian Drama) නම් කෘතියෙහි ය. ගුනාර් මිර්ඩාල් ඉතා පැහැදිලි ව ප්‍රකාශ කර ඇත්තේ බටහිරට ගැළපෙන සංවර්ධන න්‍යායයන් ආසියාවේ දී අවලංගු බවත්, ආසියාව සඳහා වෙන ම න්‍යායයන් හඳුන්වා දීම අවශ්‍ය බවත් ය (Gunnar Myrdal,1972). සමාජ සජීවිකරණය නමින් අද අප කතා කරන විෂයය ගැන ඔහු සඳහන් කර නැතත් එම තත්ත්වයන් ම වෙනත් වචන වලින් විස්තර කර ඇත. මේ නිසා ආසියානු සංවර්ධනයේ සැබෑ තේරුම් ගැනීම වන්නේ සංවර්ධනය සඳහා බටහිර රටවල් නො යෙදූ උපක්‍රම ආසියාතිකයන් විසින් යෙදිය යුතු බව ය. සමාජ සජීවිකරණය සංවර්ධන උපාය මාර්ගයක් වශයෙන් ඉස්මතු ව පෙනෙන්නේ මේ පරිසරය තුළ ය.

> සජීවිකරණයක් අවශ්‍ය වන්නේ, මිනිසුන් ගේ විගව ශක්තීන් මතු කිරීමට ය. දිළිඳු බව තුරන් කිරීමට ය. සමාජ සාධාරණය ඉස්මතු කිරීමට ය. සමානාත්මතාව තහවුරු කිරීමට ය. අපරාධ අඩු කිරීමට ය. ඉච්චාභංගත්වය, අසහනය, පසුබෑම ජය ගැනීමට ය. අලසකම, මන්දෝත්සාහීකම තුරන් කිරීමට ය. කාර්යක්ෂමතාව වැඩි කිරීමට ය. බයාදුකම, නියාලුකම, පරාධීනකම, කාළකන්නිකම ජය ගැනීමට ය. පුහු ආටෝපය වෙනුවට සැබෑ ගෞරවාන්විත බව ඇති කිරීමට ය. පුරාජේරුව, කයිවාරුව, පම්පෝරිය වෙනුවට ක්‍රියාව ඉස්මතු කිරීමට ය. ඉතා කෙටියෙන් කිව හොත් ශ්‍රී ලාංකික ජන සමාජය ප්‍රතිගාමී කර ඇති බලවේග යටපත් කොට ප්‍රගතිශීලී කරන බලවේග ඉස්මතු කිරීමට ය.

ආසියාතික ජන සමාජය ඉදිරියට ගෙන ඒම සඳහා ගැළපෙන විශේෂ උපක්‍රම පිළිබඳ ව කල්පනා නො කොට බටහිර න්‍යායෙහි පමණක් එල්බ සිටීම එක් අතකින් අනුකරණය කෙරෙහි අසීමිත ව විශ්වාසය තැබීම කි. තවත් අතකින් ආසියාතිකයන් ගොඩ ගැනීමට සුදුසු නව න්‍යායන් බටහිරින් පැමිණෙන තුරු බලා සිටීමකි. මේ සියල්ලට ම වඩා සංවර්ධනය පිළිබඳ අනවධානය, ප්‍රමාදය හා නො සැලකිල්ල ප්‍රදර්ශනය කිරීමකි. මේ නිසා බටහිර රටවල් සංවර්ධිත තත්ත්වයට ගෙන ඒමට පාදක වූ න්‍යායයන් මගින් ආසියාව ද සංවර්ධනය වනු ඇතැයි ප්‍රතිගාමී ව බලා සිටීමෙන් සිදු වන්නේ සමාජ ආර්ථික ගැටලු විසින් දිගින් දිගට ම ආසියාතිකයන් පෙළනු ලැබීම ය. සංවර්ධන අවස්ථා තව දුරටත් ගිලිහෙමින් යාම ය. එමගින් දිළිඳුකම වැඩි වීම

ය. මිනිස් අයිතිවාසිකම් අවලංගු වීම ය. අසමානාත්මතාව හා අසාධාරණය රජ වීම ය.

ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ගත් විට සජීවීකරණයක් අවශ්‍ය වන්නේ විස්තීර්ණ වුවමනාවන් ගණනාවක් සපුරා ගැනීම සඳහා ය. මෙම පරිච්ඡේදයේ මතු පෙළ ගැසෙන තොරතුරු, තර්ක, විතර්ක මත පදනම් ව කෙරෙන සංවාදයෙන් සිදු වනනේ සජීවීකරණයට පාදක වන උවමනාවන් මොනවා දැ යි පැහැදිලි කිරීම ය. ඒ සංවාදයේ සංක්ෂිප්ත හරය ගොනු කරනු ලැබුව හොත් එය පහත ආකාර වේ. එනම් සජීවීකරණයක් අවශ්‍ය වන්නේ, මිනිසුන් ගේ විභව ශක්තීන් මතු කිරීමට ය. දිළිඳු බව තුරන් කිරීමට ය. සමාජ සාධාරණය ඉස්මතු කිරීමට ය. සමානාත්මතාව තහවුරු කිරීමට ය. අපරාධ අඩු කිරීමට ය. ඉච්චාභංගත්වය, අසහනය, පසුබෑම ජය ගැනීමට ය. අලසකම, මන්දෝත්සාහීකම තුරන් කිරීමට ය. කාර්යක්ෂමතාව වැඩි කිරීමට ය. බයාදුකම, නියාලුකම, පරාධීනකම, කාළකන්නිකම ජය ගැනීමට ය. පුහු ආටෝපය වෙනුවට සැබෑ ගෞරවාන්විත බව ඇති කිරීමට ය. පුරාජේරුව, කයිවාරුව, පම්පෝරිය වෙනුවට ක්‍රියාව ඉස්මතු කිරීමට ය. ඉතා කෙටියෙන් කිව හොත් ශ්‍රී ලාංකික ජන සමාජය ප්‍රතිගාමී කර ඇති බලවේග යටපත් කොට ප්‍රගතිශීලී කරන බලවේග ඉස්මතු කිරීමට ය.

සමාජ සජීවීකරණයක අවශ්‍යතාව පිළිබඳ ව කතා කරන මෙම පරිච්ඡේදය ආරම්භයේ දී සඳහන් කරනු ලැබුයේ සමාජ සජීවීකරණයක් අවශ්‍ය වන්නේ මූලික වශයෙන් ම ගැටලු නිරාකරණය කර ගැනීමකට හා අවස්ථා වලින් නිසි ඵල ප්‍රයෝජන ලැබීමට බව යි. මේ නිසා මේ පරිච්ඡේදය තුළ ඉටු කළ යුතු ප්‍රධාන කාර්යය දෙකක් වෙයි. ඉන් පළමුවැන්න ගැටලු සහ අවස්ථා (Problems and Opportunities) යනු මොනවා දැ යි පැහැදිලි කර ගැනීම ය. දෙවැන්න ශ්‍රී ලාංකික ජන සමාජය සැබෑ වශයෙන් මුහුණ දෙන සමාජ ආර්ථික ගැටලු හා මග හැර යන අවස්ථා (Lost Opportunities) මොනවාදැ යි හඳුනා ගැනීම ය.

## ගැටලු

පළමුවෙන් ම ගැටලුවක් යනු කුමක් දැයි හඳුනා ගැනීමට උත්සාහ ගනිමු. ගැටලුවක් යනු කුමක් ද? ගැටලුවක් නිර්මාණය වන්නේ කුමන පසුබිමක් පාදක කොට ගෙන ද? කිසියම් නො ගැළපීමක්, පරතරයක් හෝ හිදැසක් නිසා ගැටලුවකට පසුබිමක් සකස් කෙරෙයි. නො ගැළපීමක්, පරතරයක් හෝ හිදැසක් නොමැති විට ගැටලුවක් නැත. නො ගැළපීමක් පරතරයක් හෝ හිදැසක් පවතින්නේ මිනිසාගේ බලාපොරොත්තු නිසා ය. මිනිසා නැමැති සත්ත්වයා බලාපොරොත්තු මත ජීවත් වන්නෙකි. එබැවින් මිනිසාට හැම විට ම තමා ජීවත් වන ලෝකයට අමතර ව බලාපොරොත්තු සහිත ලෝකයක් ද තිබේ. ප්‍රාථමික සමාජය තුළ දී මිනිසාගේ බලාපොරොත්තු මූලික වශයෙන් ආහාර, නිවාස, ඇඳුම් හා ලිංගික උවමනාවන්ට සීමා වූ නමුත් ද්විතීයික හා තෘතීයික මට්ටමේ දියුණු සමාජයේ ජීවත් වන මිනිසාගේ බලාපොරොත්තු බෙහෙවින් සංකීර්ණ ය. ඒ නිසා දියුණු මිනිස් සමාජයේ බලාපොරොත්තු ලෝකය නො දියුණු මිනිස් සමාජයේ බලාපොරොත්තු ලෝකයට වඩා බෙහෙවින් පුළුල් ය. සංකීර්ණ ය. බලාපොරොත්තු හෝ අපේක්ෂාවන්ගේ සීමාවක් ඇත්තේ ද නැත. යම් බලාපොරොත්තුවක් ඉටු නො වී තිබෙන අවස්ථාවක එකී බලාපොරොත්තුව ඉටු කර ගැනීමෙන් මිනිසා සෑහීමකට පත් නො වේ. එක් බලාපොරොත්තුවක් ඉටු වීමෙන් පසු ව, සිදු වන්නේ තවත් නව බලාපොරොත්තුවකට හෝ අපේක්ෂාවකට මුල පිරීම මිස සෑහීමකට පත් වීම නො වේ. පුද්ගලයෙකු සම්බන්ධයෙන් බැලුවත්, සමාජය සම්බන්ධයෙන් බැලුවත් මේ මූලික තර්කයේ වෙනසක් නැත.

බොහෝ විට බලාපොරොත්තු ලෝකයත් සැබෑ ලෝකයත් අතර බරපතල පරතරයක් තිබේ. මෙම පරතරය නිසා ගැටලු පැන නගී. ගැටලුවක් නිර්මාණය වීමට පරතරයක් හෝ හිදැසක් තිබිය යුතු යැයි කීවේ, මේ අර්ථයෙනි. කෙසේ වෙතත් ගැටලු තිබෙන්නේ මිනිසුන්ගේ හිස් තුළ මිස ද්‍රව්‍ය ලෝකයේ හෝ සමාජ පරිසරයේ නො වේ. ද්‍රව්‍ය ලෝකයේ හෝ සමාජ පරිසරයේ කුමන පරතරයක් තිබුණත් එම පරතරයෙන් සිදු වන්නේ ගැටළුවක් නිර්මාණය වීමට උවමනා මූලික පදනමක් ලබා දීම පමණි. ගැටලුවක් හැම විට ම මිනිසාගේ සිතුවිලි, හැඟීම් හා ආවේග සමඟ සම්බන්ධ ව පවතී. මේ නිසා ගැටළු අර්ථ

දැක්වීමේ දී වර්ග දෙකක පරතර හෝ නො ගැළපීම් සාකච්ඡාවට ගැනෙයි. පළමු වර්ගය වන්නේ බාහිර පරතරය හෝ නො ගැළපීම යි. අනෙක් වර්ගය අභ්‍යන්තර පරතරය හෝ නො ගැළපීම යි.

පළමුවෙන් බාහිර පරතරය යනුවෙන් දැක්වෙන තත්ත්වය හඳුනා ගැනීමට උත්සාහ කරමු. ගැටලුවක් නිර්මාණය කිරීමට දායක වන බාහිර පරතරය ආකාර දෙකක් නිසා ඇති විය හැකි ය. පළමු ආකාරය නම් ද්‍රව්‍ය මූලික තත්ත්වයන් මත සිදු වන භෞතික ලෝකයේ නො ගැළපීම් නිසා පරතරයක් ඇතිවීම යි. උදාහරණ වශයෙන් මිනිසුන්ට ප්‍රමාණවත් තරම් ආහාර නො මැති නම් හෝ ආහාර ලබා ගත නො හැකි නම් ආහාර අවශ්‍යතාවය හා ආහාර ප්‍රමාණය අතර පරතරයක් පැවතීම භෞතික පරතරය කි. නැතහොත් ද්‍රව්‍ය මූලික පරතරය කි. ගැටලුවක් නිර්මාණය වීමට පාදක වන එක් මූලික පදනමක් වන්නේ මෙවැනි භෞතික හෝ ද්‍රව්‍ය මූලික බාහිර පරතරයක් විද්‍යමාන වීම වේ.

ගැටලුවක් නිර්මාණය වීමට පාදක වන බාහිර පරතරයක් ඇතිවීමේ අනෙක් ආකාරය නම් සමාජ පරිසරයේ නො ගැළපීම නිසා ඇති වන පරතරය යි. උදාහරණයක් වශයෙන් යමෙකුට නිදහසේ තම ඡන්දය පාවිච්චි කිරීමේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය නො මැත්තේ නම් නැවතත් බාහිර පරතරයක් ඇති විය හැකි ය. මෙකී තත්ත්වයට ද්‍රව්‍ය මූලික පදනමක් නැතත් ද්‍රව්‍ය මූලික නො වූ බාහිර පරතරයක් පවතී. කුල ගැටලු, වර්ගවාදී ගැටලු, අයිතිවාසිකම් පිළිබඳ ගැටළු ආදිය බොහෝ විට මතු වන්නේ මෙවැනි ද්‍රව්‍ය මූලික නො වූවා වූ බාහිර පරතරයන් නිසා ය.

ඉහත උදාහරණ මගින් දැක්වූයේ ගැටළුවක් නිර්මාණය වීමට පාදක වන බාහිර පරතරයක් නිර්මාණය වීමේ ද්විවිධ ස්වරූපය පිළිබඳ ව යි. මීට පෙර සඳහන් කළාක් මෙන් මෙවැනි බාහිර පරතර නිසා ගැටලුවක් නිර්මාණය වීමට පදනමක් වැටෙන නමුත්, හැම විට ම ගැටලුවක් යනු පුද්ගල නි:ශ්‍රිත තත්ත්වයක් සේ සැලකේ. වෙනත් වචන වලින් කිව හොත් සෑම බාහිර පරතරයක් නිසාම ගැටලු ඇති නො වේ. ගැටලුවක් ඇති වීමට නම් බාහිර පරතරය කරණ කොට ගෙන

පුද්ගලයා තුළ ඇති වන නො සැහීම හෙවත් අසහනය, මානසික පීඩාව (Suffering) ආදී වූ අභ්‍යන්තර පරතරයක් ද පැවතිය යුතු ය. පුද්ගලයාගෙන් පිටස්තර වූ ද්‍රව්‍ය ලෝකයේ හෝ සමාජ පරිසරයේ පවතින කිසියම් පරතරයක් නිසා පුද්ගලයා ඔහුගේ අභ්‍යන්තරය තුළ කැලඹීමක් ඇති කර නො ගන්නේ නම් ගැටලු ඇති වන්නේ නැත. මේ නිසා ගැටලුවක් නිර්මාණය වීමේ වඩාත් තීරණාත්මක පරතරය වන්නේ අභ්‍යන්තර පරතරය යැයි යමෙකුට තර්ක කළ හැකි ය. ඇතැම් අවස්ථාවල මානසික පරතරය (Psychological gap) යනුවෙන් හඳුන්වන්නේ ද මෙම අභ්‍යන්තර පරතරය ම ය (පෙරේරා, 1992). ගැටලුවක් නිර්මාණය වීම සඳහා අභ්‍යන්තර පරතරය තීරණාත්මක සාධකයක් වන නිසා ගැටලු යනු පුද්ගලයාගෙන් පුද්ගලයාට, සමාජයෙන් සමාජයට වෙනස් වන පුද්ගල නි:ශ්‍රිත (Subjective) ප්‍රපංචයක් වේ. බාහිර වශයෙන් පවතින එකම පරතරයක් එක් අයෙකුට ගැටලුවක් සේ පෙනෙන්නේත්, තවත් අයෙකුට ගැටලුවක් සේ නො පෙනෙන්නේත් ගැටලුවල පවතින මෙම පුද්ගල නි:ශ්‍රිත ස්වභාවය නිසා ය. මේ නිසා කිසිදු ගැටලුවක් පුද්ගල නි:ශ්‍රිත ගුණයෙන් ඉවත් කළ නො හැකි ය. මන්ද? මිනිසාගේ හැඟීම්, ආවේග, ආකල්ප හෝ පිළිගැනීම් අනුව පිටස්තර ලෝකයේ ඇති පරතරය ගැටලුවක් ලෙස පිළිගත යුතු ද නැද්ද යන්න අවසන් වශයෙන් තීරණය වන්නේ පුද්ගල සම්බන්ධයක් මත බැවිනි. ගැටලු නිර්මාණය වීමේ පුද්ගල නි:ශ්‍රිත ස්වභාවය තව දුරටත් පැහැදිලි කර ගැනීම සඳහා පහත ඇති උපමා කතාව කියවා බලන්න.

ශ්‍රී ලංකාවේ සංචාරයක් සඳහා පැමිණි බටහිර ජාතිකයෙකු හික්කඩුවට ආසන්න ගමක කලක් පදිංචි වී සිටි අතර ඔහුට සිංහල හොඳින් කතා කිරීමට ද හැකියාව ලැබී තිබිණි. දිනක් මෙකී සංචාරකයා සවස් භාගයේ ඇවිදිමින් සිටින විට පාර අයිනේ බෝක්කු තැල්ලක් මත වාඩි වී බිලි පිත්තකින් මාළු බාමින් සිටි මහළු ගැමියකු මුණ ගැසිණි. සුද්දා බෝක්කුවේ අනෙක් තැල්ලෙන් වාඩි වී ගැමියාගේ මාළු බෑමේ ව්‍යාපාරය මඳ වේලාවක් නිරීක්ෂණය කළේ ය. මාළු බෑම සඳහා ඇමට ඇමිණීමට රැගෙන ආ තිත්තයන් සහිත කුඩා මුට්ටියකුත්, දැනට අල්ලාගෙන තිබූ කාවයියන් දෙදෙනෙකු ඇමුණූ මාළු වැලකුත් මහල්ලා වෙත තිබිනි. මහල්ලා පිත්ත දිය කඩිත්තේ රුවා බොහෝ වේලා

සිටිය ද මාලුවකු ඇමට හසු වූයේ කලාතුරකිනි. කලාතුරකින් හෝ ඇමට හසුවන කුඩා මාලුවකු වරින් වර වැලෙහි ඇමුණූ ඔහු නැවතත් පිත්ත දිය කඩිත්තේ රඳවා බොහෝ වේලා බලා සිටියේ ය. සුද්දා සිදු වන සියලු දේ නිරීක්ෂණය කොට මහල්ලා සමඟ කතාවකට මුල පිරුවේ ය. 'ලොකු උන්නැගේ මොකද කරන්නේ' ? 'මම මේ මාළු බානවා' 'ලොකු උන්නැහේ දන්නෙ නැද්ද මාලු බාන්න දැන් හොඳ හොඳ උපකරණ තියනවා. ඒවායින් ඉක්මණට මාලු අල්ලන්න පුළුවන්.' මහල්ලා නිශ්ශබ්ද ය. 'ලංකාව වාගේ තුන් වැනි ලෝකෙ රටවල මිනිස්සු කාලයේ වැදගත්කම දන්නෙ නැහැ. ඒ ගොල්ලන්ට කාලය ඕන තරම් නාස්ති කරන්න පුළුවන්. පැය ගාණක් කාලය මිඩංගු කරනවා, කාලයට ප්‍රමාණවත් නිෂ්පාදන නො දෙන අවස්ථාවක උණත්'. 'බලන්න මේ මාළු දෙතුන් දෙනා අල්ලන්න කොපමණ කාලයක් මිඩංගු කරන්න ඇද්ද ?' සුද්දා කියා ගෙන කියා ගෙන යයි. මහල්ලා තවමත් නිශ්ශබ්ද ය. 'ලංකාව වගේ තුන්වැනි ලෝකෙ රටවල මිනිස්සු කාර්යක්ෂමතාව කියන එක දන්නෙ නැහැ. කාර්යක්ෂමතාව ඇති වෙන්නෙ අඩු ම සම්පත් යෙදවීමකින් වැඩි ම පලදාවක් ලබා ගැනීම නිසා, ඒකට නව තාක්ෂණයත් ඕනැ වෙනවා. නමුත් තුන් වැනි ලෝකෙ මිනිස්සු නව තාක්ෂණය යොදන්නේ නැහැ. සම්පත් නාස්තිය ගැන දන්නෙත් නැහැ. කාර්යක්ෂමතාව හඳුනන්නෙත් නැහැ. ඉතින් කොහොම ද මේ රටවල් ගොඩ එන්නේ' 'සුද්දෝ උඹේ වැඩක් බලාගෙන යන තැනකට පලයන්' කියන්නට මහල්ලාට සිතිණි. එහෙත් මහල්ලා එසේ කීවේ නැත. මහල්ලා ද සුද්දාගෙන් ප්‍රශ්නයක් දෙකක් ඇසීමට සිතීය. 'මහත්තයා කියන ඔක්කෝම මම අහගෙන හිටියා. ඉතින් මහත්තයෝ, මම මොකටද ඔය කියන අලුත් උපකරණ පාවිච්චි කරලා වැඩි වැඩියෙන් කාලය මිඩංගු කිරීම ගැන හිතලා, නව තාක්ෂණය යොදලා මාලු අල්ලන්නෙ' 'ඇයි? ලොකු උන්නැහේට ඒක තේරුම් ගන්න බැරිද? එතකොට ඔය වගේ කාවයියො දෙතුන් දෙනෙක් නො වෙයි. අඩු ම වෙලාවකින් වැඩි මාළු ප්‍රමාණයක් අල්ලන්න පුළුවන්' 'ඉතින් මහත්තයෝ මට මොකටද ගොඩක් මාළු ?' 'ගොඩක් මාළු වුවමනා වෙන්නෙ ලොකු උන්නැහේ, ගොඩක් සල්ලි හම්බ කරන්න. වැඩි වැඩියෙන් නිෂ්පාදනය කළොත් වැඩි වැඩියෙන් සල්ලි හම්බ වෙනවා.' 'ඉතින් මහත්තයෝ මට මොකටද ගොඩක් සල්ලි? 'ඇයි ? ලොකු

උන්නැහේට ඒකවත් තේරුම් ගන්න බැරිද? සල්ලි හරහා තමයි අපිට හැම දෙයක් ම ලැබෙන්නෙ. ගෙවල් දොරවල්, ඉඩකඩම්, ඇඳුම් පැලඳුම්, යාන වාහන, ඕවා ඔක්කොම ලැබෙන්නෙ සල්ලි හරහා. ඒකයි ගොඩක් සල්ලි ඕනෙ' 'මහත්තයෝ, ඉතින් මට මොකටද, ඉඩකඩම්, ගෙවල් දොරවල්, යාන වාහන වගේ දේවල්?' 'ලොකු උන්නැහේ, මේ හැම දෙයක් ම අපට තියෙන්න ඕනෑ වෙන්නෙ නිදහසේ, විවේක සුවයෙන් අපේ ජීවිත ගත කරන්න' ආ! එහෙමද, මහත්තයෝ මම දැන් මේ ගත කරමින් ඉන්නෙ ඔය මහත්තයා කියන එක තමයි. 'මොකක්ද?' නිදහසේ විවේක සුවයෙන් ජීවිතය ගත කරන එක. සුද්දාත් මහල්ලාත් අතර සංවාදය නිම විය. මහල්ලා නව දුරටත් තම කාර්යයේ නියුක්ත වූ අතර සුද්දා අලුත් යමක් උගෙන යන්නට ගියේ ය.

මාලු බෑමේ කාර්යය සුද්දාට ගැටලුවක් සේ පෙනුණ ද මහල්ලාට ගැටලුවක් නො වී ය. බාහිර ලොව පවතින යම් තත්ත්වයක් ගැටලුවක් බවට පරිවර්තනය කරන්නේ පුද්ගලයාගේ සිතුවිලි, ආකල්ප, හැඟීම් ආදිය අනුව මිස බාහිර ලෝකයේ ඇති ඇතැම් තත්ත්වයන් තුළ ගැටලු ඇති කිරීමේ නෛසර්ගික ගුණාංග තිබෙන නිසා නො වේ. මේ නිසා ගැටලු පුද්ගල නිඃශ්‍රිත වනවා මෙන්ම කාල විශේෂිත (Time specific), ස්ථාන විශේෂිත (Location specific) අවස්ථා විශේෂිත (Situation specific) යන ලක්ෂණවලින් ද යුතු ය.

කාල විශේෂිත යනු ගැටලුවක් කාලය සමග අර්ථවත් වන බව යි. කිසියම් දෙන ලද පරිසරයක් යම් කාල වකවානුවක දී ගැටලුවක් නො විය හැකි නමුත්, වෙනත් කාලයකට ඒ පරිසරය ම යෙදූ විට ගැටලුවක් සේ පෙනීමට ඉඩ ඇත. උදාහරණ වශයෙන් රැස්වීම් පැවැත්වීමේ අයිතිය සාමාන්‍ය අවස්ථාවක දී ජනතාවට ගැටලුවක් නො වූවත් හදිසි නීතිය ක්‍රියාත්මක වන අවධියක දී ගැටලුවක් වේ. ස්ථාන විශේෂිත යනු එක ම තත්ත්වයක් එක් ස්ථානයක ගැටලුවක් වන්නටත්, වෙනත් ස්ථානයක දී ගැටලුවක් නො වන්නටත් ඉඩ කඩ ඇති බව යි. උදාහරණ වශයෙන් විදුලිය කපා හැරීම නාගරික පරිසරයක දී බරපතළ ගැටලුවක් වුවත්, විදුලි උපකරණ රහිත ආලෝකය සඳහා පමණක් විදුලිය ප්‍රයෝජනයට ගන්නා, ග්‍රාමීය

ජනතාවට විදුලි බලය අත් හිටුවීම බරපතල ගැටලුවක් නො වේ. තත්ව විශේෂිත වන්නේ ගැටලු දෙන ලද තත්ත්වය යටතේ ද අර්ථවත් වන බැවිනි. උදාහරණ වශයෙන් මනුෂ්‍යයන් ඝාතනය කිරීම බරපතල වරදකි. එහෙත් උසාවි තීන්දුවක් මත සිදු කළ නිත්‍යානුකූල මනුෂ්‍ය ඝාතනය වරදක් නො වේ යයි සැලකේ.

ගැටලු යනු පුද්ගල නි:ශ්‍රිත, කාල විශේෂිත, ස්ථාන විශේෂිත, තත්ත්ව විශේෂිත ලක්ෂණවලට අනුව අර්ථවත් වන නිසා ගැටලුවලට මැදිහත් පාර්ශ්වයෝ ද මෙකී විශේෂිත ලක්ෂණ වලට අනුව ම අර්ථවත් වෙති. මේ අනුව ඇතැම් විට කිසියම් ගැටලුවක පාර්ශ්ව කරුවකු වන පුද්ගලයෙකු වරෙක සාධනීය පුද්ගලයෙකු ලෙස ද, වරෙක නිශේධනීය පුද්ගලයෙකු (හොඳ පුද්ගලයෙකු හෝ නරක පුද්ගලයෙකු) ලෙස ද පෙනී සිටිය හැකි ය. උදාහරණයක් වශයෙන් ගතහොත් ශ්‍රී ලංකාවේ වර්ගවාදී ගැටලුවෙහි (වර්තමානයේ වර්ගවාදී ගැටලුව, ගැටලු තත්ත්වය ඉක්මවා ගිය අර්බුදය කි. සංකීර්ණ ගැටලු ගණනාවකින් අර්බුද නිර්මාණය වේ) පාර්ශ්වකරුවන් වූ දේශපාලකයන් එකී වර්ගවාදී ගැටලුව විසඳූ පුද්ගලයන් ලෙස හෝ උග්‍ර කළ පුද්ගලයන් ලෙස කාල විශේෂිත හා තත්ව විශේෂිත මූල ධර්ම අනුව විස්තර කළ හැකි ය. 1950 ගණන් වලදී දී ඇස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක අගමැති තුමා සිංහලය රජ බස කිරීමේ යෝජනාව ගෙනෙන විට බහුතර ජනතාවගේ ඇසින් ඔහු සාධනීය පුද්ගලයෙකි. නැතහොත් ශ්‍රී ලංකාවේ වර්ගවාදී ගැටලුවලට විසඳුම් සෙවූ වීරයෙකි. එහෙත් තවත් වසර තිහක් පමණ ගෙවී, එනම් 1980 ගණන් වලදී ප්‍රභාකරන් සිංහල විරෝධී යුද්ධයක ජිහිටන විට බණ්ඩාරණායක නිශේධනීය පුද්ගලයෙකි. නැත හොත් ශ්‍රී ලංකාවේ වර්ගවාදී ගැටළුව සිංහල රජ බස කිරීම මගින් උග්‍ර කල පුද්ගලයෙකි. බණ්ඩාරණායක මහතා චෙල්වනායගම් සමග වර්ගවාදී ගැටලුව විසඳීම සඳහා බලය බෙදා ගැනීමේ ගිවිසුමට එළඹීමට කටයුතු කරන විට බහුතර ජනතාවගේ ඇසින් ඔහු දේශපාලන වර්ගවාදී ගැටලුව උග්‍ර කළ අයෙකි. එහෙත් 1990 ගණන් වලදී බලය බෙදීමේ යෝජනා ගෙනෙන විට නැවතත් බණ්ඩාරනායක මහතා වීරයෙකි. මන්ද? බණ්ඩාරනායක මහතා බලය බෙදීමේ අවශ්‍යතාව මුලින්ම දැන සිටි බැවිනි. 1989 දී ජේ. ආර්. ජයවර්ධන ජනාධිපති තුමා වර්ගවාදී ගැටලුව විසඳීමට ඉන්දියාව

සමඟ ගිවිසුම අත්සන් කරන විට බහුතර ජනතාවගේ ඇසින් ඔහු වර්ගවාදී ගැටලුව උග්‍ර කල අයෙකි. නැවතත් 2000 දී ප්‍රභාකරන් ශ්‍රී ලංකාවේ යුද හමුදාවට පිට පිට පහර දීම නිසා ලංකා ආණ්ඩුව ඉන්දියානු ආධාර පතන විට ජේ. ආර්. වර්ගවාදී ගැටලුව හොඳින් දැක සැලසුම් ක්‍රියාවට නැගූ වීරයෙකි.

> සමාජ සජීවීකරණයක් සඳහා පාදක වන ගැටලුවක් සහ අනෙකුත් ඕනෑම සමාජ ආර්ථික ගැටලුවක් අතර හඳුනා ගත හැකි මූලික වෙනස්කමක් නැත.
>
> වෙනස්කම ඇත්තේ ගැටලුව දෙස බලන ආකාරය පිළිබඳ ව පමණ.

දැන් අපි ගැටලු හඳුනා ගැනීම සම්බන්ධයෙන් ද, ගැටලුවල ස්වභාවය පිළිබඳව ද යම්තාක් දුරට නිරවුල් භාවයට පැමිණ ඇත. නිරවුල් භාවයට පැමිණ ඇතැයි කීවේ, ගැටලුවක් අර්ථ දැක්වීම පිළිබඳ ව නිරවුල් වූ බැවිනි. බාහිර පරතරයකුත්, අභ්‍යන්තර පරතරයකුත් එක් ව තිබූ විට ගැටලුවක් නිර්මාණය වන බවත්, ගැටලු ස්වභාවයෙන් ම පුද්ගල නිඃශ්‍රිත, කාල විශේෂිත, ස්ථාන විශේෂිත හා තත්ව විශේෂිත බවත් හෙළිදරව් කළෙමු. එහෙත් තවමත් ශ්‍රී ලාංකීය ජන සමාජය මුහුණ දෙන ගැටලු හඳුනා ගැනීමට අප ප්‍රවිෂ්ට වූයේ නැත. එබැවින් මෙතැන් සිට සමාජ සජීවීකරණයක් උදෙසා පාදක වන ශ්‍රී ලාංකීය ගැටලු පිළිබඳ ව අවධානය යොමු කරමු.

## සමාජ සජීවීකරණයක් උදෙසා පාදක වන ගැටලු.

සමාජ සජීවීකරණයක් සඳහා පාදක වන ගැටලුවක් සහ අනෙකුත් ඕනෑම සමාජ ආර්ථික ගැටලුවක් අතර හඳුනා ගත හැකි මූලික වෙනස්කමක් නැත. වෙනස්කම ඇත්තේ ගැටලුව දෙස බලන ආකාරය පිළිබඳව යි. උදාහරණයක් ලෙස දිළිඳුකම නැමැති ගැටලුව ආර්ථික විද්‍යානුකූල ඇසින් බලන ආකාරයත් සජීවීකරණ ප්‍රවේශය හරහා බලන ආකාරයත් අතර පැහැදිලි වෙනසක් තිබේ. රැකියාව, ආදායම, ඉතිරිකිරීම්, ආයෝජන, ණය, බැංකු ආදී ආර්ථික විද්‍යානුකූල විස්තර කිරීම්වලට අමතර ව දිළිඳුකමට පාත්‍ර වූ තැනැත්තාගේ සිතුම් පැතුම්, ආකල්ප, වටිනාකම්, සමාජ පැවැත්ම, පවුල් සංස්ථාව, දේශපාලනය, ආයතනික සම්බන්ධකම් ආදී විවිධ තත්ත්වයන් ඉහත කී ආර්ථික විද්‍යානුකූල විස්තර කිරීම් සමඟ එකට

ගෙන සලකා බලා විසඳුම් සෙවීම සජ්වීකරණ ප්‍රවේශයේ උත්සාහය යි. මේ අනු ව භෞතික සංවර්ධනය සඳහා ද, මානව සංවර්ධනය සඳහා ද විසඳා ගත යුතු යැයි කල්පනා කරන ඕනෑම ගැටලුවකට සජ්වීකරණ ප්‍රවේශය හරහා ද දායක විය හැකි ය. සමාජ සජ්වීකරණය යනුවෙන් මෙම ග්‍රන්ථයේ පළමු පරිච්ඡේදයේ දී හඳුන්වා දුන්නේ කුමන තත්ත්වයක් ද යන්න නැවතත් මතක් කර ගැනීම මඟින් ඉදිරි සාකච්ඡාවට අනුබලයක් ලැබෙන නිසා සමාජ සජ්වීකරණය යනු කුමක්දැයි අපි නැවතත් සිහියට නංවා ගනිමු. සමාජ සජ්වීකරණය යනු විවිධ සමාජ ආර්ථික බාධක නිසා අලස භාවයට හෝ නිද්‍රාවට පත්ව සිටින සමාජය යළි පණ ගැන්වීමේ සචේතනික ක්‍රියාවලිය යි. එය එක් අතකින් භෞතික සම්පත් මූලික කොට ගත් ආර්ථික ක්‍රියාවලියක් වශයෙන් ද, තවත් අතකින් ජනතාව මූලික කොට ගත් සමාජ ක්‍රියාවලියක් වශයෙන් ද ඉදිරියට ඇදෙන ඒකාබද්ධ උත්සාහයක් වන්නේ ය. මේ ග්‍රන්ථය සාකච්ඡා කරන සමාජ සජ්වීකරණය දිළින්දන් පිළිබඳ ව පමණක් නො ව සමස්ත සමාජය ම නො බිඳුණු සංස්ථාවක් වශයෙන් සලකනු ලබන අතර එය කාල නිශ්චයක් රහිත ව නො කඩවා දිවෙන ක්‍රියාදාමයක් ලෙස ද, දේශපාලන පැලැස්තරයක් නො වූ සංවර්ධන උපාය මාර්ගයක් ලෙස ද, සමස්ත ජනතාවගේ ම දායකත්වය ලබා ගත යුතු සම්මාදමක් ලෙස ද, නාම මාත්‍රික නො වූ සැබෑ පරිවර්තනයක් ලෙස ද, සමාජයේ ඉදිරි ගමන තීව්‍ර කරන්නා වූ පෙළඹුමක් ලෙස ද, අතිශයෝක්තියක් නො වූ සමාජ යථාර්ථයක් ලෙස ද හඳුන්වා දෙනු ලැබේ. මේ අනු ව ඉතා සංක්ෂිප්ත ව ගත් කළ සමාජ සජ්වීකරණය යනු සංවර්ධනයේ පාදක තත්ත්වයන් ගොඩ නැඟීම යයි කිව හැකි ය.

> ශ්‍රී ලාංකික ජනතාව මුහුණ දෙන ප්‍රධාන ම ගැටලුව නම් ප්‍රධාන ගැටලුව කුමක්දැයි නො දැන සිටීම පිළිබඳ ගැටලුව ය.

ශ්‍රී ලාංකික ජනතාව මුහුණ දෙන ප්‍රධාන ගැටලු ලෙස නිතර සාකච්ඡාවට භාජන වන්නේ ඌන සේවා නියුක්තිය, අඩු ආදායම්, ඌන සම්පත් උපයෝජනය, මන්දපෝෂණය, අසංවර්ධිත ආයතන, අධ්‍යාපනික, සෞඛ්‍යය, නිවාස, සනීපාරක්ෂණ තත්ත්වයන්ගේ අඩු ලුහුඬුකම් සහ වෘද්ධිය පසුබිම් කර ගත් නොයෙකුත් අඩු ලුහුඬුකම් හා ඌනතා ය. වෙනත් වචන වලින් කිව හොත් ආර්ථික දිළිඳුකම ය.

කෙසේ වෙතත් මතුපිටින් පෙනෙන මෙකී ඌනතාවන්ගේ පසුබිම් කරුණු විශ්ලේෂණය කළ විට ශ්‍රී ලංකාව මුහුණ දී තිබෙන ප්‍රධානතම බාධාකාර තත්ත්වය ඉහත කී ද්‍රව්‍ය මූලික ඌනතාවන් ඉක්මවා ගිය තත්ත්වයක් බව පෙනේ. එමෙන් ම එකී ද්‍රව්‍ය මූලික තත්ත්වයන්ට පසුබිම් සපයන, ශ්‍රී ලාංකිකයන්ට ම ආවේණික වූ විශේෂ සමාජ සංසිද්ධියක් බව ද පෙනේ. මේ සමාජ සංසිද්ධිය විසින් ජනතාව උදාසීන කර යි. ප්‍රතිගාමී කර යි. ඔවුන් තුළ ඉච්ඡා භංගත්වය ඇති කර යි. දිරි ගැන්වීම් වෙනුවට පසුබෑම් ඇති කර යි. මීට ඉහත දී අප ගැටලු යන වචනය අර්ථ දැක්වූ පදනම මත පිහිටා මෙකී සමාජ සංසිද්ධිය ගැටලුවක් සේ අර්ථ දැක්විය නො හැකි බවක් පෙනේ. මක් නිසා ද? ගැටලු ඇති වන්නේ යම් අඩුවක්, මදිකමක් හෝ හිදැසක් කරණ කොට ගෙන මිනිසුන්ගේ හිස් තුළ ජනිත වන පීඩාවක් නිසා බැවින් ද, මෙම සමාජ සංසිද්ධිය නිසා පොදුවේ ලාංකිකයින්ගේ හිස් තුළ මානසික පීඩාවක් (Suffering) ඇති වී තිබෙන බවක් ප්‍රකට ව නො පෙනෙන නිසා ද මෙය මුලින් කී අර්ථ දැක්වීම් මත ගැටලුවක් නො වන්නේ යයි යමෙකුට තර්ක කළ හැකි ය. මානසික පීඩාවක් ඇති විට පීඩාවට පත් වූ තැනැත්තා එම පීඩාව සමනය කර ගැනීමට (ගැටලුව විසඳා ගැනීමට) වෙහෙසෙන නමුත් ශ්‍රී ලාංකික ජනතාව එවැනි වෙහෙසක් දරණ බවක් නො පෙනේ. වෙනත් වචන වලින් කිව හොත් යමෙකු කිසියම් සමාජ, ආර්ථික හෝ භෞතික සංසිද්ධියක් ගැටලුවක් කර ගන්නා තාක් කල් (මානසික පීඩාකාර තත්ත්වයක් බවට පත් කර ගන්නා තාක් කල්) ඒ සඳහා විසඳුම් සෙවීමට නො වෙහෙසෙන අතර, ශ්‍රී ලාංකික ජන සමාජයේ දක්නට ඇත්තේ ද මෙවැනි ම තත්ත්වය කි.

කෙසේ වෙතත් ගැටලුවකට පාදක වන තත්ත්වයක් මිනිසුන් විසින් ගැටලුවක් බවට පත් කර ගනු ලැබුව ද නො ලැබුව ද, එකී පාදක තත්ත්වයට ආවේණික වූ ප්‍රතිඵල ජනිත වීම නිරන්තරයෙන් සිදු වේ. යම් රෝගාබාධ තත්ත්වයක්, රෝගාබාධ තත්ත්වයක් සේ හඳුනා ගනු ලැබුව ද නො ලැබුව ද එහි ප්‍රතිඵල එක සේ ජනිත වන්නාක් මෙනි. මෙම තත්ත්වය ඉතා ම අන්තරායකාර වූත්, නිරන්තරයෙන් අයහපත් ප්‍රතිඵල ගෙන දෙන්නාවූත් සංසිද්ධියක් ලෙස කතුවරයා දකියි. මේ නිසා කතුවරයාගේ අත්දැකීම අනුව ශ්‍රී ලාංකික ජනතාව මුහුණ දෙන

ප්‍රධාන ම ගැටලුව නම් ප්‍රධාන ගැටලුව කුමක්දැයි නො දැන සිටීම පිළිබඳ ගැටලුව ය.

කුමක් ද? ශ්‍රී ලාංකිකයන් විසින් ග්‍රහණය කර නො ගත්තා වූ ප්‍රධාන ගැටලුව? ලාංකිකයන් මුහුණ දෙන ප්‍රධාන ගැටලුව අසවල් තත්ත්වය යයි සරල ලෙස හඳුන්වා දිය නො හැකි ය. එය සංකීර්ණ සමාජ ස්වභාවයකි. දිවයිනේ ජීවත් වන්නා වූ විවිධ ජන කොට්ඨාශ විසින් තම තමන්ගේ හැසිරීම්, ක්‍රියාවලි හා කාර්ය කටයුතු මගින් මෙම ගැටලුවට ප්‍රමාණවත් පරිදි දායක වී තිබේ. විශේෂයෙන් දේශපාලකයන් ද, අඩු වැඩි වශයෙන් අනෙකුත් ජන කොටස් වන උගතුන් හා බුද්ධිමතුන් ද, ආගමික නායකයන් ද, සාහිත්‍ය කරුවන් ද, ගොවි කම්කරු ජනතාව ද යනාදී වූ සියල්ලෝ ම මේ ගැටලුවේ දායකකාරකාදීහු ය. අනෙක් අතට ජනතාව තුළ තිබෙන ප්‍රතිගාමී ආකල්ප සහ පරාධීනත්වය ආදී තත්ත්වයන් ද, එහි පරස්පරය වූ අධි මානය, අනුන් හෙළා දැකීම ආදී ඝෘණාත්මක ගුණයන් ද ආත්ම වංචාව, පැතුරුණු මුසාව, මුල් බැස ගත් අවිචාරාත්මක දේශපාලන මතිමතාන්තර මත බෙදී වෙන් වී සිටීම, නව චින්තනයට දක්වන අසීමිත ප්‍රතිරෝධය හා විශේෂයෙන් හවුලේ දූෂණයට සහභාගි වීමේ ලක්ෂණය (සමස්ත සමාජයම දායක වී දූෂණයේ කොටස් කරුවන් වීම) ආදිය ගැටලුවේ පිටතට පෙනෙන දෘශ්‍යමාන තත්වයට යටින් සියුම් හුයක් මෙන් දිවෙයි. මෙකී සියලු සංකීර්ණ තත්ත්වයන් එක් වාක්‍යයකින්, එක් ප්‍රකාශයකින් හෝ එක් මාතෘකාවකින් විස්තර කළ නො හැකි ය. ඒ නිසා ම එය රැකීරක්ෂා ගැටලුව, අඩු ආදායම් ගැටලුව, නො දියුණු ආයතනික ගැටලුව ආදී සරල නම් කිරීමකින් හඳුන්වා දීමට ද නො හැකි ය. මේ සියල්ල එකක් සේ හඳුන්වා දීමට වඩාත් සුදුසු යෙදුම ලෙස 'සමාජ සජීවීකරණය පිළිබඳ ගැටලුව' ලෙස එය නම් කිරීම සුදුසු බව කතුවරයා ගේ අදහස යි. යමෙකු මේ යෙදුමට අකමැත්තේ නම් ගැටලුව 'X' එක්ස් යනුවෙන් නම් කළ ද වරදක් නො වේ. ගැටලුව සජීවීකරණය වශයෙන් නම් කළ ද, නො කළ ද එය ඉහත කී ගුණාංග වලින් යුතු බවට නම් විවාදයක් තිබිය නො හැකි ය.

ශ්‍රී ලාංකික ජනතාව මුහුණ දී සිටින ප්‍රධාන ගැටලුව නම් ප්‍රධාන ගැටලුව කුමක් දැ යි නො දැන සිටීම බව මෙම පරිච්ඡේදයේ ඉහත ඡේද මගින් විස්තර කරනු ලැබිණ. ජන සමාජය මුහුණ දෙන්නේ අසවල් ගැටලුව යයි කිව නො හැකි සංකීර්ණ තත්වයකට බවත් එය සජීවීකරණ ගැටලුව වශයෙන් නම් කිරීම සුදුසු බවත් කතුවරයා විසින් යෝජනා කරනු ලැබී ය. කෙසේ වෙතත් මේ සමාජ - ආර්ථික සංසිද්ධිය පිළිබඳ ව තවමත් පාඨකයා නිරවුල් නැති බැවින් එක් උදාහරණයක් මගින් මෙරට ජනතාව මුහුණ දෙන ගැටලුවල ස්වභාවය පැහැදිලි කිරීම සුදුසු ය.

කතුවරයා මෙම ග්‍රන්ථය සම්පාදනය කරමින් සිටින අවධියේ රටේ අවධානයට යොමු වූ ප්‍රධාන ගැටලුවක් ව පැවති කොළරා රෝගය පැතිර යාම සැලකිල්ලට ගනිමු. ශ්‍රී ලංකාවේ වරින් වර කොළරා රෝගය පැතිර යයි. දැනුදු එවැනි තත්වයක් උද්ගත වෙමින් තිබේ. සෞඛ්‍ය බලධාරීන්ගේ විස්තර කිරීම්වලට අනුව රෝගය පැතිර යාමේ එක් ප්‍රධාන මාධ්‍යයක් වන්නේ අපිරිසිදු ආපනශාලා ය. මේ දිනවල නිලධාරීහු ආපනශාලාවලට හදිසියේ කඩා පැන ඒවායේ විකිණීම සඳහා සූදානම් කර ඇති නුසුදුසු යැයි කියනු ලබන ආහාර ගිණි තබති. භූමිතෙල් දමති. මහජනතාව වෙත යැම වලක්වති. මේවා කළ යුතු ම කාර්යයෝ ය . කොළරා මර්දනය සඳහා නුසුදුසු ආහාර විනාශ කළ යුතු ය. එහෙත් ගැටලුවේ දිගු කාලීන විසඳුම ඇත්තේ ආහාර ගිණි තැබීම මත නො වන බව කිසිවකුත් කල්පනා කරන්නේ නැත.

කතුවරයාගේ මතකයේ සටහන් ව ඇති පරිදි කොළරාව පැතිර ගියේ මෙකල පමණක් නො වේ. මීට පෙරත් පැතිර ගියේ ය. එකල්හි ද ආපනශාලාවලට නිලධාරීහු කඩා පැන්නෝ ය. එකල්හි ද ආහාර පාන විනාශ කළෝ ය. එහෙත් මෙවර ද කොළරාව පැතිර යාමට උදව් වන ආපනශාලා එසේ ම තිබේ. අපිරිසිදු ආපනශාලා සම්බන්ධ ව ජනතාවගෙන් (පාරිභෝගිකයාගෙන්) ප්‍රතිරෝධයක් නැත. කොලරාව පැතිර යාමක් නො මැති විට නිලධාරීන්ගෙන් ද ඒවාට බාධාවක් නැත. ආපනශාලා හිමියෝ ආහාර විකුණති. පාරිභෝගිකයෝ භුක්ති විඳිති. සැම කොළරා පැතිරීමක් සමඟ ම නිලධාරීහු ආපනශාලාවලට කඩා වදිති. ඇතැම් ආපනශාලා වසා

දමති. කොළරා තර්ජනය ඉවත් වූ වහා ම නැවතත් විවෘත කරති. ආපනශාලා අපිරිසිදු වුවත්, ආපනශාලා අයිතිකරු සෞඛ්‍ය පරීක්ෂකගේ හිතවතෙකු නම්, අඩු වශයෙන් සන්තෝෂම් ලැබෙයි නම් ඒවායෙන් කොළරාව පැතිර ගියාට කමක් නැත. එබැවින් එවැනි ආපනශාලාවලට අත නො තැබේ. යම් හෙයකින් නිලධාරියෙකු වගකීම් ඉටු කරමින් ආපනශාලාවලට අත තැබුවහොත් ආපනශාලා හිමියාගේ සහයෝගයට දේශපාලකයෝ ඉදිරිපත් වෙති. එතැනින් පරිච්ඡේදය නිමි ය. මේ ගැටලුවේ අග කොතැන ද? මුල කොතැන ද, මැද කොතැන ද? කිසිදු ලක්ෂයකින් අග, මුල, මැද හඳුනා ගත නො හැකි ය. ආපනශාලාකරු හොඳ ආහාර සපයන්නේ නම් ගැටලුව පැන නො නගී. ඔහු අපිරිසිදු ආහාර සපයන නමුත්, ඒවා භුක්ති විඳීමට ජනතාව නො යන්නේ නම් එතනින් ද ගැටලුව පැන නො නගී. ආපනශාලාකරු අපිරිසිදු ආහාරපාන සපයන අතර ජනතාව ද ඒවා භුක්ති විඳීමට සූදානම් නමුත් සෞඛ්‍ය නිලධාරියා වගකීම් ඉටු කරන්නෙකු නම් ගැටලුව මතු වීමට නැවත වරක් ඉඩක් නැත. නිලධාරියා වගකීම් ඉටු නො කරන නමුත් දේශපාලකයා වගකීම් ඉටු කරන්නෙකු නම් නිලධාරියාට බලපෑම් කිරීමට ඔහුට හැකි නිසා එමඟින් ද ගැටලුව මතුවන්නේ නැත. දේශපාලකයා පත් කරන්නේ ඡන්ද දායකයා ය. දේශපාලකයාට බලපෑම් කිරීමට ඡන්දදායකයාට හැකි ය. නිලධාරියාට බලපෑම් කිරීමට දේශපාලකයාට හැකි ය. ආපනශාලා හිමියාට බලපෑම් කිරීමට පාරිභෝගිකයාට හැකි ය. මේ නිසා ගැටලුවේ ඕනෑම ලක්ෂයකින් ඕනෑම පාර්ශව කරුවෙකුට බලපෑම් කොට ගැටලුවේ චක්‍රීය තත්වය නතර කළ හැකි ය. එහෙත් කොළරා රෝගයේ ව්‍යාප්තියට එදත්, අදත්, හෙටත් හැමදා ම අපිරිසිදු ආපනශාලා දායක වීම සිදු වනු ඇත. මන්ද? ගැටලුවේ පාර්ශව කරුවන් සියල්ලෝ ම අඩු වැඩි වශයෙන් ගැටලුව පවත්වා ගෙන යාමට හොඳින් සම්මාදම් වන බැවිනි.

කොළරා රෝගය පිළිබඳ ගැටලුව පවත්වා ගෙන යාමේ වගකිව යුත්තන් ගෙන් අඩ අර්ධයක් ආපනශාලා හිමියෝ ය. තවත් අඩ අර්ධයක් රාජ්‍ය නිලධාරීහු ය. තවත් අඩ අර්ධයක් දේශපාලකයෝ ය. අනෙක් අඩ අර්ධය පාරිභෝගිකයන් හෙවත් ජනතාව ය. මේ තත්ත්වය විෂම චක්‍රය කි. ඒ නිසාම පාර්ශ්ව කරුවෝ සියල්ලෝ ම ගැටලුව

පිළිබඳ වගකීමෙන් නිදහස් ය. මක් නිසාද? ගැටලු චක්‍රයේ තමා සිටින්නේ කිසියම් එක් ලක්ෂයක පමණක් බැවින් වගකීම එකිනෙකා පිට පැවරීමෙන් තම තමන්ට නිදහස් විය හැකි බැවිනි. කෙසේ වෙතත් පාර්ශව කරුවන් සියල්ලෝම වගකිව යුත්තෝ ය. මන්ද? සියලු දෙනා වචනයේ පරිසමාප්ත අර්ථයෙන් ම පාර්ශ්ව කරුවන් වී ඇති බැවිනි.

කොළරා ව්‍යාප්තිය පිළිබඳ ගැටලුව උදාහරණයක් පමණි. ශ්‍රී ලංකාව මුහුණ දෙන බොහෝ ගැටලුවල ස්වභාවය මූලධර්ම වශයෙන් මීට සමාන ය. වෙනස් වන්නේ ගැටලුවේ පාර්ශවකරුවෝ කවුරු ද යන වග සහ ගැටලුව කුමන විෂය ක්ෂේත්‍රයකට අයත් ද යන්න පමණි. රාජ්‍ය සංස්ථා, මණ්ඩල සහ වෙනත් විවිධ රාජ්‍ය ආයතනවලට සම්බන්ධ ගැටලු නො කඩවා පවත්වා ගෙන යාමට ද, ජාතියට අයත් පොදු දේපොළ සම්බන්ධ වූ ගැටලු නො විසඳා ඉදිරියට ගෙන යාමට ද, යුද්ධය, පාතාලය වැනි සමාජ ව්‍යසනයන් දික්ගස්සවා ගැනීමට ද පොදු ජනතාව ප්‍රමුඛ ඒවායේ අනෙකුත් පාර්ශ්ව කරුවන් අතර නො නිල ගිවිසුමක් හෝ සම්මුතියක් පවතින බවක් පෙනේ. එනම්, ඒ ඒ පාර්ශ්ව කරුවන්ගේ චර්යා රටා මගින් ගැටලුව තව දුරටත් පවත්වා ගෙන යාමක් සිදු වනවා විනා විසඳීමක් සිදු නො වන බැවිනි. මෙකී චර්යා රටා එකිනෙකාගේ කතිකාවක් මත හෝ ගිවිසුමක් මත සිදු නො වන බව සැබෑ ය. එහෙත් ගිවිසුමක් මත සිදු කෙරෙන චර්යාවලටත් වඩා හොඳින් ඒවා එකිනෙකට ගැළපේ. ගැටලු නො විසඳා තව දුරටත් පවත්වා ගෙන යාමට උපකාර වන්නේ මේ චර්යා රටා ගැළපීම යි. ඒ නිසා ම ශ්‍රී ලාංකීය ජනතාව නව ලෝකය මුහුණ දෙන නව අභියෝගයන්ට මුහුණ දෙන්නේ පැරණි ගැටලු එලෙස ම තබා ගනිමිනි.

> ශ්‍රී ලාංකිකයෝ සැමදා එක ම ගැටලු පද්ධතියක් මත කැරකෙමින් සිටින බැවින් ඉදිරියට යන්නේ බෙහෙවින් මන්දගාමී ව ය. එක් පාර්ශ්වයක් විසඳීමට තැත් කරනු ලබන ගැටලුව තවත් පාර්ශවයක් විසින් අවුල් කරනු ලබයි. යම් හෙයකින් ගැටලු අවුල් කරනු ලැබුවා වූ පාර්ශ්වයෙහි නැණැස මතු වී විසඳීමේ අදිටනක් පහළ වුවහොත් මුලින් විසඳීමට තීන්දු කරනු ලැබුවා වූ පාර්ශවය විසින් මුල් අදහස හැර පියා අවුල් කිරීමේ වගකීම ක්‍රියාවට නගයි.

ශ්‍රී ලාංකිකයෝ සැමදා එක ම ගැටලු පද්ධතියක් මත කැරකෙමින් සිටින බැවින් ඉදිරියට යන්නේ බෙහෙවින් මන්දගාමී ව ය. එක්

පාර්ශ්වයක් විසඳීමට තැත් කරනු ලබන ගැටලුව තවත් පාර්ශ්වයක් විසින් අවුල් කරනු ලබයි. යම් හෙයකින් ගැටලු අවුල් කරනු ලැබුවා වූ පාර්ශ්වයෙහි නැණැස මතු වී විසඳීමේ අදිටනක් පහළ වුවහොත් මුලින් විසඳීමට තීන්දු කරනු ලැබුවා වූ පාර්ශ්වය විසින් මුල් අදහස හැර පියා අවුල් කිරීමේ වගකීම ක්‍රියාවට නඟයි. මොවුන්ගේ මේ චර්යා රටා පද්ධතිය ක්‍රියාවේ යෙදවෙන තාක් කල් ගැටලුවලට විසඳුම් නො යෙදේ. ඒ වෙනුවට සිදු වන්නේ ගැටලු අර්බුද බවට පරිවර්තනය වීම යි. අර්බුද යනු ගැටලු, ගැටලු අවස්ථාවේ නො විසඳා, කාලාන්තරයක් තිස්සේ පවත්වා ගෙන යාමෙන් ඇතිවන තත්ත්වය යි. මුල් ගැටලුවේ සවරූපය වෙනස් වී, නව පාර්ශව කරුවන් බිහි වී, ගැටලු ස්වභාවය සංකීර්ණ තත්ත්වයක් වූ විට එය අර්බුද තත්ත්වයක් බවට පත් වේ. වර්ගවාදී ගැටලුව අර්බුදයක් බවට පත්වූයේ මේ අයුරිනි. පාතාලය දැන් අර්බුදයක් බවට පත් වෙමින් තිබේ. හෙට දින ස්ථිර වශයෙන් ම පාතාලය මුළු රට ම ගිලගත් සමාජ අර්බුදයක් බවට පත් වනු නො අනුමාන ය. මන්ද? දේශපාලකයන් ඇතුලු සමස්ත සමාජය ම අඩු වැඩි වශයෙන් සම්මාදම් වී නො නිල ගිවිසුමක් මත බිහි වූවා වූ චර්යා රටා ගැළපීමක් මඟින් පාතාලය පවත්වා ගෙන යන බැවිනි.

ශ්‍රී ලංකාව මුහුණ දෙන ගැටලු පිළිබඳ ව ඉහත පැවැත් වූ සාකච්ඡාවෙන් ප්‍රධාන කරුණු තුනක් පැහැදිලි ය. ඉන් පළමුවැන්න නම් අපේ ජන සමාජය මුහුණ දෙන ගැටලුවල ස්වභාවය හා ස්වරූපය නිසි පරිදි තේරුම් ගැනීම සඳහා ගැටලු පිළිබඳ විස්තීරණ හා පාථුල විශ්ලේෂණයක් අවශ්‍ය බව ය. දෙවැන්න ගැටලු තිරසාර වශයෙන් විසඳා ගැනීම සඳහා සාම්ප්‍රදායික ගැටලු විසඳුම් ක්‍රියාමාර්ගවලින් ඔබ්බට ගිය සුවිශේෂ ක්‍රියාමාර්ග අවශ්‍ය බව ය. තුන්වැන්න ආසියානු නාටකය නම් පර්යේෂණ ග්‍රන්ථයෙහි ගුනාර් මිර්ඩාල් ප්‍රකාශ කලාක් මෙන් ශ්‍රී ලංකාව වැනි රටවල ගැටලු බටහිර සංවර්ධන න්‍යායන්ට හසු නො වන බව ය. එනම් ඉතුරුම්, ආයෝජනය, ප්‍රාග්ධනය, ශිල්පක්‍රම ආදී සාධකයන් ප්‍රධාන කොට ගත් කරුණු මෙන් ම චර්යාව නම් වූ සාධකය ප්‍රධාන කොට ගත් කරුණු ද ලංකාව වැනි රටවල සංවර්ධනයේ දී එක සේ තීරණාත්මක බව ය.

මීට ඉහත දී ද සඳහන් කළ පරිදි මේ ග්‍රන්ථය මගින් විස්තර කරන ලබන සමාජ සජීවීකරණය සඳහා පාදක වන ගැටලුවකත්, වෙනත් ඕනෑ ම සමාජ ආර්ථික ගැටලුවකත් කිසිදු වෙනසක් නැත. තිබෙන එක ම වෙනස වන්නේ කතුවරයා හඳුන්වා දෙන සජීවීකරණ ප්‍රවේශය තුළ දී ගැටලු විසඳීම සඳහා ද්‍රව්‍ය මූලික කරුණු මත මෙන් ම චර්යා මූලික කරුණු මත ද එක සමාන බරක් තැබිය යුතු වීම යි. සජීවීකරණ ප්‍රවේශයෙහි දී ගැටලුවක සියළු පාර්ශ්ව කරුවන් හඳුනා ගැනීමත්, ඒ ඒ පාර්ශ්ව කරුවන් තුළ සිදු කළ යුතු චර්යා වෙනස්කම් අර්ථ දක්වා ගැනීමත් විශේෂ වශයෙන් සිදු කළ යුතු වේ. මේ නිසා කතුවරයා හඳුන්වා දෙන සජීවීකරණ ප්‍රවේශය තුළ ගැටලුවක කියවීම සාම්ප්‍රදායික කියවීමට වඩා බෙහෙවින් ම වෙනස් ය. එබැවින් විසඳුම් යෝජනා ද වෙනස් ය. වෙනත් වචන වලින් කිවහොත් ගැටලුවක පාර්ශ්ව කරුවන්ගේ චර්යාව ගැටලු පවත්වා ගෙන යාමට දායක වන්නේ කෙසේ දැ යි හඳුනා නො ගෙන ද්‍රව්‍ය සුවක පැලැස්තර යෙදීම අරුත් සුන් අභ්‍යාස බව කතුවරයා හඳුන්වා දෙන සජීවීකරණයේ කියවීම වේ.

> අවස්ථාවලින් නිසි ලෙස ප්‍රයෝජන ගැනීම යනු සමාජ ආර්ථික සංවර්ධනය සඳහා යොදවා ගත හැකි සම්පත් සහ කාලයෙන් නිසි ප්‍රයෝජන ගැනීම ය.

## අවස්ථා

සමාජ සජීවීකරණයක් අවශ්‍ය වන්නේ මූලික වශයෙන් කරුණු දෙකක් සඳහා බව මේ පරිච්ඡේදය ආරම්භයේ දී සඳහන් කළා පාඨකයාට මතක ඇත. ඉන් පළමුවැන්න සමාජ ආර්ථික ගැටලු විසඳීම ය. දෙවැන්න අවස්ථා වලින් නිසි පරිදි ප්‍රයෝජන ගැනීම ය. ශ්‍රී ලාංකික ජන සමාජය මුහුණ පාන ගැටලුවල ස්වරූපය හා ස්වභාවය පිළිබඳ ව මේ වන විටත් පැහැදිලි කර අවසන් ය. මේ නිසා මෙතැන් සිට අවස්ථා නිසි පරිදි ප්‍රයෝජන ගැනීම යනු කුමක් දැයි පැහැදිලි කර ගනිමු.

අවස්ථාවලින් නිසි ලෙස ප්‍රයෝජන ගැනීම යනු සමාජ ආර්ථික සංවර්ධනය සඳහා යොදවා ගත හැකි සම්පත් සහ කාලයෙන් නිසි ප්‍රයෝජන ගැනීම ය. සම්පත් ප්‍රධාන වශයෙන් කොටස් දෙකකි. එකක් භෞතික සම්පත් වන අතර අනෙක මිනිස් සම්පත ය. මිනිස් සම්පත

ඇතුළු සෑම සම්පතක් ම සංවර්ධනය උදා කර ගත හැකි අවස්ථාවක් ද වන්නේ ය. සම්පත් නිසි ලෙස ප්‍රයෝජනයට නො ගැනීම අවස්ථා මඟ හැර දැමීමක් (Lost Opportunities) යයි කියන්නේ ඒ නිසා ය.

ශ්‍රී ලංකාව එක් පැත්තකින් සම්පත් ආකරයකි. බෙහෝ රටවලට නොමැති තරමේ අති මහත් සාගර සම්පතක් ශ්‍රී ලංකාව සතු ය. ජල සම්පත්, ජෛව සම්පත්, ශාඛ සම්පත් ආදියෙන් ද අනූන ය. ස්වාභාවික වනාන්තර, දිය ඇලි, කොරල්, අලංකාර සාගර වෙරළ ආදිය නිසා සංචාරක කර්මාන්තය සඳහා ද තෝ තැන්නකි. මේ සියල්ල අබිබවා මනා ලෙස මෙහෙයවිය හැකි නම් සාක්ෂරතාවක් සහිත, උගත් ශ්‍රම හමුදාවක් ද ශ්‍රී ලංකාව සතු ය. කෙසේ වෙතත් මහා පරිමාණ බැර කර්මාන්ත කෙරෙහි බලාපොරොත්තු තැබීමට තරම් ප්‍රමාණවත් භෞතික සම්පත් එනම්, යකඩ, ඛනිජතෙල්, නිකල් ආදී වූ භූ ගත සම්පත් ශ්‍රී ලංකාවට නැත. එමෙන් ම ඉහත කී සම්පත් තරඟකාරී ආර්ථික ක්‍රියාවලි බවට පත් කිරීමට තරම් ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් හා තාක්ෂණයක් ද ශ්‍රී ලංකාවට නැත. මේ නිසා ශ්‍රී ලංකා සංවර්ධනයේ ප්‍රධානතම සම්පත හා අවස්ථාව වන්නේ මිනිසා ය.

> මිනිස් සම්පත් ප්‍රයෝජනයට ගැනීමේ ශ්‍රී ලාංකික පිළිවෙත කාර්යක්ෂමතාව වැනි ආර්ථික න්‍යායක් මත වත්, සාධාරණය, සමානාත්මතාව වැනි සමාජ වටිනාකමක් මත වත් පදනම් වී නැත. එය හුදෙක් ආත්මාර්ථය හා බලය කේන්ද්‍ර කොට ගත් කරුණු මත පදනම් ව ඇති බව පෙනේ.

ශ්‍රී ලංකාවේ මෙන් ම ජපානයේ ද තීරණාත්මක සම්පත මිනිස් සම්පත ය. ඔවුන්ට ද යකඩවත්, ඛනිජ තෙල්වත්, නිකල්වත්, වෙනත් සැලකිය යුතු භූ ගත සම්පතක්වත් නැත. ජපන් ජාතිකයෝ ඔවුන් සතු එක ම ප්‍රධාන සම්පත වූ මිනිස් සම්පත ඉතා විශිෂ්ට හා ප්‍රශස්ත අන්දමින් ප්‍රයෝජනයට ගනිමින් සිටිත්. ඔවුහු මිනිස් සම්පත හසුරුවන්නේ මනා ශික්ෂණයකින් හා විනයකින් යුතුව ය. ශ්‍රී ලාංකිකයන් මිනිස් සම්පත දෙස බලන්නේ ජපන් ජාතිකයන් මෙන් නො වේ. මිනිස් සම්පත් ප්‍රයෝජනයට ගැනීමේ ශ්‍රී ලාංකික පිළිවෙත කාර්යක්ෂමතාව වැනි ආර්ථික න්‍යායක් මත වත්, සාධාරණය, සමානාත්මතාව වැනි සමාජ වටිනාකමක් මත වත් පදනම් වී නැත. එය හුදෙක් ආත්මාර්ථය හා බලය කේන්ද්‍ර කොට ගත් කරුණු මත පදනම් ව ඇති බව පෙනේ.

මිනිස් සම්පත අනෙකුත් සම්පත් සමඟ සංකලනය කිරීමෙන් භාණ්ඩ හා සේවාවන් නිෂ්පාදනය කළ හැකි ය. නිෂ්පාදනයට හවුල් වන මිනිසාගේ ගුණය, තත්ත්වය, නිපුනත්වය, හපන් බව ආදී ලක්ෂණ අනු ව ඔහු නිපදවන භාණ්ඩයේ හෝ සේවාවේ ගුණය හෝ තත්ත්වය තීරණය වේ. අදක්ෂයන්, අසමතුන් හෝ අලසයන්ගේ නිෂ්පාදනවලත්, දක්ෂයන්, හපනුන් හෝ සමත් මිනිසුන් ගේ නිෂ්පාදනවලත් වෙනසක් ඇත. මේ වෙනස හඳුනා ගෙන ඒ අනු ව කටයුතු කිරීම සංවර්ධනයේ මූලික න්‍යායය කි. එයට ආර්ථික විද්‍යාවේ දී කියන්නේ කාර්යක්ෂමතාව කියා ය. ජපනුන් ඔවුන්ගේ මිනිස් සම්පත ප්‍රයෝජනයට ගන්නේ මේ න්‍යාය මත ය. ශ්‍රී ලංකාවේ දී මිනිස් ශ්‍රමය ප්‍රයෝජනයට ගනු ලබන්නේ දක්ෂයන්. හපනුන් හෝ සමතුන් තෝරා ගැනීම නම් වූ සිද්ධාන්තය මත නො වේ. විශේෂ වශයෙන් ම රාජ්‍ය අංශය ක්‍රියාවට නැගෙන්නේ කාර්යක්ෂමතා පදනම මත නො වේ. රාජ්‍ය අංශය ක්‍රියාවට නැංවෙන්නේ දේශපාලන සම්බන්ධකම් හා පුද්ගලික හිතවත්කම් මඟින් තෝරා ගත් ප්‍රධාන පෙළේ රාජ්‍ය නිලධාරීන්ගේ ප්‍රධානත්වයෙනි. දක්ෂකම, හැකියාව, කාර්යක්ෂමකම, විචක්ෂණ බව ආදිය රාජ්‍ය ක්ෂේත්‍රයේ වග කිව යුතු නිලධාරීන් පත් කිරීමට අදාළ නිර්නායකයන්ට අයත් සුදුසුකම් නො වේ. ඒ වෙනුවට දේශපාලකයා සමග නිලධාරියා පවත්වන පුද්ගලික සම්බන්ධතාව, නිලධාරියාගේ දේශපාලන පසුබිම, දේශපාලකයා විසින් යොජනා කරන සියල්ලට ම එකඟ වීමේ ගුණය නිලධාරියා වෙත ඇද්ද නැද්ද යන වග ආදිය රාජ්‍ය නිලධාරී තනතුරුවලට පුද්ගලයන් තෝරා ගැනීමේ නිර්නායකයන්ට ඇතුළත් වී තිබේ. පාලකයන් විසින් අදක්ෂයන් පිරිවරා ගැනීමෙන් ද, දක්ෂයන් පිළිකුල් කිරීමෙන් ද ශ්‍රී ලංකාව වැනි රාජ්‍ය අංශය දැඩි ව ව්‍යාප්ත ව පවතින රටක සමස්ත සමාජ තන්ත්‍රය ම පරිහානියට පත් වෙයි. එහෙත් එම පරිහානිය නිසා දේශපාලකයාට හෝ රාජ්‍ය නිලධාරියාට ඇති වන පුද්ගලික පිරිවැයක් නො මැති බැවින් මහ ජනතාවගේ බදු මුදලින් යැපෙන රාජ්‍ය ආයතන අකාර්යක්ෂම කිරීම කෙරෙහි දේශපාලකයා මෙන් ම රාජ්‍ය නිලධාරියා ද සැලෙන්නේ නැත.

> මහ ජනතාවගේ බදු මුදලින් යැපෙන රාජ්‍ය ආයතන අකාර්යක්ෂම කිරීම කෙරෙහි දේශපාලකයා මෙන් ම රාජ්‍ය නිලධාරියා ද සැලෙන්නේ නැත.

සමත් බව, හපන් බව, නිපුණත්වය ආදී නිර්නායක නො සලකමින් තනතුරුවලට පිවිසෙන අදක්ෂයන් ඔවුන්ගේ පැවැත්ම තහවුරු කර ගැනීම සඳහා දක්ෂයන් ගෙන් වන බලපෑම අවම කර ගත යුතු ය. මේ නිසා අදක්ෂයන් හැම විට ම ඇලුම් කරන්නේ අදක්ෂයන් පිරිවරා ගැනීමකට මිස දක්ෂයන් සමඟ ගනු දෙනු කිරීමකට නො වේ. මේ නිසා අදක්ෂයන් ගේ පාලනය නැවත නැවතත් අදක්ෂයන් ඉදිරියට ගැනීමට උදව් කරන්නා වූ දුෂ්ට සංස්කෘතියක් වන්නේ ය. එමෙන් ම මෙකී දුෂ්ට සංස්කෘතිය සෙසු දේශපාලකයන්ට ද සෙසු රාජ්‍ය නිලධාරීන්ට ද පූර්වාදර්ශ තබන්නේ ය. එම පූර්වාදර්ශයන් ගෙන් සෙස්සන් ලබන ඉගෙනුම වන්නේ සමත් බව, හපන් බව, නිපුණත්වය අවලංගු බව ය. පක්ෂග්‍රාහිත්වය, අවස්ථාවාදය හා වංකකම වලංගු බව ය. ගුනාර් මිර්ඩාල් ගේ දිළිඳුකම පිළිබඳ දුෂ්ට චක්‍රය මෙන් ම අශිෂ්ඨ පූර්වාදර්ශයන් ගෙන් ලබන ඉගෙනුම ද සමාජ පරිහානියේ දුෂ්ට චක්‍රයක් ලෙස ක්‍රියාවට නැංවේ.

ඉහත පෙන්වා දෙනු ලැබුයේ ශ්‍රී ලාංකිකයින් විසින් සංවර්ධනය සඳහා යොදවා ගත හැකි ප්‍රධානතම ප්‍රායෝගික සම්පත වූ මිනිස් සම්පත ප්‍රයෝජනයට ගනු ලබන ආකාරය පිළිබඳ සුළු හෙළිදරව්ව කි. දක්ෂයාගේ, හපනාගේ, සමතාගේ සම්මාදම නිසි පරිදි ප්‍රයෝජනයට නො ගැනීම වනාහි මඟ හැර යන සමාජ අවස්ථාව කි (Lost Social Opportunity). එමෙන් ම මඟ හැර යන ආර්ථික අවස්ථාවකි (Lost Economic Opportunity). ඒ නිසා ම එය මග හැර යන සංවර්ධන අවස්ථාවක් (Lost Development Opportunity) ද වන්නේ ය.

අප මෙතෙක් සාකච්ඡා කරමින් සිටියේ ගැටලු හා අවස්ථා පිළිබඳවත්, සජීවීකරණය සඳහා ඒවා පාදක කර ගත හැක්කේ කෙසේ ද යන්නත් පිළිබඳ ව ය. මෙතෙක් සාකච්ඡාවට බඳුන් කළ දෑ කතුවරයාගේ අත්දැකීම් මත පදනම් වූ අර්ථකථනයන් වේ. එබැවින් සමාජ සජීවීකරණයකට පාදක වන ගැටලු පිළිබඳ ව කතුවරයා ගෙන් පිටස්තර වූ අයගේ අත්දැකීම් පිළිබඳ ව දැන ගැනීමට ද පාඨකයා උනන්දුවක් දැක්විය හැකි ය. මේ නිසා සජීවීකරණයට පාදක වන ගැටලු පිළිබඳ ව කතුවරයාට පිටස්තර වූවන් ගේ අදහස් මොනවා ද යන්න පිළිබඳ ව සංක්ෂිප්ත සාකච්ඡාවක් ආරම්භ කරමු.

සමාජ සජීවීකරණය මාතෘකා කොට ගත් දේශීය සම්මන්ත්‍රණයකට කතුවරයා මෑතක දී සහභාගි වූයේ ය. මෙම සම්මන්ත්‍රණය සඳහා සමාජ සජීවීකරණ ක්‍රියාවලිය භාවිතයේ යොදවන්නා වූ ප්‍රධාන පෙළේ විද්වතුන් සියළුදෙනා ම මෙන් සහභාගි වී සිටිය හ. එහෙත් මේ සම්මන්ත්‍රණය මඟින් සමාජ සජීවීකරණය යනු කුමක් දැයි පැහැදිලි ව අර්ථ දක්වා ගැනීමට හෝ එය පිළියමක් වශයෙන් යෝජනා වන්නේ කුමන ගැටලු සඳහා ද යන්න පිළිබඳ ව සියලු දෙනාට ම සෑහීමකට පත් විය හැකි තීන්දුවකට එළඹීමට නො හැකි විය. එසේ වූයේ සම්මන්ත්‍රණයට සහභාගි වූ දායකයන්ගේ අඩුවක් හෝ දුර්වලකමක් නිසා නො ව සමාජ සජීවීකරණය තවමත් ගොඩනැගෙමින් තිබෙන විෂයයක් වූ නිසාත් විෂයයේ ස්වභාවය අනු ව එය පුළුල් හා සංකීර්ණ එකක් බවට පත් ව තුබූ නිසාත් ය.

1999 මුල්භාගයේ දී, කතුවරයා සමාජ සජීවීකරණය පිළිබඳ ව ශාස්ත්‍රීය අධ්‍යයනයක නියුක්ත ව සිටින බව දන්වමින් ඒ සඳහා අදහස් හා යෝජනා ඉල්ලා තෝරාගත් විද්වතුන් 46 දෙනෙකු සඳහා මූලික ප්‍රශ්න දෙකකින් පමණක් යුත් ප්‍රශ්නාවලියක් යැවූයේ ය. මේ විද්වතුන් 46 දෙනාගේ ලැයිස්තුවට ඉහත කී සම්මන්ත්‍රණයට සහභාගි වූ කිසිවකුත් ඇතුළත් නො කළෙමි. මක් නිසාද? ඔවුන්ගේ අර්ථකතන හා මතවාදයන් පිළිබඳ ව මේ වන විටත් කතුවරයා වෙත ප්‍රමාණවත් තොරතුරු සමූහයක් තුබූ බැවිනි. ප්‍රශ්නාවලියෙන් විමසන ලද්දේ සමාජ සජීවීකරණයට සම්බන්ධ ප්‍රධාන ප්‍රශ්න දෙකක් පිළිබඳ ව පමණි. ඉන් පළමුවැන්න නම් ශ්‍රී ලංකාවේ සමාජ - ආර්ථික ඉදිරි ගමනට එරෙහි වන ගැටලු හෝ බාධක පිළිබඳ ව ඔවුන්ගේ විවෘත අදහස් විමසනු ලැබූ ප්‍රශ්නය යි. දෙවැන්න ඒවා මැඩ ගෙන ඉදිරියට යාම සඳහා ඔවුන් ගෙනෙන යෝජනා මොනවා ද යන්න යි.

තෝරා ගනු ලැබූ විද්වතුන් 46 දෙනා ගෙන් ප්‍රශ්නාවලිය සඳහා පිළිතුරු සැපයුවේ 31 දෙනෙකු පමණි. ප්‍රශ්නාවලිය සඳහා තොරතුරු සැපයූ විද්වතුන් ලබා දී ඇති පිළිතුරු හා යෝජනා අතිශයින් සිත් ඇද ගන්නා සුළු ය. ඔවුන්ගේ ප්‍රතිචාර ශ්‍රී ලාංකික සමාජ හැසිරීමේ අභ්‍යන්තරය එළිදරව් කිරීමට හොඳට ම ප්‍රමාණවත් ය. ප්‍රශ්නාවලියට ලැබුණු ප්‍රතිචාර වලින් බොහොමයක් එකිනෙකට එකක් පෑහේ. පිළිතුරු

ලබාදුන් විද්වතුන් 31 දෙනාගෙන් 30 දෙනෙකුගේ ම මතය වූයේ ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික ඉදිරි ගමනට එරෙහි වන පැහැදිලි ව හඳුනා ගත හැකි බාධා තිබෙන බව ය. අපේක්ෂා කරන මට්ටමට වඩා බෙහෙවින් අඩු වේගයකින්, මන්දගාමී ලෙස සමාජය ඉදිරියට ගමන් කරන්නේ මේ බාධාවන් නිසා බව ඔවුන්ගේ අදහස විය. ඒ ඒ විද්වතුන් නියෝජනය කරන විෂය ක්ෂේත්‍රයට යම් නැඹුරුවක් වන පරිදි පිළිතුරු ගොනු කිරීමට විද්වතුන් පෙළඹී ඇති බවක් ඔවුන්ගේ ප්‍රතිචාර වලින් හෙළිදරව් විය. උදාහරණ වශයෙන් නීති ක්ෂේත්‍රයේ පසුබිමක් ඇති විද්වතුන් ශ්‍රී ලංකාව මුහුණ දෙන පසු බෑම මූලික වශයෙන් නීතිමය හිදැසක් මත සිදුවන්නක් බව ද, හිදැස්වලින් තොර ව නීතිමය තත්වයන් නිසි පරිදි ක්‍රියාවේ යෙදවීමෙන් සමාජය නිසි මගට ගත හැකි බව ද පෙන්වා දී තිබිණි. අධ්‍යාපන විද්‍යා ක්ෂේත්‍රයේ පසුබිමක් ඇති විද්වතුන් පෙන්වා දී තුබුණේ ලාංකික සමාජය නිදාවට පත් කළ, මන්දගාමී කළ, ගැති භාවයට පත් කළ ප්‍රධාන බලවේගය මෙ රට පවතින අධ්‍යාපන ක්‍රමය බවත්, පැව්ලෝ පෙයර් වැනි අධ්‍යාපනඥයන් ප්‍රකාශ කර ඇති පරිදි පවත්නා අධ්‍යාපනය වෙනස් නො කොට සමාජ සජීවිකරණයක් බලාපොරොත්තු විය නො හැකි බව යි. ආගමික පසුබිමක් ඇති විද්වතුන් වැඩි වශයෙන් අවධාරණය කරන ලද කරුණ වූයේ ශ්‍රී ලාංකික ජන සමාජයේ ආගමික වටිනාකම් නැවත ස්ථාපිත කිරීමකින් තොර ව සමාජයේ දියාව වෙනස් කිරීම උගහට බවත් ය.

ප්‍රශ්නාවලියට පිළිතුරු එවන ලද විද්වතුන්ගෙන් වැඩි ප්‍රමාණයක් එනම් 14 දෙනෙකු ආර්ථික කරුණු කෙරෙහි වැඩි නැඹුරුවක් පෙන්වන ලද අතර ඒ 14 දෙනා ගෙන් දෙදෙනෙකු හැර අන් සියලුම විද්වතුන් එනම්, 12 දෙනෙකු ම නිදහස් ආර්ථික ක්‍රමය, පුද්ගලිකකරණය ආදී වෙළඳපල ආර්ථික ක්‍රමයක ලක්ෂණ මඟින් සමාජ - ආර්ථික ඉදිරි ගමන තහවුරු කළ හැකි බවට යෝජනා කර තිබිණි. ආර්ථික කරුණු මත බර තබා ප්‍රතිචාර දැක්වූ 14 දෙනාගෙන් දෙදෙනෙකු ඉහත කී යෝජනාවේ විලෝමය තහවුරු වීමට සාධක ඉදිරිපත් කර තිබූ අතර ඔවුන්ගේ අදහස වූයේ පුද්ගලිකකරණය, තරඟය හා වෙළඳපළ බල අරගලය තුළ මිනිස් වටිනාකම් විනාශ වීම නිසා සමාජ ආර්ථික ඉදිරි ගමන මහත් සේ ව්‍යාකූල වී ඇති බවත්, ප්‍රතිකර්මයක් ලෙස කළ යුතු ව ඇත්තේ මුදලට වහල් නො වූ රාජ්‍ය

ව්‍යවසාය ක්‍රමයක් නැවත සහතික කිරීම බවත් ය.

ප්‍රශ්නාවලියට ප්‍රතිචාර දැක්වූ විද්වතුන් 31 දෙනාගෙන් එක් අයෙකුගේ මතය අනෙක් 30 දෙනාගේ මතයට වඩා පැහැදිලි වෙනස් මගක් ගෙන තිබිණි. ඔහු කියා සිටියේ සමාජ සජීවීකරණ ක්‍රියාවලිය මුළුමනින් ම ඵල රහිත, අරුත් සුන් අභ්‍යාසයක් බව යි. ඔහුගේ අදහස අනු ව කිසිදු සමාජයක් පසුගාමී හෝ ඉදිරිගාමී වන්නේ නැත. සමාජයක් පසුගාමී යයි හෝ ඉදිරිගාමී යයි කීම මනෝ මූලික ප්‍රකාශය කි. යම් සමාජයක් යම් විශේෂිත ස්වභාවයක පවතින්නේ එම සමාජයේ පුරුෂාර්ථ හා ඕනෑ එපාකම් අනුව ය. එබැවින් බාහිර බලපෑම් මත සමාජය ඉදිරියට තල්ලු කර ගමන ඉක්මන් කර වීමට හෝ දිසාව වෙනස් කිරීමට හෝ පසු පසට තල්ලු කර පසුබට කර වීමට හෝ නො හැකි ය. කෙසේ වෙතත් යම් යම් සමාජ, ආර්ථික හා සංස්කෘතික සාධක මත සමාජයක ඉදිරි ගමන තීන්දු වන බව ඔහු සඳහන් කර තිබිණි. දෙන ලද තත්ත්වයන් යටතේ සියලු ම සමාජීය පුද්ගලයන් සමාජ සංස්ථාව තුළ තාර්කික ව හැසිරෙන බවත් මේ විද්වතාගේ අදහස විය. මේ නිසා සමාජ සජීවීකරණය යන සමස්ත අදහස ම හුදු මනෝරාජ්‍ය සංකල්පයක් ලෙස හඳුන්වා තුබූ ඔහු සමාජ සජීවීකරණයක් සඳහා අමුතුවෙන් ගත යුතු උපාය මාර්ග නැතැයි ද, එය හුදෙක් ප්‍රලාපයක් හෝ දේශපාලන ප්‍රචාරණ කටයුත්තක් වන්නේ යයි ද පෙන්වා දී තිබිණි.

ප්‍රශ්නාවලිය සඳහා ප්‍රතිචාර දැක්වූ 31 දෙනා අතුරින් මෙවැනි විප්ලවකාරී අදහසක් ඉදිරිපත් කළ එක ම තැනැත්තා මොහු වූ අතර ඒ විද්වතාගේ අදහස් යම් ශූන්‍යතාවාදී න්‍යායයක් මත ඉදිරිපත් කර ඇති බවක් බැලූ බැල්මට පෙනෙන්නට තිබිණි. කෙසේ වෙතත් යම් දාර්ශනික මත වාදයක පිහිටා ඉදිරිපත් කර ඇති ඒ අදහස් අප ඉතා ඉහළින් අගය කළ යුතු ය.

ප්‍රශ්නාවලිය සඳහා ප්‍රතිචාර දැක්වූ විද්වතුන් 31 දෙනා ගෙන් 30 දෙනෙකුගේ ම අදහස් යම් තර්කයකට අනුව ගොනු කළ හැකි ය. මුලින් කී විප්ලවකාරී අදහස් දැරූ විද්වතාගේ අදහස් මේ ගොනු කිරීමට ඇතුළත් කළ නො හැක්කේ සමාජ සජීවීකරණය අවශ්‍ය වූ

පසුබිමක් ඇති බවක් ඔහු නො පිළිගත් හෙයිනි. ප්‍රතිකර්ම යෙදිය යුතු ගැටලු සහගත තත්ත්වයක් ශ්‍රී ලාංකික ජන සමාජය තුළ ඇතැයි පිළිගනු නො ලබන්නේ නම් ඒ සඳහා ප්‍රතිකර්ම අවශ්‍ය වන්නේ ද නැත. මේ ග්‍රන්ථයෙන් සාකච්ඡා කරන්නේ ගැටලු ඇතැයි හඳුනා ගෙන, ඒවා විශ්ලේෂණය කර ප්‍රතිකර්ම යෝජනා කිරීමක් බැවින් ගැටලු නැතැ යි යන මතය තව දුරටත් ඉදිරියට ගෙන යා නො හැකිය. මේ නිසා ප්‍රශ්නාවලියට ප්‍රතිචාර දැක්වූ අනෙකුත් විද්වතුන් 30 දෙනාගේ යෝජනා, අදහස් හා ප්‍රතිකර්ම පමණක් ඉතා සංක්ෂිප්ත ව මේ ග්‍රන්ථයට ඇතුළත් කෙරිණි.

මුලින් සඳහන් කලාක් මෙන් මේ ප්‍රශ්නාවලිය මගින් ඉදිරිපත් කර තුබුණේ ප්‍රශ්න දෙකක් පමණි. ඉන් පළමුවැන්න ශ්‍රී ලංකා ජන සමාජයේ ඉදිරි ගමනට බාධා පමුණුවන ගැටලු හෝ බාධක මොනවාද යන්න යි. ග්‍රන්ථයේ මේ පරිච්ඡේදය විස්තර කරන්නේ සමාජ සජීවීකරණයට පාදක වන ගැටලු පිළිබඳ ව බැවින් ප්‍රශ්නාවලියේ පළමු ප්‍රශ්නයට ඉදිරිපත් කළ ප්‍රතිචාර පමණක් මේ පරිච්ඡේදය තුළ සාකච්ඡාවට භාජන වෙයි. ප්‍රශ්නාවලියේ දෙවැනි ප්‍රශ්නය වන හඳුනා ගත් ගැටලු සඳහා ප්‍රතිකර්ම මොනවාද යන්නට ලැබුණු ප්‍රතිචාර පසු පරිච්ඡේද වලදී සුදුසු පරිදි ඉදිරිපත් කරනු ඇත.

විද්වතුන්ගේ ප්‍රතිචාර කිසිවක් නො ගිලිහෙන පරිදි ඉදිරිපත් කිරීම සඳහා වඩාත් සුදුසු ක්‍රමය වන්නේ ඔවුන් ඉදිරිපත් කර ඇති ගැටලු වර්ගීකරණය කර වගුවක් ලෙස ඉදිරිපත් කිරීම යි. එහෙත් මේ ග්‍රන්ථය පර්යේෂණ තොරතුරු ඉදිරිපත් කෙරෙන වාර්තාවක් නො වන නිසාත්, ග්‍රන්ථය ලියාගෙන යනු ලබන ශෛලියට වගු ඉදිරිපත් කිරීමකින් බාධා පැමිණෙන නිසාත්, ප්‍රතිචාර ලබා දුන් විද්වතුන්ගේ අදහස් රචනා ශෛලියට සම්පිණ්ඩනය කිරීමට අදහස් කළෙමි.

ප්‍රශ්නාවලියට ප්‍රතිචාර දැක්වූ සියලු ම විද්වතුන් (මුලින් කී විප්ලවකාරී අදහස් දැරූ විද්වතා හැර) ශ්‍රී ලංකා සමාජ ආර්ථික ක්‍රමයේ ප්‍රමුඛතම බාධාව ලෙස හඳුනා ගෙන තුබුණේ අවස්ථාවාදී හා බඩගෝස්තරවාදී දේශපාලනය යි. (ඔවුන් සඳහන් කර තිබූ වචන වලින් ම ප්‍රකාශ කළහොත්) දේශපාලනය වෘත්තියක් කර ගැනීමත්, බලය හැසිරවීමේ

අවිචාර අවියක් කර ගැනීමත්, අනුන් පෙළන, තමා හා තමාගේ අනුගාමිකයන් සතපන තත්ත්වයක් බවට පත් කර ගැනීමත් නිසා සමාජයේ සැලකිය යුතු ජන ප්‍රතිශතයක් ප්‍රතිගාමී ව, ඉච්ජාභංගත්වයට පත් ව ඇති බව විද්වත්හු හෙළි කළහ. බලයට පැමිණි සියලු ම දේශපාලන පක්ෂ හා බලයට පැමිණීමට උත්සාහ කරන සියලු පක්ෂ තුළ මේ අයහපත් ගුණාංගය පවත්නා බව මොවුන්ගේ අදහස විය. හුදෙක් තම පාක්ෂිකයන්ට වැඩි වැඩියෙන් ආධාර උපකාර කිරීමකින් නො නැවතී අනෙකුත් මත දරන්නන් නො ඉවසා, ඔවුන්ට හිරිහැර කිරීම මගින් සමස්ත සමාජ ක්‍රමය ම අවුල් කර දැමීමට දේශපාලකයන් කටයුතු කරන බවත්, ඒ මත පොදු ජන කොටස් ද බෙදී වෙන් වී සිටිමින් ඔවුන් පෙළන්නා වූ සැබෑ ගැටලු අමතක කොට කෘතිම ව බිහි කළ දේශපාලන බෙදුම් වාදය කරපින්නා ගත්තවුන් බවට පත් කර තිබීම සමාජයේ ඉදිරි ගමනට කඩා පාත් වී ඇති ප්‍රධානත ම බාධකය යයි පෙන්වා දී තිබිණි.

නියැදියෙන් 29 දෙනෙක් තවත් ප්‍රධාන බාධකයක් ලෙස දක්වා තුබුයේ මෙරට ජනතාව දරන ඍණාත්මක ආකල්ප ය. පොදු ජනතාව ඇතුලු, නිලධාරීන්, උගතුන් හා සෙසු ජන කොටස් දරන්නා වූ ප්‍රතිගාමී ආකල්පයන් ද, යැපුම් මානසිකත්වය ද, යටත් විජිතවාදී අදහස් ද, ප්‍රබල බාධකයන් වන බවත්, මෙකී ලක්ෂණ නිසා පවත්නා සමාජ සංස්ථාව ඒ ආකාරයෙන් ම පවත්වා ගෙන යනු ලබනවා විනා ඉදිරියට යාමක් නො වන බවත් පෙන්වා දුන්හ.

නියැදියෙන් 14 දෙනෙකු කියා සිටියේ මෙරට සංවර්ධන සැලසුම් රජයෙන් රජයට වෙනස් වන, වරින් වර විවිධ ලේබල් අලවන, එමෙන් ම විවිධ පරස්පර විරෝධයන් ජනිත කරන සැලසුම් වීම නිසා එම සැලසුම් අප සමාජයේ ඉදිරි ගමන අවුල් කරන ප්‍රධාන බාධකයක් බව යි. ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධන වැඩසටහන් සකස් කරන්නේ ජනතාව සඳහා නො ව දේශපාලකයන්ගේ ප්‍රතිරූප ගොඩ නැගීමට හෝ පක්ෂ වල නාම පුවරු පෙරහැරේ ගෙන යාමකට බැවින් දේශපාලනකරණයෙන් තොර වූ, පොදු ජනතාව මූලික කර ගත්, අව්‍යාජ සංවර්ධන වැඩසටහන් නො මැති වීම සමාජ - ආර්ථික ඉදිරි ගමනේ ප්‍රධාන බාධකයක් බව මොවුන්ගේ අදහස විය.

නියැදියෙන් හත් දෙනෙකු කියා සිටියේ අප සමාජයේ ඉදිරි ගමන පසුබට කරන ප්‍රධාන අඩු පාඩුව නම් නායකයන්ගේ හිඟකම ය. මෙහිදී දේශපාලන නායකයන් පමණක් නොව සමාජය නියෝජනය කරන විවිධ තරාතිරම්වල නායකත්වයන් පිළිබඳ ව අදහස් කරන ලද අතර දේශපාලන නායකත්වය ද ඊට ඇතුළත් කර තිබිණි. මොවුන්ගේ පැහැදිලි අදහස වී තිබුණේ ශ්‍රී ලංකාවේ අව්‍යාජ නායකකයන්ගේ හිඟකමක් ඇති බව යි. යම් අරමුණක් ඉටු කර ගැනීම සඳහා නායකත්වය ප්‍රබල සාධකයක් වන නමුත් හුදෙක් නායකයන්ගේ හිඟකම නිසා ඒ වෙනුවට යොදවා ගත් නායක ප්‍රතිරූපයන්ට අරමුණු ඉටු කරගැනීමටවත්, අනුගාමික සහාය ලබා ගැනීමටත් නො හැකි බව මේ වියත්හු පෙන්වා දුන්හ.

තවත් වියතුන් හත් දෙනෙකු හඳුනා ගෙන තුබූ සමාජ ආර්ථික බාධකයක් වූයේ අකාර්යක්ෂම නිලධාරි ක්ෂේත්‍රය යි. ශ්‍රී ලංකාවේ රාජ්‍ය නිලධාරි තන්ත්‍රය අතිශයින් අකාර්යක්ෂම වූත්, ප්‍රතිගාමී වූත්, යන්ත්‍රණයක් බව මොව්හු පෙන්වා දුන්හ. ඉහළ නිලධාරි පංතියේ බහුතරයක් දේශපාලකයන් සතුටු කිරීමේ ව්‍යාපාරයක යෙදෙමින් දැන දැන ම නිවැරදි ගමන් මග අමතක කරන අය බවත්, මැද නිලධාරි තන්ත්‍රයේ බහුතරය ඉහළ නිලධාරි පන්තියට ඇතුළු වීමේ ගිජුකමින් එම පංතියට ප්‍රවිෂ්ඨ වීමේ විවිධ උපාය මාර්ග සොයමින් සිටින බවත්, පහළ පංතියේ බහුතරය බොහෝ පීඩනයන්ට හසු ව, ප්‍රතිගාමී ව, ඍණාත්මක ආකල්පවලින් යුතු ව, එදා වේල සොයා ගෙන අත පිස ගන්නා ආකාරයේ පසුබිමක සිට රාජකාරියේ නියුතු වන බවත් විස්තර කර ඇත. මේ නිසා ම ඔවුන්ගේ සේවය ලබා ගන්නා ජනතාව මහත් අපහසුතාවට පත් ව ඇති නමුත් දේශපාලකයන් හා නිලධාරීන් අතර පවත්නා අන්‍යොන්‍ය රැඳියාව නිසා නිලධාරි තන්ත්‍රයේ අකාර්යක්ෂමතාව හෙළි කිරීම නිෂ්ප්‍රයෝජන කටයුත්තක් වී ඇති බවත් මේ විද්වත්හු පෙන්වා දුන්හ.

මෙතෙක් සඳහන් කරනු ලැබුයේ ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික ඉදිරි ගමනට බාධා පමුණුවන ගැටලු මොනවා ද? යන ප්‍රශ්නයට ඉදිරිපත් කර තුබූ ප්‍රධාන පෙළේ කරුණුවලින් විශේෂයෙන් සටහන් කිරීමට වැදගත් යයි කතුවරයා තීරණය කරනු ලැබූ කරුණු කීපයකි. මීට

අමතර ව මිනිසුන්ගේ දක්ෂතාවන් නො සලකා හැරීම, පක්ෂපාතිත්වය, සැලසුම් රහිත බව, නීතිමය දුර්වලකම්, සම්පත් කළමනාකරණයේ අඩුපාඩු, ප්‍රතිපත්තිමය අඩුපාඩු, ප්‍රජාතන්ත්‍ර විරෝධී පාලනය, අන්ධානුකරණය, මිත්‍යා විශ්වාස සහිත ජනතාව, අධ්‍යාපන ක්‍රමයේ දුර්වලකම්, වංචාව, අල්ලස, දූෂණය, ආචාරධර්ම හා අගයන් නො සලකා හැරීම ආදී වූ විවිධාකාර බාධක සමාජ ආර්ථික ඉදිරි ගමන වලකනු ලබන බාධකයක් සේ නම් කර තිබිණි.

වියතුන් විසින් නම් කරන ලද මේ බාධාවන් ගැටලු වශයෙන් පවතී නම් (එනම් මිනිසුන් පීඩාවට පත්කර ඇත්නම්) ඒවා විසඳා ගැනීමට, පිළියම් යෙදීමට ශ්‍රී ලාංකික ජනතාව නො වෙහෙසෙන්නේ ඇයි ද? යන්න ගැඹුරින් සලකා බැලිය යුතු කාරණය කි. මේ පරිච්ඡේදය ආරම්භයේ ගැටලු නිර්වචන කිරීමේ දී විස්තර කරනු ලැබුයේ ගැටලු නිසා මිනිසුන් පීඩාවට පත් වන බවත් එවිට පීඩාවෙන් මිදීමේ, නිදහස් වීමේ අවශ්‍යතාව මිනිසුන් තුළ ඉස්මතු වන බවත් ය. කෙසේ වෙතත් ශ්‍රී ලාංකික ජන සමාජයේ චර්යා රටාවලින් පීඩාවකින් මිදීමේ උවමනාවක් පිළිබිඹු නො වන්නේ යයි යමෙකු තර්ක කළ හැකිය. එහෙත් එම තර්කයේ සම්පූර්ණ සත්‍යයක් නැත. මන්ද? ගැටලු නිසා මිනිසුන් පීඩාවට පත්ව ඇත් ද යන්න ප්‍රකට වන්නේ ගැටලු විසඳීම සඳහා ඉලක්ක කර ගත් පිඹුරුපත් සහිත ව මිනිසුන් විසඳුම් ක්‍රියාමාර්ගවලට පිවිසීමක් නිසා ම නොවේ. බොහෝ විට ජනතාව ගැටලුවකින් පීඩා විඳින නමුදු ඒ සඳහා සුදුසු විසඳුම කුමක් දැ යි කියා නො දනී. මේ නිසා ඇතැම් විට ඔව්හු තමන් පෙළනු ලබන ගැටලුව තව දුරටත් පවත්වා ගෙන යාමට ද අවිඥානක ව දායක වේ. එක්තරා දුරකට ශ්‍රී ලංකාව තුළ සිදු වෙමින් පවතින්නේ ද මෙවැනි තත්වයකි. මනුෂ්‍යයා පීඩාවට පත් කරන තත්ත්වයක්, එනම් ගැටලු සහගත තත්ත්වයක් ඇති විට එහි ප්‍රතික්‍රියාව සමාජය තුළ විවිධ ස්වරූපයෙන් විද්‍යාමාන වේ. මෙකී ප්‍රතික්‍රියාවන් එක්කෝ ගැටලුව සඳහා විසඳුම විය හැකි ය. ඇතැම් විට ගැටලුව තව දුරටත් උග්‍ර කරන්නක් විය හැකිය. තවත් සමහර විටක ඒ දෙක ම නො වන වෙනත් තත්ත්වයක් විය හැකි ය. බොහෝ ප්‍රතික්‍රියා තුළ ගැටලුවක් ඇත යන්න පැහැදිලි ව සටහන් ව තිබේ. මන්ද? ප්‍රතික්‍රියාවේ ස්වරූපය මගින් පීඩාවක් ඇත යන්න හෙළිදරව් වන බැවිනි.

> යම් පීඩනයකට මනුෂ්‍යයන් දක්වන ප්‍රතික්‍රියාව ප්‍රධාන ආකාර දෙක කි. ඉන් එක් ආකාරයක් නම් පීඩනයට වගකිව යුතු යැයි ඔවුන් විශ්වාස කරන්නා වූ පාර්ශවයන්ට එරෙහි ව ඉදිරියට ඒම යි. මේ ප්‍රතික්‍රියාවන් බාහිර ලෝකයට පැහැදිලි ව පෙනේ. කැරළි ගැසීම් සහ දේශපාලන ස්වරූපයක් ගත් උද්ඝෝෂණ, ආදී තත්ත්වයන් පීඩනයේ ප්‍රතික්‍රියාවන් බාහිර ලෝකයට දැනෙන ආකාරයෙන් මතු වන ඒවා ය. දෙවැනි ආකාරය නම් මුළුමනින් ම පසු බැස සිටීම යි. නැත හොත් මුලින් සිටි තත්ත්වයටත් වඩා ප්‍රතිගාමී ව සිටීම යි.

1971 දීත් 1980 ගණන් වල අග භාගයේ දීත් මෙ රට තරුණ කොටස් තමන් විඳින පීඩාවට ප්‍රතික්‍රියා දැක්වූ හ. ප්‍රතික්‍රියාව ගැටලුවේ විසඳුම නො වීය. එහෙත් එය ගැටලුවක් ඇති බව හෙළිදරව් කිරීමට සමත් විය. 1989 දී ශ්‍රී ලංකාවේ තරුණයන් විසින් ඉස්මතු කරනු ලැබූ කැරලි සහගත තත්ත්වයෙන් පසුව එවකට පැවති රජය තරුණ ගැටලුවලට පාදක වන තත්ත්වයන් සොයා බැලීම සඳහා විද්වතුන්ගේ මණ්ඩලයක් පත් කළේ ය. මේ මණ්ඩලය විසින් ඉදිරිපත් කළ වාර්තාවෙන් හෙළි කරනු ලැබුයේ සමාජ අසාධාරණය, දේශපාලන පක්ෂග්‍රාහීත්වය, සුදුස්සාට සුදුසු තැන නො ලැබීම ආදී තත්ත්වයන් මඟින් තරුණයන් ප්‍රබල ලෙස පීඩාවට පත් කර ඇති බව යි. මේ අනු ව 1990 දශකයේ මුල් භාගයේ සිට බලධාරීහු දේශපාලන පත්වීම් නතර කිරීමට ද, තරඟ විභාග ක්‍රම තහවුරු කිරීමට ද, පුද්ගල දක්ෂතා අගය කොට උසස්වීම්, තනතුරු ආදිය පිරිනැමීමට ද කටයුතු ආරම්භ කළ බවක් පෙනෙන්නට තිබිණි. කෙසේ වුව ද එම දශකයේ ම අග භාගය වන විට නැවතත් පුරුදු පරිදි, පැරණි පිළිවෙත ම තහවුරු කර ගැනීමට බලධාරීහු සමත් වූ හ. විද්වතුන්ගේ නිර්දේශ නො වැදගත් යයි බලධාරීන් ඇතැම් විට සිතන්නට ඇත.

යම් පීඩනයකට මනුෂ්‍යයන් දක්වන ප්‍රතික්‍රියාව ප්‍රධාන ආකාර දෙකකි. ඉන් එක් ආකාරයක් නම් පීඩනයට වගකිව යුතු යැයි ඔවුන් විශ්වාස කරන්නා වූ පාර්ශ්වයන්ට එරෙහි ව ඉදිරියට ඒම යි. මේ ප්‍රතික්‍රියාවන් බාහිර ලෝකයට පැහැදිලි ව පෙනේ. කැරළි ගැසීම් සහ දේශපාලන ස්වරූපයක් ගත් උද්ඝෝෂණ, ආදී තත්ත්වයන් පීඩනයේ ප්‍රතික්‍රියාවන් බාහිර ලෝකයට දැනෙන ආකාරයෙන් මතු වන ඒවා ය. දෙවැනි ආකාරය නම් මුළුමනින් ම පසු බැස සිටීම යි. නැත හොත් මුලින් සිටි තත්ත්වයටත් වඩා ප්‍රතිගාමී ව සිටීම යි. බොහෝ පුද්ගලයන්

ඇතුළත් වන්නේ මේ ආකාරයෙන් ප්‍රතිචාර දක්වන කුලකයට ය. ගැටලුවලින් පීඩා විඳින බහුතරයකගේ ප්‍රතික්‍රියාව වන්නේ මන්දගාමී ව, ප්‍රතිගාමී ව, සෘණාත්මක ආකල්ප ඇති කර ගනිමින් අරගලයෙන් හෝ පොර බැදීමෙන් වැළකී සිටීම යි. ඔව්හු ඉවජාභංගත්වයට පත්වූවෝ වෙති. ඉදිරියට නො යන්නෝ වෙති. අභියෝග මගහරින්නෝ වෙති. මොව්හු සිදු වන්නේ කුමක් ද එය අනුමත කරති. ලැබෙන්නේ කුමක් ද? එය ලබා ගනිති. ඉන් එපිට බලාපොරොත්තු තැබීමට හෝ ශුභවාදී ව සිතීමට හෝ නො පෙළඹෙති. මන්ද? මනෝ මූලික බලාපොරොත්තු වලට වඩා ප්‍රත්‍යක්ෂයෙන් ලත් අත්දැකීම සැබෑ බව ඔවුන් දන්නා නිසා ය.

> 1950 සිට 1992 වන විට ශ්‍රී ලංකාවේ සිය දිවි නසා ගැනීම් 870% කින් ඉහළ ගොස් තිබේ. එනම් 1950 දී මරණ ලක්ෂයකට 6.5 ක් වූ සිය දිවි නසා ගැනීමේ අනුපාතය 1992 වන විට මරණ ලක්ෂයකට 56.5 දක්වා ඉහළ ගොස් ඇත.

ශ්‍රී ලාංකික සමාජ පීඩනයේ තරම හෙළිදරව් කරන පැහැදිලි දර්ශකයක් නම් දිගින් දිගට ම ඉහළ යන සිය දිවි නසා ගැනීම් ය. සිය දිවි නසා ගැනීම් පීඩනයට දක්වන එක්තරා ප්‍රතික්‍රියාව කි. ලෝකයේ සිය දිවි නසා ගැනීමේ සංඛ්‍යා ලේඛන අනුව ශ්‍රී ලංකාව ද ඉහළින් සිටින රට කි. 1999 වන විට වර්ෂයකට සිය දිවි නසා ගන්නන්ගේ සංඛ්‍යාව 7000 ඉක්මවන බව සංඛ්‍යාලේඛන හෙළිදරව් කරයි. මේ සංඛ්‍යාවට මිනිස් බෝම්බ හා වර්ගවාදී ගැටලුවට සම්බන්ධ සිය දිවි නසා ගැනීම් ඇතුළත් නැත. 1950 සිට 1992 වන විට ශ්‍රී ලංකාවේ සිය දිවි නසා ගැනීම් 870% කින් ඉහළ ගොස් ඇත. එනම් 1950 දී මරණ ලක්ෂයකට සිව දිවි නසා ගැනීම් 6.5 ක් ව තුබූ අතර 1992 වන විට මරණ ලක්ෂයකට 56.5 දක්වා සිය දිවි නසා ගැනීම් ඉහළ ගොස් තිබේ (Silva and Pushpakumara, 1996) . ක්‍රි. ව. 2000 වර්ෂයේ දී අටලෝ දහමට නො සැලෙනු ඇතැයි කියනු ලබන බෞද්ධ භික්ෂූන් වහන්සේලා දෙනමක් ද සිය දිවි නසා ගැනීමෙන් සංඝ පරම්පරාවේ දායකත්වය ද සිය දිවි නසා ගැනීම් සඳහා ලබා දුනි. ශ්‍රී ලංකාවේ උතුරු නැගෙනහිර යුද්ධය නිසා වසරකට විනාශ වන මිනිස් ජීවිත ප්‍රමාණය මෙන් දෙගුණයක් පමණ සිය දිවි නසා ගැනීම් නිසා විනාශ වන බව කියැ වේ. මෑතක දී උතුරු මැද පළාත තුළ සිදු කරන ලද

එක්තරා ව්‍යාපෘතියක් තුළින් ප්‍රදේශයේ තිබෙන කණේරු නම් වූ ශාකයේ සියලුම ගස් ගලවා පුළුස්සා දමන ලදී. මන්ද? සිය දිවි නසා ගැනීම සඳහා කණේරු ඇට ගිල දැමීම බහුල වශයෙන් සිදු වී ඇති බැවිනි. එහෙත් කණේරු ඇට ඇතත් නැතත් සමාජය පීඩනයට පත් කරන තත්ත්වයන් පවතින තාක් කල් සිය දිවි නසා ගැනීම් පාලනය කිරීම අපහසු ය. ඉච්ඡාභංගත්වය, පලි ගැනීම හා ක්‍රෝධය ආදී වූ අභ්‍යන්තර තෙරපුම පුද්ගලයන් බාහිර ලොවට ප්‍රකාශ කරන එක් මාධ්‍යයක් වන්නේ සිය දිවි නසා ගැනීම් ය.

ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික ගැටලු හා ඒවායේ සංකීර්ණතාවන් පිළිබඳ ව හොඳින් ඇහුම්කන් දුන් එක්තරා විදේශිකයෙකු කීවේ ඔහුට මතු වන ප්‍රශ්නය නම් ශ්‍රී ලංකාවේ ජනතාව සිය දිවි නසා ගන්නේ ඇයි ද? යන්න නො ව සිය දිවි නසා නො ගත් සෙසු ජනතාව සිය දිවි නසා නො ගන්නේ ඇයි ද? යන ප්‍රශ්නය බව යි.

1999 වර්ෂයේ මුල් භාගයේ පැවැත් වූ එක්තරා සම්මන්ත්‍රණයකට සහභාගි වීමට මට අවස්ථාවක් ලැබිණි. සම්මන්ත්‍රණයේ එක් ප්‍රධාන මාතෘකාවක් වූයේ ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික පීඩනය හා අපරාධ පසුබිම යි. සම්මන්ත්‍රණයේ දී ශ්‍රී ලාංකික ජනතාව මුහුණ දෙන විවිධ සමාජ ආර්ථික ගැටලු පිළිබඳ ව ද, එකී ගැටලු වලින් ජනතාව ලබන පීඩනය පිළිබඳව ද, වර්තමානයේ ඉහළ යන සිය දිවි නසා ගැනීම් පිළිබඳ ව ද දිගින් දිගට ම කරුණු හෙළිදරව් විය. දරුවකු උපන් දා සිට දරුවා පාසැලට ඇතුළත් කරගැනීම දක්වාත්, පාසැලට ඇතුළත් කර ගැනීමේ සිට විභාග සමත් වන අවස්ථාව දක්වාත්, ඉන් අනතුරුව පැමිණෙන විවිධාකාර වූ සමාජ ආර්ථික අභියෝගවලට මුහුණදීමේ දීත් ශ්‍රී ලාංකිකයන් කරන අරගලය හා ඔවුන් තුළ වර්ධනය වන පීඩනය මේ සම්මන්ත්‍රණයේ දී මොනවට පැහැදිලි කරන ලදී. සම්මන්ත්‍රණයට සහභාගි වූ පිරිස අතර දේශීය අය මෙන් ම විදේශීය අය ද වූහ. ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික ගැටලු හා ඒවායේ සංකීර්ණතාවන් පිළිබඳ ව හොඳින් ඇහුම්කන් දුන් එක්තරා විදේශිකයෙකු කීවේ ඔහුට මතු වන ප්‍රශ්නය නම් ශ්‍රී ලංකාවේ ජනතාව සිය දිවි නසා ගන්නේ ඇයි ද? යන්න නො ව සිය දිවි නසා නො ගත් සෙසු ජනතාව සිය දිවි නසා නො ගන්නේ ඇයි ද? යන ප්‍රශ්නය බව යි.

මනුෂ්‍යා තුළ මානසික පීඩනයක් ඇති වීම විවිධාකාර වූ හේතූන් මත සිදු වේ. යමෙකුගේ ඕනෑ එපාකම් ඉටු කර ගැනීමට ආර්ථික ශක්තියක් නැති වීම, යම් බලාපොරොත්තුවක් කඩ වීම ආදී සරල තත්ත්වයක් නිසා මෙන් ම, සමාජ අසාධාරණය, අයුක්තිය, තාඩන පීඩන ආදී සංකීර්ණ තත්ත්වයන් නිසා ද මනුෂ්‍යයෝ පීඩනයට පත් වෙත්. යම් ජන කොටසකට දිගින් දිගට ම අසාධාරණයක් සිදු වන්නේ යයි ඔවුන් තුළ හැඟීමක් ඇති වුවහොත් ඊට දක්වන ප්‍රතික්‍රියාව ඇතැම් විට බෙහෙවින් බරපතළ විය හැකි ය. කවරෙකු විසින් අසහනයක් නැතැ යි කීව ද, පීඩනයක් නැතැ යි කීව ද මනුෂ්‍යයන් පීඩනයට දක්වන ප්‍රතික්‍රියාවක් තුළ පීඩනයේ තීව්‍රතාව ඉතා පැහැදිලි ව සටහන් ව තිබේ. බොහෝ විට පීඩනය හඳුනා ගැනීමට අපහසු වන්නේ නැතහොත් හෙළි දරව් නො වන්නේ ප්‍රතික්‍රියා විවිධාකාර වන බැවිනි. නැතහොත් සියලු දෙනාගේ ම ප්‍රතික්‍රියාව එක ම ප්‍රතික්‍රියාවක් නො වන බැවිනි. වෙනත් වචනවලින් කිවහොත් විවිධ ජන කොටස් පීඩනයට දක්වන ප්‍රතික්‍රියා විවිධාකාර ය. යම් සමාජ අසාධාරණයකට හෝ අයුක්තියකට මුහුණ දෙන මනුෂ්‍යා ඇතැම් විට දරුණු ප්‍රචණ්ඩ මානසිකත්වයක් ඇති කර ගනී. ඇතැම් විට පුරුෂාර්ථ හා වටිනාකම් මුළුමනින් ම විකුණා දමා නෝංජලයෙක් වේ. තවත් සමහර විටක තමා අසාධාරණයට ලක් වූ ආකාරයෙන් ම අනුන්ටත් අසාධාරණයක් කරමැ යි තීරණය කර තමා පෙළනු ලැබූ ආකාරයෙන් අනුන් පෙළීමට කටයුතු කරයි. ඇතැම් විට තමා පිළිගන්නා වටිනාකම් හා පුරුෂාර්ථ ඇති පරිසරයක් සොයමින් දැනට සිටින පරිසරය හැර යයි. තවත් සමහර විට තමා පිළිබඳ ව ම නො සැහීමට පත් ව හෝ අනුන් පිළිබඳ ක්‍රෝධයෙන් තමාගේ ජීවිතය විනාශ කර ගැනීමෙන් වුව ද ප්‍රතික්‍රියා දක්වයි.

> සමාජ - ආර්ථික ඉදිරි ගමන සඳහා සම්පත් පොම්ප කිරීම, ආධාර ලබා දීම ආදිය හුදෙක් තාවකාලික ප්‍රතිකර්ම පමණි. ශ්‍රී ලාංකික ජන සමාජය පසුගාමී ව තිබෙන්නේ ප්‍රධාන වශයෙන් ම චර්යා මූලික කරුණු මත නිසා චර්යාවෙහි වෙනසක් සිදු කර ගන්නා තුරු ගැටලු විසඳා ගැනීම හා අවස්ථාවලින් නිසි ප්‍රයෝජන ගැනීම දින නියමයකින් තොර ව කල් දැමීමට සිදු ව ඇත්තේ ය.

අප මෙතෙක් සාකච්ඡා කරමින් සිටියේ සමාජ සජීවීකරණයක් සඳහා පාදක වන ගැටලු මොනවා ද යන ප්‍රශ්නය සඳහා විවිධ ක්ෂේත්‍රවලට

අයත් වියතුන් විසින් දෙන ලද පිළිතුරු හා ඒ පිළිතුරු තුළින් මතු වූ අතුරු මාතෘකාවන් කීපය කි. 1980 ගණන්වල අග භාගයේ මෙ රට සිදු වූ තරුණ කැරැල්ල පදනම් කොට ගෙන රජය විසින් පත් කළා වූ වියත් මණ්ඩලයේ නිර්දේශවල ද, මේ සමීක්ෂණයෙන් ලැබූ තොරතුරුවල ද ඉතා ආසන්න සමීපතාවක් තිබේ. සමීක්ෂණයේ තොරතුරුවල හා වියත් මණ්ඩලයේ නිර්දේශවල සමීපතාවෙන් ප්‍රධාන කරුණු දෙකක් තහවුරු වෙයි. ඉන් පළමුවැන්න නම් එදා වියත් මණ්ඩලය විසින් ගවේෂණය කොට හෙළිදරව් කරනු ලැබුවා වූ සත්‍යතාවන් සමීක්ෂණ තොරතුරු මඟින් නැවත නැවතත් සැබෑ සමාජ යථාර්ථය වශයෙන් තහවුරු වීම යි. දෙවැන්න 1980 ගණන්වල අග භාගයේ මෙරට පැවතියා යයි පෙන්වා දෙනු ලැබූ සමාජ අසාධාරණය ඒ සෙයින් ම හෝ ඊටත් වඩා වැඩි මට්ටමකින් අදත් පවතින බව යි.

සමාජ සජීවීකරණයක අවශ්‍යතාව තහවුරු කිරීම සඳහා මේ පරිච්ඡේදය තුළ ගොනු කරනු ලැබූ තොරතුරු ඉදිරි පරිච්ඡේදයේ සාකච්ඡා සඳහා දැන් සම්පිණ්ඩනය කරමු. මේ පරිච්ඡේදය තුළ ගොනු කරන ලද තොරතුරු ප්‍රධාන තේමා දෙකක් මත දිග හරිනු ලැබිණ. පළමු තේමාව මඟින් ගැටලු හා අවස්ථා පැහැදිලි කිරීමත්, ශ්‍රී ලාංකික ජන සමාජය මුහුණ දෙන ගැටලු හා අවස්ථා හඳුනා ගැනීමත් සිදු විය. දෙවැනි තේමාව තුළ සමාජ සජීවීකරණයක් සඳහා පාදක වන ගැටලු සොයා බැලීම සඳහා කතුවරයා කරන ලද තොරතුරු රැස් කිරීම විමර්ශනය කෙරිණ. පළමු තේමාව නිර්වචනාත්මක පැහැදිලි කිරීම් සඳහා ද දෙවැනි තේමාව විස්තරාත්මක කරුණු ඉදිරිපත් කිරීම සඳහා ද යොදා ගනු ලැබිණ. සමාජ සජීවීකරණයේ පාදක ගැටලු තේරුම් ගැනීම සඳහා පාඨකයාට වඩා වැදගත් වන්නේ දෙවැනි තේමාව වූ විස්තරාත්මක ඉදිරිපත් කිරීම ය. විස්තරාත්මක ඉදිරිපත් කිරීමෙහි අන්තර්ගත කරුණු අනු ව සමාජ සජීවීකරණයේ ප්‍රධාන බාධකයන් වන්නේ දේශපාලන බල ලෝභය හා බැඳුනු අගතිගාමීත්වය, පරායත්ත මානසිකය, ඍණාත්මක ආකල්ප, අකාර්යක්ෂම රාජ්‍ය නිලධාරි තන්ත්‍රය, අසාර්ථක සැලසුම්, දුර්වල නායකත්වය, ප්‍රජාතන්ත්‍ර විරෝධී පාලනය, අන්ධානුකරණය, පිරිහුණු ආචාර ධර්ම, සම්පත් හිඟකම, අයහපත් සම්පත් කළමනාකරණය

ඇතුළු එම බාධක වටා ගොනු වී ඇති වෙනත් අතුරු බාධක ය. මේ අනු ව ශ්‍රී ලාංකික ජන සමාජයේ පසුගාමීත්වයට හේතු වී ඇති කරුණු වලින් සම්පත් හිඟකම වැනි ද්‍රව්‍ය මූලික කරුණු හැරුණු විට අනෙක් සියලු ම කරුණු චර්යා මූලික කරුණු ය. වෙනත් වචන වලින් කිව හොත් පුද්ගල හා සමාජ චර්යාව වෙනස් කිරීම මත වලක්වා ගත හැකි කරුණු ය. මේ නිසා සජීවීකරණ ක්‍රියාමාර්ගයන් හි දී දැඩි අවධානයක් යොමු කළ යුතු ව ඇත්තේ පුද්ගල හා සමාජ චර්යාව වෙනස් කිරීම සඳහා බව පැහැදිලි ය. දිළින්දන් සඳහා පමණක් ඉලක්ක වී ඇති ජනසවිය, සමෘද්ධි වැනි සජීවීකරණ වැඩසටහන් වලින් බලාපොරොත්තු වන්නේ ද දිළින්දන් තුළ මුල් බැස ගෙන ඇති චර්යා රටාවන් වන උදාසීනත්වය, බයාදුකම, නියාලුකම, අවිශ්වාසය, හීනමානය, යැපුම් මානසිකය වැනි චර්යා රටා වෙනස් කිරීම ය. මේ නිසා දිළින්දන් සුවිශේෂ කොට සලකා බැලුවත්, සමස්ත සමාජය එකක් වශයෙන් ගෙන බැලුවත් ප්‍රධානතම පරිවර්තනය විය යුතු ව ඇත්තේ මිනිස් චර්යාවෙහි ය. සමාජ - ආර්ථික ඉදිරි ගමන සඳහා සම්පත් පොම්ප කිරීම, ආධාර ලබා දීම ආදිය හුදෙක් තාවකාලික ප්‍රතිකර්ම පමණි. ශ්‍රී ලාංකික ජන සමාජය ප්‍රතිගාමී ව තිබෙන්නේ ප්‍රධාන වශයෙන් ම චර්යා මූලික කරුණු මත නිසා චර්යාවෙහි වෙනසක් සිදු කර ගන්නා තුරු ගැටලු විසඳා ගැනීම හා අවස්ථාවලින් නිසි ප්‍රයෝජන ගැනීම දින නියමයකින් තොර ව කල් දැමීමට සිදු ව ඇත්තේ ය. යම් දිනෙක පාලකයන් ගේ හා පාලිතයන් ගේ චර්යාව වෙනස් වන්නේ ද එදින සිට ගැටලු විසඳීමත්, අවස්ථා නිසි පරිදි ප්‍රයෝජන ගැනීමත් සිදු වන්නේ ය. එතෙක් සිදු වන්නේ එක ම ගැටලු පද්ධතියක් වටා කර කැවෙමින්, ඒවා පෝෂණය කරවමින්, ඒවාට අලුත් පාර්ශ්ව කරුවන් ඇතුළත් කරවමින් ගැටලු අර්බුද තත්ත්වයන් දක්වා පරිවර්තනය කර වීම පමණි.

# 3 පරිච්ඡේදය

## ශ්‍රී ලාංකිකයන්ගේ සමාජ චර්යාව

ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනයෙහි ප්‍රධානතම බාධාව වන්නේ ජනතාවගේ චර්යාව බව දෙවැනි පරිච්ඡේදය තුළ දී හෙළිදරව් කරනු ලැබිණ. සම්පත්, ප්‍රාග්ධනය, තාක්ෂණය, ශිල්ප ඥානය ආදියෙහි පවත්නා අඩු පාඩු සංවර්ධනයෙහි බාධාවන් වුව ද ඒ සියල්ල අබිබවා සමාජ චර්යාවෙහි පවත්නා දුර්වලකම් ඉස්මතු ව පෙනෙන බවත්, සමාජ චර්යාවෙහි වෙනසක් සිදු නො වන තුරු ගැටලු විසඳා ගැනීම හා අවස්ථාවලින් නිසි පරිදි ප්‍රයෝජන ගැනීම දින නියමයකින් තොර ව කල් දැමීමට සිදු ව තිබෙන බවත් දෙවැනි පරිච්ඡේදය මඟින් පෙන්වා දෙනු ලැබිණ. මේ නිසා සමාජ සජීවීකරණය හෙවත් සංවර්ධනයේ පාදක තත්ත්වයන් ගොඩ නැඟීම සඳහා ජනතාවගේ චර්යාව වෙනස් කිරීම අත්‍යවශ්‍ය වන බැවින් ශ්‍රී ලාංකිකයන්ගේ සමාජ චර්යාව පිළිබඳ න්‍යායාත්මක විශ්ලේෂණයක් කිරීම තුන් වැනි පරිච්ඡේදයේ අරමුණ වේ.

මනුෂ්‍යයෝ වනාහි යහපත් හා අයහපත් යයි මනුෂ්‍යයා විසින් ම සම්මත කර ගත්තා වූ චර්යා රටාවලින් යුක්ත වූ සත්ව විශේෂයකි. සත්‍යවාදී බව, අනුන්ට උපකාර වීම, පරාර්ථකාමිත්වය, කෘතවේදිත්වය ආදී අනේක විධ වූ යහපත් යයි සම්මත චර්යා රටාවලින් ද ගුණමකු බව, අලස බව, අනුන්ට නිග්‍රහ කිරීම, බොරුව, රැවටීම ආදී වූ අයහපත් යයි සම්මත චර්යා රටාවලින් ද උන්ගේ චර්යාව සමන්විත ය. යහපත් සහ අයහපත් යයි සම්මත චර්යා රටාවන් ඒ ඒ ජන සමාජවල පිළිගැනීම් අනුව වෙනස් වන නමුදු ශිෂ්ට සම්පන්න යයි කියා ගනු ලබන ජන සමාජ සියල්ල විසින් ම පොදුවේ පිළිගනු ලැබූ යහපත් හා අයහපත් යයි සම්මත චර්යා රටා තිබේ. පොදුවේ ගත් කල සියලු මිනිස් වර්ගයා අඩු වැඩි වශයෙන් මෙකී යහපත් හා අයහපත් යයි සම්මත වූ චර්යා රටාවලින් යුක්ත වන නමුත් ඇතැම් සමාජවල චර්යාවන් හි යම් යම් විශේෂත්වයන් නිරීක්ෂණය කළ හැකි ය. ශ්‍රී ලංකාවේ දකුණේ ජනතාව ආගන්තුක සත්කාරයට

කැමැත්තෝ ය. උතුරේ ජනතාව දැඩි ශික්ෂණයකින් යුක්ත වූවා හු ය. ජපන් ජාතිකයෝ කාර්ය ශූර ය. ඊශ්‍රායල් ජාතිකයෝ දැඩි අධිෂ්ඨාන ශක්තියක් ඇත්තෝ ය. එංගලන්ත වැසියෝ සම්ප්‍රදාය ගරු කරන්නෝ ය. මෙවැනි මත වාදයන් ගොඩ නැගී ඇත්තේ සුවිශේෂ චර්යා රටාවන් ඇතැම් ජන සමාජවලින් ප්‍රකට ව ප්‍රදර්ශනය වන බැවිනි. ජන සමාජවල සුවිශේෂ චර්යා රටා පැහැදිලි කිරීම සඳහා උදාහරණ ඉදිරිපත් කිරීමේ දී කතුවරයා යහපත් යයි සම්මත චර්යා රටා පමණක් යොදා ගනු ලැබුව ද අයහපත් චර්යා රටා විශේෂ ලක්ෂණ කර ගත්තා වූ ජන සමාජයන් ද තිබෙන බව අමතක කළ යුතු නැත.

> මනුෂ්‍යයෝ වනාහි යහපත් හා අයහපත් යයි මනුෂ්‍යයා විසින් ම සම්මත කර ගත්තා වූ චර්යා රටාවලින් යුක්ත වූ සත්ව විශේෂයකි. සත්‍යවාදී බව, අනුන්ට උපකාර වීම, පරාර්ථකාමීත්වය, කෘතවේදීත්වය ආදී අනේක විධ වූ යහපත් යයි සම්මත චර්යා රටාවලින් ද ගුණමකු බව, අලස බව, අනුන්ට නිග්‍රහ කිරීම, බොරුව, රැවටීම ආදී වූ අයහපත් යයි සම්මත චර්යා රටාවලින් ද උන්ගේ චර්යාව සමන්විත ය.

මෙම ග්‍රන්ථයේ දෙවැනි පරිච්ඡේදය මගින් නිශ්චය කළ පරිදි යම් ජන සමාජයක සමාජ ආර්ථික ඉදිරි ගමනේ වේගය තීරණය කරනු ලබන ප්‍රධාන සාධකයක් වන්නේ එම ජන සමාජයේ චර්යා රටාවෝ ය. 1950 ගණන් වලදී නැගෙනහිර ආසියානුවන් වූ ඉන්දුනීසියානුවන්, සිංගප්පූරු ජාතිකයන් සහ මැලේසියානුවන්ගේ සමාජ ආර්ථික මට්ටම එවකට ශ්‍රී ලංකාවේ පැවති සමාජ ආර්ථික මට්ටමට වඩා පහළින් පැවතිණි. එහෙත් 1980 ගණන් වන විට ඔව්හු නො සිතූ විරූ සමාජ ආර්ථික දියුණුවක් ඇති කර ගත් හ. නැගෙනහිර ආසියානුවන් ලැබූ තීව්‍ර සමාජ ආර්ථික දියුණුවටත්, ශ්‍රී ලාංකිකයන් ලැබූ මන්දගාමී දියුණුවටත් ඒ ඒ ජාතීන්ගේ චර්යා රටා ප්‍රධාන වශයෙන් බලපාන ලද බව සාක්ෂි සහිත ව සනාථ කළ හැකි ය. ශ්‍රී ලාංකිකයන්ගේ අශීඝ්‍ර ඉදිරි ගමනට ඔවුන්ගේ චර්යා රටා ප්‍රබල ලෙස දායක වූ බව ලජ්ජාවෙන් වුව ද පිළිගත යුතු ය. දේශපාලන, ආර්ථික ස්ථාවරත්වයක් මෙරට ඇති නො වූයේත්, රටේ පැවති සමාජ ආර්ථික ගැටලු අර්බුද තත්ත්වයන් දක්වා වර්ධනය වූයේත් ශ්‍රී ලාංකිකයන්ගේ අගතිගාමී, අවස්ථාවාදී හා අවිචාරවත් චර්යා රටා නිසා බව පිළිගත යුතු ව තිබේ.

එක් මනුෂ්‍යයකුගේ චර්යාවට වඩා තවත් මනුෂ්‍යයකුගේ චර්යාව වෙනස් ය. එමෙන්ම එක් සමාජයක චර්යාව තවත් සමාජයක චර්යාවට වඩා වෙනස් ය. ඇතැම් හු වෙනස් වන ලෝකය සමඟ ශීඝ්‍ර වේගයකින් වෙනස් වෙති. ඇතැම් හු එල්බ ගත් යමෙක එල්බ සිටීමට දැඩි කැමැත්තක් දක්වමින් වෙනස්කම් ප්‍රතික්ෂේප කරති (Wrightsman,1994). සමාජයෝ ද මෙසේ ම ය. ඉතා පුළුල් ලෙස ගත් විට මනුෂ්‍යයන්ගේ චර්යාවන් පිළිබඳ ව කෙරෙන විශ්ලේෂණ ප්‍රධාන ප්‍රවේශයන් දෙකක් මත සිදු වේ. ඉන් එකක් නම් නොමැතැටික් ප්‍රවේශය (Nomothetic Approach) හෙවත් සමස්ත මනුෂ්‍ය වර්ගයාගේ චර්යාව තීන්දු කරන පොදු සාධක සොයා බැලීමේ ප්‍රවේශය යි. අනෙක ඉඩිඔග්‍රැපික් ප්‍රවේශය (Idiographic Approach) හෙවත් පුද්ගලයන්ගේ හෝ සමාජයක සුවිශේෂතා තීන්දු කරනු ලබන සුවිශේෂ සාධක සොයා බැලීමේ ප්‍රවේශය යි (Cohler, 1993).

> නැගෙනහිර ආසියානුවන් ලැබූ තීව්‍ර සමාජ ආර්ථික දියුණුවටත්, ශ්‍රී ලාංකිකයන් ලැබූ මන්දගාමී දියුණුවටත් ඒ ඒ ජාතීන්ගේ චර්යා රටා ප්‍රධාන වශයෙන් බලපාන ලද බව සාක්ෂි සහිත ව සනාථ කළ හැකි ය. ශ්‍රී ලාංකිකයන්ගේ මන්දගාමී ඉදිරි ගමනට ඔවුන්ගේ චර්යා රටා ප්‍රබල ලෙස දායක වූ බව ලජ්ජාවෙන් වුව ද පිළිගත යුතු ය. දේශපාලන, ආර්ථික ස්ථාවරත්වයක් මෙරට ඇති නො වූයේත්, රටේ පැවති සමාජ ආර්ථික ගැටලු අර්බුද තත්ත්වයන් දක්වා වර්ධනය වූයේත් ශ්‍රී ලාංකිකයන්ගේ අගතිගාමී, අවස්ථාවාදී හා අවිචාර සහගත චර්යා රටා නිසා බව පිළිගත යුතු ව තිබේ.

යමෙකුගේ චර්යාව, පුද්ගලිකත්වය හෝ පෞරුෂය තීරණය කිරීමෙහි ලා ජීව විද්‍යාත්මක, හෝ ජාන විශේෂිත පරම්පරාගත සාධකය ඉතා වැදගත් යයි ඇතැමෙක් තර්ක කරති. එහෙත් පුද්ගල චර්යාව තීරණය කිරීමෙහි ලා ස්වභාවික විද්‍යාවන් වන ජීව විද්‍යාව හෝ ජාන විද්‍යාවේ එන පරම්පරා සාධකයට වඩා වැඩි වැදගත් කමක් ඇත්තේ සමාජ විද්‍යාවේ එන පරම්පරා සාධකයට බව තවත් අය තර්ක කරති. පරම්පරාව යන වචනය ජීව විද්‍යාව හා ජාන විද්‍යාව අර්ථ දක්වන ආකාරයත් සමාජ විද්‍යාව අර්ථ දක්වන ආකාරයත් අතර ප්‍රබල වෙනසක් ඇත. තවත් අය තර්ක කරන්නේ ජාන විද්‍යාවේ එන පරම්පරා සාධකයටත්, සමාජ විද්‍යාවේ එන පරම්පරා සාධකයටත් වඩා මිනිසා ජීවත් වන පරිසර සාධකය චර්යාව තීරණය කිරීමෙහි ලා තීරණාත්මක බව යි. කෙසේ වෙතත් චර්යාව තීන්දු කිරීමෙහි ලා

ප්‍රධාන වන සාධක පිළිබඳ ව ඔවුන් අතර පිළිගත් සම්මුතියක් නැත. කතුවරයාගේ තේරුම් ගැනීම අනු ව මේ මතවාදයන් සියල්ලෙහි ම ප්‍රබල සත්‍යතාවන් තිබේ. එක් මත වාදයක් අනෙක විසින් පරාජය කළ නො හැකි ය. මනුෂ්‍යයාගේ චර්යාව බොහෝ අවස්ථාවල පරිසරය විසින් ද, තවත් සමහර විටෙක ජීව විද්‍යාත්මක වූ , ජාන විශේෂිත පරම්පරා ගත ලක්ෂණ විසින් ද තවත් විටෙක සමාජ විද්‍යානුකූල පරම්පරා ගත ලක්ෂණ විසින් ද තවත් සමහර විටෙක ජීවවිද්‍යාත්මක පරම්පරා සාධකය, සමාජ විද්‍යාත්මක පරම්පරා සාධකය සහ පරිසරය යන සාධක සියල්ලෙහි ම ප්‍රතිඵලයක් වශයෙන් ද තීරණය වේ.

මනුෂ්‍යයන්ගේ චර්යාව පිළිබඳ ව සාකච්ඡා කරන ප්‍රධාන චර්යා විද්‍යා විෂයයන් (Behavioural sciences) ගණනාව කි. ඒ අතර සමාජ විද්‍යාව, මානව විද්‍යාව, මනෝ විද්‍යාව, සමාජ මනෝ විද්‍යාව, ජාන මනෝ විද්‍යාව, ආර්ථික විද්‍යාව, අධ්‍යාපන විද්‍යාව හා අධ්‍යාපන විද්‍යාවේ සුවිශේෂ විෂය පථයක් වන පුහුණු ක්‍රම වේදය ප්‍රධාන ය. මේ එක් එක් විෂයයන් තුළ මනුෂ්‍ය චර්යාව විග්‍රහ කිරීම ඒ ඒ විෂයයන්ට සුවිශේෂ වූ ප්‍රවේශයන් මත සිදු වේ. එහෙත් ඉතා පුළුල් ලෙස ගත් විට බොහෝ චර්යා විද්‍යාවන් තුළ චර්යාව විග්‍රහ කිරීමේ මූලික සිද්ධාන්තමය පදනම වන්නේ එස්ඕආර් (SOR) රීතියයි. S යනු stimuli හෙවත් උත්තේජකයයි. O යනු Organism හෙවත් ජීවියායි. R යනු Response හෙවත් ජීවියාගේ ප්‍රතික්‍රියාව යි. මෙම සරළ රීතියෙන් ප්‍රකාශ කරන්නේ කිසියම් උත්තේජකයක් සමඟ ජීවියකු ගැටීම නිසා උත්තේජනය වන ජීවියා උත්තේජකයට සාපේක්ෂ ව යම් ප්‍රතික්‍රියාවක් ප්‍රදර්ශනය කරන බව යි. මනෝ විද්‍යාව, ආර්ථික විද්‍යාව, සමාජ විද්‍යාව ආදී ඕනෑම චර්යා විද්‍යා විෂයයක් තුළ පමණක් නො ව සතුන්ගේ චර්යාවන් විස්තර කරන විෂයයන් තුළ ද මේ පොදු රීතිය මූලධර්මයක් වශයෙන් අනුගත ව තිබේ.

යම් හුදකලා චර්යාවක් මූලධර්ම වශයෙන් තේරුම් ගැනීම සඳහා (SOR) රීතිය ප්‍රමාණවත් වන නමුත් කිසියම් සංකීර්ණ ජන සමාජයක සමාජ චර්යාව අර්ථ දැක්වීම සඳහා (SOR) රීතිය ප්‍රමාණවත් නො වේ. මේ නිසා මේ ග්‍රන්ථය තුළ ශ්‍රී ලංකා ජන සමාජයේ චර්යාව

විස්තර කිරීම සඳහා පුහුණු ක්‍රම වේදය ඇතුළු චර්යා විද්‍යා විෂයයන් ගණනාවකින් උකහා ගනු ලැබූ හරයන් සංග්‍රහිත කොට තැනූ නව ප්‍රවේශයක් ඉදිරිපත් කරනු ලැබේ (පෙරේරා, 1992). ප්‍රමාණවත් තොරතුරු පදනමක් තිබේ නම් මෙම ප්‍රවේශය මගින් ඕනෑම ජන සමාජයක චර්යාව සම්බන්ධ ව අර්ථ දැක්විය හැකි ය. එහෙත් මේ ග්‍රන්ථය තුළ දී නව ප්‍රවේශය භාවිතයට යොදවන්නේ ශ්‍රී ලාංකික ජන සමාජයේ චර්යාව විස්තර කිරීම සඳහා ගොනු කරනු ලබන තොරතුරු මත බැවින් ග්‍රන්ථයේ විශේෂ සාකච්ඡාවට භාජන වන්නේ ශ්‍රී ලාංකිකයන්ගේ චර්යාව ය. විශේෂයෙන් ම බහුතරයක් වූ සිංහලයන්ගේ චර්යාව ය.

මේ පරිච්ඡේදයේ මතු දැක්වෙන සියලු තොරතුරු ඉදිරිපත් වන්නේ නව ප්‍රවේශය මත ශ්‍රී ලාංකිකයන්ගේ සමාජ චර්යාව විශ්ලේෂණය කිරීම සඳහා ය. එබැවින් පරිච්ඡේදයේ පෙළ ගැසෙන ඉදිරි තොරතුරු සියල්ල සංග්‍රහිත කොට නව ප්‍රවේශයේ න්‍යායාත්මක පදනම ප්‍රථමයෙන් ඉදිරිපත් කොට දෙවනුව ප්‍රවේශය තහවුරු කරන විස්තරාත්මක සාකච්ඡාවට පිවිසීම සුදුසු ය. මේ නිසා ප්‍රවේශය කුමක් ද යන්නත් එහි අන්තර්ගත හරය කුමක් ද යන්නත් ප්‍රථමයෙන් සාරාංශ කර දක්වමු.

නව ප්‍රවේශයේ තර්කනය පදනම් දෙකකින් යුතු ය. ඉන් පළමුවැනි පදනම එස්රෝ (ESRO) නමින් දැක්වෙන මනුෂ්‍ය චර්යාව තීරණය කරනු ලබන්නා වූ නියත සාධක ය. දෙවැන්න කැප් (KAP) නමින් දැක්වෙන මනුෂ්‍ය චර්යාව තීරණය කරනු ලබන විචල්‍ය සාධක ය. ප්‍රවේශය පදනම් ව ඇති තර්කනයට අනුව මනුෂ්‍යයාගේ චර්යාව වෙනස් කිරීම සඳහා කෙටි කාලය තුළ දී ගත හැකි ක්‍රියා මාර්ග මෙන් ම දිගු කාලය තුළ දී ගත හැකි ක්‍රියා මාර්ග ද ඇත. වෙනත් ආකාරයකින් කිවහොත් මනුෂ්‍ය චර්යාව තීන්දු වන්නේ විචල්‍යයන් කීපයකින් හා නියතයන් කීපයකින් සැදී සාධක ගණනාවක් මගිනි.

## චර්යා ශ්‍රිතය

මනුෂ්‍ය චර්යාව බෙහෙවින් සංකීර්ණ ය. එහෙත් එකී සංකීර්ණ තත්ත්වයන් පහසුවෙන් තේරුම් ගැනීම සඳහා චර්යාව තීරණය කරනු

ලබන වියුක්ත ස්වභාවයකින් යුතු සාධක ගණනාවක් සංයුක්ත කිරීමෙන් චර්යා ශ්‍රිතයක් (Behaviour Function) හෙවත් චර්යාව හා එහි සාධක අතර සම්බන්ධතාවක් ගොඩ නැඟිය හැකි ය. චර්යාව හා සම්බන්ධ සංකීර්ණ වූ කරුණු රාශියක් තේරුම් ගැනීම සඳහා මේ සරල ගොනු කිරීම අපට උපකාර වේ. ඉතා සරල ව ගත් විට චර්යා ශ්‍රිතය නම් වූ මනුෂ්‍ය චර්යාව හෙළිදරව් කරන සමීකරණයේ සාධක මෙසේ ලියා දැක්විය හැකි ය.

B = E,S,R,O, f ( K,A,P)

B = Behaviour (චර්යාව)
E = Environment (භෞතික පරිසරය)
S = Social setting (සමාජ පසුබිම)
R = Resources (සම්පත්)
O = Origin (සම්භවය)
K = Knowledge (දැනුම)
A = Attitudes(ආකල්ප)
P = Practice (හැකියාව)

මනුෂ්‍යයාගේ චර්යාව හා ඊට බලපාන සාධක මෙවැනි ගණිතමය සමීකරණයක් මගින් ලියනු ලැබුව ද එය ගණිත ගැටලුවක් සේ සැලකිය යුතු නැත. මෙම සරල ගණිත ප්‍රකාශනය මගින් පිටු ගණනක් තුළ ඉදිරියේ දී විස්තර වන බොහෝ දේ සංයුක්ත කොට ලිවිය හැකි නිසා මෙසේ ලියා දැක්වීමි.

මේ ශ්‍රිතයෙන් පෙන්වන සමීකරණයේ සමාන ලකුණට වම් පස ඇති ඉංග්‍රීසි B (Behaviour) අකුරෙන් සංකේතවත් කරන්නේ වැඩිහිටි මනුෂ්‍යයාගේ චර්යාව යි. සමාන ලකුණින් දකුණු පස ලියා ඇති E,S යනාදී වූ සංකේත වලින් දැක්වෙන සාධක මගින් B නම් වූ මනුෂ්‍ය චර්යාවේ ස්වභාවය තීරණය වන බව අදහස් වේ. මේ නිසා E,S යනාදී සංකේතයෝ චර්යාව තීන්දු කරනු ලබන සාධකයෝ වෙති. මේ සමීකරණයේ සාධක වර්ග දෙකකි. E,S,R,O නම් වූ නියත සාධක (Constants) හා වරහන් ඇතුලත ඇති K,A,P නම් වූ විචල්‍ය

සාධක ය (Variables). නියත සාධක යන්නෙන් කෙටි කාලයේ දී වෙනස් නො වන්නේ ය, යන තේරුම ගෙන දෙන අතර විචල්‍ය සාධක යන්නෙන් කෙටි කාලයේ දී වෙනස් කිරීමට හැකි ය යන තේරුම ගෙන දේ. ඕනෑම නියත සාධකයක් දිගු කාලයේ දී විචල්‍යය කි. මේ නිසා නියත යන වචනයෙන් හඳුන්වනු ලැබුව ද දිගු කාලය සම්බන්ධයෙන් බලන විට මේ සමීකරණයේ තිබෙන කිසිදු සාධකයක් නියත නැත. f යනු සාධකයක් නො වේ. f නම් වූ සංකේතයෙන් කියැවෙන්නේ වරහන් තුළ ඇති K,A,P නම් වූ විචල්‍යයන් නිසා B නම් වූ චර්යාව නිරතුරු ව වෙනස් කළ හැකි බව යි.

දැන් අපි ඒ ඒ සංකේත වලින් දැක්වෙන සාධක වෙන වෙන ම හඳුනා ගනිමු. E (Environment) යනු මිනිසා ජීවත් වන භෞතික පරිසරය සංකේතවත් කිරීමට යෙදූ ඉංග්‍රීසි අකුර කි. භෞතික පරිසරය ලෙස හැඳින්වෙන්නේ මනුෂ්‍යයා ජීවත් වන පරිසරයේ ඇත්තා වූ ගහ කොළ, භූමිය, කඳු, ගංගා, යනාදී වූ ද්‍රව්‍ය පදනම් වූ පරිසරය යි. ඇස්කිමෝවරුන්ගේ චර්යාව තීරණය කිරීම සඳහා ඔවුන් ජීවත් වන භෞතික පරිසරය ද, පිග්මි වරුන්ගේ චර්යාව තීරණය කිරීමට ඔවුන් ජීවත් වන පරිසරය ද හේතු වන බව ඉතා පැහැදිලි ය.

S (Social Setting) යනු සමාජ පසුබිම යි. S නම් වූ සමාජ පසුබිමෙන් මිනිස් වටිනාකම්, ආගම්, සංස්කෘතිය, දේශපාලනය, සමාජය පිළිගත් නීතිය, ජාති , කුල, සමාජ ආයතන යනාදී නොයෙකුත් සමාජ ලක්ෂණ නියෝජනය වෙයි. ඒ ඒ සමාජවලට ආවේණික වූ විශේෂ චර්යා රටාවන් නිර්ණය වීමට S හෙවත් සමාජ පසුබිම් සාධකයෙන් සිදු වන බලපෑම ඉමහත් ය. හින්දුන් ගේ සමාජ පසුබිම නිසා ඔවුන් ගව මස් අනුභව නො කිරීම ද, අප්‍රිකානු ගෝත්‍රික ජනතාවගේ සමාජ පසුබිම නිසා ඔවුන් තමන්ගේ ගෝත්‍රය හෙළිදරව් වන පරිදි හංවඩු ගසා ගැනීම ද සමාජ පසුබිමෙන් වූ බලපෑම් ය. අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට අසමත් වීම හේතුවක් ලෙස සලකා ජපානයේ දේශපාලන නායකයන් තම තනතුරු හැර යාම ද, අරමුණු කිසිවක් ඉටු කළ නො හැකි වුව ද ශ්‍රී ලාංකික දේශපාලකයන් ඒ තනතුරුවල ම රැඳී සිටීම ද ඒ ඒ රටවල් පිළිගත් සමාජ වටිනාකම් මගින් නිශ්චය කරනු ලැබූ චර්යාව ය. මේ නිසා සමාජ පසුබිම නිසා ද මනුෂ්‍යයා

ගේ චර්යාව තීන්දු වන බව ඉතා පැහැදිලි ය.

R (Resources) නම් වූ සංකේතයෙන් පුද්ගලයෙකු හෝ සමාජයක් සතු සම්පත් එනම් මිල මුදල්, ඉඩකඩම්, ණය පහසුකම් ආදී සම්පත් පදනම නියෝජනය වන අතර, O (Origin) යනුවෙන් දැක්වෙන්නේ සම්භවය හෙවත් යම් මනුෂ්‍යයෙකු හෝ යම් ජන කොටසක් තුළ ඇතැයි පිළිගනු ලබන පරම්පරාගත ආවේණික ලක්ෂණයන් ය. මීට අමතර ව 'සහජය' යනුවෙන් හඳුන්වනු ලබන ගති ලක්ෂණ ද මීට ඇතුලත් ය. ශ්‍රී ලාංකිකයන්ගේ, විශේෂයෙන් සිංහලයන් ගේ චර්යාවට හේතු විය හැකි O හෙවත් සම්භව සාධකය එනම්, පරම්පරාව, ආරය, ආදී නිසග ලක්ෂණ පිළිබඳ ව මෙතෙක් පරීක්ෂණ මට්ටමෙන් හෝ යටත් පිරිසෙයින් නිරීක්ෂණ මට්ටමින් හෝ ප්‍රමාණවත් විශ්ලේෂණයක් සිදු වී නැත. මෙම ග්‍රන්ථය තුළින් ශ්‍රී ලාංකික ජන සමාජයේ O සාධකය පිළිබඳ යම් යම් නිරීක්ෂණ තොරතුරු ඉදිරියේ දී සාකච්ඡාවට භාජනය කරනු ඇත.

ඉහත ගොඩනගන ලද චර්යාශ්‍රිතයෙහි වරහන් ඇතුළත ඇති විචල්‍යයන් දෙස දැන් අවධානය යොමු කරමු. වරහන් තුළ ඇති K (Knowledge) නම් වූ සංකේතයෙන් දැනුම යන්න ද, A (Attitudes) නම් වූ සංකේතයෙන් ආකල්ප යන්න ද, P (Practice) නම් වූ සංකේතයෙන් හැකියාවන් යන්න ද අදහස් වේ. P නම් වූ සංකේතය S (Skills) වශයෙන් ද ඇතැම් පොත පතෙහි දක්වා ඇත) .

මේ අනුව

B=E,S,R,O,f (K,A,P)

නම් සමස්ත ප්‍රකාශයේ ඉතා සරල අදහස වන්නේ, දැනුම, ආකල්ප හා කුසලතා නම් වූ ත්‍රිවිධ විචල්‍යයන් වෙනස් කිරීම මගින් මනුෂ්‍යයන්ගේ චර්යාව වෙනස් කළ හැකි බවත් ඒ වෙනස් වීම් දෙන ලද තත්ත්වයන් සේ සැලකෙන භෞතික පරිසරය , සමාජ පසුබිම, සම්පත් හා සම්භවය ආදී නියතයන්ගේ බලපෑමට හා ගැලපීමට හසු ව නැවතත් හැඩ ගැසෙන බවක් ය.

අධ්‍යාපන විද්‍යාව හෝ වැඩිහිටි පුහුණු ක්‍රම වේදය පිළිබඳ ව දළ අදහසක් ඇති පාඨකයන් මේ සමීකරණය ඉතා පහසුවෙන් අවබෝධ කර ගනු ඇත. මන්ද? (KAP) හෙවත් පුහුණු යෙදවුම් මේ සමීකරණයේ විචල්‍ය සාධක වශයෙන් ඉදිරිපත් කර ඇති බැවිනි. වැඩිහිටි මනුෂ්‍යයන්ගේ චර්යාව වෙනස් කිරීම පිළිබඳ ව සාකච්ඡා කෙරෙන වැඩිහිටි පුහුණු ක්‍රම වේදය ට අනුව ඕනෑ ම පුහුණුවකින් කරන්නේ මනුෂ්‍යයාගේ චර්යාව වෙනස් කිරීම ය. චර්යාව වෙනස් වන්නේ පුහුණු යෙදවුම් නිසා ය. පුහුණු යෙදවුම් යනු නව දැනුම, නව හැකියා හා නව ආකල්ප ය (පෙරේරා, 1992) .

මේ පරිච්ඡේදයේ මතු සාකච්ඡා කරනු ලබන මනුෂ්‍යයාගේ චර්යාව නිර්නය කරන්නා වූ වියුක්ත හා සංකීර්ණ සාධක සංයුක්ත හා සරල සාධක සේ පරිවර්තනය කොට ගණිතමය ප්‍රකාශයක් බවට පත් කිරීම මගින් ඉතා පැහැදිලි නිගමන දෙකකට පැමිණිය හැකි ය. ඉන් පළමුවැනි නිගමනය නම් ඕනෑම සමාජයක ජීවත් වන පුද්ගලයන්ගේ චර්යාව යම් සැලසුමක් මත වෙනස් කිරීමට ඉඩකඩක් තිබෙන බව යි. එනම් මනුෂ්‍යයන් උදෙසා නව දැනුම ලබා දීමෙන් ද, ඔවුන්ගේ ආකල්ප වෙනස් කිරීමෙන් ද, හැකියාවන් වැඩිදියුණු කිරීමෙන් ද, (විචල්‍ය සාධක චලනය කිරීම මගින්) දැනට තිබෙන චර්යාව වෙනස් කළ හැකි බව යි. ' f ' නම් වූ සංකේතයෙන් පෙන්වන පරිදි මනුෂ්‍ය චර්යාව සමඟ මෙකී ත්‍රිවිධ සාධක ශ්‍රිතික සම්බන්ධතාවක් පවත්වා ගනී. වෙනත් වචනවලින් කිවහොත් දැනුම, ආකල්ප හා හැකියාවන් මාධ්‍ය කොට ගෙන මනුෂ්‍යයන්ගේ චර්යාව අපේක්ෂිත අරමුණක් ඉටු කර ගැනීම සඳහා සැලසුම් සහගත ව වෙනස් කළ හැකි ය.

දෙවැනි නිගමනය නම් සමස්තය තුළ සිදු වන වෙනසකින් තොර ව යම් අංශයක් තුළ පමණක් සිදු වන වෙනසකින් සාර්ථක ප්‍රතිඵල ලැබීමට බාධා තිබෙන බව යි. තව දුරටත් පැහැදිලි කරන්නේ නම් යම් මනුෂ්‍ය කොට්ඨාශයක දැනුම, ආකල්ප හා හැකියාව යන සාධක ත්‍රිත්වයෙහි වෙනසක් කළ පමණින් ඒ මනුෂ්‍ය කොට්ඨාශයේ චර්යාව වෙනස් වීමේ සහතිකයක් නැති බව යි. මන්ද? E,S යනාදී වූ කෙටි කාලයේ දී වෙනස් කිරීමට අපහසු නියතයන් ගේ තත්ත්වය මත අලුතින් ඇති කරන ලද වෙනස පවත්වාගෙන යා හැකි ද? නො හැකි ද?

යන්න තීන්දු වන නිසා ය.

ඇතැම් විට KAP නම් වූ විචල්‍ය සාධකයන් මගින් ඇති කරනු ලබන්නා වූ වෙනස තව දුරටත් තහවුරු කිරීමේ සාධනීය සාධක සේ නියත සාධක පැවතිය හැකි ය. තවත් සමහර විටෙක එහි විලෝමය සේ පැවතිය හැකි ය. එනම් KAP වෙනස් කිරීම නිසා සිදු වන මනුෂ්‍ය චර්යාවේ වෙනස් වීම මුළුමනින් නිෂේධනය කරන තත්ත්වයක් හෝ ආපසු හැරවීමේ තත්ත්වයක් නියත සාධක තුළ තිබිය හැකි ය.

පොදුවේ ගත් විට මනුෂ්‍යයෝ චර්යාව වෙනස් කිරීම කෙරෙහි එක්තරා ප්‍රතිරෝධයක් (Resistance) දක්වති. එය මනුෂ්‍ය චර්යාවේ ස්වභාවයකි (Wrightsman, 1994). ඇතැම් ජන සමාජ වෙනස් වීමට දැඩි ප්‍රතිරෝධයක් දක්වන අතර ඇතැම් ජන සමාජ දක්වන ප්‍රතිරෝධය එතරම් දැඩි නො වේ. කෙසේ වෙතත් ප්‍රතිරෝධය සාමාන්‍ය තත්ත්වය කි. මනුෂ්‍යා තුළ පවත්නා වූ මෙම ස්වභාවික ප්‍රතිරෝධය එසේ ම පැවතෙද්දී E,S යනාදී වූ නියත සාධක වලින් ද ප්‍රතිරෝධ පැමිණුනහොත් මනුෂ්‍යයන් තුළ චර්යා වෙනසක් ඇති වන්නේ ම නැත. මේ නිසා සමාජ සජීවීකරණයක් කළ යුතු නම් මනුෂ්‍ය චර්යාව වෙනස් කිරීමට හේතු වන නියත සාධක කෙරෙහි ද විශේෂ අවධානයක් යොමු කළ යුතු ය. සමස්ත සමාජයෙහි ඇති ප්‍රතිරෝධතා නො සලකා හරිමින් ඉලක්ක ගත ජන කොටසක් වෙත පමණක් යොමු වීම ඵලදායී නො වන බව පළමු පරිච්ඡේදයේ සිට ම පෙන්වා දුන්නේ මේ තර්කය මත ය.

> සමාජ පසුබිම තීරණය කිරීමට බලපාන්නා වූ කරුණු වලින් බොහොමයක් අතීතයේ දී මනුෂ්‍යා විසින් ම නිර්මාණය කරනු ලැබූ සමාජ මෙවලම් ය. මනුෂ්‍යයා විසින් යම් සමාජ මෙවලමක් නිර්මාණයක් කරනු ලැබූ විට එනම්, ආගමක්. කුලයක්. ගෝත්‍රයක්, පංතියක්, සිරිතක් ,විරිතක්, නීතියක්, රීතියක් හෝ වෙනත් වටිනාකමක් නිර්මාණය කළ විට එකී නිර්මාණය විසින් නැවත මනුෂ්‍යයා පාලනය කිරීමට පටන් ගනී.

## මනුෂ්‍ය චර්යාව සම්බන්ධ දෙන ලද තත්ත්වයන් හෙවත් නියත සාධක

ශ්‍රී ලාංකික ජන සමාජයේ චර්යාව තීරණය වීම සම්බන්ධයෙන් ඉහත කී නියත සාධක හෙවත් එස්රෝ (ESRO) බලපාන්නේ කෙසේ දැ යි විමසා බලමු. යම් පුද්ගලයෙකුගේ හෝ ජන සමාජයක චර්යාව වෙනස් කිරීමෙහි ලා සාධනීය හෝ නිශේධනීය වශයෙන් බලපානු ලබන ප්‍රධාන නියත සාධකයන් හතරක් ඇති බව ඉහත පෙන්වා දුනිමු. මෙම සාධකයන් නියත ලෙස පවතින්නේ කෙටි කාලයක් තුළ දී පමණක් බැවින් ඒවා දිගු කාලයේ දී නියත වශයෙන් නො පවතින බව ද පෙන්වා දුනිමු. දිගු කාලයේ දී ඒවා නියත නො වන්නේ එම සාධක දිගු කාලයේ දී අවශ්‍යයෙන් ම වෙනස් වන බැවිනි. නැතහොත් වෙනස් කළ හැකි බැවිනි.

## භෞතික පරිසර නියතය

සමාජ චර්යා ශ්‍රිතයේ සඳහන් E නම් වූ නියතයෙන් මිනිසා ජීවත් වන භෞතික පරිසරය නියෝජනය කරයි. මීට පෙර කීවාක් මෙන් මනුෂ්‍යාගේ චර්යාව තීරණය කිරීමෙහි ලා ඔවුන් ජීවත් වන භෞතික පරිසරයෙන් වන බලපෑම දෙන ලද තත්ත්වයක් වශයෙන් පවතින බව E වලින් කියැවේ. තම දිවි පෙවෙත පවත්වා ගෙන යාම සඳහා ජීවිතය පරදුවට තබා මහ මුහුද සමඟ පොර බදන වෙරළබඩ ජනතාවගේ චර්යාව තුළ ද, ඈත පිටිසර කුරහන් හේනකින් යැපෙමින් නිස්කලංක ව ජීවත් වන හේන් ගොවියෙක්ගේ චර්යාව තුළ ද හඳුනා ගත හැකි චර්යා වෙනස්කම් ඇත. ඔවුන්ගේ චර්යාවේ පවත්නා වෙනස්කම් ඔවුන් ජීවත් වන භෞතික පරිසරය සමඟ දැඩි ව බැඳී ඇති බව සරල නිරීක්ෂණයකින් වුව ද වටහා ගත හැකි ය. E බොහෝ දුරට අනම්‍ය සාධකයකි. මේ නිසා E මගින් නිශ්චය කරන්නා වූ චර්යා රටා වෙනස් කිරීම ද ඉතා අපහසු ය. උදාහරණ වශයෙන් ඇස්කිමෝවරුන් මාංශ භක්ෂණයෙන් තොර ජනතාවක් බවට පත් කිරීම කළ නො හැකි තරමේ පරිවර්තනයක් ය. මන්ද? වෘක්ෂලතාදිය හිඟ ප්‍රදේශවල ජීවත් වන මිනිසුන්ගේ ආහාර පුරුදු සෘජු ලෙස ම ඔවුන් ජීවත් වන භෞතික පරිසරයේ ඇති සත්ව සම්පත් සමඟ දැඩි සම්බන්ධතාවක් දක්වන බැවිනි. භෞතික පරිසර නියතය බොහෝ දුරට ස්ථිතික ස්වභාවයක් දරණ බැවින් E සාධකය සම්බන්ධයෙන් සාකච්ඡා කළ

යුතු දෑ සීමා සහිත ය. මේ නිසා E සාධකය පිළිබඳ පැහැදිලි කිරීම මෙතෙකින් නතර කොට චර්යා ශ්‍රිතයෙහි සමාජ පසුබිම් නියතය පිළිබඳ ව අවධානය යොමු කරමු.

> දිළිඳු ජනතාව ඒකරාශි කොට ඔවුන් සංවිධානය කිරීම, බල ගැන්වීම සඳහා පසුගිය දශක කීපය තුළ ක්‍රියාවේ යොදවන ලද අභ්‍යාස සංඛ්‍යාව ගණනය කළ හොත් සිය ගණනකි. වැය කළ පිරිවැය රුපියල් කෝටි ගණනකි. නියුක්ත වූ ශ්‍රම සමුදාය ලක්ෂ ගණනකි. විවිධ රාජ්‍ය සංවිධාන විසින් ද, රාජ්‍ය නො වන සංවිධාන විසින් ද, ජාත්‍යන්තර සංවිධාන වල අනුග්‍රහය සහිතව ද දියත් කරනු ලැබූ මෙම සද් ව්‍යාපාර ඉතා නොබෝ දිනකින් S (සමාජ පසුබිම ) විසින් ආපස්සට හරවා යවනු ලැබී ය.

## සමාජ පසුබිම් නියතය

සමාජ චර්යා විශ්ලේෂණය සඳහා ඉදිරිපත් කළ නව ප්‍රවේශයෙහි දැක්වූ චර්යා ශ්‍රිතයෙහි දෙවැනි නියත සාධකය S හෙවත් සමාජ පසුබිම් නියතය යි. S වශයෙන් සංකේතවත් වන සමාජ පසුබිම E තරම් දැඩි ස්වභාවයක් දරන්නේ නැත. S තීරණය කිරීමෙහි ලා ඇතැම් විට E සාධකයේ සම්බන්ධයක් තිබිය හැකි ය. එහෙත් S හෙවත් සමාජ පසුබිමේ පදනම බොහෝ දුරට E වලින් නිදහස් ය.

සමාජ පසුබිම තීරණය කිරීමට බලපාන්නා වූ කරුණු වලින් බොහොමයක් අතීතයේ දී මනුෂ්‍යයා විසින් ම නිර්මාණය කරනු ලැබූ සමාජ මෙවලම් ය. මනුෂ්‍යයා විසින් යම් සමාජ මෙවලමක් නිර්මාණයක් කරනු ලැබූ විට එනම්, ආගමක්. කුලයක්. ගෝත්‍රයක්, පංතියක්, සිරිතක්, විරිතක්, නීතියක්, රීතියක් හෝ වෙනත් වටිනාකමක් නිර්මාණය කළ විට එකී නිර්මාණය විසින් නැවත මනුෂ්‍යයා පාලනය කිරීමට පටන් ගනී. මේ නිසා මනුෂ්‍යයා විසින් ම තමා සඳහා අතීතයේ නිර්මාණය කරන ලද තත්වයෝ ද දෙන ලද තත්ත්වයන් හෙවත් නියත තත්ත්වයන් වශයෙන් සැලකෙත්.

> සමාජ සජීවිකරණය සඳහා බලධාරීන්ට, නිලධාරීන්ට, විද්වතුන්ට, කළාකරුවන්ට කළ හැකි මෙහෙය ඉතා විශාල ය. මෙතෙක් ලබා ඇති අත්දැකීම් අනුව පෙනී යන්නේ දිළින්දන් තුළ පමණක් එනම්, එක් සමාජ ස්ථරයක් තුළ පමණක් පරිවර්තනයක් කිරීමට උත්සාහ දැරීම ඵල නො දරණ උත්සාහයක් බව ය

ශ්‍රී ලාංකිකයන්ගේ සමාජ පසුබිම තීරණය කිරීමෙහි ලා ඔවුන්ගේ සමාජ චාරිත්‍රකම්, ආගම්, විශ්වාස, ඇදහිලි, සිරිත් විරිත් හා නීති රීති, සමාජ සංස්ථා, කුල, ජාති, සමාජ පංති, (බල පන්ති, කුල පන්ති, නිල පන්ති හා ආදායම් පන්ති) ආදී විවිධාකාර වූ සමාජ නිර්මාණ හේතු වන බව පැහැදිලි ය. මේ නිසා චර්යා ශ්‍රිතයේ S නම් වූ නියත සාධකය සමාජයේ ඉහත කී සියලු අවයවයන් විසින් නිශ්චය කරනු ලැබුවා වූ පොදු සාධකයක් සේ පවතී. වෙනත් ආකාරයකින් කිව හොත් චර්යා ශ්‍රිතයේ සඳහන් S නම් වූ සාධකය තුළ සමාජ ඒකකයේ අනුගතයන් වන සියලුම සමාජ පංති, ස්ථර සහ ආයතන මගින් වූ බලපෑම සංග්‍රහිත ලෙස ගැබ් ව පවතී. තවත් ආකාරයකින් කිව හොත් එය සමාජ ඒකකයේ පොදු සාධකයකි. එබැවින් සමාජය නම් ඒකකය නිර්මාණය කරනු ලැබුවා වූ අවයවවලින් එක් අවයවයක් ඉවත් කොට ගෙන එනම්, එක් බල පංතියක්, ආදායම් පංතියක් හෝ කුල පංතියක් තුළ පමණක් චර්යා වෙනසක් ඇති කිරීමට අරමුණු කල ද ඒ වෙනස සමඟ නියත S (සමාජ පසුබිම) ප්‍රතිරෝධයන් ඇති කර ගනී නම් වෙනස පවත්වා ගෙන යා නො හැකි ය. මන්ද? නව වෙනස චිරස්ථායී කිරීමට S සාධකයේ අනුග්‍රහය අත්‍යවශ්‍ය වන බැවිනි.

න්‍යාය හෝ තර්කය පසෙක තැබුව ද ශ්‍රී ලංකාවේ අත්දැකීම්වලින් තහවුරු වන සත්‍යය ද මෙය ම ය. දිළිඳු ජනතාව ඒකරාශී කොට ඔවුන් සංවිධානය කිරීම, බල ගැන්වීම සඳහා පසුගිය දශක කීපය තුළ ක්‍රියාවේ යොදවන ලද අභ්‍යාස සංඛ්‍යාව ගණනය කළහොත් සිය ගණනකි. වැය කළ පිරිවැය රුපියල් කෝටි ගණනකි. නියුක්ත වූ ශ්‍රම හමුදාව ලක්ෂ ගණනකි. විවිධ රාජ්‍ය සංවිධාන විසින් ද, රාජ්‍ය නො වන සංවිධාන විසින් ද, ජාත්‍යන්තර සංවිධාන වල අනුග්‍රහය සහිත ව ද දියත් කරනු ලැබූ මේ සද් ව්‍යාපාර නොබෝ දිනකින් S (සමාජ පසුබිම) විසින් ආපස්සට හරවා යවනු ලැබී ය. නැත හොත් නිශේධනය කරනු ලැබී ය. මන්ද? චර්යා ශ්‍රිතය තුළ තීන්දු වී ඇති S යෝග්‍ය වූයේ පරිවර්තනය පිළිගැනීමකට නො ව ප්‍රතික්ෂේප කිරීමකට නිසා ය.

ඉදිරියට යාම සඳහා කළ යුතු ව ඇත්තේ එකඟ වීම, එකඟ නො වීම හා එකඟ නො වීමට එකඟ වීම යන අවස්ථා තුනෙන් එකඟ නො වීමට එකඟ වීම ය. එනම්, මනුෂ්‍යත්වයේ නාමයෙන් අයහපත අයහපතක් ලෙස තේරුම් ගැනීමට එකඟ වීම ය. එවැනි එකඟතාවක් ඇති වුවහොත් අයහපතින් මිදීම දෙවනු ව කළ හැකි වේ.

සමාජ පසුබිමේ බලපෑම ප්‍රකාශිත වන S නම් වූ නියතය තේරුම් ගැනීමේ දී කල්පනාවට ගත යුතු ඉතා වැදගත් කරුණක් තිබේ. එනම් S යනු සියලු ජන කොටස් මඟින් පොදුවේ අනුමත කරන ලද තත්ත්වයක් බව යි. සමාජ සංස්ථාවේ එක් අවයවයකට (කුල පංතියකට, බල පංතියකට හෝ වෙනත් පංතියකට) S සාධකයට කළ හැකි බලපෑම ඉතා අල්ප ය. එහෙත් අවයව කීපයක් එක්වුව හොත් S සඳහා කළ හැකි බලපෑම අධික ය. වෙනත් අයුරකින් කිව හොත් පවත්නා සමාජ පසුබිම හෙවත් S සාධකය යම් සමාජ පංතියකට අසාධාරණයක් වන පරිදි තීන්දු වී තුබුණ ද එකී අසාධාරණයට ලක් වූ පංතිය ඇතුළත් සමස්ත සමාජය විසින් S අනුමත කොට ඇති තාක් කල් පරිවර්තනයක් කිරීම උගහට ය. උදාහරණ වශයෙන් ගත හොත් කුල ක්‍රමය නිසා කුල හීන පංතිවලට අසාධාරණයක් හා අවැඩක් වුව ද කුල ක්‍රමය සමාජ වටිනාකමක් වශයෙන් සමස්තය පිළිගනු ලබන තාක් කල් කුල ක්‍රමයේ අසාධාරණයෙන් මිදීම අපහසු ය.

වහලා තමා වහලෙකු යයි සමාජයේ අනෙකුත් කොටස් හා එක් ව පිළිගනු ලබන්නේ ද, දුබලයා තමා දුබලයකු යයි සමාජයේ අනෙකුත් කොටස් හා එක් ව පිළිගනු ලබන්නේ ද, ඔව්හු නිරන්තරයෙන් වහලුන් හෝ දුබලයන් වනු ඇත. වහලා වහලකු නො වන්නේ යයි සමාජයේ අනෙකුත් කොටස් හා එක්ව පිළිගනු ලබන්නේ ද, දුබලයා දුබලයකු නො වේ යයි සමාජයේ අනෙකුත් කොටස් හා එක් ව පිළිගනු ලබන්නේ ද ඔව්හු තව දුරටත් වහල්ලු හෝ දුබලයන් නො වනු ඇත. වහලා වහලකු නො වේ යයි ඔහු පමණක් හිතන්නේ ද, දුබලයා දුබලයකු නො වන්නේ යයි ඔහු පමණක් හිතන්නේ ද සමාජ හැලහැප්පීමක් ඇරඹෙයි. මෙහිදී වහලාට හෝ දුබලයාට S වෙනස් කිරීම සඳහා ආධිපත්‍ය පැතිර විය හැකි නම් (බොහෝ විට විප්ලවීය ස්වභාවයක්) ඔවුන්ගේ සිතුවිල්ල එ පරිදි ම ඉටු වේ. එහෙත් S ප්‍රබල නම් වහලුන් හා දුබලයන් ඔවුන් සිටි සමාජ ස්ථරයන්ට ම නැවත පලවා හරිනු ඇත.

- ශ්‍රී ලාංකිකයන්ගේ බහුතරය එක්කෝ ශ්‍රේෂ්ඨ වූත්, ප්‍රෞඩ වූත් , මානව හිතවාදී වූත් වටිනාකම් හා සිතුම් පැතුම් ඇති ඉදිරිගාමී ජනතාවක් විය යුතු ය. නැතහොත් අලසකම, අකාර්යක්ෂමකම ආදිය මූලික ලක්ෂණ කර ගත් පසුගාමී ජනතාවක් විය යුතු ය.

- වර්තමාන ශ්‍රී ලාංකිකයාට ඇත්තේ නිර්වචනය නො කරන ලද ශ්‍රේෂ්ඨත්වයක් හා ප්‍රෞඩත්වය කි.

- වර්තමාන සිංහලයා නොක්ස් සඳහන් කරන අර්ථයෙන් උසස් නැත. හැදියාවක් නැත. ශ්‍රේෂ්ඨ නැත. නොක්ස් අද ජීවත්ව සිටියා නම් ඔහු එදා කී ප්‍රකාශය අද ලියනු ඇත්තේ මෙසේ ය. ' සිංහලයන් තුළ හැදියාවක් නැත. ඔවුහු මත් පැන් බොති. අන්සතු දේ සොරකම් කරති.' යනුවෙනි.

ශ්‍රී ලංකාවේ සමාජ පසුබිම පිළිබඳ ව විශේෂ වශයෙන් සලකා බැලූ විට එය ඉතා සිත්ගන්නා සුලු මාතෘකාවකි. ජනතාවගේ විශ්වාස, සිතුම් පැතුම්, වටිනාකම්, සිරිත් විරිත්, නීති රීති, ආගම්, ජාති පදනම්, කුල පදනම් ආයතන ආදී සියල්ල ඇතුළත් වන්නේ සමාජ පසුබිමට ය. එබැවින් සමාජ සජීවීකරණ අභ්‍යාසවල අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීම සඳහා අත්‍යවශ්‍යයෙන් ම කළ යුතු එක් කාර්යයක් වන්නේ කෙටි කාලයේ දී නියතයක් සේ පවත්නා වූ සමාජ පසුබිම නම් වූ සාධකය නියත ස්වභාවයෙන් ඉවත් කර ගැනීම ය.

සමාජ පසුබිමෙහි පරිවර්තනයක් ඇති කිරීම සඳහා සමාජයේ අනුගතයන් වන විවිධ ස්ථර වලින් සහාය අවශ්‍ය වෙයි. මෙහි දී බලධාරීන්ට, නිලධාරීන්ට, විද්වතුන්ට, කලාකරුවන්ට කළ හැකි මෙහෙය ඉතා විශාල ය. මෙතෙක් ලබා ඇති අත්දැකීම් අනුව පෙනී යන්නේ දිළින්දන් තුළ පමණක් එනම්, එක් සමාජ ස්ථරයක් තුළ පමණක් පරිවර්තනයක් කිරීමට උත්සාහ දැරීම ඵල නො දරණ උත්සාහයක් බව යි. වඩා වැදගත් වන්නේ සමස්තය තුළ සිදු වන පරිවර්තනය යි. සමාජ පරිසරය සකස් වී ඇත්තේ මනුෂ්‍යා විසින් ම තමා උදෙසා අතීතයේ දී නිර්මාණය කරන ලද සමාජ මෙවලම් මත බැවින් සමාජ ඉදිරි ගමනට උර දෙන මෙවලම් හා උර නො දෙන මෙවලම් තෝරා බේරා ගෙන නුසුදුසු මෙවලම් අවලංගු කර දැමීමට ද, අවශ්‍ය නම් ඉදිරි ගමනට දායක වන නව මෙවලම් නිර්මාණය කිරීමට ද සාමූහික ව කටයුතු කිරීම අවශ්‍ය වේ. සුදුසු, නුසුදුසු මෙවලම් තෝරා බේරා ගැනීම පිළිබඳ ව සමාජයේ සියලු තරාතිරම් වලින් එක

සමාන එකඟතාවක් ඇති වීමට බාධා තිබිය හැකි ය. මේ බාධා ප්‍රධාන කරුණු දෙකක් නිසා මතු වේ. ඉන් පළමුවැන්න නම් සියලු සමාජ ස්ථර එක සමාන ආකාරයකින් කල්පනා නො කිරීම යි. උදාහරණ වශයෙන් එක් සමාජ ස්ථරයක් තුළ ක්‍රමය පවත්වා ගෙන යාමට පක්ෂ විය හැකි අතර තවත් ස්ථරයක් තුළ ක්‍රමයට විරුද්ධ විය හැකි ය. අනෙක් කාරණය නම් යම් ජන සමාජයක අනන්‍යතාව නො කඩවා ආරක්ෂා කර ගනිමින් ඔවුනොවුන්ගේ සුවිශේෂතා ව පවත්වා ගෙන යන්නේ සමාජ පසුබිම මගින් නිසා (S සාධකය මගින් නිසා) සමාජ පසුබිම වෙනස් කොට අනන්‍යතාව බිඳ ගැනීමට මනුෂ්‍යයන් තුළ ඇති අකැමැත්ත යි. උදාහරණ වශයෙන් සිංහලයෝ එදා ද කැවුම් කෑවෝ ය. අද ද කැවුම් කති. ඔව්හු එදා ද නැකත අනුව කටයුතු කළෝ ය. අද ද එසේ ය. ඔවුන්ගේ විවාහ එදා සිදු වූයේ ද කුලය පදනම් කරගෙන ය. අද ද සිදුවන්නේ කුලය මත ය. මේ නිසා කැවුම්, නැකත, කුලය, සිංහල ජනතාවගේ අනන්‍යතාවෝ ය. කැවුම්, නැකත, කුලය නැති තැන සිංහල අනන්‍යතාව නැත. මේ ආදී කරුණු නිසා සමාජ සංස්ථාවේ සියලු ස්ථර වලට S වෙනස් කිරීම සඳහා එක සමාන එකඟතාවකට පැමිණීම තරමක් අපහසු ය. මේ නිසා වඩාත් ප්‍රායෝගික වන්නේ එකඟ නො වීමට හැකි තැන් තෝරා බේරා ගෙන එකඟ නො වීමට එකඟ වීම යි. වෙනත් ආකාරයකින් කිවහොත් එකඟ වීම, එකඟ නො වීම හා එකඟ නො වීමට එකඟ වීම යන අවස්ථා තුනෙන් එකඟ නො වීමට එකඟ වීම ය. එනම්, මනුෂ්‍යත්වයේ නාමයෙන් අයහපත අයහපතක් ලෙස තේරුම් ගැනීමට එකඟ වීම ය. එවැනි එකඟතාවක් ඇති වුවහොත් අයහපතින් මිදීම දෙවනුව කළ හැකි බැවිනි. මේ එකඟතාව සමාජ සජීවිකරණයට අඩිතාලම සකස් කරනු ඇත.

> වර්තමාන ශ්‍රී ලාංකිකයන්ගේ චර්යාව පිළිබඳ ව විමසා බැලීම සඳහා වැඩි වැඩියෙන් එබී බැලිය යුත්තේ මෑත යුගයේ ඉතිහාසයට ය. මක් නිසාද? ඔවුන් ආසන්න සම්බන්ධකම් පවත්වන්නේ මෑත යුගයේ පැවති අඳුරු ඉතිහාසය සමඟ මිස ඈත යුගයේ පැවති දියුණු ඉතිහාසය සමඟ නො වන බැවිනි. වර්තමාන ශ්‍රී ලාංකිකයෝ ඉපැරණි ආර්ථික ක්‍රමෝපායන්ට වත්, ඉපැරණි තාක්ෂණයට වත්, එකළ පැවති මිනිස් වටිනාකම් හා සාරධර්මවලට වත් නැකම් නො කියන බැවිනි.

ශ්‍රී ලාංකික මනුෂ්‍යයාගේ සමාජ පසුබිම මත තීන්දු වී ඇති චර්යාව සම්බන්ධයෙන් ඔවුන්ගෙන් ම කරුණු විමසුව හොත් බහුතර ජනතාවක් කියනු ඇත්තේ ඉතා ශ්‍රේෂ්ඨ වූ ද, ගම්භීර වූ ද, මානව හිතවාදී වූ ද සමාජ වටිනාකම් හා සිතුම් පැතුම් පද්ධතියක් විසින් ඔවුන්ගේ ජන සමාජයේ චර්යාව මෙහෙයවනු ලබන බව යි. එහෙත් ඒ සමඟ ම මෙහි විලෝමය ද ඇතැමුන් කියනු ලැබේ. එනම් ශ්‍රී ලාංකික පොදු ජනතාවගේ චර්යාව තුළ බයාදුකම, නියාලුකම, අවිශ්වාසය, ප්‍රතිගාමිත්වය, අලසකම, අකාර්යක්ෂමකම ආදිය පැහැදිලි ව පෙනෙන්නට තිබෙන බව ය. සමාජ සජීවීකරණයක් යෝජනා වන්නේ මේ පිළිගැනීම මත ය. එක ම ජන සමාජයක් පිළිබඳ ව එක ම අවස්ථාවක පරස්පර විරෝධී පිළිගැනීම් දෙකක් තහවුරු කළ නො හැකි ය. මේ නිසා ශ්‍රී ලාංකිකයන්ගේ බහුතරය එක්කෝ ශ්‍රේෂ්ඨ වූත්, ප්‍රෞඪ වූත් , මානව හිතවාදී වූත් වටිනාකම් හා සිතුම් පැතුම් ඇති ඉදිරිගාමී ජනතාවක් විය යුතු ය. නැතහොත් අලසකම, අකාර්යක්ෂමකම ආදිය මූලික ලක්ෂණ කර ගත් ප්‍රතිගාමී ජනතාවක් විය යුතු ය. කෙසේ වෙතත් මේ පිළිගැනීම් දෙක එකිනෙක සමඟ සැසඳීම තරමක් අපහසු ය. මන්ද? අලසකම, අකාර්යක්ෂමකම, ආදී වචනවලට පැහැදිලි තේරුම් ඇතත් ශ්‍රේෂ්ඨකම, ප්‍රෞඪත්වය ආදී වචනවල තේරුම් අපැහැදිලි බැවිනි. ශ්‍රේෂ්ඨත්වය යනු කුමක් දැයි හරි හැටි නිර්වචන නො කළ විට යම් ජන කොටසක් ශ්‍රේෂ්ඨ නො වන්නේ යැයි කවරෙකුටවත් තර්ක කළ නො හැකි ය. මේ නිසා වර්තමාන ශ්‍රී ලාංකිකයාට ඇත්තේ නිර්වචනය නො කරන ලද ශ්‍රේෂ්ඨත්වයක් හා ප්‍රෞඪත්වයකි.

දෙවැනි රාජසිංහ රජු දවස ලංකාවේ ජීවත් වූ ඉංග්‍රිසි ජාතික රොබට් නොක්ස් ඔහුගේ තොරතුරු වාර්තාවේ අවස්ථා කීපයක ම සඳහන් කර තුබුයේ ඔහු දුටු සිංහලයන් මනා හැදියාවක් ඇති මනුෂ්‍යයන් බව යි. ඔහු හැදියාව යන්නෙන් අදහස් කලේ කුමක් ද යන්න ඔහුගේ වාර්තාවේ ම විස්තර කර තිබේ.'සිංහලයෝ පිරිසිදුකම ඉහළින් අගය කරති. මුහුණ කට සෝදා ගැනීමෙන් පසු ව පමණක් ආහාර අනුභව කරති. උන් අනුන්ගේ දේවල් සොරා ගන්නේ නැත. මත් පැන් බොන්නේ ද නැත. තම නිවසට පැමිණෙන දේශීය මෙන් ම විදේශීය අමුත්තන්ට සංග්‍රහ කිරීමට ද සිංහලයෝ බොහෝ මනාප ය.' (Knox,

1681 83-104). නොක්ස් සඳහන් කළ හැදියාව, ශිෂ්ඨ සම්පන්නකම හෝ ශ්‍රේෂ්ඨකම කුමක් ද යන්න මේ ප්‍රකාශවලින් ඉතා පැහැදිලි ය. එහෙත් නොක්ස් සඳහන් කරන අර්ථයෙන් වර්තමාන සිංහලයා උසස් ජන කොටසක් ව සිටී ද යන්න අප විසින් ම නිශ්චය කළ යුතු ව තිබේ. නොක්ස් අද ජීවත් ව සිටියා නම් එකල ඔහු ලියූ ප්‍රකාශය පහත ආකාරයෙන් නො ලියනු ඇතැයි කාට නම් කිව හැකි ද? 'සිංහලයන් තුළ හැදියාවක් නැත. ඔව්හු පිරිසිදුකම නො සලකා හරිති. මත් පැන් බොති. අන්සතු දේ සොරකම් කරති.' මෙ පමණකින් ඔහු නො නැවතී තවත් කරුණු ගණනාවක් පිළිබඳ ව ලියනු ඇත. ඒ සියල්ල සිංහලයා තුළ හැදියාවක් හෝ ශ්‍රේෂ්ඨකමක් නො මැති බව කීමට ලියන කරුණු විනා ශ්‍රේෂ්ඨත්වයක් ඇති බව කීමට ලියන කරුණු නම් විය නො හැකි ය

ශ්‍රී ලාංකිකයන්ට දියුණු ඉතිහාසයක් මෙන් ම නො දියුණු ඉතිහාසයක් ද තිබූ බව පැහැදිලි ය.

යම් ජන සමාජයක් ඒ ජන සමාජයේ සාමාජිකයන් විසින් ම ශ්‍රේෂ්ඨ යයි කියා ගනු ලැබීම ශ්‍රී ලාංකිකයන් වෙතින් පමණක් ප්‍රදර්ශනය වන ගති ලක්ෂණයක් නො වේ. ලෝකයේ ඕනෑ ම රටක, ජාතියක, ගෝත්‍රයක කල්පනාව වන්නේ, යම් හේතුවක් මත ඔවුන් මානව සංහතියේ ඉතා ඉහළ මට්ටමක් නියෝජනය කරන්නා වූ ජනතාවක් බව යි. එහෙත් ඔවුනොවුන්ගේ ඇගයුමට අමතර ව ඔවුන් පිළිබඳ ව ඇගයුම් කිරීම පිටස්තරයෙකුට භාර දෙනු ලැබු ව හොත් ලැබෙන ප්‍රතිඵලය මුල් ප්‍රතිඵලයට වඩා බෙහෙවින් වෙනස් වනු ඇත. මන්ද? තමා, තමා ගැන කීමට වඩා උපේක්ෂාවකින් කරුණු කීමට පිටස්තරයෙකුට හැකි වන බැවිනි. මම මගේ අධ්‍යාපන කටයුතුවල නියැලෙමින් සිටි යුගයේ විදේශීය මිතුරන් රාශියක් ඇසුරු කළෙමි. ඔව්හු ලෝකයේ විවිධ ප්‍රදේශ, විවිධ සංස්කෘති හා විවිධ ජාතීන් නියෝජනය කරනු ලැබූ අය වූහ. යුරෝපීයයෝ ද, අප්‍රිකානුවෝ ද, ආසියානුවෝ ද, ලතින් ඇමරිකානුවෝ ද, රතු ඉන්දියානුවෝ ද මේ අතර වූහ. දියුණු යයි තමා විසින් ම නිර්දේශ කර ගනු ලැබූ යුරෝපීයයන් ගේ සිට සම්මත මිමි අනුව නො දියුණු යයි ප්‍රකාශිත රතු ඉන්දියානුවන් දක්වා වූ සියලුම මිතුරන්ට තමාගේ ශ්‍රේෂ්ඨත්වය අන් අයට තහවුරු කරවීමේ කතාවක් තිබිණි. මට ද එසේම ය. මට

මෙන් ම ඔවුන්ට ද ඔවුන්ගේ ශ්‍රේෂ්ඨත්වය තහවුරු කිරීමේ සාධක ද තිබිණි. මේ නිසා තම තමන් ගැන ම කියා ගනු ලබන ඇගයුම් තමන්ට ම මිස අන් අයට නො වන බව වටහා ගැනීමට තරම් අවබෝධ ඥානයක් තිබීම සජීවිකරණය වීමේ එක් මූලික අවශ්‍යතාව කි. ශ්‍රී ලාංකිකයන් වශයෙන් අපට නැත්තේ ද මේ අවබෝධ ඥානය ය.

සිංහල රාජාවලිය තුල රට එක්සේසත් කොට ආර්ථික සමෘද්ධිය ලබා කර දිය හැකි වූ රජවරු සිටියේ අතලොස්සක් පමණි. බොහෝ සිංහල රජවරු කමකට නැති රජවරු ය. ඔවුන් රජ වූයේ රජ පවුලට අයත් වූවන් නිසා මිස රජකම් කිරීමේ හැකි කම් තිබූ නිසා නො වේ.

අප දැන් සාකච්ජා කරමින් සිටින්නේ වැඩිහිටි මනුෂ්‍යයන් හා සම්බන්ධ චර්යාශ්‍රිතයේ දෙන ලද තත්ත්වයන් හෙවත් නියතයන් පිළිබඳ ව ය. ඉනුත් පරිසර නියතයන් පිළිබඳ ව ය. පරිසර නියතයන්හි වඩා වැදගත් සාධකය වන S හෙවත් සමාජ පසුබිම් නියතය පිළිබඳ ව ය. වෙනත් වචන වලින් කිව හොත් මනුෂ්‍යා විසින් ම තමා වෙනුවෙන් අතීතයේ දී නිපදවන ලද සමාජ මෙවලම් මගින් ඔවුන් නැවත පාලනය වීම සිදු වන්නේ කෙසේ ද යන්න පිළිබඳ ව ය. ශ්‍රී ලාංකිකයන් විසින් තමා වෙනුවෙන් සකස් කර ගෙන ඇති සමාජ පසුබිම නැවත ඔවුන්ගේ චර්යාව පාලනය කරන ආකාරය විස්තරාත්මක ව එමෙන් ම උදාහරණ සහිත ව තව දුරටත් සාකච්ජා කළ යුතු ය. මුලින් කී පරිදි එකඟ නො වීමට එකඟතාවක් ඇති කර ගැනීම සමාජ සජීවිකරණයේ අඩිතාලම බැවින් එකඟ නො වීම ට එකඟ විය හැකි තැන් විවරණය වන්නේ මෙවැනි සාකච්ජාවක් තුළිනි. මේ නිසා ශ්‍රී ලාංකිකයන්ගේ, විශේෂයෙන් සිංහලයන්ගේ චර්යාව සමාජ පසුබිම සමඟ බැඳී ඇති ආකාරය විවරණය කිරීම සඳහා ඓතිහාසික තොරතුරු පදනම් කර ගත් පුළුල් සාකච්ජාවක් අරඹමු.

'මේ දිවයින අතීතයේ දී දසලක්ෂ පහක් හෝ හයක් පමණ වූ ජන සංඛ්‍යාවක් ජීවත් වූ ජනාකීර්ණ දිවයිනක් ව තිබී ඇත. එකල නිෂ්පාදනය කළ සහලින් ඔවුන් ද පෝෂණය වී ඉන්දියානු කොරමැන්ඩල් වෙරළ සිට තවත් බොහෝ ප්‍රදේශයන් ද පෝෂණය කර තිබේ. එහෙත් අද මේ දිවයින තුල තිබෙන්නේ එක් හතරැස් සැතපුමකට කටවල් හතළිහක් පමණ ය. එහෙත් එම කටවල් හතලිහට උවමනා සහල් ද මලබාරයෙන් නො ලැබුනහොත් උන් ද හාමතේ ය' (Sullivan, 1854 P. 200).

## සමාජ පසුබිම හා ජන චර්යාව, ඉතිහාසය හා වර්තමානය

මෙම උප මාතෘකාව යටතේ ඉදිරිපත් කරන තොරතුරු පෙළ ගැස්වීමට පෙර උප මාතෘකාවෙන් අදහස් කරනු ලබන්නේ කුමක් දැයි පැහැදිලි කිරීම අවශ්‍ය වේ. මෙහි 'වර්තමානය' යන වචනයෙන් අදහස් වන්නේ නිදහසින් පසු ශ්‍රී ලංකාව යි. 'ඉතිහාසය' යන වචනයෙන් ඓතිහාසික අවස්ථා දෙකක් ගැනේ. එනම් ඉපැරණි ඉතිහාසය හා මෑත යුගයේ ඉතිසාහය යි. ඉපැරණි ඉතිහාසය යනු අනුරපුර, පොළොන්නරු යුගවලට අයත් ඉතිහාසය යි. මෑත යුගයේ ඉතිහාසය යනුවෙන් මේ ග්‍රන්ථය තුළ සාකච්ඡා වන්නේ නුවර යුගයේ සිට නිදහස ලැබීම දක්වා වූ කාල පරිච්ඡේදයට අයත් ඉතිහාසය යි. මේ නිසා 'ඉතිහාසය' යන වචනය ප්‍රයෝජනයට ගනු ලබන සංදර්භය හා අවස්ථාව අනුව කුමන ඓතිහාසික යුගයක් ඉන් අදහස් කළේ ද යන්න පාඨකයාට පහසුවෙන් තේරුම් ගත හැකි ය.

ඉතිහාසඥයන් හා දෙස් විදෙස් විචාරකයන්ගේ විනිශ්චය මෙන් ම කතුවරයාගේ විනිශ්චය ද වන්නේ ශ්‍රී ලාංකිකයන්ට දියුණු ඉතිහාසයක් මෙන් ම නො දියුණු ඉතිහාසයක් ද පැවති බව යි. වර්තමාන ශ්‍රී ලාංකික ජන සමාජය සම්බන්ධකම් දක්වන්නේ නුවර යුගයේ පැවති නො දියුණු ඉතිහාසයට මිස අදට ශත වර්ෂ විසි ගණනකට පෙර පැවති දියුණු ඉපැරණි ඉතිහාසයට නො වේ. මේ නිසා වර්තමාන ශ්‍රී ලාංකිකයන්ගේ චර්යාව පිළිබඳ ව විමසා බැලීම සඳහා වැඩි වැඩියෙන් එබී බැලිය යුත්තේ මෑත යුගයේ ඉතිහාසයට ය. මක් නිසා ද? වර්තමාන ශ්‍රී ලාංකිකයෝ ඉපැරණි තාක්ෂණයට වත්, ඉපැරණි ආර්ථික ක්‍රමෝපායන්ට වත්, එකල පැවති මිනිස් වටිනාකම් හා සාරධර්මවලට වත් නෑකම් නො කියන බැවිනි. වෙනත් වචනවලින් කිවහොත් වර්තමාන ශ්‍රී ලාංකිකයා නෑකම් කියන්නේ මෑත යුගයේ පැවති අඳුරු ඉතිහාසයට ය. මෑත යුගයේ පැවති නො දියුණු තාක්ෂණයට, නොදියුණු ආර්ථිකයට හා පරිහානියට පත් කලාවට ය. එමෙන් ම මෑත ඉතිහාසයේ ජීවත් වූ මනුෂ්‍යයන් තුළ පැවති පිරිහුනු වටිනාකම් හා සාරධර්මවලට ය.

## පරිහානියට පත් ශ්‍රී ලාංකිකයෝ

ඉපැරණි ශ්‍රී ලාංකික ජන සමාජය පාලනය වූයේ ඒකාධිපති රාජාණ්ඩු ක්‍රම යටතේ ය. ඓතිහාසික සාධකවලට අනුව සිංහල රජවරු මුළුමනින් යහපත් පාලනයක් ගෙන ගිය තැනැත්තන් වශයෙන් හෝ මුළුමනින් අයහපත් පාලනයක් ගෙන ගිය තැනැත්තන් වශයෙන් හැඳින්විය නො හැකි ය. සිංහල රාජ්‍ය පාලන ඉතිහාසය තුළ යහපත් වකවානු මෙන් ම අයහපත් වකවානු ද විය. බුද්ධදාස වැනි සතුන් වෙත පවා මෛත්‍රිය පැතිර වූ රජවරු ද, සංඝබෝධි වැනි රාජ්‍ය අයිතිය දෙවැනි කොට සාමය පළමු කොට සැලකූ රජවරු ද, ගජබා වැනි මහජන සතුට පාලකයාගේ සතුට සේ සැලකූ රජවරු ද, කාශ්‍යප වැනි බල ලෝභය සඳහා පීතෘ ඝාතනයට පෙළඹුණු රජවරු ද, නිශ්ශංක මල්ල වැනි කෙරුවාවට වඩා කයිවාරුව ඉස්මතු කළ රජවරු ද (වැඩි ම සෙල් ලිපි මොහුගේ ය) දුටු ගැමුණු, විජය බා වැනි විදෙස් බල සිඳ රට එක්සේසත් කළ රජවරුද, මහසෙන් පැරකුම් වැනි රට ආර්ථික සමෘද්ධියට පත් කිරීමට කැප වූ රජවරු ද, එමෙන් ම මහජනයාටත් එපා වූ, සංඝයාටත් එපා වූ කමකට නැති රජවරුන්ගෙන් ද සිංහල රාජාවලිය සංගෘහිත වී තිබේ. කෙසේ වෙතත් සමස්තයක් වශයෙන් ගත් විට අනුරාධපුර පොළොන්නරු ඓතිහාසික යුග දේශීය ඉතිහාසයේ කැපී පෙනෙන කාල වකවානු ය. ඉනුත් අනුරාධපුර යුගය සිංහල ඉතිහාසයේ ස්වර්ණමය යුගය සේ පිළිගනු ලැබේ. මක් නිසා ද? ආර්ථිකය, තාක්ෂණය, කලාව ආදී වූ බොහෝ අංගයන්ගෙන් අනෙකුත් යුග පරදවා අනුරාධපුර යුගය ඉස්මතු ව පෙනෙන බැවිනි.

> 'මෙහි වෙහෙර විහාර ආදිය බොහෝ ය. මේවායින් බොහොමයක් ඉතා දුලභ, උත්කෘෂ්ඨ ඝනයේ ඒවා ය. කපන ලද කළු ගලින් සාදා ඇති ඒවා කැටයම් කොට, ප්‍රතිමා තෙලා ඇත. මෙරට ජීවත් වන වැසියන් අඥාන පිරිසක් බැවින් මේ නටඹුන් කවර මනුෂ්‍ය කොටසකට අයත් ඒවා දැයි මට සිතා ගත නො හැකි ය. කෙසේ වෙතත් එකක් කිව හැකි ය. මේවා නිම කර තිබෙන්නේ මෙරට දැනට ජීවත් වන සිංහලයා යයි කියනු ලබන මිනිසුන්ට වඩා බොහෝ කෞශල්‍යයෙන් යුතු, ශිල්පීය ඥානයක් තිබෙන මිනිසුන් කොටසක් විසිනි.'
> (Knox 1681, P. 72).

අද ජීවත් වන දේශීයයෝ මෙන් ම ශ්‍රී ලංකාවට පැමිණෙන බොහෝ විදේශික ජාතීහු ද මෙරට පැවත තිබෙන අති පරිණත ඓතිහාසික

ශිෂ්ඨාචාරය පිළිබඳ ව විස්මයටත්, මවිතයටත් පත් වෙති. එකල ජීවත් වූ ශ්‍රී ලාංකික මනුෂ්‍යයෝ දියුණු තාක්ෂණයක ට හිමිකම් කීවාහු ය. ඔව්හු සූවිසල් මැදුරු තැනුවෝ ය. අහසින් වැටෙන හැම දිය බිඳක් ම ප්‍රයෝජනයට ගැනීමට මහ සැලසූ සූක්ෂම වාරි තාක්ෂණයක් දැන සිටිය හ. එකී තාක්ෂණය පාදක කොට ගෙන දහස් ගණනින් වූ වැව් අමුණු ඉදි කළ හ. වගා කළ හැකි හැම බිමක් ම වගාවට යෙදුවෝ ය. බතින්, බුලතින් ස්වයංපෝෂිත වූහ. සමස්තයක් වශයෙන් ගත් විට ඔව්හු උසස් අධ්‍යාත්මයක් තුබූ මිනිස්සු වූහ. උන් වෙත පැවති සාමය, අස්වැසිල්ල තුළින් ඉස්මතු ව ආ කරුණාව, දයාව වැනි මිනිස් ගුණ මූර්තිමත් කරමින් පිළිම නෙලූ හ. අධ්‍යාත්මයත්, තාක්ෂණයත් සංකලනය කොට විස්මිත දාගැබ්, වෙහෙර නිර්මාණය කළෝ ය. කලා කෘති නිර්මාණය කළෝ ය. ඉපැරණි ශ්‍රී ලාංකිකයෝ සංවර්ධනය යයි අද අප හඳුන්වන දර්ශක බොහොමයකින් පෙන්වන සමාජ - ආර්ථික තත්ත්වයන් ඉක්මවා ඉදිරියෙන් සිටි ජන කොටසක් බවට ප්‍රමාණවත් ඓතිහාසික සාක්ෂි තිබේ.

කෙතරම් ආඩ්‍යමත් ඉතිහාසයක් තුබුව ද මධ්‍යතන යුගය වන විට ශ්‍රී ලාංකිකයෝ එකී ආඩ්‍යමත් සභ්‍යත්වයෙන් පෝෂණය වූ තාක්ෂණයටවත්, ආර්ථිකයකටවත්, හැදියාවටවත් නෑකම් කීවේ නැත. එකල ඔව්හු පිරිහුණු තාක්ෂණයක්, ආර්ථිකයක්, කලාවක් හා හැදියාවක් සහිත ජන සමාජයක් බවට පරිවර්තනය වී සිටියහ. දාහත් වැනි සියවසෙහි මෙරට සංචාරයක යෙදුණු ඉංග්‍රිසි ජාතික එඩ්වඩ් සුලෙයිවාන් වල් බිහි ව තිබූ ඉපැරණි ශ්‍රී විභූතියෙන් විශ්මයට පත් ව ඔහුගේ වාර්තාවේ සඳහන් කර ඇති ප්‍රකාශයෙන් මේ පරිහානිය හොඳින් තේරුම් ගත හැකි ය. එම ප්‍රකාශයේ සිංහල අදහස මෙසේ ය. 'භූමි ප්‍රමාණයෙන් ශ්‍රී ලංකාව තරම් වූ ලෝකයේ කිසිදු රටක් තුළ මෙතරම් සංඛ්‍යාවකින් යුතු වැව් අමුණු දක්නට නැත. ඉන්දියාවේ තිබෙන යෝධ වැව්වලට මේ වැව් කිසිසේත් නො දෙවෙනි ය. මේ වැව් නිර්මාණය සඳහා බොහෝ ඈත සිට ප්‍රවාහනය කරන ලදැ යි සිතිය හැකි විශාල ප්‍රමාණයේ කළුගල් ගෙන එන්නට කොතරම් මිනිස් ශ්‍රමයක් හා දියුණු තාක්ෂණයක් යොදා ගන්නට ඇත් දැයි අදහා ගැනීම අපහසු ය. හොඳින් පුළුස්සන ලද ගඩොලින් හා ඔප කළ කළු ගලින් නිමවා ඇති උන්ගේ දාගැබ් හා ගෘහ නිර්මාණ අතිශයින් විශ්මිත

ය. මෙරට දැනට ජීවත් ව සිටින මිනිසුන් කියන්නේ එකල සිටි යෝධ මනුෂ්‍ය කොටසක් විසින් මේ දැ කරන ලද බව යි. යම් හේතුවක් නිසා එකල සිටි දියුණු මනුෂ්‍ය වර්ගය භූමියෙන් මුළුමනින් වඳ වී ගොස් ඇතැ යි මම විශ්වාස කරමි. (Sullivan,1854 P.160 - 165 and 199- 205) සුලෙයිවාන් කියන්නේ ශ්‍රී ලාංකිකයෝ තාක්ෂණික වශයෙන් පමණක් නො ව ආර්ථික වශයෙන් ද මහත් පරිහානියකට පත් ව තිබෙන ජාතියක් බව යි. 'Ceylon, formerly with a population of five or six millions, and supplying the whole of the Coromandal coasts and other parts of India with rice, has now scarcely a population of forty mouths to the square mile, and even these, but for the supplies of grain from the Malabar coast, would starve' (Sullivan, 1854 P. 200). 'මේ දිවයින අතීතයේ දී දසලක්ෂ පහක් හෝ හයක් පමණ වූ ජන සංඛ්‍යාවක් ජීවත් වූ ජනාකීර්ණ දිවයිනක් ව තිබී ඇත. එකල නිෂ්පාදනය කළ සහලින් ඔවුන් ද පෝෂණය වී ඉන්දියානු කොරමැන්ඩල් වෙරළ සිට තවත් බොහෝ ප්‍රදේශයන් ද පෝෂණය කර තිබේ. එහෙත් අද මේ දිවයින තුළ තිබෙන්නේ එක් හතරැස් සැතපුමකට කටවල් හතළිහක් පමණ ය. එහෙත් එම කටවල් හතලිහට උවමනා සහල් ද මලබාරයෙන් නො ලැබුණහොත් උන් ද හාමතේ ය.'

- මේ දිවයිනේ ජීවත් වන මිනිසුන් කියන්නේ යුක්තිය පසිඳලන විනිශ්චයකරුට අල්ලස් දිය හැකි නම් නඩුව හර වුනත් වැරදි වුනත් බිය විය යුතු නැතැ යි කියා ය. (Knox 1681, P. 52-53).
- ශ්‍රී ලාංකිකයෝ ආර්ථිකයෙන්, තාක්ෂණයෙන්, කලාවෙන්, සාර ධර්ම හා අධ්‍යාත්මයෙන් දිගින් දිගට ම පරිහාණියට පත් වූ ජන කොටසකි.
- ශ්‍රී ලාංකිකයෝ අධිපතිවාදය කරපින්නා ගත් ජන කොටසකි.

ආර්ථික හා තාක්ෂණික පදනම අනුව බලන විට අනුරපුර යුගයේ සිටි මනුෂ්‍ය වර්ගයා මුළුමනින් ම භූමියෙන් වඳ ව ගොස් ඇති බවත් වෙනත් මනුෂ්‍ය කොටසක් භූමියේ අද ජීවත් වන බවට සැක කළ හැකි බවත් සුලෙයිවාන් කිය යි. සුලෙයිවාන්ගේ අදහස ඓතිහාසික තොරතුරු අනුව අසත්‍ය වන නමුත් විදේශිකයෙකු වූ ඔහු තුළ පහළ වන සැකය කියාපාන්නේ අනුරාධපුර යුගයට සාපේක්ෂ ව කොතරම්

පරිමාණයක පරිහානියක් ශ්‍රී ලාංකික ජන සමාජය තුළ සිදු ව ඇත් ද යන වග යි. වෙනත් වචනවලින් කිව හොත් අග මුල සසැඳිය නො හැකි අන්දමේ පරිහානියක් අපේ ජන සමාජය තුළ සිදු ව ඇති බව සුලෙයිවාන්ගේ ප්‍රකාශයෙන් කියැවේ.

සුලෙයිවාන් ශ්‍රී ලංකාව දකින්නට බොහෝ පෙර සිට ම ශ්‍රී ලාංකික ජන සමාජය පරිහානියට පත් ව තුබූ බවට සාධක තිබේ. සුලෙයිවාන්ගේ ශ්‍රී ලංකා සංචාරයට ශත වර්ෂ දෙකකට පෙර එනම්, පහළොස් වැනි සියවසේ දී, දෙවැනි රාජසිංහ රජු දවස සිංහල ජන සමාජය පිළිබඳ ව තොරතුරු සැපයූ ඉංග්‍රීසි ජාතික රොබට් නොක්ස් පැමිණෙන්නේ ද සුලෙයිවාන් පැමිණි නිගමනයට ආසන්න නිගමනයකට ය. නොක්ස්, නුවර යුගයේ ජීවත් වූ මිනිසුන්ගේ ආර්ථිකය, තාක්ෂණය ආදී තත්වයන් පැරණි විහාර දාගැබ් ආදියට පාදක වී ඇති ආර්ථික හා තාක්ෂණික පදනම සමඟ සසඳා විප්ලවකාර නිගමනයකට එළඹෙයි. ඔහු කියන්නේ ඉතිහාසයේ දී මෙරට ජීවත් ව තිබෙන දියුණු, බුද්ධිමත් ජන කොටසක් විසින් පැරණි දාගැබ් ගොඩ නඟන්නට ඇති බවත්, නුවර යුගයේ සිටින සිංහලයෙකුට පැරණි වෙහෙරක නඩත්තුවක් කර ගැනීමට තරම්වත් ප්‍රමාණවත් ඥාන සම්භාරයක් නො මැති බවත් ය. නොක්ස්ගේ පහත සඳහන් ප්‍රකාශයෙන් හෙළිදරව් වන්නේ ද ඔහු දැරූ මතය යි. 'The Pagodas or Temples of their Gods are fo many that I cannot number them. Many of them are rare and Exquifite work, built of Hewn Stone, engraven with Images and Figures; but by whom and when I could not attain to know, the Inhabitants themselves being ignorent therein But sure I am they were built by far more Ingenious Artificers, than the Chingulayes that now are on the Land' (Knox 1681, P. 72). නොක්ස්ගේ මෙම සඳහනේ සරළ සිංහල අදහස මෙසේ ය. 'මෙහි වෙහෙර විහාර ආදිය බොහෝ ය. මේවායින් බොහොමයක් ඉතා දුලභ, උත්කෘෂ්ඨ ගනයේ ඒවා ය. කපන ලද කළු ගලින් සාදා ඇති ඒවා කැටයම් කොට, ප්‍රතිමා නෙලා ඇත. මෙරට ජීවත් වන වැසියන් අඥාන පිරිසක් බැවින් මේ නටඹුන් කවර මනුෂ්‍ය කොටසකට අයත් ඒවා දැයි මට සිතා ගත නො හැකි ය. කෙසේ වෙතත් එකක් කිව හැකි ය. මේවා නිම කර

තිබෙන්නේ මෙරට දැනට ජීවත් වන සිංහලයා යයි කියනු ලබන මිනිසුන්ට වඩා බොහෝ කෞශල්‍යයෙන් යුතු, ශිල්පීය ඥානයක් තිබෙන මිනිසුන් කොටසක් විසිනි.' තාක්ෂණයෙන් හා ශිල්ප ඥානයෙන් පරිහානියට පත් ජන කොටසක් මධ්‍යතන යුගය තුළ දී ශ්‍රී ලංකාවේ විසූ බව නොක්ස්ගේ පහත සඳහන් ප්‍රකාශයෙන් ද මනා ව පැහැදිලි වෙයි. '........those that were anciently built, are of better Workmanship, as was faid before; but those lately erected are far Inferior; made only with clay and sticks' (Knox 1681, P. 72). 'මා මීට පෙර ද කී පරිදි ඉපැරණි දාගැබ් මනා ශිල්පඥානයක් මත නිම වූ දෑ ය. එහෙත් පසු කලෙක ගොඩනගන ලද දෑ බොහෝ බාල වර්ගයේ නිර්මාණ ය. මේ බාල නිර්මාණ සකස් කර ඇත්තේ මැටියෙන් සහ කෝටු වලිනි '

> නැගෙනහිර තෙදවත් ශිෂ්ඨාචාර ලෙස පැවති බැබිලෝනියාව, ජෙරුසෙලම සහ ඊජිප්තුවේ තේජස අද මුළුමනින් ම අතුරුදන් ව තිබේ. මැක්සිකෝවේ, පේරු රාජ්‍යයේ දක්නට තිබෙන විස්මිත නටඹුන්වලට ගැලපෙන ඥාන සම්භාරයක්, තාක්ෂණයක්, කලාවක් අද ජීවත් වන මැක්සිකෝ වරු හෝ පේරු වැසියනට නැත. ශ්‍රී ලංකාවේ තත්ත්වය ද මෙය ම ය.

මධ්‍යතන යුගය වන විට ශ්‍රී ලාංකිකයෝ මිනිස් වටිනාකම්, සාරධර්ම ආදියෙන් ද බොහෝ සේ පිරිහී සිටිය හ. මධ්‍යතන යුගයේ ජන සමාජය තුළ අල්ලස හා දූෂණය කොතරම් ඉදිරියට ආවේ ද යත් ජනතාවට යුක්තිය පසිඳලන ආයතන පවා අල්ලසට හා දූෂණයට යටත් ව තුබූ බව රොබට් නොක්ස් ගේ වාර්තාවලින් පෙනේ. රොබට් නොක්ස් කියන්නේ ගම් සභාවෙන් සාධාරණය ඉටු නො වූ ගැමියෙකුට අදිකාරම් වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි නමුත් යුක්තිය ඉටු වන්නේ වැඩි ම අල්ලසක් අදිකාරම්ට දෙන්නේ කවරෙක් ද යන්න මත බව යි. රොබට් නොක්ස් ගේ පහත සඳහන් කියමන කියවා බලන්න. "They may appeal alfo from him to the *Adigars,* or the Chief Justice of the Kindom. But whofo gives the greatest Bribe, he shall overcome. For it is a common faying in this Land, *That he that has Money to Fee the Judge, need not fear not care, whether his case be right or not.* The greatest Punishment that these Judges can inflict upon the greateft

Malfactors, is but Imprisonment. From which Money will releafe them from Imporisonment (Knox 1681, P.52-53). මෙහි සිංහල තේරුම මෙසේ ය. 'තමනට යුක්තිය ඉටු නො වූ විට තමන්ගේ පැමිණිල්ල ගැන අදිකාරම්ට හෝ රජයේ ප්‍රධාන විනිශ්චය කරු වෙතට අභියාචනයක් සේ ඉදිරිපත් කළ හැකි ය. නමුත් විනිශ්චයකරුට දෙනු ලබන අල්ලසේ ප්‍රමාණය අනුව නඩුවේ තීන්දුව නිශ්චය වේ. මේ නිසා මේ දිවයිනේ මිනිසුන් අතර ප්‍රචලිත වූ ජන වහරක් තිබේ. එනම්, යුක්තිය පසිඳලන විනිශ්චය කරුවාට අල්ලස් දිය හැකි නම් නඩුව හරි උනත් වැරදි උනත් බිය වීමට කාරණාවක් නැති බව යි. මෙකී විනිශ්චය කරුවන්ට දිය හැකි උපරිම දඬුවම හිර දඬුවම පමණි. එහෙත් එය ද මුදල් මත වලකාලිය හැකි ය.'

රොබට් නොක්ස් දුටු ශ්‍රී ලංකාව පරිහානියට පත් රටක් හා ජන සමාජයක් ව පැවතුණු බව සැබැ ය. එහෙත් ඉපැරණි සංස්කෘතියෙහි ඇතැම් ගුණාංග ඒ වන විටත් පොදු ජනතාව වෙත යම් මට්ටමකට ශේෂ ව පැවති බව ඔහුගේ වාර්තාවලින් ම පැහැදිලි වෙයි. ඔහු වරක් සිංහල පොදු ජනතාව ගැන කරුණු දක්වමින් මෙසේ කියයි. ' ......But to come to the civilized Inhabitants, whom I am chiefly to treat of. They are a people proper and very well favoured, beyond all people that I have fee in India,.......(knox, 1681, P63)' මා නිතර සඳහන් කරන ශිෂ්ඨ සම්පන්න මිනිසුන් ගැන කියනවා නම් (මෙහි ශිෂ්ඨ සම්පන්න මිනිස්සු නම් සිංහලයෝ ය. අශිෂ්ඨයෝ වැදි ජනතාව ය.) ඔව්හු මනා හැදියාවක් ඇති නියම මනුෂ්‍යයෝ ය. ඉන්දියාවේ දී මා දැක ඇති සියලු ම මිනිසුන්ට වඩා මේ මිනිස්සු ප්‍රිය මනාප මිනිස් කොටසකි.

රොබට් නොක්ස් දුටු ශ්‍රී ලංකාව පාලනය කළ සිංහල රජු දුෂ්ඨ, කෲර පාලකයෙක් විය. එහෙත් පොදු ජනතාව තුලින් එවැනි දුෂ්ඨත්වයක් හෝ කෲරත්වයක් දැකිය නො හැකි බව නොක්ස් සෘජු ලෙස ම වාර්තා කර තිබේ. 'They are not very malitious one towards another; and their angar doth not laft long; feldom or never any blood fhed among them in their qurrels....... They are left addicted to ftealing, the which they do exedingly hate and abhor; for

that there are but few Robberies Committed among them' (Knox, 1681 p. 64) 'මොව්හු එකිනෙකාට කෲරකම් දක්වන්නා වූ මිනිස්සු නොවෙති. ඔවුන් තුළ තරහක් ඇති උන ද ඒ ඉතාමත් කෙටි කාලයකට ය. එබැවින් අරගලයක දී වුව ද ලේ ගැල්මක් සිදු වන්නේ ඉතාමත් කලාතුරකිනි. මොව්හු සොරකම් කිරීමට ඇබ්බැහි වී නැත. සොරකම් මහත් සේ පිළිකුල් කරති. එබැවින් උන් අතර සොරකම් සිදු වන්නේ සුලු වශයෙනි.'

අප මෙතෙක් සසඳමින් සිටියේ ඉපැරණි ඉතිහාසය හා මධ්‍යතන යුගයේ ඉතිහාසය යි. මේ සැසඳීමෙන් ඉතා පැහැදිලි ව පෙනී යන්නේ ශ්‍රී ලාංකිකයන් ආර්ථිකයෙන්, තාක්ෂණයෙන්, කලාවෙන්, සාරධර්ම හා අධ්‍යාත්මයෙන් දිගින් දිගට ම පරිහානියට පත් වූ ජාතියක් බව යි. ඉපැරණි ඉතිහාසයෙන් උරුම කර ගත් යම් යම් සාරධර්මයන් නුවර යුගය වන විටත් ශේෂ ව තුබූ නමුත් පරිහානියට පත් වෙමින් තුබූ ජන සමාජය නැවත හිස එසවූයේ නැත. යුරෝපීන්ගේ පැමිණීම සමඟ බටහිර ආභාෂයෙන් පෝෂණය වූ විදෙස් ගැති අධ්‍යාපනය, තාක්ෂණය, ආර්ථිකය ශ්‍රී ලාංකිකයන්ගේ පසු බැස්ම වලක්වා ලීමට සමත් වූයේ ද නැත. නුවර යුගය තුළ දී අන්ත දරිද්‍රතාවයෙහි ගිලී සිටි පොදු ජනතාව බටහිරින් පැමිණි නූතන තාක්ෂණ, ආර්ථික මෙවලම් නිසා යම් පුබුදුවකට ලක් වූ බව සැබෑ ය. එහෙත් ඉපැරණි ඉතිහාසයෙන් හෙළිදරව් වූ අන්දමේ දේශීයත්වය තුළ ගොඩ නැගුණු තිරසාර ආර්ථික පදනමක් හෝ සාරධර්ම පදනමක් නූතන මෙවලම් මගින් ගොඩ නැගුණේ නැත.

ශ්‍රී ලාංකික ජන සමාජයේ පරිහානිය පිළිබඳ ව අදහස් දක්වන ඇතැමුන් කියන්නේ ජන සමාජයේ පරිහානිය යුරෝපීන්ගේ බලපෑම හා නූතනවාදී චින්තනය (Modernism) නිසා ඇරඹුණු බව යි. එහෙත් ඓතිහාසික සාධකවලින් මේ මතය සනාථ වන්නේ නැත. යුරෝපීන්ගේ පැමිණීමට පෙරාතු ව සිට ම ශ්‍රී ලාංකිකයන් පරිහානියට පත් ව තුබූ ජාතියක් බවට බොහෝ සාධක තිබේ.

පරිහානියට පත් වූ මනුෂ්‍ය සභ්‍යත්වයන් දක්නට තිබෙන්නේ ශ්‍රී ලංකාවේ පමණක් නො වේ. ඉතා ඉහළ මට්ටමක පැවති මනුෂ්‍ය

සත්‍යත්වයන් මුළුමනින් බිඳ වැටී අග මුල සැසඳිය නො හැකි මට්ටමට පිරිහී තිබෙන අවස්ථා ජගත් ඉතිහාසයේ එමට ය. නැගෙනහිර තෙදවත් ශිෂ්ඨාචාර ලෙස පැවති බැබිලෝනියාව, ජෙරුසෙලම සහ ඊජිප්තුවේ තේජස අද මුළුමනින් ම අතුරුදන් ව තිබේ. මැක්සිකෝවේ, පේරු රාජ්‍යයේ දක්නට තිබෙන විස්මිත නටඹුන්වලට ගැලපෙන ඥාන සම්භාරයක්, තාක්ෂණයක්, කලාවක් අද ජීවත් වන මැක්සිකෝ වරු හෝ පේරු වැසියනට නැත. එකල ජීවත් ව සිටි බොහෝ යුරෝපීයනට වඩා බෙහෙවින් ඉහළ තාක්ෂණයක්, ආර්ථිකයක් මොවුනට තිබූ බවට කිසිදු සැකයක් නැත (Sullivan, 1854 P. 160 - 165 and 199 - 205).

ශ්‍රී ලාංකිකයන්ගේ වර්තමාන ජන චර්යාව විශ්ලේෂණය කිරීමේ පදනමක් වශයෙන් ඔවුන්ගේ ඓතිහාසික චර්යා ස්වභාවයන් විමසා බැලීම වැදගත් ය. ඉනුත් වර්තමාන ජන චර්යාවට ම ආසන්න සම්බන්ධකම් තිබෙන, පිරිහුණු ලක්ෂණවලින් යුතු මෑත ඉතිහාසයේ ජීවත් වූ ජනතාවගේ චර්යාව හැදෑරීමේ වැදගත්කම ඉස්මතු ව පෙනේ. ශ්‍රී ලාංකික ජන සමාජයේ චර්යාවන් පිළිබඳ ව ලිය වී ඇති සාහිත්‍ය ඉතා අල්ප ය. ශ්‍රී ලංකාව සම්බන්ධ බොහෝ ඓතිහාසික සාහිත්‍ය මූලාශ්‍ර ඇතත් ඒවා බර වී ඇත්තේ රජුන් වැනීමට, ප්‍රභූන් වැනීමට නිසා සාමාන්‍ය ජන ජීවිතය හා ඔවුන්ගේ චර්යාවන් පිළිබඳ ව විවරණය කර ගත හැකි අවස්ථා විරළ ය. අනෙක් අතට යම් ජන සමාජයක චර්යාව පිළිබඳ ව එම ජන සමාජයේ ම සාමාජිකයකු විසින් විස්තර කරන විට එක්තරා පක්ෂග්‍රාහී බවක් ද ඒ විස්තරයට මිශ්‍ර වේ. වෙනත් අයුරකින් කිවහොත් සිංහලයන්ගේ ජන චර්යාව පිළිබඳ ව සිංහලයෙකු විසින් ම ලියන විස්තරයකත්, සිංහලයකු නො වන්නකු විසින් ලියන විස්තරයකත් වෙනස්කම් ඇත. මන්ද? තමන් ගැන තමන් ම ලියා ගන්නා විට තමන්ගේ සුගුණ, වීරත්වය නිතැතින් ම ඉස්මතු වන නිසාත් නුගුණ, බියගුලුකම නිතැතින් ම අවතක්සේරුවක් වන නිසාත් ය. සිංහලයන් හැම විටම ලියා ඇත්තේ තමන් තුළ ඇති දුර්ගුණ හෙළිදරව් නො වන වාර්තා ය.

සිංහලයන්ට සම්බන්ධ ඓතිහාසික සාහිත්‍ය මූලාශ්‍ර පිළිබඳ ව සලකා බලන විට, ඉන්දියානුවන්ට රාමායණය මෙන් ද, ග්‍රීකයන්ට ට්‍රෝයි

කථාන්තර මෙන් ද, ස්කැන්ඩිනේවියානුවන්ට වොල්සන්ගා මෙන් ද, සිංහලයන්ට මහාවංශය වැදගත් ය. එහෙත් ඉන්දියානුවන්ගේ රාමායනය මෙන්ම සිංහලයන් ගේ මහා වංශය ද වීර කාව්‍ය ගනයේ ලා සැලකෙන සාහිත්‍ය මූලාශ්‍රයක් බැවින් පොදු ජනතාව පිළිබඳ විස්තර ඉදිරිපත් වන්නේ නැත (Coomaraswamy,1979 P.1-7). අනෙක වීර කාව්‍යයක් මගින් වීර ජාතියක නුගුණ කියන්නේ ද නැත. මේ සියල්ලට ම වඩා මහා වංශයෙන් හෙළිදරව් කරන්නේ පාලකයන් පිළිබඳ ව මිස පාලිතයන් පිළිබඳ ව නො වේ. මේ නිසා සමාජ පසුබිම හා බැඳී පවතින සිංහලයන්ගේ ඓතිහාසික ජන චර්යාව විවරණය කිරීමේ දී මහා වංශයෙන් ලැබිය හැකි ප්‍රයෝජනය අල්ප ය.

## මෑත ඉතිහාසයට තොරතුරු පදනමක්

ශ්‍රී ලංකාවේ පොදු ජනතාව හා ඔවුන්ගේ ජන ජීවිතය පිළිබඳ ප්‍රමාණවත් විස්තර ලැබෙන්නේ සිංහල රාජාණ්ඩු ක්‍රමයේ අවසාන භාගයේ දී ය. විශේෂයෙන් නුවර යුගයේ දී ය. අනුරාධපුර, පොළොන්නරු යුගවල පැවැති ජන ජීවිතය පිළිබඳ ව අනුමානයෙන් සිතා ගත හැකි වුවත් පැහැදිලි චිත්‍රයක් ගොඩ නැගිය නො හැකි ය. සිංහල රාජාණ්ඩු ක්‍රමයේ අවසන් භාගයේ දී ශ්‍රී ලාංකිකයන්ගේ පොදු ජන ජීවිතය පිළිබඳ ඉතා පැහැදිලි හා සවිස්තර තොරතුරු රැසක් විදේශීය සාහිත්‍යයෙහි දක්නට තිබේ. මහා වංශය ලියා ඇත්තේ සිංහලයන්ගේ ඉතිහාසය ලියා තැබීමේ අරමුණ සඳහා ම වුවත් විදේශිකයන් ලියා ඇති මේ තොරතුරුවල අරමුණ සිංහලයන්ගේ ඉතිහාසය ලියා තැබීම නො වේ. තොරතුරු ලියා තැබීමේ අවස්ථා බොහොමයක පදනම අහඹු සිදුවීම් ය. උදාහරණ වශයෙන් ශ්‍රී ලාංකික ජන ජීවිතය පිළිබඳ සවිස්තර වාර්තාවක් ලියා ඇති රොබට් නොක්ස් මුහුදු අනතුරක් නිසා ක්‍රි. ව. 1660 දී ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරළට ගසා ගෙන ආ වෙළඳ කණ්ඩායමේ පුද්ගලයෙකි. පහත රට ජන ජීවිතය ගැන තොරතුරු රැසක් වාර්තා කර ඇති ජොහැන්ස් හයිඩ් පෙර දිග ඉන්දියානු වෙළඳ සමාගමේ සේවකයෙකි. මේ නිසා ඉතිහාසය ලියා තැබීමේ අරමුණ සඳහා ම ලියන ලද දේශීය සාහිත්‍යයට වඩා ඉතිහාසය ලිවීමේ කිසිදු අරමුණක් නො මැතිව විදේශිකයන් විසින් ලියන ලද තොරතුරු පිළිබඳ ව වැඩි විශ්වාසයක් තැබිය හැකි බව නො කිව මනා ය.

සිංහලයන්ගේ ජන චර්යාව පිළිබඳ ව සිංහලයන් නො වන්නවුන් විසින් ලියන ලද වාර්තා කීපයක් මේ ග්‍රන්ථයේ ඉදිරිපත් කරන තොරතුරු සඳහා පාදක කර ගැනීම කතුවරයාගේ උත්සාහය වන්නේ ය. දෙවැනි රාජසිංහ රජු දවස විසි වසරක් පමණ උඩ රට පදිංචි ව සිටි ඉංග්‍රීසි ජාතික රොබට් නොක්ස් විසින් ලියන ලද චාරිකා වාර්තා (Knox, 1681),1640 දී ශ්‍රී ලංකාවට පැමිණි පාතුගීසි ජාතික රිබෙයිරෝ නම් නාවිකයකු විසින් ලියන ලද වාර්තා (Ribeiro, 1685) සහ ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු දවස ලංදේසීන්ගේ පෙරදිග ඉන්දියානු වෙළඳ සමාගමේ සේවය කරනු ලැබ වසර තුනක් පමණ ලංකාවේ පහත රට පදිංචි ව සිටි ජර්මානු ජාතිකයෙකු වූ ජොහැන් හයිඩ් විසින් 1744 දී ( Heydt, 1744) ලියන ලද වාර්තා මගින් සිංහලයන්ගේ සමාජ පරිසරය හා බැඳී පැවතුණු චර්යාව පිළිබඳ ව ප්‍රමාණවත් තොරතුරු ලැබේ. නොක්ස් ගේ තොරතුරුවලට පදනම් වූ කාලයේ ජීවත් වූ ජනතාවට වඩා පරම්පරා තුන හතරකට පසුව ජීවත් වූ සිංහල ජනතාවගේ ජන ජීවිතය පිළිබඳ ව හයිඩ් ගේ ලියවිලි වලින් හෙළි වන අතර, රිබෙයිරෝ වාර්තා කරන්නේ නොක්ස් ට ඉතාමත් ආසන්න කාලයක් පිළිබඳ ව ය.

සිංහල ජන චර්යාව පිළිබඳ ව කරුණු හෙළි වන මේ වාර්තා එකකකට එකක් පැහේ. අනෙක් අතට මෑත ඉතිහාසය පිළිබඳ ව ලියවී ඇති මේ සියලු වාර්තාවලින් එළි දැක්වෙන සිංහලයන්ගේ චර්යා රටා අදත් සිංහලයන් විසින් පවත්වා ගෙන යනු ලබන චර්යා රටා මගින් ද සහතික වේ. මේ නිසා වර්තමාන සිංහල ජන සමාජයේ චර්යාව, ඓතිහාසික ව ඔවුන් තුළ පැවති ජන චර්යාව සමඟ සැසඳෙන්නේ කෙසේ දැ යි වග විභාග කර බැලීම සමාජ සජීවිකරණයක් පිළිබඳ ව විශ්වාස තබන්නවුන්ට මහත් සේ ප්‍රයෝජනයක් විය හැකි ය. මන්ද? සජීවිකරණයක් උදෙසා දැනට පවත්නා චර්යාව වෙනස් වීම අත්‍යවශ්‍ය යයි සියලුදෙනා ම පිළිගනු ලබන බැවිනි.

සිංහලයන් සමඟ වසර විස්සකට ආසන්න කාලයක් ජීවත් වී සිංහලයාගේ ජන ජීවිතය හා චර්යාව පිළිබඳ ව අග්‍රගණ්‍ය වාර්තාවක් ලියා ඇති රොබට් නොක්ස් විදේශිකයෙකි. ඔහු සිංහලයන් අතර ජීවත් වී, උන්ගේ ආහාර අනුභව කොට, උන්ගේ ඇඳුම් ඇඳ, උන්ගේ

සිරිත් විරිත් මධ්‍යයෙහි ජීවත් වූවෙක් ද වෙයි. එබැවින් නොක්ස් සිංහලයන්ගේ උපත ද, ඉගෙනුම ද, විවාහය ද, කුල ගොත ද, මළගම ද, නීතිය ද, සිරිත විරිත ද, දඬුවම ද, ඇඳහිල්ල ද, ගේ දොර ද, බේතහේත ද, පාලනය ද, කැරැල්ල ද ආදී වූ සියල්ල සියැසින් දුටුවෙකි. මේ නිසා නොක්ස් ඉදිරිපත් කරන තොරතුරු නොක්ස්ගේ අත්දැකීම මත ද, පුද්ගලික අවබෝධය මත ද, ඉදිරිපත් වී ඇත. නොක්ස් ඉදිරිපත් කරන අර්ථ කථන සියල්ල නිවැරදි නැත. එහෙත් නිවැරදි දේ ඉතා පහසුවෙන් උකහා ගත හැකි ය. මන්ද? ගෙතීමක්, අතිශයෝක්තියක්, බොරු වර්ණනාවක් නොක්ස්ගේ වාර්තාවල අඩංගු නැති බැවිනි. සිංහලයන්ගේ ගති ලක්ෂණ පිළිබඳ ව පැහැදිලි උපේක්ෂාවකින් යුතු ව තොරතුරු ඉදිරිපත් කරන නොක්ස් ඔවුන්ගේ කිවුම්, කෙරුම් ඉදිරිපත් කරන්නේ වීරකාව්‍ය ශෛලියෙන් ලියා ඇති ඓතිහාසික වෘතාන්තවල තොරතුරු ඉදිරිපත් කරන ස්වරූපයෙන් නො වේ. තම තමන්ගේ ප්‍රෞඪත්වය ගැන කියා ගන්නා වීර කාව්‍යයන් තුළ කරුණු ඉදිරිපත් කිරීමේ දී ඔවුනොවුන්ගේ නායකයන් වීරයන් සේ විස්තර වන නමුදු නොක්ස්ට සිංහලයෝ වීරයෝ නො වෙති. බියගුල්ලෝ ද නො වෙති. සත්පුරුෂයෝ ද නො වෙති. අසත්පුරුෂයෝ ද නො වෙති. එබැවින් ඔහු ඇසූ දේ, දුටු දේ, අවබෝධ කර ගත් දේ ඒ අයුරින් ම වාර්තා කොට ඇති නිසා සිංහලයන් විසින් ඓතිහාසික ව පවත්වා ගෙන යන්නා වූ චර්යා රටාවන් පිළිබඳ ව මනා අවබෝධයක් ඉන් ලද හැකි ය.

## සමාජ පසුබිම් නියතය හා බැඳුනු සජීවිකරණයේ බාධක චර්යා

ශ්‍රී ලාංකික ජන සමාජය සජීවිකරණය කිරීමෙහි ලා ප්‍රධානත ම බාධකය බවට පත් ව ඇත්තේ සම්පත් පදනම නො ව චර්යා පදනම බව මීට පෙර සඳහන් කළෙමි. චර්යාවන් අනර්නුත් සමාජ පසුබිම් නියතය විසින් දායාද කර ඇති ඇතැම් චර්යා සමාජ සජීවිකරණයේ ප්‍රබල බාධකයන් සේ ක්‍රියාත්මක වේ. නොක්ස්, හයිඩ්, රිබෙයිරෝ ආදීන් ගේ ඓතිහාසික වාර්තාවලින් හෙළිදරව් වන්නා වූ ද, ශ්‍රී ලාංකිකයන් ගේ වර්තමාන චර්යාවන් මගින් නැවත නැවතත් සහතික වන්නා වූ ද මේ බාධාකාර චර්යාවන්ට පාදක වන ප්‍රධාන පදනම් තුන කි. ඒවා නම් අධිපති වාදය, පරායත්ත මානසිකය හා උච්චායම

යි. මේ ග්‍රන්ථයේ මෙතැන් සිට විශ්ලේෂණය වන්නේ අධිපති වාදය, පරායත්ත මානසිකය හා උච්චායම මත නිශ්චය වී ඇති චර්යාවන් පිලිබඳ ව ය. නොක්ස්, හයිඩ් ආදීන්ගේ ඓතිහාසික වාර්තාවලින් හෙළිදරව් වන චර්යා රටා වර්තමාන චර්යාවන් සමඟ ගැළපීමක් ඉදිරි විශ්ලේෂණය තුළ සිදු වනු ඇත.

- මඩ සෝදා ගත් කල ගොවියා රජ කමට සුදුසු යයි රොබට් නොක්ස් ප්‍රකාශ කර ඇති බව දක්වමින් වර්තමාන ගොවියාගේ වැදගත්කම හුවා දැක්වීමට ඇතැමුන් උත්සාහ කල ද, එවැනි ප්‍රකාශයක් නොක්ස් විසින් කර නැත.

- මඩ සේදූ කළ ගොවියා රජකමට වුවත් සුදුසු යයි කීව ද මඩ තැවරුණු පමණින් සියල්ලන්ට ම රජ වීමට සුදුසුකම් නැත. පහත් කුලවලට අයත් වූවන්ගේ ගතෙහි තැවරුණු මඩ කොපමණ වරක් සේදුව ද ඔවුනට රජ විය නො හැකි ය. මක් නිසාද? ඔව්හු පහත් යයි සැලකෙන නිසා ය. කුළය ගොවි නම් කවර දිනෙක වත් කුඹුරට නො බැස්ස ද ඔවුනට රජ වීමට සුදුසුකම් තිබේ. සේදීමට මඩ නැති නිසා රජ වීම බොහෝ පහසු ය.

## අධිපති වාදය

නොක්ස් ගේ මෙන් ම හයිඩ් ගේ වාර්තා වලින් ද හෙළි වන පරිදි පැරණි සිංහලයෝ අධිපති වාදය කරපින්නා ගත් ජන කොටස කි. ඔව්හු අධිපතිත්වය පැතිරවීමටත්, පිළිගැනීමටත් කැමැත්තෝ ය. අධිපති වාදය යනුවෙන් මේ ග්‍රන්ථය තුළ අදහස් කරන්නේ පාලකයා හා පාලිතයා අතර තිබෙන හා තිබිය යුතු සම්බන්ධතා ව යන අදහස නො වේ. අධිපති වාදය ප්‍රධාන ලක්ෂණ දෙකකින් යුක්ත ය. ඉන් පළමුවැන්න නම් සමාජයේ සෑම ජන කොටසක් විසින් ම ඊට ඉහළින් සිටිති යයි විශ්වාස කරනු ලබන ජන කොටසකගේ අධිපතිත්වය පිළිගෙන සිටිය යුතුය යන්න යි. දෙවැන්න අධිපතිත්වය දරන්නන් සතු අසීමිත බලය යි. නොක්ස් වාර්තා කරන පරිදි සිංහල රජු දවස කුල පදනම හා උඩ රට හා පහත රට පදනම මත අධිපති වාදයක් සමාජය තුළ ස්ථාපිත ව තිබූ අතර හයිඩ් ගේ වාර්තා අනුව පහත රට ජනතාව තුළ ද එවැනි ම අධිපති වාදයක් පැවතිණි.

නොක්ස්, හයිඩ්, රිබෙයිරෝ ආදීහු වාර්තා කරන කුල පදනම අධිපති වාදයේ සමාජ නියමය වශයෙන් එකල පිළිගත් බැවින් කුල පදනම පිළිබඳ ව දළ අදහසක් පාඨකයා වෙත තිබිය යුතු ය. කුලය නම් වූ පිළිගැනීම වර්තමාන සමාජය තුළ ද යම් ආකාරයකින් ශේෂ ව පවතින නමුදු අද තිබෙන කුලය මත එකල පැවති කුලයෙහි බලාධිකාරය පිළිබඳ ව අල්පමාත්‍ර වූ අවබෝධයක් හෝ ලද නො හැකි ය. සිංහල රජු දවස පැවති කුල පදනම වනාහි මනුෂ්‍යයෙකුගේ සමස්ත ජීවන රටාව ම උපතින් නිශ්චය කරනු ලැබුවා වූ සමාජ නියමය කි. ඉතා ම සරල ව පැහැදිලි කරනු ලැබුවහොත් පැරණි කුල පදනම වනාහි යමෙකුගේ රැකියාව නිශ්චය කරන සාධකය ය. ආදායම නිශ්චය කරන සාධකය ය. බලය නිශ්චය කරන සාධකය ය. අධ්‍යාපනය නිශ්චය කරන සාධකය ය. ජීවත් වන ප්‍රදේශය හෝ ස්ථානය නිශ්චය කරන සාධකය ය. එපමණක් නො ව ඇඳුම, විවාහය, මඟුල, අවමඟුල, කෑම් බීම් ආදිය සඳහා ගනු ලබන උපකරණ, වාඩි වීම, නිදා ගැනීම සඳහා ගනු ලබන උපකරණ, කතා බහ ආදී වූ සකල විධ මනුෂ්‍ය උවමනාවන් ම නිශ්චය කරන්නා වූ සාධකය ද විය. එකල පැවති සමාජ සම්මතය අනුව යමෙකු කළ යුත්ත නො කළ යුත්ත නිශ්චය කළ යුතු වූයේ ඔහුගේ හෝ ඇයගේ කැමැත්ත මත නො ව ඔහු හෝ ඇය උපන් කුලය අනුව ය.

සිංහල රජු දවස පමණක් නො ව මෑතක් වන තුරු ම කුලය මත පැවති අධිපති වාදය ශ්‍රී ලංකා ජන සමාජය තුළ ප්‍රබල ලෙස ක්‍රියාවට නැගිනි. 1947 දී රාජ්‍ය මන්ත්‍රණ සභාවට මන්ත්‍රී වරුන් තෝරා ගැනීමේ දී නිකුත් කරන ලද ඡන්ද දැන්වීමක් කෙරෙහි පාඨකයාගේ අවධානය යොමු කිරීමට කතුවරයා කැමති ය. 1950 ගණන් තරම් මෑත කාලය වන විටත් කුලය කොතරම් තීරණාත්මක සාධකයක් බවට පත් ව තුබුණේ දැ යි මේ ඡන්ද දැන්වීමෙන් ඉතා පැහැදිලි ව පෙනේ (දිවයින, නොවැම්බර් 20, 2000).

කරුණාවෙන් කරණු ලබන ප්‍රකාශයයි.

ලංකා පාර්ලිමේන්තුවේ කැගලු ආසනයට රඹුක්කන, කිර්තිරත්න මහත්මයා සුදුසු යැයි තීරණය කර ඒ මහතා ඉදිරිපත් කලේ,

ගරු ඩී. ඇස්.සේනානායක,
ඇස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක
ජේ. ඇල්. කොතලාවල,
ඒ.ඇ/ජ. මොලමුරේ,
එච්. ඇල්. රත්වත්ත,
ආදී උඩ - පාත දෙරට ප්‍රධාන රදල වරුය, ටී.බී. පානබොක්ක උඩරට ප්‍රධාන තුමානෝ ද එය මැනවයි පිළි ගන්නා ලදී.
කීර්තිරත්න මහත්මයා කැගලු ආසනය වෙනුවෙන් පත් කර යැවීම නිසා අපේ සිංහල රදල පක්ෂයට හෝ ගොයිගම පක්ෂයට යම් කිසි හානියක් නින්දාවක් කවදාවත් වෙන්නේ නැත. එසේ වෙනවා නම් කවදාවත් මෙසේ අපි කියන්නේ නැත.
ඔහු පත් කර යවන්නේ අවුරුදු 3 කට පමණ ය. සැක නො කර ඔහුට කැමැත්ත දී පත් කර ගන්නා ලෙස කැගලු වාසී සියළු ඡන්ද දායක වරුන්ට කරුණාවෙන් දන්වමි.
පෙර පටන් ප්‍රධාන රදල වරු රට වාසීන්ට යමක් කියන්නේ ද, එය පිළි ගත්තේ ය. එයින් රටට වැඩක් මිස අවැඩක් සිදු නො වූයේය.
ඡන්ද කාලවලදී එකී එක් කෙනා විසින් කරනු ලබන නා නා ප්‍රකාස අහන බලන අය සිහියෙන් වැඩ කළොත් කිසිම හානියක් නැත.

මීට,
තමුන්නාන්සේලාගේ
11.9.47 හිතවත් රටේ මහත්මයා ව සිටි,
සී. ඇල්. රත්වත්ත

අධිපති වාදය හෙවත් සමාජයේ එක් කොටසකට ඉදිරියට ඒමට ඉඩ නො දීම මගින් පොදු ජනතාවගේ දක්ෂකම්, විචක්ෂණකම් යටපත් කර තැබෙයි. යටත් මනුෂ්‍යයන් විසින් අධිපති වාදය පිළිගනු ලැබූ විට ඔවුන් කිසිදු අයුරකින් ඉදිරියට එනු ලබන්නේ වත්, දක්ෂකම් පෙන්වනු ලබන්නේ වත් නැත. මන්ද? එය සමාජ විරෝධී, රාජ්‍ය විරෝධී තත්ත්වයක් වන බැවිනි. මේ නිසා සමාජයේ ඉදිරි ගමනට උන්ගේ සම්මාදම ඉතාමත් අල්ප ය. සමාජයේ පැවතිය යුතු කැමැත්ත වන්නේ කුලවතාගේ හෝ බලවතාගේ කැමැත්ත ය. කුලයෙන් හෝ බලයෙන් අඩු තැනැත්තාගේ කැමැත්ත කුලවතාගේ හෝ බලවතාගේ කැමැත්ත මගින් යටපත් කරනු ලැබී ය.

සිංහල ජන සමාජය පිලිබඳ ව නොක්ස් ඉදිරිපත් කර ඇති තොරතුරු සමුදාය අතරින් වර්තමානයේ ප්‍රයෝජනයට ගැනෙන්නේ සිංහලයාගේ වරුනාව කියා පෑම සඳහා උලුප්පා ගත හැකි තොරතුරු පමණ ය. එහෙත් ඔහුගේ තොරතුරු වලින් හෙළි වන අමිහිරි සත්‍ය හෙවත් එකල පැවති සමාජ පීඩනය, අගතිගාමීත්වය, අවිචාරය, අසාධාරණය සාකච්ඡා වන්නේ ම නැත. නොක්ස් ගේ ඇතැම් කියමන් සිංහලට නැගී ඇත්තේ සිංහලයාට ම ගරු නම්බුවක් ලැබෙන ආකාරයෙන් විකෘති කොට සිංහලයා තුළ නො තිබූ සමානාත්මතාවක් පැවති බව පෙන්වීමට ය. උදාහරණයක් වශයෙන් ගතහොත් ‘මඩ සෝදා ගත් කල ගොවියා රජ කමට සුදුසු යැයි’ නොක්ස් ප්‍රකාශ කර ඇති බව දක්වමින් වර්තමාන ගොවියාගේ වැදගත්කම හුවා දැක්වීමට ඇතැමුන් උත්සාහ කළ ද, එවැනි ප්‍රකාශයක් නොක්ස් විසින් කර නැත. නොක්ස් ගේ මුල් ලියවිල්ල (First Facsimile) (සංස්කරණය නො කළ වාර්තා) කියවන තුරු ඉහත කී ප්‍රකාශය පිළිබඳ ව කතුවරයා දැරූ මතය වූයේ ද ගොවීනට එකල රජ වීමට තරම් සුදුසු සමාජ සම්මතයක් තිබී ඇති බව ය.

නොක්ස් ගේ වාරිකා වාර්තාවේ මඩ සෝදා ගත් කළ ගොවියා රජ කමට සුදුසු යයි කියන්නේ නොක්ස් නො වේ. නොක්ස් කියන්නේ එකල උඩ රට ජනතාව අතර එවැනි කියමනක් තුබූ බව ය. නොක්ස් ගේ මුල් වාර්තාවේ තිබෙන ඉංග්‍රීසි බසින් ඔහුගේ සඳහන මෙසේ ය. ‘Thefe two countries I last named, have the pre-eminence

of all the reft in the land. They are most populous, and fruitful. The inhabitants thereof are the chief and principle men: informuch that it is a ufual faying among them, that if they want a king, they may take any man, of either of thefe two countries, from the Plow, and wafh the dirt off him, and he by reason of his quality and defcent is fit to be a king'(Knox, 1681 p. 2). මෙම ප්‍රකාශයේ සරල වූත්, සංක්ෂිප්ත වූත් අදහස මෙසේ ය. 'මා පසුව සඳහන් කල රටවල් දෙක වඩාත් ම ජනාකීර්ණ හා සශ්‍රීක ප්‍රදේශ ය. මේ රටවල් දෙකෙ හි ජීවත් වන මිනිස්සු ප්‍රධාන මිනිස්සු ය. මොවුන් අතර ප්‍රචලිත ජනවහරක් තිබේ. එනම් කුලයෙන් හා පරම්පරාවෙන් ඔවුන් උසස් යැයි සලකන නිසා ඔවුන්ගෙන් ඕනෑ ම කෙනෙකු කුඹුරෙන් ගෙන මඩ සේදූ කල රජ කමට සුදුසු බව ය.'

නොක්ස් සිංහලයන්ගේ ජන වහරෙන් ගෙන උපුටා දක්වන ප්‍රකාශයේ quality යන වචනයෙන් අදහස් කර ඇත්තේ යම් මනුෂ්‍යයෙකුගේ ගෞරවාන්විත බවට හේතු වන මිනිස් ගුණයන් නො වේ. 'quality' යන ඉංග්‍රිසි වචනයට කුළය, වංශය යන තේරුම ද තිබේ. ඔහු quality යන වචනයෙන් අදහස් කරන්නේ කුලය යි. පහත සඳහන් නොක්ස් ගේ සඳහන ඊට සාක්ෂි දරයි. 'Among this people there are divers and fundry cafts or degrees of quality, which is not according to their Riches or Places of Honour the king promotes them to, but according to their *defcent* and *Blood.* And whatsoever is be it higher or lower, it remains Hereditary from Generation to Generation' (Knox, 1681 p. 66). මෙහි සරළ තේරුම මෙසේ ය. 'මෙම මිනිසුන්ට කුළ නමින් හැඳින්වෙන බෙදීම් ක්‍රමයක් තිබේ. එය පදනම් ව තිබෙන්නේ ඔවුන් සතු මුදල් හදල් හෝ රජු විසින් පිරිනමන නම්බු නාම ආදී කරුණු මත නො වේ. හුදෙක් පරම්පරාවෙන් හෝ ලේ උරුමයෙන් එන වරප්‍රසාදයක් ලෙස ය. මේ නිසා පහත් යයි සම්මත මිනිසුන් ඔවුන්ගේ සියලු ම පරම්පරාවල දී පහත් ය. උසස් යයි සම්මත මිනිසුන් ඔවුන්ගේ සියලු ම පරම්පරාවල දී උසස් ය'.

ඉහත උපුටා දැක්වූ ප්‍රකාශ මගින් නොක්ස් සාකච්ඡා කරන්නේ උඩු නුවර හා යටි නුවර ජීවත් වූ වරප්‍රසාද ලාභී මිනිසුන්ගේ චින්තනය ගැන ය. මඩ සේදූ කල රජ කමට සුදුසු යයි නොක්ස් උපුටා දක්වන ප්‍රකාශයෙන් ඔහු කියා සිටින්නේ කෘෂිකර්මයේ වැදගත්කමවත්, සිංහලයන්ගේ සමානාත්මතා ගුණය ගැන වත්, ඕනෑම ගොවියෙකුට වුව ද රජ විය හැකි සමාජ පසුබිමක් එකල පැවති බව වත් නො වේ. නොක්ස් ගේ කියමනේ සංදර්භ ගත අදහස මෙසේ අර්ථ දැක්විය හැකි ය .

- කුලයෙන් උසස් ස්ත්‍රියක් කුලයෙන් පහත් අයෙකු සමඟ ලිංගික සංවාසයේ යෙදුනහොත් දඬුවම මරණය යි. මෙවැනි වරදකට වරද කළ ස්ත්‍රියට අමතර ව ඇගේ දෙමාපියන් හා සහෝදරයින් ද වැරදි කරුවන් වන්නේ ය (Ribeiro, 1685 P. 123).
- කුලවතුන් කුලහීනයන්ගේ දොරටුවකින් වත් ඇතුල් නො විය යුතු ය (Ribeiro, 1685 P. 123).

කුලහීනයන්ට පාලන බලතල ලැබීමට සුදුසුකම් නැත. රාජ්‍ය පාලනයේ සිටිය යුත්තේ උසස් යයි සම්මත කුලවල අය පමණි. විශේෂයෙන් උඩු නුවර හා යටි නුවරට අයත් මිනිසුන් ය. ගොවි කුලය උසස් යයි සම්මත කුලයකි. එබැවින් මඩ සෝදා ගත් කල ගොවියකුට වුව ද රජ වීමට සුදුසුකම් තිබේ. මන්ද? ඔව්හු උසස් යයි සම්මත කුලයකට අයත් වන්නෝ බැවිනි.

නොක්ස් ගේ ප්‍රකාශයේ සංදර්භ ගත අදහස පහත ආකාරයෙන් ද හෙළිදරව් කළ හැකිය. 'පහත් කුලයට අයත් වූවන්ගේ ගතෙහි තැවරුණු මඩ කොපමණ වරක් සේදුව ද රජකම ලැබීමට නම් නො හැකි ය. මන්ද ? රජ කම ලැබීමට සුදුසු වන කුල පදනම උන් වෙත නැති නිසා ය'. නැතහොත් උන් උඩුනුවරට හෝ යටි නුවරට අයත් නො වන නිසා ය. නොක්ස් ඉදිරිපත් කරන අදහස තවත් සරළ ව තේරුම් යන ආකාරයකින් ප්‍රකාශ කළ හොත් එය මෙසේ ය. 'කවර දිනෙකවත් කුඹුරකට නො බැස්ස ද කුලය 'ගොවි' නම්, උන් උඩු නුවරට හෝ යටි නුවරට අයත් වූවෝ නම් උන්ට ද රජකම් කිරීමට සුදුසුකම් තිබේ. උන්ට සේදීමට මඩක් නො මැති නිසා මඩ නො සෝදාම රජ විය හැකි බැවිනි'.

මීට ඉහත දී ද පෙන්වා දුන් පරිදි නොක්ස් කතා කරන්නේ ගොවීන්ගේ මඩ සේදීමක් ගැන නො වේ. උඩු නුවර හා යටි නුවරට අයත් වූ වරප්‍රසාද ලාභී, අධිපතිවාදී මිනිසුන්ගේ කියමනක් ගැන ය. ඔහු කියන්නේ එකළ පැවති බල අධිකාරියේ පදනම ගැන ය. නැත හොත් කුළ ක්‍රමය ගැන ය. නොක්ස් උපුටා දක්වන ප්‍රකාශයේ මධ්‍යගත සාධකය කුල ක්‍රමය මත පදනම් වූ බල අධිකාරිය මිස ගොවිතැන නො වේ. කෙසේ වුව ද, කිසිදු මිනිස් ගුණයක් හා නො බැදුනු කුලය හා ලේ උරුමය මත තමන් රජ කමට සුදුසු යයි තමන් විසින් ම නිර්දේශ කර ගනු ලැබූ උඩරට මිනිසුන් ගැන නොක්ස් ට ද යමක් කීමට ඇත. ඔහු උඩ රට මිනිසුන් සහ පහත රට මිනිසුන් සසඳා මෙසේ කියයි. 'The natures of the inhabitants of the mountains and the low land are very different. They of the low land are kind, pitful, honest and plain, compaffinating strangers which we found by our own experience among them. They of the uplands are ill-natured, falfe, unkind though outwardly fair and feemingly courteous, and of more complaifant carriage, fpeech and better behaviour, than the low landers' (Knox, 1681, p. 64). මෙහි සරළ තේරුම මෙසේ ය. 'අපගේ අත්දැකීම අනුව උඩ රට මිනිසුන් හා පහත රට මිනිස්සු අත්‍යන්තයෙන් ම වෙනස් ය. පහත රට මිනිස්සු කරුණාවන්ත ය. සානුකම්පික ය. අනුන්ට උදව් වන, අවංක, සරළ, අමුත්තන් කෙරෙහි දයාවක් දක්වන මිනිසුන් ය. එහෙත් උඩ රට මිනිසුන් දුෂ්ට, බොරුකාර, අකාරුණික මිනිස්සු ය. එහෙත් මූනිච්චාවට ඔව්හු සාධාරණ, ආචාරශීලී හා අනුන් සතුටු කරවන්නා වූ මිනිසුන් ලෙස පෙනී සිටිති.'

නොක්ස් වාර්තා කරනු ලබන කාලයට වඩා වසර 20 කට පමණ පෙර එනම් 1640 දී ශ්‍රී ලංකාවට පැමිණි පෘතුගීසි ජාතික රිබෙයිරෝ එකළ පැවති කුල ක්‍රමය ගැන සඳහන් කරන්නේ මෙසේ ය. 'These people have a custom, that their nobels should under no circumsstances, not even to drink water, enter the house of a man of low birth, and also a man of a low cast cannot enter the nobel's gate" (Ribeiro, 1685, P. 123) මොවුන්ගේ සිරිත් විරිත් අනුව උසස් යයි සම්මත මිනිසුන් පහත් කුලවල උපත ලත් අය

ගෙන් දිය බිඳක් වත් පානය නො කළ යුතු ය. ඔවුන්ගේ නිවෙස්වලට ඇතුල් නො විය යුතු ය. එමෙන් ම පහත් කුලවල උපන් අය උසස් යයි සම්මත වූවන්ගේ දොරටුවකින් වත් ඇතුළු නො විය යුතු ය. 'If a woman belonging to an honourable cast have intercourse with a man of a low cast, inevitable punishment is death and her accusers are her own parents and brothers' (Ribeiro, 1685 P. 123) කුලයෙන් උසස් ස්ත්‍රියක් කුළයෙන් පහත් අයෙකු සමඟ ලිංගික සංවාසයේ යෙදුණහොත් දඬුවම මරණය යි. මෙවැනි වරදකට වරද කළ ස්ත්‍රියට අමතර ව ඇගේ දෙමාපියන් හා සහෝදරයෝ ද වැරදි කරුවෝ වන්නාහ.

- කුඩා ගම් පෙදෙසකට අයත් ලොක්කෙකු වුව ද එකල ගමන් ගත්තේ තල්පතක් පිටු පසින් අල්ලා ගත් එකෙකු ද, බුලත් පයියක් ගත් එකෙක් ද ඇතිව ය. ඉන් කියැවුනේ උන්ගේ තල් අත්ත උන්ට ගෙන යා නො හැකි තරමේ එකක් බව හෝ උන්ගේ දැහැත් අඩු වැඩි ය උන්ට බර වැඩි කමක් හෝ නො වේ. ඉන් කියැවුනේ උන් තුළ තුබූ මහන්තත්ත කම හෝ අනුන් පාගා සිටීමේ උවමනාව හෝ තවෙකෙකුට තමා ලොක්කකු බව පෙන්වීමේ ප්‍රදර්ශක මානසිකත්වය යි.

- සිංහල සමාජ සංස්ථාව මනා ව පවත්වා ගෙන යන ලද්දේ කුලවතා හෝ බලවතා නිරතුරු ව ඉහළින් සිටිය යුතු යයි කුලවතුන් නො වන්නවුන් විසින් පිළිගත් නිසා ය. නැතහොත් ඔවුන් කුළවතුන්ට තර්ජනයක් නොවූ නිසා ය.

නොක්ස් සහ රිබෙයිරෝ උඩ රට ජීවත්ව සිටි කාලයට වඩා පරම්පරා තුන හතරකට පසු එනම් ක්‍රි. ව. 1732 - 35 කාලයේ ලංකාවේ පහත රට විසූ ජර්මන් ජාතික හයිඩ් ගේ වාර්තා වලින් ද නොක්ස් ගේ සහ රිබෙයිරෝ ගේ වාර්තා තව දුරටත් තහවුරු වේ. හයිඩ් කියන්නේ එකල ජීවත් වූ සිංහලයන්ගේ පහත් යයි සම්මත වූවෝ කුලවතුන්ට කොතරම් සැලකුවේ ද යත් උන් කුලවතුන් වෙත ගිය කල්හි තමා තමා විසින් ම හඳුන්වා දෙනු ලැබුවේ බලු ගැත්තන් ලෙස බව යි. 'මේ බලු ගැත්තාට කමා කරනු මැන' යනාදී වශයෙනි (Heydt, 1744. P 116).

නොක්ස් ගේ, රිබෙයිරෝ ගේ හා හයිඩ් ගේ වාර්තා වලින් හෙළි වන පරිදි සිංහලයන්, සිංහලයන් විසින් ම පාලනය කර ගනු ලැබූ සමයන්

හි නීතිය ද බලවතාගේ ග්‍රහණයේ ය.. දඬුවම ද බලවතාගේ ග්‍රහණයේ ය. සාධාරණය, හෝ අසාධාරණය ද බලවතාගේ ග්‍රහණයේ ය. පොදු ජනතාවගේ කැමැත්ත විය යුත්තේ බලවතාගේ හෝ කුලවතාගේ කැමැත්ත ය. ඇඳුමෙන් ආයිත්තමෙන් ද, ගමනෙන් බිමනෙන් ද, කතාවෙන් බහෙන් ද, අනෙකුත් බාහිර ප්‍රදර්ශනයෙන් ද පොදු ජනතාව තමනට වඩා පහතින් සිටින්නෝ ය යන ප්‍රදර්ශනය සාමාන්‍ය චර්යාව විය. රජු පටන් දිසාවේ වරු, මුදලි, මුහන්දිරම් වරු, කෝරාල වරු යනාදීහු උන්ගේ තරම පෙන්වීමට සුදුසු සියලු අවස්ථා ප්‍රයොජනයට ගෙන අනෙකුන් සුවච, කීකරු, අත්තේවාසිකයන් බවට පත් කළ හ. පහත් යයි සම්මත එකෙකු ඉදිරියට එනු නො ඉවසූ හ. මනුෂ්‍යයන්ගේ දක්ෂකම, නිපුණත්වය, හැකියාව, ගුණය වෙනුවට කුලය, ලේ උරුමය ඉදිරියට ගෙන ආ හ.

> රජු පටන් දිසාවේ වරු, මුදලි, මුහන්දිරම් වරු, කෝරාල වරු යනාදීහු උන්ගේ තරම පෙන්වීමට සුදුසු සියළු අවස්ථා ප්‍රයොජනයට ගෙන අනෙකුන් සුවච, කීකරු, අත්තේවාසිකයන් බවට පත් කළ හ. පහත් යයි සම්මත එකෙකු ඉදිරියට එනු නො ඉවසූ හ. මනුෂ්‍යයන්ගේ දක්ෂකම, නිපුනත්වය, හැකියාව, ගුණය වෙනුවට කුළය, ලේ උරුමය ඉදිරියට ගෙන ආ හ. ආගම ද මින් මිදුනේ නො වේ. සසුනට වැද්ද ගනු ලැබුවේ ද කුළවත්තු පමණි.

සමානාත්මතාව පදනම් වූ බුදු දහම ද සිංහලයන්ගේ භාවිතාව තුළ දී කුල අසාධාරණයෙන් මිදුනේ නැත. බොහෝ විට සසුනට වැද්ද ගනු ලැබුවේ ද කුලවත්තු පමණි. එකෙකුට වඩා තවෙකකු ඉහළින් සිටිය යුතුය යන චින්තනය තුබුණේ දිසාවේලා, මුහන්දිරම්ලා වැනි ප්‍රභූන් යයි සම්මත තැනැත්තන් තුළ පමණක් නො වේ. එම චින්තනය සමස්ත ජනතාවටම පොදු විය. තමාට වඩා යමෙකු පහලින් සිටින නිසා එම කාරණාව අනුව තමා උසස් යයි උන් සිතූ හ. ඒ නිසාම ඉහළ යයි සම්මත වූවන් ගේ අධිපතිත්වය ප්‍රශ්න කිරීමකින් තොර ව භාර ගත් හ. නොක්ස් විස්තර කරන ආකාරයට උඩු නුවරත්, යටි නුවරත් ජීවත් වූ මිනිස්සු තමන් උසස් යයි සිතා අනෙකුන් පහත් කොට සැලකූ හ. මේ පිළිගැනීම අදත් සුළු වශයෙන් හෝ උඩරැටියන් තුළ දක්නට තිබේ. මේ නිසා ජීවත් වන ප්‍රදේශ අනුව ද මිනිසුන්ගේ උසස් පහත් බව තීරණය කරනු ලැබිණ. ඔව්හු දැඩි අධිපති වාදී චින්තනයන් සහිත මිනිස්සු වූහ. අනුන් පහත් කොට තැබීමේ උවමනාවක් තිබූ මිනිස්සු වූහ. ඇතුළතින් ගත හැකි ගුණයක් හා නො බැඳුණු පුහු

ආටෝපය සහ අහංකාරකම ඉස්මතු කරගත් මිනිස්සු වූහ. ලන්දේසීන් මුහුදුබඩ බලකොටු තැනීමට සිංහල රජු රැවටුවේ රජු තුළ තුබූ මේ දුර්වලකම ප්‍රයෝජනයට ගෙන ය. රජු වෙත ගොස්, ඉච්ඡා බස් දොඩා, රජු මුරුංගා අත්තේ තබා, රජුගේ මහේශාක්‍ය බවත්, උසස් බවත් කියා තමන්ගේ අරමුණ ඉටු කර ගැනීමට ලන්දේසීහු සමත් වූහ (Knox, 1681. P 39 ).

> රාජසිංහ රජු නිසා ඔහුගේ ම දියණියට දරුවකු ලැබීම සිංහලයේ සමස්ත සමාජ වටිනාකම් පද්ධතියේ විශාල දෙදරීමක් සේ සැලකිය යුතු නමුත් ඉන් වටිනාකම්වල දෙදරුමක් ඇති නො වී ය. එහෙත් පිහන් මැටියෙන් සෑදූ කෝප්පයක රා බී සම්ප්‍රදාය කැඩූ කුලහීනයා තලා, ඇදුම් ඉරා, පයින් ගසා පන්නා දැමිය යුතු යයි ජනතාට සිතු හ.

උඩ රට සිංහලයා ගැන කියන නොක්ස් මෙන් ම පහත රට සිංහලයා ගැන කියන හයිඩ් ද කියන්නේ සිංහලයන් හැම විට ම තමන් පසු පස එන රැළක් හෙවත් අන්තේවාසිකයන් පිරිසක් අපේක්ෂාවෙන් සිටි බව යි. එදා කුඩා ගම් පෙදෙසකට අයත් ලොක්කෙකු වුව ද ගමන් ගත්තේ තල්පතක් පිටු පසින් අල්ලා ගත් එකෙකු ද, බුලත් පයියක් ගත් එකෙක් ද ඇතිව ය. ඉන් කියැවෙන්නේ උන්ගේ තල් අත්ත උන්ට ගෙන යා නො හැකි තරමේ එකක් බව හෝ උන්ගේ දැහැත් අඩු වැඩි ය උන්ට බර වැඩි කමක් හෝ නො වේ. ඉන් කියැවෙන්නේ උන් තුළ තුබූ මහන්තත්ත කම හෝ අනුන් පාගා සිටීමේ උවමනාව හෝ තවෙකෙකුට තමා ලොක්කකු බව පෙන්වීමේ ප්‍රදර්ශක මානසිකත්වය යි. හයිඩ් වාර්තා කරන්නේ තරාතිරම අනුව හැම සිංහලයා තුළ ම මේ චර්යාව ප්‍රදර්ශනය වූ බව ය. ලොකුකම වැඩි වන්නට, වැඩි වන්නට උන් පසු පස ගමන් ගත් රැළ ද සංඛ්‍යාවෙන් ලොකු විය යුතු ය. නැතහොත් ගැත්තන්ගේ සංඛ්‍යාව ඉහළ යා යුතු ය. ඉංග්‍රීසීන් උඩරට යටත් කර ගැනීමෙන් පසුව ප්‍රාදේශීයාධිපතියකු බවට පත් වූ ඇහැලේපොළ කොළඹට පැමිණියේ අන්තේවාසිකයන් නව සියයක් පිරිවරා ගෙන ය. පිරිවර වැඩි වන තරමට, අන්තේවාසිකයන් වැඩි වන තරමට මහන්තත්ත කම ද වැඩි ය. බුෂි ගේ 'ලෙටර්ස් ඔන් සිලෝන්' නම් ග්‍රන්ථයේ ඇහැලේපොළගේ අන්තේවාසික පිරිවර ගැන මෙසේ කිය වේ. 'Ehelepola made his appearance at Kandy in a single horse - chaise, which he drives about the town....... I have seen this chief arrive at Colombo with nine hundred servents in his train' (Bussche, 1817 P.86).

අපක්ෂපාතී විශ්ලේෂණයකට අනුව කරුණු සලකා බැලුවහොත් අදත් සිංහලයෝ අධිපතිවාදී චින්තනයක් ඇත්තවුන් ය. වෙනස් වී ඇත්තේ මුදලි, මුහන්දිරම්කම්, දිසාව, කෝරාළ කම් ආදී තනතුරු පමණි.

අධිපති වාදය තුළ පැවති සමාජ අසාධාරණය හා අසමානාත්මතාව ඉතා පැහැදිලි ව ප්‍රකාශ වන අවස්ථා කීපයක් හයිඩ් ගේ හා නොක්ස් ගේ වාර්තා වලින් හෙළිදරව් වෙයි. ජොහැන්ස් හයිඩ් පහත රට ජන චර්යාව විස්තර කරමින් කියන්නේ වරක් රා බීමට පැමිණි පහත රට සිංහලයන්ගෙන් එකෙකු පිහන් මැටියෙන් සාදන ලද කෝප්පයක රා බොනු දුටු අනෙකුත් සිංහලයෝ ඔහුට තළා, ඇදුම් ඉරා, පයින් ගසා එලවා දැමූ බව යි. හයිඩ් පසුව දැන ගත් පරිදි පහර කෑ තැනැත්තා කුලයෙන් පහත් අයෙකි. පහර දුන් තැනැත්තෝ කුලයෙන් ඉහළ මිනිසුන් හෙවත් අප්පුහාමිලා ය. කුලහීනයා කර ඇති වරද පොල් කටුවකින් රා බීම වෙනුවට කෝප්පයකින් රා බීම ය. කුලහීනයන්ට කෝප්පය තහනම් ව තිබී ඇත. ඔවුන්ට උරුම ව තිබී ඇත්තේ පොල් කටුව යි. හයිඩ් කියන්නේ අප්පුහාමිලා හැම විට ම කුලහීනයා නො සලකා හැර, අවමන් කොට යටත් කොට තැබූ බව යි (Heydt, 1744). තත්ත්වය ආරක්ෂා කර ගැනීමට එකල තිබූ ප්‍රධානත ම ආයුධ වූයේ කුලය හා නිලය යි. එබැවින් එදා කුලය හා නිලය හරහා ඔවුහු සෙසු සමාජය හෙවත් පීඩිතයන් පාගා දැමූ හ.

නොක්ස් ගේ වාර්තා වලින් හෙළි වන්නේ කුල ක්‍රමය කොතරම් දැඩි පංති භේදයක් ඇති කරනු ලැබුවත්, කුල අතර යම් ඒකාග්‍රතාවක් තැබූ බැවින් සමාජ ක්‍රමය හැලහැප්පීමකින් තොර ව ක්‍රියාවට නැංවුනු බව යි. හයිඩ්ගේ වාර්තාවලින් හෙළි වන්නේ ද කුලවතා ගෙන් පහර කෑ කුළ හීනයා තමා වරදක් කළ බව සලකා දුවනවා විනා පහර ගැසූ එකාට පහර දීමේ අදහසක් නො පැවති බව යි. හයිඩ්, රිබෙයිරෝ සහ නොක්ස් ආදී සියලු වාර්තා විශ්ලේෂණය කළ විට පැහැදිලි වන එක් සත්‍යතාවක් තිබේ. එනම් එකල සිංහල සමාජ සංස්ථාව මනා ව පවත්වා ගෙන යන ලද්දේ කුලවතා හෝ බලවතා නිරතුරු ව ඉහළින් සිටිය යුතු යයි කුලවතුන් නො වන්නවුන් විසින් පිළිගත් නිසා ය. නැතහොත් ඔවුන් කුලවතුන්ට තර්ජනයක් නොවූ නිසා ය.

- අධිපතිවාදී සිංහල ජන සමාජය එක් අතකින් ප්‍රයෝගකාර ය. තවත් අතකින් කුහක ය. ඒ දෙකට ම වඩා අවස්ථාවාදී ය.

- සිංහල රජු දවස අධිපතිත්වය තහවුරු කර ගත්තෝ ඉංග්‍රිසි ආධිපත්‍යයට ලංකාව යටත් වෙත් ම එවකට පැවති බල පද්ධතියෙන් ගිලිහෙන බව දැන සිංහල ඇඳුම වෙනස් කළෝ ය. ඉංග්‍රිසීන්ට අයත් කලිසම් කමිස ඇඳ, ටයිපටි දමා තොප්පි පැළඳුවෝ ය. භාෂාව වෙනස් කොට සිංහල වෙනුවට ඉංග්‍රිසි කතා කළෝ ය. කෑම් බීම් වෙනස් කොට බත්, මාළු, කැවුම්, කිරිබත් වෙනුවට හැම්, බේකන්, චීස්, පුඩින් , කේක් කෑවෝ ය. ආගම වෙනස් කොට බුද්ධාගම වෙනුවට කතෝලික ආගම වැළඳ ගත් හ.

- බලය ඉංග්‍රිසීන් ගෙන් ගිලිහී ස්වදේශීන් වෙතට පත් වන විට මොවුහු නැවත වරක් වෙනස් වූ හ. සුද්දාගේ පැමිණීම සමඟ උන්ට ගැලපෙන සේ ඇන්ද කලිසම නැවත ගලවා පිරිසරයාට, බයියාට ගැලපෙන ජාතික ඇඳුමට බැස්සෝ ය. ඉංග්‍රිසිය ඔවුන්ගේ මව් බස බවට පත්ව තිබූ නමුත් කැඩුණු සිංහලය හෝ කතා කළ හ (Goonatilake , 1982). අතට අත දීම වෙනුවට ආයුබෝවන් කී හ. හැම්, බේකන් ගෙදර දී අනුභව කලත්, ජනතාව සමඟ කැවුම්, කිරිබත් කෑ හ.

පැරණි සමාජයේ පැවති පිළිගැනීම් අනු ව යුක්තිය හෝ සාධාරණය ඉටු වන්නේ 'යුක්තිය' හෝ 'සාධාරණය' නම් වූ වචනවල තිබෙන නිසග අරුත අනුව නො ව 'යුක්තිය' හා 'සාධාරණය' යනුවෙන් බලවතා හෝ කුලවතා පිළිගත්තේ කුමක් ද යන්න මත ය. කුලයෙන් අඩු තැනැත්තකු සම්ප්‍රදාය කඩන ලද්දේ කවර තැනක ද එතැන ගැටුම අවශ්‍යයෙන් ම සිදු විය. එහෙත් කුලවතා හෝ බලවතා කුමන ආකාරයකින් සම්ප්‍රදාය කැඩුවත් කුල හීනයාට හෝ දුබලයාට කළ හැකි කිසිවක් නැත. ඒ නිසා එවැනි තැන ගැටුමක් ද නැත. කුලයේ හෝ බලයේ මැද සිටින්නෙකු සම්ප්‍රදාය කඩන ලද හොත් ඊට වඩා ඉහළින් සිටින්නකුට යම් මතයක් ප්‍රකාශ කළ හැකි වුව ද පහළ සිටි කුල හීනයන් හෝ දුබලයන් සියල්ල ඉවසා සිටිය යුතු ය. නොක්ස් කියන්නේ දෙවැනි රාජසිංහ රජුට දාව ඔහුගේ ම දියණියට දරුවකු උපන් බවත් දරුවා හා දියණිය ද දරු ප්‍රසූතියේදී ම මිය ගිය බවත් ය. පියා සහ දියණිය අතර ලිංගික සබඳතා අසම්මත බැවිනුත්, සම්මතය බිඳින ලද්දේ ජනතාවගේ ප්‍රධානියා වන රජු විසින් නිසාත් සමාජය තුළ දෙදරීමක් ඇති විය යුතු ය. එහෙත් නොක්ස් කියන්නේ පොදු

ජනතාව එය නො සලකා හරින ලද බව යි. මන්ද ? අධිපතියන්ට කැමැත්තක් කළ හැකි යයි මිනිසුන් විශ්වාස කළ බැවිනි. නොක්ස් මෙහිදී අපූරු සිංහල ප්‍රස්ථා පිරුළක් ඉදිරිපත් කර සිංහලයන් එය සාධාරණීකරණය කරන අයුරු පෙන්වා දෙයි. ඔහු කියන්නේ රජුටත් හිඟන්නාටත් දෝෂාරෝපණය කිරීමට පදනමක් නැතැ යි කියා සිංහලයන් අතර ප්‍රස්ථාපිරුළක් තිබෙන බව ය. 'Non can reproach the king nor the begger' (Knox, 1681 - p .38) කුලහීනයා, දුබලයා හෝ පහත් යයි සම්මත තැනැත්තා නො සැලකිය යුතු අන්දමින් හෝ සම්ප්‍රදාය කැඩුවොත් එතැන දී සමස්ත සමාජ ක්‍රමය ම කැඩුවා සේ සැලකේ. එබැවින් සම්ප්‍රදාය කැඩීම නිසා කුලහීනයෝ, දුබලයෝ වහා දඬුවම් ලැබිය යුතු ය. රාජසිංහ රජු නිසා ඔහුගේ ම දියණියට දරුවකු ලැබීම සිංහලයේ සමස්ත සමාජ වටිනාකම් පද්ධතියේ විශාල දෙදරීමක් සේ සැලකිය යුතු නමුත් ඉන් වටිනාකම්වල දෙදරීමක් ඇති නො වී ය. එහෙත් පිහන් මැටියෙන් සැදූ කෝප්පයක රා බී සම්ප්‍රදාය කැඩූ කුලහීනයා තලා, ඇඳුම් ඉරා, පයින් ගසා පන්නා දැමිය යුතු ය. හයිඩ් සිංහලයන් රා බීමට ගිය ස්ථානයේ දුටුවේ මේ සත්‍යය ය.

> ඉපැරණි සමාජ සංස්ථාව මනා ව පවත්වා ගෙන යන ලද්දේ කුලවතා හෝ බලවතා නිරතුරු ව ඉහළින් සිටිය යුතු යයි කුලවතුන් නො වන්නවුන් විසින් පිළිගත් නිසා ය. නැත හොත් ඔවුන් කුලවතුන්ට තර්ජනයක් නො වූ නිසා ය.

සිංහලයාගේ අද චර්යාව මීට වඩා වෙනස් ද? මෙය සමාජ සජීවීකරණයක් අපේක්ෂා කරන සිංහලයා විසින් සිංහලයාගෙන් ම ඇසිය යුතු ප්‍රශ්නයකි. සිංහලයෝ ඉතිහාසය තුළ අධිපති වාදී චින්තනයක් ඇත්තවුන් බව කොතරම් සාධක, සාක්ෂි මගින් තහවුරු වුව ද, එවැන්නක් ඒත්තු ගැන්වීම අපහසු පසුබිමක දී ඔවුන් අදත් අධිපති වාදීන් යයි කිව හොත් බහුතර පිරිසක් එකහෙළා ම එම මතයට විරුද්ධ වනු ඇත. මන්ද? ඔවුන්, ඔවුන් විසින් ම කියා ගන්නේ සිංහලයන් වනාහි සමානාත්මතාව, කරුණාව, දයාව ආදී ගුණ වලින් යුතු, බුදු දහමෙන් ලත් ආභාෂය සහිත ජනතාවක් වන බව යි.

> එදා ඉහළ යයි සම්මත මිනිස්සු උන්ට ඉහළින් ඇති අයට වැඳ වැටෙමින් පහළින් සිටි අයට පයින් ගැසූ හ. අදත් එසේ ම ය. තමාට උඩින් ඇති අයට පන්දම් අල්ලමින් යටින් ඇති අය තලා පෙලා දමති.

අපක්ෂපාතී විශ්ලේෂණයකට අනු ව කරුණු සලකා බැලුව හොත් අදත් සිංහලයෝ අධිපතිවාදී චින්තනයක් ඇත්තෝ ය. වෙනස් වී ඇත්තේ මුදලි, මුහන්දිරම්කම්, දිසාව, කෝරාළ කම් ආදී තනතුරු පමණි. ඒවා නියෝජනය කරන්නට වෙන තනතුරු ඇති අය සිටිති. වෙනස් වී ඇත්තේ හස්තියා, දෝලාව වැනි ප්‍රවාහන මාධ්‍යයන් ය. ඒවා වෙනුවට මෝටර් රථ, හෙලිකොප්ටර් තිබේ. වෙනස් වී ඇත්තේ උඩු නුවර, යටි නුවර ය. ඒ වෙනුවට අග නුවර හෙවත් කොළඹ තිබේ. එදා උඩු නුවර, යටි නුවර පුරවැසියන් වරප්‍රසාද ලාභීන් වූවා මෙන් ම අද කොළඹ ඇත්තෝ වරප්‍රසාද ලාභීහු ය. කොළඹින් ඈත් වූ ගම්වල ඉන්නේ පිටිසරයෝ ය. නැතහොත් බයියෝ ය. එදා කුලය හෝ ලේ උරුමය මාධ්‍ය කරගෙන බලයට පැමිණියහ. අද ධනය මූලික මාධ්‍ය කරගෙන බලයට පැමිණෙති. (ලේ උරුමය මුළුමනින් නැතුවා නො වේ) බලයට පැමිණීමේ එක ම මාධ්‍ය ලෙස පැවති ලේ උරුමය වෙනුවට වෙනත් මාධ්‍යයන් ද එක් වූවා පමණි. එදා යමෙකුගේ මහන්තත්තකම පෙන්වීමේ, උජාරුව පෙන්වීමේ දර්ශකයක් වූයේ තමා පසු පසින් කොපමණ පිරිසක් ගමන් කරයි ද යන්න යි (Knox, 1681), (Heydt, 1744). අදත් එහි වෙනසක් නැත. ශිෂ්ට යයි සම්මත රෙගුලාසිය, නීතිය, සාධාරණය කුමක් වුවත් තමන්ගේ අන්තේවාසිකයින්ගේ ගොඩ වැඩි කිරීම අරමුණු කොට උන් පිනවීම සඳහා අයුක්තිය, අසාධාරණය රජ කරවනවා විනා සාධාරණය ඉටු වීමට ඉඩ ලැබෙන්නේ නැත. එදා ඉහළ යයි සම්මත මිනිස්සු උන්ට ඉහළින් ඇති අයට වැඳ වැටෙමින් පහළින් සිටි අයට පයින් ගැසූ හ. අදත් එසේ ම ය. තමාට උඩින් ඇති අයට පන්දම් අල්ලමින් යටින් ඇති අය තලා පෙලා දමති. මේ නිසා සිංහලයන්ගේ බහුතරය තුළ එදත් අදත් පවතින්නේ එක ම චින්තනය යි. එනම් අධිපති වාදය යි.

අධිපතිවාදී සිංහල ජන සමාජය එක් අතකින් ප්‍රයෝගකාර ය. තවත් අතකින් කුහක ය. ඒ දෙකට ම වඩා අවස්ථාවාදී ය. සිංහල රජු දවස අධිපතිත්වය තහවුරු කර ගත්තෝ ඉංග්‍රීසි ආධිපත්‍යයට ලංකාව යටත්

වෙත් ම එවකට පැවති බල පද්ධතියෙන් ගිලිහෙන බව දැන සිංහල ඇඳුම වෙනස් කළෝ ය. ඉංග්‍රීසීන්ට අයත් කලිසම් කමිස ඇඳ, ටයිපටි දමා තොප්පි පැළඳුවෝ ය. භාෂාව වෙනස් කොට සිංහල වෙනුවට ඉංග්‍රීසි කතා කළෝ ය. කෑම් බීම් වෙනස් කොට බත්, මාළු, කැවුම්, කිරිබත් වෙනුවට හැම්, බේකන්, චීස්, පුඩින් , කේක් කැවෝ ය. ආගම වෙනස් කොට බුද්ධාගම වෙනුවට කතෝලික ආගම වැළඳ ගත් හ (Goonatilake, 1982). සුද්දාට ගැලපෙන සියලු මෙවලමින් පිරිපුන් ව නැවතත් උන්ට ගැතිකම් කරමින් නැතහොත් උන්ගේ අධිපතිත්වය පිළිගනිමින් පීඩිතයාට නැවතත් අධිපතිකම් පෙන්වූ හ. සිංහල රජු දවස අධිපතිත්වය දැරැවන්ගේ ලේ උරුමක්කාරයන් විසින් ම සුද්දා යටතේ ද අධිපතිකම් දැරූ හ. පොදු ජනතාව නැවතත් ඔවුන් පිළිගත්තෝ ය. මන්ද? අධිපති වාදය බහුතර සිංහලයාගේ උරුමය වූ බැවිනි. නැතහොත් අධිපති වාදය සිංහලයාගේ ප්‍රධාන චර්යා ලක්ෂණයක් වූ බැවිනි.

- නීති, රීති, රෙගුලාසි ආදී සාධාරණය තහවුරු කරන ප්‍රජාතන්ත්‍රවාදී මෙවලම් බොහොමයක් මෙ රටට අපනයනය කරනු ලැබුවේ එංගලන්තය විසිනි. එහෙත් එකී මෙවලම් මනාව ක්‍රියාවට නැගීමට උවමනා කරන චින්තනය ලාංකිකයන් ආනයනය කළේ නැත.
- සාධාරණය රජ කර වීම සඳහා මෙවලම් හා ආයතන විදේශ වලින් ආනයනය කරනු ලැබුවත් චින්තනය තවමත් දේශීය ය. වාහනය හොඳ නමුත් එය ක්‍රියා කරවන රියදුරු අදක්ෂ නම් වාහනයේ නියම ප්‍රයෝජනය ගත නො හැකි ය.

ඉංග්‍රීසීන්ට යටත් ව සිටි මෙ රට මිනිසුන් සර්වජන ඡන්ද බලය උවමනා යයි ඉංග්‍රීසීන්ගෙන් ඉල්ලා සිටියේ නැත. අධිපතියන් වත්, අධිපතියන් නො වන්නවුන් වත් උද්ඝෝෂණ කළේ ද නැත. එහෙත් 1931 දී ඩොනොමෝර් කොමිසම නිර්දේශ කළේ ලාංකිකයන්ට සර්වජන ඡන්ද බලය දෙන්නට ය. සර්ව ජන ඡන්ද බලය අළුත් ම මුහුණුවරක් ගත් සමාජ පෙරළියක් නිසා සිංහල අධිපතියෝ නැවත කැළඹුනා හ. ඩොනොමෝර් කොමිසමට සාක්ෂි දීමට ගිය ඉංග්‍රීසි කතා කරන, ඇතැම් නාගරිකයෝ කීවේ සර්වජන ඡන්ද බලය නො දෙන ලෙස ය. ඔවුන්ගේ කල්පනාව වූ‍ේ පිටිසරයන් කිසිදු වැදගැම්මකට නැති මෝඩයන් බව ය (තලගුනේ, 1998). එහෙත් ඩොනොමෝර් නිර්දේශ

අනු ව ජනතාවට ලැබුණු සර්වජන ඡන්ද බලය අධිපති වාදයට අලුත් ම ස්වරූපයක් දුන්නේ ය. අලුත් ස්වරූපය නම් ඡන්දය අධිපතිත්වය ලැබීමේ ප්‍රධානතම මාධ්‍යයක් බවට පත් වීම යි. මේ නිසා ම ඡන්ද දායකයා හෙවත් අධිපතිත්වය නො දරන්නා වැදගත් වන්නට ද විය. මේ නිසා අධිපතිත්වය දැරීමේ චේතනාව මත ඡන්ද දායකයාට ගැළපෙන පරිදි තම තමන්ගේ ප්‍රතිරූප නැවත හැඩගස්වා ගැනීමට අධිපතීහු කල්පනා කළ හ. මොවීහු සුද්දාගේ පැමිණීම සමඟ උන්ට ගැළපෙන සේ ඇන්ද කලිසම නැවත ගලවා පිටිසරයාට, බයියාට ගැළපෙන ජාතික ඇඳුමට බැස්සෝ ය. ඉංග්‍රීසිය ඔවුන්ගේ මව් බස බවට පත්ව තිබූ නමුත් කැඩුණු සිංහලය හෝ කතා කළ හ (Goonatilake , 1982). අතට අත දීම වෙනුවට ආයුබෝවන් කී හ. හැම්, බේකන් ගෙදර දී අනුභව කළත්, ජනතාව සමඟ කැවුම්, කිරිබත් කෑ හ. කතෝලිකයෝ නැවත බුද්ධාගම්කාරයෝ වූ හ. නැවතත් ඔවිහු ම අධිපතියෝ වූහ. මේ අධිපතීන් අන් කවරෙකුත් නො ව සිංහල රජු දවස සිට ම අධිපති කම් දැරූ ලේ උරුමක්කාරයෝ ම ය. නැතහොත් උන් ඇසුරු කළ අතලොස්සක් වූ ප්‍රභූ පවුල්වලට අයත් වූවෝ වූහ. ජනතාව නැවතත් ඔවුන් පිළිගත්තෝ ය. මන්ද? අධිපති වාදය බහුතර සිංහලයාගේ උරුමය වූ බැවිනි.

එදා පැවති අධිපති වාදයත් අද පවතින අධිපති වාදයත් අතර එක් හඳුනා ගත හැකි වෙනසක් ඇත. එනම් අධිපති වාදය පවත්වා ගෙන යන ආකාරය යි. සිංහල රජු දවස අධිපති වාදය පවත්වා ගෙන යාමට පීඩිතයාගේ, දුබලයාගේ අනුමැතිය අවශ්‍ය වූයේ නැත. එහෙත් ඉංග්‍රීසි යටත් විජිත යුගයෙන් පසු ව ප්‍රජාතන්ත්‍රවාදය නමින් පැමිණි සර්වජන ඡන්ද බල රැල්ලට අධිපතීන් ගසා ගෙන යාම නිසා ලේ උරුමය මත පැවති මුදලි, මුහන්දිරම්කම්, කෝරාළකම් අවලංගු වී ගියේය. එබැවින් අද සිටින අධිපතීන්ට උන්ගේ පැවැත්ම සඳහා අධිපතීන් නො වන්නවුන්ගේ ආධාර උපකාර අවශ්‍ය වී තිබේ (තලගුනේ, 1998) . එදා අධිපතීන් එකල සිටි අධිපතීන් නො වන්නවුන් සමඟ තුබූ සම්බන්ධතාවේත්, අද අධිපතීන්, අද ජීවත් වන අධිපතීන් නො වන්නවුන් සමඟ තිබෙන සම්බන්ධතාවේත් වෙනස මෙ පමණකි. වෙනත් ආකාරයකින් කිවහොත් එදා මෙන් නො ව අද සිටින අධිපතියාට තමාගේ පැවැත්ම සඳහා පීඩිතයාගේ ඡන්දය උවමනා

ය. අද සිටින අධිපතීන්ගේ ප්‍රදර්ශිත මහජන කරුණාව ඒ නිසා ය. ප්‍රදර්ශිත සමාජවාදය ඒ නිසා ය. ප්‍රදර්ශිත මනුෂ්‍යකම ඒ නිසා ය. නො එසේ ව ඔවුන්ගේ චින්තනයේ මහා පරිවර්තනයක් සිදු ව ඇති නිසා නො වේ. චින්තනයේ පරිවර්තනයක් වූයේ නම් සමාජය අද තිබෙන තැනට වඩා බොහෝ ඉදිරියෙන් තිබිය යුතු ය. සමාජ සජීවීකරණය සඳහා අලුතෙන් ගත යුතු ක්‍රියාමාර්ගයක් ඉතිරි ව තිබෙන්නේ ද නැත. මන්ද? අධිපතිවාදී චින්තනයෙන් මිදෙන හැම පියවරකදී ම සමාජ සජීවීකරණයක් ද නිසැකයෙන් සිදු වන බැවිනි. චින්තනයේ පරිවර්තනයක් සිදු වූ තැනැත්තන් නැත්තේ ද නො වේ. එහෙත් බහුතරයක ගේ අධිපතිවාදී ආධිපත්‍ය තුළ උන්ගේ පරිවර්තනය නො සැලකිය යුතු තරම් ය.

මනුෂ්‍යයාගේ දක්ෂකම, හැකියාව ආදී ගුණයන් ඉස්මතු කිරීම වෙනුවට කුලය, බලය ආදී ආරෝපිත මිනිස් වටිනාකම් ඉස්මතු කරනු ලැබූ අධිපති වාදී පැරණි ජන සමාජය වෙනස් කිරීම සඳහා බැහැරින් ආනයනය කරන ලද ප්‍රජාතන්ත්‍රවාදී මෙවලම් වර්තමාන සමාජ සංස්ථාව තුළ ක්‍රියාවේ යෙදුණ ද, එනම් නීති රීති, රෙගුලාසි, චක්‍රලේඛ, උසාවි ආදී සාධාරණය ඉදිරියට පමුණු වන ආම්පන්න වලින් යුක්ත වුව ද, ඒවායේ නිසි ඵල ලැබීමට අධිපතිවාදී චින්තනය බාධකයක් ව තිබේ. එහෙත් බැහැරින් පැමිණි නව ආයතන සම්ප්‍රදාය හරහා මිනිස් අයිතිවාසිකම් යම් තාක් දුරට ආරක්ෂා කර ගැනීම මෙ රට පීඩිතයන් ලැබූ ප්‍රබල ජයග්‍රහණයකි.

බැහැරින් ආනයනය කරනු ලැබූ ප්‍රජාතන්ත්‍රවාදී මෙවලම් කුමක් වුව ද මෙරට බහුතර ජනතාව අදත් ගැති කම් කරන්නේ අධිපති වාදයට මිස ප්‍රජාතන්ත්‍ර වාදයට නො වේ. එදා ලේ උරුමයෙන් බලය තහවුරු කර ගත් බලවතා පිටුපස තල් අත්ත ඇල්ලූ පීඩිතයා නියෝජනය කළ සමාජ කොට්ඨාශයත්, අද ප්‍රජාතන්ත්‍රවාදී මෙවලම් හරහා බලයට පැමිණි බලවතුන් පිටුපස වග විභාගයකින් තොර ව, අවිචාරයෙන් දුවන සමාජ කොට්ඨාශයත් අතර ඇත්තේ එක සමාන මානසික ස්වභාවය කි. එදා වලව්කාරයාගේ, අප්පොලාගේ, හාමුදුරුවන්ගේ තේජස පෙන්වීමට මුගුරු අතැති ව සිටි බත් බැලයන් රැළ තුළත්, අද බලධාරියාගේ තේජස පෙන්වීමට තුවක්කු, පිස්තෝල අතැති ව සිටින

මැර කණ්ඩායම් තුළත් තිබෙන්නේ එක සමාන පරාවර්තිත බලයකි (Reflective Power). එදා රජු වෙත නො තිබූ ගුණ ගයා ප්‍රශස්ති ගී ගැයූ වන්දිභට්ටයන් තුළත්, අද බලවතුන් තුළ නැති ගුණ වනා ආත්ම ලාභය සොයන එහෙයියන් තුළත් ඇත්තේ එක සමාන මානසික ස්වභාවයකි. එදා තල් අත්තෙන් ආවරණය ලැබූ ලේ උරුමක්කාර බලවතුන් ගේ ඔළුවල ගැබ් ව තුබූ මහන්තත්තකමත්, අද අන්තේවාසිකයන් රැස් කරන්නා වූ බලවතුන්ගේ ඔළුවල ගැබ් ව ඇති මහන්තත්ත කමත් එක ම ය. පැරණි ජන සමාජය හා අද ජන සමාජය සමඟ සසඳන විට වෙනස් ව ඇත්තේ ඇඳුම්, පැළඳුම්, ගේ දොර, යාන වාහන ආදී ද්‍රව්‍ය පදනම මිස චින්තනය නො වේ. සිතුම් පැතුම්, චර්යා රටා, ගති ගුණ අදත් එදා පරිදි ම ය. නැතහොත් වෙනස් ව ඇත්තේ නො සැලකිය යුතු මට්ටමිනි.

> එදා වලව්කාරයාගේ, අප්පොලාගේ, හාමුදුරුවන්ගේ තේජස පෙන්වීමට මුගුරු අතැති ව සිටි බත් බැලයන් රැළ තුළත්, අද බලධාරියාගේ තේජස පෙන්වීමට තුවක්කු, පිස්තෝල අතැති ව සිටින මැර කණ්ඩායම් තුළත් තිබෙන්නේ එක සමාන පරාවර්තිත බලයකි (Reflective Power). එදා රජු වෙත නො තිබූ ගුණ ගයා ප්‍රශස්ති ගී ගැයූ වන්දිභට්ටයන් තුළත්, අද බලවතුන් තුළ නැති ගුණ වනා ආත්ම ලාභය සොයන එහෙයියන් තුළත් ඇත්තේ එක සමාන මානසික ස්වභාවයකි.

මීට පෙර ද සඳහන් කළ පරිදි නීති, රීති, රෙගුලාසි ආදී කුඩු මහත් සියලු ප්‍රජාතන්ත්‍රවාදී උපකරණ මනා ව භාවිතයට යෙදීමට මිනිස් චින්තනයේ වෙනස්කම් උවමනා වේ. ශ්‍රී ලංකා ජන සමාජයේ නැත්තේ ද මෙය ය. ඕනෑවටත් වැඩි තරම් නීති, රීති සහ රෙගුලාසි ඇතත් ඒවා ක්‍රියාවට නගන්නෝ අධිපති වාදී චින්තනය ඇත්තවුන් වූ ශ්‍රී ලාංකිකයන් ම බැවින් සමාජ පරිවර්තනයක් සිදු වන්නේ ඉතාමත් හෙමිහිට ය.

නීති, රීති, රෙගුලාසි ආදී සාධාරණය තහවුරු කරන ප්‍රජාතන්ත්‍රවාදී මෙවලම් බොහොමයක් මෙ රටට අපනයනය කරනු ලැබුවේ එංගලන්තය විසිනි. එහෙත් එකී මෙවලම් මනාව ක්‍රියාවට නැඟීමට උවමනා කරන චින්තනය ලාංකිකයන් ආනයනය කළේ නැත. එංගලන්තයට මෙවලම් අපනයනය කළ හැකි වුවත්, චින්තනය අපනයනය කළ නො හැකි ය. එය අවශ්‍ය නම් දේශීයයන් විසින්

ආනයනය කළ යුත්ත කි. මේ නිසා බැහැරින් ගත් ප්‍රජාතන්ත්‍රවාදී මෙවලමත්, දේශීය වූ අධිපතිවාදී චින්තනයත් අතර ප්‍රබල පරස්පර විරෝධතාවක් මතු වී තිබේ.

ක්‍රි. ව. 2000 වර්ෂයේ ජූලියේ දී එංගලන්ත අගමැති ටෝනි බ්ලේයර් ගේ පුත් ඉයුවාන් බීමතින් වාහනයක් පැදවීමේ වරදට හසු විය. 16 හැවිරිදි ඉයුවාන් තම විභාගය අවසන් ව පැවැති සාදයේ දී බීමත් ව සාදය අවසන තම වාහනය පදවා එම ඔහු කළ වරද විය. ඉයුවාන් ගේ පියා ටෝනි බ්ලේයර් මෙහිදී කියා සිටියේ තමා අගමැති බව නො සලකා ඉයුවාන් නීතිය ඉදිරියට පමුණුවා නිසි දඬුවම් ලබා දිය යුතු බව යි. මේ සිදු වීම එංගලන්ත සමාජයේ ප්‍රජාතන්ත්‍ර වාදී චින්තනය පිළිබඳ කදිම නිදසුන කි. ලංකාවේ දී මෙවැනි සිදු වීමක් ප්‍රබල බලවතෙකුගෙන් නො ව උප බලවතෙකුගෙනුත් නො ව ඊටත් වඩා යට මට්ටමේ බලවතෙකුට සම්බන්ධ අයෙකු ගෙන් වුව ද සිදු වන්නේ ටෝනි බ්ලේයර් ගත් ක්‍රියාමාර්ගයේ අනෙක් පැත්ත ය. එනම් වහා පොලිසියට නියෝග දී පුත්‍රයා නිදහස් කර ගැනීම ය. නැතහොත් පුත්‍රයා වෙනුවට තැරැව් කරුවකු ඉදිරිපත් කිරීම ය. ලංකාවේ චින්තනය අනුව තම පුත්‍රයා තබා තමාට හිතවත් ව සිටී නම් සමාජ ද්‍රෝහී, නම ගිය අපරාධකාරයකුවත් නීතිය ඉදිරියට පැමිණවීමට බලධාරීන් කටයුතු කරන්නේ නැත. ඒ වෙනුවට කරන්නේ එවැනි සමාජ ද්‍රෝහීන් ආරක්ෂා කිරීමට කටයුතු කිරීම ය. මන්ද? අධිපති වාදී චින්තනයට නීතියක් රීතියක් සාධාරණයක් නැති නිසා ය. සාධාරණය රජ කර වීම සඳහා මෙවලම් හා ආයතන විදේශ වලින් ආනයනය කරනු ලැබුවත් චින්තනය තවමත් දේශීය ය. වාහනය හොඳ නමුත් එය ක්‍රියා කරවන රියදුරු අදක්ෂ නම් වාහනයේ නියම ප්‍රයෝජනය ගත නො හැකි ය. ලංකාවේ නීති, රීති රෙගුලාසි ක්‍රියාවට නැඟීම සම්බන්ධයෙන් කිව යුතු ව ඇත්තේ ද මේ කතාව ම ය.

චීන ජනප්‍රවාදයකට අනුව පරායත්ත මානසිකයේ එක් ස්වරූපයක් විස්තර වන්නේ මෙසේ ය. පාළමකින් එගොඩ වීමේ බලාපොරොත්තු ඇති ව බොහෝ වේලාවක් පාළම අද්දර බලා සිටින ගොනෙකුගෙන් කුරුල්ලෙකු මෙසේ ඇසී ය. 'යාළුවා උඹ පාළමින් එගොඩ වීමට ද බලා සිටින්නේ' 'ඔව් , ඔව් ඒකට තමයි' ගොනා කී ය. 'ඇයි ඉතින් එගොඩ නො වී බලා සිටින්නේ' කුරුල්ලා නැවත ඇසී ය. 'මම කොහොමද අනික් පැත්තට යන්නේ, මට නාස් ලණුවක් නැහැ. මාව ඇදගෙන යන්න කෙනෙකුත් නැහැ' ගොනා කී ය. 'නාස් ලණුවක් නැත්නම්, ඇදගෙන යන්න කෙනෙකුත් නැත්නම් උඹේ බලාපොරොත්තුව හොඳ හැටි ඉටු කර ගන්න පුළුවන්නෙ. මමත් උදව් කරන්නම්. උඹ අනික් පැත්තට පලයං.' කුරුල්ලාගේ උපදේශය වී ය. 'කුරුල්ලෝ උඹ මට කරදර කරන්න නේද හදන්නේ. කව්රු කිව්වත් මගේ නාස් ලණුවෙන් ඇදගෙන යන තුරු මම නම් පාළමෙන් එගොඩට යන්නේ නැහැ' ගොනා ගේ පිළිතුර විය.

## පරායත්ත මානසිකය

තමන් මත නො ව අනුන් මත බලාපොරොත්තු තැබීමේ මානසිකය හෙවත් පරායත්ත මානසිකය සිංහලයාගේ සමාජ පසුබිම් නියතය නිර්මාණය කළ තවත් ප්‍රධාන චර්යා ලක්ෂණයකි. සමාජ සජීවීකරණය පිළිබඳ ව සාකච්ඡා කරන විද්වත් හු නිරන්තරයෙන් සාකච්ඡාවට ගනු ලබන පරායත්ත මානසිකය (Dependancy Syndrome) සජීවීකරණයේ ප්‍රධානතම බාධකයක් ලෙස ද සලකති. පරායත්ත මානසිකත්වයේ ස්වරූප ගණනාවකි. තමාට නො හැකි ය. තමාට නො මැති ය. යනුවෙන් නිරතුරු ව සිතමින් ඒ අනුව කටයුතු කිරීම එක් ස්වරූපයකි. ආත්ම විශ්වාසයෙන් තොර වීම තවත් ස්වරූපයකි. පරශක්තීන් පිළිබඳ ව අසීමිත ව විශ්වාස තැබීම තවත් ස්වරූපයකි. මන්දෝත්සාහී බව, පසුගාමී බව තවත් ස්වරූපයකි. චීන ජනප්‍රවාදයකට අනුව පරායත්ත මානසිකයේ එක් ස්වරූපයක් විස්තර වන්නේ මෙසේ ය. පාළමකින් එගොඩ වීමේ බලාපොරොත්තු ඇති ව බොහෝ වේලාවක් පාළම අද්දර බලා සිටින ගොනෙකුගෙන් කුරුල්ලෙකු මෙසේ ඇසී ය. 'යාළුවා උඹ පාළමින් එගොඩ වීමට ද බලා සිටින්නේ' 'ඔව් , ඔව් ඒකට තමයි' ගොනා කී ය. 'ඇයි ඉතින් එගොඩ නො වී බලා සිටින්නේ' කුරුල්ලා නැවත ඇසී ය. 'මම කොහොමද අනික් පැත්තට යන්නේ, මට නාස් ලණුවක් නැහැ. මාව ඇදගෙන යන්න කෙනෙකුත් නැහැ' ගොනා කීය. 'නාස් ලණුවක් නැත්නම්, ඇදගෙන යන්න කෙනෙකුත් නැත්නම් උඹේ බලාපොරොත්තුව හොඳ හැටි ඉටු කර ගන්න පුළුවන්නෙ. මමත් උදව්

කරන්නම්. උඹ අනික් පැත්තට පලයං' කුරුල්ලාගේ උපදේශය වී ය. 'කුරුල්ලෝ උඹ මට කරදර කරන්න නේද හදන්නේ. කව්රු කිව්වත් මගේ නාස් ලණුවෙන් ඇදගෙන යන තුරු මා නම් පාළමෙන් එගොඩට යන්නේ නැහැ' ගොනා ගේ පිළිතුර විය.

> 'මට නැත. මට නො හැකි ය. මම දුප්පත් ය' යනුවෙන් කීමට මිස 'මට තිබේ. මට හැකිය. මම පොහොසත් ය' කීමට පැරණි ශ්‍රී ලාංකිකයෝ බිය වූ හ. මක් නිසාද? හැකි නම්, තිබේ නම්, පොහොසත් නම් රජුට හෝ රාජ පුරුෂයන්ට එම සම්පත් දීමට සිදු වන නිස ා ය (Knox, 1681 P.32).

ශ්‍රී ලංකාවේ පොදු ජනතාව පරායත්ත මානසිකත්වයකින් යුතු ජනතාවක් බව පසක් කර ගෙන ඇත්තේ ග්‍රාමීය සංවර්ධනයට යම් මැදිහත්වීමක් දක්වා ඇති ඇතැම් රාජ්‍ය නිලධාරීන්, දේශපාලකයන් සහ සංවර්ධන නියමුවන් විසිනි. කෙසේ වෙතත් මෙ රට ගැමි ජනතාව පරායත්ත මානසිකත්වයකින් යුතු යැ යි කියනු ලබන්නේ කිසියම් දාර්ශනික මත වාදයක් මත පිහිටීමෙන් හෝ ප්‍රමාණවත් තොරතුරු රැස් කිරීමක් තුළින් සිදු වූ විශ්ලේෂණයකින් හෝ ගැමියන්ගේ චර්යාව පිළිබඳ ව කරනු ලැබූ පර්යේෂණ මත පිහිටීමෙන් හෝ නො වේ. මෙවැනි තීන්දුවකට එළඹ ඇත්තේ හුදෙක් ග්‍රාම සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මඟින් ඉහත කී පිරිස් ලැබූ අත්දැකීම මත ය. වෙනත් ආකාරයකින් කිව හොත් ගැමියන් තුළ ඇති සහනාධාර අපේක්ෂාව, ඉදිරියට යාමට ඇති අකැමැත්ත, ග්‍රාම සංවර්ධන වැඩසටහන් සඳහා තිබෙන ප්‍රතිගාමී සහභාගිත්වය, ශ්‍රමදාන, ගැමි රැස්වීම් ආදියට සහභාගි වීමේ දී යමක් ලබා ගැනීමට තිබේ නම් පමණක් ගැමියන් සහභාගි වීම ආදී අනුන් මත රැඳීමේ චර්යා ලක්ෂණ නිරීක්ෂණය කිරීම මත ය.

පරායත්ත මානසිකත්වය යයි මේ ග්‍රන්ථය තුළ දී හඳුන්වා දෙනු ලබන චර්යා රටාව යථෝක්ත විස්තර කිරීම්වලට වඩා තරමක් පුළුල් ය. එය ගැමියන් තුළ ඇති සහනාධාර අපේක්ෂාව, යමක් ලබා ගැනීමට ඇත්නම් පමණක් සංවර්ධන වැඩසටහන්වලට සහභාගි වීම යනාදී ගැමි චර්යා ලක්ෂණ මත පමණක් විස්තර කෙරෙන සංකල්පයක් නො වේ. එය ගැමියන්ට පමණක් සීමා වූවක් ද නො වේ. මෙ රට බහුතරයක් වන ජනතාව කෙරෙන් විද්‍යමාන වන පරායත්තතාව

සමාජයේ සමස්ත චර්යා පද්ධතියෙන් වෙන් කොට ගැනීමට හැකි හුදකලා චර්යාවක් සේ මේ ග්‍රන්ථය තුළ විස්තර නො වේ. එය ඔවුන්ගේ ඓතිහාසික සමාජ පරිසරය සමඟ සම්බන්ධ ය. ආර්ථික මට්ටම් සමඟ සම්බන්ධ ය. හැදියාව සමඟ සම්බන්ධ ය. ඇදහිල්ල හා විශ්වාස සමඟ සම්බන්ධය. සිතුම් පැතුම් සමඟ සම්බන්ධ ය. සමාජ වටිනාකම් සමඟ සම්බන්ධ ය.

මෙ රට බහුතර ජනතාව තුළ පරායත්ත මානසිකත්වයක් ඇති බව හෙළිදරව් වන්නේ ඔවුන්ගේ වර්තමාන හැසිරීම් රටාව තුළින් පමණක් නො වේ. ඓතිහාසිකව ද එය සත්‍යයකි. පරායත්ත මානසිකත්වය හුදෙක් යටත්විජිත වාදයේ ප්‍රතිඵලයකැ යි විග්‍රහ වුව ද යටත් විජිත වාදය පරායත්ත මානසිකත්වය ඇති කිරීමේ එක් සාධකයක් පමණක් වන්නට ඇති බව ඓතිහාසික සාක්ෂිවලින් පෙනී යයි.

නොක්ස් ගේ හා හයිඩ් ගේ වාර්තාවලින් හෙළිදරව් වන පරිදි මෙ රට ජනතාව තුළ පැල පදියම් ව ඇති පරායත්ත මානසිකත්වයට හේතු වන සාධක දෙකකි. ඉන් පළමුවැන්න ජනතාව ජීවත් වූවා වූ සමාජ - ආර්ථික පසුබිම යි. දෙවැන්න ඔවුන්ගේ විශ්වාස පද්ධතිය යි. රට වැසියාට ඔවුන්ගේ අභිංසක උවමනාවන් ඉටු කර ගැනීමේ කැමැත්ත පවා අනුන් මත තැබීමට සිදු වූ සමාජයක ස්වශක්තියක් හෝ ආත්ම විශ්වාසයක් කෙසේ වර්ධනය විය හැකි ද යන්න ළමා මනෝ විද්‍යාවේ හෝ වැඩිහිටි මනෝ විද්‍යාවේ මූලික සිද්ධාන්ත දන්නෝ පහසුවෙන් වටහා ගනිති (Wrightsman,1994). හැකියාවන්, දක්ෂකම්, විචක්ෂණකම් ආදී සියල්ල පුද්ගලයා තුළින් ඉස්මතු වන්නේ ස්වශක්තියට වටිනාකමක් තිබෙන සමාජයකින් හා ස්ව ශක්තිය කෙරෙහි විශ්වාසය තබන මනුෂ්‍යයන් සිටින සමාජයකින් පමණි. ස්වශක්තිය යන වචනයේ තේරුම වන්නේ ද යමෙකුගේ අභ්‍යන්තරය කෙරෙන් මතු වන ශක්තිය, දක්ෂකම, හැකියාව යන්න ය.

නොක්ස් ගේ සහ හයිඩ් ගේ විස්තරවලට අනුව ඓතිහාසික සමාජ පරිසරය තුළ සිංහලයාට තම තමන්ගේ දක්ෂකම්, විචක්ෂණකම් පෙන්වීමට නැත හොත් ස්වශක්තියෙන් නැඟී සිටීමට කිසිදු අවසරයක් තිබී නැත. සියල්ල රජු සහ රජු යටතේ ක්‍රියාත්මක වූ නිලධාරි තන්ත්‍රය

මගින් යටපත් කරනු ලැබින. යම් දක්ෂකමක් ඇත්තකු වෙතොත් ඔහු රජුට හෝ ආගමික ස්ථානයකට පමණක් සේවය කළ යුතු ව තුබූ බව සිංහලයාගේ ඓතිහාසික නටඹුන්වලින් ද මනා ව පැහැදිලි ය. ඓතිහාසික මොහෙන්දෝජාරෝ හරප්පා ශිෂ්ඨාචාරයේ නටඹුන් අතර පොදු ජනතාව ප්‍රයෝජනයට ගත් නානපොකුණු, මන්දිර, වැසිකිළි, කම්හල්, අවන්හල්, මහාමාර්ග ආදිය ප්‍රධාන තැනක් ගනු ලැබුවත් ඉපැරණි ඉතිහාසයට අයත් ලාංකීය ඓතිහාසික නටඹුන් තුළින් වුව ද පොදු ජනතාව පිළිබඳ ව කිසිවක් නො කියැ වේ. සිංහලයාගේ ඓතිහාසික නටඹුන් අතර රජු හෝ ආගම සම්බන්ධ නටඹුන් හැරුණු විට පොදු ජනතාව සම්බන්ධ කිසිවක් නැත. නොක්ස් එක් අවස්ථාවක ඔහුගේ වාර්තාවේ සඳහන් කර ඇත්තේ තමා විසින් කටු මැටි බිත්තියෙන් තනා සෙවිලි කර ගත් නිවසේ බිත්තිවල සුදු හුණු ටිකක් ආලේප කරනු ලැබුව ද හුණු ආලේප කල නිවෙස්වල වාසය කිරීම රාජ උදහසට ලක් විය හැකි රාජ්‍ය විරෝධී ක්‍රියාවක් බව පසු ව සිංහලයන්ගෙන් දැන ගත් බව යි. සිංහලයන්ගේ ස්වශක්තිය වැළලී ගොස් ඔවුන් අනුන් මත රැඳෙන පසුගාමීන් බවට පත් වූයේ මේ ඓතිහාසික සමාජ පරිසරය විය හැකි ය.

විජාතිකයන් ලියූ ඓතිහාසික වාර්තාවලින් හෙළි වන පරිදි පරිහානියට පත් සිංහල රාජ්‍ය පාලන කාලය තුළ රජුගේ හා රාජ පුරුෂයන්ගේ අභිලාෂය වී ඇත්තේ සමාජය හැකි තරම් දිළිඳු මට්ටමකින් පවත්වා ගෙන ගොස් පරායත්ත මානසිකයක් තහවුරු කරවීම යි. මේ අභිලාෂය වෙනස් වී ඇත්තේ රජුගේ ප්‍රධානතම බදු ආදායම බවට තුබූ කෘෂිකර්මය සම්බන්ධයෙන් පමණි. කිසිවෙකු ස්වශක්තියෙන් නැගී සිටිනු දැකීමට පාලකයන් රිසි නො වූහ. මහන්සියෙන් හරි හම්බ කර ගත් දෙයක් පාලකයන්ගෙන් බේරා ගැනීමට ජනතාවට නො හැකි වූ නිසා ජනතාව අනුන් මත රැඳීම තමන්ගේ ස්වශක්තියට වඩා තර්කානුකූල බව සිතන්නට ඇත. මේ නිසා මට නැත. මට නො හැකි ය. මම දුප්පත් ය යනුවෙන් කීමට මිස මට තිබේ. මට හැකිය. මම පොහොසත් ය කීමට ජනතාව බිය වූ හ. මක් නිසාද? හැකි නම්, තිබේ නම්, පොහොසත් නම් රජුට හෝ රාජ පුරුෂයන්ට එම සම්පත් දීමට සිදු වන නිසාය. ' .......Yet fush is the government they are under, that they are afraid to be known to have

any thing, left it to be taken away from them' (Knox 1681 P. 32). 'ජනතාව යමක් අතිරික්ත ව තබා ගැනීමට බිය වෙති. මන්ද? අතිරික්ත ව තිබෙන දේ පාලකයන් විසින් ගෙන යනු ලබන නිසා ය.' මිනිසුන් සතු භෞතික සම්පත් පමණක් නො ව රූමත් කාන්තාවක් සිටින ස්වාමි පුරුෂයෙකුට තම බිරිඳ රැක ගැනීමට ද එ කළ අපහසු විය. රජු හෝ රාජ පුරුෂයන් උන්ගේ හිතු මතය පරිදි විවාහක අවිවාහක බව ද නො සලකා කාන්තාවන් උන් වෙත ගෙන ගිය හ.

- සිකනලෙක් වැනි කුඩා සතෙකු (ශුණා) මොවුන් සලකන්නේ ඔවුන්ගේ අනාගත වක්තෘ කෙනෙකු වශයෙනි (Knox, 1681 P. 64).

- සිංහලයන්ට කටයුතු සිදු කිරීමට තිබෙන ඉඩ කඩට වඩා කල් දැමීමට ඇති ඉඩ කඩ වැඩි ය. පැරණි සිංහලයෝ වනාහි කුදු මහත් සියළු කටයුත්තක් ම පර ශක්තියක් මත සිදු වේ යයි සැලකූ මිනිසුන් මිස ස්වශක්තියක් මත කිසිවක් සිදු කල හැකි යයි විශ්වාස කළ මිනිසුන් නො වී ය.

ශ්‍රී ලාංකික ජන සමාජයේ දිළිඳුකම පිළිබඳ ව සාකච්ඡා කරන හයිඩ් වරක් කියන්නේ සිංහලයන්ට සත්ව පාලනය මගින් ආහාර හා ආදායම් උපයා ගැනීමට මහඟු අවස්ථාවක් හා පරිසරයක් ඇතත් රජුගේ පාලනය ඊට ප්‍රධානත ම බාධාව බව යි (Heydt, 1744 P 120). රොබට් නොක්ස් කියන්නේ සත්ව පාලනයේ බාධකයන් සේ පවතින නරින්ගෙන් කුකුළන්ට වන හානිය හෝ කොටින්ගෙන් ගවයන්ට වන හානියට වඩා රජුන්ගෙන් හා රාජ පුරුෂයන්ගෙන් වන හානිය වඩාත් තීරණාත්මක බව යි. මක් නිසාද? රජුගේ ඒකායන පරමාර්ථය වන්නේ මිනිසුන් දිළින්දන් ලෙස හෝ හිඟ පාඩු ඇති එවුන් සේ පවත්වා ගෙන යාම බැවිනි. රජු හා රාජ පුරුෂයන්ගේ කටයුතු පොදු ජනතාවගේ නිදහසට, ආර්ථික දියුණුවට කොතෙක් දුරට බාධාකාරි වූයේ ද යන්න පිළිබඳ ව රොබට් නොක්ස්ගේ පහත සඳහන් ප්‍රකාශය සාක්ෂි දරයි. 'For here are many Jackalls, which catch their Hens and fome Tigres, that destroy their cattle : but the greatest of all is the King; whofe endeavour is to keep them poor and in want' (Knox, 1681 P. 87).

පරායත්ත මානසිකත්වය දිළිඳුකම සමඟ දැඩි සම්බන්ධකමක් දක්වයි. රජු සහ රජුගේ පාලනයට සම්බන්ධ නිලධාරි තන්ත්‍රය හැරුණු විට මෙරට මුළු මහත් පොදු ජනතාව ම දිළින්දන් බවත්, යැපුම් මට්ටමෙන් ඔබ්බට බලාපොරොත්තු නො තුබූ ජන කොටසක් බවත් හයිඩ් ගේ මෙන්ම නොක්ස් ගේ වාර්තා වලින් ද හෙළි වේ. කටු මැටි ගසා අතු සෙවිලි කර සකස් කර ගනු ලැබූ එක කාමරයකින් පමණක් යුතු නිවසත්, වගාවට උවමනා උපකරණ කීපයත්, යන්තමින් විලි වසා ගැනීමට තරම් ප්‍රමාණවත් වස්ත්‍රත් හැළි වළං කීපයකුත් හැරුණු විට මධ්‍යකාලීන යුගයේ සිංහලයන්ට තිබී ඇති වෙනත් කිසිදු සම්පතක් නැත. ලුණුත්, සහලුත් ඇතොත් ඔවුන් ස්වයංපෝෂිත යයි සිතූ බවත්, ඉන් ඔබ්බට තුබූ බලාපොරොත්තුවක් නො මැති බවත් නොක්ස් ඔහුගේ වාර්තාවේ පැහැදිලි ව සඳහන් කර යි. වර්තමාන සිංහලයන්ට බැහැරින් ලැබුණු නව තාක්ෂණය, අධ්‍යාපනය ආදී පහසුකම්වල ආධාරය ලැබුණ ද අදත් ඔවුන් ගෙන් බොහොමයක් අත්‍යයන්තයෙන් ම දිළින්දෝ ය. දිළින්දෝ දිළින්දන් නො වන්නවුන් ගෙන් යමක් ලබා ගැනීමේ චේතනාව සහිත ව සිටීම පරායත්ත මානසිකයක් ලෙස හැඳින්වුව ද එය පැවැත්ම සඳහා ඔවුන් තුළ නිර්මාණය වී ඇති චර්යාවන් ලෙස ද විස්තර කළ හැකි ය.

සිංහලයන්ගේ ඇදහිලි හා විශ්වාස තුළ ද පදනම පරායත්ත මානසිකය ම ය. එය ඓතිහාසිකව ද වර්තමානයේ දී ද එක සමාන වූ සත්‍යයයකි. හයිඩ් සිංහලයන්ගේ ඇදහිලි හා විශ්වාස පිළිබඳ ව මෙසේ සඳහන් කර යි. මෙ රට වැසියන්ට ඕනෑම අසනීපයක් හෝ අතුරු ආන්ත්‍රාවක් වූ විට ඔවුන්ගේ දෙවියන් වශයෙන් සලකන ලද ප්‍රතිමා ඇති තැනට යති. එතැන විවිධාකාර වූ දේව ප්‍රතිමා තිබේ. ඇතැම් දේව ප්‍රතිමා වලට මනුෂ්‍යයන්ගේ මෙන් මුහුණු ද, ඇතැම් දේව ප්‍රතිමාවලට වන සතුන්ගේ මුහුණු ද තිබේ. අසනීපයට හෝ කරදරයට පත් වූ මනුෂ්‍යයෝ දෙවියන්ට යම් යම් දේ දීමට පොරොන්දු වී ඒ වෙනුවට තමාගේ කාර්ය කර දෙන මෙන් ඉල්ලති. (හයිඩ් මේ කියන්නේ දෙවියන්ට බාර වීම පිළිබඳ ව ය.) මෙය මනුෂ්‍යයන් හා දෙවියන් අතර අන්‍යොන්‍ය වශයෙන් ඇති කර ගනු ලබන ගිවිසුම කි. දෙවියන් කාර්ය නො කළහොත් ඔවුන් සිතන්නේ දෙවියන්ට දීමට පොරොන්දු වූ දේ ප්‍රමාණවත් නො වූ නිසා කාර්යය ඉටු නො වන බව ය. මේ නිසා

යළිත් දෙවියන් හමු ව ගිවිසුම පළල් කොට දෙවියන් සතුටු කිරීමට මුලින් පොරොන්දු වූ දේටත් වඩා වැඩියෙන් දීමට පොරොන්දු වෙති. තව දුරටත් කාර්ය ඉටු නො වේ නම් ඔව්හු දෙවියන්ට පළි ගසති. ශාප කරති. දෙවියන් මැදිහත් වී ඔවුන්ගේ කාර්ය ඉටු කර නො දුන්න ද දෙවියන්ගේ පැවැත්මට මොවුන්ගෙන් තර්ජනයක් ඇති නොවේ. මන්ද? කිසිවක් ඉටු නො වූ විට ඔවුන් කියන්නේ දෙවියන්ගේ වරදක් නො ව ග්‍රහයා නරක විට දෙවියන් කුමක් කරන්න ද කියා ය.

ජර්මානු ජාතික හයිඩ් වාර්තා කළ කාලයට වඩා ශත වර්ෂයකට පමණ පෙර වාර්තාවක් ලියූ පෘතුගීසි ජාතික රිබෙයිරෝ ශ්‍රී ලාංකිකයන්ගේ ඇදහිලි ගැන කීවේ හයිඩ් කී අදහසට සමාන අදහසකි. ‘To begin with these people in their superstition and worship of idols resemble all the people of India but they differ in some aspects.... Their idols are of various shapes: such as a man or woman, or monky, some like an elephant with numerous arms and other represented with a bow and arrows, in fact the variety of figures is unlimited’ (Rebeiro, 1685 P 118) ‘මොවුන්ගේ ඇදහිල්ල ඉන්දියානුවන්ගේ ඇදහිල්ලට බෙහෙවින් ම සමාන ය. එහෙත් සමහර පැතිවලින් වෙනස් ය. ඇදහිල්ලට ගන්නා ප්‍රතිමා හැඩ රුව අතින් විවිධාකාර ය. ඇතැම් ප්‍රතිමාවලට පිරිමින්ගේ හැඩ රුව ද, ඇතැම් ඒවාට ගැහැණුන්ගේ හැඩරුව ද, තවත් ඒවාට වඳුරන්ගේ, අලින්ගේ හැඩ රුව ද ඇත. මේ ප්‍රතිමාවලට දුනු, ර්තල ආදියෙන් යුතු බාහු ද අසීමිත වූ ස්වරූප ඇති මුහුණු ද තිබේ.’

හයිඩ් සහ රිබෙයිරෝ වාර්තා කරන තොරතුරු සියල්ල නොක්ස් ගේ වාර්තා වලින් ද මුළුමනින් ම තහවුරු වන අතර නොක්ස් ඔහුගේ අත්දැකීමක් පිළිබඳව විස්තර කරමින් කියන්නේ අපූරු කතාවකි. වරක් හිටි අඩියේ ම සිංහලයන්ට අළුත් දෙවියෙකු පහළ විය. එක් කොරාටික මනුෂ්‍යයෙකු එතෙක් වැඳුම් පිදුම් කළ දෙවියන්ට අමතර ව අලුත් දෙවියකු ජනතාවට හඳුන්වා දුන්නේ ය. රෝග නිවාරණය කිරීමේ විශේෂ හැකියාවක් ඇතැ යි පිළිගනු ලැබූ අලුත් දෙවියා කෙරෙහි ජනතාව බලවත් විශ්වාසය තබා තම තමන්ගේ ඕනෑ එපාකම්

ඉටු කර ගැනීම සඳහා වැළ නො කැඩී පැමිණ නව දෙවියාගේ පිහිට සොයන්නට විය. කෙසේ වුවද, නව දෙවියා හඳුන්වා දුන් තැනැත්තාගෙන් රජුට තර්ජනයක් ඇති වේ යයි රජු කල්පනා කළ නිසාත්, දෙවියා හඳුන්වා දීමේ දී සිදු වූ සුළු අඩු පාඩුවක් නිසාත් ඔහු සිංහල රජුගේ උදහසට ලක් විය. අලුත් දෙවියා හඳුන්වා දුන් තැනැත්තා රජු ගෙන් බේරී තම ජීවිතය රැක ගත්තේ රජුගේ පාලනය යටතේ නො පැවති කොළඹ ප්‍රදේශයට පලා යාමෙනි.

පරායත්ත මානසිකයකට පදනම් සපයන සිංහලයන්ගේ ඇදහිලි හා විශ්වාස දෙවියන් හා භූතයන් සම්බන්ධ වූ විශ්වාස වලට පමණක් සීමා වූවක් නො වේ. 'They are very fupertitious in making observations of any little accident, as *Omens* protending good to them or evil' මොව්හු අන්ධ විශ්වාසයන් හි එල්බ සිටින්නෝ ය. ඉතාමත් සුළු සිදු වීමක් වුව ද, සුභ නිමිති හෝ අසුභ නිමිති මත සිදු වේ යයි සිතා ඔවුනට වන හොඳ නරක තෙරුම් ගනිති. 'There is a little creature much like a lizard, which they look upon as prophet ..........' සිකනලෙක් වැනි කුඩා සතෙකු (රොබට් නොක්ස් මේ කියන්නේ හූණා ගැන ය) මොවුන් සලකන්නේ ඔවුන්ගේ අනාගත වක්තෘ කෙනෙකු වශයෙනි (Knox, 1681 P. 64).

ඓතිහාසික මූලාශ්‍ර වලින් හෙළි වන පරිදි සිංහලයන්ගේ විශ්වාස හා ඇදහිලි දෛනික ජීවිතයේ සමාජ ආර්ථික කටයුතු සඳහා සම්බන්ධ වී ඇත්තේ හැම විට ම නිශේධනීය ලෙස මිස සාධනීය ලෙස නො වේ. ඔව්හු කිවිසීම, කැස්ස ආදී සාමාන්‍ය ශාරීරික උවමනාවන් පවා අසුභ ලකුණු ලෙස සැලකූ බැවින් යම් කටයුත්තක් ආරම්භ කිරීමේ දී කිවිසුමක්, කැස්සක් පැමිණියේ නම් ආරම්භ කිරීමට නියමිත කාර්ය පසුවට කිරීමට කල් දැමූ හ. පරිසරයේ නිතර දක්නට ලැබෙන හූනන්, කපුටන් ආදීන් ගේ ශබ්ද අශුභ යයි සලකා සමාජ ආර්ථික කටයුතු කල් දැමූ හ. මනුෂ්‍යයන්ගේ කට හඬ නො මැති අවස්ථාවක් එන තුරු සිටිමින් ආහාර පිස ගැනීම සඳහා වළඳට සහල් දැමීම ද කල් දැමූ හ. ගමන් බිමන් වලදී ඕනෑ ම කෙනෙකුට මුණගැසිය හැකි ව තිබෙන බොහෝ දේ අශුභ යයි සලකා ගමන් බිමන් පසු ව යාමට කල් දැමූ හ. එතෙකුදු නො ව අලුතින් උපන් දරුවාගේ අනාගතය

ගැන නැකැත්කරුගෙන් අසා උපත අසුභ නම් දරුවා හාමතේ තබා හෝ දියේ ගිල්වා මරා දැමූහ (Knox, 1681 P. 61 - 91 and 110).

රිබෙයිරෝ සිංහලයන්ගේ නැකැත් විශ්වාස පිළිබඳ ව කියන්නේ මෙසේ ය. 'These all consult before making a journey about which they have a presentiment of any kind, as to the hour at which they should begin a war, fight a battle, sow a field, built a hut, or any other business whatever' (Ribeiro, 1685, P. 122) 'ගමන් බිමන් යාම, යුද්ධ කිරීම, කුඹුරු වැපිරීම, අතුපැලක් තනා ගැනීම ආදී වූ ඕනෑ ම කාර්යයක් සම්බන්ධයෙන් මොව්හු හොඳ වේලාවල් තෝරා ගැනීමට නැකැත් කරුවන්ගේ පිහිට පතති.' සිංහලයන්ට ශුභ ලකුණු අඩු ය. අශුභ ලකුණු වැඩි ය. මේ නිසා කටයුතු සිදු කිරීමට තිබෙන ඉඩ කඩට වඩා කල් දැමීමට ඇති ඉඩ කඩ වැඩි ය. පැරණි සිංහලයෝ වනාහි කුදු මහත් සියලු කටයුත්තක් ම පර ශක්තියක් මත සිදු වේ යයි සැලකූ මිනිසුන් මිස ස්වශක්තියක් මත කිසිවක් සිදු කළ හැකි යයි විශ්වාස කළ මිනිස්සු නො වූහ.

වර්තමාන ජන සමාජය දෙස බැලුව ද මෙකී චර්යාවේ සැලකිය යුතු වෙනස්කමක් සිදු වී නැත. එදා මෙන් ම අදත් මෙ රට වැසියෝ අන්ධ විශ්වාසයන් නිසා මෙන් ම පාලකයන් විසින් සිතා මතා, උපක්‍රමශීලී ව දමන ලද නාස් ලණු නිසා ද පරායත්ත මානසිකත්වයකින් යුතු ව කටයුතු කරති. සිංහල රජු දවස මෙන් ම අද ද පාලකයෝ මනුෂ්‍යයන්ගේ දක්ෂකම්, විචක්ෂණකම්, යටපත් කර තැබීමේ , මොට කර තැබීමේ ප්‍රතිපත්ති ක්‍රියාවට නගති. මනුෂ්‍යයන් ස්වශක්තියෙන් යුතු ව ස්වාධීන ව නැගී සිටිනවාට වඩා පරායත්ත ව සිටිනු දැකීම පාලකයන්ගේ මනාපය ය. මේ නිසා පරායත්තතාව තහවුරු වන පරිදි කරුණු සලසා දීම ද, සැලසුම් සකස් කිරීම ද, ඒවා ක්‍රියාවට නැගීම ද මොවුන්ගේ උවමනාව ය. බටහිරින් පැමිණි ප්‍රජාතන්ත්‍රවාදය නිසා දෙවැනි රාජසිංහ රජු දවස මෙන් සුදු හුණු ගෑ බිත්ති ඇති නිවාසවල ජීවත් වීමට පාලකයාගේ අවසරය අද අවශ්‍ය වන්නේ නැත. එදා මෙන් ජනතාවගේ දේපල රජු හෝ රාජ පුරුෂයන් විසින් සෘජු ලෙස පැහැර ගනු ලබන්නේ ද නැත. එහෙත් එකල සිටි ජනතාවගේ අතිරික්තය රාජ පුරුෂයන් විසින් පැහැර

ගැනීමත්, මෙකල මහ ජනයාගෙන් අය කරනු ලබන බදු මුදල් පාලකයන් විසින් ඔවුන්ගේ අසීමිත සැප සම්පත් හා සුඛවිහරණය සඳහා යොදවා ගැනීමත් අතර ඇත්තේ මූලධර්ම වශයෙන් සමානතාව කි.

එකල මෙන් ම අදත් පාලකයාගේ පැවැත්ම තහවුරු කර ගැනීම සඳහා පාලිතයන් බැඳ තැබීම සිදු වෙයි. දක්ෂකම්, විචක්ෂණකම් හරහා මිනිසුන් ඉදිරියට ඒම රජුගේ පැවැත්මට තර්ජනයක් විය හැකි යයි රජු සැලකුවා සේ ම ජනතාවගේ කටයුතු ජනතාව විසින් ම ස්වාධීන ව තීරණය කර ගැනීම දේශපාලකයාගේ පැවැත්මට තර්ජනයක් විය හැකි යයි දේශපාලකයෝ කල්පනා කරති. මේ නිසා බලයට පත් වන සියලු ම පාලකයෝ මනුෂ්‍යයන් හැසිරවීමේ නාස් ලනු තමා වෙත තබා ගනී. රැකියා දීම, මාරු කිරීම, උසස් කිරීම, නීතිය ඉදිරියට පැමිණවීම, සාධාරණය තහවුරු කිරීම සඳහා පමණක් නො ව දිළිඳු සහනාධාර ලබා දීම ආදී වූ කුඩා මහත් සියලු සමාජ - ආර්ථික කටයුත්තක් සඳහා ම ඔව්හු ඇඟිලි ගසති. මැදිහත් වෙති. මෙකී සියලු සමාජ ආර්ථික කටයුත්තක් සඳහා ම නීති, රීති, රෙගුලාසි, චක්‍රලේඛ ඇතත් දේශපාලකයාගේ ඕනෑ එපාකම් මත හා ඇඟිලි ගැසීම් මත ඒවා සිදු වන තැනට කටයුතු සම්පාදනය කරති. මේ නිසා පුද්ගලයන්ගේ ස්වාධීනත්වය, දක්ෂකම, විචක්ෂණකම, නීතිගරුකකම මෙන් ම ආත්ම ගෞරවය හා ස්වශක්තිය ද නො වටනා මිනිස් අගයන් බවට පත් වී තිබේ.

- එකල සිටි ජනතාවගේ අතිරික්තය රාජපුරුෂයන් විසින් පැහැර ගැනීමත්, මෙකල මහජනයාගෙන් අය කරනු ලබන බදු මුදල් පාලකයන් විසින් ඔවුන්ගේ අසීමිත සැප සම්පත් හා සුඛ විහරණය සඳහා යොදවා ගැනීමත් අතර ඇත්තේ මූලධර්ම වශයෙන් සමානතාවයකි.

- බලයට පත් වන සියලු ම පාලකයෝ මනුෂ්‍යයන් හැසිරවීමේ නාස් ලනු තමන් වෙත තබා ගනී. රැකියා දීම, මාරු කිරීම, උසස් කිරීම, නීතිය ඉදිරියට පැමිණ වීම, සාධාරණය තහවුරු කිරීම සඳහා පමණක් නො ව දිළිඳු සහනාධාර ලබා දීම ආදී වූ කුඩා මහත් සියලු සමාජ - ආර්ථික කටයුත්තක් සඳහා ම ඔව්හු ඇඟිලි ගසති. මැදිහත් වෙති.

ඉහත පෙන්වා දෙනු ලැබුයේ රජුගේ පාලනය විසින් ජනතාවගේ ස්වශක්තිය සැලසුම් සහගත ව මොට කර තැබූ පරිද්දෙන් වර්තමාන දේශපාලකයන් විසින් වර්තමාන ජනතාවගේ ස්ව ශක්තිය ද සැලසුම් සහගත ව මොට කර තබන ආකාරය යි. ස්වශක්තිය මොට කර තැබීමට එකල පැවති සිතුම් පැතුම්, ඇදහිලි හා විශ්වාස පද්ධතිය දායක වූවා මෙන් අද පවතින සිතුම් පැතුම් ද ඒ ආකාරයෙන් ම දායක වෙයි. අදත් එදා මෙන් ම ජනතාව ස්වශක්තිය කෙරෙහි විශ්වාසය නො තබා පරායත්ත මානසිකයකින් යුතු ව සියලු උවමනාවන් ඉටු කර ගැනීම සඳහා අදිසි බලවේග කෙරෙහි බලාපොරොත්තු තබති. අද සිදු ව ඇති එක ම වෙනස නම් එවැනි අදිසි බලවේග පිළිබඳ ව විශ්වාස තහවුරු කර වීමටත්, පැතිර වීමටත් පුවත්පත රූපවාහිනිය වැනි පිටතින් පැමිණි නව තාක්ෂණය යොදා ගැනීම පමණි. වෙදදුරන් පසෙක සිටිය දී අදිසි බලවේග මත විශ්වාස තබා රෝග නිවාරණය කිරීම සඳහා භූතයන්ගේ හෝ දෙවියන්ගේ පිහිට සොයන්නෝ ද, පොත, පත මත නො ව දෙවියන්ගේ හා පේනකරුවන්ගේ ආධාර මත පිහිටා විභාග සමත් වීමට උත්සාහ කරන්නෝ ද, පෙම්වතුන් පෙම්වතියන් දිනා ගැනීමේ මනෝ විද්‍යාත්මක විධි ක්‍රම පසෙක තබා වශීකරුවන් මගින් ආදරය දිනා ගැනීමට උත්සාහ කරන්නෝ ද, ජනතාව මත නො ව ග්‍රහයන් හා දෙවියන් වෙත බලාපොරොත්තු තබා දේශපාලනය කරන්නෝ ද, මෙලොව නො ව පරලොව ම ගොස් සැප සම්පත් විඳිමි යයි සිතා මෙලොව වැඩ නො සලකා සිටින්නෝ ද, ඇස ගැටෙන, අත ගැටෙන සියලු පෙනෙන බලවේග අබිබවා නො පෙනෙන බලවේග විසින් කුඩු මහත් සියලු ජීවන කාර්යයක් ම ඉටු කරනු ලබන්නේ යයි සිතන්නෝ ද බහුල වශයෙන් සිටින්නා වූ වර්තමාන ජන සමාජයේ දක්නට ලැබෙන්නේ නොක්ස්, හයිඩ් සහ රිබෙයිරෝ වාර්තා කළ ජන සමාජයේ පැවැති චර්යා රටාවෝ ම ය. මුලින් කීවාක් මෙන් තිබෙන එක ම වෙනස නම් දෙවියන් හමු වීමට සුදුසු වේලාව, පේන ඇසීමට සුදුසු වේලාව නියම කර ගැනීම සඳහා දුරකථන භාවිතයත්, එදා මැටියෙන් නිම වූ දෙවිවරු සිමෙන්තියෙන් නිම වීමත්, එදා තාවකාලික උපකරණ වලින් නිමවුනු දෙවොල බටහිර ආභාෂයෙන් ලත් ස්ථිර උපකරණ වලින් නිම වීමත්, රාහු කාලය නිවේදනය කරන්නට රූපවාහිනිය යොදා ගැනීමත්, වශීකරන හැටි, අවශ්‍ය අය ගෙන්වන හැටි, අනවශ්‍ය

අය පන්නන හැටි නිවේදනය කරන්නට දිනපතා පුවත්පත යොදා ගැනීමත් පමණි. සිංහලයෝ එදා සිටි සිංහලයෝ ම ය. ඔව්හු එදාත් පරායත්ත මානසිකත්වයකින් යුතුය. අදත් එසේ ම ය.

- වෙදදුරන් පසෙක සිටිය දී අදිසි බලවේග මත විශ්වාස තබා රෝග නිවාරණය කිරීම සඳහා භූතයන්ගේ හෝ දෙවියන්ගේ පිහිට සොයන්නෝ ද, පොත, පත මත නො ව දෙවියන්ගේ හා පේනකරුවන්ගේ ආධාර මත පිහිටා විභාග සමත් වීමට උත්සාහ කරන්නෝ ද, පෙම්වතුන් පෙම්වතියන් දිනා ගැනීමේ මනෝ විද්‍යාත්මක විධි ක්‍රම පසෙක තබා වශීකරුවන් මගින් ආදරය දිනා ගැනීමට උත්සාහ කරන්නෝ ද, ජනතාව මත නො ව ග්‍රහයන් හා දෙවියන් වෙත බලාපොරොත්තු තබා දේශපාලනය කරන්නෝ ද, මෙලොව නො ව පරලොව ම ගොස් සැප සම්පත් විඳිමි යයි සිතා මෙලොව වැඩ නො සලකා සිටින්නෝ ද, ඇස ගැටෙන, අත ගැටෙන සියළු පෙනෙන බලවේග අභිබවා නො පෙනෙන බලවේග විසින් කුදු මහත් සියළු ජවන කාර්යයක් ම ඉටු කරනු ලබන්නේ යයි සිතන්නෝ ද මෙරට බහුල වශයෙන් වෙසෙති.

- නොක්ස් වාර්තා කරනු ලැබූ කාලයේ දී මෙන් ම අදත් හිටි අඩියේ ම ජනතාව අතරට අළුත් දෙවිවරු හෝ අළුත් හාස්කම් ඇති අය පහළ වෙති. එදා මෙන් ම අදත් ජනතාව නව හාස්කම් වලින් ප්‍රයෝජන ගැනීමට වැළ නො කැඩී යති. නොක්ස් වාර්තා කළ සිංහල රජු දවස මෙන් ම අදත් ජනතාවට ඒවායින් ලැබෙන සෙත බොහෝ ය. රෝග නිවාරණ අවස්ථා බොහෝ ය.

නව ලොවට පිවිසීම සඳහා පසුබිම් සකස් කරන ආර්ථික දියුණුව රඳා පවතින්නේ ද්‍රව්‍ය මූලික සම්පත් සහ මානව සම්පත් කාලය සමඟ ගළපා වලනය කිරීමේ රීතිය මත ය. ආර්ථික විද්‍යාවට අයත් වචනවලින් කිව හොත් කාර්යක්ෂමතාව මත ය. නැත හොත් අවම සම්පත් සහ කාල උපයෝජනයක් මඟින් උපරිම නිමැවුමක් ලබා ගැනීම මත ය. ලාංකිකයන්ගේ මනෝ මූලික විශ්වාසයන් නිසා සම්පත් හා කාලය හැසිරවීමේ සීමාවන් ඔවුන් වෙත බාහිර ව පැන වී තිබේ. ඔව්හු බොහෝ විට කාලය හා සම්පත් තමාගේ පාලනයේ තබා ගැනීම වෙනුවට ඔවුන් නො දන්නා වූ, ඔවුන්ගේ පාලනයෙන් තොර යයි සිතන්නා වූ අදෘශ්‍යමාන බලවේගවලට නතු කර තබති. මේ තත්ත්වය ඉතා පැහැදිලිව ම පරායත්ත මානසික ස්වභාවයක් වන අතර ආර්ථික ඉදිරි ගමන මන්දගාමී කරන ප්‍රධානතම බාධකයක් ද වේ.

> විදේශ විනිමය වියදම් කර ජපනුන්ගේ යන්ත්‍ර ලාංකිකයන් මිළදී ගන්නවා මිස ලාංකිකයන්ගේ යන්ත්‍ර ජපනුන් මිළදී ගන්නේ නැත. ලාංකිකයන් යන්ත්‍ර හදන්නේ බෙල්ලේ එල්ලා ගෙන ඉන්නට ය. නැත්නම් අතේ හෝ ඉනේ බඳින්නට ය. එසේත් නැත්නම් උලුවස්සේ අලවා තබන්නට ය. එහෙත් ජපන්නු යන්ත්‍ර හදන්නේ බෙල්ලේ එල්ලා ගන්නට නො ව මිනිසාට ප්‍රයෝජනවත් නිෂ්පාදනයක් කරන්නට ය. මේ නිසා ජපනුන්ට ලංකාවේ මිනිසුන් නිපදවන යන්ත්‍ර වලින් ප්‍රයෝජනයක නැත. මේ නිසා ඔවුන් ලාංකිකයන් නිපදවන යන්ත්‍ර ඉල්ලන්නේ ද නැත. එහෙත් ලාංකිකයන්ට ජපනුන්ගේ යන්ත්‍ර නැතිව ජීවත් වීමට නො හැකි නිසා ජපන් යන්ත්‍රවලට හොඳ වෙළඳාමක් ලංකාවේ තිබේ.

නොක්ස් වාර්තා කරනු ලැබූ කාලයේ දී මෙන් ම අදත් හිටි අඩියේ ම ජනතාව අතරට අලුත් දෙවිවරු හෝ අලුත් හාස්කම් ඇති අය පහළ වෙති. එදා මෙන් ම අදත් ජනතාව නව හාස්කම් වලින් ප්‍රයෝජන ගැනීමට වැළ නො කැඩී යති. නොක්ස් වාර්තා කළ සිංහල රජු දවස මෙන් ම අදත් ජනතාවට ඒවායින් ලැබෙන සෙත බොහෝ ය. රෝග නිවාරණ අවස්ථා බොහෝ ය. එක් තැනෙක දහස්වර මැතිරූ තෙලකි. තව තැනෙක ලක්ෂ වර ජීවම් කළ නූලකි. නැත හොත් ගුලියකි. තවත් තැනෙක අරමුණු ඉටු වූ පසු ව ගනු දෙනු බේරා ගැනීමට යෝජනා කරන කපුවෙකි. මේ සියල්ල අභිබවා සියලු උපද්‍රවයෙන් මිනිසා බේරා ගැනීම පිණිස නිපද වූ යන්ත්‍ර රාජයෙකි. ජපනුන්, ඇමරිකානුවන් හෝ ජර්මානුවන් මෙන් ම ලාංකිකයන් ද යන්ත්‍ර නිපදවති. ජපන්නු යන්ත්‍ර නිපද වූයේ දැනට සිය වස් දෙක තුනක සිට ය. එහෙත් සිංහලයන් යන්ත්‍ර නිපද වූයේ සිය වස් දහය පහළොවකට ම පෙර සිට ය. ජපනුන්ගේ යන්ත්‍ර සඳහා බුද්ධිමය බලය ද සිංහලයන්ගේ යන්ත්‍රවලට ජීවම් බලය ද යොදා ගනු ලැබෙයි. සිංහලයන්ගේ යන්ත්‍ර නිෂ්පාදනය අද දක්වා ම නො කඩවා පවත්වා ගෙන එනු දැකිය හැකි ය. එක තැනෙක සීවලී යන්ත්‍රය ය. තව තැනෙක රතන යන්ත්‍රය ය. තවත් තැනෙක කන්ද කුමාර යන්ත්‍රය ය. එහෙත් විදේශ විනිමය වියදම් කර ජපනුන්ගේ යන්ත්‍ර ලාංකිකයන් මිළදී ගන්නවා මිස ලාංකිකයන්ගේ යන්ත්‍ර ජපනුන් මිළදී ගන්නේ නැත. ලාංකිකයන් යන්ත්‍ර හදන්නේ බෙල්ලේ එල්ලා ගෙන ඉන්නට ය. නැත්නම් අතේ හෝ ඉනේ බඳින්නට ය. එසේත් නැත්නම් උලුවස්සේ අලවා තබන්නට ය.

එහෙත් ජපන්නු යන්ත්‍ර හදන්නේ බෙල්ලේ එල්ලා ගන්නට නො ව මිනිසාට ප්‍රයෝජනවත් නිෂ්පාදනයක් කරන්නට ය. මේ නිසා ජපනුන්ට ලංකාවේ මිනිසුන් නිපදවන යන්ත්‍ර වලින් ප්‍රයෝජනයක් නැත. මේ නිසා ඔවුන් ලාංකිකයන් නිපදවන යන්ත්‍ර ඉල්ලන්නේ ද නැත. එහෙත් ලාංකිකයන්ට ජපනුන්ගේ යන්ත්‍ර නැති ව ජීවත් වීමට නො හැකි නිසා ජපන් යන්ත්‍රවලට හොඳ වෙළඳාමක් ලංකාවේ තිබේ. ලාංකිකයන් මෙන්ම ජපනුන් ද මිනිස්සු ය. ඔවුන්ගේ බහුතරයක් ද ලාංකිකයන් මෙන් ම බෞද්ධයෝ ය. එහෙත් ජපනුන් නිපදවන යන්ත්‍රයකට උවමනා කරන ඇණයක්, මුරිච්චියක් නිපදවා ගන්නටවත් ලාංකිකයන්ට නො හැකිය. මක් නිසාද ? ලාංකිකයන් එදා මෙන් ම අදත් පර ශක්තිය වෙත මිස ස්වශක්තිය මත විශ්වාසය නො තබන මිනිසුන් බැවිනි. නැත හොත් පරායත්ත මානසිකයකින් යුතු මිනිසුන් බැවිනි.

- නියම බෞද්ධ භික්ෂුවට වර්ගයක් නැත. ජාතියක් නැත. කුලයක් නැත. උන් වහන්සේලා සියල්ලෝ ම මිනිස් වර්ගයත්, මිනිස් ජාතියත්, මිනිස් කුලයත් පමණක් නියෝජනය කළ යුතු වන්නෝ ය.

- බෞද්ධ භික්ෂූන් වහන්සේලාගෙන් ඇතැමෙක් සිංහලයන්ගේ පවුල් සංවිධාන කටයුතුවලට විරුද්ධ ව ධර්ම දේශනා කරන්නේ නූපන් සත්වයා කෙරෙහි පවා පතල මහා කරුණාව නිසා නො ව උතුරු නැගෙනහිර යුද්ධයට හේවායන් මදි වන නිසා ය. නැතහොත් වෙනත් සුළු ජාතියක වැඩි වන ජනගහණයට කරට කර සිටින්නට තමන් නියෝජනය කරන්නා වූ ජාතිය වන සිංහල ජාතිය අපොහොසත් වේ යයි සිතන නිසා ය.

සමාජ පසුබිම් නියතය විසින් නිශ්චය කර ඇති චර්යාව පිළිබඳ ව කතා කරන විට ආගම නම් වූ සමාජ මෙවලම ගැන ද යමක් සඳහන් කළ යුතු ය. සිංහලයන්ගෙන් අති මහත් බහුතරයක් බෞද්ධයෝ ය. ලෝකයේ අනෙකුත් ආගම් සමඟ සසඳන කළ බුදු දහම අතිශයින් ශ්‍රේෂ්ඨ වූ, බුද්ධි ගෝචර වූ දර්ශනවාදයක් ලෙස මිස ඇදහිලි ක්‍රමයක් සේ සැලකිය නො හැකි ය. බුදු දහම හුදෙක් ප්‍රාඥයන්ට මිස දුෂ්ප්‍රාඥයන්ට නො වන බව 'පඤ්ඤා වන්තස්සායං ධම්මෝ නායං ධම්මෝ දුප්පඤ්ඤස්ස' යන බුදුරදුන්ගේ ප්‍රකාශයෙන් ඉතා පැහැදිලි ය. බුදු දහම හේතු වාදී දහමකි. එය පර ශක්තිය නිෂ්ප්‍රභා කරන

ස්වශක්තිය විශ්වාස කරන දහමකි. සමානාත්මතාව, මිනිස් අයිතිවාසිකම් තහවුරු කරන දහමකි. අද්භූත බව, ගුප්ත බව හා අන්ධානුකරණය පිළිකෙව් කරන, විවෘත බව, බුද්ධිය හා අවබෝධය අගය කරන අදේවවාදී දහමකි. එහෙත් මේ සා ශ්‍රේෂ්ඨ දර්ශනයකින් සිංහලයන්ගේ චර්යාවට සිදු වී ඇති බලපෑම බෙහෙවින් ම සීමා සහිත ය. සිංහලයන්ගෙන් බහුතරයක් උපතින් පමණක් බෞද්ධයෝ ය. ක්‍රියාවෙන් බෞද්ධයන් නො වේ. ක්‍රියාවෙන් ඔව්හු බෞද්ධයන්ට වඩා හින්දූන්ට නැකම් කියති. කෙසේ වෙතත් බුදු දහමේ අයිතිකාරයන් හා උරුමක්කාරයන් සිංහලයන් යයි ඔව්හු විශ්වාස කරති. ඔව්හු බුදු දහමේ අයිතිකාරයන් හෝ උරුමක්කාරයන් බවට පත් නො වී ක්‍රියාවෙන් බෞද්ධයන් වූවා නම් අනිවාර්යයෙන් ම ඔවුන් දැනට ප්‍රදර්ශනය කරන චර්යාවෙහි පරස්පරය ප්‍රදර්ශනය කරනු නො අනුමාන ය.

- සිංහලයන්, තමා විසින් ම උතුම් ජන කොටසකැ යි කයිවාරු ගසති. පාරට්ටු කර ගනිති. ඔව්හු උදාර සංස්කෘතියකට අයත් ජන කොටසකැයි කියා ගනිති. සුපිරිසිදු සංස්කෘතියකට, අයත් වූවෝ යයි කියා ගනිති.
- අද සිටින ඇතැම් බෞද්ධ භික්ෂූන් වහන්සේලා පේන කියන්නේත්, දේවාරූඪ වන්නේත්, අංජනම් බලන්නේත්, යන්ත්‍ර මන්ත්‍ර, හදි හූනියම් ආදී වූ කටයුතුවල නියැලෙන්නේත්, හඳහන් ලියන්නේත්, නැකැත් බලන්නේත්, සෙත් කවි, වස් කවි කියන්නේත්, පන්සල් ඇතුලත ම දේවාල පවත්වා ගෙන යන්නේත් හින්දු සංස්කෘතියෙන් ලැබූ ආභාෂය නිසා ය.

ශ්‍රී ලාංකික බෞද්ධ ගිහි ජනතාව පමණක් නො ව ඔවුන්ගේ පූජ්‍ය පක්ෂය වන සංඝයා වහන්සේලාගෙන් බොහෝ දෙනෙක් ද බෞද්ධ දර්ශනය අනුව නියම බෞද්ධයෝ නො වෙති. ඇතැම් සංඝයා වහන්සේලා හින්දූන් මෙන් පේන කියති. දේවාරූඪ වෙති. අංජනම් බලති. ඇතැම් හු යන්ත්‍ර, මන්ත්‍ර, හදි, හූනියම් ආදී වූ කටයුතුවල යෙදෙමින්, එකී විශ්වාස පතුරුවමින් මිළ මුදල් උපයති. ඇතැම් හු නැකැත්, හඳහන් කියවති. තවත් අය වෙළඳ ව්‍යාපාර මෙහෙයවති. ඇතැමෙක් දේශපාලකයන්ගේ අතකොළු ය. බෞද්ධයන්ගේ පූජ්‍ය පක්ෂය සැබෑ බෞද්ධයන් නො වන විට ගිහියන් කෙරෙන් සැබෑ බෞද්ධකමක් කිසිසේත් අපේක්ෂා කළ නො හැකි ය.

බුදු දහමේ දාර්ශනික මත වාදයට අනුව බෞද්ධ භික්ෂුවට කුලයක් තිබිය නො හැකි ය. සිව් දෙසින් ගලා එන මහා ගංගාවෝ මහ සයුරට පැමිණි විට එකී ගංගාවන් නියෝජනය නො කොට මහ සයුර පමණක් නියෝජනය කරන්නා සේ ඕනෑ ම වර්ගයකින්, ඕනෑම ජාතියකින්, ඕනෑ ම කුලයකින් සසුනට පැමිණෙන සියල්ලෝ ම බුද්ධ ආර්ය පුත්‍රයන් වන්නෝ ය. මේ නිසා නියම බෞද්ධ භික්ෂුවට වර්ගයක් නැත. ජාතියක් නැත. කුලයක් නැත. උන් වහන්සේලා සියල්ලෝ ම මිනිස් වර්ගයත්, මිනිස් ජාතියත්, මිනිස් කුලයත් පමණක් නියෝජනය කළ යුතු වන්නෝ ය. බුදු දහමේ දාර්ශනික ඉගැන්වීම කවරක් වුව ද, සිංහල බුද්ධ පුත්‍රයන්ට අනෙකුත් ගිහි සිංහලයන්ට මෙන් ම වර්ග, ජාති හා කුල අදත් තිබේ. මේ නිසා සඟ සසුන තුළත් ජාතිය හා කුලය නියෝජනය වෙයි. උන් වහන්සේලා නිකාය ගණනාවකට බෙදී සිටින්නේ විනය, අභිධර්ම, සූත්‍ර වශයෙන් ධර්මය පිළිබඳ විශේෂඥතා ඥානය ලැබීමට නො ව උන් වහන්සේලා උපතින් ලත් කුල උරුමය පවුල් උරුමය තව දුරටත් රැකීමට ය. උන් වහන්සේලාගෙන් ඇතැමෙක් සිංහලයන්ගේ පවුල් සංවිධාන කටයුතුවලට විරුද්ධ ව ධර්ම දේශනා කරන්නේ නූපන් සත්වයා කෙරෙහි පවා පතළ මහා කරුණාව නිසා නො ව උතුරු නැගෙනහිර යුද්ධයට හේවායන් මදි වන නිසා ය. නැතහොත් වෙනත් සුළු ජාතියක වැඩි වන ජනගහණයට කරට කර සිටින්නට තමන් නියෝජනය කරන්නා වූ ජාතිය වන සිංහල ජාතිය අපොහොසත් වේ යයි සිතන නිසා ය. මේ අනුව ශ්‍රී ලාංකික බෞද්ධ ගිහි ජනතාව පමණක් නො ව ඔවුන්ගේ පූජ්‍ය පක්ෂය වන්නා වූ සංඝයා වහන්සේලාගෙන් බොහෝ කොටසක් ද සැබෑ බෞද්ධයන් නො වන්නෝ ම ය.

## උච්චායම

ශ්‍රී ලාංකිකයාගේ විශේෂයෙන් සිංහලයාගේ සමාජ පරිසර නියතය විසින් නිර්මාණය කරන ලද තවත් විශේෂ චර්යා ලක්ෂණයක් නම් උච්චායම යි. උච්චායම යනු බොරු උසස්කම් පෙන්වීම, පාරට්ටුව , කයිවාරුව හෝ පම්පෝරි ගැසීම යි. උච්චායම යනු ආඩම්බරය නො වේ. ආඩම්බරය යන්නෙන් අදහස් වන්නේ තමන් හෝ තමන් ඇතුළත් ජන සමාජයේ තිබෙන යම් ගුණයක්, දක්ෂකමක්. හැකියාවක් නිසා පුද්ගලයෙකු වශයෙන් හෝ ජන සමාජයක් වශයෙන් සතුටට

පත්වීම යි. උදාහරණ වශයෙන් බොරු නො කීම ආඩම්බරයට කරුණකි. වංචා නො කිරීම ආඩම්බරයට කරුණකි. තමන්ගේ ආහාර තමන් ම නිපදවා ගැනීම ආඩම්බරයට කරුණකි. අමුත්තන්ට සංග්‍රහ කිරීම ආඩම්බර වීමට සුදුසු ගුණයකි. නොක්ස් ද සිංහලයන් තුළ ඇති මේ ගුණය ඉහළින් අගය කර ඇත. එහෙත් එවැනි කිසිදු ගුණයක්, කාරණයක් හෝ තත්ත්වයක් හා නො බැඳුනු පුහු අහංකාරකම උච්චායම වේ. කුලය මත, ජාතිය මත, ගෝත්‍රය මත නම්, ගම්, වාසගම් ආදිය මත උච්චායම පැවතිය හැකිය. 'This people are very ambitious of their titles, having but little elfe that they can boaft in' 'මේ මිනිසුන්ට පම්පෝරි ගැසීමට වෙන කිසිවක් නැති නිසා ඔවුන්ගේ නම්, ගම්, වාසගම් පිළිබඳ ව පම්පෝරි ගසති' (knox, 1681 P. 95). Thry are ................very proud and felf conceited' 'මොව්හු බෙහෙවින් උඩඟු අහංකාර පරවශ මිනිස්සු ය' (Knox, 1681 P. 64).

ඇතැම් විට කිසිදු තර්කයක් හෝ පදනමක් නො මැති ව නො දැනුවත්කම මත ද උච්චායම පැවතිය හැකි ය. උදාහරණ වශයෙන් සිංහලයන්, තමා විසින් ම උතුම් ජන කොටසකැ යි කයිවාරු ගසති. පාරට්ටු කර ගනිති. ඉංග්‍රිසි භාෂා උච්චාරණය සිංහලයන්ට තරම් හොඳින් කළ හැකි වෙනත් ජන කොටසක් නැතැයි කියති. ඔව්හු උදාර සංස්කෘතියකට අයත් ජන කොටසකැයි කියා ගනිති. සුපිරිසිඳු සංස්කෘතියකට, අයත් වූවෝ යයි කියා ගනිති. එහෙත් ප්‍රශ්නය නම් උදාර සංස්කෘතියක් වන්නේ කුමන මිනිස් ගති පැවතුම්වලට හෝ කවර ඇගයුමකට සාපේක්ෂව ද? යන්න යි. සුපිරිසිඳු සංස්කෘතියක් පැවතියේ ලෝකයේ කුමන ජන සමාජයක් තුළ ද යන්න යි. මේ ප්‍රශ්නවලට පිළිතුරු සෙවිය නො හැකි ය. මෙවැනි ප්‍රකාශ හා පිළිගැනීම් හුදෙක් උච්චායම හෙවත් පුහු අහංකාරය මත පදනම් වූ මනෝ මූලික පාරට්ටු කර ගැනීම් මිස සැබෑ හේතුවාදයන් මත පදනම් වූ සිද්ධිමය කාරණා නො වේ. උදාහරණ වශයෙන් ගත හොත් සිංහලයන්ගේ යයි කියනු ලබන වර්තමාන සංස්කෘතියට අයත් බොහෝ දේ ඉන්දියානුවන්ගේ ය. තවත් කොටසක් පෘතුගීසි, ලන්දේසි, ඉංග්‍රිසි ආදී වූ බටහිර ජාතීන්ගේ ය. දේශීයත්වය තුළින් ම නිර්මාණය වූ සංස්කෘතිකාංගයන් ඇත්තේ ඉතා සුලු වශයෙනි. සිංහලයන් විසින්

වර්තමානයේ පවත්වා ගෙන එනු ලබන සංස්කෘතිය ඒ ඒ ඓතිහාසික යුගවල දී සුපිරි යැයි පිළිගනු ලැබූ ජන සමාජවල සංස්කෘතීන්ට යටත් ව පෝෂණය වූවකි. මේ නිසා ඇණ කොටා, පොර බදා අනන්‍යතාව රැකීමට තරම් සුපිරිසුදු සිංහල සංස්කෘතියක් යථාර්ථමය වශයෙන් ඇත්තේ නැත. සිංහලයන්ට පමණක් නො ව ලෝකයේ කිසිදු ජාතියකට මුළුමනින් පිරිසිදු සංස්කෘතියක් යැයි කිව හැකි යමක් නැත. සමාජයේ ශීඝ්‍ර ඉදිරි ගමනක් ඇති කිරීමට උවමනා කරන ජන සමාජයක් විසින් කළ යුතු ව ඇත්තේ අනන්‍යතාව යැයි කියා කිසිවක දිගින් දිගට එල්ලී සිටීම නො වේ. කොතරම් දේශීය වුවත් නුසුදුසු සේ බැහැර කිරීම ය. කොතරම් විදේශීය වුවත් සුදුසු දේ වැළඳ ගැනීම ය.

වර්තමාන සිංහලයන් විසින් දේශීය යයි කියනු ලබන සංස්කෘතිකාංගයන්ගෙන් බොහෝ දේ මහින්දාගමනය සමඟ උතුරු ඉන්දියාවෙන් ආනයනය කරනු ලැබූ සංස්කෘතික අංගෝපාංගයන් ගෙන් පෝෂණය වූ ඒවා ය. එවකට ශ්‍රී ලංකාවේ පැවති දේශීය ජන සමාජයෙහි ලක්ෂණ වූ දඩයම සහ ප්‍රාථමික වන්දනා ක්‍රම ආදිය බෞද්ධ සංස්කෘතික ආභාෂය සමඟ යටපත් විය. එහෙත් දේශීය සංස්කෘතියේ යම් යම් ශේෂ වූ කොටස් නව සංස්කෘතියට එක් විය. මේ නිසා දේශීය යයි කිව හැකි යම් පිරිසිදු සංස්කෘතියක් සිංහලයන් වෙත තිබුණා නම් එය පළමු වරට මහත් පරිවර්තනයකට හසු වූයේ මහින්දාගමනය නිසා ය. මහින්දාගමනයෙන් පසු ව මෙ රට පැවති ප්‍රමුඛ සංස්කෘතිය සිංහල බෞද්ධ සංස්කෘතිය යැයි කියනු ලැබේ. අද දක්වා ම පවතින්නේ සිංහල බෞද්ධ සංස්කෘතිය යයි කීව ද මහින්දාගමනයෙන් පසු ව ද එය වරින් වර බරපතල ලෙස වෙනස් විය. අනුරාධපුර යුගයේ අග භාගයේ දීත්, පොලොන්නරුව යුගයේදීත්, විශේෂයෙන් මහනුවර යුගයේ දීත් සිංහල බෞද්ධ සංස්කෘතිය දකුණු ඉන්දියානු ද්‍රවිඩ ජනතාවගේ හින්දු සංස්කෘතියෙන් මහත් ආභාෂයක් ලැබී ය. අද සිටින ඇතැම් බෞද්ධ භික්ෂූන් වහන්සේලා පේන කියන්නේත්, දේවාරූඪ වන්නේත්, අංජනම් බලන්නේත්, යන්ත්‍ර මන්ත්‍ර, හදි හූනියම් ආදී වූ කටයුතුවල නියැලෙන්නේත්, හඳහන් ලියන්නේත්, නැකැත් බලන්නේත්, සෙත් කවි, වස් කවි කියන්නේත්, පන්සල් ඇතුළත ම දේවාල පවත්වා ගෙන යන්නේත් හින්දු සංස්කෘතියෙන්

ලැබූ ආභාෂය නිසා ය.

උතුරු ඉන්දියානු හා දකුණු ඉන්දියානු සංස්කෘතීන්ගෙන් ආභාෂය ලත් දේශීය සංස්කෘතිය බටහිර ජාතීන්ගේ පැමිණීම සමඟ නැවතත් ප්‍රබල ලෙස පරිවර්තනය වන්නට විය. දේශීයයන් බටහිර ජාතීන්ගේ ආදිපත්‍යයට යටත් වීම සමඟ බටහිර ජාතීන්ගේ සංස්කෘතිය සුපිරි සංස්කෘතියක් සේ පෙනෙන්නට වූ අතර දේශීය ප්‍රභූන් ඉංග්‍රීසි භාෂාව හා කතෝලික ආගම වැළඳ ගැනීමටත් , ඔවුන්ගේ කෑම් බීම්, ඇඳුම් පැළඳුම්, හා සිරිත් විරිත් අනුගමනය කිරීමටත් කටයුතු කරනු ලැබිණ. මෙම සංස්කෘතික සංකලනය කොතරම් දැඩි ව සිදු වූයේ ද යත් කුමක් දේශීය ද, කුමක් විදේශීය ද යන වග සංස්කෘතික අනන්‍යතාව ගැන කතා කරන අයට ද අද හඳුනා ගැනීම අපහසු ය. උදාහරණ වශයෙන් වර්තමානයේ සිංහලයන් අතර භාවිතයේ තිබෙන නීත්‍යනුකූල ව විවාහයට පත් ස්ත්‍රියක හා පුරුෂයෙකු ලිංගික සබඳතා පැවැත්වීමේ පිළිවෙත මුළුමනින් ම වික්ටෝරියානු සංස්කෘතියේ ආභාෂය ලැබූවකි. යුරෝපීයයන්ගේ පැමිණීමට පෙර විවාහ හා ලිංගික සබඳතා පිළිබඳ සිංහල සංස්කෘතියෙහි පැවැති සිරිත් විරිත් පිළිබඳ ව ශ්‍රී ලංකාවට පැමිණි ප්‍රථම බටහිර ජාතිය වූ පෘතුගීසීන් විසින් වාර්තා කර ඇත්තේ මෙසේ ය. 'There marriges are a ridiculous matter. A girl makes a contract to marry a man of her own cast. The next day the brother of the husband takes his place, and if there are seven brothers, she is the wife of all of them, distributing the night by turns without the first husband having a greater right than any of the other. And if during the day any of them find chamber unoccupied, he can have access to the woman if he thinks fit; and while he is within no one else can enter; she can refuse herself to non of them. Whichever brother it may be contracts the marriage, the woman is the wife of all; only if the youngest marry, non of the others has any right over her, but he can claim access to the wifes of all of them whenever he likes. If it chances that there are more brothers than seven, those who exeed that number have no right over her, but if there are two, up to five, they are satis-

fied with one woman and the woman who is married to a husband with a large number of brothers is considered very fortunate, for all toil and cultivate for her and bring whatever they earn to the house and well supported and for this reason their children call all of them their fathers (Ribeiro, 1685, P. 123) පෘතුගීසි ජාතික රිබෙයිරෝ ගේ සටහනේ සරල සිංහල අනුවාදය මෙසේ ය. 'සිංහලයන්ගේ විවාහය වනාහි සිනහව ගෙන දෙන සුළු කටයුත්ත කි. ස්වකීය කුලයට ගැළපෙන තරුණයෙකු සමඟ විවාහ වන කාන්තාව විවාහ වූ තැනැත්තාගේ සහෝදරයින් සමඟ ද ලිංගික සබඳතා පවත්වන්නී ය. නිවසට පැමිණි ස්ත්‍රිය පළමු රාත්‍රිය තමා රැගෙන ආ තැනැත්තා සමඟ ගත කරන්නී ය. අනතුරු ව ඒ ඒ සහෝදරයා සමඟ වෙන් වෙන් වශයෙන් රාත්‍රී ගත කරන්නී ය. මේ නිසා පවුලට රැගෙන ආ ස්ත්‍රිය සියල්ලන්ගේ ම භාර්යාව ද වන්නී ය. ලිංගික සබඳතා පැවැත්වීමේ දී ඇය රැගෙන ආ සහෝදරයාට කිසිදු විශේෂ අයිතියක් නැත. ඔහුට ද ඇත්තේ අනෙකුන්ට ඇති අයිතිය ම ය. කෙසේ වෙතත් පවුලේ සහෝදරයන් ගණන සංඛ්‍යාවෙන් හත ඉක්මවන්නේ නම් අට වැන්නා සිට අනෙක් අය සමඟ ලිංගික සබඳතා පැවැත්වීම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ස්ත්‍රිය වෙත තිබේ . යම් පවුලක බාල සහෝදරයා විවාහ වූයේ නම් ඔහුගේ භාර්යාව සමඟ ලිංගික සබඳතා පැවැත්වීමට වැඩිමහල් සහෝදරයන්ට අයිතියක් නැත. එහෙත් බාල සහෝදරයාට වැඩිමලුන්ගේ ඕනෑම භාර්යාවක් සමඟ ලිංගික සේවනයේ යෙදීමට අවසර තිබේ. සහෝදරයන් කීප දෙනෙකු සිටින පවුලක අයෙකු සමඟ දීග යාමට ලැබීම සිංහල කාන්තාවන් සලකන්නේ වාසනාවක් ලෙස ය. මන්ද? සියළුම සහෝදර වරු මහන්සි වී හරිහම්බ කරන දෙයෙහිත්, වගා කටයුතුවලින් ලැබෙන දෙයෙහිත් ප්‍රතිඵල ලබන්නේ ඇය බැවිනි. ස්ත්‍රියට ලැබෙන දරුවන් කිසිදු භේදයකින් තොර ව සියළුම සහෝදරයන්ට 'අප්පා' කියා අමතති.

- සිංහල සංස්කෘතික අනන්‍යතාව රැකීමට යයි කියා වර්තමාන සිංහලයෝ තම බිරින්දෑවන් යහළුවන්ට ලබා දෙන්නේවත් , තම සහෝදරයාගේ බිරිඳ සමඟ ලිංගික සබඳතා පැවැත්වීමට කල්පනා කරන්නේවත් නැත. යටත් පිරිසෙයින් සංස්කෘතික අනන්‍යතාව ගැන කතා කරන්නෝවත් එසේ කරන්නේ නැත.

- අසරණයන්ට සරණ වීම සිංහල බෞද්ධයන්ගේ විශේෂ ගුණයකැ යි බොහෝ විට පාරට්ටු කර ගනිති. එහෙත් මේ පාරට්ටුවේ ද සනාථ කළ හැකි සත්‍යයක් නැත.

- ලාංකිකයන්ට තිබෙනවා යයි කියන අසරණයන්ට සරණ වීමේ විශේෂ ගුණය නො තිබී ඒ වෙනුවට පිට රැටියන්ට තිබෙන සාමාන්‍ය ගුණය රාජ්‍ය නො වන සංවිධාන ක්‍රියාකාරීන්ට තිබුණා නම් මෙ රට අසරණ සරණ වැඩසටහන් අදට වඩා හොඳින් ක්‍රියාත්මක වන්නට ඉඩ තිබුනි.

ඉංග්‍රිසි ජාතික නොක්ස් සිංහලයන්ගේ ලිංගික සබඳතා පිළිබඳ ව වාර්තා කර ඇති තොරතුරුවලින් රිබෙයිරෝ ගේ තොරතුරු තව දුරටත් සනාථ වේ. නොක්ස් කියන්නේ රාජ නීතිය අනුව වෛශ්‍යාවන් වශයෙන් කටයුතු කිරීම කස පහර ලැබීමට, කන් කපා දැමීමට, හෝ හිස මුඩු කිරීමට හේතු වන වරදක් වුවත්, සැබෑ ලෙස වෛශ්‍යාව යනු කවිරු දැ යි නිර්වචනය කළ හොත් සිංහල ස්ත්‍රීන් සියල්ලෝ ම මෙන් වෛශ්‍යාවන් සේ සැලකිය හැකි බව යි. 'And tho I think they be all whores, yet they abhor the name of *Vefou*, which is whore' (Knox, 1681, P. 92) . 'මොවුහු වෛශ්‍යාව යන තේරුම ඇති 'වේසාවී' යන වචනය පිලිකුල් කරන නමුත් ඔවුන් සැම දෙනා ම මෙන් වෛශ්‍යාවන් බව මගේ හැඟීමයි'

ජර්මානු ජාතික හයිඩ්ගේ වාර්තා වලින් ද ලිංගික සබඳතා පිළිබඳ ව සිංහලයන් වෙත පැවති සිරිත් විරිත් තවදුරටත් හෙළිදරව් වෙයි. හයිඩ් ඔහුගේ වාර්තාවේ සඳහන් කර ඇත්තේ මෙසේ ය. 'I can affirm, that the men are not jealous, but are glad to allow a good friend to lie with their wife when they are absent: they even beg such, in their absence to entertain their wives' (hydts, 1744, P.135). 'පිරිමින් ඊර්ෂ්‍යා සහගත නැත. ඔවිහු නිවසේ නොමැති විට ඔවුන්ගේ බිරියන් සමඟ ලිංගික සබඳතා පැවැත්වීමට

මිතුරන්ට ඉඩ දෙති. ඒ සඳහා මිතුරන්ට ආරාධනය ද කරති.'

බටහිරට මිශ්‍ර නො වූ දේශීය සංස්කෘතිය තුළ පැවති විවාහ ක්‍රම, ලිංගික සබඳතා ක්‍රම සම්බන්ධයෙන් සංස්කෘතික අනන්‍යතාවක් ගැන කතා කරන්නෝ ඇතැම් විට මවිතයට පත් විය හැකි ය. එහෙත් එවැනි මවිතයක් ඇති කර ගත යුතු නැත. මන්ද? සංස්කෘතිය යන්න කලින් කලට, යුගයෙන් යුගයට පවතින සමාජ ආර්ථික වටිනාකම් මත නිශ්චය වන බැවිනි. බටහිරින් පැමිණි විවාහ ක්‍රම හා ලිංගික සබඳතා පිළිබඳ පිළිවෙත් අද අපගේ සංස්කෘතිය බවට පත් වී හමාර ය. සිංහල සංස්කෘතික අනන්‍යතාව රැකීමට යයි කියා වර්තමාන සිංහලයෝ තම බිරින්දෑවන් යහළුවන්ට ලබා දෙන්නේවත්, තම සහෝදරයාගේ බිරිඳ සමඟ ලිංගික සබඳතා පැවැත්වීමට කල්පනා කරන්නේවත් නැත. යටත් පිරිසෙයින් සංස්කෘතික අනන්‍යතාව ගැන කතා කරන්නෝවත් එසේ කරන්නේ නැත. මේ නිසා සුපිරිසිදු සංස්කෘතියක් පිළිබඳ ව හෝ සංස්කෘතික අනන්‍යතාවක් ගැන විශ්වාස කිරීම හුදු මායාවක් පමණි. එය ප්‍රතිගාමී චින්තනයක් පමණි.

අසරණයන්ට සරණ වීම සිංහල බෞද්ධයන්ගේ විශේෂ ගුණයකැ යි බොහෝ විට පාරට්ටු කර ගනිති. එහෙත් මේ පාරට්ටුවේ ද සනාථ කළ හැකි සත්‍යයක් නැත. ඇතැම් සිංහල බෞද්ධයෝ අසරණයන්ට සරණ වෙති. ඇතැම් හු එසේ නො කරති. ඇතැම් සිංහල අබෞද්ධයෝ ද අසරණයන්ට සරණ වෙති. ඔබේ අසල්වැසියාට ප්‍රේම කරන්න යයි ක්‍රිස්තුන් වහන්සේ කී සේක. ඔබේ අසල්වැසියා කුසගින්නේ සිටින විට කුස පුරා ආහාර ගන්නා ඔබ නියම මුස්ලිම් භක්තිකයෙකු නො වේ යයි නබි නායක තුමා කීය. ගෙට ආ අමුත්තාට වතුර උගුරකින් හෝ ප්‍රිය වචනයෙන් හෝ සංග්‍රහ කළ යුතු බව හින්දු ඉගැන්වීමකි. මේ නිසා සිංහල බෞද්ධයන් අතර පමණක් නො ව අනෙකුත් ජාතීන් අතර හා අනෙකුත් ආගමිකයන් අතර ද අසරණයන්ට සරණ වන ගුණය ඇති අය මෙන් ම වෙනත් බොහෝ යහ ගුණ වලින් යුක්ත අය ද වෙති. එමෙන්ම යහ ගුණ නො මැත්තෝ ද වෙති. ඉතා අපක්ෂපාතී ව කරුණු සලකා බැලූ විට, අසරණයන්ට සරණ වීමේ ගුණය මෙරට ජීවත් වන වර්තමාන වැසියන්ට වඩා කැපී පෙනෙන පරිදි ඇත්තේ පිටරැටියන් තුළ ය. සිංහල බෞද්ධයන් තුළ ද නැතුවා නො වේ.

දිළිඳුකම තුරන් කිරීම, ළමා සෞඛ්‍ය ආරක්ෂාව, ළමා අයිතිවාසිකම් තහවුරු කිරීම, ආබාධිත පුනරුත්ථාපනය, ළමා අධ්‍යාපනය, වැඩිහිටි ආරක්ෂණය, යුධ අනාථයන් පුනරුත්ථාපනය ආදී මෙ රට ක්‍රියාත්මක විවිධාකාර වූ අසරණ සරණ වැඩසටහන් සඳහා මුදල් හා ද්‍රව්‍ය වශයෙන් උපකාර කරන්නේ පිටරැටියන්ගේ මුදල් පසුම්බියෙනි. අසරණයන්ට සරණ වීමේ විශේෂ ගුණය ඇතැ යි කියන මෙ රට වැසියන් විසින් කළ යුතු ව ඇත්තේ ඔවුනොවුන් සම්බන්ධ වී සිටින රාජ්‍ය නො වන සංවිධාන හරහා එම ආධාර උපකාර අසරණයන්ට ලබා දීම ය. එහෙත් මෙරට වැසියන් විසින් අටවා ගෙන ඇති බොහෝ රාජ්‍ය නො වන සංවිධාන වලින් එම අරමුණු නිසි පරිදි ඉටු වේ දැයි ඉතා මැදිහත් සිතකින් යුතු ව කල්පනා කර බැලිය යුතු ය. ලාංකිකයන්ට තිබෙනවා යයි කියන අසරණයන්ට සරණ වීමේ විශේෂ ගුණය නො තිබී ඒ වෙනුවට පිට රැටියන්ට තිබෙන සාමාන්‍ය ගුණය රාජ්‍ය නො වන සංවිධාන ක්‍රියාකාරීන්ට තිබුණා නම් මෙ රට අසරණ සරණ වැඩසටහන් අදට වඩා හොඳින් ක්‍රියාත්මක වන්නට ඉඩ තිබිණි.

අප මෙතෙක් සාකච්ඡා කරනු ලැබුයේ චර්යා ශ්‍රිතයෙහි තීරණාත්මක නියතයක් වන S හෙවත් සමාජ පසුබිම් නියතය විසින් නිර්ණය කරනු ලැබුවා වූ ශ්‍රී ලාංකිකයන්ගේ චර්යාව පිළිබඳ ව හා එම චර්යාවේ විශේෂ ලක්ෂණයන් පිළිබඳ ව ය. අධිපති වාදය, පරායත්ත මානසිකය, උච්චායම ආදී වූ චර්යා ලක්ෂණ හඳුනා ගනු ලැබුවේ සජීවිකරණයට බාධා පමුණුවන විශේෂ චර්යා රටා සොයා බැලීමට දැරූ උත්සාහයේ ප්‍රතිඵලයක් වශයෙනි. අධිපති වාදය සජීවිකරණයේ බාධාකාරී චර්යාවක් වන්නේ බහුතරයක් වන අධිපතියන් නො වන්නවුන්ගේ ඉදිරියට ඒම අධිපති වාදය විසින් වළකනු ලබන නිසා ය. පරායත්ත මානසිකය බාධකයක් වන්නේ මිනිසාගේ දක්ෂකම් නිපුණතාවන්, විචක්ෂණකම් පරායත්ත මානසිකය මගින් මොට කර, යටපත් කර තබන නිසා ය. උච්චායම බාධකයක් වන්නේ මිනිසාට නිවැරදි වීමට, අඩු පාඩු සකසා ගැනීමට උවමනා නිහතමානී බව උච්චායම විසින් අවලංගු කර දමන නිසාත්, විවෘත මනසකින් යුතු ව විශ්ව සමාජය දෙස බැලීමට ඇති නිදහස හීන කරනු ලබන නිසාත් ය. සමාජ පසුබිම් නියතය පිළිබඳ ව කරනු ලැබූ සාකච්ඡාව මෙතෙකින් නතර කොට දැන් සම්පත් නියතයේ ස්වභාවය පිළිබඳ ව

සාකච්ඡා කිරීමට යොමු වෙමු.

## සම්පත් නියතය

සමාජ චර්යා ශ්‍රිතයෙහි තුන් වැනි නියතය R හෙවත් සම්පත් ය. සමාජ චර්යාව තීරණය කිරීමෙහි ලා සම්පත් (R) දෙන ලද තත්ත්වයන් වන බැවින් එය කෙටි කාලයේ දී නියතයකි. මනුෂ්‍යයාගේ චර්යාව හා සම්පත් අතර ඇත්තේ ඉතා පැහැදිලි සම්බන්ධතාවකි. මනුෂ්‍යයාට ස්වභාව ධර්මයෙන් දායාද කළ E නම් වූ භෞතික පරිසර නියතයත්, මනුෂ්‍යයා විසින් නිර්මාණය කරගනු ලැබූ S නම් වූ සමාජ පසුබිම් නියතයත් සමඟ සසඳන විට R නම් වූ සම්පත් නියතය නම්‍ය බවින් වැඩි ය. වෙනත් වචන වලින් කිව හොත් භෞතික පරිසරය හා සමාජ පසුබිම වෙනස් කිරීමට ගත වන කාලයට වඩා අඩු කාලයක් තුළ සම්පත්වල තත්ත්වය වෙනස් කළ හැකි ය. සම්පත් වශයෙන් ගැනෙන්නේ මිනිස් ශ්‍රමය ඇතුළු මුදල්, උපකරණ, යාන වාහන, යන්ත්‍ර, සූත්‍ර, ණය පහසුකම් ආදී වූ මිනිසාගේ සුබ විහරණය සඳහා ප්‍රයෝජනයට යොදවා ගත හැකි දේ ය.

මනුෂ්‍යා පරිහරණය කරන සම්පත්වල ස්වභාවය ද, ප්‍රමාණය ද, ගුණය ද මනුෂ්‍යයාගේ චර්යාව කෙරෙහි බලපාන බව ඕනෑම මිනිස් චර්යාවක් විශ්ලේෂණය කිරීමක් මගින් වුව ද, තේරුම් ගත හැකි ය. උදාහරණ වශයෙන් ලංකාව ඇතුළු දකුණු ආසියානු රටවල ජනතාව එම රටවල පොදු ප්‍රවාහන සේවා ප්‍රයෝජනයට ගැනීමේ පිළිවෙත සලකා බැලිය හැකි ය. මේ රටවල ජනතාව ඔවුන්ගේ පොදු ප්‍රවාහන සේවා ප්‍රයෝජනයට ගැනීමේ දී උනුන් සමඟ පොර බදති. කුලල් කා ගනිති. ශාරීරික අනතුරු කර ගනිති. ප්‍රවාහන සේවා ලබා දෙන්නන් හා මගීන් අතර අඬදබර ඇති කර ගනිති. එහෙත් ජපානය, ඇමරිකා එක්සත් ජනපදය වැනි රටවල ජීවත් වන ජනතාව තුළින් කිසි විටෙකත් මෙවැනි චර්යාවක් දක්නට නො ලැබේ. ප්‍රවාහන සේවාව සම්බන්ධ ඇමරිකානුවන්ගේ හා ජපනුන්ගේ හැසිරීමට හේතු විය හැකි විවිධ කරුණු තිබිය හැකි නමුත් එම රටවල පොදු ප්‍රවාහන සේවයේ තත්ත්වය ප්‍රබල සාධකය කි. ඇමරිකා එක්සත් ජනපදයේ සියල්ලන්ට ම සුව පහසුවෙන් යා හැකි පරිදි ප්‍රවාහන පහසුකම් ලබා ගැනීමට තරම් ප්‍රමාණවත් පොදු ප්‍රවාහන සේවාවක් තිබෙන නිසා

ඇමරිකානුවන් අරගල කොට, පොර බදමින් සේවාව ලබා ගැනීමට කටයුතු කරන්නේ නැත. ඔවුන් බසයකට ගොඩ වන්නේ ශාන්තු වරයන් මෙන් ඉවසිල්ලෙනි. එහෙත් ලංකාව වැනි රටවල පොදු ප්‍රවාහන සේවයේ ස්වභාවය ද, ප්‍රමාණය ද, ගුණය ද සියල්ල පහත් මට්ටමක පවතින නිසා සේවාව ලබා ගැනීමේ දී එක්තරා දුරකට කැලෑ නීතිය ක්‍රියාවේ යෙදවෙයි. කැලෑවේ නීතිය නම් නො හැකි එකා මැඩ, හැකි එකා ජීවත්වීමේ නීතිය යි. බසයකට ගොඩ වීමේ දී මහල්ලා, දුබලයා, ගැබිණි මව නො තකා කාය ශක්තිය ඇත්තවුන් ජය ගන්නේ ඒ නිසා ය. බස් රථවල මගීන් වැඩි නම් සංඝයා වහන්සේ නමක් දුටු විට බස් රථ නතර කරන්නේ ම නැත. මන්ද ? සංඝයා වහන්සේ ගේ පැමිණීම මගී තදබදය තවත් සංකීර්ණ කරන්නේ යයි රියදුරන් විශ්වාස කරන බැවිනි. බසය ඇතුළත පූජ්‍ය පක්ෂයට ආසන වෙන් කර ඇතත්, එහි අසුන් ගැනීමට නම් බසයකට ගොඩ වීමේ ඉඩ කඩ පළමුවෙන් ම තහවුරු විය යුතු ය. බසයකට ගොඩ වීමේ අවසරයක් නො මැති විට බස් රිය තුළ වෙන් කළ අසුනකින් සංඝයා වහන්සේට ඇති ප්‍රයෝජනයක් ද නැත. යම් හෙයකින් බස් රථය නතර කරනු ලැබුවහොත් සංඝයා වහන්සේලා ද පොදු ප්‍රවාහන සේවය ප්‍රයෝජනයට ගන්නා පිළිවෙත ප්‍රදර්ශනය නො කර සිටින්නේ නැත. උන් වහන්සේලාගෙන් ඇතැමෙක් ද කාන්තාවන් පෙරළා ගෙන බස් රියට වඩිති. දෙන ලද තත්ත්වය තුළ උන් වහන්සේලාට වෙන කළ හැකි යමක් නැති බැවිනි.

මෙ රට මගී ජනතාව ගැබිණි මව්වරුන්, මහල්ලන් පෙරළා ගෙන බස් රථවලට ගොඩ වෙන්නේ හුදෙක් අවිනීත කම නිසා ම නොවේ. සම්පත් මගින් ඔවුන් තුළ අවිනීත චර්යාවක් නිර්මාණය කර ඇති නිසා ය. සංඝයා වහන්සේ ලා කාන්තාවන් පෙරළා ගෙන බස් රථවලට වඩින්නේ උන් වහන්සේලා විනය පිටකය කියවා නැති නිසා නො වේ. සම්පත් මගින් උන් වහන්සේලා තුළ ද අවිනය චර්යාවක් නිර්මාණය කර ඇති නිසා ය. මේ නිසා සම්පත්, චර්යාවේ ස්වභාවය තීරණය කරන ප්‍රබල සාධකයක් බව තේරුම් ගැනීමට හැකි ය. දුම්රිය ස්ථානයක්, තැපැල් කන්තෝරුවක්, ආරෝග්‍ය ශාලාවක් හෝ වෙනත් ඕනෑම පොදු සේවාවක් සම්බන්ධයෙන් වුව ද චර්යාව මේ ආකාරය ම ය. ගුවන් යානයකට ගොඩ වීමට ගියත් මගීන්

ලාංකිකයන් හෝ දකුණු ආසියාතිකයන් නම් වර්යාව එක සමාන ය. ඇතැම් දකුණු ආසියාතිකයන් හා සසඳන කල ලාංකිකයන්ගේ චර්යාව තරමක් හොඳ ය. ගුවන් යානයක ගමන් ගැනීම සඳහා මගීන්ගේ ආසන කල් වේලා ඇති ව වෙන් කොට, අංක දී තිබියදීත් ගුවන් යානයට ගොඩ වීම සඳහා ඔව්හු පොර බදන්නේ බස් රථයේ දී මෙන් ම තමන්ගේ ආසනය ගුවන් යානයේ දීත් අහිමි වේ දෝ යි යන කල්පනාව නිසා විය හැකි ය. නැත හොත් ඔවුන් ගොඩ වීමට පෙර බස් රියදුරන් ගමන් අරඹන්නා සේ ම ගුවන් යානය ද පියාසර කරනු ඇතැ යි යන කල්පනාවක් ඇති ව විය යුතු ය. මෙවැනි මිනිස් චර්යාවන්ගෙන් ප්‍රදර්ශනය වන්නේ අනෙකක් නො ව සම්පත් පදනම මගින් මනුෂ්‍යයාට දායාද කර දී ඇති ඇබ්බැහි වීම් ය. නැත හොත් සම්පත් සහ මනුෂ්‍ය චර්යාව අතර ඇති තාර්කික සම්බන්ධතාවය ය. එසේත් නැතහොත් සම්පත්වල ස්වභාවය, ප්‍රමාණය හා ගුණය අනුව මිනිසුන්ගේ චර්යාව නිර්මාණය වන ආකාරය ය.

- මෙ රට මගී ජනතාව ගැබිනි මව්වරුන්, මහල්ලන් පෙරළා ගෙන බස් රථවලට ගොඩ වෙන්නේ හුදෙක් අවිනීත කම නිසා ම නොවේ. සම්පත් මගින් ඔවුන් තුළ අවිනීත චර්යාවක් නිර්මාණය කර ඇති නිසා ය. සංඝයා වහන්සේ ලා කාන්තාවන් පෙරළා ගෙන බස් රථවලට වඩින්නේ උන් වහන්සේලා විනය පිටකය කියවා නැති නිසා නො වේ. සම්පත් මගින් උන් වහන්සේලා තුළ ද අවිනය චර්යාවක් නිර්මාණය කර ඇති නිසා ය.

- ගුවන් යානයක ගමන් ගැනීම සඳහා මගීන්ගේ ආසන කල් වේලා ඇති ව වෙන් කොට, අංක දී තිබියදීත් ගුවන් යානයට ගොඩ වීම සඳහා ඔව්හු පොර බදන්නේ බස් රථයේ දී මෙන් ම තමන්ගේ ආසනය ගුවන් යානයේ දීත් අහිමි වේ දෝ යි යන කල්පනාව නිසා විය හැකි ය. නැත හොත් ඔවුන් ගොඩ වීමට පෙර බස් රියදුරන් ගමන් අරඹන්නා සේ ම ගුවන් යානය ද පියාසර කරනු ඇතැ යි යන කල්පනාවක් ඇති ව විය යුතු ය.

මනුෂ්‍යයන් පුහුණුකිරීම්වලට ලක් කිරීම මගින් කරන්නේ චර්යාව වෙනස් කිරීමට උත්සාහ කිරීමකි. එනම් මනුෂ්‍යයාගේ දැනුම, ආකල්ප හා හැකියාවන් වෙනස් කිරීමකි. කිසියම් පුහුණුවක් මගින් දැනුම, ආකල්ප හා හැකියාවන් වෙනස් කළ ද චර්යාව වෙනස් වීමේ සහතිකයක් නැත. මන්ද? චර්යාව වෙනස් වීම කෙරෙහි සම්පත්

නියතයක් සේ ක්‍රියා කරන බැවිනි. 1970 ගණන්වල මුල් භාගයේ දී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පොහොර භාවිතය පිළිබඳ ව ගොවියා දැනුවත් කොට පොහොර යෙදවීම වැඩි කිරීම සඳහා රට පුරා පුහුණු වැඩ සටහන් පවත්වනු ලැබිණ. එහෙත් පුහුණු වැඩසටහන් නිසා ගොවීන්ගේ පොහොර භාවිතය සැලකිය යුතු පරිදි වර්ධනය වූයේ නැත. ගොවීන් පොහොර අඩුවෙන් භාවිතා කළේ ඔවුන්ට පොහොර ගැන දැනුමක් නො තිබූ නිසා ම නො වේ. පොහොර මිලට ගැනීමට අත මිට මුදල් නො තිබුණු නිසා ය. පසුව රජය පොහොර සඳහා ණය සහනාධාර වැඩපිළිවෙළ ක්‍රියාවේ යෙදවීමත් සමඟ පොහොර භාවිතය ඉහළ ගියේය. පොහොරවල ගුණ කොතරම් දැනගත්තත්, පොහොර යෙදීමේ අනු පිළිවෙළ දැනගත්තත් අත මිට මුදල් නැත්නම් පොහොර භාවිතය වැඩි වන්නේ නැත. මනුෂ්‍යයාගේ චර්යාව තීරණය කිරීමෙහි ලා බලපානු ලබන මේ සරල සත්‍යය පොහොර යෙදීම පිළිබඳ ගොවියාගේ චර්යාව වෙනස් කිරීම සම්බන්ධයෙන් පමණක් නො ව ඕනෑම කරුණක් සම්බන්ධයෙන් හෝ ඕනෑම මිනිස් චර්යාවක් සම්බන්ධයෙන් වුව ද සත්‍යයකි.

සම්පත්, මනුෂ්‍ය චර්යාව තීරණය කිරීම සම්බන්ධයෙන් තීරණාත්මක නියතයක් බව හෙළිදරව් කිරීමට සුදුසු තවත් උදාහරණයක් නම් රට පුරා ක්‍රියාවට නඟා ඇති ආදායම් උත්පාදන ව්‍යාපෘති වැඩපිළිවෙල ය. රාජ්‍ය අංශය මෙන් ම රාජ්‍ය නොවන අංශ විසින් ද ආදායම් උත්පාදන ව්‍යාපෘති ගම් මට්ටමින් බිහි කිරීම සඳහා පසු ගිය දශක දෙකක පමණ කාලය තුළ දරණ ලද උත්සාහ අපමණ ය. මේ ග්‍රන්ථය රචනා කරන කතුවරයා ද මෙවැනි ව්‍යාපෘති ගණනාවක් සම්බන්ධ පුහුණුකිරීම් හා පර්යේෂණ කටයුතුවල යෙදී ඇත. ව්‍යාපෘති සැලසුම් කිරීම, ක්‍රියාවට නැංවීම හා ඇගයුම් කිරීම පිළිබඳ ව ගැමි තරුණ තරුණියන් පුහුණු කිරීමේ වැඩසටහන් කොපමණ පැවැත්වුව ද ඒවායින් නිසි ඵල නෙළා ගැනීමට හැකි තරුණ තරුණියන් බිහි වන්නේ ඉතාමත් කලාතුරකිනි. බොහෝ විට කිසිවෙකුත් නොමැති තරම් ය. බිහිවන ආදායම් උත්පාදන ව්‍යාපෘති කරුවෝ ද, රටකජු හෝ කඩල විකිණීමට, ස්වීප් ටිකට් විකිණීමට, කොළ කැඳ විකිණීමට හෝ කුකුල් පට්ටියක් ඇති කිරීමෙන් ඔබ්බට යන්නේ ඉතාමත් කලාතුරකිනි. කතුවරයාගේ පුද්ගලික අත්දැකීම වන්නේ තරුණ

තරුණියන් සතු සීමිත ප්‍රාග්ධනය විසින් පනවනු ලබන සීමා ඉක්ම යාමට ඔවුන් අසමත් වන බව යි. කෙසේ වුව ද, පුද්ගලයන් සතු ව්‍යාපාරික ඥානය ද මෙහිදී වැදගත් සාධකයක් බව නො සලකා හැරිය නො හැක.

සම්පත්, මනුෂ්‍යයන් තුළ දැනට පවත්නා චර්යාවන් වෙනස් කිරීමට බාධා පමුණුවන නියතයක් සේ ක්‍රියා කරනවා පමණක් නො ව පවත්නා චර්යා තහවුරු කිරීමට ද, නව චර්යා නිර්මාණ කිරීමට ද පාදක වෙයි. සම්පත් සමඟ බැඳී තිබුණු සිංහලයන්ගේ යම් යම් චර්යා රටා පිළිබඳ ව රොබට් නොක්ස් ගේ ලියවිලි වලින් ඉතා පැහැදිලි විස්තර සැපයෙයි. හුදෙක් සිංහලයාගේ ගති සිරිත්වලට සම්බන්ධ චර්යා රටා වශයෙන් රොබට් නොක්ස් විස්තර කරන බොහෝ චර්යාවන් සිංහලයන් පරිහරණය කළ සම්පත් පදනම මත තීන්දු වූ චර්යාවන් බව ඉතා පැහැදිලි ය. රොබට් නොක්ස් තම වාර්තාවේ මෙසේ සඳහන් කරයි. 'සිංහලයෝ ගමනක් බිමනක් යන විට අනෙකුන්ගේ වස්ත්‍ර ද, කණ කර ආභරණ ද ඉල්ලා ඇඳ ගෙන යති. ඉල්ලා ඇඳගෙන යාම ඔවුන් ලැජ්ජාවට කරුණක් සේ සලකන්නේ නැත. ඇඳ පැළඳ සිටින තැනැත්තා අනෙකුන්ට කියන්නේ මේ මගේ ඇඳුම් නොව, අසවලාගෙන් ඉල්ලා ගෙන ඇඳගත් ඇඳුම් බව ය' (Knox 1681 P. 90). රොබට් නොක්ස් ට පෙනුණේ මෙය සිංහලයන් නම් වූ මිනිසුන් තුල තුබූ විශේෂ චර්යා ලක්ෂණයක් ලෙස ය. මන්ද? ඔහුගේ අත්දැකීම මත ඉංග්‍රිසි ජාතිකයෝ ඇඳුම් ඉල්ලා ගෙන අඳින්නේවත්, යම් හෙයකින් ඉල්ලා ගනු ලැබුව හොත් ඒ ගැන අනෙකුන්ට කියන්නේවත් නැති නිසා විය හැකි ය.

සිංහලයන් අනුන්ගේ ඇඳුම් ඉල්ලා ගෙන අඳින්නේ ඔවුන්ට සුවිශේෂ වූ චර්යාවක් නිසා නො වේ. පැරණි සිංහලයන්ගෙන් බොහෝ දෙනෙකුට ගමන් බිමන් යාමට හෝ උත්සවයකට ඇඳීමට හෝ සුදුසු මට්ටමේ ඇඳුම් නො තිබුණු නිසා ය. ගැමියන්ගෙන් බොහෝ දෙනෙකු දිළින්දන් නිසා එවැනි දිළින්දකු වටිනා ඇඳුම් අඳිනු ලැබුව ද ඒවා ඔහුට හෝ ඇයට අයත් නො වන බව අනෙකුත් ගැමියෝ දනිති. මේ නිසා ඇඳුම් ඉල්ලා ගත් බව ප්‍රකාශ කිරීමේ ප්‍රශ්නයක් ද නැත. එසේ කීව ද නො කීව ද ඉල්ලා ගත් ඇඳුම් ම විය යුතු බව අනෙකුන් දන්නා

නිසා ය. අනෙක් අතට ගැමියන් සියල්ලෝ ම මෙන් දිළින්දන් නිසා දිළිඳුකම වසන් කිරීමේ උවමනාවක් නැතුවා මෙන් ම දිළිඳුකම මදි පුංචි කමක් සේ සැලකීමේ හේතුවක් ද නැත. මේ නිසා ඉල්ලා ගත් ඇඳුම, ඉල්ලා ගත් එකක් යයි කීමෙන් ඇති වන විශේෂ ලජ්ජාවක් ද නැත. සිංහලයන්ගේ ඇතැම් චර්යා රටාවන් පිළිබඳ ව නොක්ස් හෙළි කරන තොරතුරු බොහෝ විට අර්ථවත් කළ හැක්කේ ගැමියන්ගේ සම්පත් පදනම සමඟ ඔවුන්ගේ චර්යා රටා ගැළපීමකිනි. සිංහල රජු දවස පමණක් නො ව අදත් ඇතැම් පිටිසර ගම්වල මිනිස්සු අනුන්ගෙන් ඉල්ලා ගෙන ඇඳුම් අඳිති. සම්පත් පදනම මත තීරණය වී ඇති මේ චර්යාව ගැමියන් අවඥාවට හේතුවක් සේ සලකනු ලබන්නේ නැත. ඇඳුම් ඇඳීම සම්බන්ධයෙන් පමණක් නොව වෙනත් බොහෝ චර්යා රටාවන් තීරණය වීම සම්බන්ධයෙන් ද සම්පත්වලින් වන බලපෑම ඉමහත් බව කිව යුතු ය.

## සම්භව නියතය

මනුෂ්‍යයාගේ චර්යාව විශ්ලේෂණය කිරීම සඳහා මේ පරිච්ඡේදය තුළ ඉදිරිපත් කරනු ලැබූ චර්යා ශ්‍රිතයෙහි අඩංගු 'එස්රෝ' නමින් හැඳින් වූ නියත සමූහයේ අවසන් නියතය වන්නේ O හෙවත් සම්භව නියතය යි. නැතහොත් පරම්පරාව යි. මනුෂ්‍ය චර්යාව නිශ්චය කිරීමෙහි ලා සම්භවය හෙවත් පරම්පරාව ද වැදගත් වන බව මීට පෙර සඳහන් කරනු ලැබිණ.

ජාන මනෝ විද්‍යාව තුළ කරන ලද විවිධ පර්යේෂණ හා නිරීක්ෂණ මඟින් ද, උරුමය හා චර්යාව අතර ඇති සම්බන්ධකම් හෙළිදරව් කිරීම සඳහා බ්‍රෝඩ්හර්ස්ට් විසින් කරන ලද පාලිත පරීක්ෂණ මඟින් ද සම්භව සාධකය චර්යාව නිශ්චය කිරීම කෙරෙහි බලපාන ආකාරය පැහැදිලි කර ඇත (Broadhurst, 1960). සම්භවය හෝ පරම්පරාව යන වචනයට ජීව විද්‍යාත්මක අර්ථයක් මෙන් ම සමාජ විද්‍යාත්මක අර්ථයක් ද ඇත. සමාජ විද්‍යාව තුළ අර්ථ දැක්වෙන පරම්පරාව හෝ සම්භවය යන යෙදුමට ලේ උරුමය හෝ ජාන සම්බන්ධකම් යන අදහසට අමතර ව සංස්කෘතික හෝ ඓතිහාසික උරුමය යන අදහස් ද අන්තර්ගත ය. මේ අර්ථ දැක්වීම අනුව සම්භව සාධකය හෙවත් පරම්පරාවෙන් එන චර්යා ලක්ෂණ S හෙවත් සමාජ පසුබිම්

නියතයෙන් හෙළිදරව් වන චර්යා ලක්ෂණ සමඟ පටලැවිල්ලක් ඇති කර ගන්නා බවක් පෙනේ. එහෙත් සම්භවයෙන් නිශ්චය වන චර්යා වෙන් කොට හඳුනා ගැනීමට යොදා ගත හැකි එක් තර්කානුකූල ක්‍රමයක් තිබේ. එනම්, යම් සමාජයක් විසින් දිගින් දිගට ම, පරම්පරාවෙන් පරම්පරාවට නො කඩවා පවත්වා ගෙන එන චර්යා රටාවක් E,S,R යන සාධක මගින් අර්ථ දැක්විය නො හැකි නම් එනම්, භෞතික පරිසරය, සමාජ පසුබිම හා සම්පත් පදනම මත අර්ථ දැක්විය නො හැකි නම් එම චර්යා O හෙවත් සම්භවය සමඟ සම්බන්ධතාවක් තිබිය හැකි බව යි.

පරම්පරාව හෙවත් සම්භවය ගැන අදහස් ඉදිරිපත් කර ඇති විද්වතුන් බොහෝ ය. නූතන සමාජ විද්‍යාවේ පියා වන ඔගස්ටේ කම්ටේ Auguste Comte ගේ අදහස අනුව යම් මනුෂ්‍ය චර්යා පද්ධතියක් ඊළඟ පරම්පරාවට දායාද කිරීම සඳහා බලපාන ප්‍රධාන සාධකය වන්නේ මනුෂ්‍යයකු ජීවත් වන වයස් ප්‍රමාණය යි. මනුෂ්‍යයකු යටත් පිරිසෙයින් වසර 30 ක් වත් ජීවත් වෙයි නම් ඔවුන්ගේ සමස්ත සමාජ ක්‍රියාවලියට සම්බන්ධ චර්යා රටා පද්ධතිය ම ඊළඟ පරම්පරාවට දායාද වන බව කම්ටේ කී ය. ජෝන් ස්ටුවට් මිල් මේ අදහස තව දුරටත් වර්ධනය කර කීවේ යම් මනුෂ්‍ය කොට්ඨාශයක දැනට පවත්නා චර්යා රටා සමූහයත් ඊළඟට පැමිණෙන මනුෂ්‍ය කොට්ටාශයේ චර්යා රටා සමූහයත් අතර වෙනසක් පවතී නම් ඒ වෙනසින් එළි දැක්වෙන්නේ පරම්පරා පරතරය බව යි (Mill, 1843). ඔටෙගා, ලෝරන්ස් එස් රයිට්ස්මන් ආදී හු කියන්නේ මනුෂ්‍යයන්ගේ චර්යාව තීරණය වන්නේ මනුෂ්‍යයන් සමාජය අර්ථකතනය කර ගන්නා ආකාරය (Social interpretation of reality) අනුව මිස සත්‍ය වශයෙන් තිබෙන්නේ කුමක් ද? සිදු වන්නේ කුමක් ද යන්න අනුව නො වන බව යි. මේ නිසා ඔවුන් ගේ අදහස වන්නේ පරම්පරාව අර්ථ දැක්වීම සඳහා ජීව විද්‍යාත්මක සාධකවලට වඩා වැඩි වැදගත්කමක් සමාජ සාධකවලට තිබෙන බව යි (Ortega,1933) (Wrightsman, 1994)

මනුෂ්‍ය චර්යාව විශ්ලේෂණය කිරීම සඳහා මේ ග්‍රන්ථය තුළ ඉදිරිපත් කරන ප්‍රවේශයෙහි O නමින් හැඳින්වෙන සම්භව සාධකයෙන් විස්තර කෙරෙන චර්යා රටාවන් ප්‍රධාන ලක්ෂණ දෙකකින් යුතු ය. ඉන්

පළමුවැන්න නම් හඳුනා ගනු ලබන කිසියම් චර්යා රටාවක් පරම්පරා ගණනාවක් පුරා ම නො කඩවා, නො බිඳී පවත්වා ගෙන යාම යි. දෙවැන්න එම චර්යා රටාවන් මනුෂ්‍යයාගේ චර්යාව තීරණය කිරීමට හේතු වන අනෙක් ප්‍රධාන සාධකයන් වන භෞතික පරිසරය, සමාජ පසුබිම හා සම්පත් පදනම මගින් තර්කානුකූල ව විස්තර කළ නො හැකි වීම යි. වෙනත් ආකාරයකින් කිව හොත් භෞතික පරිසරය වෙනස් වුව ද, සමාජ පසුබිම වෙනස් වුව ද, සම්පත් පදනම වෙනස් වුව ද ඒ වෙනස්කම්වලට ප්‍රතිචාර නො දක්වමින් යම් ජන සමාජයක් හඳුනා ගත් චර්යා රටා සමූහයක් නො වෙනස් ව පරම්පරාවෙන් පරම්පරාවට පවත්වා ගෙන යාම යි.

මනුෂ්‍යයන්ගේ චර්යා රටාවන් තුළ පරම්පරාවෙන් පරම්පරාවට ගෙන යන චර්යා රටාවන් ද, ගිලිහෙන චර්යා රටා ද, අලුතින් වැද්ද ගන්නා චර්යා රටාවන් ද ඇත. දිගින් දිගට ම ගෙන යන චර්යා රටා මගින් යම් මනුෂ්‍ය සමාජයක අනන්‍යතාව රැකේ. ගිලිහෙන චර්යා රටා හා අලුතින් වැද්දගන්නා චර්යා රටා නිසා පරම්පරා වෙනස හෙළිදරව් වේ. යම් චර්යාවක් ගිලිහෙන්නේත්, එමෙන් ම යම් නව චර්යාවක් වැද්දගන්නේත් හේතු සහිත ව ය. එක්කෝ භෞතික පරිසරය වෙනස් වීමෙනි. නැත හොත් සමාජ පසුබිම වෙනස් වීමෙනි. එසේත් නැතහොත් සම්පත් පදනම වෙනස් වීමෙනි. තවත් විටෙක විචල්‍ය සාධකයන් වූ දැනුම, කුසලතා ආදියෙහි වෙනසක් වීමෙනි. මේ ආදී සියලු සාධක වෙනස් වුව ද එම වෙනස්වීම්වලට ප්‍රතිචාර නො දක්වා යම් චර්යාවක් දිගින් දිගට ම පවත්වා ගෙන යන්නේ නම් එම චර්යාවන් මනුෂ්‍යයන්ගේ සම්භව සාධකය සමඟ හෙවත් පරම්පරාව සමඟ සම්බන්ධ බවට තර්ක කිරීම සාධාරණ ය.

මනුෂ්‍යයන්ගේ චර්යා රටාවන් තුළ පරම්පරාවෙන් පරම්පරාවට ගෙන යන චර්යා රටාවන් ද, ගිලිහෙන චර්යා රටාවන් ද, අළුතින් වැද්ද ගන්නා චර්යා රටාවන් ද ඇත. දිගින් දිගට ම ගෙන යන චර්යා රටා මගින් යම් මනුෂ්‍ය සමාජයක අනන්‍යතාව රැකේ. ගිලිහෙන චර්යා රටා හා අළුතින් වැද්දගන්නා චර්යා රටා නිසා පරම්පරා වෙනස හෙළිදරව් වේ.

මීට පෙර ද පෙන්වා දුන් පරිදි සම්භවය හෙවත් පරම්පරාව යන සාධකය අර්ථ දැක්වීම විෂයයෙන් විෂයට වෙනස් ය. සමාජ විද්‍යාවේ

අර්ථ දැක්වීමට වඩා ජාන විද්‍යාවේ අර්ථ දැක්වීම වෙනස් ය. ජාන විද්‍යාවේ අර්ථ දැක්වීමට වඩා පරිණාම වාදයේ අර්ථ දැක්වීම වෙනස් ය. කෙසේ වෙතත් මනුෂ්‍ය චර්යාව තේරුම් ගැනීම සඳහා වඩා වැදගත් වන්නේ සම්භවය යන්න අර්ථ දැක්විය යුත්තේ ජාන විද්‍යාව අනුව ද, සමාජ විද්‍යාව අනුව ද, ජීව විද්‍යාව අනුව ද , පරිණාම වාදය අනුව ද යන්න නො වේ. වැදගත් වන්නේ කුමන අර්ථ දැක්වීමක් මත හෝ විස්තර වන සම්භව සාධකය නිසා යම් මනුෂ්‍ය කොට්ඨාශයක් තුළ විශේෂයෙන් හඳුනා ගත හැකි චර්යා ලක්ෂණ තිබේ ද යන්න යි. එබැවින් යම් මනුෂ්‍ය කොට්ඨාශයක් පරම්පරාවෙන් පරම්පරාවට නො කඩවා ගෙන එන්නා වූ චර්යා රටාවකට පාදක වන්නේ ජාන විද්‍යාවේ විස්තර වන ඩීඑන්ඒ (Deoxyribonucleic Acid) හෝ ආර්එන්ඒ (Ribonucleic Acid) ආදී වූ ජීව රසායන ක්‍රියාවලිය ද නැතහොත් සමාජ විද්‍යාවේ විස්තර වන වර්ග , ගෝත්‍ර හෝ ඓතිහාසික උරුමය ආදී වූ කරුණු ද, එසේත් නැතහොත් පරිණාම විද්‍යාවේ විස්තර වන නීග්‍රෝවරු (Negroid ) යුරෝපීයයන් (Caucasoid) ආදී මිනිස් ප්‍රභේදයන් ද යන්න චර්යා විශ්ලේෂණයක් සඳහා වැදගත් නැත. මේ නිසා කතුවරයාගේ ව්‍යායාමය වන්නේ මිනිස් චර්යාව නිශ්චය කිරීමෙහි ලා පාදක වන අනෙකුත් කිසිදු නියත සාධකයක් සමඟ තාර්කික ව ගැළපිය නො හැකි එහෙත් පරමපරාවෙන් පරම්පරාවට නො කඩවා පවත්වා ගෙන යනු ලබන විශේෂ මිනිස් චර්යා රටාවන් හඳුනා ගැනීමත්, හඳුනා ගනු ලැබූ චර්යා රටා මත චර්යා විශ්ලේෂණයක යෙදීමත් පමණ ය.

සිංහල සම්භවයක් ඇති ශ්‍රී ලාංකිකයින් විසින් පාරම්පරිකව පවත්වා ගෙන එනු ඇතැ යි ඓතිහාසික වාර්තා වලින් හෙළිදරව් වන එමෙන් ම වර්තමානයේ දී ත් ඔවුන් විසින් ප්‍රදර්ශනය කරනු ලබන චර්යා රටාවන් විවිධාකාර ය. පිළිගත් සම්මතය අනුව ඒවායින් ඇතැම් ඒවා යහපත් ය. ඇතැම් ඒවා අයහපත් ය. සමාජ සජීවීකරණය පිළිබඳ ව සාකච්ඡා කරන මේ ග්‍රන්ථය මඟින් සිංහලයන් ගේ සම්භවය හා සම්බන්ධ වූ යහපත් චර්යාවන් ගැන සාකච්ඡා කිරීම එතරම් වැදගත් නැත. මන්ද? සජීවීකරණයට බාධා පැමිණෙන්නේ යහපත් චර්යාවන්ගෙන් නො වන හෙයිනි. අනෙක් අතට සජීවීකරණයක් සඳහා චර්යා වෙනසක් කළ යුතු නම් වෙනස් කළ යුත්තේ අයහපත්

චර්යාවන් බැවිනි. මේ නිසා සජීවීකරණයට බාධා පමුණුවන ප්‍රධාන පෙළේ අයහපත් චර්යා රටා තුනක් පිළිබඳ ව සම්භවය හා සම්බන්ධ චර්යා වශයෙන් ඉදිරියේ දී සාකච්ඡා කරනු ඇත. මේ චර්යාවන් නම් අලසකම හා අකාර්යක්ෂමකම, වහා අමතක කිරීමේ චර්යාව සහ මුසාව හා රැවටීම යි. මේ පරිච්ඡේදයේ ඉදිරි විස්තරය තුළ සිදු වන්නේ මෙකී චර්යාවන් පිළිබඳ ව විශ්ලේෂණයක් කිරීම ය.

> ශ්‍රී ලාංකිකයන්ගෙන් බහුතරයක් අලසකම නැති කර ගැනීමටත් අලස ය. අලසකම නැති කර ගන්නේ කෙසේ දැයි දැනගැනීමටත් අලස ය. අලසකම ගැන කතා කිරීමටත් අලස ය.

## අලසකම හා අකාර්යක්ෂමතාව

ශ්‍රී ලාංකිකයන්, විශේෂයෙන් සිංහලයන් වෙනත් බොහෝ ජන වර්ගයන් හා සසඳන කල බෙහෙවින් අකාර්යක්ෂම හා අලස මිනිසුන් යයි කියනු ලැබේ. එහෙත් මේ සැසඳීම සත්‍ය වන්නේ බටහිර රටවල මිනිසුන් හා ඇතැම් නැගෙනහිර ආසියාතිකයන් සමඟ සසඳන කල මිස දකුණු ආසියාතිකයන් සමඟ සසඳන කල නො වේ. දකුණු ආසියාතිකයන් හා සසඳන කල ශ්‍රී ලාංකිකයෝ අලසකම හා අකාර්යක්ෂමකම අතින් අඩු වැඩි වශයෙන් ඔවුනට සමාන ය. අලසකම හා අකාර්යක්ෂමතාව සම්භවය හා සම්බන්ධ මිනිස් චර්යා සමඟ බැඳී තිබේ ද නැතහොත් භෞතික පරිසරය හෝ සමාජ පසුබිම සමඟ බැඳී තිබේ ද, යන්න තෝරා බේරා ගැනීම තරමක් අපහසු ය. අලසකම හා අකාර්යක්ෂමතාව සම්භවයේ ලක්ෂණයක් වශයෙන් මෙන් ම භෞතික පරිසරයේ හා සමාජ පසසුබිමේ නිර්මාණයක් සේ විග්‍රහ කිරීමට ද යම් යම් තොරතුරු තිබේ. නිවර්තන කලාපීය රටවල ජීවත් වන මිනිස්සු ශීත රටවල ජීවත් වන මිනිසුන්ට වඩා ස්වභාවයෙන් ම අලස යැයි මතයක් තිබේ. මේ මතය පරීක්ෂණ මඟින් තහවුරු කර ඇති බවට සාක්ෂි නැතත් නිරීක්ෂණ අනු ව සනාථ කළ හැකි මතයකි. දක්ෂකම, කාර්යශූර භාවය, උද්‍යෝගිමත් බව ආදී මිනිස් චර්යාවන්ට වටිනාකමක් නො දෙන සමාජ පසුබිමක් නිසා ද අලසකම ජනිත වන බවට මතයක් තිබේ. මේ මතය සනාථ කිරීම සඳහා ද යම් යම් කරුණු තිබේ. දිළිඳුකම විසින් අලසකම හෝ අකාර්යක්ෂමතාව නිර්මාණය කරන බවට තවත් මතයක් තිබේ. මේ මතයෙන් ප්‍රකාශ

වන්නේ ආහාර පානාදිය හිඟකම නිසා ඌණ පෝෂණයන්ට ලක් වීම කරණ කොට ගෙන ජීව විද්‍යාත්මක හේතූන් මත මිනිසුන් අලස හා අකාර්යක්ෂම වන බව යි.

- 'සිංහලයන්ට කම්මැලිකම මහත් ආහ්ලාදයට හෝ ප්‍රීතියට කරුණකි. ඔව්හු තදියමක් ඇති වන තෙක් ම වැඩ කටයුතු කිරීම පසුවට කල් දමති' (knox 1681. p. 65).
- සිංහලයන්ට ඔවුන්ගේ ආර්ථිකය ගොඩ නගා ගැනීම සඳහා උවමනා තරම් සම්පත් තිබේ. ඔවුනට යාරවත් ඉඩම් ද , ඇත් දත් ද, පොළවෙන් හාරා ගැනීමට මැණික් ද ඇත. වෙළදාම ද දියුණු කළ හැකි ය. එහෙත් සම්පත් වලින් ප්‍රයෝජනය ගැනීමටත්, වෙළදාම දියුණු කිරීමටත් උද්‍යෝගීමත් බව හා කාර්යක්ෂම බව උවමනා ය. එහෙත් මේ දෙක ම සිංහලයන්ට නැත ((knox 1681, p. 32).
- 'මේ මිනිසුන් වගා කිරීමට බොහෝ කම්මැලි යි.' (Ribeiro, 1685 P. 124).
- 'ජය ගැනීමට අපහසු ම බාධකය නම් සිංහලයන්ගේ කම්මැලිකම යි' (Bussche, 1817 P. 95).

දේශගුණය, සමාජ වටපිටාව, පෝෂණය ආදී වූ විවිධ හේතූන් නිසා අලස බව නිර්මාණය වන බවට ඇති මත කිසිවක් ප්‍රතික්ෂේප කළ නො හැකි ය. මන්ද? සෑම මතයකට ම සාධාරණ තර්කයක් පදනම් වී ඇති බැවිනි. කෙසේ වෙතත් සිංහලයන්ගේ අලසකමට වැඩි සම්බන්ධකමක් තිබෙන්නේ දේශගුණය ආදී වූ හෙතූන් සමඟ නො ව සම්භවය සමඟ යයි තර්ක කිරීමට සාධාරණ කරුණු කිහිපයක් තිබේ. ඉන් එකක් නම් ලංකාවේ ශීත දේශගුණය සහිත නුවරඑළිය වැනි ප්‍රදේශවල ජීවත් වන මිනිසුන් හා උෂ්ණ දේශගුණය සහිත ප්‍රදේශවල ජීවත් වන මිනිසුන් තුළ තිබෙන අලසකමේ හෝ කාර්යක්ෂමකමේ කැපී පෙනෙන වෙනස්කම් දක්නට නො තිබීම ය. මෙයින් හෙළිදරව් වන්නේ දේශගුණය නො වන කරුණු මත අලසකම බැඳී තිබෙන බව ය. ඌණ පෝෂණය ඇති ලාංකිකයන් තුළ මෙන් ම ඌණ පෝෂණය නො මැති ලාංකිකයන් තුළ ද එක සේ අලස බව දක්නට ලැබීමෙන් තහවුරු වන්නේ ඌණ පෝෂණය සමඟ ද අලස බව සෘජු සම්බන්ධයක් නො පවත්වන බව ය. ඇතැම් විට ඌණ පෝෂණය සහිත, ගැමි දිළින්දන්ට වඩා ඌණ පෝෂණය රහිත මධ්‍යම පාංතික රාජ්‍ය නිලධාරීනු

අලසකමින් හා අකාර්යක්ෂමකමින් වැඩි බව කතුවරයා අත් දැක ඇත. සිංහලයන් ප්‍රධාන කොට ගත්, ශ්‍රී ලාංකිකයන්ගෙන් බහුතරයක් අලසකම නැති කර ගැනීමටත් අලස ය. අලසකම නැති කර ගන්නේ කෙසේ දැයි දැනගැනීමටත් අලස ය. අලසකම ගැන කතා කිරීමටත් අලස ය. මේ නිසා දේශගුණය, සමාජ වටපිටාව, පෝෂණය යනාදී සාධකයන්ට වඩා සම්භව සාධකය සමඟ අලසකම ආසන්න සම්බන්ධතාවක් තිබේ යයි කීම සාධාරණ ය.

ශ්‍රී ලාංකිකයන් ස්වභාවයෙන් ම අලස හා අකාර්යක්ෂම මිනිසුන් යයි කතුවරයා සඳහන් කරන්නේ ප්‍රධාන තොරතුරු මූලයන් හතරක් මත ය. ඉන් පළමු මූලය වන්නේ ඓතිහාසික වාර්තාවන් ය. දෙවැන්න තත්කාලීන සංවර්ධන සාහිත්‍යය යි. තුන්වැන්න මෙරට සංවර්ධන කටයුතුවල නියැලී සිටි විදේශිකයන් තුළින් ලබා ගත් තොරතුරු ය. හතර වැන්න හෙවත් ඉතාමත් ප්‍රධාන තොරතුරු මූලය වන්නේ දශක කිහිපයක් තුළ කතුවරයා ඔහුගේ අත්දැකීම හා ප්‍රත්‍යක්ෂය මඟින් ගොනු කර ගත් තොරතුරු ය. මේ එක් එක් තොරතුරු මූලය පාදක කොට ගෙන සම්භවය සමඟ අලසකම සම්බන්ධ දැ යි විමසා බලමු.

මෙම ග්‍රන්ථය සඳහා ඓතිහාසික තොරතුරු සපයන ප්‍රධාන මූලයන් වන නොක්ස් , රිබෙයිරෝ හා හයිඩ් ගේ වාර්තා මඟින් ද, බුෂී, සුලිවාන් ආදීන් ගේ සංචාරක වාර්තා මඟින් ද සිංහලයන්ගේ අකාර්යක්ෂමකම හා අලසකම පිළිබඳ ව සෘජු ලෙස ම හෙළිදරව් කර ඇත. නොක්ස් කියන්නේ මෙසේ ය. ·Chingulays are naturally, a people given to floth and lazinefs: if they can but any ways live, they abhor to work; onely what their neceffities force them to, they do, that is, to get Food and Rayment· ( knox 1681, p. 32). සිංහලයෝ වනාහි ස්වභාවයෙන් ම අලසයෝ ය. කම්මැලියෝ ය. වැඩ නො කර යාන්තම් පණකෙන්ද ගැට ගසා ගැනීමට හැකි කම තිබෙන බව පෙනුනොත් වැඩ කිරීම පිළිකුල් කරති. ඔවුන් වැඩ කරන්නේ වැඩ නො කර බැරි නිසා ය. එනම් ආහාර ලබා ගැනීමටත්, ගෙවීම් කිරීමටත් යමක් උවමනා නිසා ය. තවත් අවස්ථාවක නොක්ස් සිංහලයන්ගේ කම්මැලිකමේ ස්වභාවය පිළිබඳ ව සංක්ෂිප්ත විශ්ලේෂණයක යෙදෙමින් මෙසේ කියයි. ·..........delighting in

floath, deffering labour till urgent neceffity conftrain them ......' (knox 1681. p. 65) 'සිංහලයන්ට කම්මැලිකම මහත් ආහ්ලාදයට හෝ ප්‍රීතියට කරුණකි. ඔව්හු තදියමක් ඇති වන තෙක් ම වැඩ කටයුතු කිරීම පසුවට කල් දමති.' නොක්ස් සිංහලයන්ගේ ආර්ථිකය පිළිබඳ ව විශ්ලේෂණයක යෙදෙමින් කියන්නේ මෙවැනි අදහසකි.

සිංහලයන්ට ඔවුන්ගේ ආර්ථිකය ගොඩ නගා ගැනීම සඳහා උවමනා තරම් සම්පත් තිබේ. උන්ට සාරවත් ඉඩම් ඇත. ඇත් දත් ඇත. පොළොවෙන් හාරා ගැනීමට මැණික් ඇත. ඉතා පහසුවෙන් උන්ගේ බිමේ කපු වගා කළ හැකි ය. කඳු වලින් පහත බිම්වල ජීවත් වන අයට කපු වවා ඒවායින් ඇඳුම් සාදා ගත හැකි ය. උවමනාවක් තිබේ නම් කපු නො වැවෙන උඩරට වැසියන් ට ඒවා විකිණීමට ද හැකි ය. ඒ අනුව වෙළඳාම ද දියුණු කළ හැකි ය. එහෙත් උන්ගේ සම්පත් වලින් ප්‍රයෝජන ගැනීමට නම් උද්‍යෝගිමත් බව හා කාර්යක්ෂම බව උවමනා ය. එහෙත් මේ දෙකම උන්ට නැත 'All thefe things that land affords, and it might do it in much greater quantity, if the people were but laborious and industrious' (Knox 1681, P. 32) නොක්ස් මෙම විශ්ලේෂණය කරනු ලැබුයේ පරම්පරා විසි පහකට පමණ පෙර දී ය. එනම් දෙවැනි රාජසිංහ රජු පාලනය කළ සමයේ අත්දැකීම් මත පදනම් ව ය. එහෙත් මේ විශ්ලේෂණය අදටත් වලංගු නො වන්නේ ද?

ශ්‍රී ලංකාවේ සශ්‍රීකත්වයත්, එහි ජීවත් වන මනුෂ්‍යයන්ගේ අලසකම ගැනත් පෘතුගීසි ජාතික රිබෙයිරෝ කියන්නේ මෙසේ ය. 'They are very lazy in cultivation, for their forests yield them food in abundane and the only article they lack is salt' (Ribeiro, 1685 P. 124) 'මේ මිනිසුන් වගා කිරීමට බොහෝ කම්මැලි ය. එහෙත් වනාන්තරවලින් ආහාරවලට උවමනා දේ බහුල ව ලැබේ. එබැවින් ඔවුනට හිඟ පාඩුව තිබෙන්නේ ලුණු පමණි.' ශ්‍රී ලංකාව සංවර්ධනය කිරීමේ දී ජය ගැනීමට ඉතාමත් ම අපහසු බාධකය වී තිබෙන්නේ සිංහලයන්ගේ කම්මැලිකම බව බුස්චිගේ ලිපි එකතුවෙන් ද හෙළි වෙයි. 1817 දී බුස්චි පළ කරන ලද 'ලංකාව පිළිබඳ ලිපි' නම් කෘතියේ මෙසේ

සඳහන් වේ. 'The indolence of the Chigalese will be most diffuclt to overcome' (Bussche, 1817 P. 95) 'ජය ගැනීමට අපහසු ම බාධකය නම් සිංහලයන්ගේ කම්මැලිකම යි' .

බටහිර රටවල හා ආසියාකරයේ දියුණු යයි සම්මත රටක් වන ජපානය වැනි රටවල ද කම්මැලියන් සිටී. එහෙත් ඔවිහු ඉතා අඩුවෙන් හමු වන මිනිසුන් ය. ලංකාවේ ද කඩිසර, උද්යෝගිමත්, කාර්යක්ෂම මිනිසුන් සිටිති. ඔවුන් ද ඉතා අඩුවෙන් හමු වන මිනිසුන් ය.

ශ්‍රී ලංකාවේ සංචාරයක යෙදීමෙන් පසු ලංකාව ගැන වාර්තාවක් ලියූ එඩ්වඩ් සුලෙයිවාන් සිංහලයන්ගේ අලසකම ගැන සඳහන් කර ඇත්තේ මෙසේ ය. '.........The Cingalease are of that miserable race that will not work unless forced to do so. Even gold, that all powerful persuader, fails in producing the desired effect; and I feel convinced, that if English energy and Malabar labour were removed, all that has hitherto been done for the island would, in five years have utterly and entirely disappeared, and the coffee and cocoa crops have sunk to nothing' (Sullivan, 1854, P. 48) 'සිංහලයෝ වනාහි මහත් අවාසනාවන්ත වර්ගය කි. ඔව්හු බල කිරීමක් නො මැති නම් වැඩෙහි යෙදෙන්නේ නැත. රත්රන් හෝ මොනයම් වෙනත් පෙළඹවීමක් මගින් වුව ද උන් වැඩට පෙළඹ විය නො හැකි ය. මගේ තේරුම් ගැනීම අනුව ඉංග්‍රිසීන්ගේ හා මලබාර් ජාතිකයන්ගේ ශ්‍රමය ඉවත් කරනු ලැබුව හොත් මේ දිවයින තුළ මෙතෙක් ගොඩ නැගූ සියලු දේ අවුරුදු පහක් ගත වීමට මත්තෙන් මුළුමනින් ම අතුරුදන් ව යන්නේ ය. කෝපි වගාව හා කොකෝවා වගාව ද කිසිදු නිෂ්පාදනයක් නො කරන තත්වයකට ඇද වැටෙන්නේ ය.'

'සිංහලයන් වනාහි මහත් අවාසනාවන්ත වර්ගය කි. ඔව්හු බල කිරීමක් නො මැති නම් වැඩෙහි යෙදෙන්නේ නැත. රත්රන් හෝ මොනයම් වෙනත් පෙළඹවීමක් මගින් වුව ද උන් වැඩට පෙළඹ විය නො හැකි ය. මගේ තේරුම් ගැනීම අනුව ඉංග්‍රිසීන්ගේ හා මලබාර් ජාතිකයන්ගේ ශ්‍රමය ඉවත් කරනු ලැබුව හොත් මේ දිවයින තුළ මෙතෙක් ගොඩ නැගූ සියළු දේ අවුරුදු පහක් ගත වීමට මත්තෙන් මුළුමනින් ම අතුරුදන් ව යන්නේ ය. කෝපි වගාව හා කොකෝවා වගාව ද කිසිදු නිෂ්පාදනයක් නො කරන තත්වයකට ඇද වැටෙන්නේ ය' (Sullivan, 1854, P. 48).

ඉහත ඉදිරිපත් කරනු ලැබුයේ සිංහලයන්ගේ අලසකම පිළිබඳ ව සෘජු ලෙස ම වාර්තා කර ඇති ඓතිහාසික ලේඛන කිහිපයකි. වර්තමාන සංවර්ධන සාහිත්‍ය තුළ ගොනු වී ඇති පර්යේෂණ තීන්දු තුළින් සනාථ වන්නේ ද ඓතිහාසික ව වාර්තා වී ඇති මේ සත්‍ය ම ය. ශ්‍රී ලංකාව පිළිබඳ ව පමණක් නො ව දකුණු ආසියාව සමස්තයක් ලෙස ගෙන ඉතා තියුණු පර්යේෂණයක යෙදුණු ගුනාර් මිර්ඩාල් 1972 දී ලියන ලද ආසියානු නාටකය (Asian Drama) නම් වූ පර්යේෂණ කෘතියෙහි දකුණු ආසියාතිකයන්ගේ චර්යාව සංවර්ධනය කෙරෙහි බාධක වන ආකාරය ඉතා මැනවින් විස්තර කර ඇත. ගුනාර් මිර්ඩාල් කියන්නේ බටහිරට ගැළපෙන ආර්ථික න්‍යායන් දකුණු ආසියාව තුළ දී අවලංගු බව ය. ඔහු කියන්නේ නූතන මිනිසාට, නූතන විද්‍යාව විසින් ජනිත කළ ලොවට හෝ කාර්මික කරණයට හසු වූ නව ලෝකයට නො ගැළපෙන චර්යා රටාවන් දකුණු ආසියාතිකයන් තුළින් ප්‍රදර්ශනය වන බව ය. නව ලොව ජීවත් වීම සඳහා මිනිසා තුළ තිබිය යුතු යයි විශ්වාස කරන කාර්යක්ෂමතාව, කඩිසරකම, කලට වේලාවට වැඩ කිරීම, ආදී වූ චර්යා රටාවන් දකුණු ආසියාතිකයන් තුළින් ප්‍රදර්ශනය නො වන නිසා දකුණු ආසියාතිකයන් සම්බන්ධයෙන් බලන විට ආර්ථික ඵල ප්‍රයෝජන ලැබිය හැකි අවස්ථා බහුල වශයෙන් මඟ හැරෙන බව (Lost economic opportunities) ගුනාර් මිර්ඩාල් ගේ අදහස යි.

බටහිර රටවල හා ආසියාකරයේ දියුණු යයි සම්මත රටක් වන ජපානය වැනි රටවල ද කම්මැලියෝ සිටිත්. එහෙත් ඔවුහු ඉතා අඩුවෙන් හමු වන මිනිස්සු ය. ලංකාවේ ද කඩිසර, උද්යෝගිමත්, කාර්යක්ෂම මිනිස්සු සිටිති. ඔවුහු ද ඉතා අඩුවෙන් හමු වන මිනිස්සු ය. ලාංකිකයන් ගේ කම්මැලිකම හෝ අකාර්යක්ෂමකම ලාංකිකයන්ට වඩා පෙනෙන්නේ විදේශිකයන්ට ය. ලාංකිකයන්ගේ අලස හැසිරීම තක්සේරු කිරීම සඳහා විදේශිකයෙකු විසින් මා පෙළඹ වූ එක් සිදු වීමක් මෙසේ ය. මේ සිදු වීම සිදු වන කාලයේ සජීවීකරණය ගැන ග්‍රන්ථයක් ලිවීමේ කිසිදු අදහසක් මා වෙත නො තිබුනා පමණක් නො ව සජීවීකරණය යයි මාතෘකාවක් තිබේ ද යන්නවත් දැන නො සිටියෙමි. එහෙත් මේ ග්‍රන්ථය රචනා කරන මේ යුගය වන විට එදා ලැබූ අත්දැකීම අතිශයින් වැදගත් ය. සිදු වීම මෙසේ ය. 1980

ගණන් වල මුල් භාගයේ වාර් පුනරුත්ථාපන වැඩ සටහනක උපදේශකයෙකු වූ විදේශීය ජාතිකයෙකු සමග මම ක්ෂේත්‍රයට ගියෙමි. පුනරුත්ථාපන වැඩසටහන ක්‍රියාත්මක වූ ප්‍රදේශයේ එවකට මහා මාර්ග නඩත්තුවක් ද සිදු වෙමින් පැවතිණ. මහා මාර්ගයේ එක් පසෙක කාණුවක් හාරමින් සිටි පිරිසක් දෙස ටික වේලාවක් බලා සිටි විදේශිකයා සිනාසිණි. සිනාසීමට හේතුව කුමක් දැ යි මා විමසූ විට වැඩ කරන පිරිස දෙස නිරීක්ෂණය කරන ලෙස උපදේශකයා කී ය. මම හොඳින් නිරීක්ෂණය කළෙමි. එහෙත් සිනාසීමට තරම් කරුණක් එහි ඇති බවක් මට පෙනුණේ නැත. විදේශිකයා කාරණය පැහැදිලි කරන තුරු ම සිනාසීමට තරම් කරුණක් ඇති බව මට ඒත්තු ගියේ ද නැත. ඔහු සිනාසුනේ ලාංකිකයන්ගේ කාර්යක්ෂමතාව ගැන ය. එදා කාණුව කැපූ තැන කම්කරුවන් කී දෙනෙක් සිටියා දැයි මට අද මතක නැත. කෙසේ වෙතත් දෙදෙනෙකු වැඩෙහි නියුක්ත වී සිටි නමුත් අනෙක් සියලු දෙනා ඒ අසල බලා සිටි බව නම් මතක ය. මට එදා සිතුණේ විදේශිකයා ලාංකිකයන් බාල්දු කිරීමට දැරූ උත්සාහයක් ලෙස ය. එහෙත් එය සිනාසීමට තරම් ප්‍රමාණවත් කරුණක් බව ඒත්තු ගියේ වෙනත් රටවල මිනිසුන්ගේ කඩිසර බව පිළිබඳවත්, කාර්යක්ෂම බව පිළිබඳවත් පුද්ගලිකව ම ප්‍රත්‍යක්ෂ කර ගැනීමෙන් පසු ව ය.

ශ්‍රී ලාංකිකයන් අලස, අකාර්යක්ෂම මිනිසුන් බව කීමට නොක්ස් ගේ වාර්තාවන් වත්, හයිඩ් ගේ වාර්තාවන් වත් වෙනත් අටුවා ටීකාවන් වත් අවශ්‍ය වන්නේ නැත. විදේශිකයා නිරීක්ෂණය කළාක් මෙන් පාරක කානුවක් කපන තැන, විදුලි කම්බියක් එලන තැන, රේල් පීල්ලක් දමන තැන වෙනත් කටයුත්තක් කෙරෙන තැනක් හෝ රජයේ කාර්යාලයක් නිරීක්ෂණය කිරීම හොඳට ම ප්‍රමාණවත් ය. බොහෝ විට වැඩෙහි යෙදෙන අයට වඩා වැඩෙහි නො යෙදෙන අය වැඩි ය. කාලය නාස්ති කරන අයගේ සංඛ්‍යාව කාළය යොදවන අයගේ සංඛ්‍යාවට වඩා වැඩි ය. ඕනෑම සරළ සිදු වීමක් නිරීක්ෂණය කල විට දැකිය හැකි සිද්ධිමය සත්‍යතාව වන්නේ මෙය යි. මේ සත්‍ය සමස්තය විස්තර කිරීම සඳහා ද එක සේ වලංගු ය. කිසියම් දෙන ලද අවස්ථාවක සමස්ත ජනතාව වැඩ කරන ආකාරයත්, වැඩ නො කරන ආකාරයත් බැලීමට සුදුසු ස්ථානයක් ගුවනේ ඇත්නම් ජාතියේ

කාර්යක්ෂමතාව පෙනෙනු ඇත්තේ කානුව කැපූ තැන තිබූ කාර්යක්ෂමතාව පරිදි ම ය. අනිවාර්යයෙන් ම වැඩ කරන අයට වඩා නො කරන අය වැඩි බව නම් නිරීක්ෂණය කළ හැකි වනු ඇත.

ශ්‍රී ලාංකිකයන්ට වැඩ නො කිරීමට හෝ වැඩ කල් දැමීම සඳහා නිදහසට ඉදිරිපත් කළ හැකි කරුණු එමට ය. ඒවායින් බොහොමයක් වැඩ නො කිරීම සඳහා නිදහසට ඉදිරිපත් කළ හැකි වුවත් සත්‍ය වශයෙන් ම වැඩ නො කිරීමට හෝ වැඩ කල් දැමීමට තරම් තාර්කික හේතූන් නො වන බව කතුවරයාගේ පෞද්ගලික අත්දැකීම ය. වර්ෂාව, ගංවතුර, බෝම්බ, මැතිවරණ, විදුලි බලය ඇණ හිටීම, නාය යාම, පරිගණක ආදියෙහි මතු වන ගැටලු , ප්‍රවාහන ගැටලු, පිරිත් පිංකම්, උත්සව ආදිය වැඩ නො කිරීමට හෝ වැඩ කල් දැමීම සඳහා නිදහසට ඉදිරිපත් කරනු ලබන බාල වර්ගයේ කරුණු වලින් අතලොස්සකි. මේ සියල්ල අලසකමෙහි ලක්ෂණයක් ම වන්නේ ය. මීට අමතර ව අද ප්‍රධානියා නැත. හෙට ලිපිකරුවා නැත. දෙදෙනා ම සිටින විට ලිපි ගොනුව සෙවීමට කාර්යාල සහායකයා නැත ආදී වූ සේවය ලබා ගන්නා තැනැත්තා කිසිසේත් වග නො කිව යුතු තුන් වැනි පංතියේ හේතූන් ද වැඩ නො කිරීමට හෝ කල් දැමීම සඳහා හොඳටම ප්‍රමාණවත් කරුණු ය. සමාජ ආර්ථික වශයෙන් ඉදිරියට ගිය දියුණු යයි සම්මත රටවල වැඩ නො කිරීම සඳහා ම යොදා ගත් නිවාඩුව යන හේතුව හැරුණු විට අනිකුත් කිසිදු හේතුවක් වැඩ නො කිරීමට හෝ කල් දැමීමට කාරණයක් නො වන්නේ ය. ශ්‍රී ලාංකිකයන්, විශේෂයෙන් රාජ්‍ය අංශයේ නියුක්ත වූවන් සම්බන්ධයෙන් බලන විට වැඩ කරන දිනයකත් වැඩ නො කරන දිනයකත් ඇත්තේ ඉතා සුළු වෙනස්කමක් පමණි.

> සිංහල ගැමියන් අමනාපකම් දිගින් දිගට ම නො පවත්වා ඉතා ඉක්මනින් අතීතය අමතක කර දමති.

## වහා අමතක වන බව හා වැනෙන බව.

ශ්‍රී ලංකාවේ බහුතරයක් වන සිංහලයන්ගේ සම්භවය හා සම්බන්ධ තවත් චර්යාවක් සේ දැක්විය හැක්කේ වහා අමතක වීමේ ලක්ෂණය යි. වහා අමතක වීමේ ලක්ෂණයේ ගුණ මෙන් ම අගුණ ද තිබේ.

එහෙත් ගුණ වලට වඩා අගුණ වැඩි ය. එහි එක් හොඳ ගුණයක් සේ නොක්ස් දක්වන්නේ සිංහලයන් ඉතා ඉක්මණින් සතුරු තත්ත්වයේ සිට මිතුරු තත්ත්වයට පරිවර්තනය කර ගත හැකි මිනිසුන් බව ය. සිංහල ගැමියන් අමනාපකම් දිගින් දිගට ම නො පවත්වා ඉතා ඉක්මණින් අතීතය අමතක කර දමන්නේ මේ විශේෂ චර්යා ලක්ෂණ ය නිසා ය. සැර පරුෂ වචනයෙන් එකිනෙකාට බැණ දොඩා දින කීපයකින් අනතුරු ව නැතහොත් එදින ම නැවතත් මිත්‍ර ව,කුළුපග ව සිටින සිංහලයන් නිතර දැකිය හැකි ය. එය ඔවුන්ගේ සම්භවය හා බැඳී පවතින චර්යාවක් බව සරල නිරීක්ෂණයකින් වුව ද පසක් කර ගත හැකි ය.

වහා අමතක වීමේ ප්‍රධානතම අගුණය නම් සිංහලයාට ඉතිහාසයෙන් ඉගෙන ගැනීමට ඇති අවස්ථාව වැළකී යාම යි. දියුණු වන ඕනෑම ජාතියක් ඉදිරියට යන්නේ ඉතිහාසයෙන් ඉගෙන ගත් කරුණු මත පදනම් ව ය. එහෙත් ශ්‍රී ලාංකිකයෝ විශේෂයෙන් සිංහලයෝ එක ම වරද නැවත නැවත ඒ ආකාරයෙන් ම සිදු කරන්නා වූ මිනිස්සු ය. රෑ වැටුණ වළේ දවල් නො වැටිය යුතු යයි ඔවුන් අතර කියමනක් ඇතත් ඔව්හු රෑ දවල් භේදයකින් තොර ව එක ම වළේ නැවත නැවතත් වැටෙනා මිනිස්සු ය. දේශපාලනය සම්බන්ධයෙන් බැලුවත්, යුද්ධය සම්බන්ධයෙන් බැලුවත්, රටේ කැරළි කෝලාහල සම්බන්ධයෙන් බැලුවත් නිරන්තරයෙන් ම සිදු වන්නේ එක ම ක්‍රියාවලිය කි. මන්ද ? ඉතිහාසයෙන් උගත් පාඩම් වහා අමතක වන නිසා සිංහලයන් එක ම පාඩම නැවත නැවතත් ඉගෙන ගන්නා මිනිසුන් බැවිනි.

> සිංහලයන් ගෙන් බහුතරයක් ප්‍රතිපත්ති රහිත වැනෙන මිනිසුන් ය.

සිංහලයන් ගෙන් බහුතරයක් ප්‍රතිපත්ති රහිත වැනෙන මිනිස්සු ය. සිංහලයන් උන්ගේ ම එකෙකුගේ වචනයට වඩා සුද්දෙකුගේ වචනය ගරු කරන්නේ සුද්දන් හා සිංහලයන් එකිනෙකා සමග සැසඳීමෙන් ඔවුන් ලබා ඇති අත්දැකීම් මත පදනම් ව ය. 'සුද්දා කිව්වොත් කිව්වාමයි.' 'සුද්දාගේ වචන දෙකක් නැහැ' වැනි යෙදුම් සිංහල ජන වහරට පැමිණ ඇත්තේ සුද්දා ගේ ස්ථිර බවත්, සිංහලයාගේ වැනෙන බවත් පිළිබඳ ව සිංහලයා විසින් ම ගොඩ නැගු සමාජ වටිනාකම්

මත මිස සිංහලයන් සුද්දන්ට යටත්ව සිටි නිසා නො වේ. නැතහොත් පරාධීනත්වය නිසා නො වේ. කලාතුරකින් හෝ සිංහලයෙකු ස්ථිර ප්‍රතිපත්ති මත පිහිටා කටයුතු කරන බව දුටු විට අනෙකුත් සිංහලයන් ඔහුට කියන්නේ 'මිනිහා හරියට සුද්දා වගේ' කියා ය. තමන් ගේ වැනෙන සුලු බව තමන් ම දන්නා නමුත් සහජ ගති නිසා (සම්භවය නිසා) අත් හැරිය නො හැකි තත්ත්වයක් තුළ සිංහලයන් කොටු වී සිටිනා බවක් පෙනේ. සුද්දන් පිළිබඳ ව සිංහලයන් තුළ ගොඩ නැගී ඇති මේ ඇගයුමට පදනම වැටී තිබෙන්නේ අපට වඩා හොඳ චර්යාවන් සුද්දන් තුළ ඇති බව අපේ ම යටි සිත් දන්නා නිසා ය. උන් බොරු කියන්නේ ඉතා කලාතුරකින් බවත්, පොරොන්දු ඉටු කරන බවත්, කළට වේලාවට වැඩ කරන බවත් සිංහලයන්ට විශ්වාස ය. සුද්දාට ගරු කරන්නේ මේ තක්සේරු ව මත ය. යම් හෙයකින් සුද්දා එදා සිට ම බොරු කීවා නම් , එදා සිට ම පොරොන්දු කඩ කළා නම්. එදා සිට ම කලට වේලාවට වැඩ නො කරන්නෙකු වූයේ නම් දුටු තැන සුද්දා ගැරහීමට, අවඥාවට ලක් කිරීමටඅප කටයුතු කරනු නො අනුමාන ය.

- සිංහලයන්ට බොරු කීම එතරම් ගණන් ගත යුතු හෝ හාද සාක්ෂියට පිටු පා යන කරුණක් නො වේ. එම නිසා බොරු කීම ලජ්ජාවට හෝ අපකීර්තියට කරුණක් ද නො වේ. යමෙකු බොරු කියන ලදැ යි හෙළි වුව ද ඒ ගැන පුදුම විය යුතු නැත. මන්ද? බොරු කීම එතරම් ම සාමාන්‍ය දෙයක් වන බැවිනි.

- සිංහලයන් ගැන ග්‍රන්ථයක් ලියූ ඉංග්‍රීසි ජාතික නොක්ස් කිවේ සිංහලයන් බොරුකාරයන් හා රැවටිලි කාරයන් බව ය. එදා සිටි නොක්ස් මෙන් ම අද සිටින නොක්ස් ලා, ටොමීලා, රස්ටිලා වැනි විජාතිකයන්ගේ අත්දැකීම ද එසේම ය.

## බොරුව හා රැවටීම

බොරුව හා රැවටීම සිංහලයන්ගේ සම්භවය හා සම්බන්ධ චර්යා ලක්ෂණයක් බව ඓතිහාසික වාර්තා වලින් ද වර්තමාන හැසිරීම් රටා වලින් ද මනා ව සනාථ වන කරුණ කි. සිංහලයන් ස්වභාවයෙන් ම බොරුකාරයන් හා රැවටිලිකාරයන් බව ඍජුව ම ප්‍රකාශ කලේ රොබට් නොක්ස් ය . ඔහුගේ වාර්තාවේ කීප අවස්ථාවක ම බොරු කීම හා රැවටීම ගැන සඳහන් කර ඇති අතර වරක් ඔහු මෙසේ කියයි. 'For they make no account nor confcience of lying, neither

is it any fhame or difgrace to them, if they be catched in telling lyes: it is so cuftomary' (knox, 1681 p. 64). සිංහලයන්ට බොරු කීම එතරම් ගණන් ගත යුතු හෝ හාද සාක්ෂියට පිටු පා යන කරුණක් නො වේ. එම නිසා බොරු කීම ලජ්ජාවට හෝ අපකීර්තියට කරුණක් ද නො වේ. යමෙකු බොරු කියන ලදැ යි හෙළි වුව ද ඒ ගැන පුදුම විය යුතු නැත. මන්ද? බොරු කීම එතරම් ම සාමාන්‍ය දෙයක් වන බැවිනි. In Their Promises very unfaithful, approving lying in themselves (Knox , 1681, P. 64 ). මොව්හු බොරු කීම ඔවුන් විසින් ම අනුමත කර ගෙන ඇති බැවින් ඔවුන්ගේ පොරොන්දුවල තිබෙන්නේ මහත් අවිශ්වාස සහගත බව කි. එනම්, මොව්හු පොරොන්දුවලට ද්‍රෝහී වෙති.

දෙවැනි රාජසිංහ රාජ්‍ය සමයෙහි දී රොබට් නොක්ස් වාර්තා කළාක් මෙන් බොරුව හා රැවටීම අදත් එසේ ම පැවතෙයි. නැතහොත් එදාටත් වඩා ගරුවට සිදු වෙයි. බොරුව හා රැවටීම ශ්‍රී ලාංකික ජන සමාජය විනාශ මුඛයට පත් කළ ඉතාමත් ම අයහපත් චර්යාවන්ගෙන් එක කි. මීට පෙර සාකච්ඡාවට ගත් වහා අමතක වීමේ චර්යාව සමඟ බොරුව හා රැවටීම ඉතා හොඳින් ගැලපේ. වරක් රැවටූ විට, බොරු කළ විට නැවතත් බොරුවට හසු කර ගැනීමට හෝ රැවටීමට නම් අමතක වී තිබීම අත්‍යාවශ්‍ය වේ. ශ්‍රී ලංකාවේ මැතිවරණ පොරොන්දු මහා පර්මාණ මට්ටමේ හෝ ජාතික මට්ටමේ බොරු හා රැවටීම් ය. සාමාන්‍යයෙන් සිදු විය යුතු මනුෂ්‍ය චර්යාව වන්නේ වරක් බොරුවකට හෝ රැවටුමකට හසු වූ විට එවැනි බොරුවකට හෝ රැවටුමකට නැවත හසු නො වීම ය. එහෙත් මැතිවරණ වැඩි වන තරමට සිංහල ජනතාව තුළ සිදු වන්නේ රැවටීම තේරුම් ගැනීම නො ව රැවටෙන වාර ගණන වැඩි වීම ය.

- දක්ෂ දේශපාලකයකු වීමට අවශ්‍ය නම් දක්ෂ ලෙස රැවටීමට හැකියාවක් තිබිය යුතු යයි නිර්ලජ්ජිතව ප්‍රකාශ කිරීමට තරම් ආත්ම ශක්තියක් මෙරට ජනතාවට තිබේ.

- දේශපාලනඥයන්ගෙන් අති බහුතරයක් රැවටිලිකාරයන් බව සැබෑ ය. එහෙත් ඔවුන් රැවටිලිකාරයන් වී ඇත්තේ පොදු ජනතාවගෙන් අති බහුතරයක් රැවටිලිකාරයන් වී ඇති නිසා සහ එකී බහුතරය තුළින් දේශපාලකයන් බිහි ව ඇති නිසා ය.

බොරුව හා රැවටීම ශ්‍රී ලාංකික ජන සමාජය තුළ දැඩි ව මුල් බැස ගෙන ඇත්තා වූත්, සියලු සමාජ පංතිවල එක සේ පැතිර පවත්නා වූත් චර්යා රටාවකි. අනුන් රැවටීම ශිෂ්ට සම්පන්න සමාජය තුළ අයහපත් යැයි සම්මත මිනිස් චර්යාවකි. එහෙත් එය අසාමාන්‍ය මිනිස් චර්යාවක් නො වේ. ඕනෑ ම සමාජයක බොරුව හා රැවටීම යම් සාධාරණ ප්‍රමාණයකින් පවතී. කෙසේ වුව ද, බොරුව හා රැවටීම මත ම රැඳෙමින්, ඒ මත ම යැපෙමින් සිටීම යම් අසාමාන්‍ය චර්යා තත්ත්වයකි.

ශ්‍රී ලාංකිකයන් රැවටීම ප්‍රගුණ කළාහු වෙති. අනෙකකු රැවටීම බොහෝ විට දක්ෂකමක් ලෙස සලකනු විනා දුර්ගුණයක් ලෙස සැලකීමට මොව්හු පුරුදු වී නැත. ඔව්හු ජීවත් වන්නේ රැවටීම් වැලක් තුළ ය. සාර්ථක දේශපාලකයකු වීමට අවශ්‍ය නම් දක්ෂ ලෙස රැවටීමට හැකියාවක් තිබිය යුතු යයි නිර්ලජ්ජිතව ප්‍රකාශ කිරීමට තරම් ආත්ම ශක්තියක් මෙරට ජනතාවට තිබේ. මන්ද? එය පාලකයකු වීමට උවමනා දක්ෂකමක් හෝ ගුණයක් සේ සලකන බැවිනි. රැවටීම හා බොරුව ශ්‍රී ලාංකික ජන සමාජයේ යම් සමාජ පංතියකට හෝ යම් දේශපාලන පක්ෂයකට හෝ යම් තරාතිරමකට හෝ ආවේණික වූවක් නොවේ. දේශපාලකයන් විසින් ජනතාව රවටනු ලබන්නෝ ය යන කියමන ඉතා සුලභ කියමනක් වුව ද එම කියමනෙන් හෙළිදරව් වන්නේ සත්‍යයෙන් අඩක් පමණි. රැවටීම හා බොරුව දේශපාලකයන් විසින් පමණක් ක්‍රියාවට නඟන්නක් නො වේ. දේශපාලකයන් පමණක් රැවටිලි කරන්නේ යයි කිව හොත් එය දේශපාලකයන් කෙරෙහි ද්වේශ සහගත ව කරනු ලබන ප්‍රකාශයක් පමණි. මන්ද? රැවටීම හා බොරුව සමස්ත ජාතිය තුළ ම පැලපදියම් ව ඇති නිසා දේශපාලකයන්ට පමණක් ලේබල් ඇලවීම අසාධාරණ බැවිනි. දේශපාලනඥයන්ගෙන් අති බහුතරයක් රැවටිලිකාරයන් බව සැබෑ ය. එහෙත් ඔවුන් රැවටිලිකාරයන් වී ඇත්තේ පොදු ජනතාවගෙන් අති බහුතරයක් රැවටිලිකාරයන් වී ඇති නිසා සහ එකී බහුතරය තුළින් දේශපාලකයන් බිහි ව ඇති නිසා ය.

පොදු ජනතාවගේ නියෝජිතයෝ හෝ නායකයෝ පොදු ජනතාවගේ ගුණාංග වලින් යුක්ත වනු මිස අන් කවර ගුණාංගයක් ප්‍රදර්ශනය

කරනු ඇද් ද? ජනතාවගේ නායකයෝ හෝ නියෝජිතයෝ ජනතාව විසින් ම තෝරා ගත්තා හු ය. ජනතාව ඔවුනට කැමැත්තේ ඔවුහු ඔවුන්ගේ පාර්ශවයේ ඇත්තන් වන බැවිනි. එබඳින් බිහි වීමට ගවයන් සිටිය යුතු යයි කියමනක් තිබේ. එමෙන් ම යහපත් පාලකයන් බිහි වීමට යහපත් පාලිතයන් ද සිටිය යුතු ය.

> ශ්‍රී ලාංකිකයන් සියල්ලෝ ම මෙන් නො නිල එකඟතාවක් මත රැවටීම් වැළක් පිළිගත් සංස්ථාපිත වූ රැවටුම් පද්ධතියක කොටස් කරුවෝ වෙති. රැවටිල්ල සාමාන්‍යයක් බව සියළු දෙනාගේ ම ප්‍රත්‍යක්ෂය වේ.

ශ්‍රී ලාංකික ජන සමාජය තුළ බොරු කාරයන් හෝ රැවටිලිකාරයන් වීමෙන් ගැලවීමට කිසිවකුට නො හැකි ය. මන්ද? බොරුව හා රැවටීම සංස්ථාපිත තත්ත්වයක් වන බැවිනි. ජනතාව ඔවුන්ගේ නිලධාරීන් රවටති. නිලධාරීහු ජනතාව රවටති. දේශපාලකයෝ නිලධාරීන් රවටති. නිලධාරීහු දේශපාලකයන් රවටති. ඉහළ නිලධාරීහු පහළ නිලධාරීන් රවටති. පහළ නිලධාරීහු ඉහළ නිලධාරීන් රවටති. මීට අමතර ව පාර්භෝගිකයා වෙළෙන්දා ද, වෙළෙන්දා පාර්භෝගිකයා ද, කම්කරුවා ස්වාමියා ද, ස්වාමියා කම්කරුවා ද, රජය ජනතාව ද, ජනතාව රජය ද ආදී සියලු දෙනා ඔවුනොවුන් රවටා ගනිති.

බොරුව හා රැවටීම සම්බන්ධ චර්යාව ශ්‍රී ලාංකික ජන සමාජය තුළ මතු පිටින් දුර්ගුණයක් සේ සැලකුව ද, රොබට් නොක්ස් කීවාක් මෙන් ඇතුළතින් එය සමාජයේ සාමාන්‍ය ලක්ෂණයකි. රැවටිල්ල පවත්වා ගෙන යාම තහවුරු කිරීම සඳහා සමාජය තුළ නො නිල එකඟතාවක් පවතී. ඒ කෙසේ ද යත් රැවටීම, රැවටීමක් බව දැන දැනත් එය අනුමත කරමින්, එකඟ වෙමින් ඊට අනුග්‍රහය දැක්වීම සඳහා සාමාන්‍ය ජන සමාජයේ බහුතරයක් කටයුතු කරන බැවිනි. ඉතා පැහැදිලි ව තමා විසින් අනුන් රවටන ලද බව දන්නා නමුත් නැතහොත් අනෙකුන්ගේ රැවටීමට තමා හසු ව ඇති බව දන්නා නමුත් තමා අනෙකකු රවටන බව හෝ තමා අනෙකකුට රැවටී සිටින බව හෝ මොව්හු නො සලකා හරිති. මන්ද? රැවටිල්ල සාමාන්‍යයක් බව සියලු දෙනාගේ ම ප්‍රත්‍යක්ෂය නිසා ය. මොව්හු සියල්ලෝ ම නො නිල එකඟතාවක් මත රැවටීම් වැළක් පිළිගත් සංස්ථාපිත වූ රැවටුම් පද්ධතියක කොටස් කරුවෝ වෙති.

නො නිල එකඟතාව මත පවත්වා ගෙන යන්නා වූ රැවටුම් පද්ධතිය හානි පමුණුවන්නේ සැබෑ සමාජ ආර්ථික ඉදිරි ගමනට පමණක් නො වේ. එය රැවටීම ලක්ෂණයක් කර නො ගත්තා වූ සුළුතරයක් වන පුද්ගලයන්ගේ පැවැත්මට ද බාධා පමුණුව යි. බොහෝ උගත්තු, බුද්ධිමත්තු රට හැර වෙනත් රටවලට යන්නේ කාමසුඛල්ලිකානුයෝගී ව ජීවත් වීමට නො වේ. වැඩි භෞතික සැප සම්පත් පතා දියුණු යයි සම්මත රටවලට යන්නෝ ද වෙති. එහෙත් කතුවරයා දන්නා බොහෝ දෙනෙක් ශ්‍රී ලංකාව හැර වෙනත් රටවලට සංක්‍රමණය වූයේ කලකිරීම, පසුතැවිල්ල, බලාපොරොත්තු කඩ වීම, අවදානම ආදී වූ මානසික පීඩනයන් මත ය. අව්‍යාජ ව හා අභීත ව නිවැරදි තීරණ ගැනීමේ හා ඒ අනුව කටයුතු කිරීමේ ඉඩ කඩ ශ්‍රී ලංකා ජන සමාජය තුළ බෙහෙවින් අඩු ය. මේ නිසා යමෙකුගේ පැවැත්ම තහවුරු කර ගැනීමට නම් රැවටීම හෝ ව්‍යාජ ලෙස කටයුතු කිරීමේ දුර්ගුණය ද ඔහු හෝ ඇය විසින් පුගුණ කළ යුතු ව තිබේ. නැත හොත් ඔහුගේ හෝ ඇයගේ පැවැත්මට එල්ල වන බාධාවන්ගේ සීමාවක් නැත.

- අව්‍යාජ පුද්ගලයෙකු තම සිතට එකඟ ව යම් අව්‍යාජ ක්‍රියාදාමයක නියුක්ත වුව ද සෙස්සෝ කිසි විටෙකත් ඔහුගේ හෝ ඇගේ කාර්යය අව්‍යාජ යයි පිළිගැනීමට මැළි වෙති.

- අව්‍යාජ පුද්ගලයෝ තම සද් කාර්යයන් අතර මග නතර කර දමා එක්කෝ රැවටිලිකාර සාමාන්‍ය ප්‍රවාහයට එක්වෙති. නැතහොත් ඉච්ඡා භංගත්වයට හා පසුතැවිල්ලට පත් ව සිටිති.

බොරුව හා රැවටීම කොතරම් දුරට සමාජයේ මුල් බැසගෙන ඇද්ද යන්න පැහැදිලි කිරීම සඳහා ප්‍රශස්ත සාක්ෂියක් ශ්‍රී ලාංකික ජන සමාජයේ සිතුම් පැතුම් තුළින් ම මතු කර ගත හැකි ය. ශ්‍රී ලාංකිකයෝ බොහෝ දෙනෙකු විශ්වාස කරන්නේ අව්‍යාජ පුද්ගලයන් යයි හැඳින්විය හැකි කිසිවකු තමන් ජීවත් වන සමාජයේ නො මැති බව ය. ඔව්හු තමා ගැනවත් තමාගෙන් පිටස්තර වූ අය ගැනවත් කිසි විටෙක විශ්වාස නො තබන බවක් පෙනේ. උදාහරණ වශයෙන් යම් අව්‍යාජ පුද්ගලයෙකු තම සිතට එකඟ ව යම් අව්‍යාජ ක්‍රියාදාමයක නියුක්ත වුව ද සෙස්සෝ කිසි විටෙකත් ඔහුගේ හෝ ඇගේ කාර්යය අව්‍යාජ යයි පිළිගැනීමට මැළි වෙති. කුමන හෝ වංචනික අදහසකින් යුතු ව

හෝ ආත්මාර්ථකාමී යටි අදහසක් ඉටු කර ගැනීම සඳහා ඉදිරියට ආ පුද්ගලයෙකු ලෙස අව්‍යාජ පුද්ගලයා ලේබල් කරනු ලබන අතර එමගින් අව්‍යාජ තැනැත්තාගේ සද් ක්‍රියාදාමය වුව ද ලත් තැන ම ලොප් කර දැමීමට සෙසු සමාජය කටයුතු කර යි. මේ නිසා බොහෝ අය යම් සද් කාර්යයක් සඳහා ඉදිරියට පැමිණෙන්නේ වත්, එසේ පැමිණෙන අයෙකුට අත හිත දෙන්නේ වත් නැත. යමෙකු අව්‍යාජ කාර්යයක නියුක්ත වන්නේ නම් ඔහු කෙරෙහි එල්ල වන අවලාද, අපවාද, චෝදනා හා අවහිරතා අපමණ ය. බොහෝ අව්‍යාජ පුද්ගලයන් තම සද් කාර්යයන් අතර මඟ නතර කර දමා එක්කෝ රැවටිලිකාර සාමාන්‍ය ප්‍රවාහයට එක්වන්නේත්, නැතහොත් ඉච්ඡා භංගත්වයට හා පසුතැවිල්ලට පත් ව පසුගාමී ව සිටින්නේත් මේ නිසා ය.

> කුමන මට්ටමක රැවටිලිකාර, බොරුකාර චර්යාවක් සාමාන්‍ය චර්යාව ලෙස පැවතුන ද ශ්‍රී ලාංකිකයන්ගේ කැමැත්ත මොව්හු ලෝකයේ උතුම් ම ජාතිය යයි කීමට ය. උතුම් ම රට යයි කීමට ය. මේ කියමන් ජාතික මට්ටමේ රැවටිලිකාර කියමන් ය. මන්ද? සමස්ත ජාතිය ම ආත්ම වංචනයක් සහිත රැවටිලි මායාවකට කොටු කර තැබීමට එම කියමන් සමත් වන බැවිනි.

මේ ග්‍රන්ථය රචනා කරන මා වසර විසිපහක් පමණ කාලයක් පුරා සමාජ සජීවිකරණය හෝ විපර්යකාරකත්වය යයි හැඳින්විය හැකි විෂයෙහි පුහුණුකරුවෙකු හා පර්යේෂකයෙකු ලෙස ද, ක්‍රියාකාරකයෙකු ලෙස ද කටයුතු කළ බැවින් ශ්‍රී ලාංකික ජන සමාජයේ විවිධ ස්ථර තුළ මුල් බැස ගෙන තිබෙන බොරුව හා රැවටිල්ල පිළිබඳ පාථුල අත්දැකීමක් ලබා ඇත. දිළින්දන් පමණක් ඉලක්ක කර ගත් සජීවිකරණයක් මගින් මෙ රට සැබෑ සමාජ ආර්ථික පරිවර්තනයක් ඇති කළ නො හැකි යයි මේ ග්‍රන්ථය ආරම්භයේ සිට ම කීවේ එබැවිනි. සැබෑ සමාජ සජීවිකරණයක් අපේක්ෂා කරන්නේ නම් මේ ග්‍රන්ථය පරිශීලනය කරන පාඨකයා ඇතුළු සියලු සමාජ ස්ථරවල ම සම්මාදමක් අත්‍යවශ්‍ය වේ.

මීට පෙර ද සඳහන් කළ පරිදි ශ්‍රී ලාංකික ජන සමාජයේ බොරුව හා රැවටිල්ල සාමාන්‍ය චර්යාවකි. බොහෝ විට රැවටීම් සිදු වන්නේ

පුද්ගලාන්තර මට්ටමිනි. තවත් සමහර විටෙක බුද්ධිය, උගත්කම, නිලය, බලය හෝ වරප්‍රසාදය මාධ්‍ය කර ගනිමිනි. කෙසේ වුව ද, තමන් රැවටිලිකාරයන් යයි හෙළිදරව් වනවාට ජනතාව ඇතුළු නායකයෝ අකැමැති ය. මේ නිසා රැවටිල්ල කොතෙක් හෙළිදරව් වුව ද තමන් රැවටිලිකාර පිරිසකැ යි මොව්හු පිළිගන්නේ ද නැත. කුමන මට්ටමක රැවටිලිකාර, බොරුකාර චර්යාවක් සාමාන්‍ය චර්යාව ලෙස පැවතුණ ද මොවුන්ගේ කැමැත්ත මොව්හු ලෝකයේ උතුම් ම ජාතිය යයි කීමට ය. උතුම් ම රට යයි කීමට ය. මේ කියමන් ජාතික මට්ටමේ රැවටිලිකාර කියමන් ය. මන්ද? සමස්ත ජාතිය ම ආත්ම වංචනයක් සහිත රැවටිලි මායාවකට කොටු කර තැබීමට ඒ කියමන් සමත් වන බැවිනි. මේ නිසා සජීවීකරණ ක්‍රියාවලියෙහි ලා වැදගත් ම කාර්යය වන්නේ තමන් රැවටිලිකාරයන් බව තමන්ට ම අවබෝධ කර දීමෙන් ආත්ම වංචනයේ පදනම බිඳ දැමීම ය. උතුම් ම ජාතිය වීමට නම්, උතුම් ම රට වීමට නම් උතුම් චර්යාවන්ගෙන් යුක්ත විය යුතු බව පෙන්වා දීම ය. සජීවීකරණය වීමේ අල්පමාත්‍ර වූ විශ්වාසයක් හෝ තැබිය හැක්කේ එවැනි සැබෑ පරිවර්තනයක් තුළ පමණි. සමාජ සජීවීකරණය වර්තමානයේ අප සියලු දෙනාගේ ම අපේක්ෂාව වී ඇති නිසා රැවටීම හා බොරුව අපගේ සාමාන්‍ය චර්යාව බව ප්‍රථමයෙන් පිළිගත යුතු ය. ස්වයං විවේචනයක යෙදිය යුතු ය. අපි කවරහු දැ යි අපට ම හඳුනා ගැනීම සඳහා රැවටීම පිළිබඳ ව මා ලැබූ අත්දැකීම් සම්භාරයෙන් අල්පයක් පාඨකයා සමඟ හුවමාරු කර ගැනීමට අදහස් කරමි.

1990 ගණන්වල මුල් භාගයේ දී මෙ රට ප්‍රධාන සංවර්ධන ක්ෂේත්‍රයක ප්‍රතිපත්ති සැලසුම් සකස් කිරීම සඳහා කිසියම් ව්‍යාපෘතියක් මගින් සම්මන්ත්‍රණ ගණනාවක් පවත්වනු ලැබිණ. මේ සම්මන්ත්‍රණ වලින් කීපයකට මම ද සහභාගි වුණෙමි. පැවැත්වූ සම්මන්ත්‍රණ මගින් අදාළ සංවර්ධන ක්ෂේත්‍රයෙහි ප්‍රතිපත්ති පිළිබඳ ව බොහෝ තීරණ ගනු ලැබිණ. මේ අතර ඉහත කී සම්මන්ත්‍රණවලින් ගනු ලැබූ තීරණවලට එරෙහි ව සංවිධානය කරනු ලැබූ තවත් සම්මන්ත්‍රණයකට ද සහභාගි වීමට මට අවස්ථාව ලැබිණි. දෛවෝපගත පරිදි මේ සම්මන්ත්‍රණය සංවිධානය කිරීමේ වගකීම ලැබුණේ ද මට ය. මට උපදෙස් දුන් ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරියා ප්‍රකාශ කර සිටියේ අදාළ සංවර්ධන ක්ෂේත්‍රයේ ආයතන ප්‍රධානීන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ අමාත්‍ය

තුමා ද සම්මන්ත්‍රණයට සහභාගි වන බවත්, ඔවුන් සඳහා කෙරෙන ආරාධනය ඔහු විසින් ම කරන බවත් අනෙකුත් සහභාගිවන්නන් සඳහා ආරාධනා පත් යැවීම මගේ වගකීම බවත් ය. මේ නිසා දිවයිනේ නන් දෙසින් පැමිණෙන සහභාගි වන්නන් සඳහා මා ආරාධනා පත් යැවූ අතර, ඔවුන්ගේ පැමිණීම දිරි ගැන්වීම සඳහා ගරු අමාත්‍යතුමා සහ ආයතන ප්‍රධානීන් ද සම්මන්ත්‍රණයට සහභාගි වන බව දන්වා යැවුවෙමි. සම්මන්ත්‍රණ දිනය උදා විය. සම්මන්ත්‍රණය පැවැතියේ කොළඹින් පිටස්තර ස්ථානයක ය. මා ඇතුළු නිලධාරීන් සිව් දෙනෙකු සම්මන්ත්‍රණයට පෙර දින ම කොළඹින් පිටත් ව ගොස් සම්මන්ත්‍රණයේ සංවිධාන කටයුතුවල නියැලුණෙමු. සම්මන්ත්‍රණයට සහභාගි වීම සඳහා ආරාධනා පත් යැවූ සියලුදෙනා ම සම්මන්ත්‍රණයට පැමිණ සිටිය හ. එහෙත් මුලින් කී රාජ්‍ය නිලධාරියා ද ඔහුගේ ආරාධනය පරිදි පැමිණිය යුතු යයි අපේක්ෂිත රාජ්‍ය නිලධාරීන් ද, ගරු ඇමතිතුමා ද සම්මන්ත්‍රණය ආරම්භ කිරීමට නියමිත වේලාව වනතුරුත් පැමිණ නො සිටිය හ. ආරාධනය ලත් සෙසු සහභාගිවන්නෝ සම්මන්ත්‍රණ ශාලාව තුළ අසුන් ගෙන සිටිය හ.

සම්මන්ත්‍රණය ආරම්භ කිරීමට නියමිත වේලාව පසු වී විනාඩි කිහිපයක් ගත වෙත් ම මුලින් කී නියමු නිලධාරි මහතා පමණක් සම්මන්ත්‍රණ ශාලාවට පැමිණියේ ය. ගරු ඇමතිතුමා හෝ අනෙකුත් කිසිදු ඉහළ නිලධාරියෙකු සම්මන්ත්‍රණයට නො පැමිණි බව මම ඉහත කී නිලධාරියාට දන්වා සිටියෙමි. ඔහු මගේ දැනුම් දීම කෙරෙහි එතරම් සැලකිල්ලක් නො දක්වා මා සමග සිටි නිලධාරියෙකු අමතා මෙසේ කීය. ඔහු කතා කළේ ඉංග්‍රීසි භාෂාවෙන් නිසා මම ඔහුගේ ප්‍රකාශය එසේ ම සටහන් කරමි. 'ඩේවිඩ්, රන් අප් ඇන්ඩ් බ්‍රින් ද මිනිස්ටර්' ඩේවිඩ් වහාම ඇමතිතුමා කැඳවාගෙන එන්න යනු එහි සිංහල අදහස යි. (ඩේවිඩ් අන්වර්ථ නාමයකි) ඩේවිඩ් නම් වූ මගේ සගයා එකෙනෙහි ම පහත මාලයට දිව ගියේ ය. ඇමතිතුමාගේ කාර්යාලය තිබුණේ සම්මන්ත්‍රණය පැවැත්වීමට සැලසුම් කර තිබූ නගරයේ ම බැවින් අපි කව්රුත් සිතුවේ ඩේවිඩ් ඇමති තුමා කැඳවා ගෙන ඒමට ගිය බව ය. විනාඩි 15 කට පමණ කාලයකින් ඩේවිඩ් නැවත සම්මන්ත්‍රණ ශාලාවට පැමිණ පෙර කී රාජ්‍ය නිලධාරියාට මොනවා දෝ යන්තමින් කොඳුරනු අපට ඇසිණි. එවිට රාජ්‍ය නිලධාරියා සම්මන්ත්‍රණ සභාව

අමතා ප්‍රකාශයක් කළේ ය. ඒ ප්‍රකාශය මෙසේ ය. 'අපේ ගරු ඇමති තුමා මේ දැන් හදිසියෙන් හෙළිකොප්ටරයෙන් කොළඹ ගිහිල්ලා. ඒ නිසා ඇමතිතුමා සම්මන්ත්‍රණයට නො පැමිණෙන බව දන්වා තිබෙනවා' සියලු දෙනා ම සුසුමක් හෙළුවේ ඇමතිවරුන්ට තිබෙන වැඩ ඔහොම තමයි කියන්නාක් මෙනි. සම්මන්ත්‍රණය එක් දිනක් සඳහා සැලසුම් කර තිබුණත් දින භාගයකින් අවසන් විය. එම දින භාගය ද අරුත් සුන් අභ්‍යාසයක් ම විය. ගරු ඇමතිතුමා කැඳවා ගෙන ඒමට යැවූ ඩේවිඩ් ගෙන් 'මොකද ඇමතිතුමා කීවේ' යයි සම්මන්ත්‍රණය අවසානයේ දී මම ඇසීමි. මොන ඇමති තුමා ද? ඔහු මගෙන් ඇසී ය. 'සම්මන්ත්‍රණයට ආරාධනය කර තිබූ ඇමතිතුමා' මම කීමි. මම ඇමතිතුමෙක් කැඳවා ගෙන එන්න ගියේ නැහැ. මම ගියේ ශාලාවේ පහත මාලයට පමණ යි. මට පුළුවන් ද ඇමතිවරයෙක් හදිසියේ කැඳවා ගෙන එන්න. මමත් අනෙකුත් නිලධාරීන් දෙදෙනාත් පුදුමයෙන් පුදුමයට පත් වුණෙමු.

මේ රැවටීම පිළිබඳ ව මගේ සිත් කාවැදුණු එක් උදාහරණයක් පමණි. මෙය ජාතික මට්ටමෙන්, නිල මට්ටමෙන්, සිදු වූ රැවටීමකි. බොරුව හා රැවටීම පිළිබඳ පාඨකයාගේ අත්දැකීම් සමඟ සසඳා බලන කළ මා ඉදිරිපත් කල අත්දැකීම නො සැලකිය යුතු තරම් එකක් විය හැකි ය. මන්ද? සමස්ත ජාතිය ම රවටන මහා පරිමාණ රැවටුම් අතර හිරු දුටු කණමැදිරියකු මෙන් මගේ අත්දැකීම නො වටනා නිසා ය. එහෙත් මේ අත්දැකීම මගින් මා ඉස්මතු කිරීමට බලාපොරොත්තු වූයේ රැවටීම පිළිබඳ ව අප සමාජයේ පවත්නා නො නිල එකඟතාව යි. ඩේවිඩ්ට උපදෙස් දුන් නිලධාරියා ඩේවිඩ්ගෙන් බලාපොරොත්තු වූයේ ඇමතිතුමා කැඳවා ගෙන ඒම නො වේ. සම්මන්ත්‍රණය සඳහා ඇමතිතුමා කැඳවා ගෙන ඒමට ගිය ඩේවිඩ්ගේ බලාපොරොත්තුව වූයේ ද ඇමති තුමා කැඳවා ගෙන ඒමක් නො වේ. ඉහත කී නිලධාරියා සහ ඩේවිඩ් අතර කිසිදු කතිකාවක් නො තිබුණත් මනා ලෙස ගැළපෙන චර්යා ප්‍රදර්ශනයකින් රැවටීම පවත්වා ගෙන යාමට හැකි විය. රාජ්‍ය නිලධාරි තන්ත්‍රයේ අතලොස්සක් හැර බොහෝ දෙනා එක්කෝ ඉහත කී නිලධාරියාගේ හොල්මන් ය. නැතහොත් ඩේවිඩ්ලා වශයෙන් කටයුතු කිරීමට සිදු වන අය ය. වෙනත් වචන වලින් කිවහොත් මහා රැවටීමක කොටස් කරුවෝ ය. මා මේ අත්දැකීම

සටහන් කරනු ලැබුයේ ශ්‍රී ලාංකික ජන සමාජයේ රැවටීම සාමාන්‍ය චර්යාවක් බවට පත් ව ඇති බව පෙන්වීමටත්, එය නිල මට්ටමින්, බලය, උගත්කම හෝ වරප්‍රසාදය මාධ්‍ය කර ගත් වෙනත් මට්ටමකින් වුව ද එළිදක්වන බව සනාථ කිරීමටත් ය.

රැවටීම ශ්‍රී ලාංකික ජන ජීවිතයේ කොටසක් බවට පත් ව ඇති නිසා රැවටීමේ සම්බන්ධතාවක් නො මැති ව කිසිවක් සිදු නො වන මට්ටමකට අප සමාජය පත් ව තිබේ. සියලුදෙනා ම සම්මාදම් වී කෙරෙන ආත්ම වංචාවක් මත කිසි විටෙකත් සමාජ සජීවීකරණයක් අපේක්ෂා කළ නො හැකි ය. නිවැරදි වීමට නම් ආත්ම හෙළිදරව්ව අත්‍යවශ්‍ය අවශ්‍යතාවකි. ඉහත ඉදිරිපත් කළ අත්දැකීම පුද්ගල හෙළිදරව්වක් නො ව සිද්ධි හෙළිදරව්වකි. සිද්ධි හෙළිදරව්වකින් පුද්ගල ප්‍රතිරූපයන්ට හානි නො පැමිණෙන නමුත්, ස්වයං විවේචනයකට මහ පෑදීමක් සිදු වෙයි.

පුද්ගල හෙළිදරව්වක් නො වන්නා වූ සිද්ධි හෙළිදරව්වක් වුව ද පාපයක්, අයුක්තියක් හෝ පහර ගැසීමක් ලෙස ශ්‍රී ලාංකිකයෝ සලකති. මන්ද? සාමාන්‍ය චර්යාව රැවටිල්ල සමඟ බද්ධ ව පැවතීම හේතු කොට ගෙන හෙළිදරව්වෙන් නිරතුරුව ම සාමාන්‍ය චර්යාවට බාධා පැමිණෙන බැවිනි. එහෙත් එළිපිට පිළිගනු නො ලැබුවත් රැවටිල්ල ශ්‍රී ලාංකික ජන ජීවිතයේ සාමාන්‍ය සංසිද්ධියක් බවට සියලු දෙනා තම තමන්ගේ අභ්‍යන්තරයෙන් පිළිගෙන ඇති බවට සාක්ෂි තිබේ.

ඉංග්‍රීසීන් යටතේ මෙ රට පැවති අවධියේ සර්ව ජන ඡන්ද බලය ලබා දීම නිර්දේශ කිරීම සඳහා මෙ රටට පැමිණි කොමිසමේ සාමාජිකයිනට ලංකාවේ ගොවීන් ඉංග්‍රිසි කතා කරන මිනිසුන් බව පෙන්වීම සඳහා කොළඹ කන්තෝරුවලින් ගිය නිලධාරීන් මාවනැල්ලේ කුඹුරකට බස්සවා සුද්දන්ට මුණගස්වා ඉංග්‍රිසි කතා කරන ගොවීන් මෙ රට සිටින බව ඔප්පු කළ ආකාරය ගැන බොහෝ දෙනෙක් දන්නා ජනප්‍රවාදයකි. මෙ රට අගමැති වරයෙකු වූ ඩඩ්ලි සේනානායක මහතා ආරම්භ කළ වගා සංග්‍රාමයේ දී ඔහු රැවටීම සඳහා මානා යායවල් අස්වද්දන ලද කුඹුරු යායවල් ලෙස ඒත්තු ගැන් වූ නිලධාරීන් ගැන

අදත් ජනප්‍රවාද ඇත. ජනාධිපති ප්‍රේමදාස මහතා ක්ෂේත්‍ර නිරීක්ෂණය සඳහා ගමන් ගන්නා ප්‍රදේශවල එතුමා රැවටීම සඳහා තාවකාලික ව සකස් කරන ලද පාරවල්, ගොඩනැගිලි ආදිය පෙන්වීම ගැන නිලධාරීන් විසින් ම ජනප්‍රවාද ගොඩනගා ඇත. ඇමතිවරයෙකු රැස්වීමක් සඳහා ගමන් ගන්නා මාර්ගයේ පමණක් වලවල් වසා, තාර දමා, වැලි දමා ඔවුන් රැවටීමට නිලධාරීන් ගන්නා උත්සාහයන් බොහෝ දෙනා දන්නා කරුණු ය. මෙ පමණක් නො ව ශ්‍රී ලාංකිකයන්ගේ සාමාන්‍ය ජන චර්යාව උපහාසාත්මක ව හෙළිදරව් කිරීමට ඔවුන් විසින් ම ගොතන ලද ජනප්‍රවාදයන් රාශියකි. ප්‍රදේශයේ කෘෂිකර්ම නිෂ්පාදනය දෙගුණ කිරීම සඳහා කුමන පහසුකමක් අවශ්‍ය දැ යි ඇමතිවරයා දිසාපති වරයාගෙන් ඇසූ විට වැඩිපුර සංඛ්‍යා ලේඛන නිලධාරීන් දෙදෙනෙක් ලබා දෙන්නැ යි දිසාපති වරයා කීවේලු. මෙයින් කියැවෙන්නේ සංවර්ධනයට සම්බන්ධ ඉලක්කම්වල ඇති නිසරු බව සහ රැවටුම් සහගත බවයි. කිලෝ මීටර් 15 ක මාර්ග සංවර්ධනයට වෙන් වූ මුදල් වලින් කොටසක් වංචා කොට කිලෝ මීටර් 12 ක දිග මාර්ගයක් පමණක් සකස් කළ කාර්මික නිලධාරියා හා ඉංජිනේරුවා මාර්ගය පරීක්ෂා කරන නිලධාරියා එන විට කිලෝමීටර් කණු 15 ක් කිලෝ මීටර් 12 ප්‍රමාණයට සිටුවා මාර්ගය දිගු කර පෙන්නුවේලු. අධ්‍යක්ෂවරයා විසින් කැඳවනු ලැබූ රැස්වීමක් සඳහා සහභාගි වීමට යමින් සිටින ඒකක ප්‍රධානියෙකු හා ඔහුගේ යටත් නිලධාරියා අතර ඇති වූ කතා බහක් මෙසේ ය. රැස්වීමට යාමට සූදානමින් සිටි ඒකක ප්‍රධානියා ඔහුගේ යටත් නිලධාරියා අමතා 'ටේක් ද /පයිල්' (ලිපි ගොනුව ගන්න) යයි කී ය. 'වට් /පයිල් සර්' ? (මොන ලිපි ගොනුව ද?) යටත් නිලධාරියා ඇසී ය. 'එනි /පයිල් මෙන් එනි /පයිල්' (ඕනෑම ලිපි ගොනුවක්) ඒකක ප්‍රධානියා කී ය. මෙහි තේරුම අධ්‍යක්ෂ වරයා මෙන් ම යටත් නිලධාරීන් ද ප්‍රයෝජනවත් කාර්යයක නියුක්ත ව නැතත් එසේ යෙදී සිටිතැ යි පෙන්වීමෙන් දෙපාර්ශවය ම ඔවුනොවුන් රවටා ගන්නා බව යි. ශ්‍රී ලංකාවේ කලක් වාසය කළ විදේශිකයකු මගේ මිතුරකුට කියා ඇත්තේ ලංකාවේ රැස්වීම් වලින් බොහොමයක් NATO රැස්වීම් කියා ය. NATO යනු ජාත්‍යන්තර සංවිධානයක් වන බැවින් අපේ රැස්වීම NATO වන්නේ කෙසේ දැයි ඔහු විමසූ විට ඔහු කියා ඇත්තේ NATO යනු 'නෝ ඇක්ෂන් ටෝකින් ඔන්ලි' (වැඩ නැහැ, කතාව විතරයි) කියා ය. ශ්‍රී

ලාංකික ජන සමාජයේ නිලධාරීන් සම්බන්ධ රැවටීම් පදනම් කර ගත් මෙවැනි හාස්‍ය සහගත ජනප්‍රවාදවල සිද්ධිමය සත්‍යතාවක් ඇතත්, නැතත්, ඒවායින් හෙළිදරව් වන්නේ නිලධාරී තන්ත්‍රය තුළ බොරුව හා රැවටිල්ල කොතරම් සාමාන්‍ය තත්ත්වයක් බවට පත්ව ඇද්ද යන වග යි.

තේමාව කුමක් වුවත් බොහෝ සංවර්ධන ව්‍යාපෘති වල ද රැවටිල්ල අනන්‍ය අභ්‍යන්තර සාධකයකි. භෞතික සංවර්ධන වැඩසටහන්වල දී ඇස්පනා පිට පෙන්විය යුතු යමක් ඇති නමුත් මානව සංවර්ධනය හා ආයතන සංවර්ධනය යයි කියා ගන්නා ව්‍යාපෘතිවල එසේ පෙන්විය යුතු භෞතික ස්වරූපයක් නැති නිසා එවැනි ව්‍යාපෘති මඟින් රැවටිල්ල ගරුවට කර ගෙන යා හැකි ය. පාරක්, වැවක්, ඇළක්, ජල නලයක්, ගොඩනැගිල්ලක් සම්බන්ධ ව්‍යාපෘතියක දී මෙන් නො ව මෙවැනි ව්‍යාපෘතිවල නිමැවුම වන්නේ ස්වශක්තිය, බල ගැන්වීම, සජීවීකරණය, සංවිධාන ශක්තිය ආදී ඇස නො ගැටෙන නිමැවුම් බැවින් ඒවා වර්ධනය වී ඇති බවට ව්‍යාපෘති කරුවෝත්, ව්‍යාපෘති ඇගයුම් කරන්නෝත් ඔවුන්ගේ වාර්තාවල ලියා ඇත. විපර්යකාරකත්වය, සජීවීකරණය, බල ගැන්වීම, ස්වශක්ති වර්ධනය ආදී මෙකී නො කී නොයෙකුත් තේමාවන් රැගත් ව්‍යාපෘති සියල්ල සාර්ථක ව නිම වූ බවට ඒවාට සම්බන්ධ වාර්තා වලින් සහතික ඉදිරිපත් කර ඇතත් ව්‍යාපෘති අරඹා දශක කිහිපයකට පසුවත් ජනතාව සිටින්නේ එදා සිටි තැන ම හෝ ඊට නුදුරු තැනෙක බව උපේක්ෂාවෙන් කරුණු විමසන්නෙකුට ප්‍රත්‍යක්ෂ වේ. මේ තත්ත්වය අනෙකක් නො ව රැවටිල්ලේ සෘජු ප්‍රතිඵලයක් ම ය.

සමස්ත සමාජය ම රැවටිල්ලේ ගොදුරු බවට පත් ව ඇති බැවින් සංවර්ධන ව්‍යාපෘති අගය කරන්නෝ ද ඒ ප්‍රවාහයට හසු ව ඇත. සංවර්ධන ව්‍යාපෘති අගය කරන්නෝ බොහෝ විට ව්‍යාපෘති ක්‍රියාත්මක කරන අය හා මුදල් ප්‍රතිපාදන ලබා දෙන අය සතුටු කිරීම සඳහා ඇගයුම් වාර්තා සකස් කරති. ඇගයුම් කිරීමේ කාර්යය සඳහා පුද්ගලයන් හා පෞද්ගලික ආයතන ඉදිරිපත් වීමේ නව ප්‍රවණතාව සමග මේ තත්ත්වය තවත් අසතුටුදායක වී තිබේ. හොඳ ඇගයුම් වාර්තා ලියා කාටත් සතුටු විය හැකි ආකාරයේ ප්‍රතිඵල පෙන්විය නො

හැකි නම් එවැනි අයට ඇගයුම් කොන්ත්‍රාත්තු ලබා නො දෙති. මේ නිසා වැඩි වැඩියෙන් ඇගයුම් කොන්ත්‍රාත්තු ලැබීමට නම් වැඩි වැඩියෙන් පුද්ගලයන් සතුටු කිරීමට කටයුතු කළ යුතු බව ඇගයුම්කරුවෝ දනිති. එබැවින් ඇගයුම් වාර්තාවල වැඩි බරක් තැබෙන්නේ හොඳ යයි සම්මත දේ ඉස්මතු කර දැක්වීමට ය.

එක්තරා පුද්ගලයෙකු වෛද්‍යවරයෙකු මුණ ගැසීමට ගොස් තමාට අධික ලෙස දහඩිය දමන බව කී ය. එවිට වෛද්‍යවරයා කීයේ අධිකව දහඩිය දැමීම ඉතා හොඳ බවත් එය ප්‍රතිකාර ගත යුතු තත්ත්වයක් නො වන බවත් ය. තවත් නොබෝ දිනකින් ඔහුට නිතර නිතර බඩගිනි වන බවක් දැනෙන්නට විය. වෛද්‍යවරයා හමුවීමට නැවත ගිය ඔහු නිතර නිතර බඩගිනි දැනෙන බව පැවසී ය. වෛද්‍යවරයාගේ පිළිතුර වූයේ බඩගිනි වීම හොඳ තත්ත්වයක් බව ය. තවත් ටික දිනෙකින් ඔහුට නිතර ම නිදි බර ගතියක් දැනෙන්නට වූ නිසා වෛද්‍යවරයා නැවතත් හමු විය. වෛද්‍යවරයා යළිත් කීයේ නිදි බර ගතිය ප්‍රතිකාර ගැනීමට තරම් කලබල විය යුතු නැති බව ය. සති කීපයකින් මහත් සේ රෝගාතුර ව ඇඳක් මත වැතිර සිටි මොහු බැලීමට මිතුරකු පැමිණියේ ය. මිත්‍රයා 'කොහොමද තොරතුරු?' කියා ඇඳේ වැතිර සිටි තැනැත්තාගෙන් ඇසූ විට ඔහු කීයේ මගේ ජීවිතයේ ඉතාමත් හොඳ යයි කියනු ලබන කාරණා කීපයක් නිසා මම අද මරණාසන්න ව සිටින බව ය.

වරක් එක්තරා පුද්ගලයෙකු වෛද්‍යවරයෙකු මුණ ගැසීමට ගොස් තමාට අධික ලෙස දහඩිය දමන බව කී ය. එවිට වෛද්‍යවරයා කීයේ දහඩිය දැමීම ඉතා හොඳ බවත් එය ප්‍රතිකාර ගත යුතු තත්ත්වයක් නො වන බවත් ය. තවත් නොබෝ දිනකින් ඔහුට නිතර නිතර බඩගිනි වන බවක් දැනෙන්නට විය. වෛද්‍යවරයා හමුවීමට නැවත ගිය ඔහු නිතර නිතර බඩගිනි දැනෙන බව පැවසී ය. වෛද්‍යවරයාගේ පිළිතුර වූයේ බඩගිනි වීම හොඳ තත්ත්වයක් බව ය. තවත් ටික දිනෙකින් ඔහුට නිතර ම නිදි බර ගතියක් දැනෙන්නට වූ නිසා වෛද්‍යවරයා නැවතත් හමු විය. වෛද්‍යවරයා යළිත් කීයේ නිදි බර ගතිය ප්‍රතිකාර ගැනීමට තරම් කලබල විය යුතු නැති බව ය. සති කීපයකින් මහත් සේ රෝගාතුර ව ඇඳක් මත වැතිර සිටි මොහු බැලීමට මිතුරකු පැමිණියේ ය. මිත්‍රයා 'කොහොමද තොරතුරු?' කියා ඇඳේ වැතිර සිටි තැනැත්තාගෙන් ඇසූ විට ඔහු කීයේ මගේ ජීවිතයේ ඉතාමත් හොඳ යයි කියනු ලබන කාරණා කීපයක් නිසා තමා අද මරණාසන්න ව සිටින බව ය.

ශ්‍රී ලාංකික ජන සමාජයට සිදු ව ඇත්තේ ඇදේ වැතිර උන් රෝගියාට වූ දේ ම ය. ශ්‍රී ලාංකිකයන්ගේ බහුතරය සත්‍ය කතා නො කරති. ඔවුන්ගේ කාර්ය කටයුතු, හැසිරීම් ඔවුන් විසින් ම හොඳ යයි සහතික කොට ඒවා ඒ සෙයින් ම පවත්වා ගෙන යනවා විනා වෙනස් කිරීමකට සූදානමක් නැත. ජන සමාජය අඳුරේ හෙළා ඇති, ජන සමාජය විසින් ම නිර්මාණය කර ගත්තා වූ, එහෙත් කිසිවකුගේ උදව්වෙන් තොර ව ඔවුනට ම විසඳා ගත හැකි ව්‍යාජත්වය හෝ රැවටිල්ල නම් වූ උගුලකට හසු ව එහි ආදීනව විඳින බව ඔව්හු කිසි විටෙකත් නො පිළිගනිති. මේ සත්‍ය පිළිගනු ලබන තාක් කල්, එයට ප්‍රතිකර්ම නො යොදන තාක් කල් ජනතාව සජීවීකරණය වීම වෙනුවට තව දුරටත් අජීවීකරණයෙහි ම ගිලී සිටිනු ඇත.

සිංහලයන් ගැන ග්‍රන්ථයක් ලියූ ඉංග්‍රීසි ජාතික නොක්ස් කීවේ සිංහලයන් බොරුකාරයන් හා රැවටිලි කාරයන් බව ය. එදා සිටි නොක්ස් මෙන් ම අද සිටින නොක්ස් ලා, ටොම්ලා, රස්ටිලා වැනි විජාතිකයන්ගේ අත්දැකීම ද එසේම ය. ඔවුන් කියන්නේ ද අපේ ජන සමායේ මුල් බැස ගත් පුදුමාකාර බොරුවක් සහ රැවටිල්ලක් තිබෙන බව ය. විජාතිකයන් බොහෝ විට පිටස්තර ජන සමාජයකට පැමිණි විට එකී ජන සමාජය විවේචනය කිරීමෙන් හෝ හෙළා දැකීමෙන් වැළකීමට වග බලා ගනිති. කුමන තත්ත්වයක් පිළිබඳ ව ඇසුවත් ඔවුන් කියන්නේ 'එව්රි තින් ඉස් /පයින්' කියා ය. හැම දෙයක් ම හොඳයි කියා ය. එහෙත් අප සමඟ ජීවත් වූ බොහෝ විජාතිකයන් ශ්‍රී ලාංකික ජන සමාජයේ ලක්ෂණ පිළිබඳ ව හොඳ අවබෝධයක් ලබා ඇත. ශ්‍රී ලංකාවේ සංවර්ධන ව්‍යාපෘතිවලට සම්බන්ධ වී වසර ගණනාවක් මෙ රට ජීවත් වූ විජාතිකයන් කිහිපදෙනෙකු ශ්‍රී ලංකාවෙන් බැහැර දී මට නැවත මුණගැසුණු නිසා මා ඔවුන් සමඟ සංවාදයක යෙදුනෙමි. සජීවීකරණය පිළිබඳ ව ග්‍රන්ථයක් සම්පාදනය කිරීමේ මූලික තොරතුරු සම්පාදනය කරමින් සිටි මා ශ්‍රී ලාංකික ජන සමාජය පිළිබඳ ව ඔවුන් ලැබූ අත්දැකීම කෙසේ දැයි ඇසූ විට, ඔවුන් අප ජන සමාජය සම්බන්ධ බොහෝ හොඳ ගුණ වර්ණනා කළෝ ය. එහෙත් හොඳ ගුණ වලින් නො සෑහුණු මා සංවර්ධන කටයුතු වල දී මුහුණ දුන් ප්‍රධාන ගැටලු මොනවා දැ යි විමසූ විට ඔවුන් ප්‍රධාන බාධක දෙකක් හෙළිදරව් කළෝ ය. ඉන් එකක් නම් මෙතෙක් අප සාකච්ඡාවට

ගත් බොරුව හා රැවටිල්ල යි. අනෙක ශ්‍රී ලාංකිකයන් කාලය සම්පතක් ලෙස නො සලකන බව යි. ඔවුන් කීවේ 'ටයිම් ඉස් මනි' (කාලය යනු මුදල්) කියා ය. එහෙත් ශ්‍රී ලාංකික ජන සමාජයේ දී 'ටයිම් ඉස් නතිං' (කාලය කිසිදු වටිනාකමක් නැත) යයි කීහ.

ඉහත කී සංවාදයේ දී හෙළිදරව් වූ තවත් වැදගත් අදහසක් නම් ශ්‍රී ලංකා ජන ජීවිතය සමඟ ගැටීම නිසා විජාතිකයන් තුළ සිදු වන චර්යා පරිවර්තනය යි. ශ්‍රී ලංකාවට පැමිණ තම කාර්යයන් ආරම්භ කළ මුල් වකවානුවේ දී විජාතිකයන්ට වැරදී ඇති තැන් බොහෝ ය. හේතුව අපේ කියුම් කෙරුම් ඔවුන්ගේ කියුම් කෙරුම් මෙන් එක හා සමාන මට්ටමකින් තේරුම් ගැනීම ය. දැනට වසර හාරසීයකට පෙර සිංහලයන් ගැන ලියූ නොක්ස් සිංහලයන් ඇසුරු කිරීම සඳහා විදේශිකයන්ට ඉතා වැදගත් උපදේශකයක් දී ඇතත් වර්තමාන විදේශිකයන් නොක්ස් ගේ වාර්තා පරිශීලනය නො කළ තැනැත්තන් විය හැකි ය. නොක්ස් විදේශිකයන් ට දුන් උපදේශය මෙසේ ය. 'They are crafty and treacherous, not to be trusted upon any protestations' 'සිංහලයන් කපටි, විශ්වාස කළ නො හැකි පිරිසක් නිසා කිසිදු ප්‍රොතෙස්තෙන්තයකු විසින් ඔව්හු විශ්වාස නො කළ යුතු ය' (Knox, 1681 P. 64). කාලය, පොරොන්දු, ඉලක්ක ආදිය පිළිබඳ ව විජාතිකයන් වෙත තුබූ තේරුම්වලට වඩා වෙනස් තේරුම් ශ්‍රී ලංකාවේ දී ඇති බව ඔවුන් වටහා ගෙන ඇත්තේ කාලයාගේ ඇවෑමෙනි. මේ නිසා ආරම්භක අවධියේ දී ශ්‍රී ලාංකිකයන්ගේ කියුම් කෙරුම් ඔවුන්ගේ සංස්කෘතියට අයත් අත්දැකීම් මත පදනම් ව මුළුමනින් ම විශ්වාස කරන්නටත් කාලයාගේ ඇවෑමෙන් ශ්‍රී ලංකාවේ දී ලැබූ නව අත්දැකීම් මත පදනම් ව සියලු දේ අවිශ්වාසයෙන් හා සැකයෙන් යුතු ව බලන්නටත් පුරුදු වූ අයුරු පෙන්වා දුන් හ. ඔවුන් කී පරිදි පසු කාලයේ දී පුද්ගලයාගේ තරාතිරම කුමක් වුව ද පුද්ගලයා ශ්‍රී ලාංකිකයෙකු නම් ඔවුන්ගේ ඕනෑ ම කියුමක් කෙරුමක් කිරා මැන බලා ඇත්තේ ශ්‍රී ලංකන්/පැක්ටර් (ශ්‍රී ලංකා සාධකය) යන කාරණය ද සැලකිල්ලට ගැනීමෙන් පසුව ය.

විජාතිකයන්, විශේෂයෙන් සුද්දන් රැවටීම ඉතා පහසු ය. එය එක් ශ්‍රී ලාංකිකයෙකු විසින් තවත් ශ්‍රී ලාංකිකයකු රැවටීමට වඩා බෙහෙවින්

පහසු ය. මන්ද? විජාතිකයන් ශ්‍රී ලාංකිකයන්ගේ සංස්කෘතිය පිළිබඳ ව මනා වැටහීමක් නැත්තන් බැවිනි. 1980 ගණන්වල මුල් භාගයේ දී මා වාරි ජලපාලනය සම්බන්ධ ව්‍යාපෘතියක සේවයේ යෙදී සිටි ශ්‍රී ලාංකික නිලධාරියෙකු නැවතී සිටි නිවසේ නැවතී සිටියෙමි. ඉංග්‍රීසි ජාතිකයෙකු ඔහුගේ අධීක්ෂකයා විය. නිලධාරියාට පැවරී තුබූ කාර්යය වූයේ වාරිමාර්ග ඇලක අග සිට මුල දක්වා වූ නියම කර ගත් ස්ථානවල ගලා යන වාරි ජලයේ උස මැන බලා සටහන් කිරීම යි. ක්ෂේත්‍රය පිහිටා තිබුණේ අප නතර වී සිටි නිවසින් සැතපුම් 04 ක් පමණ ඈතිනි. ඇලේ වාරි ජලය ගලා ගිය දිනවලින් බොහොමයක මෙකී නිලධාරියා ජලයේ උස මැනීමට ක්ෂේත්‍රයට ගියේ නැත. ඒ වෙනුවට ඔහු කළේ සැතපුම් 04 ක් එපිටින් ගලා ගිය ඇලේ ජලයේ උස නිවසේ සිට ම තම ලේඛනයේ සටහන් කිරීම ය. කෙසේ වෙතත් සුද්දාගේ හදිසි පරීක්ෂාවක් ඇති වෙතැ යි නිතර සෝදිසියෙන් සිටි මෙම නිලධාරියාට දිනක් සුද්දා තම මෝටර් සයිකලයෙන් ක්ෂේත්‍රය දෙසට යනු දක්නට ලැබුනි. සුද්දා ගමන් කළ යුතු ව ඇත්තේ ඇලේ උඩ කෙළවරේ සිට අග කෙළවර දෙසට ය. එහෙත් මෙකී නිලධාරියාට කුඹුරු යාය හරහා ඇලේ අගට ඉතා ඉක්මණින් ළඟා විය හැකි ය. ඔහු වහා ජල මානකය ද රැගෙන ඇල අගට ගොස් සුද්දාගේ පැමිණීමට පෙර ඇල අග සිට ජලය මැන සටහන් කරමින් උඩ අතට ගමන් කරන්නට විය. සුද්දා ඇල උඩ කෙළවර සිට පරීක්ෂා කරමින් තම සේවකයා නො දැක මහත් සේ නො සන්සුන් වන්නට ඇත. එහෙත් තව දුරටත් ඇල අග දෙසට ගමන් කරන ඔහු තම සේවකයා ඇල අග සිට රාජකාරිය අකුරට ම ඉටු කරමින් සිටිනු දැක මහත් සතුටට පත් වන්නට ඇත. මා සමග කුළුපග ව සිටි ඉහත කී නිලධාරියාගෙන් මම තොරතුරු විමසීමි. ඔහු සිනාසෙමින් කීවේ 'සුද්දන් කොහෙද අපිව තම්බන්නෙ' කියා ය. දින කීපයකට පසු ව සුද්දා ත්‍යාගයක් ලෙස මෙකී නිලධාරියාට අත් ඔරලෝසුවක් ලබා දුන්නේ ය. වරක් සාකච්ඡාවක දී සුද්දා මා සමඟ කීවේ තෝමස් ගේ සේවය ඉතා අවංක නිසා ඔහුට අත් ඔරලෝසුවක් තෑගි කළ බව ය. (තෝමස් අන්වර්ත නාමයකි) මා සුද්දාගෙන් තවත් කරුණු විමසූ විට ඔහු කීයේ තමා යටතේ ජල මිනුම් කරන නිලධාරීන් සය දෙනෙකු සිටින බවත්. ඔවුන් පිළිබඳ ව තමා එක් දිනක දී පරීක්ෂා කළ විට තෝමස් හැර අන් කිසිවකු එදා ක්ෂේත්‍රයේ ජල මිනුම් නො කළ බවත්

ය. මට සුද්දා ගැනත්, ඔහුගේ පරීක්ෂාව ගැනත් මහත් අනුකම්පාවක් ඇති විය. තෝමස් සහ අනෙක් නිලධාරීන් පස් දෙනා විශ්ව විද්‍යාල උපාධිධාරීන් ව සිටි බැවින් ඔව්හු පසු කලෙක රාජ්‍ය සේවයට ඇතුලත් වන්නට ඇත. මම ඔවුන් පිළිබඳ ව කිසිවක් නො දනිමි.

> කිසිදු වග විභාගයකින් තොර ව පුරෝහිත තොරතුරු මත පදනම් ව කටයුතු කිරීම ප්‍රධාන පාලකයන්ගේ සිරිත ය. එකල මෙන් පුරෝහිතයන් කවදැ යි පරීක්ෂා කර බලන ගජබා රජවරු අද නැත. අපගේ ම ඉතිහාසයේ සඳහන් පරිදි එකල සිටි පුරෝහිතවරු ගජබා රජුටත් ඇන්ද වූ හ. නැතහොත් රැවටුවෝ ය.

තවත් සංවර්ධන ව්‍යාපෘතියකට සම්බන්ධ විජාතික විශේෂඥයෙකු ශ්‍රී ලංකාවට පැමිණියේ කඩින් කඩ ය. ඔහු සම්බන්ධ වූ ව්‍යාපෘතිය ජනතා සංවිධාන ගොඩ නැඟීම පිළිබඳ එකකි. ක්ෂේත්‍රයේ කටයුතු අධීක්ෂණය පැවරී තුබුනේ මෙ රට නිලධාරියෙකුට ය. විජාතිකයා කොළඹට පැමිණි වහා ම කොළඹ සිටින නිලධාරීන්ගෙන් විජාතිකයා ලංකාවට පැමිණි බව ක්ෂේත්‍ර අධීක්ෂකයා දැන ගනී. එවිට ඔහු විජාතිකයාගේ චිත්ත සංතුෂ්ටිය සඳහා නොයෙකුත් උප්පරවැට්ටි හා දඟංගැට සූදානම් කරයි. වරක් මෙකී විජාතිකයාට හදිසි ක්ෂේත්‍ර නිරීක්ෂණයක් කළ යුතු බවට අදහසක් පහළ විය. විජාතිකයා සමඟ මමත් තවත් නිලධාරියෙකුත් ක්ෂේත්‍ර නිරීක්ෂණය සඳහා ගියෙමු. ක්ෂේත්‍ර අධීක්ෂණ නිලධාරියා අදාළ ව්‍යාපෘති සීමාව තුළ වූ අහඹු ලෙස තෝරා ගත් ප්‍රදේශයක් කරා යන බව විජාතිකයා ඇතුළු අපට දැනගන්නට හැර යම් මාර්ගයක අප කැඳවා ගෙන ගියේ ය. අප ගමන් ගත් ජීප් රථයට යා හැකි වූයේ සැතපුමකටත් වඩා අඩු දුර කි. පෙර දින වර්ෂාව නිසා බෝක්කුවක් සේදී කැඩී ගොස් තිබිණි. ක්ෂේත්‍ර අධීක්ෂකයා මුහුණ ඇඹුල් කර ගත්තේ බලාපොරොත්තු වූ පරිදි ක්ෂේත්‍රය නිරීක්ෂණය කළ නො හැකි වීම ගැන කණගාටු වන බවක් දක්වමිනි. එහෙත් ඔහු එතැනින් වෙනත් මාර්ගයකට හැරී අහඹු ලෙස ම වෙනත් මාර්ගයක ගමන් ගන්නා බවක් අපට පෙන්වමින් තවත් ප්‍රදේශයකට අප රැගෙන ගියේ ය. විශ්මය කි. සැලකිය යුතු ජන සංඛ්‍යාවක් ද, ක්ෂේත්‍ර නිලධාරීන් ද සහිත ව ගජරාමයට ක්‍රියාවේ යෙදෙන ජනතා සංවිධානයක මහා රැස්වීම කි. විජාතිකයා මහත් සන්තෝෂයට පැමුණුනි. අපි ද විශ්මයට පත් වීමු. ජනතාව තුළ ස්වශක්තිය, බල ගැන්වීම බලාපොරොත්තු වූවාටත් වඩා හොඳින් ඇති

ව තිබෙන බවට ක්ෂේත්‍ර නිරීක්ෂණයෙන් සනාථ විය.

ක්ෂේත්‍ර නිරීක්ෂණයෙන් කුමක් සනාථ වුව ද එහි සැබෑ කතාව මා දැනගත්තේ මාස කීපයකට පසුව ය. එවිට විජාතිකයා ක්ෂේත්‍ර චාරිකාවේ වාර්තාව ද ලියා අවසන් ය. සිදු ව ඇත්තේ වේදිකා ගත කරනු ලැබූ සිදුවීමකි. විජාතිකයා ඇතුළු අප ක්ෂේත්‍රයට පැමිණෙන බව ක්ෂේත්‍ර අධීක්ෂණ නිලධාරියා මුල සිට ම දැන සිට තිබේ. ඔහු විසින් අප රැගෙන ගිය මාර්ගයේ බෝක්කුව ද කැඩී තිබුණේ ඊට පෙර දින වර්ෂාවක් නිසා නො වේ. සති ගණනාවක සිට ම එම මාර්ගයේ වාහන ගමන් ගෙන නැත. අප නිරීක්ෂණය කරමින් සිටින රැස්වීම මුළුමනින් ම අහඹු සිදුවීමක් බව ඒත්තු ගැන්වීම සඳහාත්, ජනතාවගේ සංවිධාන බලය සැබැවින් ම සිදු ව ඇති බව ඒත්තු ගැන්වීම සඳහාත් අධීක්ෂණ නිලධාරියා අහඹු තත්ත්වයක් මවා පා අප සියලු දෙනා රැවටිල්ලට හසු කර තිබේ. සිදු ව ඇති සත්‍ය සිදු වීම කල් පසු ව හෝ අප දැනගත්තත් විජාතිකයා අදත් දන්නේ ඔහු ඇසින් දැක ප්‍රත්‍යක්ෂ කර ගත් සත්‍ය පමණි.

රැවටිල්ල සමස්ත ජන සමාජයේ සෑම ස්ථරයක ම පැතිර පවතින නමුදු, රැවටිල්ලෙන් වන බලපෑමේ තීව්‍රතාව රැවටිල්ල කරනු ලබන සමාජ ස්ථරය අනුව වෙනස් වේ. මේ නිසා වගකිව යුත්තන්ගෙන් කෙරෙන රැවටිල්ල අනෙකුන්ගේ රැවටිල්ලට වඩා අනර්ථකාරී ය. පාලකයන් ආසන්නයෙන් සිටින පුරෝහිතයන් වැනි වූ ඉහළ රාජ්‍ය නිලධාරීන්ගෙන් නිතර දෙවේලේ සිදු වන රැවටිල්ල සමස්ත ජාතිය ම නො මඟ යවන සුළු ය. පුරෝහිතයන් වැනි ඉහළ රාජ්‍ය නිලධාරීහු ප්‍රධාන පාලකයන් නිරතුරු ව ම රවටති. කිසිවක් නිසි පරිදි සිදු නො වුවත් සියල්ල නිසි පරිදි සිදු වේ යයි ඔව්හු පවසති.

කිසිදු වග විභාගයකින් තොර ව පුරෝහිත තොරතුරු මත පදනම් ව කටයුතු කිරීම ප්‍රධාන පාලකයන්ගේ සිරිත ය. එකල මෙන් පුරෝහිතයන් කව්දැ යි පරීක්ෂා කර බලන ගජබා රජවරු අද නැත. අපගේ ම ඉතිහාසයේ සඳහන් පරිදි එකල සිටි පුරෝහිතවරු ගජබා රජුටත් ඇන්ද වූ හ. නැතහොත් රැවටුවෝ ය. ඔවුන් රජුට වාර්තා කළේ රටවැසියාට කිසිදු ප්‍රශ්නයක්, දුක්ගැනවිල්ලක් නැති බව ය. එහෙත් රහසිගත ව හා හුදෙකලා ව රටේ සැබෑ තත්ත්වය නිරීක්ෂණය

කිරීමට ගිය ගජබා රජු මැහැල්ලකගේ දුක් අඳෝනාව අසා සොළින්ගෙන් තම රටට වූ ව්‍යසනය තේරුම් ගෙන සොළී දෙස ජය ගෙන ජනතාවගේ දුක් ගැනවිලි විසඳා ලූ බව ඉතිහාසය කියයි. මේ නිසා පුරෝහිතයන්ගේ බොරු කීම හා රැවටිල්ල සිංහලයන් තුළ අද පමණක් නො ව එදාත් එසේ ම තිබූ බව ඔප්පු වෙයි.

- දිලිඳුකම ලක්ෂණයක් කර ගත් නිසා දිළින්දන් තුළ විශේෂ සද්භාවයක් දැකිය නො හැකි ය.
- යම් එක් සමාජ කොට්ඨාශයක් බොරුවෙන්, වංචාවෙන්, රැවටිල්ලෙන් මිදෙන්නේ නම් අනෙක් සමාජ කොට්ඨාශයට රැවටිල්ල හා බොරුව තනිව ම පවත්වා ගෙන යා නො හැකි ය. මන්ද? සමාජ කොට්ඨාශ දෙක අතර ප්‍රබල පරස්පර විරෝධතාවක් ඇති වී සමාජ සංස්ථාවේ යම් දෙදරීමක් ඇති වීම අනිවාර්ය බැවිනි. ජන සමාජයේ ඒ ඒ කොට්ඨාශ අතර තුලනයක් ඇති වී සමාජය අද පවත්නා ආකාරයෙන් පවතින්නේ සමාජය එසේ පවත්වා ගෙන යාමට සියල්ලෝ ම සම්මාදම් වන නිසා ය.

අප දැන් සාකච්ඡා කරමින් සිටින්නේ ශ්‍රී ලංකා ජන සමාජයේ සමාජ චර්යාව නිශ්චය කරන්නා වූ සම්භව නියතයෙහි නිමැවුමක් සේ පෙනෙන බොරුව හා රැවටීම පිළිබඳ චර්යා රටාව පිළිබඳව යි. ඉනුත් විශේෂ අවධානයක් යොමු කළේ රාජ්‍ය නිලධාරි තන්ත්‍රයේ ඉහළ සහ පහළ ස්ථර විසින් අන්‍යෝන්‍ය ව පවත්වා ගෙන යනු ලබන රැවටිල්ල හෙළි කිරීමට යි. එහෙත් බොරුව හා රැවටිල්ල සඳහා වැඩි බරක් රාජ්‍ය නිලධාරීන් උදෙසා ම යොමු කර කරුණු ඉදිරිපත් කිරීම අසාධාරණ ය. මන්ද? රාජ්‍ය නිලධාරීන් යනු සුවිශේෂ ජන කොටසක් නොව මෙ රට පොදු ජනතාව වෙතින් ම බිහි වූ ජන කොටසක් වන බැවිනි. ඉංග්‍රීසි ආධිපත්‍ය මෙ රට පැවති යුගයේ මෙන් නො ව අද රාජ්‍ය නිලධාරි තන්ත්‍රයට පත් ව සිටින්නේ පොදු ජනතාවගේ දරු මුණුබුරෝ ය. ඔව්හු ඉංග්‍රීසි කතා කරන ඉහළ ආදායම් පංතිවලට අයත්, නාගරිකයෝ නො වෙති. ඉංග්‍රීසි පළමු බස කර ගත් නාගරිකයන් රාජ්‍ය නිලධාරි තන්ත්‍රයේ ඇත්තේ අතළොස්ස කි. මේ නිසා නිලධාරීන් යනු නැවත වරක් පොදු ජනතාව ය. මීට පෙර කීවාක් මෙන් පොදු ජනතාව යනු රැවටිල්ල සාමාන්‍ය චර්යාව කර ගත් ජනතාවක් බැවින් ඔවුන්ගේ දරු මුණුබුරන් වන නිලධාරීහු එසේ නො වන්නෝ යැයි කිව හැක්කේ කෙසේ ද? එබැවින් බොරුව හා

රැවටිල්ල නිලය හෝ තනතුරු නිසා බිහි වූවක් නො ව සාමාන්‍ය ජන චර්යාවේ ප්‍රතිබිම්බයක් වශයෙන් නිලධාරි තන්ත්‍රය තුළ දී ත් ප්‍රදර්ශනය වන සංසිද්ධියක් පමණි.

ශ්‍රී ලංකාවේ ජන සමාජය විශ්ලේෂණය කිරීමේ දී ඇතැම් වියතුන් හා බුද්ධිමතුන් විසින් කරනු ලබන එක්තරා සාවද්‍ය විශ්ලේෂණයක් නම් චර්යා රටා විස්තර කිරීමේ දී සමාජය පංති වශයෙන් බෙදා ඒ ඒ පංති අනු ව හොඳ හා නරක චර්යා ඇතැයි විස්තර කිරීම යි. ඇතැම් වියතුන්ගේ විස්තරවලට අනු ව නාගරිකයෝ, ධනවත්තු, බලධාරීහු, නිලධාරීහු ආදී වරප්‍රසාද ලාභීහු වංචනිකයෝ ය. දූෂිතයෝ ය. සූරා කන්නෝ ය. ආත්මාර්ථකාමීහු ය. දිළින්දෝ, ගැමියෝ, පාලිතයෝ යනාදීහු අහිංසකයෝ ය. අව්‍යාජ මිනිස්සු ය. පරිත්‍යාගශීලීහු ය. පරාර්ථකාමීහු ය. වසර විසි පහක් පමණ කාලයක් ග්‍රාමීය සංවර්ධනයට හා සජීවීකරණයට සම්බන්ධ පර්යේෂණ හා පුහුණුකිරීම්වල යෙදී සිටි මගේ අත්දැකීම අනුව මේ විශ්ලේෂණයේ කිසිදු සත්‍යයක් නැත.

දිළින්දෝ ද, ගැමියෝ ද, පාලිතයෝ ද ඉහත කී කිසිදු චර්යා ලක්ෂණයක් මත යහපත් යයි සම්මත කණ්ඩායමට පමණක් ඇතුළත් කළ නො හැකි ය. මන්ද? දිළිඳුකම ලක්ෂණයක් කර ගත් නිසා ඔවුන් තුළ විශේෂ සද්භාවයක් දැකිය නො හැකි බැවිනි. එමෙන් ම නාගරිකයෝ, ධනවත්තු, නිලධාරි ආදීහු ද අයහපත් යයි සම්මත කණ්ඩායමට පමණක් ඇතුළත් කළ නො හැකි ය. මන්ද? ඔවුන් තුළ ද හඳුනා ගත හැකි විශේෂ අසද්භාවයක් නැති බැවිනි. දිළින්දෝ ද තමන්ට අවස්ථාව ලැබෙන පරිද්දෙන් බොරුවේ හා රැවටිල්ලේ යෙදෙති. වංචාව ද එසේම ය. ඔවුන්ගේ රැවටිල්ල හා බොරුව නිසා සමස්ත සමාජයට සිදු වන බලපෑම අඩුවෙන් තක්සේරු වී පෙනෙන්නේ සමස්ත සමාජයට ඔවුන්ගේ රැවටිල්ලෙන් වන බලපෑම අඩු නිසා ය.

යමෙකු බලධාරියෙකු, නිලධාරියෙකු, වගකිවයුත්තෙකු, තීරකයෙකු, නායකයෙකු වන විට ඔහුගේ හෝ ඇගේ රැවටිල්ල නිසා සිදුවන අසාධාරණය හෝ අයහපත සමස්ත ජාතියට ම, රටට ම දැඩි ව බලපායි. එහෙත් ඉහත කී දිළින්දන්ගේ, ගැමියන්ගේ, පාලිතයන්ගේ රැවටිලි නිසා බරපතල සමාජ අසාධාරණයක් හෝ අයහපතක් සිදු

නො වන්නේ ඔවුන්ගේ රැවටිලි අසල්වාසීන්ගේ මට්ටමේ දී ම, ගම් මට්ටමේ දී ම දිය වී යන ඒවා නිසා ය. රැවටිල්ලේ පරිමාණය අනුව ඉන් සිදු වන සමාජ හානිය අඩු වීම නිසා රැවටිල්ල පිටතට හෙළිදරව් නො වුව ද වරප්‍රසාද නො ලත් පංතිය යයි කියනු ලබන, අහිංසකයෝ යයි වර්ග කරනු ලබන පංතියේ බහුතරය ද රැවටිලි කාරයන් ම බව කිව යුතු ය. වාරිමාර්ග පද්ධති නඩත්තුව සඳහාත්, මහාමාර්ග නඩත්තුව සඳහා ක්ෂේත්‍රයට සැපයෙන සිමෙන්ති රජයේ නිලධාරීන් හොර පාරෙන් කළු කඩයට විකුණන විට පොරකමින් ඒවා අඩු මිලට ලබා ගන්නට තැත් කරන්නේ මෙකී අහිංසකයෝ ය. වාරි ඇල වේලි හිතා මතා කඩා බිඳ දමන්නේ මොවුහු ම ය. වාරි ඉදිකිරීම් විනාශ කරන්නෝ මොවුහු ය. පාලම්වල ඇදිවලට දැමූ යකඩ බට රූපවාහිනී ඇන්ටෙනාවලට සවි කරන්නේ මොවුහු ය. මේ නිසා ශ්‍රී ලංකා ජන සමාජයේ අග මුල මැද හැම තැන ම බොරුව ය, රැවටිල්ල ය. එක් කොට්ඨාශයක් මුළුමනින් ම යහපත් කොට්ඨාශයක් වී අනෙක් කොට්ඨාශය මුළුමනින් ම නරක කොට්ඨාශයක් වශයෙන් පැවතීම න්‍යායට මෙන් ම භාවිතයට ද පටහැනි ය. සියලු දෙනා තම තමන්ට අවස්ථාව ලැබෙන පමණින් බොරුවට, රැවටිල්ලට හා වංචාවට සම්මාදම් වෙති. යම් එක් සමාජ කොට්ඨාශයක් බොරුවෙන්, වංචාවෙන්, රැවටිල්ලෙන් මිදෙන්නේ නම් අනෙක් සමාජ කොට්ඨාශයට රැවටිල්ල හා බොරුව තනිව ම පවත්වා ගෙන යා නො හැකි ය. මන්ද? සමාජ කොට්ඨාශ දෙක අතර ප්‍රබල පරස්පර විරෝධතාවක් ඇති වී සමාජ සංස්ථාවේ යම් දෙදරීමක් ඇති වීම අනිවාර්ය බැවිනි. ජන සමාජයේ ඒ ඒ කොට්ඨාශ අතර තුලනයක් ඇති වී සමාජය අද පවත්නා ආකාරයෙන් පවතින්නේ සමාජය එසේ පවත්වා ගෙන යාමට සියල්ලෝ ම සම්මාදම් වන නිසා ය. නැතහොත් සමාජය අද පවත්නා තත්ත්වයෙන් පැවතීමට අවශ්‍ය වන්නා වූ සාධක අවශ්‍ය ප්‍රමාණයෙන් හා ගුණයෙන් පවත්නා නිසා ය.

අප මේ පරිච්ඡේදය තුළ සාකච්ඡා කරනු ලැබුයේ ශ්‍රී ලාංකිකයන්ගේ සමාජ චර්යාව පිළිබඳව යි. චර්යාව විශ්ලේෂණය කිරීම සඳහා පරිච්ඡේදය ආරම්භයේ දී ම නව ප්‍රවේශයක් හඳුන්වා දුන්නා පාඨකයාට මතක ඇත. නව ප්‍රවේශය මඟින් හඳුන්වා දුන් චර්යා ශ්‍රිතය නැවත සිහි ගැන්වුව හොත් එය පහත ආකාර වේ.

B = E , S , R , O , f ( K A P )

මේ පරිච්ඡේදයේ මෙතෙක් විස්තර කළ සියලු දෑ චර්යා ශ්‍රිතයෙහි සංගෘහිත ව පවතී. චර්යා ශ්‍රිතයෙහි නියතයන් මගින් නිශ්චය වී ඇති චර්යා රටාවලින් සජීවීකරණය සඳහා බාධක වන චර්යා පමණක් කතුවරයා සාකච්ඡාවට ගත් අතර එකී නියතයන් නිර්මාණය කර ඇති සාධනීය චර්යාවන් පිළිබඳ ව කතුවරයා අවධානයක් යොමු නො කළේ ය. මක් නිසා ද? මේ ග්‍රන්ථය සජීවීකරණය තේමා කොට ලියනු ලබන්නක් විනා හුදු චර්යා විශ්ලේෂණයක් උදෙසා ම නො ලියන ලද්දක් බැවිනි.

බ්‍රෝඩ්හර්ස්ට් කීවේ මිනිස් චර්යාව පරිසරය හා සම්භවය (ජාන) මගින් තීරණය වන නමුත් චර්යාව යනු සම්භවයේ හා පරිසරයේ එකතුවක් (Sum) නො ව නිමැවුමක් (Product) බව ය (Broadhurst, 1960). බ්‍රෝඩ්හර්ස්ට් මිනිස් චර්යාව විශ්ලේෂණය කිරීම සඳහා ඉදිරිපත් කළ මේ තර්කය නව ප්‍රවේශය සඳහා ද එක සේ වලංගු ය. එනම් මනුෂ්‍යයාගේ චර්යාව තීරණය වන්නේ එක් එක් නියතයෙන් නිශ්චය වන්නා වූ එකිනෙකින් වෙන් කළ හැකි සුවිශේෂ චර්යා රටා මත නො ව ඒ ඒ නියතය එකිනෙක කෙරෙහි අන්‍යෝන්‍ය ව බලපෑම මත තීරණය වන්නා වූ තත්ත්වයෙහි ප්‍රතිඵලයක් වශයෙන් බව යි. වෙනත් ආකාරයකින් කිවහොත් භෞතික පරිසරය (E), සමාජ පසුබිම (S), සම්පත් (R), හා සම්භවය (O) යන සාධක හතරෙහි නිමැවුම වන ESRO නම් වූ නව නියතයක් මත චර්යාව තීරණය වනවා විනා එක් එක් නියතය වෙන් වෙන් ව, හුදකලාව, චර්යාව නිශ්චය නො කරන බව යි. එකතුවක (Sum) සරල බවක් ඇතත් නිමැවුමක(Product) ඇත්තේ සංකීර්ණ ස්වභාවයකි. අනෙක එකතුවක වටිනාකමට වඩා නිමැවුමක වටිනාකම ද අත්‍යන්තයෙන් ම වෙනස් ය. එමෙන් ම එකතුවක තත්ත්වය, ප්‍රමාණය හා ගුණයට වඩා නිමැවුමක තත්ත්වය, ප්‍රමාණය හා ගුණය ද වෙනස් ය. මේ නිසා මනුෂ්‍ය චර්යාව වනාහි සරල වශයෙන් පුරෝකථනය කළ නො හැකි සංකීර්ණ ස්වභාවයක් බව තේරුම් ගැනීම වැදගත් ය. එබැවින් මේ පරිච්ඡේදය තුළ පැහැදිලි කිරීම් සහ අර්ථ දැක්වීම් සඳහා වෙන් වෙන් වශයෙන් විශ්ලේෂණය කරනු ලැබුවා වූ E,S,R,O නම් වූ නියත සමූහය සත්‍ය වශයෙන්

පෙනී සිටින්නේ මෙකී නියත සමූහයේ නිමැවුම වශයෙන් හැඳින්විය හැකි ESRO නම් වූ තනි නියතයක් වශයෙන් බව කිව යුතු ය. මේ නිසා සමාජ චර්යාශ්‍රිතය වඩා සාධාරණ වශයෙන් එක් නියතයක් හා විචල්‍යයන් තුනක් මත තීරණය වන බැවින් එය පහත ආකාරයෙන් ලිවීම වඩා තාර්කික වන්නේ ය.

$$B = ESRO, f\ (K, A, P)$$

මේ පරිච්ඡේදය තුළ සාකච්ඡාවට ගත් තොරතුරු ඉතා සංක්ෂිප්ත ව ගොනු කිරීමට දැන් උත්සාහ ගනිමු. මනුෂ්‍යයාගේ චර්යාව බෙහෙවින් සංකීර්ණ තත්ත්වයකි. චර්යාව වනාහි ඵලය කි. චර්යාව නම් වූ ඵලය ජනිත කිරීමට හේතූන් රැසක් තිබේ. ඒ හේතූන් හෙවත් සාධකයන් කාල පදනම මත අර්ථ දැක්වූ විට දෙ ආකාර ය. එක් සාධක විශේෂයක් කෙටි කලක දී වෙනස් කළ හැකි ය. අනෙක් සාධක වෙනස් කළ හැක්කේ දිගු කාලයේ දී ය. කෙටි කාලයේ දී වෙනස් කිරීමට හැකි සාධක විචල්‍ය සාධක ලෙස ද කෙටි කාලයේ දී වෙනස් කිරීමට අපහසු සාධක නියත සාධක වශයෙන් ද හැඳින් වේ. කෙටි කාලයේ දී වෙනස් කළ හැකි සාධක ත්‍රිවිධාකාර ය. දැනුම, කුසලතා හා ආකල්ප යනු ඒවා ය. (ආකල්ප විචල්‍යයක් වුව ද දැනුම හා කුසලතාවලට සාපේක්ෂ ව එය දිගු කාලීන ය) කෙටි කාළයේ දී වෙනස් කළ නො හැකි සාධක හෙවත් නියත සාධක සිව් ආකාර ය. මිනිසා ජීවත් වන භෞතික පරිසරය, සමාජ පසුබිම, සම්පත් හා ඔහුගේ සම්භවය, නියත සාධක සේ ගැනේ. දිගු කාලීන වශයෙන් ගත් විට සෑම සාධකයක් ම විචල්‍යය සාධකය කි. නැතහොත් වෙනස් කළ හැකි සාධකය කි. මේ නිසා මිනිසාගේ චර්යාව ද වෙනස් කළ හැකි ය. චර්යාව යනු ඵලයක් බැවින් එයට මුල් වූ හේතූන් වෙනස් නො කොට ඵලය වෙනස් කළ නො හැකි ය. මේ නිසා හේතූන් එලෙස ම තබා ගනිමින් ඵලය පමණක් වෙනස් කිරීමට බලාපොරොත්තු තැබීම අතාර්කික අපේක්ෂාවක් වන්නේ ය. චර්යා පරිවර්තනයක් සඳහා දැනුම, කුසලතා හා ආකල්ප ආදිය කොතෙක් පොම්ප කිරීමට උත්සාහ කළ ද යම් චර්යාවක් සඳහා නියත සාධක හේතු වී ඇත්නම් ඒ චර්යාව වෙනස් කිරීම ඉතා අපහසු වන්නේ ය. මෙ වැනි අවස්ථාවක නියතයන්ගේ වෙනස් කිරීමක් සඳහා කටයුතු කිරීම අත්‍යවශ්‍ය වේ.

නියතයන් නියත වශයෙන් ම තබා ගනිමින් විචල්‍යයන් පමණක් වෙනස් කිරීමට යාමෙන් සිදු වන්නේ විචල්‍යයන් මත සිදු වන වෙනස නැවතත් නියතයන්ට අනුරූප ව හැඩ ගැසීම ය. නැතහොත් නියත දෙසට ආපසු ගමන් කිරීමක් වීම ය. එබැවින් යම් චර්යා පරිවර්තනයක් තහවුරු කර ගැනීමට අවශ්‍ය වන්නේ නම් නියත සාධකයන් ගේ ස්වභාවය අත්‍යවශ්‍යයෙන් ම සැලකිල්ලට ගත යුතු වන්නේ ය.

චර්යාව නිශ්චය වන්නේ විචල්‍ය සාධකයන් තුනකින් හා එස්රෝ නම් වූ තනි නියතයකින් වුව ද කරුණු විශ්ලේෂණය කිරීම සඳහා මේ පරිච්ඡේදය තුළ එස්රෝ නම් වූ නියතය විභේදනය කොට පරීක්ෂාවට ලක් කළේ ය. එක් එක් විභේදිත නියතයෙහි විශේෂිත චර්යා ලක්ෂණ හඳුනා ගෙන සමාජ සජීවීකරණය කෙරෙහි බාධා පමුණුවන චර්යා නම් කිරීමක් ද සිදු කරනු ලැබිණ. ඒ අනුව සිංහලයන් ගේ සමාජ පසුබිම් නියතය විසින් අධිපති වාදය, පරායත්ත මානසිකය හා උච්චායම නම් අයහපත් චර්යා රටා තුනක් ද, සම්භව නියතය විසින් අලසකම හා අකාර්යක්ෂමකම, වැනෙන බව හා අමතක වන බව සහ බොරුව හා රැවටීම නම් වූ චර්යා රටා යුගලයන් තුනක් ද විශේෂ වශයෙන් හඳුනා ගත්තේ ය. මීට අමතර ව භෞතික පරිසරය හා සම්පත් නම් වූ දෙන ලද තත්ත්වයන් හෙවත් නියතයන් චර්යාව නිශ්චය කිරීම සඳහා දායක වන ආකාරය ද මේ පරිච්ඡේදය තුළ දී හෙළිදරව් කරනු ලැබිණ. මේ අනුව මේ පරිච්ඡේදය තුළ සාකච්ඡා කරන ලද සියලු දත්ත, තොරතුරු හා න්‍යායන්ගේ අවසන් විග්‍රහය වන්නේ ශ්‍රී ලාංකිකයන්ගේ වර්තමාන චර්යාව උවමනාවක් තිබේ නම් වෙනස් කළ හැකි බව ය. එමෙන් ම වෙනස් කළ යුතු බව ය. අවශ්‍ය වන්නේ ඒ සඳහා ගත යුතු මඟ තෝරා ගැනීම සහ මනා සංකලනයකින් යුතු උපක්‍රම පද්ධතියක් නිශ්චය කර ගැනීම ය. සජීවීකරණය සඳහා ගත යුතු මඟ හා සුදුසු උපක්‍රම කවරේ ද යන්න පිළිබඳ ව ඉදිරි පරිච්ඡේදවල දී විස්තර කරනු ඇත.

# 4 පරිච්ඡේදය

## සමාජ සජ්වීකරණය සඳහා ගත යුතු මග

මේ ග්‍රන්ථයේ තුන් වැනි පරිච්ඡේදයේ අරමුණ වූයේ සමාජ සජ්වීකරණයට බාධක ව පවතින ජන චර්යාවෙහි ලක්ෂණ හඳුනා ගැනීම යි. සමස්තයක් වශයෙන් ගත් විට තුන් වැනි පරිච්ඡේදය තුළ දී සිදු වූ චර්යා විශ්ලේෂණය මගින් සජ්වීකරණය සම්බන්ධ ප්‍රධාන ප්‍රශ්න දෙකක් මතු කොට ඒවාට පිළිතුරු සොයා ගනු ලැබිණ. ඒ ප්‍රශ්න දෙක නම් ශ්‍රී ලාංකිකයන්ගේ වර්තමාන චර්යාව වෙනස් කළ හැකි ද? වෙනස් කළ යුතු ද ? යන ප්‍රශ්න දෙක යි. මින් පළමු ප්‍රශ්නයට න්‍යායානුකූල පිළිතුරක් ද දෙවැනි ප්‍රශ්නයට අරමුණු හෝ අපේක්ෂා මත පදනම් වූ පිළිතුරක් ද ගොඩ නගා ගන්නා ලදී. ගණිතමය පදනමක් මත ගොඩ නැගූ නව ප්‍රවේශයක් මත ලබා ගත් න්‍යායානුකූල පිළිතුරෙන් කියැවුනේ මනුෂ්‍යයන්ගේ චර්යාව විචල්‍ය හේතුන් කීපයක් හා නියත හේතුන් කීපයක ප්‍රතිඵලයක් වශයෙන් නිර්මාණය වන බවත් එකී හේතුන් චලනය කිරීම මත හේතුන්ගේ ඵලය හෙවත් චර්යාව වෙනස් කළ හැකි බවත් ය. ඒ අනුව ශ්‍රී ලාංකිකයන්ගේ වර්තමාන චර්යාව ද අවශ්‍ය නම් සැලසුම් සහගත ව වෙනස් කළ හැකි බව පෙන්වා දෙනු ලැබිණි. දෙවැනි ප්‍රශ්නයට ලබා දුන් පිළිතුරෙන් කියැවුනේ සමාජ සජ්වීකරණයක් සඳහා අත්‍යාවශ්‍යයෙන් ම ශ්‍රී ලාංකිකයන් ගේ චර්යාව වෙනස් කළ යුතු බව ය. එමෙන් ම ඒ සඳහා නියි ක්‍රියා මාර්ග ගත යුතු බව ය.

හතරවැනි පරිච්ඡේදය වන මේ පරිච්ඡේදයේ බලාපොරොත්තුව වන්නේ ශ්‍රී ලාංකිකයන්ගේ චර්යාව වෙනස් කිරීම සම්බන්ධයෙන් ගත යුතු මග කුමක් ද යන්න පැහැදිලි කිරීම යි. වෙනත් වචනවලින් කිවහොත් ආර්ථික සංවර්ධනය සහ සමාජ යහපැවැත්ම තහවුරු කිරීම සඳහා වර්තමාන සමාජ චර්යාව වෙනස් කළ යුතු නම් ඒ වෙනස කුමන ස්වරූපයක් ගත යුතු ද? ඒ සඳහා යා යුතු දිසාව කුමක් ද? යන්න සාකච්ඡා කිරීම මේ පරිච්ඡේදයේ අරමුණ වේ.

## චර්යා වෙනස පිළිබඳ මත වාද

ආර්ථික සංවර්ධනය හා සමාජ යහ පැවැත්ම සඳහා ශ්‍රී ලාංකිකයන්ගේ වර්තමාන චර්යාව වෙනස් කළ යුතු බවට තර්කයක් නැත. සාධාරණය, සමානාත්මතාව හා සමාජ ආර්ථික ශුභසිද්ධිය පතන සියලු දෙනාගේ ම උවමනාව වන්නේ එය යි. විශේෂ වශයෙන් ම උගතුන්, බුද්ධිමතුන්, කලාකරුවන්, මාධ්‍යකරුවන් සහ ඇතැම් දේශපාලනඥයන් ද මේ මතය දැඩි ව දරති. එහෙත් කළ යුතු වෙනස කුමන ස්වරූපයක් ගත් එකක් ද යන්න පිළිබඳ ව මූලික එකඟතාවක් නැත. ශ්‍රී ලාංකික ජන චර්යාව වෙනස් කිරීම අරමුණු කොට ශාස්ත්‍රීය වශයෙන් ලියන ලද ලිඛිත සාහිත්‍යයක් නැතත් චර්යා වෙනසක් අපේක්ෂා කරන්නෝ ප්‍රධාන මත වාද දෙකක් ඉදිරිපත් කරති. ඉන් පළමු මතයෙන් කියැවෙන්නේ ශ්‍රී ලාංකිකයන්ගේ ඉපැරණි සංස්කෘතියෙහි පැවතියා යයි ඇතැමෙකු විශ්වාස කරනු ලබන ලක්ෂණ නැවත ඇති කළ යුතු බව යි. මේ මතයෙහි පදනම වන්නේ බටහිර ජාතීන්ගේ බලපෑම නිසා ශ්‍රී ලාංකිකයින් පසුගාමී ජනතාවක් බවට පත් වී ඇති බවත්, ශ්‍රී ලාංකිකයින්ගේ ඉතිහාසය වර්තමානයට වඩා සාධාරණත්වයෙන් ද, සමානාත්මතාවෙන් ද, යහපැවැත්මෙන් හා ඉදිරිගාමිත්වයෙන් ද ඉහළ මට්ටමක පැවති බව ය.

> ජන චර්යාවේ වෙනසක් අපේක්ෂා කරන්නෝ ප්‍රධාන මත වාද දෙකක් ඉදිරිපත් කරති. ඉන් පළමු මතයෙන් කියැවෙන්නේ ශ්‍රී ලාංකිකයන්ගේ ඉපැරණි සංස්කෘතියෙහි පැවතියා යයි ඇතැමෙකු විශ්වාස කරනු ලබන ලක්ෂණ නැවත ඇති කළ යුතු බව යි. දෙවැනි මත වාදයෙන් කියැවෙන්නේ වෙනස් වන ලොව සමඟ ශ්‍රී ලාංකික ජනතාව ඉදිරියට යාම සඳහා පැරණි සමාජ ආර්ථික මෙවලම් වලින් තව තවත් නිදහස් ව වඩා යෝග්‍ය මෙවලම් නිර්මාණය කරමින් සම්ප්‍රදායෙන් මිදිය යුතු බව යි.

දෙවැනි මත වාදයෙන් කියැවෙන්නේ වෙනස් වන ලොව සමඟ ශ්‍රී ලාංකික ජනතාව ඉදිරියට යාම සඳහා පැරණි සමාජ ආර්ථික මෙවලම් වලින් තව තවත් නිදහස් ව වඩා යෝග්‍ය මෙවලම් නිර්මාණය කරමින් සම්ප්‍රදායෙන් මිදිය යුතු බව ය. මේ මත වාදයේ පදනම වන්නේ ඉතිහාසයට වඩා වර්තමානය ආර්ථික වශයෙන් මෙන් ම ප්‍රජාතාන්ත්‍රික ලක්ෂණ වූ මිනිස් අයිතිවාසිකම් ගරු කිරීම් වශයෙන් ද ඉදිරියට පැමිණ සිටින බව ය. මෙකී අන්ත මත වාද දෙක අතරේ දෝලනය වන තවත් මත වාද ගණනාවක් තිබේ. ඒවායින් ඇතැම්

ඒවා දේශපාලන ස්වරූපයක් ගත් ඒවා ය. තවත් ඒවා ජාතිමය හෝ වර්ගමය ස්වරූපයක් ගත් ඒවා ය. තවත් සමහර ඒවා ආගම්වාදී මත වාද ය. කෙසේ වෙතත් මේ අතුරු මත වාද සියල්ල මූල ධර්ම වශයෙන් ඉහත කී ප්‍රධාන මත වාද දෙක තුළ ඇති පරාසයෙහි යම් තැනෙක ස්ථාන ගත කළ හැකි ය. නැතහොත් අඩු වැඩි වශයෙන් එක් එක් ප්‍රධාන මතවාදයට පක්ෂ ව හෝ ප්‍රතිපක්ෂ ව ගොනු කළ හැකි ය. මේ නිසා ශ්‍රී ලාංකික ජන චර්යාව වෙනස් කිරීම පිළිබඳ ව ඇත්තේ මූලික මත වාදයන් දෙකක් පමණ කැ යි කීම සාධාරණ වේ.

සමාජ සජීවිකරණය සඳහා ගත යුතු මඟ කුමක් ද යන්න නිශ්චය කර ගැනීමේ දී මෙකී ප්‍රධාන මතවාදයන් දෙක පිළිබඳ ව ම පුළුල් ලෙස සලකා බැලීම වැදගත් වේ. ඒ ඒ මතවාදයෙහි තිබෙන තාර්කික භාවයත්, ප්‍රායෝගික භාවයත් හෙළිදරව් වන්නේ එවැනි සලකා බැලීමකිනි. අපි ප්‍රථමයෙන් පළමු මත වාදය වන ශ්‍රී ලාංකිකයන්ගේ ඓතිහාසික ජන චර්යාව හුවා දැක්වෙන මත වාදය සැලකිල්ලට ගනිමු.

ශ්‍රී ලාංකිකයන්ගේ ඉතිහාසය හා සම්බන්ධ විවිධ තොරතුරු අනභිමත ව හා තාර්කික ව අර්ථ දැක්වුව හොත් ඉන් හෙළිදරව් වන සමාජ ආර්ථික යථාර්ථය එතරම් සතුටු විය හැකි එකක් නො වන බව තුන් වැනි පරිච්ඡේදයෙන් පැහැදිලි විය. ඉතිහාසය පිළිබඳ අනභිමත විශ්ලේෂණයකින් හෙළිදරව් වන්නේ ආර්ථික වශයෙනුත්, ප්‍රජාතාන්ත්‍රික වශයෙනුත්, සමානාත්මතාව, සාධාරණය, යුක්තිය ආදී වූ මිනිස් අයිතිවාසිකම් වශයෙනුත් අගය කළ හැකි මට්ටමක ශ්‍රී ලංකාවේ ඓතිහාසික සමාජය නො පැවති බව යි. කෙසේ වෙතත් ප්‍රජාතන්ත්‍රවාදය නො පැවති, සමානාත්මතාව නො පැවති, අඟ හිඟකම් පැවති පැරණි ජන සමාජය තුළ අදට වඩා වැඩි සමාජ සහජීවනයක් හා යහපැවැත්මක් පැවති බවට ද ප්‍රමාණවත් ඓතිහාසික සාධක තිබේ (Knox , 1681 p 66 - 95) . නූතන සමාජයේ ප්‍රකට ව පෙනෙන ලක්ෂණ වන අපරාධ, දූෂණය, ප්‍රචණ්ඩත්වය ආදිය පැරණි සමාජය තුළ ප්‍රදර්ශනය වූයේ බෙහෙවින් ම සීමා සහිත ව ය. මේ නිසා බැලූ බැල්මට පෙනෙන්නේ සමාජයේ යහපැවැත්ම සම්බන්ධයෙන් බලන විට බැහැරින් පැමිණි

ප්‍රජාතන්ත්‍රවාදය, මිනිස් අයිතිවාසිකම් හා භෞතික සැප සම්පත් ආදියට වඩා දේශීය වූ ඒකාධිපතිවාදය, අසමානාත්මතාව හා අගහිඟකම ආදිය ලාංකිකයන්ට වඩා ගැළපෙන බව ය.

ශ්‍රී ලාංකිකයන්ගේ ඓතිහාසික වටිනාකම් නැවත තහවුරු කළ යුතු යැයි මත වාදයක් ගොඩ නැගී තිබෙන්නේ ද මේ තර්කය මත විය හැකි ය. කෙසේ වෙතත්, තාර්කික විශ්ලේෂණයකින් හෙළිදරව් වන තත්ත්වය මතු පිටින් ගොඩ නැගෙන මේ මතය බිඳ දැමීමට ප්‍රමාණවත් පසුබිමක් සපයන බව කිව යුතු ය.

ඓතිහාසික වාර්තා බොහොමයකින් හෙළිදරව් වන පරිදි සමාජ සහජීවනයට බාධා පමුණුවන ලබන ප්‍රචණ්ඩත්වය, අපරාධ, දූෂණය, නපුර ආදී තත්ත්වයන් පැරණි ජන සමාජයේ අවම මට්ටමකින් පැවතියේත්, සමාජ යහපැවැත්මක් ප්‍රදර්ශනය වූයේත් ඓතිහාසික සමාජය තුළ තුබූ සමාජ ආර්ථික හේතූන් ගණනාවක් නිසා ය. අන්‍යොන්‍ය රැඳියාව මත පදනම් වූ භාණ්ඩ හුවමාරු ආර්ථිකය, අත්තම, කයිය, මාරු උදව්ව ආදී වූ මෙවලම් මත හසුරුවනු ලැබූ නිෂ්පාදනය, කුල ක්‍රමය මත පදනම් වූ සමාජ ධූරාවලිය පිය පුතු උරුමයෙන් තහවුරු කරන ලද වෘත්තීය විශේෂඥතාව මේ අතර වේ. එහෙත් මේ සියල්ල අභිබවා සිටි ප්‍රධාන කරුණු දෙකක් ද වේ. එනම්, එකල ජීවත් වූ ජනතාවගේ සිතුම් පැතුම් හා වටිනාකම්වල ස්වභාවය හා ඒකාධිපති රාජාණ්ඩුව යටතේ ක්‍රියාවට නැගුණු ජනතාව භීෂණයට පත් කළ දඬුවම් ක්‍රමය යි. පැරණි ජන සමාජයේ පැවති සමාජ සහජීවනයෙහි ප්‍රධාන හේතූන් වශයෙන් මෙකී හේතුද්වය නම් කළ පමණින් පාඨකයා නිරවුල් වන්නේ නැත. හේතු හා ඵල අතර ඇති සම්බන්ධතාව හෙළිදරව් වන්නේ ද නැත. එබැවින් පැරණි සමාජයේ සහජීවනය හා යහපැවැත්ම තහවුරු කරනු ලැබුවා වූ ප්‍රධාන හේතුද්වය සාධක සහිත ව පෙන්වා දීමට යම් උත්සාහයක් දැරීම අත්‍යවශ්‍ය වේ.

> පැරණි ජන සමාජය තුළ ප්‍රචණ්ඩත්වය, නපුර ආදිය සීමා වීමටත්, සහජීවනයක් ප්‍රදර්ශනය වීමටත් බලපෑ ප්‍රධාන හේතූන් දෙකකි. ඉන් පළමුවැන්න ජනතාව තුළ පැවති වටිනාකම්, විශ්වාස හා සිතුම් පැතුම්වල ස්වභාවය යි.

## පැරණි සමාජ වටිනාකම්, විශ්වාස හා සිතුම් පැතුම්

පැරණි ජන සමාජය තුළ ප්‍රචණ්ඩත්වය, නපුර ආදිය සීමා වීමටත්, සහජීවනයක් ප්‍රදර්ශනය වීමටත් බලපෑ ප්‍රධාන ම හේතුවක් වූයේ එකල ජීවත් වූ ජනතාව තුළ පැවති වටිනාකම්, විශ්වාස හා සිතුම් පැතුම්වල ස්වභාවය යි. අපරාධ, නපුර, ප්‍රචණ්ඩත්වය ආදිය ප්‍රදර්ශනය වන්නේ මිනිසා තුළ පවත්නා වූ ලෝභය, ක්‍රෝධය, වෛරය, ඊර්ෂ්‍යාව, ආදී වූ අභ්‍යන්තර හැඟීම්වල බාහිර පිළිබිඹුවක් වශයෙනි. අද මෙන් ම එදා පැවති ඓතිහාසික සමාජය තුළ ද ක්‍රෝධය, ඊර්ෂ්‍යාව, වෛරය වැනි මිනිස් ගති පැවතුම් එලෙස ම පැවතුනි. පළිගැනීමේ මානසිකත්වය ද එ පරිද්දෙන් ම ය.මක් නිසා ද? මැකියාවලි කීවාක් මෙන් ස්වභාවයෙන් ම මනුෂ්‍යයන් දුර්ගුණවලින් ද යුක්ත වන බැවිනි. පැරණි ජන සමාජයේ පැවති විශ්වාස, ඇදහිලි හා සිතුම් පැතුම් නිසා සිංහලයන් ඔවුන් තුළ පැවති ක්‍රෝධය, ඊර්ෂ්‍යාව, පළි ගැනීමේ රිසි කම ආදී වූ දුර්ගුණයන් මුදා හරින ලද්දේ ඔවුනට ම විශේෂිත වූ ස්වරූපයකිනි. (තුන් වැනි පරිච්ජේදයේ පරායත්තතාව යටතේ ලියා ඇති තොරතුරු ද කියවා බලන්න) ඔව්හු එකිනෙකා කා කොටා ගෙන, ආයුධවලින් පහර දී එකිනෙකා මරා ගැනීමට ඉක්මන් වූයේ නැත. ඒ වෙනුවට කරනු ලැබුයේ එකල සමාජය විසින් සතුරාට පහර දීම සඳහා පිළිගනු ලැබූ ප්‍රචණ්ඩත්වය ප්‍රදර්ශනය කිරීමේ විවිධ ක්‍රම ක්‍රියාවට නැඟීම ය.

පැරණි සිංහලයන් අනෙකෙකුට නපුර කටින ලද්දේ දෙවියන් මාධ්‍ය කර ගෙන ය. භූතයන් මාධ්‍ය කර ගෙන ය. අශුභ නැකත, අශුභ හෝරාව, අශුභ දිසාව, මරු සිටින දිසාව ආදිය මාධ්‍ය කර ගෙන ය. ඔව්හු අනෙකාට අපරාධයක් කිරීම සඳහා (බොහෝ විට මරා දැමීම සඳහා) කොඩිවින කළ හ. හූනියම් වැළලූ හ. දෙවියන් ඉදිරියේ පළි ගැසූ හ. වස් කවි කී හ. පොල් ගැසූ හ. කැති මන්නා ආදියෙන් පහර දීම වෙනුවට ඒවා ගිණි පල්ලෙහි වළලා රත් කොට නපුර පැතූ හ. විනාශය පතා හුණු ගෑ හ. මිරිස් ඇඹරූ හ. කබරුන් ලවා ලිප ගිණි පිඹ, තෙල් හිඳ, පහන් දල්වා නපුර පැතූ හ. අංගම් පිල්ලි යැවූ හ. (මේ කිසිවක් වර්තමානයේ කුමන වර්ගයකවත් අපරාධයක් නො වේ. සත්ව හිංසාව යටතේ කබරුන් බැඳ ගැනීම පමණක් දඬුවම් ලැබිය හැකි වරදක් විය හැකි ය) මේ නිසා පැරණි සිංහල සමාජයේ ප්‍රදර්ශනය වූ නපුර, ප්‍රචණ්ඩත්වය මෙකී මිථ්‍යා, ඇදහිලි හා

විශ්වාසවලට සීමා වූවා මිස කා කොටා ගැනීම් බවට අද මෙන් පවුල් පිටින් අමු අමුවේ මරා දැමීම් බවට හෝ නීතියේ නිර්වචනය වන අපරාධ බවට පරිවර්තනය වූයේ කලාතුරකිනි. එබැවින් පැරණි සිංහලයෝ මනසින් අපරාධකාරයන් වූ නමුත් ක්‍රියාවෙන් අපරාධකාරයන් වූයේ නැත.

පැරණි සිංහලයෝ ධනය වටිනාකමක් ලෙස නො සැලකූ හ. ලුනුත්, සහලුත් ඇතොත් තමන් ස්වයංපෝෂිත යයි සිතූ හ. ඇති නැති බව, ඉහළ පහළ බව උපතින් ම ලැබෙන්නක් බව ද එය වෙනස් කළ නො හැකි තත්ත්වයක් යයි ද සිතූ හ. සියල්ල දෛවය විසින් නිශ්චය කරනු ඇතැයි ද, කරුමය හෝ ලබා උපන් බව දෙන ලද තත්ත්වයක් යයි ද විශ්වාස කළහ (Knox , 1681 P 85).

ඓතිහාසික තොරතුරුවලින් හෙළිදරව් වන පරිදි, පැරණි සමාජ පිළිගැනීම් නිසා එ කල ජීවත් වූ ශ්‍රී ලාංකිකයෝ නීතිමය නිර්වචනවලට අනු ව අපරාධ කාරයන් නො වූවා පමණක් නො වේ. එකල පැවති වටිනාකම් අනුව ඔව්හු ඉතා සරල ජන ජීවිතයක් පවත්වා ගෙන පිරිසක් ද විය. ශ්‍රී ලාංකිකයෝ ධනය වටිනාකමක් ලෙස නො සැලකූ හ. ලුනුත්, සහලුත් ඇතොත් තමන් ස්වයංපෝෂිත යයි සිතූ හ. ඇති නැති බව, ඉහළ පහළ බව උපතින් ම ලැබෙන්නක් බව ද එය වෙනස් කළ නො හැකි තත්ත්වයක් යයි ද සිතූ හ. සියල්ල දෛවය විසින් නිශ්චය කරනු ඇතැයි ද, කරුමය හෝ ලබා උපන් බව දෙන ලද තත්ත්වයක් යයි ද විශ්වාස කළ හ.

"They hold that every mans good or bad Fortune was predetermined by God, before he was born, according to an ufual *Proverb* they have, *Ollua Cottaula tiana, It is written in the head*" (Knox , 1681 P 85). " මොවුන්ගේ විශ්වාසය අනුව යමෙකු ඉපදීමට පෙර සිටම ඔහුගේ හෝ ඇගේ දෛවය දෙවියන් විසින් නිශ්චය කර අවසාන ය. මොවුන් අතර ඇති සාමාන්‍ය ජන වහරට අනුව යමෙකුගේ දෛවය ඔහුගේ හෝ ඇගේ ඔළුවේ කොටා ඇත." ශ්‍රී ලාංකිකයින්ගේ පැරණි ජන සමාජය තුළින් ප්‍රදර්ශනය වූ චර්යාව එකල පැවති විශ්වාස පද්ධතියේ හා වටිනාකම්වල සෘජු පිළිබිඹුවක් විය. මෙහි ප්‍රතිඵල වශයෙන් පැරණි ජන සමාජය තරහයෙන් තොර

විය. කුළල් කා ගැනීමෙන් තොර විය. බල තෘෂ්ණාවෙන් තොර විය. බල අරගල පැවතියේ අතලොස්සක් වූ රදළයන් අතර රජකම සඳහා පමණි. සෙස්සෝ ලද දෙයින් සතුටු ව, දෛවය උරුම කළ දෙය ට පිටු නො පා අධිපති වාදයට අභියෝග නො කොට ජීවත් වූ හ. ධනය, බලය හෝ කුලය මත උසස් තත්ත්වයකට පැමිණීම සඳහා පැරණි ජනතාව ගනු ලැබූ සියලු උත්සාහයෝ සමාජයේ තවෙකෙකුට හිරිහැර නො වන අහිංසක උත්සාහයෝ වූ හ. කරුමයෙන් හෝ දෛවයෙන් ලබා දී ඇති ජීවිතය වෙනස් කළ හැක්කේ කුශලාකුශල කර්ම මත පමණකැ යි විශ්වාස කළ මොව්හු ඉදිරියේ පැමිණෙන ජන්මයක දී භව භෝග සම්පත් ලැබීමට, ඇත්, අස්, ගව, මහීෂාදී වූ සැප සම්පත් ලැබීමට, උසස් කුලවල උපත ලැබීමට පිං දහම් රැස් කළා මිස තිබෙන ජන්මය ඉහළ තත්ත්වයකට ගෙන ආ හැකි යයි විශ්වාස නො කළා හ. එබැවින් ලැබී තිබෙන ජන්මයේ තත්ත්වය කුමක් වුව ද එය විඳ දරා සිටීමට ජනතාව පුරුදු වී සිටිය හ. වර්තමාන ජන්මයේ දී මුහුණ දෙන අඟ හිඟකම්, ලෙඩ දුක්, අතවර, නොපනත්කම් නො වැදගත් ය. මන්ද? ඒවා වෙනස් කළ නො හැකි, දෙන ලද තත්ත්වයන් බැවිනි. එහෙත් ඉදිරි ජන්මයේ ස්වභාවය තීරණය වන්නේ මේ ජන්මයේ කටයුතු කරන ආකාරය අනුව නිසා ඉදිරි ජන්මය වෙනස් කළ හැකි ය. කෙසේ ද? මේ ජන්මයේ දී හොඳින් ජීවත් වීමෙනි. හොඳින් ජීවත් නො වුව හොත්, පනවා ඇති නීති රීති කැඩුව හොත් ඉදිරි ජන්මයේ දී ලැබෙන දඬුවම බෙහෙවින් සාහසික විය හැකි ය. බොහෝ විට දැන් තිබෙන තත්ත්වයටත් වඩා පහත් තත්ත්වයකට ඇද වැටිය හැකි ය. එනම්, බල්ලකු, කපුටෙකු වී ඉපදීමෙන් දඬුවම් ගෙවන්නට වුව ද සිදු විය හැකි ය. මේ නිසා බෙහෙවින් පහත් යැයි සම්මත බලු, කපුටු ආදී වූ ජන්මයන් හි ඉපදීමේ අවදානමින් බේරීම ඉතා වැදගත් ය. පැරණි ජන සමාජයේ පැවැති මෙවැනි විශ්වාස ප්‍රයෝජනයට ගනිමින් නීති රීති හෝ ආඥාවන් ක්‍රියාවට නැගුණු ආකාරය ඇතැම් ටැම් ලිපිවලින් ඉතා පැහැදිලි ව පෙනේ. කිරිගල්ලෑව, මොරගොඩ හා අළුත් වැව ටැම් ලිපිවලට අනුව ඒවායේ සඳහන් ආඥාවන් උල්ලංඝණය කරන්නෝ ඉදිරි ජන්මවල දී අවශ්‍යයෙන් ම කපුටන් හෝ බල්ලන් වන්නෝ ය.

"මෙයටි වැදැ ආඥා උලැඝනා කළ කෙනෙකුන් ඇත දෙස්...
කරනු කවුඩු බලු වනු" (කිරිගල්ලෑව ටැම් ලිපිය)

"මේ අත්තාණි කණු හින්දවන ලදි මේ ආන්නැ උලැඝන කළ කෙනෙක් ඇත්නම් කව්ඩු බලු වෙත්වා"

(මොරගොඩ ටැම් ලිපිය)

"මෙයට් අනියා කළඟු කව්ඩු බලු වෙත්වා" (අලුත්වැව ටැම් ලිපිය)

කිරිගල්ලෑව, මොරගොඩ හා අලුත්වැව ටැම් ලිපි තුනෙහි ම උපුටා ගත් කොටස්වල අර්ථය වන්නේ ලිපියෙහි පනවා ඇති ආඥාවන් කඩ කරන්නෝ බල්ලන් හෝ කපුටන් වශයෙන් ඉදිරි ආත්මයන්හි ඉපදෙන බව යි (ආනන්ද තිස්ස කුමාර, 1990, පිටු 94).

> පැරණි ජන සමාජය තරහයෙන් තොර විය. කුළල් කා ගැනීමෙන් තොර විය. බල තෘෂ්ණාවෙන් තොර විය.බල අරගල පැවතියේ අතලොස්සක් වූ රදළයන් අතර රජකම සඳහා පමණි. සෙස්සෝ ලද දෙයින් සතුටු ව, දෛවය උරුම කළ දෙය ට පිටු නො පා අධිපති වාදයට අභියෝග නො කොට ජීවත් වූ හ.

පැරණි ශ්‍රී ලාංකිකයෝ ඔවුන් වෙත තුබූ විශ්වාස පද්ධතිය නිසා බොහෝ විට දෙන ලද තත්ත්වයන්ට අභියෝග කළේ නැත. අභියෝග නො කිරීමේ ජන චර්යාව සමාජ යහපැවැත්ම සඳහා බෙහෙවින් හිතකර විය. එකල කුලය, ලේ උරුමය මත පදනම් වූ අධිපති වාදය නිසා මිනිස් අයිතිවාසිකම් බරපතල ලෙස උල්ලංඝණය වූ බව සැබෑ ය. එමෙන් ම දෛවය, කරුමය, ලබා උපන් බව ආදී විශ්වාස නිසා පරායත්තතාව හා පසුගාමිත්වය ප්‍රදර්ශනය වූ බව ද සැබෑ ය. එහෙත් මේ සියල්ලෙහි අවසන් ප්‍රතිඵලය වූයේ තරහයෙන් තොර, කුළල් කා ගැනීමෙන් තොර, උද්ඝෝෂණයෙන් හා අරගලයෙන් තොර ජන සමාජයක් බිහි වීම ය. පැරණි ජන සමාජය සැහීමකට පත් ජන සමාජයක් විය. අග හිඟකම, ලෙඩ දුක් ආදියෙන් පීඩාවට පත් වුව ද අසහනයෙන් තොර වූ ජන සමාජයක් විය. සොරකමින්, දූෂණයෙන්, අපරාධවලින් මිදුණු ජන සමාජයක් විය. මේ සියල්ල හේතු කොට ගෙන පැරණි ශ්‍රී ලාංකික ජන සමාජය සාමකාමී, සහජීවනයෙන් යුතු ජන සමාජයක් ව තිබිණැ යි කීම අතිශයෝක්තියක් නො වේ.

> ප්‍රචණ්ඩත්වය, අපරාධ, දූෂණය, නපුර ආදී තත්ත්වයන් සමාජය තුළ අවම මට්ටමකින් පැවතීමට හේතු වූ දෙවැනි ප්‍රධාන හේතුව නම් ඒකාධිපති රාජාණ්ඩු ක්‍රමය විසින් පවත්වා ගෙන ගිය ජනතාව භීෂණයට ලක් කළ මිලේච්ඡ දඬුවම් ක්‍රමය යි.

## සමාජය භීෂණයට ලක් කළ දඬුවම්

ප්‍රචණ්ඩත්වය, අපරාධ, දූෂණය, නපුරු ආදී තත්ත්වයන් සමාජය තුළ අවම මට්ටමකින් පැවතීමට හේතු වූ අනෙක් ප්‍රධාන හේතුව නම් ඒකාධිපති රාජාණ්ඩු ක්‍රමය විසින් පවත්වා ගෙන ගිය ජනතාව භීෂණයට ලක් කළ ම්ලේච්ඡ දඬුවම් ක්‍රමය යි. නොක්ස්, කැප්ටන් බුෂි, කැම්ප්බෙල් සහ සුලෙයිවාන්ගේ එකිනෙකට ස්වාධීන වූ වාර්තාවල සිංහල රජු දවස සමාජය භීෂණයට ලක් කළ දඬුවම් පිළිබඳ ව පැහැදිලි ව වාර්තා වේ (Knox, 1681), (Bussche, 1817) (Campbell, 1834) (Sullivan ,1854). බුෂිගේ "ලෙටර්ස් ඔන් සිලෝන්" නම් කෘතියෙහි රජු ගේ ම්ලේච්ඡ දඬුවම් ගැන එක් තැනෙක සඳහන් වන්නේ මෙසේ ය. "Their noses were first cut off, and then and arm and an ear of each. Seven of these unfortunate suffers died under the operation" (Bussche, 1817, P. 14). "පළමුවෙන් ඔවුන්ගේ නාසා කපා දැමී ය. අනතුරු ව එක් එක් පුද්ගලයාගේ අතක් සහ කණක් කපා දැමී ය. මෙම අවාසනාවන්තයන්ගෙන් හත් දෙනෙකු ම මෙම දඬුවම් දෙන අවස්ථාව තුළදී ම මරණයට පත් විය." ඇහැලේපොළ පවුලට සිංහල රජු පැනවූ දඬුවම් හා ඒවා ක්‍රියාත්මක කළ අයුරු බුෂි ඉදිරිපත් කර ඇති එක් ලිපියක සඳහන් වන්නේ මෙසේ ය. "The wife of Ehelepola and his four children were butchered in the presence of king, with every refinement of cool blooded cruelty. The infants were decapitated in the presence of the agonized mother, who was then forced to pound their bleeding heads in a mortar. After this, her own throat was cut and the body, with remains of her children cast into the lower tank of Kandy" (Busssche, 1817, P. 13). "ඇහැලේපොළ ගේ බිරිඳ හා දරුවන් සිව් දෙනා රජු ඉදිරිපිට දී ම්ලේච්ඡ හා කුරිරු ලෙස වධ බන්ධනයට පත් කළේ ය. මව ඉදිරියේ තබා ගෙන ළදරුවන්ගේ හිස් සිඳ දමනු ලැබිණ. අනතුරු ව ලේ වැගිරෙන ළමා හිස් වංගෙඩියකට දමා මව විසින් ම කොටවා අවසන මවගේ උගුරු දණ්ඩ ද කපා දැමී ය. දරුවන්ගේ හා ඇගේ මළ සිරුරු පහළ නුවර වැවට විසි කරනු ලැබී ය."

ශ්‍රී ලංකාවේ ජන සමාජය පිළිබඳ ව වාර්තාවක් ලියා ඇති එඩ්වඩ් සුලෙයිවාන් නම් තැනැත්තා ද සිංහල රාජාණ්ඩු තුළ පැවති දඬුවම් ක්‍රම ගැන වාර්තා කර තිබේ. සුලෙයිවාන් එක් තැනක මෙසේ සඳහන් කර ඇත. "The cruelty and oppression of these kings, up to the time of their overthrow by the British, in the present century was incredibly barbarous;.........state prisoners buried up to the neck, with the King and his friends playing at bowl at their heads, till some fortunate blow deprived the wretched saffures of life: elephants treading criminals to death;............"(Sullivan, 1854 P. 53). "රජ වරුන් විසින් ක්‍රියාවට නගන ලද කෘෘරත්වය හා මර්දනය ඇදහිය නො හැකි තරම් ය. රජු විසින් සිරභාරයට ගනු ලැබූ මිනිසුන් හිස පමණක් මතු පිටට පෙනෙන පරිදි පොලවේ වළලා ඒ මත රජු සහ රජුගේ මිත්‍රයන් විසින් පන්දු ක්‍රීඩා කළ හ. පන්දු වැදීමෙන් මරණයට පත් නො වූ සිර කරුවන් ඝාතනය සඳහා ඇතුන් ලවා පාගා දමනු ලැබිණ".

ඓතිහාසික වාර්තා වලින් හෙළි වන පරිදි මැත ඉතිහාසයේ ශ්‍රී ලාංකිකයන් තුළ පැවති සමාජ සහපැවැත්මේ යථාර්ථය වනාහි ඉහත කී ද්විවිධාකාර වූ හේතුන්ගේ ඵලයක් මිස අනෙකක් නොවේ. සමාජය තුළ යහපැවැත්මක් පැවතියේ ශ්‍රී ලාංකිකයින් වෙත තුබූ සුවිශේෂ මිනිස් වටිනාකම් හා ආගමික හැදියාව නිසා යැයි ප්‍රකාශ වුව ද ඓතිහාසික වාර්තාවලින් මේ මතය සනාථ වන්නේ නැත. මැත ඉතිහාසයේ ශ්‍රී ලාංකිකයෝ යුක්තිය, සාධාරණය, සමානාත්මතාව ආදී වූ මිනිස් ගුණ අගය කළ සුවිශේෂ මිනිස් කොට්ඨාශයක් නො වූහ. එමෙන් ම එකී මිනිස් ගුණ අගය කරන්නා වූ සැබෑ බෞද්ධයන් ද නො වූහ. එහෙත් අවබෝධයෙන් තොර වූ, අන්ධ විශ්වාසයන් කෙරෙහි පැවති බිය නිසාත්, ඒකාධිපතියෙකු වූ රජතුමා විසින් පනවනු ලබන ම්ලේච්ඡ දණ්ඩනයන් ට තුබූ බිය නිසාත්, සමාජ සහජීවනයක් හා යහපැවැත්මක් ප්‍රදර්ශනය විය.

## නාමික බෞද්ධයන් වූ, සැබෑ බෞද්ධයන් නො වූ ශ්‍රී ලාංකිකයෝ

ඓතිහාසික තොරතුරුවලින් හෙළි වන පරිදි ඉපැරණි ඉතිහාසයේ දී

බුදු දහමට රාජ්‍ය අනුග්‍රහය ලැබුණේ දේශපාලන උපක්‍රමයක් වශයෙන් නො වේ. සැබෑ වශයෙන් ම රජුගේත්, වැසියන්ගේත් ආගමික දර්ශනය වූයේ බුදු දහම නිසා ය. වෙනත් වචන වලින් කිවහොත් ඉපැරණි රාජ්‍ය පාලකයෝ ජීවිත දර්ශනයක් වශයෙන් මෙන් ම විමුක්ති මාර්ගයක් වශයෙන් ද බුදු දහම අග්‍ර ගණ්‍ය කොට සැලකූ හ. එහෙත් මෑත ඉතිහාසය වන විට පාලකයා බුදු දහමේ අයිතිකාරයා වූයේ දේශපාලන උපක්‍රමයක් වශයෙනි. රාජ්‍යත්වය හා බෞද්ධ දර්ශනය අතර ඉපැරණි ඉතිහාසයේ දී පැවති ගැඹුරු සබඳතාව මෑත ඉතිහාසය වන විට මුළුමනින් ම බාල තත්ත්වයට පත් විය. රජවරු වෙත කිසිදු බෞද්ධකමක්, හැදියාවක් නො තිබුණත් පාලන බලය සඳහා ඔව්හු නාමික බෞද්ධයෝ වූහ. එමෙන් ම බුදු දහමේ අයිතිකාරයන් බවට ද පත් වූහ.

අද රාජ්‍ය පාලනය මෙහෙයවන්නා වූ දේශපාලකයන්ගෙන් ජනතාවට බුදු දහමේ හරයන් සේ ගැනෙන යුක්තිය හා සාධාරණය ඉටු නො වන්නා සේ ම නාම මාත්‍රික බෞද්ධ රජ වරුන්ගෙන් ද ජනතාවට යුක්තිය හා සාධාරණය ඉටු වී නැති බව ඓතිහාසික සාධකවලින් පැහැදිලි ව සනාථ වේ. එකල රාජ්‍ය මෙහෙයවීමේ අයිතිය ලත් වරප්‍රසාද ලත් පංතිය වූ "රජකොල් සම්දරුවන්" "රජකොල් කැමි" (රාජ්‍ය යන්ත්‍රණය මෙහෙය වූ රදළයන්) ආදීන්ගෙන් පොදු ජනතාවට බුදු දහමේ වටිනාකම් සේ සැලකෙන යුක්තිය හා සාධාරණය ඉටු වනු වෙනුවට පීඩාවක්, හිරිහැරයක් හා ශුරා කැමක් සිදු වූ බව ඓතිහාසික ටැම් ලිපිවලින් මනා ව හෙළිදරව් වේ (ආනන්ද තිස්ස කුමාර, 1990 පිටු 90 - 96). රාජ සේවකයන්ගෙන් මහජනතාවට වන පීඩාව හා හිරිහැරය ගැන නොක්ස් විසින් ද සෘජු ලෙස ම වාර්තා කර ඇත (knox, 1681 p 32 and 87).

ශ්‍රී ලාංකික පොදු ජනතාව ආගමෙන් යම් හික්මීමක්, හැදියාවක් ලැබූ බව සැබෑ ය. දන් දීම, පෝදා පන්සල් යාම ආදිය ජන චර්යාවට එක් වූයේ ආගම නිසා ය. හින්දුන්ගෙන් ලැබුණු කුල වාදය අසල්වැසි ඉන්දියාවේ මෙන් එකිනෙකා මරා ගන්නා මට්ටමේ තිරශ්චීන තත්ත්වයකට ඇද නො වැටුණේ ආගම නිසා ය. බුද්ධදාසලා, ධර්මදාසලා, සංඝදාසලා බිහිවුණේ ආගම නිසා ය. එහෙත්

ඓතිහාසික තොරතුරුවලින් හෙළි වන පරිදි මැත ඉතිහාසයේ ජීවත් ව සිටි පාලකයෝ මෙන් ම පොදු ජනතාව ද  කිසි විටෙකත් සැබෑ බෞද්ධයෝ නම් නො වූ හ. හයිඩ් ප්‍රකාශ කරන පරිදි නුවර යුගයේ ජීවත් වූ පොදු ජනතාව  ආගම පිළිබඳ ව යම් සැලකිල්ලක් හෝ දැක්වූයේ  ලෙඩ දුක්, අනතුරු ආදිය සිදු වූ විට හෝ වයස්ගත ව මිය යාමට ආසන්න වූ විට ය.  "There are indeed but  of few of them that are at all zealous in religion and hold their gods in great honour or esteem :  They concern themselves also but little with the points of their religion until they are sick or very old.  When they come to a great  age, they think that................but this is done for the most part only by the old people, who expect to die soon" (Hydts, 1744. P. 134). "ආගම ගැන තැකීමක් කරන්නේ මොවුන්ගෙන් ඉතාමත් සුළු පිරිසක් පමණි. ආගම සොයන්නේ බොහෝ සේ වයසට පත් වූ විට හෝ රෝගාතුර වූ විට ය. බෝ ගස් සිටුවීමෙන් ද, ඒවා අවට පිරිසිදු කිරීමෙන් ද, ඒවාට පුද පූජා පැවැත්වීමෙන් ද, දාගැබ් අවට පිරිසිදු කිරීමෙන් ද මරණින් මතු දෙව් ලොව යා හැකි යයි මේ මිනිස්සු විශ්වාස කරති. එහෙත් සත්‍ය වශයෙන් ම මේ චර්යාව තිබෙන්නේ ඉතා ඉක්මණින් මිය යනු ඇතැයි විශ්වාස කරනු ලබන වයස්ගත වූ මනුෂ්‍යයන් තුළ පමණි"

- රාජ්‍යත්වය හා බෞද්ධ දර්ශනය අතර ඉපැරණි ඉතිහාසයේ දී පැවති ගැඹුරු සබඳතාව මැත ඉතිහාසය වන විට මුළුමනින් ම බාල තත්ත්වයට පත් වී තිබේ. වර්තමානයේ පවතින්නේ මේ බාල සම්බන්ධතාවය යි.
- වර්තමාන රාජ්‍ය පාලනය මෙහෙයවන්නා වූ දේශපාලකයන්ගෙන් ජනතාවට බුදු දහමේ හරයන් සේ ගැනෙන යුක්තිය හා සාධාරණය ඉටු නො වන්නා සේ ම එකල සිටි නාම මාත්‍රික බෞද්ධ රජ වරුන්ගෙන් ද ජනතාවට යුක්තිය හා සාධාරණය ඉටු වී නැති බව ඓතිහාසික සාධකවලින් පැහැදිලි ව සනාථ වේ.
- "ආගම ගැන තැකීමක් කරන්නේ සිංහලයන්ගෙන් ඉතාමත් සුළු පිරිසක් පමණි. ආගම සොයන්නේ බොහෝ සේ වයසට පත් වූ විට හෝ රෝගාතුර වූ විට ය" (Hydts, 1744. P. 134).

අගතියෙන් තොර ව කරුණු සලකා බැලුව හොත් හයිඩ් ගේ මේ ප්‍රකාශය වර්තමානයට ද එකසේ සත්‍ය බව පෙනේ.  පොදු ජනතාව දැනුත් මෙ පරිදි ම ය.  සැබෑ බෞද්ධකම නිසා ශ්‍රී ලාංකිකයින් තුළ

සාමයක්, සහජීවනයක් පැවතියා නම් එය අදත් පැවතිය යුතු ය. මන්ද? ශ්‍රී ලාංකිකයන්ගෙන් බහුතරයක් දැනුදු බෞද්ධයන් ම වන බැවිනි. මේ නිසා මෑත ඉතිහාසයේ ජීවත් වූ ශ්‍රී ලාංකිකයන් වෙතින් ප්‍රදර්ශනය වූ හික්මීම හා විනය සැබෑ බෞද්ධකම නිසා ලැබුණු හික්මීමක් හෝ විනයකට වඩා ඔවුන්ගේ විශ්වාස හා වටිනාකම් නිසා ද, එකල ක්‍රියාත්මක ව පැවති දැඩි දඬුවම් නිසා ද ප්‍රදර්ශනය වූවකි.

මෑත යුගයේ ජීවත් ව සිටි ශ්‍රී ලාංකිකයන් සැබෑ බෞද්ධයන් නො වූ බව පෙන්වීමට සුදුසු තවත් උදාහරණයක් නොක්ස් ගේ වාර්තාවලින් එළි දැක්වෙයි. සමානාත්මතාව බෞද්ධයන් විසින් පිළිපැදිය යුතු සතර සංග්‍රහ වස්තූන් ගෙන් එකක් වුව ද පැරණි ශ්‍රී ලාංකිකයන් තුළ පැවති සමානාත්මතාවේ ස්වභාවය ගැන නොක්ස් හෙළිදරව් කරන්නේ මෙසේ ය. "සමාජයේ ඉතා පහත් තත්ත්වයක් වූ හිඟන (රොඩී) කුලයෙහි ලා සැලකීමට හෝ මරණය තෝරා ගැනීමට යමෙකුට ඉඩ දුන හොත් ඔහු හෝ ඇය නිසැක වශයෙන් ම මරණය තෝරා ගන්නේ ය (Knox, 1681, P. 71). මීට පෙර ද වරක් සඳහන් කළ පර්දි ඓතිහාසික සිංහල ජන සමාජයේ පැවති අසමානාත්මතාව ගැන රිබෙයිරෝ කියන්නේ මෙසේ ය. "කුල කතක් කුළ හීනයෙකු සමඟ ලිංගික සංවාසයේ යෙදී අසුවුව හොත් දඬුවම මරණය යි." (Ribeiro, 1685, P 123).

අප දැන් කතා කරමින් සිටින්නේ ශ්‍රී ලාංකිකයන්ගේ වර්තමාන සමාජ චර්යාව වෙනස් කිරීම සඳහා යා යුතු දිසාව හා කළ යුතු වෙනස්කම කුමක් ද යන්න පිළිබඳව යි. මෙහිදී ප්‍රධාන මත වාද දෙකක් ඇති බව ප්‍රකාශ කෙරේනි. ඉන් එකකින් කියැවුනේ සමාජ යහපැවැත්ම උදෙසා පැරණි සමාජ වටිනාකම් නැවත සලකා බැලිය යුතු බව ය. අනෙක් මතයෙන් කියැවුනේ පැරණි සම්ප්‍රදායික සමාජ මෙවලම් බිඳ දමා නව මෙවලම් හරහා තව තවත් ඉදිරියට යා යුතු බව ය. මෙතෙක් කරන ලද සාකච්ඡාවේ අරමුණ වූයේ මෙම මත දෙකෙන් කුමන මතයක් ඉදිරියට ගැනීම සුදුසු ද යන්න පිළිබඳ ව ස්වාධීන පරීක්ෂාවක් කිරීම යි. නැතහොත් අගතිගාමී චින්තනයෙන් හැකි තාක් බැහැර ව අනභිමත පරීක්ෂාවක් කිරීම යි.

ඉහත කළ කෙටි සාකච්ඡාවේ දී හෙළිදරව් වූ ප්‍රධාන නිගමන දෙකකි. ඉන් පළමුවැන්න ශ්‍රී ලාංකිකයන් වන අප සියලු දෙනා උද්දාමයට පත් කර තිබෙන පැරණි නිගමනය වේ. එනම්, පැරණි ශ්‍රී ලාංකිකයෝ සාමය, සමාදානය හා සහජීවනය ලඟා කර ගත් ජනතාවක් වූ බව යි. දෙවැනි නිගමනය සම්ප්‍රදාය විරෝධී නිගමනයකි. එනම් පැරණි ශ්‍රී ලාංකිකයන් තුළින් ප්‍රදර්ශනය වූ සාමය, සමාදානය හා සහජීවනය වනාහි ශ්‍රී ලාංකික මනුෂ්‍යයන් තුළ පැවති සුවිශේෂ වූ සද්භාවයක ඵලයක් නො ව, එමෙන් ම සැබෑ බෞද්ධ සිතුවිලිවල ඵලයක් ද නො ව ඔවුන් තුළ පැවති, විශ්වාස පද්ධතියේ හා වටිනාකම් පද්ධතියේ නිමැවුමක් වශයෙන් ද, දැඩි දඬුවම් සහිත අධිපති වාදයේ ප්‍රතිඵලයක් වශයෙන් ද පැවති තත්ත්වයක් බව යි. වෙනත් ආකාරයකින් කිව හොත් ලේ උරුමය, අධිපතිවාදය ආදී වූ සමාජ මෙවලම් නිසා ද , ධනය, බලය, කුලය, ආදිය දෛවයෙන්, කරුමයෙන්, උරුමයෙන්, ලබා උපන් බවින් හෝ පරම්පරාවෙන් දෙන ලද තත්ත්වයක් යයි මිනිසුන් විශ්වාස කළ නිසා ද, ඒ අනුව හැසිරුණු නිසා ද, ඒකාධිපති රාජාණ්ඩුවක් යටතේ සම්ප්‍රදාය කැඩීම දැඩි දඬුවම් ලැබීමට හේතුවක් වූ නිසා ද ඇති වූ ප්‍රතිඵලයක් බව යි. අරගල කරන්නේ, පොර බදන්නේ, කුළල් කා ගන්නේ එක්කෝ ධනය සඳහා ය. නැතහොත් බලය සඳහා ය. එසේත් නැතහොත් සමාජ තත්ත්වය සඳහා ය. මේ සියල්ල දෙන ලද තත්ත්වයන් නම් එනම්, වෙනස් කළ නො හැකි යයි සිතුවහොත් අරගලය, පොර බැදීම අනවශ්‍ය උත්සාහ වන්නේ ය. එමෙන් ම කුලයට, බලයට, වංශයට එරෙහි ව කටයුතු කිරීම රාජද්‍රෝහී යයි පිළිගනු ලබන විට ඇති වන්නේ ද මේ ප්‍රතිඵලය ම ය.

## බටහිර බලපෑම හා සමාජ චර්යාව

සමාජ යහපැවැත්ම සඳහා පැරණි වටිනාකම් නැවත ස්ථාපිත විය යුතු ය යන මත වාදය ඇසුරෙන් මතු වන තවත් අතුරු තර්කයක් නිරවුල් කර ගැනීමට තිබේ. මේ අතුරු තර්කයෙන් කියැවෙන්නේ බටහිර ජාතීන්ගේ බලපෑම නිසා මෙ රට ජනතාව ගේ සමාජ වටිනාකම් අයහපත් දිසාවට වෙනස් වූ බවත් ඒ නිසා ම, වර්තමාන සමාජය තුළ දක්නට ලැබෙන තරඟය, අරගලය, පොරකෑම, අපරාධ, නපුරු ආදිය ප්‍රදර්ශනය වන බවත් ය. පැරණි ජන සමාජය සහජීවනයෙන් යුතු එකක් යැයි කීම සත්‍ය වූවා සේ ම මේ අතුරු

තර්කය වන බටහිර බලපෑම නිසා සමාජ වටිනාකම් වෙනස් වී තරඟය, අරගලය, පොරකෑම ඇති වූයේ යැයි කීම ද සනාථ කළ හැකි සත්‍යය කි. එහෙත් එය සත්‍ය වනුයේ ද මුල් තර්කයේ දී මෙන් ම මත වාදය ඉදිරිපත් කරන්නවුන් පෙන්වා දෙන හේතුන් මත නො වේ. වෙනත් හේතුන් නිසා ය.

බටහිර ජාතීන් නිසා ශ්‍රී ලාංකිකයන්ගේ සමාජ වටිනාකම් වෙනස් වූ බව සැබෑ ය. එහෙත් මෙකී වෙනස්වීම් වලින් බොහොමයක් සමාජය ඉදිරියට ගෙන යනු ලැබූ ඉදිරිගාමී වෙනස්වීම් මිස පසුගාමී වෙනස්වීම් නො වේ. සුරාව, ගව මස් අනුභවය ආදිය බැහැරින් පැමිණි දුසිරිත යයි යමෙකුට තර්ක කළ හැකි ය. (මේවා බටහිර සමාජය තුල දුසිරිත් වශයෙන් සැලකෙන්නේ නැත) එහෙත් ප්‍රජාතන්ත්‍රවාදය, අධ්‍යාපනය, තාක්ෂණය ආදියෙන් සිදු වූ බලපෑමෙන් ද කුල, දැවැදි, ජාති, ලේ උරුම ආදී වූ වටිනාකම් දෙදරා යාමෙන් හා නීතිය, සමාජ සාධාරණය ස්ථාපිත වීම ආදියෙන් සිදු වූ පරිවර්තනයෙන් ද සිදු වූයේ සමාජය මහා ඉදිරි පිම්මක් පැනීම ය. විශේෂයෙන් ඉංග්‍රීසීන්ගේ බලපෑමෙන් පසු කුළ හා ලේ උරුම භේදයකින් තොර ව නෛතික වශයෙන් තහවුරු කරන ලද මිනිස් අයිතිවාසිකම් හා සමානාත්මතාව ශ්‍රී ලාංකික ජන සමාජයේ බරපතල වෙනස්කම් නිර්මාණය කළේය.

කන්ද උඩරට කැරැල්ල මැඩ පැවැත්වීමෙන් අනතුරු ව බ්‍රවුන්රිග් ආණ්ඩුකාරයා විසින් නිකුත් කරන ලද නිවේදනයේ සඳහන් පරිදි ඉංග්‍රිසි පාලනය නිසා මෙ රට සිදු කරන ලද වෙනස්කම්වලින් සමහරක් මෙසේ ය. . "British rule was strongly contrasted with the encient and frequent recurrence of capital exeutions, preceded by the most cruel and babarous tortures" නිතර නිතර සිදු කරන්නා වූ ම්ලේච්ඡ වධ බන්ධන වලින් යුතු ඉපැරණි මරණ දඬුවම් ක්‍රමයට බ්‍රිතාන්‍ය පාලනය දැඩි ලෙස විරුද්ධ විය. "An extraordinary and unpresidented laxity was allowed to take place in order that the country might with more ease recover from any evil effects sustained by the contrary practices of the King" රජු විසින් පවත්වා ගෙන ආ මර්දනකාරී, නපුරු පාලනයේ ප්‍රතිවිපාකවලින් මිදීම සඳහා මෙතෙක් කිසි කලෙකත් නො පැවති

අන්දමේ නිදහසක් හා සහනයක් රට තුළ ඇති කරන ලදී. And finally, that every Kandyan, be he of the highest or lowest class, is secured in his life, liberty and property from enchrochement of any kind, or by any person" අවසන් වශයෙන් කන්ද උඩරට ජීවත් වන්නා වූ ඉහළ හෝ පහළ පංතිවලට අයත් සියලු දෙනාට ඔවුන්ගේ ජීවිතය, නිදහස හා දේපල ආරක්ෂා කර ගැනීම සඳහා කටයුතු යොදන්නේ ය (Campbell, 1834, P. 383-385).

බටහිර ආභාෂය මත සිදු වූ මේ වෙනස්කම් නිසා කුලය, ලේ උරුමය වෙනුවෙන් යමෙකු ප්‍රසිද්ධියේ කතා කිරීම අශිලාචාරකම, නොමිනිස්කම ප්‍රදර්ශනය කිරීමක් බවට සලකනු ලැබිණ. අධ්‍යාපනය කුලවතුන්ගේ, ලේ උරුමක්කාරයන්ගේ හස්තයෙන් මිදී වඩා පුළුල් සමාජ කොට්ඨාශයක් වෙතට පත් විණි. පැරණි පිළිගැනීම අනුව අධ්‍යාපනය ලැබිය යුත්තේ කුළවත්තු, බලවත්තු, වංශවත්තු මිස පොදු ජනතාව නො වේ. එකල අධ්‍යාපනික වශයෙන් කාන්තාව බෙහෙවින් ම නො සලකා හරිනු ලැබිණ. එබැවින් කුලවතුන්, බලවතුන්, වංශවතුන් ආදී වරප්‍රසාදලාභී පවුල් විසින් වුව ද කාන්තාවගේ අධ්‍යාපන අයිතියට ගරු කරනු ලැබුවේ නැත. පරම්පරාව වෙත පමණක් කේන්ද්‍රණය වී තුබූ බලය හා ධනය බටහිර බලපෑම සමග උගත්කම, දක්ෂකම, නිපුණත්වය ආදී මාධ්‍ය හරහා පවුල් උරුමයෙන් වියුක්ත වී සාමාන්‍ය ජනතාව අතට පත් වන්නට විය. මේ අනුව බටහිර බලපෑම සමඟ මෙ රට ජනතාව තුළ පැවති සමාජ වටිනාකම් ප්‍රබල ලෙස විනාශ වූ බව සත්‍ය නමුත් බොහෝ සමාජ වටිනාකම් විනාශ කළ යුතු මට්ටමක පැවති ඒවා බව ද පිළිගත යුතු ව තිබේ (අයිවන්, 1999).

> බටහිර බලපෑම නිසා මෙරට ජනතාව තුළ පැවති සමාජ වටිනාකම් විනාශ වූ බව සත්‍යයකි. එමෙන් ම බොහෝ සමාජ වටිනාකම් විනාශ කළ යුතු මට්ටමක තිබූ බව ද සත්‍යයකි.

## ශ්‍රී ලාංකිකයන්ගේ නාමික ප්‍රජාතන්ත්‍රවාදය

බටහිරින් පැමිණි ප්‍රජාතන්ත්‍රවාදය විසින් ශ්‍රී ලාංකික ජන සමාජය අවුලෙන් අවුලට පත් කරනු ලැබූ බවට ඇතැමෙකු තර්ක කරති. එහෙත් සැබැව නම් ප්‍රජාතන්ත්‍රවාදය මගින් සමාජය අවුල් කළා නො ව

ප්‍රජාතන්ත්‍රවාදයක් නො පැවතීම නිසා සමාජය අවුල් සහගත තත්ත්වයකට පත් වූ බව යි. දශක පහකට අධික කාලයක් ශ්‍රී ලාංකිකයෝ ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රගුණ කළාහු ය. එහෙත් මේ වන විටත් පරිණත ප්‍රජාතන්ත්‍රවාදයක් ශ්‍රී ලංකාව තුළ දක්නට ලැබෙන්නේ නැත. ඒ වෙනුවට දක්නට ලැබෙන්නේ ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාවට නැගුණු මුල් අවධියේ පැවති තත්ත්වයටත් වඩා බාල මට්ටමේ ප්‍රජාතන්ත්‍රවාදයකි. වෙනත් වචනවලින් කිවහොත් වර්තමානයේ දක්නට ලැබෙන්නේ දියවෙමින් යන ප්‍රජාතාන්ත්‍රික සාරධර්ම සහිත ජන සමාජයකි.

බැහැරින් පැමිණි ප්‍රජාතන්ත්‍රවාදී රාමුවට යටත් වීමත්, අවනත වීමත් නිසා ශ්‍රී ලාංකික ජන සමාජය සාම්ප්‍රදායික පැරණි බැමි වලින් මිදී ගිලිහී ගියේ ය. එහෙත් ගිලිහුණු බැමි නිසා නිර්මාණය වූ රික්තකය පිරවීම සඳහා ප්‍රජාතාන්ත්‍රික සාරධර්මවලින් ප්‍රතිපූරණයක් කෙරුනේ නැත. ප්‍රජාතාන්ත්‍රික චින්තනයට අයත් නූතන බැමි සමග තදින් බද්ධ වූයේ ද නැත. මේ නිසා සාම්ප්‍රදායික රාජාණ්ඩු ක්‍රමය තුළ හෝ, යටත් විජිත වාදය තුළ හෝ ප්‍රජාතන්ත්‍රවාදය තුළ හෝ දැකිය නො හැකි අලුත් ම කුලකයකට අයත් චර්යා රටා පද්ධතියක් ජන සමාජය තුළින් ප්‍රදර්ශනය වූ අතර එමගින් අවිචාරයක්, අසංයමයක් හා අවිනයක් ප්‍රකට වන්නට විය. තුන් වැනි පරිච්ඡේදයේ දී කීවාක් මෙන් ප්‍රජාතාන්ත්‍රවාදය ක්‍රියාවට නැගීමේ වගකීම් භාර ගනු ලැබුවේ ද පැරණි වැඩවසම් ක්‍රමය ක්‍රියාවට නැගීමේ වගකීම් දැරූ අධිපති පංතියම ය (අයිවන්, 1999). මේ නිසා ශ්‍රී ලාංකිකයන් ප්‍රජාතන්ත්‍රවාදයේ අංගෝපාංගයන් වූ නීති පොත, රෙගුලාසිය, චක්‍රලේඛය ආදිය සාධාරණ ව හා අපක්ෂපාතී ව ක්‍රියාවට නො නැගුවා පමණක් නො ව ප්‍රජාතන්ත්‍රවාදය ආත්මාර්ථකාමී හා අයුතු අරමුණු ඉටු කර ගැනීම සඳහා ද ප්‍රයෝජනයට ගනු ලැබිණ.

ජන මාධ්‍යයන් මගින් කෙරෙන කෑ කෝ ගැසීම් නිරීක්ෂණය කළ හොත් පිටස්තරයෙකුට පෙනෙන්නේ ශ්‍රී ලංකාව තුළ සුපිරි ප්‍රජාතන්ත්‍රවාදයක් පවතින බව යි. එහෙත් රටේ ජීවත් වන්නා වූ ජනතාවට පෙනෙන්නේ සියලු පාර්ශ්වයන්ට අයත් බල ලෝභීන් විසින් දිගින් දිගට ම අනිසි ලෙස හා ආත්මාර්ථකාමී ලෙස ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රයෝජනයට ගනු ලබන බව යි.

ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන වර්තමාන ප්‍රජාතන්ත්‍රවාදය අමුතු ම ආරක් ගත් සුවිශේෂ ප්‍රජාතන්ත්‍රවාදයකි. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක ප්‍රජාතන්ත්‍රවාදයට අනුව රට තුළ සිදු වන ප්‍රජාතන්ත්‍ර විරෝධී දේ පෙන්වා දීමේ පූර්ණ ප්‍රජාතාන්ත්‍රික අයිතිය ජනතාවට තිබේ. එහෙත් එවැනි ප්‍රජාතන්ත්‍ර විරෝධී දේ වලක්වා ගැනීම සඳහා ජනතාවට ගත හැකි ප්‍රායෝගික ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියා මාර්ග අතිශයින් ම විරළ ය. මේ නිසා ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදය තුළ දිගින් දිගට ම ප්‍රජාතන්ත්‍ර විරෝධී දේ සිදු වීමත්, දිගින් දිගට ම ප්‍රජාතන්ත්‍ර විරෝධී දේ සිදු වන්නේ යයි කෑ කෝ ගැසීමත් සිදු වෙයි. ජන මාධ්‍යයන් මගින් කෙරෙන කෑ කෝ ගැසීම් නිරීක්ෂණය කළ හොත් පිටස්තරයෙකුට පෙනෙන්නේ ශ්‍රී ලංකාව තුළ සුපිරි ප්‍රජාතන්ත්‍රවාදයක් පවතින බව යි. එහෙත් රටේ ජීවත් වන්නා වූ ජනතාවට පෙනෙන්නේ සියලු පාර්ශ්වයන්ට අයත් බල ලෝභීන් විසින් දිගින් දිගට ම අනිසි ලෙස හා ආත්මාර්ථකාමී ලෙස ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රයෝජනයට ගනු ලබන බව යි.

මීට පෙර ද සඳහන් කළ පරිදි ශ්‍රී ලාංකිකයෝ අඩ සිය වසකට අධික කාලයක් ප්‍රජාතන්ත්‍රවාදය පුගුණ කළ මිනිස්සු ය. එබැවින්, ඔව්හු ප්‍රජාතන්ත්‍රවාදය ගැන ද, එහි අඩංගු න්‍යායයන් ගැන ද හසළ දැනුමක් ඇත්තෝ ය. ඉහළ සාක්ෂරතාවක් ඇති ශ්‍රී ලාංකිකයන්ගෙන් සැලකිය යුතු ජන කොටසක් ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ව පමණක් නො ව අනෙකුත් දේශපාලන ක්‍රම වේදයන් පිළිබඳ ව ද ප්‍රමාණවත් අවබෝධයක් ඇත්තෝ වෙති. සමාජවාදය, කොමියුනිස්ට්වාදය, පැසිස්ට්වාදය, ඒකාධිපතිවාදය ආදී වූ සියලු පාලන උපාය මාර්ගයන්හි ගුණාගුණ කීමට මොව්හු දනිති. දේශපාලකයන්, උගතුන් පමණක් නො ව සාමාන්‍ය ජනතාවගෙන් බොහෝ දෙනෙක් ද දනිති. මේ නිසා සැබෑ උවමනාවක් තිබේ නම් ප්‍රජාතන්ත්‍රවාදය නිසි පරිදි පවත්වා ගෙන යාමට අවශ්‍ය බුද්ධිමය පදනම ශ්‍රී ලංකා ජන සමාජය තුළ තිබෙන්නේ ය.

ඕනෑ ම ප්‍රජාතාන්ත්‍රික රටක ප්‍රජාතන්ත්‍රවාදයේ නියමුවන් වන්නේ රටේ පාලකයන් හෙවත් දේශපාලකයන් ය. ශ්‍රී ලංකාවේ සිටින්නේ සිද්ධාන්තයෙන් හෝ න්‍යායෙන් වුව ද ප්‍රජාතන්ත්‍රවාදය තේරුම් කර දීමට සමත්, ව්‍යක්ත දේශපාලන නායකයෝ ය. දේශපාලන

නායකයන් සමඟ ප්‍රජාතන්ත්‍රවාදය ගැන වාද කළ නො හැකි ය. මන්ද? එතරමට ම ඔව්හු සිද්ධාන්ත හා න්‍යායන් ගිල දැමුවෝ බැවිනි. එහෙත් ජාතියේ අවාසනාවට ඔවුන්ගේ ප්‍රායෝගික චර්යාව තුළ සැබෑ ප්‍රජාතන්ත්‍රවාදයක් ප්‍රදර්ශනය වන්නේ ඉතාමත් අඩු වශයෙනි. සිද්ධාන්ත හා න්‍යායන් පොතට පමණක් සීමා වී තිබේ. පුස්තකාලයක ජීවත් වූ කාවෙකුට දිනක් මකුළුවකු මුණ ගැසිණි. කාවා මකුළුවාට කීවේ තමා දැන් බොහෝ සේ උගතකු බවට පත් වී ඇති බව යි. මකුළුවා ඒ කෙසේ දැ යි ඇසී ය. පුස්තකාලයේ තිබෙන බොහෝ සාරගර්භ පොත පත කා දැමීමෙන් තමා උගතකු බවට පත් වී ඇති බව කාවා කී ය. එවිට මකුළුවා කීවේ උඹටත් වඩා ඉක්මණින් උගතකු වන හැටි මම දන්නවා යයි කියා ය. ඒ කෙසේ දැ යි කාවා ඇසී ය. උඹ ව කා දැමීමෙන් යයි මකුළුවා කී ය. දිවි ඇති තුරා ම පුස්තකාලයක ජීවත් වීමෙන් කාවාට උගතකු විය නො හැකි වා මෙන් ම අඩ සිය වසක් පුරා පාර්ලිමේන්තුවක් පවත්වා ගෙන ගිය පමණින් ද, සිද්ධාන්ත හෝ න්‍යාය දැන ගැනීමෙන් ද ශ්‍රී ලාංකික දේශපාලකයන්ට ප්‍රජාතන්ත්‍රවාදීන් විය නො හැකි ය. ප්‍රජාතන්ත්‍රවාදය හාවිතයෙන් ප්‍රදර්ශනය කළ යුතු ව තිබේ.

පුස්තකාලයක ජීවත් වූ කාවෙකුට දිනක් මකුළුවකු මුණ ගැසිණි. කාවා මකුළුවාට කීවේ තමා දැන් බොහෝ සේ උගතකු බවට පත් වී ඇති බව යි. මකුළුවා ඒ කෙසේ දැ යි ඇසී ය. පුස්තකාලයේ තිබෙන බොහෝ සාරගර්භ පොත පත කා දැමීමෙන් තමා උගතකු බවට පත් වී ඇති බව කාවා කී ය. එවිට මකුළුවා කීවේ උඹටත් වඩා ඉක්මණින් උගතකු වන හැටි මම දන්නවා යයි කියා ය. ඒ කෙසේ දැ යි කාවා ඇසී ය. උඹ ව කා දැමීමෙන් යයි මකුළුවා කී ය. දිවි ඇති තුරා ම පුස්තකාලයක ජීවත් වීමෙන් කාවාට උගතකු විය නො හැකි වා මෙන් ම අඩ සිය වසක් පුරා පාර්ලිමේන්තුවක් පවත්වා ගෙන ගිය පමණින් ද, සිද්ධාන්ත හෝ න්‍යාය දැන ගැනීමෙන් ද ශ්‍රී ලාංකික දේශපාලකයන්ට ප්‍රජාතන්ත්‍රවාදීන් විය නො හැකි ය. ප්‍රජාතන්ත්‍රවාදය හාවිතයෙන් ප්‍රදර්ශනය කළ යුතු ව තිබේ.

ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා වීම සඳහා ප්‍රජාතාන්ත්‍රික නීතිය මෙන් ම ප්‍රජාතන්ත්‍රවාදයට අනුකූල වූ සමාජ අනුපිළිවෙල (order) ද අවශ්‍ය වේ. සාධාරණය, යුක්තිය, අයිතිවාසිකම ඉටු කර ගැනීම සඳහා හැම විට ම නීතියේ පිහිට පැතීම අසීරු කාර්යයකි. එමෙන් ම එය

ප්‍රායෝගික නො වන්නා වූ ද කාර්යයකි. මේ නිසා ප්‍රජාතන්ත්‍රවාදයේ පැවැත්ම සඳහා ප්‍රජාතාන්ත්‍රික වටිනාකම් ගරු කරන්නා වූ සමාජ අනුපිළිවෙල අත්‍යවශ්‍ය සාධකයක් වේ. කිසිවෙකුට අයුක්තියක්, අසාධාරණයක් වන විට ඒ පිළිබඳ ව දන්වා සාධාරණය ඉටු කර ගැනීම සඳහා අගතියෙන් තොර ව සිදු වන කන් දීමක් ඇති වන්නේ මෙවැනි අනුපිළිවෙලක් තිබේ නම් පමණි. එහෙත් ශ්‍රී ලාංකික ජන සමාජය තුළ සාධාරණය ඉටු කර ගැනීම සඳහා ගොඩ නැගුණු ප්‍රජාතාන්ත්‍රික අනුපිළිවෙලක් නැත. තිබෙන අනුපිළිවෙල දේශපාලනකරණය තුළින් අගතියට පත් ව තිබේ. ගොවි පළක ඇපල් ගසකට නැග හොරෙන් ඇපල් කඩන ළමයකු දුටු ඇපල් ගස් හිමියා "ළමයා බැහැපන් බිමට මම උඹේ තාත්තාට කියනවා" යයි කී ය. "තාත්තා ඉන්නේ අනෙක් ඇපල් ගහේ" යයි ළමයා කී ය. ශ්‍රී ලාංකික සමාජයේ ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කරන සමාජ අනුපිළිවෙළ මේ කතාවට වඩා වැඩි වෙනසක් නැත.


ගොවි පළක ඇපල් ගසකට නැග හොරෙන් ඇපල් කඩන ළමයකු දුටු ඇපල් ගස් හිමියා "ළමයා බැහැපන් බිමට මම උඹේ තාත්තාට කියනවා" යයි කී ය. "තාත්තා ඉන්නේ අනෙක් ඇපල් ගහේ" යයි ළමයා කී ය. ශ්‍රී ලාංකික සමාජයේ ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කරන සමාජ අනුපිළිවෙළ මේ කතාවට වඩා වැඩි වෙනසක් නැත.

## ශ්‍රී ලාංකික ප්‍රජාතන්ත්‍රවාදයේ සමාජ නිර්මාණය

බටහිරින් පැමිණි ප්‍රජාතන්ත්‍රවාදය හා මානව නිදහස අනිසි ලෙස, ආත්මාර්ථකාමී ලෙස හා අයුතු ලෙස ප්‍රයෝජනයට ගැනීමත්, එතෙක් පැවති සාම්ප්‍රදායික බැමි වලින් නිදහස් වීමත් යන ද්විවිධ හේතූන් ශ්‍රී ලාංකික සමාජය තුළ නිර්මාණය කළේ ශ්‍රී ලාංකිකයන්ට ම පාලනය කර ගත නො හැකි මට්ටමේ අධම චර්යා රටා පද්ධතියකි. ප්‍රජාතන්ත්‍රවාදය, ආත්මාර්ථකාමී ලෙස ක්‍රියාවට නැගූ බල ලෝභී පාලකයන් මෙන් ම ප්‍රජාතන්ත්‍රවාදයේ සීමා හඳුනා නො ගත් අන්තවාදී පාලිතයන් විසින් ද මෙකී අධම චර්යා පද්ධතිය හරහා ජන සමාජය අද ඇද වැටී තිබෙන ප්‍රපාතයට වේගයෙන් ඇද ගෙන ආ හ. දියුණු මනුෂ්‍ය කොට්ඨාශ විසින් ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රයෝජනයට ගත් විට සාමය, සමාදානය, සාධාරණය, අන්‍යොන්‍ය විශ්වාසය ආදී වූ සමාජ යහපැවැත්ම තහවුරු වන ගුණාංග නිර්මාණය වන නමුත් ශ්‍රී ලාංකික

ජන සමාජය තුළ සිදු වූයේ ඒකාධිපති සිංහල රාජාණ්ඩු යුගයේ පැවති සාමය හා සමාදානයත් අතුරුදන් වී යාම ය. මේ ග්‍රන්ථයේ තුන් වැනි පරිච්ඡේදයේ කරනු ලැබූ චර්යා විශ්ලේෂණය මගින් හඳුනා ගත් අධිපතිවාදය, උච්චායම, පරායත්තතාව, බොරුව හා රැවටීම, වැනෙන සුළු බව ආදී වූ ශ්‍රී ලාංකිකයන්ගේ විශේෂ චර්යා ලක්ෂණ සමග ප්‍රජාතන්ත්‍රවාදය එක් පැත්තකින් ප්‍රතිරෝධ ඇති කර ගන්නටත් තවත් පැත්තකින් බද්ධ වන්නටත් විය. ප්‍රතිරෝධය හා බද්ධ වීම ඇතුළත් වූ මේ සංකීර්ණ සමාජ ක්‍රියාවලිය නිසා ප්‍රජාතන්ත්‍රවාදයේ ලේබල් ඇලවූ අපරාධ බිහි විය. ප්‍රජාතන්ත්‍රවාදයේ මුද්‍රාව යෙදූ අසාධාරණය ක්‍රියාවට නැඟිණි. දූෂණය, අවනීතිය හා අයුක්තිය පිටුදැකීම සඳහා ප්‍රජාතන්ත්‍රවාදය යොදා ගනු ලැබීම වෙනුවට එවැනි දුර්ගුණ සහතික කර ගැනීම සඳහා ප්‍රජාතන්ත්‍රවාදය ආශීර්වාදයක් කර ගනු ලැබිණ. මෙහි අවසන් ප්‍රතිඵලය වූයේ ප්‍රජාතන්ත්‍රවාදය නිසා සංයමය හා විනය සහිත ප්‍රජාතාන්ත්‍රික ජන සමාජයක් බිහි වීම වෙනුවට අවිචාර, අශිෂ්ඨ ජන සමාජයක් බිහි වීම ය. ඒ නිසා ම ප්‍රචණ්ඩත්වය, අපරාධ, අසාධාරණය හා දූෂණය ආදී ලක්ෂණ ඉස්මතු වී බෙහෙවින් අසහනකාර ජන සමාජයක් නිර්මාණය වීම ය. එමගින් සමාජ යහපැවැත්ම අතුරුදන් වීම ය. බටහිරින් ලැබුණු ශ්‍රේෂ්ඨ ප්‍රජාතන්ත්‍රවාදය කොතරම් අශිෂ්ඨ ලෙස ශ්‍රී ලාංකිකයෝ ක්‍රියාවට යෙදුවේ ද යත් ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාවට නඟා දශක හතරක් ඉක්ම යාමට ප්‍රථම සමස්ත ජාතිය ම ගොදුරුකර ගත් කැරළි දෙකකටත්, අති බිහිසුණු යුද්ධයකටත් ඔව්හු මුහුණ දුන්හ. දැනුදු මුහුණ දෙමින් සිටිති.

අංක 4.1 රූපය




දියුණු සමාජයක් තුළ සමාජ සහජීවනයත්, ප්‍රජාතන්ත්‍රවාදයත් අතර තිබෙන සම්බන්ධතාව හෙළිකරන අංක 4.1 රූප සටහන දෙස බලන්න. මේ රූපයේ සිරස් අක්ෂයෙන් ප්‍රජාතන්ත්‍රවාදයේ තීව්‍රතාවත්, තිරස් අක්ෂයෙන් සමාජ සහජීවනයේ තීව්‍රතාවත් නියෝජනය කර යි. තිරස් සහ සිරස් අක්ෂ දෙකෙන් ආවරණය වන ක්ෂේත්‍රඵලය Q1 සිට Q 4 දක්වා වූ කුඩා කළාප හතරකට බෙදා වෙන් කර ඇත. දියුණු සමාජයක් තුළ දී ප්‍රජාතන්ත්‍රවාදය හෙවත් මිනිස් අයිතීන් වැඩි වැඩියෙන් තහවුරු වන විට නිර්මාණය විය යුතු ප්‍රතිඵලය වන්නේ වැඩි වැඩියෙන් සමාජ සහජීවනය ද තහවුරු වීම ය. එනම්, Q 1 සිට Q 4 දක්වා තිත් ලකුණු වලින් පෙන්වා ඇති පරිදි රේඛාවක් ඇඳින ලද හොත් එකී ප්‍රදේශය තුළ ප්‍රජාතන්ත්‍රවාදයේ හා සමාජ සහජීවනයේ සමබන්ධතාව ප්‍රදර්ශනය විය යුතු ය. මේ නිසා ප්‍රජාතන්ත්‍රවාදය හා මිනිස් අයිතිවාසිකම් තහවුරු වීමට සාපේක්ෂ ව තර්කානුකූල ව වර්තමාන ශ්‍රී ලංකාව පිහිටිය යුත්තේ Q 4 නම් වූ චතුරශ්‍රයෙන් දැක්වෙන කළාපය තුළ ය. එහෙත් සැබෑ වශයෙන් සිදු වී ඇති තත්වය නම් Q3 කලාපයේ පිහිටා තිබූ අතීත ශ්‍රී ලංකාව වර්තමානය වන විට ගමන් කර ඇත්තේ Q2 කළාපය දක්වා බව ය. එනම්, අඩු සමාජ සහජීවනයක් ප්‍රදර්ශනය කරන කළාපයක් කරා ය. මින් හෙළිදරව් වන්නේ ප්‍රජාතන්ත්‍රවාදය මනුෂ්‍යයන්ගේ යහපැවැත්ම හීන කරන බව නො වේ. ඉන් කියැවෙන්නේ එක්කෝ සැබෑ ප්‍රජාතන්ත්‍රවාදයක් ශ්‍රී

ලංකාව තුළ නො මැති බව ය. නැතහොත් ප්‍රජාතන්ත්‍රවාදය ශ්‍රී ලංකාවට නො ගැළපෙන බව ය. ප්‍රජාතන්ත්‍රවාදයේ තීව්‍රතාව ප්‍රකාශ කරන සිරස් අක්ෂයෙන් නියෝජනය වන්නේ නාමික ප්‍රජාතන්ත්‍රවාදයක් නම් සමාජ යහපැවැත්ම ඊට ප්‍රතිචාර දක්වන්නේ නැත. ප්‍රජාතන්ත්‍රවාදයක් ඇතැයි කීව ද, යථාර්ථය එය නො වන්නේ නම්, යථාර්ථයේ තිබෙන්නා වූ ප්‍රජාතන්ත්‍රවාදයේ සැබෑ ස්වභාවයට අනුව සමාජ යහපැවැත්ම ද නිශ්චය වන්නේ ය.

> බටහිරින් ලැබුණු ශ්‍රේෂ්ඨ ප්‍රජාතන්ත්‍රවාදය කොතරම් අශිෂ්ඨ ලෙස ශ්‍රී ලාංකිකයෝ ක්‍රියාවට යෙදුවේ ද යත් ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාවට නඟා දශක හතරක් ඉක්ම යාමට ප්‍රථම සමස්ත ජාතිය ම ගොදුරුකර ගත් කැරලි දෙකකටත්, අති බිහිසුණු යුද්ධයකටත් ඔවුහු මුහුණ දුන්හ. දැනුදු මුහුණ දෙමින් සිටිති.

ප්‍රජාතන්ත්‍රවාදය දියුණු සමාජවලට ලබා දෙන ප්‍රතිඵල ඒ ලෙසින් ම, නො දියුණු සමාජවලට ලබා නො දෙන බවට ද මතයක් තිබේ. ඇතැම් අප්‍රිකානු වියතුන් එළිපිට ම ප්‍රකාශ කරන්නේ බටහිරින් ලැබුණු ප්‍රජාතන්ත්‍රවාදය ඔවුනට නො ගැළපෙන බවත්, ඒකාධිපතිත්වය හෝ අධිකාරමය පාලනය ඔවුනට වඩා සුදුසු බවත් ය. මේ අදහසෙහි පිහිටා සමාජ යහපැවැත්මෙහි බිඳ වැටීම විස්තර කරනු ලැබුව හොත් ශ්‍රී ලංකාව ද ඇතුළත් වන්නේ නො දියුණු සමාජයකට ය. මන්ද? මිනිස් අයිතිය තහවුරු කිරීමකට වඩා මිනිස් අයිතිය කෙළෙසීමෙන් යහපැවැත්ම තහවුරු කළ හැකි සමාජයක් අප සතු වන බැවිනි. කරුණු කවරක් වුව ද පිටතට නිරාවරණය වී ඇති බොහෝ වර්තමාන සමාජවල යහපැවැත්ම බිඳ වැටෙන්නේ එක්කෝ දුර්වල ප්‍රජාතන්ත්‍රවාදය නිසා ය. නැත හොත් නිරාවරණය වී ඇති නමුත් තවමත් සමාජය නො දියුණු මට්ටමක පවතින නිසා ය. (පැරණි ශ්‍රී ලංකාවේ සමාජ යහපැවැත්ම පැවතියේ මේ කරුණු දෙක ම නිසා නො ව වෙනත් හේතූන් නිසා බව මේ පරිච්ඡේදය ආරම්භයේ දී සඳහන් කළා පාඨකයාට මතක ඇතැයි සිතමි.) මේ හේතු දෙක එකිනෙකට සම්බන්ධ ය. කවර හේතුවක් වර්තමාන ශ්‍රී ලංකාවේ තත්වයට මුල් වන්නට ඇත්ද යන්න නිශ්චය කිරීම පාඨකයාට භාර ය. කතුවරයාගේ පුද්ගලික අවබෝධය අනුව මේ හේතු දෙක ම අඩු වැඩි වශයෙන් ශ්‍රී ලංකාවේ සමාජයේ යහපැවැත්ම බිඳ හෙළීමට හේතු වී ඇත. එහෙත්

ඉන් වඩාත් වැදගත් හේතුව වන්නේ ශ්‍රී ලාංකිකයන්ට සැබෑ ප්‍රජාතන්ත්‍රවාදයක් නො තිබීම ය. ප්‍රජාතන්ත්‍රවාදයත්, යුක්තියක්, සාධාරණයත් සඳහා කෙරෙන නිරන්තර අරගලයක් දක්නට තිබෙන්නේ එබැවිනි.

> ආත්මාර්ථය හා බල ලෝභය අරමුණු කොට ක්‍රියාවට නැගුණු නාමික ප්‍රජාතන්ත්‍රවාදය නිසා මෙ රට නිර්මාණය වූ විවිධ සමාජ, ආර්ථික, දේශපාලන හා වර්ගවාදී ගැටලුවලින් කියැවෙන්නේ ප්‍රජාතන්ත්‍රවාදය නම් වූ සංකල්පයේ වැරැද්දක් නො වේ. ශ්‍රී ලාංකිකයන්ගේ අශිෂ්ඨවූත්, අවිනීත වූත් චර්යාවන් ගේ වැරැද්ද ය.

ආත්මාර්ථය හා බල ලෝභය අරමුණු කොට ක්‍රියාවට නැගුණු නාමික ප්‍රජාතන්ත්‍රවාදය නිසා මෙ රට නිර්මාණය වූ විවිධ සමාජ, ආර්ථික, දේශපාලන හා වර්ගවාදී ගැටලුවලින් කියැවෙන්නේ ප්‍රජාතන්ත්‍රවාදය නම් වූ සංකල්පයේ වැරැද්දක් නො වේ. ශ්‍රී ලාංකිකයන්ගේ අශිෂ්ඨවූත්, අවිනීත වූත් චර්යාවන් ගේ වැරැද්ද ය. එහෙත් ශ්‍රී ලාංකිකයෝ අශිෂ්ඨ වූ චර්යාවක් තමන් තුළ ඇතැයි පිළිගැනීමට නො කැමැත්තෝ ය. එමෙන් ම නිදහසින් පසු ව බිහි වූ සමාජ, ආර්ථික හා දේශපාලන ගැටලුවලට තමන් වග කිව යුතු යැයි පිළිගැනීමට ද නො කැමැත්තෝ ය. මේ නිසා ශ්‍රී ලාංකිකයන් තමන් විසින් ම නිර්මාණය කර ගත් ගැටලුවල වග උත්තර කරුවන් වශයෙන් සුද්දන් හා උන්ගේ මෙවලම් නම් කිරීමටත්, ගැලවුම් කාරයන් ලෙස මානව නිදහස හා අයිතිය කෙලෙසූ පැරණි සමාජ මෙවලම් හා වටිනාකම් නම් කිරීමටත් පෙළඹී සිටී. සුද්දන් හඳුන්වා දුන් මෙවලම් සමාජ පරිහානියේ හේතූන් බවට පත් වී ඇත්තේත්, ප්‍රජාතන්ත්‍ර විරෝධී පැරණි සමාජ මෙවලම්වලට ආරෝපිත වටිනාකමක් ලැබී ඇත්තේත් මෙහි ප්‍රතිඵලයක් වශයෙනි.

## පැරණි සමාජ මෙවලම් හුවා දක්වන අතුරු තර්ක

නූතන සමාජ මෙවලම්වලට සාපේක්ෂ ව පැරණි සමාජ මෙවලම්වල ශ්‍රේෂ්ඨත්වය හුවා දක්වන තර්ක බොහෝ ය. එහෙත් මෙම තර්ක සටන් පාඨ වශයෙන් සිත් ගන්නා සුලු නමුත් කරුණුමය වශයෙන් සනාථ කළ හැකි ඒවා නො වේ. ඇතැමුන් කියන්නේ ශතවර්ෂ විස්සකටත් වඩා වැඩි කාලයක් මෙ රට වැසියන් පාලනය වූ දේශීය නීති පද්ධතියක් තිබූ බවත් ඒ නීති පද්ධතිය නිසා සමාජ යහපැවැත්ම තහවුරු ව පැවති බවත් ය. බටහිරින් පැමිණි රෝම ලන්දේසි නීතිය

හා ඉංග්‍රිසි නීතිය මගින් මෙකී දේශීය නීති පද්ධතිය යටපත් වූ බවට ද තර්ක කරනු ලැබේ.

- පැරණි සමාජ මෙවලම් නුවා දැක්වෙන මත වාදයට පක්ෂ ව ඉදිරිපත් කෙරෙන බොහෝ ප්‍රකාශන සාක්ෂි හෝ සාධක මගින් සනාථ කළ නො හැකි ය. බොහෝ දෙනෙකු එක ම ප්‍රකාශයක්, එක ම ආකාරයකින් නැවත නැවතත් කීම නිසා ඒවා තුළ ප්‍රචාරණමය වශයෙන් සහතික වූ වලංගු භාවයක් ඇති වී තිබෙන බව පෙනේ. ප්‍රචාරණමය වශයෙන් සහතික වී ඇති කරුණුවල සත්‍යාසත්‍යතාව විමසා බැලීම සඳහා කිසිවෙකු ගවේෂණමය උත්සාහයක් දරන්නේ නැත.

- සිංහලයන්, ඔවුන් විසින් ම හඳුන්වා ගනු ලබන විස්තරයට අනු ව ඔව්හු හොඳ බෞද්ධයෝ ය. අවුරුදු දහස් ගණනක් නො බිඳී පවතින්නා වූ ශ්‍රේෂ්ඨ බෞද්ධ සංස්කෘතියක් දායාද කර ගත් උරුමක්කාරයෝ ය. ලෝකයේ නිර්මල බුදු දහම තිබෙන්නේ සිංහල බෞද්ධයන් තුළ පමණ ය. දෙමාපියෝ දරුවන්ට ද, දරුවෝ දෙමාපියන්ට ද, අසල්වැසියන් අනෙකුත් අසල්වැසියන්ට ද ගරු කරති. යුතුකම් ඉටු කරති. ඉදින්, මේ සමාජ යහපැවැත්ම තව දුරටත් ආරක්ෂා කළ යුතු ය. බටහිරින් එන උවදුරුවලින් රටත්, ජනතාවත් බේරා ගත යුතු ය. මන්ද? බටහිර ඇත්තෝ අසංවර ය. අශීලාචාර ය. නිතර නිතර දික්කසාද වෙති. දරුවෝ දෙමාපියන් දෙස ද, දෙමාපියන් දරුවන් දෙස ද නො බලා සිටිති. මහලු දෙමාපියන් අනාථ මඩම්වල ය. බටහිර වාසීහු ඔවුනොවුන් මරා ගනිති. උන් අතර ස්ත්‍රී දූෂණ අධික ය. අපරාධ අධික ය. හොරකම් අධික ය. වංචාව අධික ය. ඉදින්, අප උන් ගෙන් ප්‍රවේශම් විය යුතු ය

රෝම ලන්දේසි නීතිය හා ඉංග්‍රිසි නීතියේ බලපෑම නිසා මෙ රට යම් නීතියක් තිබුණා නම් එය යටපත් වී ඇති බව ඉතා පැහැදිලි ය. මන්ද? වර්තමාන ජනතාව මූලික වශයෙන් පාලනය වන්නේ රෝම ලන්දේසි නීති හා ඉංග්‍රිසි නීතියේ පදනම මත මිස දේශීය නීතියක් මත නො වන බැවිනි. එහෙත් බටහිර ජාතීන් මෙහි පැමිණෙන විට යටපත් කර දැමීමට තරම් ප්‍රමාණවත් දේශීය නීති පද්ධතියක් මෙ රට නො තිබූ බව ද ඉතාමත් පැහැදිලි ය. ශ්‍රී ලාංකිකයන් කවර දිනෙකවත් ප්‍රමාණවත් නීති පද්ධතියකින් පාලනය වූ බවට කිසිදු ඓතිහාසික සාධකයක් නැත. ශ්‍රී ලංකා ඉතිහාසයේ බොහෝ නීති රීතිවල පදනම සම්ප්‍රදාය හෝ රජුගේ කැමැත්ත ය. ඇතැම් රාජාණ්ඩු කාලවල දී බදු අය කිරීම්, දඩ ක්‍රම, අන්තාණි ප්‍රදාන සහ වෙළඳපළ කටයුතු සම්බන්ධ ව පනවා තිබෙන නියෝග අනුව යම් යම් නීති තිබූ බවට

ප්‍රමාණවත් ඓතිහාසික සාක්ෂි තිබේ. සෙල් ලිපි, ටැම් ලිපි, සන්නස් ආදිය මේ නීති රීතිවලට උදාහරණ ය. එහෙත් ඒ නීති රීති වර්තමාන නීති රීතිවලට වඩා ඉහළ මට්ටමක ඒවා යයි කීම අතිශයෝක්තියකින් ඉතිහාසයේ ශ්‍රේෂ්ඨත්වය හුවාදැක්වීමක් මිස සත්‍ය තත්ත්වය නො වේ.

ඇතැම් සිංහල රාජ්‍ය පාලකයන්ගේ පාලන වකවානු තුළ යම් යම් පිළිගත් නීති තිබුණත් තවත් රාජ්‍ය පාලකයන්ගේ පාලන වකවානු තුළ කිසිදු නීතියක් රීතියක් මත කටයුතු සිදු වූයේ නැත. උදාහරණ වශයෙන් දෙවැනි රාජසිංහ රජු දවස පැවති නීතිය ගැන රොබට් නොක්ස් කියන්නේ මෙසේ ය. "hear are no Laws, but the will of the King, and whatfoever proceeds out of his mouth is an immutable Law" රජුගේ කැමැත්ත හැරුණු විට නීතිය යයි කියා යමක් මෙහි නැත. රජුගේ මුවින් නික්මෙන්නේ යමක් ද එය නිත්‍ය වශයෙන් ම නීතිය වන්නේ ය " (knox, 1681, P 101). ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු දවස පැවති නීතිය පිළිබඳ ව ජර්මන් ජාතික හයිඩ් වාර්තා කරන්නේ මෙසේ ය. "They have no other laws but the will of the King, who when he orders anything, must be obeyed by everyone without any demur" "රජතුමාගේ කැමැත්ත විනා වෙනත් නීතියක් මොවුනට නැත. විරෝධතාවකින් තොර ව සියල්ලෝ ම රජුගේ අණ පිළිපැදිය යුතු වේ" (Hydts 1744 p.128).

පැරණි සමාජ මෙවලම් හුවා දැක්වෙන මත වාදයට පක්ෂ ව ඉදිරිපත් කෙරෙන බොහෝ ප්‍රකාශන සාක්ෂි හෝ සාධක මගින් සනාථ කළ නො හැකි ය. ඒවා සැලකිය හැක්කේ කිසියම් දෘෂ්ඨි වාදයක ප්‍රකාශන වශයෙන් මිස ගවේෂණය කොට තහවුරු කළ හැකි කරුණු වශයෙන් නො වේ. බොහෝ දෙනෙකු එක ම ප්‍රකාශයක්, එක ම ආකාරයකින් නැවත නැවතත් කීම නිසා ඒවා තුළ ප්‍රචාරණමය වශයෙන් සහතික වූ වලංගු භාවයක් ඇති වී තිබෙන බව පෙනේ. ප්‍රචාරණමය වශයෙන් සහතික වී ඇති කරුණුවල සත්‍යාසත්‍යතාව විමසා බැලීම සඳහා කිසිවෙකු ගවේෂණමය උත්සාහයක් දරන්නේ නැත. එබැවින් මෙකී දෘෂ්ඨිවාදයේ ප්‍රකාශවලට ඇත්තේ ව්‍යවහාරමය වශයෙන් පිළිගත්

සත්‍යතාවක් මිස ගවේෂණය කොට සනාථ කළ හැකි ආකාරයේ සත්‍යතාවක් නො වන බව නැවතත් කිව යුතු ය. මඩ සේදූ කළ ගොවියෙකුට රජ විය හැකි ය යන ප්‍රකාශය ගවේෂණය කොට බැලූ විට මුළුමනින් ම අසත්‍යයක් වන නමුත් ව්‍යවහාරමය වශයෙන් එය සත්‍යයක් ලෙස ශ්‍රී ලාංකිකයන් පිළිගෙන තිබෙන්නාක් මෙනි.

ශ්‍රී ලාංකික ජනතාව යනු කවිරු ද යන්න පිළිබඳ ව මත වාදයක් ගොඩ නඟමින් සිටින ඉහත කී දෘෂ්ඨි වාදීන්ට අනුව ශ්‍රී ලාංකිකයෝ අනුන්ට ගරු කරන මිනිස්සු ය. අතිශයින් ශීලාචාර සම්පන්න ය. කතාවේ දී ත්, ක්‍රියාවේ දී ත් ගුණ ගරුක ය. විනය හඳුනති. වංචා නො කරති. බොරු නො කියති. අනුන් ඝාතනය කරන, වනසන කාර්යයක නිරත නො වෙති. එසේ වන්නේ නම් ඒ ඉතාමත් කලාතුරකිනි. බටහිර ජාතීන් සමඟ සසඳා බලන කළ එය නො සැලකිය යුතු තරම් ය. සිංහලයෝ හොඳ බෞද්ධයෝ ය. අවුරුදු දහස් ගණනක් නො බිඳී පවතින්නා වූ ශ්‍රේෂ්ඨ බෞද්ධ සංස්කෘතියක් දායාද කර ගත් උරුමක්කාරයෝ ය. දෙමාපියෝ දරුවන්ට ද, දරුවෝ දෙමාපියන්ට ද, අසල්වැසියන් අනෙකුත් අසල්වැසියන්ට ද ගරු කරති. යුතුකම් ඉටු කරති. ඉදින්, මේ සමාජ යහපැවැත්ම තව දුරටත් ආරක්ෂා කළ යුතු ය. බටහිරින් එන උවදුරුවලින් රටත්, ජනතාවත් බේරා ගත යුතු ය. මන්ද? බටහිර ඇත්තෝ අසංවර ය. අශීලාචාර ය. නිතර නිතර දික්කසාද වෙති. දරුවෝ දෙමාපියන් දෙස ද, දෙමාපියන් දරුවන් දෙස ද නො බලා සිටිති. මහලු දෙමාපියන් අනාථ මඩම්වල ය. බටහිර වාසීහු ඔවුනොවුන් මරා ගනිති. උන් අතර ස්ත්‍රී දූෂණ අධික ය. අපරාධ අධික ය. හොරකම් අධික ය. වංචාව අධික ය. ඉදින්, අප උන් ගෙන් ප්‍රවේශම් විය යුතු ය. කෙසේ වුව ද, අපට ද ප්‍රශ්න නැත්තේ යයි අපි නො කියමු. අපට බටහිර එවුන්ට තරම් ආහාර නැත. ඇඳුම් පැළඳුම් නැත. ගෙවල් දොරවල්, යාන වාහන නැත. ඉඩ පහසුකම් නැත. ස්වභාවික සම්පත් හිඟ ය. ලොකු කර්මාන්ත නැත. තාක්ෂණය ද දුර්වල බව පිළි ගනිමු. එබැවින් මේවා දියුණු කර ගත හොත් අනෙක් ඒවා දැනටමත් තිබෙන නිසා අපට නිවී සැනසිල්ලේ ජීවත් විය හැකි ය. ඝාතනය, දූෂණය, අසංවරකම බටහිරින් එන ඒවා ය. ඒවා අපට ඉගැන්වූවෝ බටහිර ජාතීහු ය. උන්ගේ සංස්කෘතියත්, තාක්ෂණයත්, අධ්‍යාපනයත් නිසා අපගේ හොඳ ගති පැවතුම් විනාශ වී ගොස් ඇත.

පැරණි සමාජ මෙවලම් හුවා දක්වන ඉහත කී දෘෂ්ඨිවාදයෙන් කෙරෙන්නේ පැකේජයක් වශයෙන් නැතහොත් පොදියක් වශයෙන් පැරණි මෙවලම් හුවා දැක්වීමත් බටහිර ආභාෂය ගර්හා කිරීමත් ය. එහෙත් ඉතා පරීක්ෂාවෙන් සලකා බැලුවහොත් මනුෂ්‍ය කොට්ඨාශයක් වන බටහිර ජාතීන් තුල මෙන් ම ශ්‍රී ලාංකිකයින් තුල ද ශිෂ්ඨ සමාජ විසින් පිළිගනු ලැබූ හොඳ මෙන් ම නරක ද ඇත. කතුවරයාගේ අත්දැකීම අනුව තවෙකෙකුට ගරු කිරීම, තවෙකෙකු අගය කිරීම, ගුණ ගරුක බව, සත්‍යවාදී බව, විනයානුකූල බව, අවංක බව ආදී වූ දහසකුත් එකක් ගුණාංගයන් අතින් පොදුවේ ගත් විට බටහිර ජාතීහු ශ්‍රී ලාංකිකයන්ට වඩා බොහෝ ඉදිරියෙන් සිටී. මෙකී ලක්ෂණ නිර්ණායක ලෙස සලකා ශ්‍රී ලාංකිකයන් බටහිර ජාතීන් සමඟ සසැඳුවහොත් ශ්‍රී ලාංකිකයෝ බෙහෙවින් අශිෂ්ඨ මිනිසුන් ය. ශ්‍රී ලාංකිකයෝ භෞතික සම්පත් අතින් බටහිර ජාතීන්ට වඩා පසු පසින් සිටිනවා පමණක් නො වේ. ඔව්හු ඉහත කී ගුණාංග සම්බන්ධයෙන් බලන විට භෞතික සම්පත්වලටත් වඩා බොහෝ පසු පසින් සිටී. ශ්‍රී ලාංකිකයන් දෘෂ්ඨී මායාවකට හසු ව සත්‍ය උඩු යටිකුරු කොට බලන බවක් පෙනේ.

පැරණි සමාජ වටිනාකම් හා මෙවලම් හුවා දක්වන මත වාදයට පක්ෂ ව ඉදිරිපත් කරන බොහෝ විශේෂිත වූ තර්ක ඇතත් ඒවා පිළිබඳ ව සාකච්ජා කිරීම නිෂ්ප්‍රයෝජන කටයුත්ත කි. මක් නිසා ද? ප්‍රධාන හේතු තුනක් නිසා ය. ඉන් පළමුවැන්න, ඓතිහාසික සමාජ ආර්ථික මෙවලම් මිනිස් අයිතිය, සමානාත්මතාව හෝ ප්‍රජාතාන්ත්‍රික සාර ධර්ම මත ගොඩ නැඟී නැති නිසා ය. දෙවැන්න පැරණි මෙවලම් තහවුරු කිරීම සඳහා ඉදිරිපත් කරන තර්ක හුදෙක් භාවමය වශයෙන් හැඟීම් දනවන නමුත් කරුණුමය වශයෙන් සාධනය කළ නො හැකි නිසා ය. තුන්වැන්න එම තර්ක සාධනය කළ හැකි ඒවා යයි සිතුව ද පැරණි සමාජ වටිනාකම් නැවත ස්ථාපිත කිරීමට උවමනා වන සමාජ ආර්ථික රාමුව අංශු මාත්‍රයකින් හෝ නැවත ඇති කළ නො හැකි නිසා ය.

ශ්‍රී ලාංකික සමාජයට පැරණි යුගවල පැවති තත්ත්වයට නැවත යා නො හැකි ය. ගැමියන්ට උවමනා කැම්, බීම්, කෘෂි උපකරණ, බේත් හේත් ආදී සියල්ල තමා විසින් ම නිපදවා ගනු ලැබූ ස්වයංපෝෂිත ගැමි ආර්ථිකයක් නැවත ඇති කළ නො හැකි ය. ස්වයංපෝෂිත ආර්ථිකයේ ලක්ෂණ වූ කයිය, මාරු උදව්ව හෝ අත්තම ආදී වූ නිෂ්පාදන මෙවලම් පිළිබඳ ව තව දුරටත් බලාපොරොත්තු තැබිය නො හැකි ය. කිසිදු විරැකියාවක් නො තිබුණු පියාගෙන් පුතුට උරුම වූ සේවා නියුක්ති ක්‍රමයකට නැවත යා නො හැකි ය. උරුමය, කරුමය, දෛවය, කුලය, ලේ උරුමය ආදී වූ එකල පැවති විශ්වාස හා වටිනාකම් එකල පැවති පරිද්දෙන් ම නැවත තහවුරු කළ නො හැකි ය. වෘත්තීය සමිති, සේවක උද්ඝෝෂණ, පිකටිං, වැඩ වැරීම්, පෙළපාලි නො තිබූ රජුගේ කැමැත්ත නීතිය යයි සැලකූ ඒකාධිපති යුගයකට නැවත යා නො හැකි ය. මිනිස් අයිතිය දෙවැනි කොට ජාති අයිතිය, ගෝත්‍ර අයිතිය, කුල අයිතිය ප්‍රමුඛ කොට ගත් ආවෘත සමාජයකට නැවත යා නො හැකි ය. ඉතුරුම්, ආයෝජනය, පොලිය, තරඟකාරී ව්‍යාපාර, සමපේක්ෂණය ආදී වූ ආර්ථික කරුණු ද, සමස්ත වශයෙන් බලපාන්නා වූ ගෝලීයකරණය මත ද චලනය වන වර්තමාන ආර්ථිකය, භාණ්ඩ හුවමාරුව සහිත සරල ආර්ථිකයක් බවට නැවත පරිවර්තනය කළ නො හැකි ය. කෙටියෙන් ම කිවහොත් මේ සියල්ල යල් පිනූ සමාජ ආර්ථික තත්ත්ව ය. නැතහොත් ප්‍රායෝගික නො වන්නා වූ සමාජ ආර්ථික මෙවලම් ය. මේ නිසා යල් පිනූ සමාජ ආර්ථික මෙවලම් මත පැවති පැරණි වටිනාකම් දෙස නැවත හැරී බැලිය යුතු ය යන මත වාදය හුදෙක් ආවේග දනවන සටන් පාඨයක් ම වනවා විනා ක්‍රියාදාමයක් බවට පරිවර්තනය කළ හැකි අර්ථාන්විත සංකල්පයක් නො වන්නේ ය.

ඉපැරණි සමාජ ආර්ථික මෙවලම් කොතෙක් හුවා දැක්වුව ද වර්තමාන ශ්‍රී ලාංකික සමාජයට පැරණි යුගවල පැවති තත්ත්වයට නැවත යා නො හැකි ය. ගැමියන්ට උවමනා කැම්, බීම්, කෘෂි උපකරණ, බේත් හේත් ආදී සියල්ල තමා විසින් ම නිපදවා ගනු ලැබූ ස්වයංපෝෂිත ගැමි ආර්ථිකයක් නැවත ඇති කළ නො හැකි ය. ස්වයංපෝෂිත ආර්ථිකයේ ලක්ෂණ වූ කයිය, මාරු උදව්ව හෝ අත්තම ආදී වූ නිෂ්පාදන මෙවලම් පිළිබඳ ව තව දුරටත් බලාපොරොත්තු තැබිය නො හැකි ය. කිසිදු විරැකියාවක් නො තිබුණු පියාගෙන් පුතුට උරුම වූ සේවා නියුක්ති ක්‍රමයකට නැවත යා නො හැකි ය. උරුමය, කරුමය, දෛවය, කුලය, ලේ උරුමය ආදී වූ එකල පැවති විශ්වාස හා වටිනාකම් එකල පැවති පරිද්දෙන් ම නැවත තහවුරු කළ නො හැකි ය. වෘත්තීය සමිති, සේවක උද්ඝෝෂණ, පිකටිං, වැඩ වැරීම්, පෙළපාලි නො තිබූ රජුගේ කැමැත්ත නීතිය යයි සැලකූ ඒකාධිපති

යුගයකට නැවත යා නො හැකි ය. මිනිස් අයිතිය දෙවැනි කොට ජාති අයිතිය, ගෝත්‍ර අයිතිය, කුල අයිතිය ප්‍රමුඛ කොට ගත් ආවෘත සමාජයකට නැවත යා නො හැකි ය. ඉතුරුම්, ආයෝජනය, පොළිය, තරඟකාරී ව්‍යාපාර, සමපේක්ෂණය ආදී වූ ආර්ථික කරුණු ද, සමස්ත වශයෙන් බලපාන්නා වූ ගෝලීයකරණය මත ද චලනය වන වර්තමාන ආර්ථිකය, භාණ්ඩ හුවමාරුව සහිත සරල ආර්ථිකයක් බවට නැවත පරිවර්තනය කළ නො හැකි ය. කෙටියෙන් ම කිවහොත් මේ සියල්ල යල් පිනූ සමාජ ආර්ථික තත්ත්වයන් ය. නැතහොත් ප්‍රායෝගික නො වන්නා වූ සමාජ ආර්ථික මෙවලම් ය. මේ නිසා යල් පිනූ සමාජ ආර්ථික මෙවලම් මත පැවති පැරණි වටිනාකම් දෙස නැවත හැරී බැලිය යුතු ය යන මත වාදය හුදෙක් ආවේග දනවන සටන් පාඨයක් ම වනවා විනා ක්‍රියාදාමයක් බවට පරිවර්තනය කළ හැකි අර්ථාන්විත සංකල්පයක් නො වන්නේ ය.

මෙතෙක් සාකච්ඡාවට ගත් තොරතුරු, තර්ක, විතර්ක හා මත වාද මගින් හෙළිදරව් වූ ප්‍රධාන කරුණු සංක්ෂිප්ත ව ගොනු කරනු ලැබුව හොත් ඒ මෙසේ ය. ඉන් පළමුවැන්න වන්නේ නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ඇති වූ සමාජ ආර්ථික බිඳ වැටීම පිළිබඳ ව ශ්‍රී ලාංකිකයන් ඍජු ලෙස ම වගකීම භාර ගත යුතු බව ය. දෙවැන්න, සුද්දන් හඳුන්වා දුන් ප්‍රජාතන්ත්‍රවාදය සහ නීතිය ආදී වූ මෙවලම් සමාජ ආර්ථික බිඳ වැටීමේ වගකිව යුතු සාධකයන් නො වන බව ය. තුන්වැන්න, සමාජ ආර්ථික ප්‍රතිෂ්ඨාපනයක් සඳහා වර්තමාන ජන සමාජයේ චර්යාව වෙනස් කළ යුතු නමුත් ඒ සඳහා පැරණි සමාජ මෙවලම් හා වටිනාකම් නැවත යොදා ගත නො හැකි බව ය. සිව්වැන්න, ආර්ථික සංවර්ධනය හා සමාජ සහපැවැත්ම තහවුරු කර ගැනීම සඳහා ශ්‍රී ලාංකිකයන් කළ යුත්තේ බැහැරින් පැමිණි ප්‍රජාතන්ත්‍රවාදය, නීතිය ආදී වූ නව මෙවලම් සැබෑ ලෙස ක්‍රියාවට නැගීම මිස සුද්දන්ට අවලාද නැගීම නො වන බව ය.

## සුද්දන්ගේ අසද් භාවය හා වෙස්වලා ගත් ආශීර්වාදය

මේ සාකච්ඡාව තුළ දී අවධාරණය කළ යුතු තවත් විශේෂ කරුණක් වෙයි. එනම්, නිහදසින් පසු ව මෙ රට සිදු වූ සමාජ යහපැවැත්මේ බිඳ වැටීම සඳහා ශ්‍රී ලාංකිකයන් ඍජු ලෙස ම වග කිව යුතු යැයි කීම

නිසා සුද්දන්ගේ සද්භාවයක් පිළිබඳ ව ඉන් නො කියවෙන බව යි. සුද්දන් මෙරට සමාජ ආර්ථික පරිවර්තනයක් ඇති කළේ ඔවුන් තුළ සැබෑ මානව දයාවක් තිබූ නිසා වත්, පරාර්ථකාමිත්වයක් තිබූ නිසා වත් නො වේ. ඓතිහාසික තොරතුරුවලින් හෙළි වන පරිදි යටත් විජිත වාදීහු වචනයේ පරිසමාප්ත අර්ථයෙන් ම විජිතයන් යටත් ව තබා ගැනීමේ මානසිකත්වයකින් යුක්ත වූවෝ වූ හ.

ශ්‍රී ලංකාව යටත් භාවයට පත් කර ගත් පෘතුගීසි, ලන්දේසි හා ඉංග්‍රීසිහු මර්ධනකාරී වූ හ. ආත්මාර්ථකාමී විය. ඇතුළතින් මෙන් ම මතු පිටින් ද සූරාකෑමේ අරමුණු ඇත්තෝ වූ හ (අයිවන් 1999). ඔව්හු ස්වදේශීන්ගෙන් පාලනය උදුරා ගත් හ. ස්වදේශීන් සිර කර තැබීමෙන් විවිධාකාර අඩම්තේට්ටම්වලට ලක් කිරීමෙන්, මරා දැමීමෙන් මර්ධනය කළ හ. දේශීය සම්පත් උන්ගේ ජන්ම භූමි වලට පිටත් කර යැවූ හ. සුද්දන් උන්ගේ ආත්මාර්ථකාමී අරමුණු ඉටු කර ගැනීම සඳහා මෙරට ස්ථාපිත ව පැවති වැඩවසම් නිෂ්පාදන ක්‍රමය, අධිපතිවාදී පාලන ක්‍රමය හා ස්වයංපෝෂිත ආර්ථික ක්‍රමය උඩු යටිකුරු කළ හ. පිය පුතු සම්බන්ධතාව මත පැවති වැඩවසම් නිෂ්පාදන ක්‍රමය වෙනස් කොට නිදහස් ශ්‍රම සංචලතාව මත නිෂ්පාදනය හැසිරවීමෙන් නිෂ්පාදනයට වානිජ පදනමක් ලබා දීම සුද්දන්ගේ එක් අරමුණක් විය. කුලය, ලේ උරුමය මත පැවති අධිපති වාදී ජන සමාජය වෙනස් කොට ඡන්ද බලය හඳුන්වා දීමෙන් ලේ උරුමක්කාර අධිපති පංතිය මට්ටු කිරීම හා වෙනස් වන ලොවට ගැළපෙන පරිදි යටත් විජිත වාදය වඩා මට සිළුටු ස්වභාවයකින් දිගු කල් පවත්වා ගෙන යාම තවත් අරමුණක් විය. එමෙන් ම භාණ්ඩ හුවමාරුව මත පැවති ස්වයංපෝෂිත ආර්ථිකය වෙනස් කොට වානිජ ආර්ථිකය හඳුන්වා දීමෙන් ජාත්‍යන්තර වෙළඳ පොළ හරහා වැඩි වැඩියෙන් ධනය හා ලාභ රැස් කිරීම තවත් අරමුණක් විය. සුද්දන්ගේ පරමාර්ථ කුමක් වුව ද, උන්ගේ පරිවර්තන නිසා ශ්‍රී ලාංකිකයන් වෙත ලැබුණු අනුපමේය ප්‍රතිලාභයන් දෙක කි. ඉන් පළමුවැන්න අසමානාත්මතාවේ පදනම වූ කුලය හා ලේ උරුමය අවලංගු වීම යි. මෙම ප්‍රතිලාභය ඉතාමත් සුවිශේෂ ය. මන්ද? ශ්‍රී ලාංකිකයන්ගේ චර්යාව සමඟ සසඳන කළ සුද්දන් නො වන්නට, සුද්දන් ගේ බලපෑම නො වන්නට ස්ව කැමැත්තෙන් නම් මෙවැනි පරිවර්තනයක් කිසි විටෙකත්

බලාපොරොත්තු විය නො හැකි බැවිනි. දෙවැන්න සුද්දන් රැගෙන ආ පරිවර්තනය සමග ශ්‍රී ලාංකිකයන් අතට පත් වූ ප්‍රගතිශීලී මෙවලම් පොදිය යි. මෙකී මෙවලම් පොදියට ප්‍රජාතන්ත්‍රවාදය, මානව නිදහස, අධ්‍යාපනය, තාක්ෂණය, ශිල්ප ක්‍රම හා නීතිය ආදී වූ අංග ඇතුළත් ව තිබීම ශ්‍රී ලාංකිකයන් ලැබූ විශේෂ ප්‍රතිලාභයන් සේ සැලකිය හැකි ය.

> යටත්විජිතවාදීහු ස්වදේශීන්ගෙන් පාලනය උදුරා ගත් හ. ස්වදේශීන් සිර කර තැබීමෙන් විවිධාකාර අඩම්තේට්ටම්වලට ලක් කිරීමෙන්, මරා දැමීමෙන් මර්ධනය කළ හ. දේශීය සම්පත් උන්ගේ ජන්ම භූමි වලට පිටත් කර යැවූ හ. උන්ගේ ආත්මාර්ථකාමී අරමුණු ඉටු කර ගැනීම සඳහා මෙරට ස්ථාපිත ව පැවති වැඩවසම් නිෂ්පාදන ක්‍රමය, අධිපතිවාදී පාලන ක්‍රමය හා ස්වයංපෝෂිත ආර්ථික ක්‍රමය උඩු යටිකුරු කළ හ.

අප මෙතෙක් සාකච්ඡා කරමින් සිටියේ සමාජ චර්යාව වෙනස් කිරීමේ දිසාව නිශ්චය කිරීම පිළිබඳ ව ඉදිරිපත් ව ඇති ප්‍රධාන මත වාද දෙකෙන් පළමුවැන්න වූ පැරණි සමාජ වටිනාකම් නැවත තහවුරු කළ යුතු ය යන මත වාදය සම්බන්ධ ව යි. මෙම සාකච්ඡාව තුළ දී ඉතා පැහැදිලි ව හෙළිදරව් වූයේ පැරණි වටිනාකම් නැවත තහවුරු කිරීම යන මත වාදය හුදෙක් මතයක් ම වනවා විනා ක්‍රියාවට නැඟිය හැකි සංකල්පයක් නො වන බව යි. ජන සමාජයේ චර්යාව වෙනස් කිරීම පිළිබඳ අනෙක් ප්‍රධාන මත වාදයෙන් කියැවෙන්නේ බටහිර ජාතීන් හරහා ශ්‍රී ලාංකිකයන් වෙත ට පැමිණි ප්‍රගතිශීලී මෙවලම් පොදිය එනම්, ප්‍රජාතන්ත්‍රවාදය, නීතිය, මානව නිදහස, අධ්‍යාපනය, තාක්ෂණය, ශිල්ප ක්‍රම, ආදිය සැබෑ ලෙස ද, නිසි ලෙස ද ක්‍රියාවට නැංවීමෙන් ආර්ථික සංවර්ධනය හා සමාජ යහපැවැත්ම තහවුරු කළ යුතු බව යි. මේ නිසා සමාජ සජීවිකරණය සඳහා ගත යුතු මඟ පිළිබඳ ව මේ පරිච්ඡේදය තුළ සිදු කෙරෙන ඉතිරි සාකච්ඡාවත්, ග්‍රන්ථයේ ඉදිරි දිග හැරුමත් සිදු වන්නේ මේ මත වාදය පදනම් කර ගෙන ය.

## සජීවිකරණය පිළිබඳ විද්වතුන්ගේ අදහස්

ශ්‍රී ලාංකික ජන සමාජය සජීවිකරණය කිරීමෙහි ලා ගත යුතු පියවර කුමක් ද? යන්න සම්බන්ධයෙන් කතුවරයා විශේෂිත තොරතුරු රැස් කිරීමක් කරන ලද බව ග්‍රන්ථයේ දෙවැනි පරිච්ඡේදයේ දී සඳහන් කළා පාඨකයාට මතක ඇත. මෙකී තොරතුරු රැස් කිරීමේ දී අදහස්

විමසනු ලැබුයේ සමාජ ආර්ථික සංවර්ධනයේ විවිධ විෂය ක්ෂේත්‍ර නියෝජනය කරන ලද පුද්ගලයන් ගෙනි. ඇතැම්හු ආර්ථික විද්‍යාඥයෝ ය. ඇතැම්හු සමාජ විද්‍යාඥයෝ ය. තවත් අය නීතිය, ආගම, අධ්‍යාපනය ආදී වූ ක්ෂේත්‍රවලට සම්බන්ධ වූවෝ ය. මොවිහු සමාජ සජ්වීකරණයක් සඳහා ඉදිරිපත් කරන ලද යෝජනා ඔවුනොවුන් නියෝජනය කරන්නා වූ විෂයයන්ට අදාළ විස්තර කිරීම් මත පදනම් වූ යෝජනා ය. ආර්ථික විද්‍යාඥයන්ගේ අදහස්වලට වඩා සමාජ විද්‍යාඥයන්ගේ අදහස් වෙනස් ය. නීතිමය පසුබිමක් ඇති විද්වතුන්ගේ අදහස්වලට වඩා අධ්‍යාපන වේදීන් ගේ අදහස් වෙනස් ය. ආගමික පසුබිමක් මත පදනම් වූ පැහැදිලි කිරීම් හා යෝජනා මේ සියල්ලට ම වඩා වෙනස් ය. බැලූ බැල්මට එකිනෙකට එකක් වෙනස් විස්තර කිරීම් මත සමාජ සජ්වීකරණයක් සඳහා විසඳුම් යෝජනා ගෙනෙනු ලැබුව ද කතුවරයාගේ කල්පනාව අනුව විශේෂඥයෝ සියලු දෙනා ම ප්‍රකාශ කරන්නේ එක් පොදු උවමනාවක් ගැන ය. වෙනස තිබෙන්නේ ඔවුන් කතා කරන භාෂාවේ මිස උවමනාවේ නො වේ.

සජ්වීකරණය සම්බන්ධයෙන් යෝජනා වන විවිධ අදහස්වල තිබෙන්නේ එක ම හරය කි. ආගම මාධ්‍ය කොට හෝ නීතිය මාධ්‍ය කොට හෝ අධ්‍යාපනය මාධ්‍ය කොට හෝ වෙනත් විෂයයක් මාධ්‍ය කොට හෝ ලබා ගත යුතු යැයි කියන ඵලය එකක් ම වන්නේ ය. එනම්, කවරාකාරයකින් හෝ යුක්තිය, සාධාරණය හා සමානාත්මතාව තහවුරු කොට ජනතාව ආර්ථික හා සමාජ වශයෙන් බල ගැන්විය යුතු බව සියල්ලන්ගේ ම යෝජනාව වේ. විශේෂඥයන් විසින් ඉදිරිපත් කළ විවිධාකාර සජ්වීකරණ යෝජනාවල හරය පැහැදිලි කිරීම සඳහා මැද පෙරදිග ජීවත් ව සිටි මිත්‍රයන් සිව් දෙනෙකු සම්බන්ධයෙන් ගොඩ නැගී තිබෙන උපමා කථාව බොහෝ සුදුසු ය.

ඉස්ලාම් ජනප්‍රවාදයකට අනුව කුළුපග මිතුරන් සිව් දෙනෙකු වූ තුර්කි ජාතිකයෙකු, පර්සියානුවෙකු, අරාබි ජාතිකයෙකු හා ග්‍රීකයෙකු අතර ඇති වූ සංවාදයක් මෙසේ ය. සංචාරයක යෙදෙමින් සිටි මිතුරන් සිව් දෙනා තමන් විසින් වියදම් කොට අත ඉතිරි වී ඇති මුදලට කුමක් කළ යුතු ද යන්න පිළිබඳ ව වාද කරමින් සිටිය හ. තුර්කි ජාතිකයා කීවේ ඉතිරි වූ මුදලින් උසුම් (*Uzum*) මිළ දී ගත යුතු බව ය.

පර්සියානුවා කීවේ උසුම් නො ව ඇන්ගු (*Angur*) මිළ දී ගැනීම වඩා සුදුසු බව ය. අරාබි ජාතිකයා මේ යෝජනා දෙකට ම විරුද්ධ වූ අතර අත ඉතිරි මුදල් යෙදවිය යුත්තේ ඉනැබ් (*Inab*) මිළට ගැනීමට යයි ඔහු වාද කළ අතර සිව් වැන්නා වූ ග්‍රීකයා කීවේ ස්ටැපිල් (*Stafil*) මිළට ගැනීම සුදුසු බව ය. මිතුරන් සිව් දෙනාගේ ම අදහස් තේරුම් ගැනීමට සමත් වූ පිටස්තරයෙකු කීවේ තමාට මුදල් දුන හොත් මිතුරන් සිව් දෙනා ම සතුටු වන පරිදි කටයුතු කිරීමට ඔහුට හැකි බව ය. පිටස්තරයා ඉදුණු මිදි පොකුරක් මිළට ගෙන එනු දුටු පර්සියානුවා මෙන්න මට උවමනා කළ ඇන්ගු යයි කෑ ගැසී ය. මගේ යෝජනාව වූ උසුම් මෙතන තිබෙනවා යයි තුර්කි ජාතිකයා ද කී ය. ඉනැබ් මිලට ගැනීම නිසා අරාබි ජාතිකයා ද, ස්ටැපිල් මිලට ගැනීම නිසා ග්‍රීකයා ද පිටස්තරයාට ස්තුති වන්ත විය. සමාජ සජීවීකරණය සම්බන්ධයෙන් ආර්ථික විද්‍යාඥයන්, සමාජ විද්‍යාඥයන්, ආගමික මත දරන්නන්, අධ්‍යාපනවේදීන් ආදී වූ සියල්ලන් ම දරණ මතයෙහි කිසිදු පරස්පරයක් නැත. වෙනස තිබෙන්නේ ඔවුනොවුන්ගේ විෂයට අදාළ වාංමාලාවේ පමණි.

ජාතීන් හතරකට අයත් වූ මිතුරන් සිව් දෙනෙකු තමන් විසින් වියදම් කොට අත ඉතිරි වී ඇති මුදලට කුමක් කළ යුතු ද යන්න පිළිබඳ ව වාද කරමින් සිටිය හ. තුර්කි ජාතිකයා කීවේ ඉතිරි වූ මුදලින් උසුම් (*Uzum*) මිළ දී ගත යුතු බව ය. පර්සියානුවා කීවේ උසුම් නො ව ඇන්ගු (*Angur*) මිළ දී ගැනීම වඩා සුදුසු බව ය. අරාබි ජාතිකයා මේ යෝජනා දෙකට ම විරුද්ධ වූ අතර අත ඉතිරි මුදල් යෙදවිය යුත්තේ ඉනැබ් (*Inab*) මිළට ගැනීමට යයි ඔහු වාද කළ අතර සිව් වැන්නා වූ ග්‍රීකයා කීවේ ස්ටැපිල් (*Stafil*) මිළට ගැනීම සුදුසු බව ය. මිතුරන් සිව් දෙනාගේ ම අදහස් තේරුම් ගැනීමට සමත් වූ පිටස්තරයෙකු කීවේ තමාට මුදල් දුන හොත් මිතුරන් සිව් දෙනා ම සතුටු වන පරිදි කටයුතු කිරීමට ඔහුට හැකි බව ය. පිටස්තරයා ඉදුණු මිදි පොකුරක් මිළට ගෙන එනු දුටු පර්සියානුවා මෙන්න මට උවමනා කළ ඇන්ගු යයි කෑ ගැසී ය. මගේ යෝජනාව වූ උසුම් මෙතන තිබෙනවා යයි තුර්කි ජාතිකයා ද කී ය. ඉනැබ් මිලට ගැනීම නිසා අරාබි ජාතිකයා ද, ස්ටැපිල් මිලට ගැනීම නිසා ග්‍රීකයා ද පිටස්තරයාට ස්තුති වන්ත විය. සමාජ සජීවීකරණය සම්බන්ධයෙන් ආර්ථික විද්‍යාඥයන්, සමාජ විද්‍යාඥයන්, ආගමික මත දරන්නන්, අධ්‍යාපනවේදීන් ආදී වූ සියල්ලන් ම දරණ මතයෙහි කිසිදු පරස්පරයක් නැත. වෙනස තිබෙන්නේ ඔවුනොවුන්ගේ විෂයට අදාළ වාංමාලාවේ පමණි.

විෂය විශේෂඥයන් කෙරෙන් ගොනු කර ගත් කරුණු වලින් තහවුරු වන්නේ ශ්‍රී ලාංකික ජන සමාජය තුළ යුක්තිය, සාධාරණය හා සමානාත්මතාව තහවුරු කළ යුතු ව තිබෙන බව යි. ප්‍රජාතන්ත්‍රවාදය, මානව නිදහස සහතික කළ යුතු ව තිබෙන බව යි. අධ්‍යාපනය, තාක්ෂණය, ශිල්ප ක්‍රම ආදිය නව ලොවට ගැළපෙන පරිදි නිසි ලෙස ද, සැබෑ ලෙස ද ක්‍රියාවට නැඟිය යුතු ව තිබෙන බව යි. එමගින් ජනතාව සමාජීය වශයෙන් මෙන් ම ආර්ථික වශයෙන් ද බල ගැන්විය යුතුව තිබෙන බව යි. මේ නිසා සමාජ සජීවීකරණය සඳහා ගත යුතු මඟ වැටී ඇත්තේ ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රම හරහා ය. ප්‍රජාතාන්ත්‍රික සාර ධර්ම හරහා ය. නව ලොවට ගැළපෙන අධ්‍යාපනය, ශිල්පක්‍රම හා තාක්ෂණය හරහා ය. මිනිස් අයිතිවාසිකම් උපරිම කිරීම හරහා ය. එමෙන් ම නූතන සමාජ ආර්ථික වටිනාකම් හරහා ය.

විෂය විශේෂඥයන් කෙරෙන් ගොනු කර ගත් කරුණු වලින් තහවුරු වන්නේ ශ්‍රී ලාංකික ජන සමාජය තුළ යුක්තිය, සාධාරණය හා සමානාත්මතාව තහවුරු කළ යුතු ව තිබෙන බව යි. ප්‍රජාතන්ත්‍රවාදය, මානව නිදහස සහතික කළ යුතු ව තිබෙන බව යි. අධ්‍යාපනය, තාක්ෂණය, ශිල්ප ක්‍රම ආදිය නව ලොවට ගැළපෙන පරිදි නිසි ලෙස ද, සැබෑ ලෙස ද ක්‍රියාවට නැඟිය යුතු ව තිබෙන බව යි. එමගින් ජනතාව සමාජීය වශයෙන් මෙන් ම ආර්ථික වශයෙන් ද බල ගැන්විය යුතුව තිබෙන බව යි. මේ නිසා සමාජ සජීවීකරණය සඳහා ගත යුතු මඟ වැටී ඇත්තේ ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රම හරහා ය. ප්‍රජාතාන්ත්‍රික සාර ධර්ම හරහා ය. නව ලොවට ගැළපෙන අධ්‍යාපනය, ශිල්පක්‍රම හා තාක්ෂණය හරහා ය. මිනිස් අයිතිවාසිකම් උපරිම කිරීම හරහා ය. එමෙන් ම නූතන සමාජ ආර්ථික වටිනාකම් හරහා ය.

හතර වැනි පරිච්ඡේදය තුළ මෙතෙක් සිදු කරන ලද සාකච්ඡාව ගොනු කිරීමට අප දැන් කටයුතු කළ යුතු ය. මක් නිසා ද? පරිච්ඡේදයේ අරමුණ වූයේ සමාජ සජීවීකරණය සඳහා ගත යුතු මඟ හෝ දිශාව පිළිබඳ ව මූලික විනිශ්චයක් කිරීම නිසා එවැනි විනිශ්චයක් මේ වන විටත් කර ඇති බැවිනි. මේ පරිච්ඡේදය තුළ දී සිදු වූ සාකච්ඡාව ඉතා සංක්ෂිප්ත ව ගොනු කරනු ලැබුව හොත් ඉන් කරුණු කීපයක් කිය වේ. පළමු වැන්න, ශ්‍රී ලාංකික සමාජය සජීවීකරණය කිරීම සඳහා පැරණි සමාජ ආර්ථික මෙවලම් මත විශ්වාස තැබිය නො හැකි බව යි. දෙවැන්න, ශ්‍රී ලාංකික සමාජය සමාජ ආර්ථික වශයෙන් දුබල වීමේ හේතූන් පවතින්නේ ශ්‍රී ලාංකිකයන් වෙත ම මිස අනෙකකු වෙත

නො වන බව යි. තුන්වැන්න, සමාජ සජීවීකරණය සඳහා ප්‍රජාතාන්ත්‍රික සාර ධර්ම මුල් කොට ගත් නූතන මෙවලම් පිළිබඳ ව විශ්වාසය තබා ජනතාව සමාජ ආර්ථික වශයෙන් බල ගැන්විය යුතු බව යි. මේ නිසා සමාජ සජීවීකරණයේ මහ ප්‍රජාතන්ත්‍රවාදය හරහා ද, විසඳුම් ක්‍රියා මාර්ග ප්‍රජාතාන්ත්‍රික රාමුවක් මත සිදු වන සමාජ ආර්ථික බල ගැන්වීමක් මත ද උදා කර ගත හැකි බව මේ පරිච්ඡේදයෙන් ප්‍රකාශ විය. ආර්ථික බලගැන්විම, සමාජ බලගැන්වීම ඇතුළත් සජීවීකරණයේ නිශ්චිත ක්‍රියාමාර්ග පිළිබඳ ව සාකච්ඡා කිරීම සඳහා දැන් අපි ග්‍රන්ථයේ දෙවැනි වෙළුමට ප්‍රවිෂ්ට වෙමු.

## ආශ්‍රිත ග්‍රන්ථ

ජනසවිය කොමසාරිස් දෙපාර්තමේන්තුව, (1991). ප්‍රාදේශීය සභාවලට ජනසවියෙන් ශක්තිමත් පදනමක්. ජනසවිය කොමසාරිස් දෙපාර්ත මේන්තුවේ ප්‍රකාශනයකි.

ජනසවිය කොමසාරිස් කාර්යාලය, (1990).ජනසවිය දෙවැනි වටය සවි- 1

දරිද්‍රතා සහ සමාජ විශ්ලේෂණ ආයතනය, (1994). ජනසවිය : මිරිඟුව හා යථාර්ථය. එලියට් පෙදෙස, කොළඹ 8.

පෙරේරා, අයි. ආර්. (1998). ශ්‍රී ලංකාවේ විවෘත ආර්ථිකය හා නිරපේක්ෂ දිළිඳුකම: ගොවිකටයුතු අධ්‍යයන 3 වෙළුම, 2 කලාපය, පිටු 1-32 : හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය, 114 විජේරාම මාවත, කොළඹ 07.

පෙරේරා, අයි.ආර්. (1992). පුහුණු ක්‍රමවේදය, ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ ප්‍රකාශනයකි. මුද්‍රණය :රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව.(නැවත මුද්‍රණය - 1996).

ස්ටැන්ලි ගජනායක සහ ජයා ගජනායක. (වසර සඳහන් නැත) ප්‍රජාව සවිබල කරණය : අන්තර් ජාතික පුහුණු හා උපදේශක කාර්යාලය උතුරු ඉලිනොයිස් විශ්ව විද්‍යාලය: ඩේකාබ්, ඉලිනොයිස් 60115 ඇ.එ.ජනපදය.

වික්ටර් අයිවන්. (1999). නිදහස් ජාතික ඒකාග්‍රතාව හා දේශපාලනයේ පවුල් පොරය: නන්දන මාරසිංහ අනුස්මරණ ග්‍රන්ථ ප්‍රකාශන පදනම: මුද්‍රණය ප්‍රින්ට් ඉන් : 7, කෙකටිය මාවත, සිරිමල් උයන, රත්මලාන.

සුනිමල් ප්‍රනාන්දු. (1991). ආසියානු ජනසවියක් කරා ....IRED ප්‍රකාශයකි.

Alderman, H. (1991). Food Subsidies and the Poor: *Essays on Poverty, Equity and Growth:* Edited by George Psacharopoulos: World Bank, Washinton D.C.

Apiwat, S. (2000). Groups for Production Credit in Thailand: The Country Report Presented to the Symposium on Integrated Local Community Development: Organized by APO, Japan.

Ash, N. R. (1999). The Third World in the Age of Globaliza tion: Madyam Books Delhi.

Abel-Smith, B. and Townsend, P. (1965). The Poor and the Poorest, G. Bell & Sons, London.

Atkmson, J.M. (1971). Societal Reactions to Suicide in Cohen, Discovering Suicide, Macmillan, London.

Broadhurst, P.L. (1960). Experiments in Psychogentics: Appli cation of Biometrical Genetics to the Inheritance of Behaviour in *Experiment in Personality: Volume 01: Psycho Genetics and Psychopharmacology. London*. Edited by Hans J. Eysenck

Bussche, L. De. (1817). Letters on Ceylon: Particularly Related to the Kindom of Kandy, London: Printed for J.J. Stockdale, No. 41, Pall Mall. Reprinted (1999) Nice Printing Press Delhi 110051.

Bynon, R. (1993). NGO Involvement in Small Enterprise Development - An Overview: Occasional Publication No. 02. IRED, 64, Horton Place, Colombo 7, Sri Lanka.

Berlin, I. (1978). Karl Marx 4th edition, Oxford University Press, Oxford.

Bernbaum, G. (1977). Knowledge and Ideology in the Sociol ogy of Education, Macmillan, London.

Beteille, A. (ed), (1969). Social Inequality, Penguin Books, Harmondsworth.

Bierstedt, R. (1963). The Social Order, McGraw-Hill, New York.

Birnbaum, N. and Lenzer, G. (eds), (1969). Sociology and Religion: A Book of Readings, Prentice-Hall, Englewood Cliffs.

Blauner, R. (1964). Alienation and Freedom, University of Chicago Press, Chicago. Work Satisfaction and Indus trial Trends in Modern Society in Worsley, 1972.

Blau, P.M. (1963). The Dynamics of Bureaucracy 2nd edition, University of Chicago press, Chicago. On the Nature of Organizations, John Wiley & Sons, New York, 1974.

Blau, P.M. and Schoenherr, R.A (1971). The Structure of Organizations, Basic Books, New York.

Braverman, H. (1974). Labor and Monopoly Capitalism, Monthly Review Press, New York.

Brown, R. (ed), (1973). Knowledge, Education and Cultural Change, Tavistock, London.

Budd, S. (1973). Sociologists and Religion, Collir-Macmillan, London.

Coser, L.A. (1977). Masters of Sociological Thought 2nd edition, Harcourt Brace Jovanovich, New York.

Coser, L.A. and Rosenberg, B. (eds), (1976) Sociological Theory: A Book of Readings 4th edition, Macmillan, New York.

Campbell, J. (1843). Excursions Adventures and Field Sports in Ceylon: First Published London: Reprint: New Delhi (1999): Shubham Offset Press.

Coomaraswamy, A.K.(1979). Mediaeval Sinhalese Art (Third edition): States Printing Corporation, Sri Lanka

Christian Aid (1988). Banking on the Poor: The Ethics of Third World Debt. Published by Christian Aid: (New Edi tion) P. Box 100, London SEI 7RT Printed by Stanley Hunt Ltd., Rushden.

Cohler, B.J.(1993). Describing Lives: Gordon Allport and the "Science" of Personality. In *Fifty years of Personality Psychology*: K.H Craik, R.Hogan, and R.N. Wolfe (Eds) New York:

Davis, K. (1948). Human Society, Macmillan, New York.

Dowse, R. E. and Hughes, J.A. (1972).Political Sociology , John Wiley & Sons, London.

Dye, T.R. and Zeigler, L.H. (1975). The Irony of Democracy 3rd edition, Duxbury press, North Scituate.

Dharmarathne T.A. (1991). Anti Poverty Policies in Sri Lanka: an Evaluation of Programs Alleviation of Poverty with Reference to Food Subsidy Schemes. Masters' Thesis Submitted to the Institute of Social Studies, The Hague, The Netherlands.

Etzioni, A. (1964).Modern Organizations, Prentice-Hall, englewood Cliffs.

Eysenck, H. (1964). Crime and Personality, Routledge & Kegan Paul, London Race, Intelligence and Education, Temple Smith, London, 1971.

Edirisinghe, N. (1990). Poverty in Sri Lanka: Its Extent Distribution and Characteristics of the Poor. The Report Submitted to the World Bank for the Sri Lanka Poverty Alleviation and Employment Project. Colombo, Sri Lanka.

Edward Sullivan, (1854). The Bungalow and the Tent: A Visit to Ceylon: Publisher In Ordinary to Her Majesty. London Republished by Asian Educational Services: New Delhi 1999.

Field, F. (1975) 'What is Poverty?' *New Society.* vol 33 no 677.

Fances Stewart (1987). Alternative Macro Policies, Meso Policies, and Vulnerable Groups in Adjustment with a Human Face (A Study by Unicef) Editors: Giovanni Andrea Cornia, Richard Jolly, Frances Stewart: Printed in Great Britain by Courier International Ltd. Tiptrec, Essex.

Fuller, J. L. and Tompson, W.R. (1960). Behavior Generics New York, Wiley.

Glass, D.V. (ed), (1954). Social Mobility in Britain, Routledge & Kegan Paul, London.

Goonatilaka, S. (1982). Crippled Minds: an Exploration into Colonial Culture. The Lake House bookshop 100, Sir Chittampalam Gardiner Mawatha: Colombo: Sri Lanka.

Gunatilaka, G. (1993). Development or under Development: The Sri Lankan Reality: in The Island, 18th March.

Gunnar, M. and King, S.S. (1992). Asian Drama an Inquiry into the Poverty of Nations. Manufactured in the United States of America by H. Wolf: New York.

Harris, N. (1971). Beliefs in Society, Penguin Books, Harmondsworth.

Hunter, F. (1963). Community Power Structure, Anchor Books, New York.

Hale, J. R. (1966). Machiavelli and the Self-Sufficient State: Page 22-34 in *Political Ideas*, Edited by David Tompson: Made and Printed in Great Britain by C. Nicholls and Company Limited: Penguin Book Ltd: Middle Sex, England.

Henry, A.K. (1991). Macroeconomic Change and Poverty in Sri Lanka: Institution of Policy Studies: Colombo, Sri Lanka.

Heydt, J.W. (1744). Allerneeuestr Geographisch - and Topographisch Er Schau - Platz: Translator : R. Ravanhart. Published by Ceylon Government Informa tion Dept. Government Press. Colombo.

Jos Nooij (1998). Real Targeting the Case of Food Distribution in India: Working Paper No. 276: Institute of Social Studies, P.O. Box 29776, 2502LT The Hague -The Netherlands.

James, E. (1970). America Against Poverty. Routledge & Kegan Paul, London.

Knox, R. (1681). Historical Relation of the Island Ceylon in the East Indies. Richard Chiswell: London. Repub lished in 1983 by K.V.G. De Silva and Sons (col.) Ltd, 415, Gall Road Colombo 4.

Lane, D. (1970). Politics and Society in the USSR, Weidenfeld & Nicolson, London, The Socialist Industrial State, George Allen & Unwin, London, 1976.

Levy, M.J. (1952). The Structure of Society, Princeton Univer sity Press, Princeton.

Lipset, S.M. and Zetterburg, H.L. (1959). 'Social Mobility in Industrial Societies' in Social Mobility in Industrial Society edited by S.M. Lipset and R. Bendix Univer sity of California Press, Berkeley.

Luckmann, T. (1976). The Invisible Religion: The Transforma tion of Symbols in Industrial Society, Macmillan, New York.

Liyanage, S. and Bandara, N. (1995) Review of the Perfor mance of the Janasaviya Trust Fund: in *Poverty Alleviation Through the Janassaviya Trust Fund and its Partners* (Published for Private Circulation Only).

Mill, J. S. (1843). A System of Logic, Ratiocinative and Induc tive. London: Longmans.

Ministry of Policy Planning, (1992). Nutrition Survey 1985/ 89 Nutrition and Janasaviya Division: Ministry of Policy Planning and Implementation: Sethsiripaya, Battaramulla, Sri Lanka.

McLellan, D. (ed), (1977).Karl Marx Selected Writings, Oxford University Press, Oxford.

Mangin, W. (1968). 'Poverty and Politics in Cities of Latin America' in Urban Poverty: Its Social and Political Dimensions edited by W. Bloomberg Jr and H. J. Schmandt, Sage Publications, Beverly Hills.

Mennell, S. (1974). Sociological Theory, Nelson, London.

Milbrath, L.(1965). Political Participation, Rand McNally, Chicago.

Miliband, R. (1969). The State in Capitalist Society, Weidenfeld & Nicolson, London: Politics and Poverty in Wedderburn, 1974, Marxism and Politics, Oxford University Press, Oxford.

Mouzelis, N.P. (1975). Organization and Bureaucracy 2nd edition, Routledge & Kegan Paul, London.

Moynihan, D.P. (1968). (ed) On Understanding Poverty, Basic Books, New York.

Murdock, G.P. (1949), Social Structure, Macmillan, NewYork.

OECD, (1998). Macrothesaurus for Information Processing in the Field of Economic and Social Development: Fifth Edition.

Ortega, Y. Gasset, J. Man & Crisis. New York: Norton. (1993).

Parsons, T. (1937). The Structure of Social Action, McGraw-Hill, New York. The Social System, the Free press, New York, 1951:

Payne, G., Ford, G and Robertson, C. (1977) 'A Reappraisal of Social Mobility in Britain'Sociology vol 11no 2.

President's Commission on Income Maintenance Programs, (1969). Poverty amid Plenty: the Report of the President's Commissio of Income Maintenance pro grams, US Government Printing Office, Washington DC.

Perera, I.R. (1996). The Trends of Poverty in Sri Lanka with Special Reference to Malnutrition: In *Contemporary Development Analysis* P. 135 - 144 Vol. 1 No. 1: International Research Foundation for Development, Inc. Cambridge, Minnesota 55008 USA.

Robertson, R. (1970). The Sociological Interpretation of Religion, Basil Blackwell, Oxford.

Rose, A.M. (ed), (1962). Human Behaviour and Social pro cesses, Routledge & Kegan Paul, London.

Ratwatta, C.J. (1995). Present Forms of Non-governmental Self-help Promotion: Experience and Learning: in *Poverty alleviation Through the Janasaviya Trust Fund and its Partners* (Published For Privet Circulation only).

Ribeiro, J. (1685). The Historic Tragedy of the Island Ceilao, dedicated to his most serene Majesty Dom Pedro the Second, King of Portugul, Our Lord. 3rd edition: PE Pieris, Colombo Apothecaries Co. Ltd. 1925

Rebeiro, J. (1685). Ribeiro's History of Ceilao with Notes , from De Barros, De Couto and Antonio Bocurro: Part I. Translated from the Portuguese by P.E. Pieris Deraniyagala Sumanasinghe Siriwardane, Printed at the Albion Press, Galle. (The translation was don approxi mately in 1910. The document is available at the Musium Library, Colombo, Sri Lanka).

Silverman, D. (1970). The Theory of Organizations, Heinemann, London.

Stacey, M. (1960). Tradition and Change: A Study of Banbury (Oxford University Press, Oxford.

Silva, T.K and Pushpakumara W.D.N.R. (1996). Love, Hate and the Upurge in Youth Suicide in Sri Lanka: Suicide Trends in a Mahaweli New Settlement: Sri Lanka In *Journal of Social Science,* 1996 Vol.19 No 1&2: P. 73-92.

Solow, R.M. (1970). Growth Theory: An Exposition. Oxford University Press, Ely House, London.

Sunardi, (2000). Bandarharho of Central Java: Housing Re newal and Integrated Local Community Development: The Country Report Presented to the Symposium on Integrated Local Community Development Organized by APO Japan.

Sunimal, F. & Gamage, W. (1989). Some Socio - Political Aspects of Janasaviya: In *Economic Review* July/ August 1989.

Townsend, p. (ed), (1970). The Concept of Poverty, Heinemann, London.

The State Coordinating Ministry for People's Welfare & Poverty Alleviation Republic of Indonesia, (1998). Indonesia's Poverty alleviation Policy Reform: Gov ernment Publication.

Valentine, C.A. (1968). Culture and Poverty, University of Chicago press, Chicago.

Wedderburn, D. (ed), (1974). Poverty, Inequality and Class Structure, Cambridge University Press, Cambridge.

Wignaraja, P. & Siriwardana, S. (ed) (1998). Readings on Pro-Poor Planning through Social Mobilization in South Asia. Vol.1. The Strategic Option for Poverty Eradi cation. Printed at Kay Kay printers, Delhi-1d10007.

World Bank (1999). Knowledge for Development: World Development Report 1998/99 Oxford University Press. New York.

Wrightsman L.S. (1994). Adult Personality Development: Sage Publications: London. New Delhi.